[සිංහල පරිවර්තනය]

# ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව.

## පටුන

1. මූලික කරුණු: ........ 1

2. චෝදනා: ........ 2

3. අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය: ........ 9

4. අංක 01-16 දක්වා චෝදනාවලට අදාළ සාක්ෂි සාරාංශය සහ ඇගයීම; ........ 13

1) ප්‍රධාන පොලිස් පරීක්ෂක (CI) රම්මුනි උවන්නේ ඇන්සලම් ද සිල්වාගේ සාක්ෂි ........ 13

2) පොලිස් සැරයන් (PS 16089) ඉමදුව මානගේ අජිත් සිසිර කුමාරගේ සාක්ෂිය. ........ 20

3) පොලිස් කොස්තාපල් රියදුරු 89728 අමරසිංහ කළු ආරච්චිගේ දුලිප් ගිහාන් පියතිස්සගේ සාක්ෂිය. ........ 26

4) නියෝජ්‍ය පොලිස්පති ගුණනන්දවඩු නිශාන්ත ද සොයිසාගේ සාක්ෂි. ........ 29

5) හමුදා සැරයන් ගම්මැද්ද තන්ඩක්කරලාගේ චන්දිමාල් රුචිරංගගේ සාක්ෂිය. ........ 39

6) උප පොලිස් පරීක්ෂක මාවනානේ හේවා ගාමිණී ජයසේකරගේ සාක්ෂිය ........ 43

7) උප පොලිස් පරීක්ෂක සුදත් ධර්ම ශ්‍රී පුල්ලේපෙරුමගේ සාක්ෂිය. ........ 46

8) වැඩබලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වීරසූරිය ලියන ආරච්චිගේ සමන් ප්‍රියන්තගේ සාක්ෂිය. ........ 48

9) කාන්තා පොලිස් සැරයන් 275 කලහේපාඩි කනකනම්ගේ නාලිකා දිල්මා තිලකරත්නගේ සාක්ෂිය ........ 52

10) සහකාර පොලිස් අධිකාරී ඩිලාන් චාමර දොඩන්ගොඩගේ සාක්ෂිය. ........ 54

11) වගුරුවෙල ගමරාළලාගේ චානක ජීවන්ත පල්ලෙවත්ත (ජේලර්) ගේ සාක්ෂිය. ........ 55

12) පොලිස් සැරයන් සමරකෝන් විජේවික්‍රම විදානේ මුහම්දිරම්ගේ උපුල් වසන්ත අල්විස් විජේවික්‍රමගේ සාක්ෂිය. ........ 56

13) පොලිස් කොස්තාපල් රියදුරු විජේකෝන් හේරත් මුදියන්සේලාගේ ඉෂාන් නිරෝෂ් බණ්ඩාරගේ සාක්ෂිය ........ 59

14) සහකාර පොලිස් අධිකාරී අරුමප්පෙරුම ආරච්චිගේ චන්දිමා නිරෝෂනී අරුමප්පෙරුමගේ සාක්ෂිය. 60

15) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොස්ගහමුලගෙදර ප්‍රගීත් බුද්ධික සමරපාලගේ සාක්ෂි ........ 60

16) ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් තනුජා නයෝමි ප්‍රනාන්දුගේ සාක්ෂිය ........ 62

17) කාන්තා පොලිස් කොස්තාපල් 6754 මාකුඹුරේ ගෙදර හේරත් මුදියන්සේලාගේ ඉනෝකා චාන්දනීගේ සාක්ෂිය ........ 63

18 ) පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුමගේ සාක්ෂිය. ........ 64

19) කාන්තා පොලිස් පරීක්ෂක යටියන්තොට ඩයස් දමයන්ති ස්වර්ණලතා සමරසිංහගේ සාක්ෂි ........ 64

20) කන්නන්ගර කෝරළලාගේ දෝන නෙල්කා ශ්‍යාමලී ජයතිලකගේ සාක්ෂි ........ 65

21) පොලිස් පරීක්ෂක විජේතුංග මුදියන්සේලාගේ ශ්‍රියා බණ්ඩාර විජේතුංගගේ සාක්ෂිය. ........ 66

22) ප්‍රධාන පොලිස් පරීක්ෂක විලියම් බ්‍රිටස් අසංක තුසිත කුමාරගේ සාක්ෂි. ........ 66

23) වග උත්තරකාර පොලිස්පති තෙන්නකෝන් මුදියන්සේලාගේ වංශාලංකාර දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සාක්ෂි. ....... 68

24) අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් කළ හරස් ප්‍රශ්න විභාගය ....... 93

25) නියෝජ්‍ය පොලිස්පති කපුගමරාලලාගේ ජගත් චන්ද්‍ර කුමාරගේ සාක්ෂි. ....... 114

26) අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාරගෙන් හරස් ප්‍රශ්න විමසීම. ....... 123

27) විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහගේ සාක්ෂි. ....... 153

28) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරාගේ සාක්ෂි. ....... 154

29) විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී හෙට්ටිආරච්චිගේ නෙවිල් වර්ජින්ටන් ද සිල්වාගේ සාක්ෂි ....... 156

30) සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් හරස් ප්‍රශ්න කිරීම. ....... 163

31) තානේෂ් බර්නාඩ් ඩයස්ගේ සාක්ෂි ....... 165

32) සුදන්තිත්තලපිටියේ ප්‍රියන්ත ජයතිලක පෙරේරාගේ සාක්ෂි ....... 166

5. චෝදනා පත්‍රයේ චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12 සහ චෝදනා අංක 13, 14, 15, 16 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් එළඹුණ ලද නිගමන: ....... 166

6. චෝදනා පත්‍රයේ චෝදනා අංක 11 සහ අංක 12 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් එළඹුණ ලද නිගමන: ....... 172

7. චෝදනා පත්‍රයේ අංක 17, 18 සහ 19 චෝදනාවලට අදාළ සාක්ෂි සාරාංශය සහ ඇගයීම; ....... 173

1) පොලිස් කොස්තාපල් රියදුරු 80188 හේවා කොලොම්බගේ ප්‍රසාද්ගේ සාක්ෂි ....... 173

2) පො.කො. 91484 කන්දප්පා හෙට්ටිගේ මහේෂ් උදාරගේ සාක්ෂි. ....... 175

3) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බාලසූරිය මොහොට්ටි අප්පුහාමිලාගේ සම්පත් කුමාර සේනාරත්නගේ සාක්ෂි. ....... 176

4) උප පොලිස් පරීක්ෂක රාජපක්ෂ ආරච්චිලාගේ මහින්ද රාජපක්ෂගේ සාක්ෂි. ....... 179

5) ප්‍රධාන පොලිස් පරීක්ෂක හේනදීරගේ ලලිත සුමින්ද ගුණසේකරගේ සාක්ෂි. ....... 179

6) සහකාර පොලිස් අධිකාරී බටුගෙදර අප්පුහාමිලාගේ වික්‍රම් කුමාර වීරසේකරගේ සාක්ෂි. ....... 181

7) ප්‍රධාන පොලිස් පරීක්ෂක පස්ගම විදානලාගේ අසෝක ෂෙල්ටන් කරුණාතිලකගේ සාක්ෂි. ....... 183

8) සහකාර පොලිස් අධිකාරී අබේසේකර ගම්ලත්ගේ යසස් ස්වර්ණ කීර්තිසිංහගේ සාක්ෂි. ....... 186

9) වැඩ බලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වීරසූරිය ලියන ආරච්චිගේ සමන් ප්‍රියන්තගේ සාක්ෂිය. ....... 188

10) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කුමාර බුද්ධික මනතුංගගේ සාක්ෂි ....... 191

8. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් චෝදනා අංක 17, 18 සහ 19 සම්බන්ධයෙන් දරන ස්ථාවරය: ....... 196

9. චෝදනා පත්‍රයේ චෝදනා අංක 17, 18 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන: ....... 200

10. චෝදනා පත්‍රයේ චෝදනා අංක 19 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන: 203
11. චෝදනා පත්‍රයේ චෝදනා අංක 20,21 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන: ..... 204
12. චෝදනා පත්‍රයේ චෝදනා අංක 22,23 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන: ..... 205
13. සමාප්ති සටහන: ..... 206

# 1 වෙළුම සඳහා ඇමුණුම්

1. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙත ලබා දුන් චෝදනා පත්‍රය (2025-04-08 දිනැතිව පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද යෝජනා සම්මතය අනුව සකස් කරන ලද)

2. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා නොපිළිගැනීමට වූ තීරණයට පාදක වූ හේතු අඩංගු වන 2025 මැයි 19 දිනැති නියෝගයේ පිටපතක් A ලෙස සටහන් කරමින් මෙම වාර්තාවට අමුණා තිබේ. (මෙම නියෝගයේ අත්සන් කරන ලද මුල් පිටපත II වෙළුම ලෙස සකස් කර තිබෙන 2025-05-19 දිනැති කාර්ය වාර්තා තුළ ඇතුළත් කර තිබේ.)

# ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනා පිළිබඳව විමර්ශන හා පරීක්ෂණ කර වාර්තා කිරීම සඳහා 2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 06 වන වගන්තිය යටතේ පත් කරන ලද පරීක්ෂණ කමිටුවේ අවසන් වාර්තාව.

**2025 ජූලි 21**

## 1. මූලික කරුණු:

2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 6 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු කථානායකතුමා විසින්, ගරු පද්මන් සුරසේන විනිසුරුතුමා සභාපති ලෙසත්, (විශ්‍රාමික) නීල් ඉද්දවෙල විනිසුරුතුමා සාමාජිකයකු ලෙසත්, ලලිත් ඒකනායක මහතා (ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති) නිල බලයෙන් සාමාජිකයා ලෙසත් ඇතුළත් වන මෙම විමර්ශන කමිටුව පත් කරන ලදී. (මෙහි ඇතැම් අවස්ථාවලදී "වගඋත්තරකාර පොලිස්පති" හෝ "දේශබන්දු තෙන්නකෝන් මහතා" ලෙසින් සඳහන් කෙරෙන) ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති තනතුරෙන් ඉවත් කිරීම අදහස් කර ගනිමින් ඉදිරිපත්කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කර වාර්තා කිරීමට මෙම කමිටුව පත් කරන ලදී. ඒ අනුව, මෙම විමර්ශන කමිටුව සඳහන් කරන ලද චෝදනා සම්බන්ධයෙන් සොයාගැනීම් සිදුකර, එහි සොයාගැනීම් ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ.

කමිටු සාමාජිකයන් පත් කිරීමෙන් පසු, විමර්ශන කමිටුව ප්‍රථම වරට 2025 අප්‍රේල් 23 වන දින පාර්ලිමේන්තුවේදී රැස්වී, ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකූන් මහතා පොලිස්පති තනතුරෙන් ඉවත් කිරීමට අපේක්ෂා කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය සහ පරීක්ෂණ කටයුතු සිදුකළ යුතු ආකාරය පිළිබඳව සාකච්ඡා ආරම්භ කරන ලදී. එදින, පාර්ලිමේන්තුවේ මහලේකම්, කමිටුවේ කටයුතු සඳහා සහාය වීම පිණිස, පාර්ලිමේන්තු සහකාර මහලේකම් හංස අබේරත්න මහතා, පාර්ලිමේන්තු නියෝජ්‍ය ප්‍රධාන නිලධාරිනි නිපුණිකා තෙන්නකෝන් මහත්මිය සහ පාර්ලිමේන්තු නිලධාරිනි හංසනී මුණසිංහ මහත්මිය නම් කර, හැන්සාඩ්/කාරක සභා වාර්තාකරුවන් කිහිප දෙනෙකු ද ඇතුළුව අවශ්‍ය සියලු පහසුකම් කමිටුවට ලබා දෙන ලදී. විමර්ශන කමිටුව එදින, ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර, 2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 13 වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින්, කමිටුවේ කාර්යයන් ඉටු කිරීම සඳහා, ගරු නීතිපතිතුමාගෙන් නිලධාරීන් කණ්ඩායමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටීමට තීරණය කළේය. ඒ අනුව, විමර්ශන කමිටුව, මෙම ඉල්ලීම ගරු නීතිපතිතුමා වෙත දැනුම් දීමට, පාර්ලිමේන්තු සහකාර මහලේකම් හංස අබේරත්න මහතාට අවසර දෙන ලදී.

ඉහත ඉල්ලීම පරිදි ගරු නීතිපතිවරයා විසින් විමර්ශන කමිටුවට අවශ්‍ය විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීම සඳහා අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ දිලීප පීරිස් සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රජිත පෙරේරා පත් කරන ලදී.

එමෙන්ම, විමර්ශන කමිටුව 2002 අංක 05 දරණ නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 13 වැනි වගන්තිය අනුව කටයුතු කරමින්, වැඩබලන පොලිස්පතිවරයාගෙන් කමිටුවේ කාර්යයන් සඳහා සහාය වීමට විමර්ශන නිලධාරීන් කණ්ඩායමක් ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. ඒ අනුව, වැඩබලන පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) සහකාර පොලිස් අධිකාරී රෝහන් විජේකෝන්, ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක, උප පොලිස් පරීක්ෂක දුලිත මධුරංග සහ පොලිස් කොස්තාපල් 78185 ශලින්ද යන අය විමර්ශන කමිටුවට එහි සැලසුම් කළ විමර්ශන සහ පරීක්ෂණ සිදුකිරීම සඳහා සහාය වීමට නම් කරන ලදී.

නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායම සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් කණ්ඩායමේ පැමිණීමත් සමඟ, විමර්ශන කමිටුව 2025-04-08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව සාකච්ඡා කර සලකා බලා, පොලිස්පති ධූරයෙන් දේශබන්දු තෙන්නකෝන් මහතා ඉවත් කිරීමට අපේක්ෂා කරන ලද චෝදනා (ඉහත කී යෝජනාව අනුව) සම්බන්ධයෙන් අවශ්‍ය විමර්ශන සිදු කරන ලදී. විමර්ශන කමිටුව අවශ්‍ය පරිදි නිතර රැස් වූ අතර එමඟින් එම විමර්ශනයේ ප්‍රගතිය නිවැරදි දිශාවට සමාලෝචනය කිරීමට සහ මඟ පෙන්වීමට හැකි විය.

ඉන් අනතුරුව, විමර්ශන කමිටුව, එම විමර්ශනවලින් පසුව තමන් වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු සලකා බැලීමෙන් පසු, දේශබන්දු තෙන්නකෝන් මහතා සහ ඔහුගේ නීතිඥවරයා සමග සාකච්ඡා කර තීරණය කිරීමට සැලසුම් කළ ආකාරයට පරීක්ෂණය ආරම්භ කිරීමට හැකි වන පරිදි 2025-05-19 දින විමර්ශන කමිටුව හමුවේ පෙනී සිටින ලෙස පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාට දැනුම් දීමට තීරණය කළේය. ඒ අනුව, විමර්ශන කමිටුව දේශබන්දු තෙන්නකෝන් මහතාට සිතාසි භාරදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

## 2. චෝදනා:

2025 මැයි 19 වන දින, වගඋත්තරකාර පොලිස්පතිවරයා තමාට සිතාසි ලැබීමෙන් පසුව විමර්ශන කමිටුව හමුවේ පෙනී සිටියේය. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් නීතිඥ රසික සංජීව වීරවික්‍රම මහතා සහ නීතිඥ කිත්මිනි කාවේශා රුවන්පුර පෙනී සිටියහ. ගරු නීතිපතිවරයා විසින් නම් කරන ලද අතිරේක සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා (ජනාධිපති නීතිඥ) සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රජිත පෙරේරා මහතා විමර්ශන කමිටුවට සහාය වීමට පෙනී සිටියහ. පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් හංස අබේරත්න මහතා ද විමර්ශන කමිටුවට සහාය වීමට එහි ලේකම්වරයා ලෙස පැමිණ සිටියේ ය.

එදින, එනම් 2025 මැයි 19 වන දින, විමර්ශන කමිටුව විසින් 2025-04-08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අනුව සකස් කරන ලද චෝදනා විසිතුනකින් (23) සමන්විත චෝදනා පත්‍රය, එම යෝජනාවේ පිටපතක් සමග විමර්ශන කමිටුව හමුවේ සිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාට භාර දෙන ලදී.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රසික සංජීව වීරවික්‍රම මහතා ආරම්භයේදීම යම් මූලික විරෝධතා මතු කිරීමට විමර්ශන කමිටුවෙන් අවසර ඉල්ලා සිටියේය. විමර්ශන කමිටුව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නීතිඥවරයාට තමන් මතු කිරීමට අදහස් කළ මූලික විරෝධතා සම්බන්ධයෙන් කමිටුවට කරුණු දැක්වීමට අවසර දුන්නේය.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නීතිඥවරයාට ඉල්ලා සිටි අවස්ථාව ලබා දීමෙන් පසු විමර්ශන කමිටුව විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සංජීව වීරවික්‍රම මහතා විසින් ඉදිරිපත් කරන ලද කරුණු විභාග කරන ලදී. ඉන්පසු විමර්ශන කමිටුව ගරු අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණු විභාග කළේය. ඉන් අනතුරුව, ගරු අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද කරුණුවලට ප්‍රතිචාර දැක්වීමට නීතිඥ සංජීව වීරවික්‍රම මහතාට තවත් අවස්ථාවක් ලබා දෙන ලදී. ඉන් අනතුරුව, විමර්ශන කමිටුව, ඉහත කී විභාගය අතරතුර මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට හැකි වන පරිදි වැඩිදුර කටයුතු කල්තබන ලදී. ඉන් අනතුරුව, විමර්ශන කමිටුව, දෙපාර්ශ්වයේම නීතිඥවරුන් විසින් ඉදිරිපත් කරන ලද කාරණා ඔවුන්ගේ අදාළ කරුණු ඉදිරිපත්කිරීම්වලදී සලකා බැලීමෙන් පසු, 2025 මැයි 19 වන දිනැති තම නියෝගයේ සඳහන් හේතු මත[1] වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් මතු කරන ලද මූලික විරෝධතා තුනම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කළේය. එමෙන්ම, විමර්ශන කමිටුව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද අයදුම් දෙක සලකා බැලීමට නොහැකි බව ද තීරණය කළේය. ඉන් අනතුරුව, විමර්ශන කමිටුව ඉතිරි පරීක්ෂණය ඉදිරියට ගෙන යාමට පියවර ගන්නා ලදී.

වගඋත්තරකාර පොලිස්පතිවරයාට භාර දෙන ලද චෝදනා පත්‍රය (2025-04-08 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව අනුව සකස් කළ) පහත පරිදි විය:

> *2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 5 වගන්තිය සමග කියවිය යුතු 3 (ඇ) සහ 3(ඉ) වගන්ති ප්‍රකාරව විෂමාචාරය සහ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශ බන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සඳහා එකී පනතෙහි 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට 2025-04-08 දින පාර්ලිමේන්තුව යෝජනාවක් සම්මත කර ඇති හෙයින් ද;*
>
> *2002 අංක 05 දරණ නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 6 වැනි වගන්තිය අනුව ඔබ පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීමට අදහස් කරමින් එල්ල කරනු ලබන චෝදනා විමර්ශනය කර පරීක්ෂා කිරීමට විමර්ශන කමිටුවක් පත් කර ඇති බැවින්, ඒ අනුව මෙම විමර්ශන කමිටුව ඔබ ධුරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද හේතු සම්බන්ධයෙන් සොයාගැනීම් සිදු කර ගරු පාර්ලිමේන්තුවේ කථානායකතුමාට එවැනි සොයාගැනීම් දැනුම් දීම අවශ්‍ය වන හෙයින් ද;*
>
> *එමෙන්ම එම විමර්ශන කමිටුව 2025 මැයි 07 දිනැති නොතීසිය මගින් එම විමර්ශනය සම්බන්ධයෙන් පවත්වන විමර්ශනය සම්බන්ධයෙන් ඔබට දැනුම් දී ඇති හෙයින් ද;*
>
> *එබැවින්, පහතින් වඩාත් සම්පූර්ණයෙන් සඳහන් කර ඇති චෝදනාවලට අදාළව එම විමර්ශන කමිටුව ඔබට එරෙහිව සොයාගැනීම් නොකළ යුත්තේ මන්දැයි එම කමිටුව හමුවේ හේතු දක්වන ලෙස පොලිස්පති, ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා වන ඔබ වෙත මෙයින් නියෝග කරනු ලැබේ:-*

1 වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් ගොනුකළ මූලික විරෝධතා ප්‍රතික්ෂේපකිරීම සඳහා වන 2025 මැයි 19 දිනැති නියෝගය A යනුවෙන් සළකුණු කොට මෙම වාර්තාවට අමුණා ඇත.

1. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් නම් වශයෙන්: ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ගිහාන් පියතිස්ස යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

2. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත්, නම් වශයෙන්: ප්‍රධාන පොලිස් පරික්ෂක අන්ස්ලම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරික්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රෝෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුවගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ගිහාන් පියතිස්ස යන එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමත් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නිති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 ක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින්ද,

3. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට, , නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

4. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශ බන්දු තෙන්නකෝන්, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නිති විරෝධී කටයුත්තක හෝ අපරාධයක නියැලීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධූරයේ බලතල බරපතල අන්දමන් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින්ද,

*5. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2007 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති හෙයින් ද;*

*6. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම් නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලැනේ පිහිට W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නිති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

*7. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;*

*8. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායම නිති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමනින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනිමත් සිදුකර ඇති හෙයින් ද;*

*9. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමේ දෙදෙනෙකු වන පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන අය වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධි ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින්*

*2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;*

10. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු වැලිගම, පැලෑනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදි තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි එකී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස දේශබන්දු තෙන්නකෝන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින් ද;*

11. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂන රොෂාන් මීධුරාග යන සන්නද්ධ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු වැලිගම, පැලෑනේදී ඉහත සඳහන් නිති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරතවන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩි බලන පොලිස්පති ලෙස එහි දේශබන්දු තෙන්නකෝන්, ළඟම් ඇති රෝහලව තුවාලකරුවන් රැගෙන නොගොස් රහසිගකට කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති හෙයින් ද;*

12. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු වැලිගම, පැලෑනේදී ඉහත සඳහන් නිති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරතවන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ළඟම ඇති රෝහලට තුවාල කරුවන් රැගෙන නොගොස් රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

13. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමග කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;*

14. *බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමග කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

15. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායම් අනෙකුත් සාමාජිකයින් සමග කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ ( කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති හෙයින් ද;*

16. *2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශ බන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමග කුමන්ත්‍රණය කර ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

17. *2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025. 02. 27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;*

18. *2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ දේශ බන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

19. *2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314 2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් වරින් වර නිකුත් කරන ලද වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්ට අනුකූලවීමට අපොහොසත් වී ඇති බවත්, සිදුවෙමින් පවතින නිසි නෛතික ක්‍රියාවලියට හානි කරමින් සැඟවී සිටි බවත්, නීතියේ ආධිපත්‍යය, යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීම ආරක්ෂා කිරීමේ කාර්යය පවරා ඇති පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපයට සහ කීර්ති නාමයට කැළලක් සිදු කළ බවත් සමස්තයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව සහ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වූ බවත් එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවන් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවන් සිදු කර ඇති හෙයින් ද;*

20. *2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ඔබ විසින්, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන්* ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනිය මාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පීරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දූලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ. ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රීයන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු *යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;*

21. *2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ඔබ, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන්* ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත,

කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනිය මාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පිරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දුලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ. ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රීයන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු *යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඩුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;*

22. ඔබ මුළු රටේම නීතිය හා සාමය පවත්වා ගෙන යාමේ රාජකාරිය පැවරී ඇති මෙරට පොලිස්පති ධුරය හොබවන අතරේ, ඉහත කී විෂමාචාර සහ/හෝ බරපතල අන්දමින් බලය අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලින් එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීම මගින් මෙරට පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් කර, පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවන් සිදු කර එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

23. ඔබ විවිධාකාර ස්වභාවයේ පුළුල් බලතල පැවරී ඇති මෙරට පොලිස්පති ධුරය හොබවන අතරේ, ඉහත කී විෂමාචාර සහ/හෝ බරපතල අන්දමින් බලය අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලින් එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීම මගින් මෙරට පොලිස්පති ධුරය දරන තැනැත්තා වෙතින් අපේක්ෂා කෙරෙන ඉහළ ප්‍රමිතියට වඩා පහළ මට්ටමකට වැටී ඇති අතර, එම නිසා මෙරට පොලිස්පති ධුරය දැරීමට නුසුදුසු තත්ත්වයට පත්ව ඇති අතර එමගින් *2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත.*

*පරීක්ෂණ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති දිනයට හා වේලාවට පෙර එකී කමිටුව වෙත දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉහත කී චෝදනා සම්බන්ධයෙන් ඔබගේ හේතු දැක්වීම් ප්‍රකාශය ඉදිරිපත් කරන ලෙස මෙයින් ඔබට නියෝග කරනු ලැබේ. වැඩිදුර පරීක්ෂණය, එහි සමාප්තිය තෙක් දිනපතා පවත්වන බවට ද ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.*

## 3. අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය:

ඉහත සඳහන් කර ඇති පරිදි, මෙම පරීක්ෂණය පැවැත්වීම සඳහා සුදුසු කාර්ය පටිපාටියක් වගඋත්තරකාර පොලිස්පතිවරයා හෝ ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා සමඟ සාකච්ඡා කර අනුගමනය කිරීමට ද වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙත නොතීසි නිකුත් කිරීමට පරීක්ෂණ කමිටුව විසින් තීරණය කරනු

ලබන අවස්ථාවේ දී තීරණය කරන ලදි . එම තීරණය බලාත්මක කරමින්, මෙම පරීක්ෂණය පැවැත්වීම සඳහා අනුගමනය කළ යුතු වඩාත් සුදුසු කාර්ය පටිපාටිය පිළිබඳව එකඟ වී තීරණය කිරීමේ අරමුණින්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා සමඟ විමර්ශන කමිටුව විසින් දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදි . මෙම ක්‍රියාදාමය පුරාම ස්වභාවික යුක්තියේ නීතිරීතිවලට අනුකූල වීම සහතික කිරීමට තමන් කැපවී සිටින බව වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා යන දෙදෙනාටම විමර්ශන කමිටුව විසින් මෙම සාකච්ඡාව අතරතුර පැහැදිලි කරන ලදි.

ඉහත සාකච්ඡාව ප්‍රකාරව, විමර්ශන කමිටුව විසින් පහත සඳහන් කාර්ය පටිපාටිය අනුගමනය කළ යුතු බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් එකඟ වන ලදි :

1. වගඋත්තරකාර පොලිස්පතිවරයාට ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රය තුළ නියෝග කර ඇති ආකාරයට, චෝදනා විසිතුන සම්බන්ධයෙන් තම හේතුව ලිඛිතව ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා එකඟ විය.

2. ඕනෑම ලිඛිත ලේඛනයක් ද අමුණනු ලැබිය හැකි දිවුරුම් ප්‍රකාශයක් මගින් තම හේතු දැක්වීම සකස් කර ඉදිරිපත් කිරීමට වැඩි කාලයක් ඉල්ලා සිටිමින් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් යොමු කරන ලද අයදුම සඳහා අවසර දීමට විමර්ශන කමිටුව විසින් තීරණය කරන ලදි.

3. දෙපාර්ශවයේම කාලය සහ මහන්සිය ඉතිරි කර ගැනීම සහ විමර්ශන කමිටුව විසින් විමර්ශනය පහසුවෙන් ඉදිරියට ගෙන යාම සඳහා පහසුකම් සැලසීම පිණිස කිසියම් අදාළ කරුණක් හා සම්බන්ධ කිසියම් ඒත්තුගැනීමක් වාර්තා කිරීමට ඇති හැකියාව තම සේවාදායකයා (වගඋත්තරකාර පොලිස්පතිවරයා) සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා සමඟ සාකච්ඡා කර සලකා බැලීමට වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා එකඟ විය.

4. ගොනු කිරීමට නියමිත ලිඛිත හේතු දැක්වීමේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ගනු ලබන ස්ථාවරයන් සහ සටහන් කිරීමට නියමිත ඒත්තු ගැනීම් මත පදනම්ව, චෝදනා පත්‍රයේ දක්වා ඇති චෝදනාවලට සහාය දක්වමින් සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි මෙහෙයවීම ආරම්භ කිරීමට පෙර එම සාක්ෂිකරුවන්ගෙන් සටහන් කර ඇති සියළුම ප්‍රකාශවල පිටපත් පරීක්ෂණ කමිටුවට භාර දීමට පියවර ගැනීමට උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා එකඟ විය.

5. උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් පරීක්ෂණ කමිටුව ඉදිරියේ තමාට භාර දෙනු ලබන කරුණු මත ඉන් අනතුරුව වැඩිදුර හේතු දැක්වීමක් (දෙවන හේතු දැක්වීමක් ) ඉදිරිපත් කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා එකඟ විය. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් පරීක්ෂණ කමිටුව වෙත දෙවන හේතු දැක්වීම ඉදිරිපත් කරනු ඇත.

6. සිදු කළ හැකි කිසියම් පිළිගැනීමක් සටහන් කර ගැනීමෙන් පසුව සහ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් තමා වෙත භාර දෙනු ලබන කරුණු මත දෙවන හේතු දැක්වීම වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් භාර දෙනු ලැබීමෙන් පසුව තමන් විසින් පිටිවහලක් කර ගනු ලබන සාක්ෂි පරීක්ෂණ කමිටුව ඉදිරියේ තැබීමට උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා එකඟ විය.

7. පරීක්ෂණයේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කිරීම අවසානයේ දී, ලිඛිත කරුණු දැක්වීම් සිදු කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාට සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයාට පරීක්ෂණ කමිටුව විසින් අවස්ථාවක් ලබා දෙනු ඇත.

ඉන්පසු, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා යන දෙදෙනාම පරීක්ෂණ කමිටුව ඉදිරියේ අනුගමනය කිරීමට එකඟ වූ ඉහත සඳහන් කාර්ය පටිපාටියට අනුගතව කටයුතු කළහ. එකඟ වූ පරිදි, චෝදනා පත්‍රය භාර දීමෙන් පසු, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් තම නීතිඥවරයා හරහා, චෝදනා පත්‍රයේ දක්වා ඇති චෝදනා විසිතුන (23) සම්බන්ධයෙන් ඔහු ගන්නා ස්ථාවරය සඳහන් කරමින් දිවුරුම් ප්‍රකාශයක් මගින් ඔහුගේ පළමු හේතු දැක්වීම මෙම කමිටුවට ඉදිරිපත් කරන ලදි. ඉන් අනතුරුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා යන දෙදෙනාගේම එකඟතාවයෙන් පරීක්ෂණ කමිටුව විසින් මෙම පරීක්ෂණයට අදාළ කරුණු පිළිගැනීම් කිහිපයක් වාර්තා කිරීමට කටයුතු කළේය. ඉන්පසුව, උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අදහස් කරන සියළුම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල පිටපත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාට භාර දීමට පියවර ගන්නා ලදි. ඉන් අනතුරුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දීමට නියමිත සාක්ෂිකරුවන්ගේ සියළුම ප්‍රකාශවල පිටපත් ලැබුණු බව තහවුරු කර, එකී යෝජිත සාක්ෂි සම්බන්ධයෙන් ඔහු ගන්නා ස්ථාවරය දක්වමින් තම දෙවන හේතු දැක්වීම පරීක්ෂණ කමිටුවට භාර දෙන ලදි. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් මෙම දෙවන හේතු දැක්වීම ද දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරන ලදි. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ඉදිරිපත් කරන ලද දෙවන හේතු දැක්වීම ලැබීමෙන් අනතුරුව, පරීක්ෂණ කමිටුව නැවතත් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ එකඟතාවය ඇතිව තවත් පිළිගැනීම් කිහිපයක් වාර්තා කිරීමට කටයුතු කළේය. උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලද්දේ ඉන් පසුවය. මෙය විශේෂයෙන්ම සිදු කරන ලද්දේ, පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දෙන සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ අවස්ථාව ඉල්ලා සිටින බව වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් තම දෙවන හේතු දැක්වීම දැක්වෙන දිවුරුම් ප්‍රකාශය තුළ අවධාරනය කර ඇති බැවිනි. ඒ අනුව, උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා පරීක්ෂණ කමිටුව ඉදිරියේ පහත සඳහන් සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි මෙහෙයවීය:

(1) ප්‍රධාන පොලිස් පරීක්ෂක විලියම් බ්‍රිට්ස් අසංක තුසිත කුමාර,
(2) ප්‍රධාන පොලිස් පරීක්ෂක (වැඩ තහනමට ලක්ව සිටින) රම්මුණි උවන්නේ ඇන්ස්ලම් ද සිල්වා,
(3) පොලිස් සැරයන් (PS 16089) ඉමදුව මානගේ අජිත් සිසිර කුමාර,
(4) පොලිස් කොස්තාපල් රියදුරු (PCD 89728) අමරසිංහ කළු ආරච්චිගේ දුලිප් ගිහාන් පියතිස්ස,
(5) නියෝජ්‍ය පොලිස්පති ගුණන්දවඩු නිශාන්ත ද සොයිසා,

(6) ශ්‍රී ලංකා යුද හමුදාවේ සැරයන් (3 වැනි ගැමුණු හේවා, මාතර) ගම්මැද්ද තණ්ඩක්කාරලාගේ චන්දිමාල් රුවිරංග,

(7) උප පොලිස් පරීක්ෂක මාවනානේ හේවා ගාමිණී ජයසේකර,

(8) උප පොලිස් පරීක්ෂක සුදත් ධර්ම ශ්‍රී පුල්ලේපෙරුම,

(9) වැඩ බලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වීරසූරිය ලියන ආරච්චිගේ සමන් ප්‍රියන්ත,

(10) කාන්තා පොලිසිය සැරයන් කලහේපාඩි කංකානම්ගේ නාලිකා දිල්මා තිලකරත්න,

(11) 11) සහකාර පොලිස් අධිකාරී ඩිලාන් චාමර දොඩංගොඩ,

(12) පොලිස් කොස්තාපල් රියදුරු (PCD 80188) හේවා කොළඹගේ ප්‍රසාද්,

(13) පොලිස් කොස්තාපල් (PC 19484) කන්දප්පා හෙට්ටිගේ මහේෂ් උදාර,

(14) වගුරුවෙල ගමරාලලාගේ චානක ජීවන්ත පල්ලෙවත්ත (ජේලර්),

(15) පොලිස් සැරයන් (PS 1822) සමරකෝන් විජේවික්‍රම විදානේ මුහම්දිරම්ගේ උපුල් වසන්ත අල්විස් විජේවික්‍රම,

(16) පොලිස් කොස්තාපල් රියදුරු (PCD 105570) විජේකෝන් හේරත් මුදියන්සේලාගේ ඉෂාන් නිරෝෂ් බණ්ඩාර,

(17) සහකාර පොලිස් අධිකාරි අරුමප්පෙරුම ආරච්චිගේ චන්දිමා නිරෝෂනි අරුමප්පෙරුම,

(18) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොස්ගහමුලගෙදර ප්‍රගීත් බුද්ධික සමරපාල,

(19) ජාතික පොලිස් කොමිසමේ ලේකම්, තනුජා නයෝමි ප්‍රනාන්දු

(20) කාන්තා පොලිස් කොස්තාපල් 6754 මාකුඹුරේ ගෙදර හේරත් මුදියන්සේලාගේ ඉනෝකා චාන්දනී හේරත්,

(21) පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුම,

(22) කාන්තා උප පොලිස් පරීක්ෂක යටියන්තොට ඩයස් දමයන්ති ස්වර්ණලතා සමරසිංහ,

(23) කන්නන්ගර කෝරළලාගේ දෝන නෙල්කා ශ්‍යාමලී ජයතිලක

(24) පොලිස් පරීක්ෂක විජේතුංග මුදියන්සේලාගේ ශ්‍රියා බණ්ඩාර විජේතුංග,

(25) ප්‍රධාන පොලිස් පරීක්ෂක බාලසූරිය මොහොට්ටි අප්පුහාමිලාගේ සම්පත් කුමාර සේනාරත්න,

(26) උප පොලිස් පරීක්ෂක රාජපක්ෂ ආරච්චිලාගේ මහින්ද රාජපක්ෂ,

(27) ප්‍රධාන පොලිස් පරීක්ෂක හේනදීරගේ ලාලිත සුමින්ද ගුණසේකර

(28) සහකාර පොලිස් අධිකාරී බටුගෙදර අප්පුහාමිලාගේ වික්‍රම් කුමාර වීරසේකර,

(29) ප්‍රධාන පොලිස් පරීක්ෂක පස්ගම විදානලාගේ අශෝක ෂෙල්ටන් කරුණාතිලක,

(30) සහකාර පොලිස් අධිකාරී අබේසේකර ගම්ලත්ගේ යසස් ස්වර්ණ කීර්තිසිංහ සහ,

(31) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කුමාර බුද්ධික මනතුංග

ඉහත සඳහන් සියළු සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි සටහන් කර ගැනීම අවසන් කිරීමෙන් පසු, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් පරීක්ෂණ කමිටුව ඉදිරියේ වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සාක්ෂි දීමට පහත සාක්ෂිකරුවන් කැඳවන ලදි:

(1) වගඋත්තරකාර පොලිස්පති තෙන්නකෝන් මුදියන්සේලාගේ වංශාලංකාර දේශබන්දු තෙන්නකෝන්,

(2) නියෝජ්‍ය පොලිස්පති කපුගමරලාලාගේ ජගත් චන්ද්‍රකුමාර,

(3) විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහ,

(4) ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පත්තිනි වසම් මයුර ප්‍රසන්න පෙරේරා,
(5) විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී හෙට්ටිආරච්චිගේ නෙවිල් වර්ජින්ටන් ද සිල්වා,
(6) තනේෂ් බර්නාඩ් ඩයස්, සහ
(7) සුදන්තිතලපිටිය ප්‍රියන්ත ජයතිලක පෙරේරා.

පරීක්ෂණ කමිටුව ඉදිරියේ වාචික සාක්ෂි දීමට සාක්ෂිකරුවෙකු කැඳවන සෑම අවස්ථාවකම, ඔහුගේ හෝ ඇයගේ සාක්ෂි ප්‍රධාන වශයෙන්ම මෙහෙයවනු ලැබුවේ එම සාක්ෂිකරු කැඳවීම සිදු කරන ලද උගත් නීතිඥවරයා විසිනි; ඉන් අනතුරුව, එම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ කාර්යය සඳහා අනෙක් නීතිඥවරයාට බාධාවකින් තොරව අවස්ථාව සලසා දෙන ලදී; එම සාක්ෂිකරු කැඳවන ලද උගත් නීතිඥවරයා හට එම සාක්ෂිකරුගෙන් නැවත ප්‍රශ්න කිරීමට තවත් අවස්ථාවක් ලබා දෙන ලදී.

මේ අනුව, චෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලට සහාය දක්වමින් සාක්ෂිකරුවන් 31 දෙනෙකුගේ වාචික සාක්ෂි පරීක්ෂණ කමිටුව ඉදිරියේ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් මෙහෙයවන ලදී. සාක්ෂිකරුවන් 15 දෙනෙකුගේ නම් අඩංගු ලැයිස්තුවක් ගොනු කිරීමෙන් පසු, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් සාක්ෂිකරුවන් 07 දෙනෙකුගේ වාචික සාක්ෂි පරීක්ෂණ කමිටුව ඉදිරියේ මෙහෙයවන ලදී.

**4. අංක 01-16 දක්වා චෝදනාවලට අදාළ සාක්ෂි සාරාංශය සහ ඇගයීම;**

1) <u>ප්‍රධාන පොලිස් පරීක්ෂක (CI) රම්මුනි උවන්නේ ඇන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂි</u>

ප්‍රධාන සාක්ෂිකරු වන මෙම සාක්ෂිකරු කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, තමන් 2019 ඔක්තෝබර් මාසයේ සිට කොළඹ අපරාධ කොට්ඨාශයේ (මෙතැන් සිට මෙම වාර්තාවේ ඇතැම්විට සී.සී.ඩී ලෙස ද හැඳින්වේ) සේවය කිරීමට සම්බන්ධ වී ඇති බවත්, 2023-12-30 දින වන විට කොළඹ අපරාධ කොට්ඨාශයෙහි ස්ථාන භාර නිලධාරී (OIC) තනතුර දැරූ බවත්ය. තමන් විසින් සාක්ෂි ලබා දීමේ දී, ඔහු විසින් වැදගත් කරුණු රාශියක් හෙළි කරන ලද අතර, ඒවා අතර පහත සඳහන් කරුණු කමිටුව විසින් මෙම වාර්තාව තුළ අවධාරණය කරනු ඇත.

එවකට කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේ සහකාර පොලිස් අධිකාරී (ASP) නෙවිල් ද සිල්වා[2] ය. එවකට කොළඹ දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කළේ නියෝජ්‍ය පොලිස්පති (DIG) ජගත් චන්ද්‍ර කුමාර ය. බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (SDIG) වූයේ වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා ය. ඔහු එවකට වැඩබලන පොලිස්පති වරයා ද විය.

---

මෙම සාක්ෂිකරු විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දුන්නද, මෙම වාර්තාවේ ඔහු සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ලෙස හඳුන්වනු ලැබේ

කොළඹ අපරාධ කොට්ඨාශයෙහි එවකට සංවිධානාත්මක අපරාධ ඒකකයේ ස්ථාන භාර නිලධාරියා වූයේ පොලිස් පරීක්ෂක (IP) ජයතිලක ය. ලැයිස්තුවේ නම් හමු වූ පුද්ගලයින් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පොලිස් පරීක්ෂක ජයතිලකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් මාතර ප්‍රදේශයට යාමට නියමිතව තිබුණි.

කොළඹ අපරාධ කොට්ඨාශයෙහි එවකට සංවිධානාත්මක අපරාධ ඒකකයේ ස්ථාන භාර නිලධාරියා වූයේ පොලිස් පරීක්ෂක (IP ) ජයතිලක ය. කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂ විසින් ලබා දුන් ලේඛනයට අමුණා ඇති ලැයිස්තුවේ නම් හමු වූ පුද්ගලයින් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පොලිස් පරීක්ෂක ජයතිලකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් මාතර ප්‍රදේශයට යාමට නියමිතව තිබුණි. පොලිස් පරීක්ෂක ජයතිලකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම 2023-12- 29 දින මාතරට ගියේය.

මත්ද්‍රව්‍ය සාදවලට සම්බන්ධ පුද්ගලයින් බිය ගැන්වීම සඳහා වැලිගම පිහිටි W15 හෝටලයට වෙඩි තැබීමට නිශ්චිත උපදෙස් සහිතව පොලිස් පරීක්ෂක (IP) දුනුසිංහ, පොලිස් පරීක්ෂක (IP) නිශාන්ත සහ උප පොලිස් පරීක්ෂක (SI) මධුරංග සමඟ වැලිගමට යන ලෙස සී.සී.ඩී හි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම සාක්ෂිකරුට පැවසීය; පොලිස් පරීක්ෂක නිශාන්ත 01 ඒකකයේ ස්ථාන භාර නිලධාරියා ලෙස කටයුතු කළ අතර, පොලිස් පරීක්ෂක දුනුසිංහ කොළඹ අපරාධ කොට්ඨාශයෙහි දූෂණ මර්දන ඒකකයේ ස්ථාන භාර නිලධාරියා ලෙස කටයුතු කළේය. මෙම මෙහෙයුම පිළිබඳව මාතර ප්‍රදේශයේ පොලිස් බලධාරීන් දැනුවත් කිරීමට පියවර ගෙන ඇති බව ද වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඔවුන්ට පවසා තිබුණි.

කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් WP PK 7225 ලියාපදිංචි අංකය සහිත සුදු පැහැති KDH වර්ගයේ වෑන් රථය පැදවූයේ පොලිස් කොස්තාපල් රියදුරු (PCD) 89728 දුලිප් ගිහාන් පියතිස්ස විසිනි. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා ප්‍රමුඛ කණ්ඩායම 2023-12-30 වන දින රාත්‍රී 8.30 ට කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කාර්යාලයෙන් පිටව යාමට පෙර, වෑන් රථයේ බාහිර පෙනුම පිටතින් පෙනෙන පරිදි වෙනස් කරන ලදී. පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් විසින් වෑන් රථයේ බඳෙහි ස්ටිකරයක් ඇලවීමෙන් මෙය සිදු කරන ලදී. පොලිස් පරීක්ෂක නිශාන්තගේ ඉල්ලීම පරිදි පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් වෑන් රථයේ ස්ටිකරය අලවා ඇති බව මෙම සාක්ෂිකරු දැන සිටියේය. උප පොලිස් පරීක්ෂක මධුරංග වම් පස පිටුපස දොර අසල T56 අවියක් රැගෙන වාඩි වී සිටියේය. මෙම සිද්ධියේදී මියගිය පොලිස් සැරයන් (PS) 57421 උපුල් ද T56 අවියක් රැගෙන ගියේය. කණ්ඩායමේ නායකයා වූ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා පිස්තෝලයක් රැගෙන ගිය අතර පොලිස් පරීක්ෂක නිශාන්ත ද පිස්තෝලයක් රැගෙන ගියේය. මෙම සාක්ෂිකරු සිද්ධිය වූ අවස්ථාවේ වෑන් රථයේ ආසන සැකැස්ම P-1(A) ලෙස සලකුණු කර ඇති සටහනේ දැක්වෙන බව හඳුනා ගත්තේය. එය 2025-02-27 දිනැති පොලිස් සැරයන් (PS) 57421 උපුල්ගේ මරණය පිළිබඳ මරණ පරීක්ෂණය අවසානයේ මාතර උගත් මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයේ කොටසකි.

කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කාර්යාලයෙන් පිටව ගිය පසු, මෙම සාක්ෂිකරු ගල්කිස්සේ පිහිටි ඔහුගේ නිවසේ සිටි ඔහුගේ මහලු පියාට රාත්‍රී ආහාර පැකට්ටුවක් ලබා දීම සඳහා එම වෑන් රථයේ සිටි කණ්ඩායම සමඟ එම නිවසට ගියේය. පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් වෑන් රථයේ අංක තහඩු ව්‍යාජ අංක තහඩු බවට පත් කිරීමට පියවර ගෙන ඇත්තේ එම කාලය තුළ ය. ඉදිරිපස සහ පසුපස පැති දෙකෙහිම ව්‍යාජ

අංක තහඩු සවි කරනු ලැබුණි. කණ්ඩායමේ සියළුම සාමාජිකයෝ සිවිල් ඇඳුම් ඇඳ සිටියහ. වෑන් රථයේ ආරක්ෂිත හිස්වැසුම් දෙකක් තිබුණි. අතරමගදී, ඔවුන් රත්මලානේ පිහිටි ''පිලාවුස්'' නම් වූ අවන්හලකින් රාත්‍රී ආහාරය ගත්හ. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා, පරීක්ෂණයක් සඳහා කණ්ඩායම සමඟ මාතර ප්‍රදේශයට පිටත්ව යන බව පිළිබිඹු කිරීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාශයෙහි ඒකක 01 හි තොරතුරු පොතේ ඔහුගේ පිටවීමේ සටහන ඇතුළත් කළේය. මෙම සාක්ෂිකරු එසේ කර ඇත්තේ වැලිගම W15 හෝටලයේදී වෙඩි තැබීමට යන බව සහ එය නීති විරෝධී ක්‍රියාවක් බව හොඳින් දැන සිටියදී ය. කණ්ඩායමේ සමහර සාමාජිකයින් ඔවුන්ගේ සිවිල් ඇඳුම්වලට ඉහළින් ජැකට් පැළඳ සිටියහ.දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් කර කොක්මාදූව පිටවීමේ ස්ථානයෙන් පිටව ගිය ඔවුන් W15 හෝටලය පිහිටා තිබූ වැලිගම ප්‍රදේශයට පැමිණ W15 හෝටලය සොයා ගන්නා තෙක් ගාලු පාර දිගේ ගමන් කර ඇත. නීති විරෝධී ක්‍රියාවක් කිරීමට ඔවුන්ට උපදෙස් ලබා දී තිබූ අතර, ඒ වන විට මාර්ගයේ ගමන් කරන වාහන සුළු සංඛ්‍යාවක් තිබූ බැවින්, ඔවුහු වෙරළ අසල පිහිටි ස්ථානයකට ගොස්, වෑන් රථය නවතා, මාර්ගයේ වාහන ප්‍රවාහය අඩු වන තෙක් බලා සිටියහ. 2023-12-30 වන දින රාත්‍රී 11.00 ට පමණ ඔවුන් වැලිගම ප්‍රදේශයට ළඟා වුවද, 2023-12-31 වන දින අලුයම 2.20 ට පමණ නීති විරෝධී මෙහෙයුම ක්‍රියාත්මක කිරීම සඳහා W15 හෝටලය ඉදිරිපිටට ගොස් වෑන් රථය නතර කර ඇත.

මෙම සාක්ෂිකරුට අනුව, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් තමාට, පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනාට සහ උප පොලිස් පරීක්ෂකවරයාට වැලිගමට යන ලෙස පවසන ලද විට, උප පොලිස් පරීක්ෂක මධුරංග W15 හෝටලයේදී වෙඩි තැබීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ඇත. ඒ අනුව, උප පොලිස් පරීක්ෂක මධුරංග වෑන් රථයේ වම් පැත්තේ තල්ලු කරන දොර විවෘත කර W15 හෝටලය ඉලක්ක කර ගනිමින් ඔහු රැගෙන ගිය T56 තුවක්කුවෙන් වෙඩි තැබීය. මෙම සාක්ෂිකරුට අනුව, උප පොලිස් පරීක්ෂක මධුරංග තම T56 අවියෙන් W15 හෝටලය දෙසට වට 8-10ක් පමණ වෙඩි තබා ඇත. වෙඩි තැබීම්වලින් නිකුත් වූ දරාගත නොහැකි ශබ්දයක් වෑන් රථය ඇතුළතින් ඇසුනු හෙයින් , ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා තම දෑත්වලින් කන් වසාගෙන ඉදිරිපස අසුනේ පිටුපස කොටස යටට හිස පහත් කර සිට ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා ඉතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත්තේ උප පොලිස් පරීක්ෂක මධුරංග W15 හෝටලයේදී වෙඩි තැබීමට පෙර ඔවුන්ට වෙඩි තැබූ කිසිවෙකු අවට නොසිටි බවයි. මෙම සාක්ෂිකරු පැහැදිලිව සහ නිශ්චිතව ප්‍රකාශ කර ඇත්තේ W15 හෝටලයට වෙඩි තැබීමේ නීති විරෝධී මෙහෙයුම සිදු කිරීම සඳහා කණ්ඩායම කොළඹ සිට වැලිගම දක්වා ගොස් 2023-12-31 වන දින අලුයම 2.20 දක්වා රැඳී සිටි බවයි. මේ අනුව, උප පොලිස් පරීක්ෂක මධුරංග මේ මොහොතේ හිතාමතාම, කිසිඳු සොයා බැලීමකින් තොරව W15 හෝටලයට වෙඩි තැබූ බව ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ පැහැදිලි ස්ථාවරයයි.

හදිසියේම, මේ මොහොතේ, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයට වෙඩි ප්‍රහාරයක් එල්ල වූ අතර, සාක්ෂිකරු වෑන් රථයේ සිටි අනෙක් අයගෙන් දැනගත්තේ වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය පැමිණ කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයට වෙඩි තැබූ බවයි. වැලිගම පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම විසින් වෙඩි තැබීම සිදු වූයේ උප පොලිස් පරීක්ෂක මධුරංග W15 හෝටලයේදී වෙඩි තැබීම නැවැත්වීමෙන් පසුව බව මෙම සාක්ෂිකරු පැහැදිලිව සහ නිශ්චිතව ප්‍රකාශ කර ඇත. වැලිගම පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයට වෙඩි තැබීමත් සමඟ, පොලිස් සරයන් 57421 උපුල් සහ උප පොලිස් පරීක්ෂක මධුරංග වෙඩි වැදීමෙන් තුවාල ලැබූහ. උප පොලිස් පරීක්ෂක මධුරංග වෑන් රථයේ පැති දොර අසලම අසුන්ගෙන සිටිය ද, ඔහුට එය වසා ගැනීමට පවා නොහැකි විය. මෙම මෙහෙයුම පිළිබඳව ප්‍රදේශයේ පොලිස් බලධාරීන්

දැනුවත් කර ඇති බවට ඔවුන්ව නොමග යැවීමට කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් ඔවුන්ට බොරුවක් පවසා ඇති බව එවිට ඔහුට සහ කණ්ඩායමේ අනෙක් අයට වැටහුණි.

මෙම සාක්ෂිකරුට අනුව, W15 හෝටලයේ වෙඩි තැබීම සඳහා කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථය එය නවතා තිබූ ස්ථානයෙන් වේගයෙන් ඉවතට ධාවනය කිරීමට පටන් ගත් විට, වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි පොලිස් නිලධාරීන් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයට වෙඩි තබා ඇත. වෙඩි ප්‍රහාරයකට ලක් වීමේ අනපේක්ෂිත සිදුවීමත් සමඟ, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයේ සිටි සියල්ලන්ම ව්‍යාකූල වී, බියට පත් වී සහ කම්පනයට පත් වී ඇත. යම් දුරක් ගමන් කිරීමෙන් පසු, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථය අතුරු මාර්ගයකට හැරී තිබුණි. අතුරු මාර්ගයේ යම් ස්ථානයක, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථය නතර විය. ඒ වන විට වැලිගම පොලිස් නිලධාරීන් වෙඩි තැබීම හේතුවෙන් වෑන් රථයේ පිටුපස වීදුරු සහ තවත් වීදුරු කිහිපයක් කැඩී ගොස් තිබුණි. වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු, වෑන් රථය ගමන් කරන විට පවා කැඩුණු වීදුරු කැබලි වරින් වර වැටුණු බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. ඔවුන් වේගයෙන් යන විට මාර්ගය අසල STF නිලධාරීන් කිහිප දෙනෙකු සමඟ STF බස් රථයක් තිබී ඇත. එක් අවස්ථාවක ඔහු ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්තගේ ජංගම දුරකථනය හරහා වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට කතා කළේය. කෙසේ වෙතත්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඒ අවස්ථාවේ ඔවුන් කළ යුතු දේ පිළිබඳව කිසිදු නිශ්චිත උපදෙසක් ලබා දුන්නේ නැත.

ඉන්පසුව, පොලිස් පරීක්ෂක නිශාන්ත සහ පොලිස් පරීක්ෂක දුනුසිංහ ඔවුන්ගේ ජංගම දුරකථන ආධාරයෙන් අධිවේගී මාර්ග පිවිසුමට ගමන්කිරීමට මාර්ගයක් සෙවූ අතර, පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් සහ කණ්ඩායමේ තවත් නිලධාරියෙක් වෑන් රථයෙන් බැස ව්‍යාජ අංක තහඩු ඉවත් කර වෑන් රථයේ නිවැරදි අංක තහඩු නැවත සවි කළහ. ඉන්පසු ඔවුන් දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමට පැමිණි අතර, එහිදී ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ නිලධාරීන් ඔවුන්ව නතර කර තිබුණි. ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ පොලිස් නිලධාරීන් ඔවුන්ට කොළඹ දෙසට අධිවේගී මාර්ගයට ඇතුළු වීමට ඉඩ දුන්නේ නැත. ටික වේලාවකට පසු, වැලිගම මූලස්ථාන පරීක්ෂක (HQI) අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමට පැමිණ කොළඹ අපරාධ කොට්ඨාශයෙහි තුවාල ලැබූ නිලධාරීන් දෙදෙනා ගිලන් රථයකින් රෝහලට යැවීමට පියවර ගත්තේය. අනෙක් තැනැත්තන් වැලිගම මූලස්ථාන පරීක්ෂක විසින් වැලිගම පොලිස් ස්ථානයට ගෙන යන ලදී.

වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු සිදුවූයේ කුමක්දැයි තහවුරු කර ගැනීම සඳහා වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් කිසි විටෙකත් තමාට කතා නොකළ බව මෙම සාක්ෂිකරු විශේෂයෙන් ඔහුගේ සාක්ෂියේ සඳහන් කර ඇත. මෙම දිනයේ වැලිගම සිදුවූයේ කුමක්දැයි තහවුරු කර ගැනීම සඳහා නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර ද කිසි විටෙකත් තමාට කතා නොකළ බව ඔහු ප්‍රකාශ කර ඇත. වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා 2023-12-31 වන දින පෙ.ව. 5.30 සිට පෙ.ව. 6.00 අතර වැලිගම පොලිස් ස්ථානයට පැමිණ ඇත. වැලිගම W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන තුන්වන පාර්ශවයක් විසින් වෙඩි තැබූ විට ප්‍රතිප්‍රහාර පිණිස තමන් වෙඩි තැබූ බවට කතාව ගොතමින් වැලිගම පොලිසියට ප්‍රකාශ ලබා දෙන ලෙස, වෙඩි තැබීමේ සිද්ධියට මුහුණ දුන් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායම් සාමාජිකයින් සමඟ සාකච්ඡා කර ඔවුනට , වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් උපදෙස් දී ඇත. ඉන්පසුව, W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන තුන්වන පාර්ශවයක්

විසින් වෙඩි තැබූ විට තමන් ප්‍රතිප්‍රහාර ලෙස වෙඩි තැබූ බවට කතාව ගොතමින් වැලිගම පොලිසියට ප්‍රකාශ ලබා දීමට කණ්ඩායම් සාමාජිකයින් විසින් පියවර ගෙන තිබුණි. මාතර ගරු මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පවා, මරණ පරීක්ෂණයේදී (BR 6314/2023 නඩුවට අදාළව මහේස්ත්‍රාත්වරයා විසින් පවත්වන ලද) තම සාක්ෂි සටහන් කරගනු ලැබීමේ දී කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායම් සාමාජිකයින් විසින් සිදුවීම්වල එම ගොතන ලද අනුවාදයම විස්තර කර ඇත. ඉන් අනතුරුව , අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ලද පළමු ප්‍රකාශයේදී ද ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා විසින් එම ගොතන ලද කතාවම පවසා තිබුණි. කෙසේ වෙතත්, පසුව, අනෙකුත් සාමාජිකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සහ වැලිගමට ගිය ඔහුගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් විසින්, 2025 මාර්තු මාසයේදී, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සත්‍ය කතාව හෙළි කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී තිබුණි.

වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය පොලිස් සැරයන් 57421 උපුල්ට පිරිනමන ලද ත්‍යාගය වෙනුවෙන් සකස් කරන ලද ත්‍යාග වවුචරය හඳුනා ගත් ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා, එය කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ නියෝගය මත සකස් කරන ලද බව ප්‍රකාශ කර ඇත. ත්‍යාග වවුචරයේ P-2 හි සඳහන් කර ඇති පදනම වන ඩබ්ලිව්. චින්තක නොහොත් හරක්කටා සමඟ හෙරොයින් ව්‍යාපාරයක නියැලී සිටි බවට සැක කරන නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තැබීමෙන් පොලිස් සැරයන් 57241 උපුල් මිය ගිය බවට සඳහන් කර ඇති පදනම පැහැදිලිවම ගොතන ලද සහ අසත්‍ය ප්‍රකාශයක් බව ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ ස්ථාවරයයි. මෙම සාක්ෂිකරුට අනුව, මෙම අසත්‍ය ප්‍රකාශය P-2 ත්‍යාග වවුචරයට හිතාමතාම ඇතුළත් කර ඇති අතර, උප පොලිස් පරීක්ෂක මධුරංග විසින් W15 හෝටලයට වෙඩි තැබීමේ ක්‍රියාව නීති විරෝධී ක්‍රියාවක් ලෙස සිදු කරන ලද බව ඔහුගේ කණ්ඩායමේ සියලුම සාමාජිකයෝ දැන සිටියහ.

අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමේ තීරණය අවලංගු කිරීම සඳහා සර්ටියෝරාරි ආඥාවක් නිකුත් කරන ලෙසට ඉල්ලා සිටිමින් ඔවුන් වෙනුවෙන් තමන් විසින් අභියාචනාධිකරණය හමුවේ ගොනු කර ඇති, ඔහු විසින් අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ පවා, ව්‍යාජ කරුණු අඩංගු වූ බව මෙම සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කර ඇත. එනම්, මෙම සිදුවීම සිදු වූ ආකාරය සම්බන්ධයෙන් ගොතන ලද කතාවම ය.

තමන් ප්‍රමුඛ කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායමට 2023-12-30 දින වැලිගමට යාමට උසස් නිලධාරීන් විසින් අවසර ලබා දී ඇති බව ව්‍යාජ ලෙස පෙන්වීමට, මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් පසුව සහ පොලිස් සරයන් 57241 උපුල්ගේ මරණයෙන් පසු සකස් කරන ලද ලියකියවිලි ලෙස P-13, P-14, P-15 සහ P-16 යන ලියකියවිලි මෙම සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදි. මෙම සාක්ෂිකරුට අනුව, වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම කණ්ඩායමට W15 හෝටලයේ වෙඩි තැබීම සිදු කරන ලෙස ඉල්ලා සිටියේ 2023-12-30 දින පමණි. කෙසේ වෙතත්, P-13, P-14, P-15 සහ P-16 ට අනුව සියළුම උසස් නිලධාරීන් එනම් සහකාර පොලිස් අධිකාරී (ASP) , නියෝජ්‍ය පොලිස්පති (DIG) සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ( SDIG) ( වගඋත්තරකාර පොලිස්පතිවරයා) විසින් 2023-12-30 දින මෙම කණ්ඩායමට වැලිගමට යාමට අවසර ලබා දී තිබුනේ 2023-12-29 දින ය. එපමණක් නොව, 2023-12-30 දින රාත්‍රී 8.30 ට කොළඹ අපරාධ කොට්ඨාශයෙහි පරිශ්‍රයෙන් පිටව යන අවස්ථාවේ දී එවැනි ගමනක් යාමට කිසිදු උසස් නිලධාරියෙකුගෙන් ලිඛිත අවසරයක් නොතිබූ බව මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත. මෙයින් පෙනී යන්නේ පුරවා අනුමත කරන ලද පොලිස් පෝරම 439 සහ P-13 සිට P-16 දක්වා සලකුණු

කර ඇති ලේඛන වන සහකාර පොලිස් අධිකාරී (ASP), නියෝජ්‍ය පොලිස්පති (DIG) සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (SDIG) (වගඋත්තරකාර පොලිස්පතිවරයා) විසින් නිකුත් කරන ලද ආවරණ ලිපි 2023-12-29 දිනට නොතිබූ ලේඛන බවයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇති අදාළ කරුණු කිහිපයක් අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ: වයස අවුරුදු 58 ක් වන ඔහු මේ වන විට විශ්‍රාම යන වයසට ආසන්නය ; නදුන් චින්තක නොහොත් හරක් කටාගේ මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලය පිළිබඳ විමර්ශනයට කොළඹ අපරාධ කොට්ඨාශය සම්බන්ධ විය; මෙම විමර්ශනය ප්‍රධාන වශයෙන් සිදු කරන ලද්දේ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්තගේ ඒකකය විසිනි; ඒ නිසා ඔහු ප්‍රධාන පොලිස් පරීක්ෂක නිශාන්ත ස්ථාන භාර නිලධාරියා ලෙස කටයුතු කරන 01 වන ඒකකයෙහි පවත්වාගෙන යනු ලබන තොරතුරු පොතේ ඔහුගේ පිටවීම ඇතුළත් කළේය; වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඉහත සඳහන් නිලධාරීන් ඉදිරියේ ඔහුගේ කාර්යාලයේදී ඉහත සඳහන් නීති විරෝධී උපදෙස් ලබා දුන්නේය; R-2 හි අමුණා ඇති ලැයිස්තුවේ සඳහන් පුද්ගලයින් සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කරන ලෙස කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂවරයාට උපදෙස් දී ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයා බව ඔහු දැන සිටියේය.

හරස් ප්‍රශ්න ඇසීමේදී, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා මහතා නැවත වරක් ප්‍රකාශ කර ඇත්තේ, වැලිගම W15 හෝටලය ඉදිරිපිට සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියේ සිදුවීම් අනුපිළිවෙලට අදාළව පෙර ප්‍රකාශ මාලාවේදී ඔහු පැවසූ දේ ගොතන ලද අනුවාදයක් බවයි. ඔහු විසින් මුලින්ම, 2023-12-31 දින වැලිගම පොලිස් ස්ථානයට කළ ප්‍රකාශයේ දී, දෙවනුව, 2024-02-29 දින මාතර මහේස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ මරණ පරීක්ෂණ කටයුතුවලදී සටහන් කරගත් සාක්ෂියේ දී සහ තෙවනුව, 2025-02-03 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කළ ප්‍රකාශයේ දී සඳහන් කර ඇත්තේ සිදුවීම්වල ගොතන ලද අනුවාදයයි. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ, 2025-03-08 දින ඔහු විසින් ස්වේච්ඡාවෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද ප්‍රකාශයේ සහ පසුව 2025-03-22 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කරන ලද ඊළඟ ප්‍රකාශයේ දී සිදුවීම්වල සත්‍ය සහ නිවැරදි අනුවාදය ප්‍රකාශ කර ඇති බවයි.

CA Writ 817/2024 හි R-9 ලෙස ගොනු කර ඇති පෙත්සම; R-10 ලෙස එයට අමුණා ඇති දිවුරුම් ප්‍රකාශය; පෙත්සම්කරුවන් හය දෙනා විසින් R-11 ලෙස ගොනු කර ඇති පෙරකලාසිය; එම නඩුවේ R-12 ලෙස ගොනු කර ඇති අවබෝධතා ගිවිසුම; වැඩබලන අධ්‍යක්ෂ නෙවිල් ද සිල්වා විසින් R-13 ලෙස අත්සන් කරන ලද පෙරකලාසිය: සහ R-14 ලෙස ඇති නඩුවේ ජර්නල් සටහන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් පරීක්ෂණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. වැඩබලන අධ්‍යක්ෂ හෙට්ටිආරච්චිගේ නෙවිල් වර්ජින්ටන් ද සිල්වා විසින් කුරුවිට බන්ධනාගාරයේදී මෙම දිවුරුම් ප්‍රකාශයට අත්සන් තබා ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් හරස් ප්‍රශ්න නැගීමේ දී අසන ලද ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වූයේ සමහර අවස්ථාවල කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් තම ස්ථානයෙන් පිටතට යම් යම් රාජකාරි සඳහා යන විට පිට පළාත් පොලිස් ස්ථානවලට දැනුම් නොදෙන බවයි.

මෙම සාක්ෂිකරු මෙම නීති විරෝධී නියෝගයට එරෙහිව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට පැමිණිලි නොකළේ මන්දැයි වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විමසා තිබුණි. එවිට මෙම සාක්ෂිකරු පිළිතුරු දී ඇත්තේ ඔහු එසේ කළහොත් ඔහුට පොලිස් සේවයේ දිගටම රැඳී සිටීමට නොහැකි වන බවයි. කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂවරයා ඉදිරියේ සියළුම සාමාජිකයින් මෙම නීති විරෝධී නියෝගය ක්‍රියාත්මක කිරීමට භාරගත් බැවින් ඒ සඳහා සටහනක් ඇතුළත් කිරීමට තමාට නොහැකි වූ බව ද මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර තිබේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුට යෝජනා කර තිබුණේ 2025-03-06 දින ඔහුගේ වැඩ තහනම් කිරීමෙන් පසුව ඔහු මෙම ප්‍රකාශය කළ බවයි. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් වැඩ තහනම අපේක්ෂා කරමින් සිටි බවත්, 2025-03-08 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සත්‍යය හෙළි කිරීමට ඔවුන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූයේ ඒ නිසා බවත්ය.

හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙන අවස්ථාවේ දී පවා මෙම සාක්ෂිකරු විශේෂයෙන් පිළිගෙන ඇත්තේ තම නායකත්වයෙන් වැලිගමට ගිය කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක්, එනම් වැලිගම W15 හෝටලයට වෙඩි තැබීම, සිදු කරන ලද බවයි. ඉහත කරුණු වලට අමතරව, ප්‍රධාන සාක්ෂි විභාගයේදී ඔහු ප්‍රකාශ කළ සිදුවීම් අනුපිළිවෙල සිදුවීම්වල නිවැරදි අනුවාදය ලෙස නැවත නැවතත් විස්තර කර ඇත. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙන අවස්ථාවේ දී මෙම සාක්ෂිකරු එම සිදුවීම් අනුපිළිවෙලින් බැහැර වී නැත. මූලික ප්‍රකාශ මාලාව, මාතර මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පැවති මරණ පරීක්ෂණයේදී ලබා දුන් සාක්ෂි සහ W15 හෝටලයේ වෙඩි තැබිමක් ඇතිවීමට හේතු වූ සිදුවීම් අනුපිළිවෙල සම්බන්ධයෙන් ගොතන ලද සිදුවීම් අනුවාදයක්, අභියාචනාධිකරණය ඉදිරියේ ගොනු කරන ලද දිවුරුම් ප්‍රකාශය තුළ අඩංගු බව ඔහු විසින් නැවත නැවතත් ප්‍රකාශ කර ඇත. වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය පැමිණීම තමා දුටුවේ නැති නමුත් වෑන් රථයේ සිටි අනෙක් අයගෙන් එය දැනගත් බව ඔහු නැවත නැවතත් තහවුරු කර ප්‍රකාශ කර ඇත. සාක්ෂිකරු නොසැලකිලිමත් වි ඇති බවත්, තුවාල ලැබූවන් හැකි ඉක්මනින් රෝහල් ගත කිරීම ප්‍රමාද කර ඇති බවත්, එම නොසැලකිල්ල පොලිස් සැරයන් උපුල්ගේ මරණයට හේතු වී ඇති බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත. හරස් ප්‍රශ්න ඇසීමේදී අසන ලද ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු දෙමින්, වැලිගම පොලිස් නිලධාරීන් නැවතත් ඔවුන්ට වෙඩි තබනු ඇතැයි යන බියෙන් තම කණ්ඩායම නැවත නගරය දෙසට නොයෑමට තීරණය කළ බව මෙම සාක්ෂිකරු පවසා තිබේ. වැලිගම W15 හෝටලයට වෙඩි තැබීමට නීති විරෝධී නියෝගයක් ලැබුණු බවට ඔහු කළ ප්‍රකාශය අසත්‍ය බව වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරු එම යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත.

මෙම පරීක්ෂණ කමිටුව ඉදිරියේ හමුදා සැරයන් රුවිරංග ද සාක්ෂි ලබා දී ඇත. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල සඳහන් කර ඇති හේතු නිසා, වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරය භාරව සිටි පොලිස් සැරයන් සිසිර කුමාරගේ සාක්ෂි සහ කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයට වෙඩි තැබීමට T56 අවියක් භාවිතා කළ හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි සත්‍ය බව පරීක්ෂණ කමිටුව විසින් නිගමනය කර ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා විසින් ලබා දුන් සාක්ෂි, ඉහත සඳහන් එක් එක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සමඟ අනුකූල වන අතර එම නිසා ඔවුහු එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් තහවුරු කරති. W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙකු විසින් වෙඩි තැබූ විට පමණක්

තමන් විසින් ප්‍රතිප්‍රහාර එල්ල කළ බවට කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමේ සාමාජිකයින් විසින් 2023-12-31 දින වැලිගම පොලිසියට ලබා දෙන ලද, ඔවුන්ගේ ප්‍රකාශවල මුල් අනුවාදය , වැලිගම වෙඩි තැබීමේ සිද්ධියේ නිවැරදි අනුවාදය ලෙස ගත යුතු බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා ගත් ස්ථාවරය ප්‍රතික්ෂේප කිරීමට මෙම වාර්තාවේ ඉදිරි පිටුවල කමිටුව විසින් තීරණය කර ඇත. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල දක්වා ඇති හේතු නිසා, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවනු ලැබූ නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර සහ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා යන මහත්වරුන් විසින් මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ස්ථාවරයන් ප්‍රතික්ෂේප කිරීමට ද කමිටුව විසින් තීරණය කර ඇත. මේ අනුව, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට පරීක්ෂණ කමිටුවට කිසිදු පදනමක් නොමැති නමුත් ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂි පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට සෑම හේතුවක්ම තිබේ.

2) <u>පොලිස් සැරයන් (PS 16089) ඉමදුව මානගේ අජිත් සිසිර කුමාරගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු වැලිගම ප්‍රදේශයේ පොලිස් සහ හමුදා ඒකාබද්ධ රාත්‍රී ජංගම මුර සංචාරය භාරව සිටි පොලිස් සැරයන්වරයාය. මෙම මුර සංචාරක කණ්ඩායම වැලිගම පොලිස් ස්ථානයට අයත් ලියාපදිංචි අංක GC 0320 දරන ජීප් රථයෙන් ගමන් කරමින් සිටියේ ය. මෙම සාක්ෂිකරුට අනුව, වැලිගම පොලිස් ස්ථානයේ මෙම රාත්‍රී ජංගම මුර සංචාරක කණ්ඩායම සිද්ධිය වන අවස්ථාවේ ගාලු පාරේ ගාල්ල දෙසට පැමිණෙමින් සිටියේය. ඔහු ජීප් රථයේ ඉදිරිපස රියදුරු පේළියේ වම් පස අසුනේ වාඩි වී සිටියේය. මෙම ජීප් රථය 'පොලිස්' යනුවෙන් මුද්‍රණය කර ඇති ජීප් රථයක් වන අතර එය පොලිස් ජීප් රථයක් ලෙස පහසුවෙන් හඳුනාගත හැකිය. එය මෙරට පොලිසිය විසින් භාවිතා කරන ජීප් රථවල සම්මත ස්වභාවය වන නිල් පැහැති පොලිස් ජීප් රථයක් වේ. ජීප් රථයේ පිටුපස ආසනවල හමුදා නිලධාරීන් දෙදෙනෙක් සහ තවත් පොලිස් කොස්තාපල්වරයෙක් සිටියහ. එක් සොල්දාදුවෙක් සහ පොලිස් කොස්තාපල්වරයෙක් T56 රයිෆල් සහ උණ්ඩ 120 ක් බැගින් රැගෙන යමින් සිටියහ. සැරයන් සිසිර කුමාර කුඩා ගිනි අවියක් රැගෙන ගියේය. ඔවුන් ළඟා වෙමින් සිටින වන විට, W15 හෝටලය ඉදිරිපිට ගාලු පාර අයිනේ නවතා තිබූ සුදු පැහැති KDH වෑන් රථයක් ඔවුන් විසින් දක්නා ලදි. ඉන්පසු ඔවුන්ට රතිඤ්ඤා පිපිරීමට සමාන ශබ්ද ඇසුණි. එම ශබ්දය ඇසුනු පසු ඔවුහු සෙමින් KDH වෑන් රථය දෙසට ඉදිරියට ගොස් එහි සිදුවන්නේ කුමක්දැයි හොඳින් පරීක්ෂා කළහ. නවතා තිබූ KDH වෑන් රථයට දකුණු පැත්තෙන් ඔවුන් විසින් සෙමින් ඉස්සර කරන ලද අතර, එම අවස්ථාවේදී වෑන් රථයේ වම් පස විවෘතව පැවැති පිටුපස දොර හරහා පුද්ගලයකු විසින් W15 හෝටලයට වෙඩි තබමින් සිටිනු ලබන බව ඔවුන් විසින් දකින ලදි. වේලාව 2023-12-31 දින අලුයම 2.20 සිට 2.25 අතර විය. මෙම සාක්ෂිකරු කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ පොලිස් ජීප් රථයේ රියදුරු පවා මේ අවස්ථාවේ නවතා තිබූ වෑන් රථයෙන් වෙඩි තබන ආකාරය නිරීක්ෂණය කර ඇති බවයි. නවතා තිබූ KDH වෑන් රථය පසුකර ගිය පසු වෑන් රථය නවත්වන ලෙස ඔහු විසින් රියදුරුට නියෝග කරනු ලැබ ඇති අතර, ඒ අනුව රියදුරු විසින් ජීප් රථය, නවතා තිබූ KDH වෑන් රථයට ආසන්න වශයෙන් මීටර් 5-7ක් පමණ ඉදිරියෙන් මාර්ගයේ එකම පැත්තේ නතර කරන ලදි.වාහන දෙකම එකම දිශාවට (ගාල්ල දිශාවට) මුහුණලා තිබූ අතර මාර්ගයේ එකම පැත්තේ නවතා තිබුණි.

වැලිගම පොලිස් ජීප් රථය නවතා තිබූ KDH වෑන් රථයට ඉදිරියෙන් නතර කළ පසු, පොලිස් සැරයන් සිසිර කුමාර ජීප් රථයෙන් බැස W15 හෝටලය ඉදිරිපිට නවතා තිබූ KDH වෑන් රථය දෙසට ගමන් කිරීමට පටන් ගත්තේය. ඔහු KDH වෑන් රථය දෙසට ගමන් කිරීමට පටන් ගන්නා විට, KDH වෑන් රථය එය ඉදිරිපස

නතර කර තිබූ වැලිගම පොලිස් ජීප් රථයට ඉස්සර කර වේගයෙන් ගමන් කිරීමට පටන් ගත්තේය. ඒ අවස්ථාවේදී, පොලිස් සැරයන් සිසිර කුමාර තම කණ්ඩායමේ සාමාජිකයින්ට (වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම) KDH වෑන් රථයට වෙඩි තබන ලෙස නියෝග කර ඇති අතර වෙඩි තැබීම සැබවින්ම සිදුවිය. T56 රයිෆලයකින් KDH වෑන් රථයට වෙඩි තැබුවේ හමුදා සැරයන් රුවිරංග බව පසුව ඔහුට දැනගන්නට ලැබුණි. KDH වෑන් රථය වේගයෙන් ධාවනය වන විට, පොලිස් සැරයන් සිසිර කුමාර නැවත පොලිස් ජීප් රථයට නැඟී වේගයෙන් ගමන් කරමින් තිබූ KDH වෑන් රථය පිටුපස ලුහුබැඳ යාමට පටන් ගත්තේය. මේ කාලය තුළ, ඔහු සිද්ධිය සම්බන්ධයෙන් තම ජංගම දුරකථනය හරහා වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට දැනුම් දී තිබුණි. කෙසේ වෙතත්, වැලිගම පොලිස් ජීප් රථයේ පැරණි තත්ත්වය නිසා ඔවුන්ට KDH වෑන් රථය පිටුපසින් සක්‍රිය ලෙස ලුහුබැඳ යාමට නොහැකි වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස KDH වෑන් රථය වේගයෙන් ධාවනය වී ඔවුන් සිටි ස්ථානයෙන් නොපෙනී ගියේය. වැලිගම රාත්‍රී ජංගම මුර සංචාරයේ සියලුම සාමාජිකයෝ ඔවුන්ගේ නිල ඇඳුම් ඇඳ සිටියහ. එය කිසිදු සැකයකින් තොරව පොලිස් ජීප් රථයක් ලෙස හඳුනාගත හැකි සලකුණු කරන ලද පොලිස් ජීප් රථයකි. පොලිස් සැරයන් සිසිර කුමාර පොලිස් නිල ඇඳුමින් සැරසී ජීප් රථයෙන් බැස සිටි නිසා සහ ස්ථානය වටා ප්‍රමාණවත් ආලෝකයක් තිබූ නිසා, KDH වෑන් රථයේ සිටි අයට, විශේෂයෙන් වෑන් රථයේ ඉදිරිපස ආසනවල වාඩි වී සිටි අයට, එම ස්ථානයේ ඔවුන්ගේ KDH වෑන් රථය ඉදිරිපිට නවතා තිබූයේ පොලිස් ජීප් රථයක් බව නිරීක්ෂණය කර තේරුම් ගැනීමට කිසිදු දුෂ්කරතාවයක් නොතිබුණි.

වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු, පොලිස් සැරයන් සිසිර කුමාර වැලිගම පොලිසියට ප්‍රකාශයක් ලබා දී ඇති අතර එය වැලිගම පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක නන්දසිරි විසින් සටහන් කර ඇත. එම ප්‍රකාශය පරික්ෂාකාරීව කියවීමේ දී පෙනී යන්නේ පොලිස් පරීක්ෂක නන්දසිරි 2023-12-31 වන දින පෙ.ව. 6.00 ට මෙම සාක්ෂිකරුගෙන් (පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර) ප්‍රකාශය සටහන් කර ඇති බවයි. හරස් ප්‍රශ්න වලට පිළිතුරු දිමේ දී, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, පොලිස් සැරයන් සිසිර කුමාර මහතා තම ප්‍රධාන සාක්ෂියේ දැනටමත් සාක්ෂි දී ඇති දේ සනාථ කරමින් එම සිදුවීම් අනුපිළිවෙලම නැවත අවධාරණය කර ඇත. තමන් ගමන් කළ පොලිස් ජීප් රථය ලෑන්ඩ් කෲසර් වර්ගයේ ජීප් රථයක් ලෙස මෙම සාක්ෂිකරු විසින් විස්තර කරනු ලැබ ඇත. ඔහුගේ කණ්ඩායමේ සාමාජිකයින් පස් දෙනෙක් සිටියහ. පොලිස් ජීප් රථයෙහි 'පොලිස් වැලිගම' ලෙස සිංහලෙන් සලකුණු කර තිබුණි. මෙය ජීප් රථයේ දෙපසම මුද්‍රණය කර තිබුණි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා පෙන්වා දීමට උත්සාහ කළේ, පොලිස් ජීප් රථය මිරිස්සෙන් පිටත් වූ වේලාව සහ ජීප් රථය ගමන් කළ වේගය සැලකිල්ලට ගෙන කාලය ගණනය කිරීමේදී, එවැනි ගණනය කිරීමක් අනුව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කළ අවස්ථාවේ මෙම සිදුවීම සිදුවී තිබිය නොහැකි බවයි. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරු පැහැදිලි කර ඇත්තේ ඔහු ලබා දුන් වේලාවන් සහ ඔහු ලබා දුන් වේගය ආසන්න සංඛ්‍යා පමණක් බවයි. හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු XI සහ X2 ලෙස සලකුණු කර ඇති ඔහුගේ ප්‍රකාශ ඔහුගේ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇති බව පිළිගෙන ඇත. හරස් ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු නැවත ප්‍රකාශ කර ඇත්තේ නවතා තිබූ KDH වෑන් රථයෙන් W15 හෝටලය දෙසට සිදු කරනු ලබමින් තිබූ වෙඩි තැබීම් එම ප්‍රදේශයේ බල්බ් වලින් නිකුත් වූ ආලෝකයෙන් ඔහු පැහැදිලිව දුටු බවයි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් එවැනි කොටස් වලින් එකක් පහත පරිදි යලි ඉදිරිපත් කළ හැකිය:

ප්‍ර: හරි. සාක්ෂිකරු ඊට පස්සේ මොනවාද නිරීක්ෂණය කෙරුවේ?

උ: ඒ වෙලාවේදී නවතා තිබූ ඒ වාහනය අධික වේගයෙන් මා ඉදිරියට ආවා. මම අපේ ජීප් රථයෙන් එම වාහනය පසුකර යන විට මම පැහැදිලිව දුටුවා වෙඩි තියනවා. එම අවස්ථාවේ මම ඇස් දෙකට දැකපු නිසා තමයි වෙඩි තියනවා කියලා දැන ගත්තේ. ඒ අනුව තමයි මම වෙඩි තියපු ඒ වාහනය ළඟට ජීප් රථයෙන් බැහැලා ගමන් කළේ.

ප්‍ර: තමුන් ඒ වාහනය ළඟට ගිහින් මොනවාද කිව්වේ?

උ: කියන්න වුණේ නැහැ ස්වාමීනි; අපේ ජීප් රථය පිටුපසටවත් යන්න වුණේ නැහැ. ඒ වාහනය අධික වේගයෙන් මා නවතා තිබූ ජීප් රථය දෙසට පැමිණියා.

ප්‍ර: ඊට පසුව මොකක්ද වුණේ?

උ: ඔවුන් අපේ ජීප් රථයට දකුණු පසින් ඉදිරියට ගමන් කළා.

ප්‍ර: ඒ වාහනය ඔබේ වාහනය පසුකර යද්දී ඔබේ වාහනයට පුංචි හෝ සීරීමක් වුණා ද?

උ: නැහැ ස්වාමීනි.

ප්‍ර: ඔයගොල්ලන් පසු කරගෙන ඒ වාහනය ගිහිල්ලා තිබෙනවා නේද?

උ: එසේය ස්වාමීනි.

ප්‍ර: ඊට පස්සේ ඒ වාහනයෙන් ඔබලාට වෙඩි තිබ්බේ නැහැ නේද?

උ: නැහැ.

ප්‍ර: ඊට පස්සේ ඒ වාහනයෙන් වෙන කාටවත් වෙඩි තිබ්බෙත් නැහැ නේද?

උ: නැහැ.

ප්‍ර: තමුන් වාහනයෙන් බැහැලා ඒ වෑන් රථයේ ඉන්නා අයට මොකක් හෝ අණක් දුන්නාද?

උ: එසේ අණක් දෙන්න අවස්ථාවක් හම්බ වුණේ නැහැ.

ප්‍ර: මුකුත්ම අවස්ථාවක් හම්බ වුණේ නැහැ?

උ: නැහැ, ස්වාමීනි.

ප්‍ර: ඒ මුකුත්ම කරන්න ඉස්සෙල්ලා ඒ අය ගියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වැන් රථය අධික වේගයෙන් ගියා ද?

උ: එසේය, ස්වාමීනි.

ප්‍ර: අධික වේගයෙන් ගිය ඒ වාහනයට තමුන්ගේ නිලධාරින්ට දීපු අණ මොකක්ද?

උ: මට භය හිතුණා, ස්වාමීනි. මම පැහැදිලිවම දැක්කා වෙඩි තියනවා කියලා. මම දන්නේ නැහැ මේ ගොල්ලන් කවුද කියන්න. ඒ නිසා එම වාහනය නවතා ගැනීමට අවශ්‍ය නිසා මම අපේ නිලධාරින්ට කිව්වා වෙඩි තියන්න කියලා.

ප්‍ර: හරියටම හරි. සාක්ෂිකරු කියා තිබෙන්නේ ඒක නේ. වාහනය නවත්වා ගන්න ඕනෑ නිසා වෙඩි තියන්න කියලා කිව්වා?

උ: ඔව්.

ප්‍ර: සාක්ෂිකරුගේ වචනයෙන්ම කිව්වොත්, සාක්ෂිකරු ජීප් රථය ඇතුළේ හිටපු නිලධාරින්ට කියා තිබෙනවා "වෙඩි තියාපාන්" කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒ වෙලාවේ සාක්ෂිකරුගේ ජීප් රථය ඇතුළේ කී දෙනෙක් හිටියාද?

උ: යුද හමුදා නිලධාරින් දෙදෙනායි; රියැදුරුයි; පොලිස් කොස්තාපල්වරයෙකුයි.

ප්‍ර: යුද හමුදා නිලධාරින් දෙදෙනාගෙන් එක් අයෙකුගේ අතේ ටී56 ගිනි අවියක් තිබුණා?

උ: පිටවීමේදී එක අවියයි ගෙනිච්චේ.

ප්‍ර: පොලිස් නිලධාරියා අතේ තවත් ගිනි අවියක් තිබුණාද?

උ: තිබුණා.

ප්‍ර: එකත් එක්කත් මැගසින් 4ක් තිබුණා නේද? ඒ කියන්නේ, එම ගිනි අවි දෙකේ උණ්ඩ 120 බැගින්, උණ්ඩ 240ක් තිබුණා නේද?

උ: ඔව්.

ප්‍ර: අර පොලිස් නිලධාරින් දෙදෙනා වෙඩි තිබ්බා ද?

උ: එක පොලිස් නිලධාරියෙකුගේ අතේ විතරයි ගිනි අවියක් තිබුණේ.

ප්‍ර: එක පොලිස් නිලධාරියෙකුගේ අතේ ගිනි අවියක් තිබුණා. යුද හමුදා නිලධාරින් දෙදෙනාගෙන් එක් අයෙකු අතේ තවත් ගිනි අවියක් තිබුණා. ඒක නිවැරදියි නේද?

උ: ඔව්, නිවැරදියි.

ප්‍ර: මම අහන්නේ, ඒ ජීප් රථයේ හිටපු පොලිස් නිලධාරින් දෙදෙනාගෙන් එක් අයෙක් වෙඩි තිබ්බාද?

උ: ඒ අවස්ථාවේ මම දැක්කේ නැහැ. මොකද, මම බිමට බැහැලා නේ හිටියේ.

ජංගම මුර සංචාර කණ්ඩායමට වෙඩි තැබීමට නියෝග කිරීමට පෙර මෙම සාක්ෂිකරු පූර්ව අනතුරු ඇඟවීම් ලබා නොදුන් බව පවසමින් මෙම සාක්ෂිකරු අභියෝගයට ලක් කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා උත්සාහ කළ අවස්ථාවේ දී, සියල්ල සිදුවූයේ ක්ෂණිකවම බවත්, KDH වෑන් රථය එම ස්ථානයෙන් පලා යන විට වෙඩි තැබීම හැර වෙනත් විකල්පයක් නොමැති බවත් මෙම සාක්ෂිකරු විසින් පැහැදිලි කර ඇත. එය W15 හෝටලයට වෙඩි තැබූ පුද්ගලයින් සමඟ තිබූ වෑන් රථයක් වූ බැවින් කිසිදු හේතු සොයා බැලීමකින් තොරව වෑන් රථයට වෙඩි තැබීමට නියෝග කළ බව ද පොලිස් සැරයන් සිසිර කුමාර ප්‍රකාශ කළේය. හරස් ප්‍රශ්න කිරීමේදී ඇසූ ප්‍රශ්නයකට තවදුරටත් පිළිතුරු දෙමින් පොලිස් සැරයන් සිසිර කුමාර ප්‍රකාශ කර ඇත්තේ KDH වෑන් රථයේ සිටි අය වැලිගම පොලිස් ජීප් රථය සහ ඒ අවස්ථාවේ පොලිස් නිල ඇඳුමින් සිටි තමා දුටු විට යටත් වීමට හෝ තමන්ව හඳුන්වා දීමට ඉදිරිපත් විය යුතුව තිබූ බවයි. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂිය පහත පරිදි වේ.

ප්‍ර: හරියට හරි. එතකොට, වැදගත්ම දේ මේකයි. ඔබතුමා යුනිෆෝම් ඇඳගෙනනේ බැස්සේ. උතුම් වූ විනිශ්චයකාරතුමාත් ඒ ප්‍රශ්නය ඇහුවා. මේ ගරු සභාවෙනුත් ඇහුවා. ඒ වෙලාවේ එතැන පැවති එළිය අනුව බැහැලා ඉන්නේ පොලිස් නිලධාරියෙක් කියලා වාහනයේ හිටපු අයට දැක ගන්න පුළුවන්ද?

උ: දර්ශනය වෙනවා, ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍ය මනුස්සයෙකුට පේන්නම ඕනෑ නේද?

උ: පේනවා ස්වාමීනි.

ප්‍ර: ඔබතුමා දන්න නීතිය අනුව, ඔබතුමා යුනිෆෝම් එක ඇඳලා ඉස්සරහට ගියාට පස්සේ ඒ ගොල්ලෝ නීතිය අනුව ඔබට යටත් විය යුතුද, නැද්ද?

උ: නීති ගරුක අය පැමිණියා නම් යටත් වෙන්න ඕනෑ.

ප්‍ර: ඔව්, අනිවාර්යයෙන්ම යටත් වෙන්න ඕනෑ. ඔවුන් තමන්ට යටත් වුණාද, නැද්ද?

උ: නැත ස්වාමීනි.

ප්‍ර: නැහැ, ඔවුන් පළා ගියා?

උ: ඔව්, ඔවුන් පළා ගියා.

පොලිස් සැරයන් සිසිර කුමාර විසින් ලබා දුන් සාක්ෂි සම්බන්ධයෙන්, කමිටුවෙහි නිරීක්ෂණය වන්නේ වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් පවා ඔහු බොරු සාක්ෂි ලබා දෙන බවට යෝජනා කිරීමට උත්සාහ නොකරන ලද බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයාගේ ස්ථාවරය වූයේ වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයෙන් වෙඩි තැබීම සිදු වූයේ මෙම සාක්ෂිකරු විසින් ඔහුගේ කණ්ඩායමට කඩිමුඩියේ ලබා දුන් නියෝගයක් හේතුවෙන් බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා එය මෙම සාක්ෂිකරුගේ අතපසුවීමක් ලෙස ආරෝපණය කිරීමට උත්සාහ කළේය. ඇත්ත වශයෙන්ම, වගඋත්තරකාර පොලිස්පතිවරයා ද ඔහුගේ සාක්ෂි අතරතුර, මෙම සාක්ෂිකරුගේ විශ්වසනීයත්වය දෝෂ දර්ශනයට ලක් කිරීමට උත්සාහ කළේ නැත. ඒ වෙනුවට, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් තම සාක්ෂි දීමේදී, වැලිගම රාත්‍රී ජංගම මුර සංචාරයේ නිලධාරීන් හුදෙක් ඔවුන්ගේ රාජකාරි ඉටු කළ බවත් ඔවුන්ගේ පැත්තෙන් කිසිදු අඩුපාඩුවක් සිදු නොවූ බවත් පිළිගන්නා ලදි. කලින් සඳහන් කළ පරිදි, වැලිගම පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා අපරාධ ස්ථානයේදීම මෙම සාක්ෂිකරුගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තේ 2023-12-31 වන දින උදෑසන 6.00 ට ය. හමුදා සැරයන් රුවිරංග ද මෙම පරීක්ෂණ කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දී ඇත. රුවිරංගගේ සාක්ෂි සත්‍ය ලෙස පිළිගැනීමට තීරණය කර ඇත්තේ මන්දැයි පරීක්ෂණ කමිටුව හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි ඇගයීමේදී හේතු දක්වා ඇත. හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි පොලිස් සැරයන් සිසිර කුමාරගේ සාක්ෂි සමඟ පරිපූර්ණ එකඟතාවයකින් යුක්ත වේ. එබැවින්, එම එක් එක් සාක්ෂිකරුවන් විසින් ලබා දෙන සාක්ෂි එකිනෙක අන්‍යෝන්‍ය වශයෙන් තහවුරු කරනු ලබන බව කමිටුව විසින් අනාවරණය කර ගනු ලැබේ. මේ අනුව, මෙම වෙඩි තැබීමේ සිද්ධිය සැබවින්ම සිදුවූ ආකාරය මෙම සාක්ෂිකරුවන් දෙදෙනා ඔවුන්ගේ සාක්ෂි වලදී පැහැදිලි කර ඇති බවට පරීක්ෂණ කමිටුවට කිසිදු සැකයක් නැත. කුතුහලය දනවන කරුණ නම්, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායම භාරව සිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා විසින්, එයම, 2023-12-31 දින අළුයම 2.20 සිට 2.25 දක්වා කාලය තුළ සැබවින්ම සිදු වූ සිදුවීම්වල සත්‍ය අනුපිළිවෙල ලෙස ඔහුගේ සාක්ෂියේදී විස්තර කර තිබීමයි . පොලිස් සැරයන් අජිත් සිසිර කුමාරගේ සාක්ෂි සහ වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ද මතභේදයට ලක් නොකරනු ලබන හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා විසින් විස්තර කරන ලද(සිදු වීම්වල) පෙර අනුවාදයට (2023-12-31 දින වැලිගම පොලිසියට කරන ලද ප්‍රකාශයෙහි විස්තර කරන ලද සිදුවීම්වල ගොතන ලද අනුවාදයට) නිශ්චිතවම සහාය නොදක්වයි. එබැවින්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ කළ තර්කය කෙ◌ාතරම් වුවද, W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙකුගේ වෙඩි ප්‍රහාරයට ලක් වූ විට පමණක් තමන් විසින් ප්‍රති ප්‍රහාර එල්ල කළ බවට සඳහන් කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායමේ සාමාජිකයින් විසින් 2023-12-31 දින වැලිගම පොලිසියට විස්තර කරන ලද මුල් අනුවාදය පැවතිය නොහැකි අතර එය අත්‍යවශ්‍යයෙන්ම බිඳ වැටේ.

3) <u>පොලිස් කොස්තාපල් රියදුරු 89728 අමරසිංහ කළු ආරච්චිගේ දුලිප් ගිහාන් පියතිස්සගේ සාක්ෂිය.</u>

පොලිස් කොස්තාපල් රියදුරෙකු ලෙස මෙම සාක්ෂිකරු, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් අට දෙනෙකුගෙන් යුත් කණ්ඩායම 2023-12-30 දින පැලැන වැලිගම වෙත ප්‍රවාහනය කළ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් WP PK 7225 ලියාපදිංචි අංකය සහිත KDH වෑන් රථය පැදවීය. කොළඹ අපරාධ කොට්ඨාශයට අනුයුක්ත තවත් පොලිස් කොස්තාපල් රියදුරන් දෙදෙනෙකු වන පොලිස් කොස්තාපල් රියදුරු අමිල සහ පොලිස් කොස්තාපල් රියදුරු බණ්ඩාර යන අයගේ සහාය ඇතිව 2023-12-30 දින කොළඹ අපරාධ කොට්ඨාශයේ කාර්යාලයෙන් වැලිගමට යාමට පෙර වෑන් රථයේ බඳෙහි ස්ටිකරයක් අලවා ඇති බව ඔහුගේ සාක්ෂියයි. ඔහු තවත් පොලිස් කොස්තාපල්වරයෙකුගේ, එනම් කොළඹ අපරාධ කොට්ඨාශය ට අනුයුක්ත උදයංගගේ, සහාය ඇතිව යතුරුපැදියක් භාවිතා කර කොළඹ ඩාර්ලි පාරේ සාප්පුවකින් මෙම ස්ටිකර් මිලදී ගත් බව ද ඔහුගේ සාක්ෂිය වේ. KDH වෑන් රථයේ ස්ටිකර් ඇලවීම 2023-12-30 දින දිනයේ දෙවන භාගයේදී සිදු කරන ලදී. ඔහුට අනුව, වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු වෑන් රථය වැලිගම පොලිස් ස්ථානයට ගෙන එන විටත්, ඔහු වෑන් රථයේ අලවා තිබූ ස්ටිකරය වෑන් රථයේ බඳෙහි රැඳී තිබුණි. පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස ඔහුගේ සාක්ෂිවලින් තහවුරු කර ඇත්තේ, පොලිස් පරීක්ෂක නිශාන්තගේ උපදෙස් පරිදි, ඔහු සහ අනෙක් අය විසින් ගල්කිස්සේ පිහිටි ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නිවසේ දී කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් KDH වෑන් රථයේ නිවැරදි අංක තහඩු ඉවත් කර එයට ව්‍යාජ අංක තහඩු සවි කළ බවයි. මෙය සිදු කරනු ලැබුවේ වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය පොලිස් සැරයන් උපුල්ගේ සහාය ඇතිව ය. පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස තඹුත්තේගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. එබැවින් ඔහු ප්‍රකාශ කළේ මාතර ප්‍රදේශය ගැන තමා හුරුපුරුදු නැති බවයි. අධිවේගී මාර්ගයෙන් පිටවන තුරු කණ්ඩායම විසින් කළ යුතු මෙහෙයුම ගැන ඔහු දැන සිටියේ නැත. කොක්මාදූව පිටවීමේ ස්ථානයෙන් අධිවේගී මාර්ගයෙන් පිටවීමෙන් පසු පොලිස් පරීක්ෂක නිශාන්ත වෑන් රථයේ සිටි අනෙක් අයට පවසා ඇත්තේ ඔවුන් නීති විරෝධී කටයුත්තක් සඳහා යන බවයි. වැලිගම ප්‍රදේශයට පැමිණි පසු ඔවුන් W15 හෝටලය පිහිටා ඇති ස්ථානය හඳුනාගෙන තිබුණි. එක් අවස්ථාවකදී, ආරක්ෂක නිලධාරියෙකු ළං වූ විට, ඔවුන් නැවතත් එම ස්ථානයෙන් ඉවත් වී ඇත. W15 හෝටලය පසුකර වෑන් රථය පදවාගෙන ගොස්, වරක් W15 හෝටලයෙන් ඈත ස්ථානයක ටික වේලාවක් රැඳී සිටින ලදි. මාර්ගයේ රථවාහන තදබදය අඩු වන තෙක් එම ස්ථානයේ රැඳී සිට, පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස නැවතත් වෑන් රථය පදවා W15 හෝටලය ඉදිරිපිට එය නතර කර ඇත. මෙය 2023-12-31 වන දින අළුයම සිදු විය. පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්සට අනුව,කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් KDH වෑන් රථයේ පිටුපස වම් පැත්තේ තල්ලුකරන දොර අසල අසුන්ගෙන සිටි SI මධුරංග එය විවෘත කර W15 හෝටලයට වෙඩි තැබීමට පටන් ගත්තේය.

SI මධුරංග W15 හෝටලයට වෙඩි තැබීම අවසන් කිරීමෙන් පසු, වෑන් රථයේ සිටි කෙනෙකු පොලිස් නිලධාරීන්ගේ පැමිණීම පිළිබඳව අනෙක් අයට දැනුම් දෙන හඬ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්සට ඇසුණි. SI මධුරංග තවමත් W15 හෝටලයට වෙඩි තබමින් සිටියදී හෝ ඔහු වෙඩි තැබීම නැවැත්වූ පසු පොලිස් ජීප් රථය පැමිණි බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. වෑන් රථය ඇතුළතින් ඔහුට ඇසුණේ ''පොලීසියෙන්'' ''පොලීසියෙන්'' යන වචන ය.

දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොක්මාදූව පිටවීමේ ස්ථානයෙන් පිටවීමෙන් පසු කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක් සිදු කිරීමට යන බව කලින් දැන සිටි ඔහු, ''පොලීසියෙන්'' ''පොලීසියෙන්'' යන වචන ඇසීමෙන් කලබලයට පත් විය

ඒ මොහොතේ ඔහුට අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින් විසින් ''යමන්'' ''යමන්'' යනුවෙන් කෑගසන හඬ ඇසුණි. මෙම වචන ඇසූ පසු , ඔහු GC අංකයක් සහිත Land Cruiser පොලිස් ජීප් රථයක් දැක හඳුනා ගත්තේය. එම වාහනය පොලිස් ජීප් රථයක් බව පැහැදිලිව හඳුනා ගත් බැවින් පොලිස් කොස්තාපල් රියදුරු දූලිප් ගිහාන් පියතිස්සට ඒ පිළිබඳ කිසිදු සැකයක් නොතිබුණි. එසේ කිරීමට උපදෙස් ලැබුණු පසු, පොලිස් කොස්තාපල් රියදුරු දූලිප් ගිහාන් පියතිස්ස වහාම පොලිස් ජීප් රථය පසුකරමින් ගාල්ල දෙසට වෑන් රථය ධාවනය කළේය. ඔහු වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය පසුකර වේගයෙන් ධාවනය කරමින් සිටින විට, ඔහුට වෙඩි හඬ ඇසුණු අතර, කොළඹ අපරාධ කොට්ඨාශයට වෑන් රථයට වෙඩි වැදී ඇති බව ඔහුට වැටහුණි.

වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය වේගයෙන් පසුකර යන අතරතුර, වෙඩි හඬ ඇසුණු අතර, සීසීඩී වෑන් රථයට වෙඩි වැදී ඇති බව ඔහුට වැටහුණි. වෑන් රථය W15 හෝටලයේ ස්ථානයෙන් ඉවතට වේගයෙන් ගමන් කරමින් සිටියදී හදිසියේම වෑන් රථය තුළට විශාල සුළඟක් පැමිණි විට, වෙඩි ප්‍රහාරයෙන් සීසීඩී වෑන් රථයේ වීදුරු කැඩී ගොස් ඇති බව පීසීඩී දූලිප් ගිහාන් පියතිස්ස තේරුම් ගෙන ඇත. මන්ද මෙම වෑන් රථය සම්පූර්ණයෙන්ම වායු සමීකරණය කරන ලද වෑන් රථයක් වූ අතර එම නිසා වෑන් රථයේ සියලුම දොරවල් සහ ජනෙල් සෑම විටම වසා තිබුණි. ඒ අවස්ථාවේදී, ස්ථානාධිපති ඇන්ස්ලම් ද සිල්වා අනෙක් අයට පවසා ඇත්තේ පොලිස් සැරයන් උපුල්ට වෙඩි වැදී ඇති බවයි.

අතරමගදී, ඔහු වෑන් රථය අතුරු මාර්ගයකට හරවා ඉඩකඩ සහිත ස්ථානයක ටික වේලාවක් නවතා තිබුණි; එහිදී PCD දූලිප් ගිහාන් පියතිස්ස වෑන් රථයෙන් බැස වෑන් රථයේ නිවැරදි අංක තහඩු නැවත සවි කළේය. ඉන්පසු ඔවුන් මාර්ගය සොයාගෙන දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමට ළඟා විය. කෙසේ වෙතත්, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් වෑන් රථය නැවැත්වූ අතර ඔවුන්ට ඉදිරියට යාමට ඉඩ දුන්නේ නැත. වැලිගම HQI එම ස්ථානයට පැමිණෙන තෙක් කොළඹ අපරාධ කොට්ඨාස සාමාජිකයින්ට වෑන් රථය තුළ රැඳී සිටින ලෙස ඉල්ලා සිටින ලදී. ඒ වන විට, PCD දූලිප් ගිහාන් පියතිස්ස විසින් පොලිස් සැරයන් උපුල්ට සහ SI මධුරංගට වෙඩි වැදී තුවාල ලබා ඇති බව වටහාගෙන තිබුණි. OIC ඇන්ස්ලම් ද සිල්වා දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි නිලධාරීන්ට තම හැඳුනුම්පත පෙන්වා තිබුණද, වෑන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායමට එම ස්ථානයෙන් පිටවීමට අවසර නොලැබුණි.1990 සුවසැරිය ගිලන් රථය එහි පැමිණ තුවාල ලැබූ පුද්ගලයින් දෙදෙනා කරාපිටිය රෝහලට රැගෙන ගියේ, වැලිගම HQI අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමට පැමිණි පසුවය. වැඩිදුර සාක්ෂි ලබා දෙමින්, W15 හෝටලය ඉදිරිපිට නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තැබීමේ සිද්ධියකට ප්‍රතිචාර වශයෙන් කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම වෙඩි තැබූ බවට පෙන්වීමට වැලිගම පොලිස් ස්ථානයට මුලින් ගොතන ලද කතාවක් පැවසූ බව මෙම සාක්ෂිකරු පිළිගෙන තිබේ. ගරු මාතර මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පැවති මරණ පරීක්ෂණ කටයුතුවලදී ඔහු සාක්ෂි දුන් විට එම ගොතන ලද කතාවම පැවසූ බව ද ඔහු පිළිගත්තේය. ඉන්පසු ඔහු නීතිඥවරයෙකු සමඟ CID වෙත ගොස් වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධියට අදාළ සිදුවීම්වල සැබෑ අනුපිළිවෙල හෙළි කරමින් CID වෙත ප්‍රකාශයක් ලබා දුන් බව ඔහු සිය සාක්ෂියේදී තහවුරු කළේය. මේ අනුව, ඔහු 2023-12-31 දින වැලිගම පොලිස් ස්ථානයට කළ ප්‍රකාශයේ W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධියට අදාළව ගොතන ලද විස්තරයක් පැවසූ බව ඔහුගේ සාක්ෂියෙන් තහවුරු කර ඇත.

හරස් ප්‍රශ්න කිරීමේදී, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ගමන අතරතුර W15 හෝටලය සොයා ගැනීමට ගමන් මග පිළිබඳ ගූගල් විස්තරයක් හෝ GPS ජාල විස්තරයක් තමා වෙත ලබා දී නොමැති බව PCD දුලිප් ගිහාන් පියතිස්ස මහතා ප්‍රකාශ කර තිබේ. හරස් ප්‍රශ්න කිරීමේදී තවදුරටත් පිළිතුරු දෙමින්, W15 හෝටලයේදී SI මධුරංග විසින් වෙඩි තැබීමේ සිද්ධිය අතරතුර එම ස්ථානයට පැමිණි කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථය ඉදිරිපිට නතර වූයේ වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය බව තමා පැහැදිලිව හඳුනාගත් බව මෙම සාක්ෂිකරු ඉතා නිශ්චිතව තහවුරු කර ඇත. කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථය තමන් අධික වේගයෙන් පදවාගෙන යන විට කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථයට වෙඩි තැබුවේ වැලිගම පොලිස් ලෑන්ඩ් කෲසර් ජීප් රථයේ සිටි පොලිස් නිලධාරීන් බව PCD දුලිප් ගිහාන් පියතිස්ස මහතා ද තහවුරු කර තිබේ. එම ස්ථානයේ කළ යුතුව තිබූ නිවැරදි දෙය නම්, වැලිගම පොලිස් ජීප් රථය පැමිණි පසු එම ස්ථානයෙන් පැන නොගොස්, කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන් විසින් වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර නිලධාරීන්ට තමන් හඳුන්වා දීම බව PCD දුලිප් ගිහාන් පියතිස්ස මහතා ද පිළිගෙන තිබේ. කළ යුතු නිවැරදි දෙය එය බව ඔහු දැන සිටියද, ඒ අවස්ථාවේ වෑන් රථයේ සිටි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ඔහුට උපදෙස් දෙනු ලැබූ පරිදි ඔහුට කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථයෙන් එම ස්ථානයෙන් වේගයෙන් පලා යාම හැර වෙනත් විකල්පයක් නොතිබුණි. තවදුරටත් හරස් ප්‍රශ්න කිරීමේදී ,ඔහු කොළඹ අපරාධ කොට්ඨාස රථයේ අංක තහඩු වෙනස් කිරීම නීති විරෝධී ක්‍රියාවක් බවත්, W15 හෝටලයට වෙඩි තැබීමට කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම විසින් සිදු කරන ලද මෙහෙයුම ද නීති විරෝධී ක්‍රියාවක් බවත් ඔහු ස්ථිරවම පිළිගෙන ඇත.

වගඋත්තරකාරපොලිස්පති පොලිස්පති වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයාගේ දැඩි හා තියුණු හරස් ප්‍රශ්න කිරීමේදී, මෙම සාක්ෂිකරු හැඟීම්බර විය. මෙය පහත ඡේදයෙන් පිළිබිඹු වේ:

ප්‍ර: මහත්තයෝ ඔබතුමාට පුළුවන් කමක් තිබුණා නේ පොලිස්පතිතුමාට හරි සීනියර් ඩීඅයිජී මහත්මයාට හරි, ඩිවිෂන්ට හරි, නි.පො.ප කොළඹට හරි පොලිස්පති සහන මන්දිරයට හරි ලියල කියන්න තිබුණා නේ කිව්වද, නැද්ද?

උ : තේරුනේ නැහැ මට ස්වාමීනි. මේ කියන්නේ මොනවද කියලා.

ප්‍ර: මම කියන්නේ දැන් තමුන් නීති විරෝධී වැඩක් කෙරුවා? ඔව් නේ?

උ: මම නම් කළේ නැහැ ස්වාමීනි. මට උසස් නිලධාරියෙක් කරපු වැඩේ තමයි ස්වාමීනි. මම මුල ඉඳන්ම කියන්නේ ඒකයි ස්වාමීනී. ඇත්තම. මම දැන් බොහොම අමාරුවෙන් ජීවත් වෙන්නේ ස්වාමීනී. මට දරුවෝ තුන්දෙනෙකුත් ඉන්නවා, ස්වාමීනී. මම දන්නවා නම් පොලිසියට එන්නෙත් නැහැ ස්වාමීනි. මම බැඳලා - විවාහ වෙලා - ආවේ ස්වාමීනි. ගොවිතැනක් කරන් ඉන්නවා ඔය බවක් දන්නවා නම්. මට එපාවෙලා තිබෙන්නේ ස්වාමීනී දැන්. මට මේ ජොබ් එකත් එපා ස්වාමීනි. නිදහස් වෙන්නයි ඕනෑ මෙච්චායින්. නිදහසේ ජීවත් වෙන්න. වැඩක් කරගන්න විධියකුත් නැහැ ස්වාමීනි, එපා වෙලා ඉන්නේ මට ස්වාමීනි.

**( සාක්ෂිකරු අඬයි)**

තවද, මෙම සාක්ෂිකරු තවදුරටත් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් කියා ඇත්තේ මෙම සිද්ධියේදී ඔහු තම ඉහළ නිලධාරීන්ගේ නියෝග ක්‍රියාත්මක කළ බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් ඇසූ ප්‍රශ්න අනුව ඔහු මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවල විශ්වසනියබාවය බිඳ හෙළීමට උත්සාහ කළ බවක් බැලූ බැල්මට පෙනෙන්නට තිබුණද, ඔහු කිසිවිටෙකත් මෙම සාක්ෂිකරුට ඔහු බොරු සාක්ෂි ලබා දෙන බව යෝජනා කර නැත. අනෙක් අතට, 2023-12-31 දින වැලිගම W15 හෝටලය ඉදිරිපිට සිදු වූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂිකරුවන් ලෙස සාක්ෂි දුන් අනෙකුත් සියලුම සාක්ෂිකරුවන් විසින් PCD දුලිප් ගිහාන් පියතිස්සගේ සාක්ෂිය හොඳින් සනාථ කරයි. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල සඳහන් වන පරිදි, ඉමදූව දක්ෂිණ අධිවේගී මාර්ග පිවිසුමට ළඟා වූ පසු කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථය නැවැත්වීමේ සිද්ධියට සම්බන්ධ සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවලට පටහැනි වීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා උත්සාහ කර නොමැත.

කලින් සඳහන් කර ඇති පරිදි, වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරය භාරව සිටි පොලිස් සැරයන් සිසිර කුමාරගේ සාක්ෂි සහ කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථයට වෙඩි තැබීමට T56 අවියක් භාවිතා කළ හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි සත්‍ය සාක්ෂි ලෙස විමර්ශන කමිටුව නිගමනය කර ඇත. CI ඇන්ස්ලම් ද සිල්වා විසින් ලබා දුන් සාක්ෂි ඉහත සඳහන් එක් එක් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සමඟ අනුකූල වන බවත් එම නිසා එකිනෙකා අන්‍යෝන්‍ය වශයෙන් සනාථ කරන බවත් කමිටුව නිරීක්ෂණය කර ඇත. පෙර සඳහන් කර ඇති පරිදි, W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් වෙඩි තැබූ විට පමණක් ඔවුන් ප්‍රතිචාර දැක්වූ බවට කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායමේ සාමාජිකයින් විසින් 2023-12-31 දින වැලිගම පොලිසියට ලබා දුන් මුල් තොරතුරු දැක්වීම වැලිගම සිදුවීමට අදාල නිවැරදි විස්තරය වශයෙන් සැලකිය යුතු බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා ගත් ස්ථාවරය ප්‍රතික්ෂේප කිරීමට ද කමිටුව තීරණය කර ඇත. මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් අධිවේගී මාර්ග අංශයේ නිලධාරීන් කණ්ඩායම විසින් ලබාදුන් සාක්ෂි වලට අනුව PCD දුලිප් ගිහාන් පියතිස්සගේ සාක්ෂි හොඳින් සනාථ වන බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කර ඇත. එබැවින් විමර්ශන කමිටුව PCD දුලිප් ගිහාන් පියතිස්සගේ සාක්ෂි පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට තීරණය කරනු ලැබේ.

4) <u>නියෝජ්‍ය පොලිස්පති ගුණන්දවඩු නිශාන්ත ද සොයිසාගේ සාක්ෂි.</u>

නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන බුද්ධි අංශය වන පොලිස් විශේෂ ශාඛාවේ අධ්‍යක්ෂවරයා විය. මෙම අංශය පොලිස්පති විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලැබේ. ඔවුන් විවෘත පරීක්ෂණ සිදු නොකරන නමුත් සැක සහිත දේවල් පිළිබඳ තොරතුරු රැස් කිරීම සහ පොලිස්පතිවරයා සහ අනෙකුත් අදාළ නිලධාරීන් වෙත දිනපතා එම තොරතුරු ලබා දීම සඳහා රහසිගත මෙහෙයුම් පමණක් සිදු කරයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා 2023-12-29 දින මොහුව ඔහුගේ කාර්යාලයට කැඳවා තිබුණි. ඒ වන විට, ත්‍රස්ත විමර්ශන අංශයේ (TID) අධ්‍යක්ෂ SSP ප්‍රසන්න අල්විස්, කොළඹ අපරාධ කොට්ඨාස වැඩබලන අධ්‍යක්ෂ නෙවිල් ද සිල්වා සහ තවත් කිහිප දෙනෙකු එම කාර්යාලයේ සිට ඇත. R-2 ලිපියට අමුණා ඇති නම් ලැයිස්තුව පිළිබඳව වැඩිදුර පරීක්ෂණ පවත්වන ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් කොළඹ අපරාධ කොට්ඨාස වැඩබලන අධ්‍යක්ෂ වෙත උපදෙස් දී තිබුණි. 'FNA' සටහන වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් R-2 ලිපියට යොදා ඇති බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද

සොයිසා හඳුනාගෙන ඇත. ඒ අනුව, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා දකුණු පළාතේ ස්ථානගත කර ඇති ඔහුගේ ශාඛාවේ සහකාර පොලිස් අධිකාරීවරයාට උපදෙස් දී ඇත්තේ මෙම තොරතුරු කොළඹ අපරාධ කොට්ඨාසයේ සිට එම ප්‍රදේශයට පැමිණෙන නිලධාරීන්ට ලබා දෙන ලෙසයි.

මේ සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂක ජයතිලක මහතා ද ඔහු හා සම්බන්ධ වී සිටි බැවින්, පොලිස් පරීක්ෂක ජයතිලක මහතාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමක් මේ සඳහා මාතරට ගිය බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා දැන සිටියේය. කෙසේ වෙතත්, ඇන්ස්ලෙම් ද සිල්වා මහතාගේ නායකත්වයෙන් යුත් සීසීඩී කණ්ඩායම 3012.2073 දින වැලිගමට යන බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතාට දැනුම් දී නොතිබුණි. එම කණ්ඩායමේ කිසිවෙකු R-2 ලේඛනයේ සඳහන් යම් සැකකරුවෙකුගේතොරතුරු ලබා ගැනීම සඳහා හෝ අදාළ කාලය තුළ වෙනත් කරුණක් සඳහා කිසියම් තොරතුරක් ලබා ගැනීමට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා සම්බන්ධ කර ගෙන තිබුණි.

2023-12-29 සිට 2023-12-31 දක්වා දිනකදී, වගඋත්තරකාර පොලිස්පතිවරයා තමා සෘජුවම අමතා නව වසර උදාව වෙනුවෙන් ෆේස්බුක් සාද පැවැත්වීමට නියමිත ස්ථාන පිළිබඳ විස්තර තමාට එවන ලෙස උපදෙස් දුන් බවට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා සාක්ෂිදී ඇත. ඒ අනුව, ඔහුට මාතර විශේෂ අංශයේ ස්ථානාධිපති සීඅයි රාජකරුණා මහතාගෙන් එම තොරතුරු ලැබී ඇති අතර, එවැනි ස්ථාන නවයක් පිළිබඳ තොරතුරු වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙත යවා ඇත. පැලෑන වැලිගම W15 හෝටලය ඒ අතර වේ.

ඉහත තොරතුරු ලැබීමෙන් පසු, වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා, W15 හෝටලය පිළිබඳ ඡායාරූප ඇතුළුව එහි වැඩිදුර තොරතුරු තමා වෙත යොමු කරන ලෙස නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතාට උපදෙස් දී තිබුණි. ඒ අනුව, ඔහු මාතර පොලිසියේ දූෂණ මර්දන ඒකකයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර මහතාගෙන් මෙම තොරතුරු ලබා ගෙන වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාට යවා ඇත.

වැඩිදුර සාක්ෂි ලබා දෙමින්, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා ප්‍රකාශ කර ඇත්තේ 2023-12-31 වන දින අලුයම 2.45 ට පමණ කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාගෙන් තමාට ඇමතුමක් ලැබුණු බවයි. වැලිගමට ගිය කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක (පාතාලයෙන් වෙඩි තැබීම්) නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි ප්‍රහාරයට ලක්ව ඇති බව ඒඑස්පී නෙවිල් ද සිල්වා මහතා ඒ අවස්ථාවේ දුරකථනයෙන් ඔහුට පවසා තිබුණි. තවද, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා ඔහුට පවසා තිබුණේ, තමාට වගඋත්තරකාර පොලිස්පතිවරයා සම්බන්ධ කර ගත නොහැකි වූ බවත්, එබැවින් මෙම සිද්ධිය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයා අමතා තමාට දැනුම් දෙන ලෙසත්ය.

කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් මෙම තොරතුරු දැනගත් විට, සිද්ධිය පිළිබඳ වැඩි විස්තර ලබා ගැනීමට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතාට අවශ්‍ය වූ අතර, ඒ අනුව ඔහු වැලිගම -සහකාර පොලිස් අධිකාරී, මාතර SSP සහ පසුව නියෝජ්‍ය පොලිස්පති- මාතර යන මහත්වරුන්ට කතා කොට ඇත. එවිට ඔහුට දැනගන්නට ලැබුණේ කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම ප්‍රදේශයේ අදාළ බලධාරීන්ට දැනුම් නොදී වැලිගමට ගොස් ඇති

බවයි. එම කාලය තුළ, පොලිස්පතිවරයා එක් අවස්ථාවක ඔහුගේ දුරකථනයට පිළිතුරු දුන් බැවින්, කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ විසින් පොලිස්පතිවරයාට යැවීමට අවශ්‍ය යයි කියූ පණිවිඩ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා විසින් යවා තිබුණි. ඒ අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුට දුරකථනයෙන් 'ගියපු එවුන් පිස්සුවක් කෙලලා ද? මුන් බීල ද හිටියේ?' යනුවෙන් විමසා ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුට පවසා ඇත්තේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට කතා කරන බවයි. නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සාක්ෂි මෙසේය.

ප්‍ර: කලින් සාක්ෂි දීමේදී තමුන්ට හැඟිච්ච දෙයක් ගැන සඳහන් කරමින් ආවේ?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: පැහැදිලි කරන්න, මොකක්ද ඒක?

උ: ස්වාමීනි, මේ සිද්ධියෙන් පසු පාන්දර මගේ මතකයේ හැටියට 2.45ට වාගේ -

**පරීක්ෂණ කමිටුවෙන්:-**

ප්‍ර: මොන සිද්ධියෙන් පසුවද?

උ : වැලිගම. අද සාක්ෂි දෙනු ලබන සිද්ධිය ගැන.

ප්‍ර: වෙඩි තැබීමේ සිද්ධිය?

උ: වෙඩි තැබීමේ සිද්ධිය. සාමාන්‍යයෙන් ඕනෑම වෙඩි තැබීමේ සිද්ධියක් සිදු වූ වහාම ක්ෂණිකව පොලිස්පතිට දැනුම් දීම මගේ වගකීමක්, පොලිස්පතිතුමාට විතරක් නෙවෙයි. මම කලින් සාක්ෂි ලබා දෙමින් දැනුම් දුන් හයරාකි එකේ සියලුම අයට දැනුම් දීමක් සිද්ධ කරනවා. පාන්දර 2.45ට විතර මම තද නින්දේ පසු වුණේ. එසේ පසුවන අවස්ථාවේ දී මගේ දුරකථනය නාද වුණා.

ප්‍ර: ඒ කියන්නේ ඔය 31 වැනිදාද?

උ: එහෙමයි, ස්වාමීනි. දුරකථනයේ නාද වුණා. ඒ නාද වෙන අවස්ථාවේදී මම හිතන්නේ තද නින්ද නිසා මම ඒ දුරකථනය දෙපාරක්, තුන් පාරක් විතර විසන්ධි කිරීමක් සිද්ධ කළා. සයිලන්ට් කිරීමක්. නමුත් අවසානයේදී ඇහැරිලා මම ආන්සර් කළා. නිදිමතේම මම ආන්සර් කළා. එතකොට අනෙක් පැත්තෙන් කථා කළ කෙනා" සර්, මම නෙවිල් සිල්වා කථා කරන්නේ කියලා" දැනුම් දුන්නා. පොලිස්පතිතුමා කන්ටැක්ට් කරගන්න බැහැ. හදිසියේම පොලිස්පතිතුමාව කන්ටැක්ට් කරගන්න ඕන සර්. සිද්ධියක් තිබෙනවා කියලා කිව්වා. එතකොට මම ඇහුවා, මොකක්ද කියලා. ඒ අවස්ථාවේදී කිව්වා, CCD ටීම් එකකට වැලිගමදී වෙඩි වැදිලා තිබෙනවා සර් කියලා. ඒක අන්ඩර්

වර්ඩ් එකෙන් තියල තිබෙන කථාවක් තමයි ස්වාමීනී, මුලින්ම දැනුම් දුන්නේ. ඉන් අනතුරුව මම ඒක වෙරිෆයි කරගන්න ඕනෑ නිසා විශේෂ කාර්යාංශ මූලස්ථානයට දුරකථන ඇමතුමක් අරගෙන දැනුම් දුන්නා, මෙවැනි සිද්ධියක් වාර්තා වෙලා තිබෙනවාද කියන එක. ඒ අවස්ථාවේ ඒ වන විට වාර්තා වෙලා තිබුණේ නැහැ. මම කිව්වා, මාතර ප්‍රධාන ඒකකයේ ස්ථානාධිපතිට වහාම මට දුරකථන ඇමතුමක් ගන්න කියලා. ඒ අතර මම පොලිස්පතිතුමාටත් දුරකථනයෙන් උත්සහ කරමින් හිටියා.

ඒ වාගේම මම මේ සිද්ධිය පිළිබඳව - මොකද, බුද්ධි අංශ අධ්‍යක්ෂවරයා හැටියට හරි තොරතුරු පොලිස්පතිතුමාට දෙන්න ඕනෑ නිසා මම සහකාර පොලිස් අධිකාරි - වැලිගම හට කථා කළා මතකයි, කිහිප අවස්ථාවක. ඒ වාගේම කොට්ඨාස භාර නිලධාරීටත් කථා කළා. පසුව නියෝජ්‍ය පොලිස්පතිටත් කථා කළා. මම අර සාක්ෂි ලබාදෙමින් කිව්වේ, දැනුම් දීමකින් තොරව ගමන් කර තිබුණේ කියන එක දැනගත්තේ එසේ කථා කරන අවස්ථාවලදී.

ඊට පසුව පොලිස්පතිතුමා දුරකථනයට ආන්සර් කළා. මට තේරුණා, එතුමා නින්දේ පසු වෙන්නේ කියලා. එතුමාට මම කිව්වා, මෙහෙම නෙවිල්ට සර්ව කන්ටැක්ට් කරගන්න අවශ්‍යයි කියලා කියනවා, සීසීඩී එකෙන් ගියපු ටීම් එකකට වෙඩි වැදිලා කියලා නෙවිල් දැනුම් දෙනවා කියලා. එතකොට පොලිස්පතිතුමා මට දැනුම් දුන්නා, - ගියපු එවුන් පිස්සුවක් කෙළලා, උන් පිස්සුවක් කෙළලාද කියලා මට කිව්වා. කියලා, නෙවිල්ට කථා කරන්නම් කියලා දැනුම් දුන්නා, ස්වාමීනි.

සිද්ධිය පිළිබඳ වැඩිදුර තොරතුරු තහවුරු කර ගැනීම සඳහා නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා තවදුරටත් කටයුතු කළ අතර, වැඩබලන අධ්‍යක්ෂ සීසීඩී සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා විසින් මෙම සිදුවීම සිදු වූ ආකාරය පිළිබඳව සිදු කල විස්තර කිරීම, මාතර ප්‍රදේශයේ පොලිස් බලධාරීන් විසින් විස්තර කරන ලද ආකාරය නොවන බව ඔහුට වැටහුණි. සීසීඩී අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා විසින් විස්තර කරන ලද සිදුවීම්වල අනුවාදය පිළිබඳව ඔහුට එවිට සැකයක් මතු වී තිබුණි. මන්ද, ඒ මොහොතේ සීසීඩී කණ්ඩායමට පාතාල කණ්ඩායම් වලින් වෙඩි තැබීමක් සිදුවී ඇති බව මාතර පොලිස් නිලධාරීන් තහවුරු නොකළ බැවිනි. එපමණක් නොව, අදාළ අවස්ථාවේදී W15 හෝටලය ඉදිරිපිට සීසීඩී වෑන් රථයට වෙඩි තැබුවේ වැලිගම පොලිස් ස්ථානයේ රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන් බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා මාතර පොලිස් නිලධාරීන්ගෙන් දැනගෙන තිබේ.

ඉන්පසු නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනුම් දීමට පියවර ගෙන ඇත. ඒ සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා දැක්වූ ප්‍රතිචාරය වැදගත් වන අතර එම නිසා පහත දක්වා ඇත.

ප්‍ර: ඒ තහවුරු කරගත්ත එක නේ. ඒක පසුව අවස්ථාවක තබමු. සාක්ෂිකරු කිව්වා නේ පොලිස්පතිතුමාට දැනුම් දුන්නා කියලා මේක තමයි තත්ත්වය කියලා?

උ: එහෙමයි ස්වාමීනී, ඉන්පසු පොලිස්පතිතුමාට එවලේ අප දැනුම් දුන්නා මේගොල්ලන් අවසර අරගෙන නැතිව ගිය බව.

ප්‍ර: ඒ කොයි වෙලාවේ ද?

උ: 31 වන දින උදේ. ඊට පසුව මුළු ලංකාවේම සිදුවීම් පිළිබඳව පොලිස්පතිතුමා නැවත උදේ 5.30ත් 6.00ත් අතර වාගේ දැනුවත් කරනවා. ඒ අවස්ථාවේදී සොයාගත් සියලු කරුණු එක්ක දැනුවත් කළා. ඊට අමතරව මගේ මතකයේ හැටියට එදින කාර්යාලයේදී හමුවුණා. පොලිස්පතිතුමා ඒ වන විට කිව්වා, මේක under world teams, බුද්ධි අංශ කට්ටිය දාලා, කවුද මේ වෙඩි තියල තිබෙන්නේ කියන එක සම්බන්ධයෙන් සොයන්න උපදෙස් දුන්නා. ඒ වගේම මම කිව්වා, මේ අය අවසර අරගෙනත් නෙමෙයි ගිහිල්ලා තිබෙන්නේ කියන එක. මට මතකයි පොලිස්පතිතුමා මුල්ම අවස්ථාවේදී කිව්වා, මම දැනුම් දුන්න වෙලාවේදී කිව්වා," නිලධාරීන් පිස්සු කෙළලාද, බීලා පිස්සු කෙළලාද?" කියන එක තමයි මට දැනුම් දුන්නේ. ඒවගේම කිව්වා," මේ කණ්ඩායම බීලාද හිටියේ කියලත් සොයලා දැනුම් දෙන්න කියලා" කිව්වා ස්වාමීනී.

කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන් වෙඩි තැබූ බව කොළඹ අපරාධ කොට්ඨාස වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා කිසිදු අවස්ථාවක තමාට පවසා නොමැති බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා සිය සාක්ෂියේදී නිශ්චිතවම ප්‍රකාශ කර ඇත. වෙඩි තැබීමෙන් W15 හෝටල් පරිශ්‍රයට හානි සිදුවී ඇති බව වැලිගම -සහකාර පොලිස් අධිකාරී විසින් ඔහුට දන්වන ලදී. ඉන්පසුව, DIG නිශාන්ත ද සොයිසා විසින් මෙම තත්ත්වය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයාට නැවත දැනුම් දී තිබුණි. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂි පහත දැක්වේ.

උ: සහකාර පොලිස් අධිකාරිට කථා කළාට පස්සේ සහකාර පොලිස් අධිකාරී මට දැනුම් දුන්නා, මොබයිල් එකෙන් වෙඩි තියලා තියෙනවා. මේ අය නොනවත්වා ගිහිල්ල තිබෙනවා කියලා.

ප්‍ර: ඒ 31 වැනිදා උදේ 6.00 විතර වෙන කොට?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: ඒ සොයා ගැනීම නෙවිල් සිල්වා කියපු එකට වඩා වෙනස් නේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒ තොරතුර වැඩ බලන පොලිස්පතිතුමාටත් දැනුම් දුන්නාද?

උ: දැනුම් දුන්නා.

ප්‍ර: ඒ කීයට විතරද?

උ: මම හිතන්නේ හයත්, හය හමාරත් අතර.

ප්‍ර: 31 වැනිදා?

උ: එහෙමයි.

ප්‍ර: කොහොමද දැනුම් දුන්නේ?

උ: ඒ ඒ වෙලාවට ලංකාවේම තිබෙන බුද්ධි තොරතුරු දැනුම් දෙනවා. ඒ අතරේ මේක විශේෂ නිසා මුලින්ම මේක ගැන දැනුම් දීලා කිව්වා." සර්, සිද්ධියේදී කම්බයින් මොබයිල් එකෙන් වෙඩි තියලා තිබෙනවා, සී.සී.ඞී. එකේ වෑන් එකට. නමුත් නෙවිල්ලා කියනවා, අර පැත්තෙන් වෙඩි තිබ්බ කියල. නමුත් ඒ.එස්.පී. කියනවා, මේගොල්ලන්ගේ මොබයිල් එකෙනුත් වෙඩි තිබ්බා කියලා කියනවා" කියලා.

එවකට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන බුද්ධි අංශය වන විශේෂ ශාඛාවේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේය. නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා වැඩිදුර සාක්ෂි ලබා දෙමින් 2023-12-31 වන දින අලුයම වැලිගම W15 හෝටලය ඉදිරිපිටදී කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන්ට වෙඩි තැබුවේ අපරාධකරුවෙකු බවට කිසිදු සාක්ෂියක් මෙතෙක් හමු වී නොමැති බව ප්‍රකාශ කළේ එම පදනම මත යි. තවද, මාතර සහ හම්බන්තොට ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස වත්මන් නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා ද සාක්ෂි මගින් මෙම කරුණ තහවුරු කළේය. වැලිගම, මාතර පොලිස් කොට්ඨාශයට අයත් බව මෙහිදී සඳහන් කළ යුතුය. මෙයින් අදහස් කරන්නේ, එදින වැලිගම W15 හෝටලය ඉදිරිපිටදී කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන් තුවාල ලබා / මිය ගියේ සංවිධානාත්මක අපරාධ කල්ලියක සාමාජිකයෙකු විසින් මෙහෙයවන ලද වෙඩි තැබීමකින් බවට කිසිදු සාක්ෂියක්, ඒ කාලයේ පමණක් නොව වර්තමානයේදී ද නොමැති බවයි.

කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන් මෙම නීති විරෝධී ක්‍රියාවෙහි නිරත වී ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාස වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සහ වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පෙළඹවීම හෝ අනුමැතිය සහිතව බවට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ මෙම සියලු කරුණු මත පදනම්වයි.

කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථය දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමට පැමිණ එහි රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් විසින් එය නතර කරන ලද බවට තහවුරු කර ගැනීම සඳහා නිශාන්ත ද සොයිසා මහතා අධිවේගී මාර්ග අංශයේ අධ්‍යක්ෂවරයා ද අමතා ඇත. කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම යම් නීති විරෝධී ක්‍රියාවක නිරත වී ඇති බවට නිගමනය කිරීමට මෙම කරුණ ද උපකාරී විය. කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල්ගේ මරණයට හේතු වූ තත්වයන් සැලකිල්ලට ගනිමින් ඔහුට ත්‍යාගයක් ලබා දීමට තීරණය කිරීම ද නීති විරෝධී ක්‍රියාවක් බව DIG නිශාන්ත ද සොයිසා සාක්ෂි දී ඇති අතර, මෙම සිද්ධිය සම්බන්ධයෙන් කොළඹ නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර කිසි විටෙකත් තමා සමඟ සම්බන්ධ නොවූ බව DIG නිශාන්ත ද සොයිසා නිශ්චිතවම ප්‍රකාශ කර ඇත.

නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා සිය සාක්ෂියේ සඳහන් කර ඇත්තේ, මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් 2025.02.27 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගෙන ඉදිරිපත්

කරන ලෙස CIDයට නියෝග කරමින් නියෝගය ප්‍රකාශයට පත් කළ වහාම, දේශබන්දු තෙන්නකෝන් මහතාගෙන් තමාට ඇමතුමක් ලැබුණු බවත්, ඔහු මහේස්ත්‍රාත්වරයා පිළිබඳ විස්තර, අධිකරණ දිනය ආදිය පිළිබඳව විමසූ බවත්ය. මෙම සාක්ෂියෙන්, 2025.02.27 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයාට තිබූ දැනුම පැහැදිලි විය. අවසාන වශයෙන්, ඔහු වෙත යොමු කරන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින්, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා මෙසේ පැවසීය:

ප්‍ර: අවසාන වශයෙන් මෙම ගරු කමිටුව හමුවේ කියන්න, ඔබගේම හිටපු ආයතන ප්‍රධානී, දේශබන්දු තෙන්නකෝන් මහත්මයාට විරුද්ධව යම් ආකාරයක ද්වේශ සහගත, අසත්‍ය සාක්ෂියක් මේ කමිටුව ඉදිරියේ දීමට අවශ්‍යතාවයක් තිබෙනවාද?

උ: කිසිසේත්ම නැත ස්වාමීනි. එතුමා යටතේ මගේ මතකයේ හැටියට මා අවස්ථා තුනක රාජකාරී කර තිබෙනවා. නුගේගොඩ කොට්ඨාශය භාර නිලධාරියා ලෙස කටයුතු කරද්දී මම සහකාර පොලිස් අධිකාරීවරයෙක්. ඊට අමතරව එතුමා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති හැටියට කටයුතු කරන කොට මම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මධ්‍යම පළාත හැටියට රාජකාරී කළා ස්වාමිනි. ඊට අමතරව එතුමා වැඩ බලන පොලිස්පති හැටියට කටයුතු කරද්දී මම විශේෂ කාර්යාංශයේ අධ්‍යක්ෂවරයා හැටියට ඉතාම ළඟින් රාජකාරී කළා. එතුමාට විරුද්ධව අසත්‍යයක් ප්‍රකාශ කිරීමට කිසිසේත්ම මට අයිතියක් නැහැ සහ මම එහෙම කරන්නේ නැහැ. මොකද, වසර 34ක මගේ සේවා කාලය. එතුමාට ඇති වෙලා තිබෙන මේ තත්ත්වය පිළිබඳව මට තිබෙන්නේ කනගාටුවක්. ඇත්ත වශයෙන්ම පොලිස් දෙපාර්තමේන්තුවේ ඉඳුරාම සහකාර පොලිස් අධිකාරිවරයෙක් හැටියට බඳවා ගන්නා නිලධාරීන් හැටියට අපි ස්වාමීනි උප පොලිස් පරීක්ෂකවරුන් හැටියට බැඳෙන්නේ. එතුමා දක්ෂ නිලධාරියෙක්. ඒ වගේම පොලිස් දෙපාර්තමේන්තුවට සැහෙන සේවයක් කරපු නිලධාරියෙක්. ඇතිවෙලා තිබෙන තත්ත්වය පිළිබඳව මා අවංකවම කනගාටු වෙනවා. නමුත් වෙච්ච ප්‍රායෝගික තත්ත්වය මා විසින් අධිකරණයට මෙන්ම මෙම කමිටුවටත් ප්‍රකාශ කළ යුතු වෙනවා. ඒ අනුව මම ප්‍රකාශ කරන්නේ, සත්‍යයක්.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගෙන් දැඩි ලෙස හරස් ප්‍රශ්න ඇසීය. කෙසේ වෙතත්, එවැනි හරස් ප්‍රශ්නවලට පවා මුහුණ දෙමින්, ඔහු තම ප්‍රධාන සාක්ෂි ලෙස ප්‍රකාශ කළ දෙයෙහි නිරපේක්ෂ අනුකූලතාව පවත්වා ගනිමින් නිශ්චිත ස්ථාවරයක සිට ඇත. හරස් ප්‍රශ්න කිරීමේදී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ පුද්ගලයින් 149 දෙනෙකුගේ නම් ලැයිස්තුව සම්බන්ධයෙන් ඔහුගේ කාර්යභාරය වූයේ කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය කිරීම පමණක් බවත්, එනම් පොලිස් විශේෂ කොට්ටාශය සතුව ඇති අවශ්‍ය බුද්ධි තොරතුරු සැපයීම පමණක් බවත්ය. පොලිස් විශේෂ කොට්ටාශය සෘජුවම පොලිස්පතිවරයා යටතේ පවතින බවත් එම කොට්ටාශයට අනුයුක්ත නිලධාරීන් දිවයිනේ සෑම ප්‍රදේශයකම ස්ථානගත කර ඇති බවත් ඔහු පැවසීය. එබැවින්, එදින වැලිගම W15 හෝටලය ඉදිරිපිට ඇත්ත වශයෙන්ම සිදුවූයේ කුමක්දැයි තහවුරු කර ගැනීමට වගඋත්තරකාර පොලිස්පතිවරයාට පහසුවෙන් ක්ෂණික පියවර ගත හැකිව තිබූ බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගේ ස්ථාවරයයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතාට යෝජනා කර ඇත්තේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනී යැයි බියෙන් සිටින බැවින් ඔහු CID වෙත කළ ප්‍රකාශයේ මෙම කරුණු සඳහන් කළ බවයි. මෙම යෝජනාව ප්‍රතික්ෂේප කරමින් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ අත්අඩංගුවට ගැනීමට අවශ්‍ය වන වරදක් ඔහු සිදු කොට නොමැති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් උපදේශකවරයා ද මෙම සාක්ෂිකරුට යෝජනා කළේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා W15 හෝටලය පිළිබඳ තොරතුරු ඉල්ලා සිටි බවට කරන ප්‍රකාශය අසත්‍ය ප්‍රකාශයක් බවයි. කෙසේ වෙතත්, මෙම  සාක්ෂිකරු එම යෝජනාව ද ප්‍රතික්ෂේප කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා තවදුරටත් යෝජනා කර ඇත්තේ, SI ප්‍රියංකර අදාළ අවස්ථාවේදී W15 හෝටලය අසලට ගොස් නොමැති බවයි. සාක්ෂිකරු මෙම ස්ථාවරය පිළිගෙන නැත. කෙසේ වෙතත්,  කොළඹ අපරාධ කොට්ඨාස වෑන් රථය දකුණු අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේදී නතර කර ඇති බව තහවුරු කර ගැනීම සඳහා අධිවේගී මාර්ග  අංශයේ SSP මයුර පෙරේරා මහතා සම්බන්ධ කර ගැනීම පිළිබඳව ද වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා ප්‍රශ්න කර ඇත. ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂිවල  විශ්වසනීයබාවය බිඳහෙළීමේ අරමුණින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරාගෙන් කිසිදු ප්‍රශ්නයක් විමසා නැත. තවත් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා ඔහුගේ ප්‍රධාන සාක්ෂි ලෙස දැනටමත් ප්‍රකාශ කර ඇති සියලුම සත්‍ය ස්ථාවරයන් නැවත අවධාරණය  කර ඇත.

හරස් ප්‍රශ්න අතරතුර ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ බස්නාහිර පළාතේ ඉහළ අපරාධ රැල්ලක් පවතින බවත්, මිනීමැරුම් සංඛ්‍යාව වැඩි වී ඇති බවත් එය පොලිසියට අභියෝගයක් බවත්ය.  කොළඹ අපරාධ කොට්ඨාස  නිලධාරීන් මෙම නීති විරෝධී ක්‍රියාවෙහි යෙදී ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පෙළඹවීම හෝ අනුමැතිය සහිතව බවට කළ නිරීක්ෂණය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න කළ විට, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මෙසේ පැවසීය.

ප්‍ර: එතකොට විශාල ජංගම මුරසේවා ප්‍රමාණයක් පාතාල මර්දනයට සහ මත්ද්‍රව්‍ය ජාලය මර්දනයට ඒ කාලය වෙන කොට යොදවලා තිබුණා?

උ: බස්නාහිර පළාතෙත්, දකුණු පළාතෙත් අපරාධ රැල්ල ඉහළ ගිහින් තිබුණා. මිනී මැරීම් වැඩිවෙලා තිබුණා. ඒක පොලිසියට ලොකු අභියෝගයක් වෙලා තිබුණා. ඒක මැඩපැවැත්වීම සඳහා යොදවලා තිබුණා.

ප්‍ර: ඔබතුමා බුද්ධිමත් නිලධාරියෙක් හැටියට හිතනවාද, පොලිස්පතිවරයා ඒ වාගේ වේලාවක ගිහිල්ලා හෝටලයකට පහර දෙන්න උත්සාහයක් දරයි කියලා. මම යෝජනාවක් කරන්නේ ?

උ: පොලිස්පතිතුමා උත්සාහයක් දැරුවාද, නැද්ද කියන එක ගරු විනිශ්චය මණ්ඩලය තීරණය කරයි. මම කියන්නේ මට දැනගන්න ලැබුණු කාරණා.

ප්‍ර: මම අහන්නේ, දේශබන්දු මහත්මයා විසින්ම හමුදාවත් කැඳවලා, දේශබන්දු මහත්මයා විසින්ම ත්‍රස්ත මර්දන කණ්ඩායම් 30කුත් පාරට දාලා, දේශ බන්දු මහත්මයා විසින්ම යතුරුපැදි බලගණයකුත් දාලා, දේශබන්දු මහත්මයා විසින්ම ජංගම සංචාරත් දාලා එතනට අනීතික ක්‍රියාවක් කරන්න කියලා තමන්ගේ නිලධාරීන් කණ්ඩායමක් යවයි ද?

උ: අපිටත් තිබෙන ප්‍රශ්නය ඒක තමයි. අපිත් මුල් අවධියේදී කල්පනා කළා. නමුත් පවතින තත්වයන් අනුව එවැනි තත්ත්වයක් ඇති වී තිබෙන බව තමයි නිරීක්ෂණය වෙන්නේ.

ප්‍ර: ඔබ කියන්නේ දේශබන්දු මහත්මයා එතැනට කණ්ඩායමක් යැව්වා කියලද?

උ: දේශබන්දු මැතිතුමාගේ උපදෙස් මත CCD එකේ කණ්ඩායමක් ගියා කියන එක තමයි මම අදහස් කරන්නේ.

ප්‍ර: ඒක තමන් හිතන දෙයක්ද, ඒකට මොනවා හරි තොරතුරක් තමන් ගාව තිබෙනවාද?

උ: එළඹෙන කාරණා මත මගේ නිරීක්ෂණය මම කිව්වේ.

එපමණක් නොව, හරස් ප්‍රශ්න ඇසීමේ දී මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ සාමාන්‍ය තත්වයන් යටතේ, බාහිර පළාතකින් පොලිස් නිලධාරීන් කණ්ඩායමක් පැමිණෙන ඕනෑම අවස්ථාවක ප්‍රදේශයේ පොලිස් බලධාරීන්ට දැනුම් දිය යුතු බවයි. වැලිගම පොලිසිය වෙත තම පැමිණීම පිළිබඳව දැනුවත් කිරීමට කොළඹ අපරාධ කොට්ඨාසය අපොහොසත් වීම මෙම අවාසනාවන්ත සිදුවීමට එක් හේතුවක් බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා ප්‍රකාශ කර තිබේ.

හරස් ප්‍රශ්න කිරීමේදී තවදුරටත් සාක්ෂි ලබා දෙමින්, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා තහවුරු කර ඇත්තේ, මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් මරණයට අදාළ හේතු ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වගඋත්තරකාර පොලිස්පතිවරයා තමාට කතා කර මහේස්ත්‍රාත්වරයා පිළිබඳ සහ අධිකරණ දිනයන් ආදිය පිළිබඳ තොරතුරු ඉල්ලා සිටි බවයි. තවද, හරස් ප්‍රශ්න කිරීමේදී නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි දෙමින් කියා සිටියේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා පරීක්ෂණයක් පැවැත්විය යුතුව තිබූ බවයි. අදාළ ප්‍රශ්නය සහ මෙම සාක්ෂිකරුගේ පිළිතුර පහත පරිදි වේ:

ප්‍ර: එහෙම කියලා නම්, ඒ කියන්නේ නීති විරෝධී ක්‍රියාවක් වෙලා කියලා, කියලා නැත්නම් ඔහු ආරම්භ කරන්න ඕනෑද?

උ: මා මුල් අවස්ථාවේදී මෙතන යම්කිසි ගැටලු සහගත තත්වයක් තිබෙන බව දැනුම් දුන්නා. එතුමා ඒ අවස්ථාවේදී ඇත්ත වශයෙන්ම නියෝගයක් කරලා විමර්ශනයක් ආරම්භ කළා නම් අද එතුමා පත්වෙලා ඉන්න තත්ත්වයට එතුමා පත් වෙන්නෙත් නැහැ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ, කොළඹ අපරාධ කොට්ඨාස නිලධාරීන් විසින් W15 හෝටලයට වෙඩි තැබීමේ සිද්ධියට වගඋත්තරකාර පොලිස්පතිවරයා සම්බන්ධ බවට ඔහු ඉදිරිපත් කළ සාක්ෂි අසත්‍ය බවයි. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරු එම යෝජනාව ප්‍රතික්ෂේප කර ඇත.

නැවත ප්‍රශ්න කිරීමේදී තම ස්ථාවරය තවදුරටත් පැහැදිලි කරමින්, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා නැවත අවධාරණය කර ඇත්තේ, වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා මුලින් ප්‍රකාශ කළ ආකාරයට සිදු වී ඇත්නම් (එනම්, සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් වැලිගමට රාජකාරියට ගිය පොලිස් නිලධාරීන් කණ්ඩායමකට අනුයුක්ත පොලිස් සැරයන්වරයෙකු ඝාතනය කිරීම) එය ඉතා බරපතල කාරණයක් වනු ඇති බවයි. කෙසේ වෙතත්, හි පොලිස් සැරයන් උපුල් මහතා ඝාතනය කළ මෙම සංවිධානාත්මක අපරාධ කණ්ඩායම පිළිබඳව වැඩිදුර කිසිවක් සොයා ගැනීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසි විටෙකත් කිසිදු පරීක්ෂණයක් ආරම්භ කර හෝ එවැනි කිරීම සඳහා නියෝග කොට නැත. එපමණක් නොව, ඉහත සඳහන් කළ පරිදි, මාතර සහ හම්බන්තොට කොට්ඨාශ භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා ද මෙම විමර්ශන කමිටුව ඉදිරියේ නිශ්චිතව ප්‍රකාශ කර ඇත්තේ W15 හෝටලය ඉදිරිපිට කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායමට වෙඩි තැබීම සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් සිදු කරන ලද බවට මේ දක්වා සාක්ෂි කිසිවක් මතු වී නොමැති බවයි. තවද, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම විසින් සිදු කරන ලද වෙඩි තැබීම්වලින් සීසීඩී හි පොලිස් සැරයන් උපුල් මිය ගිය බැවින්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැලිගම පොලිසිය විසින් අපරාධ විමර්ශනය සිදු කිරීම වැරදි බව නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගේ ස්ථාවරයයි. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂි පහත පරිදි වේ:

ප්‍ර: වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා යටතේ තිබ්බ්ච ජංගම මුර සංචාරයෙන් කරපු වෙඩි තැබීමකින් තවත් පොලිස් නිලධාරියෙක් මැරුණාම එම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා යටතේම විමර්ශනයක් කරන එක හරිද?

උ: වැරදියි, ස්වාමීනි. සාමාන්‍යයෙන් අපි පාවිච්චි කරන ක්‍රමවේදය තමයි විනිවිදභාවය සඳහා වෙනත් පරීක්ෂකවරයෙකු පත් කරනවා, විනිවිද ව ඒ විමර්ශනය පැවැත්වීම සඳහා.

ප්‍ර: වෙනත් පරීක්ෂකවරයෙක් කියන එකෙන් සාක්‍ෂිකරු අදහස් කරන්නේ මොකද්ද?

උ: ඒ OIC ඉවත් කරලා, වෙනත් OIC කෙනෙක් පත් කරනවා. ගරු පරීක්ෂණ කමිටුවට මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කර දෙන්නම්. යම් පොලිස් ස්ථානයක් ඇතුළත සිර මැදිරියක් තුළදී අත්අඩංගුවට ගත් යම් සැකකරුවෙකු මිය ගියා කියලා හිතන්න. ඒ OICටම ඒ සම්බන්ධයෙන් විමර්ශනය කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. වෙනත් නිලධාරියකු ලව්වා තමයි මරණ පරීක්ෂණ සාක්ෂි හෝ ඒ විමර්ශන කටයුතු සියල්ලම සිදු කරන්නේ.

වැඩබලන කොළඹ අපරාධ කොට්ඨාස අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා සිය සාක්ෂියේදී, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා මෙම සිද්ධියට පටලවා ගැනීමට අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බවට අදාල විය හැකි හේතුවක් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සහකාර පොලිස්

අධිකාරී නෙවිල් ද සිල්වා මහතාගේ සාක්ෂි ඇගයීමට ලක් කරන අවස්ථාවේ දක්වා ඇති හේතු මත, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාගේ සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට මෙම විමර්ශන කමිටුව තීරණය කර ඇත. මෙම සිද්ධියට තමන් සම්බන්ධ කිරීමට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා විසින් ව්‍යාජ චෝදනා එල්ල කිරීම සඳහා පසුබිම් වන කිසිදු හේතුවක් වගඋත්තරකාර පොලිස්පතිවරයා ඉදිරිපත් කර නොමැත.

ඇත්ත වශයෙන්ම, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගේ සාක්ෂි, සීඅයි ඇන්ස්ලම් ද සිල්වා, පොලිස් සැරයන් සිසිර කුමාර සහ හමුදා සැරයන් රුවිරංග යන අයගේ සාක්ෂි සමඟ සමපාත වේ. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල සඳහන් කර ඇති හේතු නිසා, ඉමදූව පිවිසුමෙන් දකුණු අධිවේගී මාර්ගයට ඇතුළු වීම වැළැක්වීමට කොළඹ අපරාධ කොට්ඨාසයේ KDH වෑන් රථය නැවැත්වූ පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි පිළිගත යුතු බව විමර්ශන කමිටුව නිගමනය කර ඇත. මේ අනුව, ඉහත සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි, ඉමදූව පිවිසුමෙන් දකුණු අධිවේගී මාර්ගයට ඇතුළු වීම වැළැක්වීමට කොළඹ අපරාධ කොට්ඨාසයේ KDH වෑන් රථය නැවැත්වූ පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි මගින් ද හොඳින් සනාථ වේ. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල දක්වා ඇති පරිදි, 2023-12-31 දින වැලිගම පොලිසියට කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායමේ සාමාජිකයින් විසින් ලබා දුන් මුල් තොරතුරු දැක්වීම එනම්, W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් වෙඩි තැබූ විට පමණක් ඔවුන් ප්‍රතිචාර දැක්වූ බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා ඉදිරිපත් කල ස්ථාවරය වැලිගම වෙඩිතැබීමේ සිද්ධියට අදාල නිවැරදි තොරතුරු දැක්වීම වශයෙන් සැලකීම ප්‍රතික්ෂේප කිරීමට කමිටුව විසින් තීරණය කර ඇත. මේ අනුව, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගේ සාක්ෂි සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගැනීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

5) <u>හමුදා සැරයන් ගම්මැද්ද තන්ඩක්කරලාගේ චන්දිමාල් රුවිරංගගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු මාතර 3 වන ගැමුණු හේවා බළකායේ හමුදා සැරයන්වරයෙකි. සිද්ධිය වන අවස්ථාවේ ඔහු වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ලෑන්ඩ් කෲසර් ජීප් රථයේ ගමන් කළේය. පොලිස් නිලධාරීන්ට අමතරව හමුදා සොල්දාදුවන් දෙදෙනෙකුගෙන් සමන්විත මෙම රාත්‍රී ජංගම මුර සංචාරය, වැලිගම පොලිස් ස්ථානයේ පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර විසින් මෙහෙයවන ලදී. ඔවුන් 2023-12-30 වන දින සවස 6.00 සිට ප්‍රදේශයේ මුර සංචාරයේ යෙදීමට පටන් ගත් අතර 2023-12-31 වන දින අලුයම 4.00 දක්වා දිගටම කරගෙන යාමට බලාපොරොත්තු වී ඇත. 2023-12-31 වන දින අලුයම 2.00 ත් 2.30 ත් අතර, ඔවුන් ගාලු පාරේ මුර සංචාරයේ යෙදී මාතර පැත්තෙන් ගාල්ල දෙසට පැමිණෙමින් සිටියහ. අතරමගදී, කණ්ඩායම වැලිගම පැලේන වටරවුම ආසන්නයේ ඇති W15 හෝටලයට ළඟා වන විට රතිඤ්ඤා පුපුරන හඬක් ඇසුණි. පොලිස් සාජන්ට් අජිත් සිසිර කුමාර ජීප් රථයේ ඉදිරිපස අසුනේ වාඩි වී සිටියේය. මොහොතකට පසු, රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදෙන ජීප් රථය, නවතා තිබූ වෑන් රථය සෙමෙන් පසුකර ගොස් නවතා තිබූ එම වෑන් රථය ඉදිරිපිට නතර විය. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර අනෙක් අයට රථයෙන් බැස නොයන ලෙස උපදෙස් දෙමින් පොලිස් ජීප් රථයෙන් බැස නවතා තිබූ KDH වෑන් රථය දෙසට ගමන් කිරීමට පටන් ගත්තේය. හමුදා සැරයන් රුවිරංග පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර ගමන් කරන දිශාව දෙස එනම් නවතා තිබූ KDH වෑන් රථය දෙසට හොඳින් බලා සිටියේය. එවිට ඔහු නවතා තිබූ වෑන් රථය

වේගයෙන් ධාවනය වන බව දැක ඇති අතර, වැලිගම පොලිසියේ පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර ' වෑන් එකට යන්න දෙන්න එපා. වෙඩි තියපන් වෙඩි තියපන්' ' කියමින් වෑන් රථය නැවැත්වීමට නියෝග කර ඇත. ඒ අවස්ථාවේදී හමුදා සැරයන් රුවිරංග T56 රයිෆලයක් භාවිතා කරමින් පලා යන වෑන් රථය ඉලක්ක කර වෙඩි තැබුවේය. වැලිගම පොලිස් ජීප් රථය පසුකර යන විට, එනම් වැලිගම පොලිස් ලෑන්ඩ් කෲසර් ජීප් රථයට සමාන්තරව වෑන් රථය ගමන් කරන විට, වෑන් රථයට වෙඩි තැබීමට හමුදා සැරයන් රුවිරංග පටන් ගෙන තිබේ. සාක්ෂි ලබා දීමේදී, මෙම සාක්ෂිකරු තම T56 අවිය භාවිතා කර KDH වෑන් රථයට වෙඩි තබන විට තම ශරීරයේ ඉහළ කොටස ඇලව තිබූ ආකාරය තම අත් චලනයන් මගින් විමර්ශන කමිටුවට පෙන්වා දුන්නේය. තවදුරටත් පැහැදිලි කරමින්, හමුදා සැරයන් රුවිරංග පවසා ඇත්තේ වෑන් රථය ජීප් රථය පසුකර ගිය පසුවත් ඔහු වෑන් රථයට වෙඩි තැබීම දිගටම කරගෙන ගිය බවයි. පලා යන වෑන් රථයේ වීදුරු බිඳෙන ශබ්ද ඔහුට ඇසී ඇත. කෙසේ වෙතත්, KDH වෑන් රථය ගාල්ල දෙසට නතර නොවී වේගයෙන් ධාවනය වී පලා ගොස් තිබුණි. රුවිරංගට අනුව ඔහු වෙඩි 7 ක් පමණ තබා ඇත. ඉන්පසු පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර පොලිස් ජීප් රථයට නැඟී පලා යන වෑන් රථය පිටුපස ලුහුබැඳ යාමට උත්සාහ කළ නමුත් පොලිස් ජීප් රථයේ දුර්වල යාන්ත්‍රික තත්ත්වය හේතුවෙන් එය සාර්ථක නොවීය. හමුදා සැරයන් රුවිරංග කමිටුව ඉදිරියේ ඔහුගේ සාක්ෂියේදී පවසා ඇත්තේ පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර මේ සම්බන්ධයෙන් වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක වෙත වාර්තා කළ බවත්, ඔහු මේ පිළිබඳව ඔහුගේ කඳවුරේ අණදෙන නිලධාරී මේජර් තිලකරත්න වෙත වාර්තා කළ බවත්ය.

නවතා තිබූ KDH වෑන් රථය තුළ සිටි පුද්ගලයින් W15 හෝටලයට වෙඩි තබන අවස්ථාවේ ඒ අවට වෙනත් කිසිවෙකු නොසිටි බව හමුදා සැරයන් රුවිරංග ඔහුගේ සාක්ෂියෙන් විශේෂයෙන් තහවුරු කර ඇත. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂි පහත පරිදි වේ:

ප්‍ර: මහත්මයාලා කිව්වා නේ ජීප් රථයෙන් W 15 හෝටලය දෙසට එන විට ඒ හෝටලය ආසන්නයේ වෑන් රථයක් නවත්වලා වෙඩි තබමින් සිටියා කියලා?

උ: එහෙමයි, ස්වාමීනී.

ප්‍ර: වෑන් රථය ආසන්නයේ භූමියේ කවුරුන් හෝ සිටියා ද ?

උ: භූමියේ කවුරුත් හිටියේ නැහැ.

ප්‍ර: එතකොට ඒ වෑන් රථයේ සිට වෙඩි පහරවල් කවර දෙසටද එල්ල වෙමින් තිබුණේ?

උ: හොටෙල් එකේ ගේට්ටුව පැත්තට තමයි එල්ල වෙමින් තිබුණේ.

ප්‍ර: ඒ අවට හෝ පාරේ මොන පැත්තක හරි යම්කිසි පුද්ගලයකු හෝ පුද්ගලයන් කණ්ඩායමක් එහෙම පේන්න සිටියාද?

උ: එහෙම කවුරුත් දැක්කේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: කිසිම මිනිස් පුළුටක් ඒ ප්‍රදේශයේ තිබුණෙ නැහැ?

උ: තිබුණේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: ඒ ස්ථානයේ එළියේ මොනවාගේද තිබුණේ?

උ: එළිය තිබුණා, ස්වාමීනි, ලයිට් දාලා තිබුණා.

ප්‍ර: පාරේ ලයිට් එහෙම තිබුණාද?

උ: පාරේ ලයිට් දාලා තිබුණා.

ප්‍ර: ඒ කියන්නේ, හෝටලයේ ආලෝක තත්ත්වයක් තිබුණාද ඒ අවස්ථාවේදී?

උ: හෝටලයේ ආලෝක තත්ත්වයක් ඒ තරම් ලොකුවට තිබුණේ නැහැ.

ප්‍ර: මහා මාර්ගයේ විදුලි බුබුළු තිබුණාද?

උ: එළිය තිබුණා.

ප්‍ර: කෙනෙක්ව හදුනා ගන්න පුළුවන් ආලෝක තත්ත්වයක් තිබුණා?

උ: එහෙමයි, ස්වාමීනී.

වෑන් රථයට තමා වෙඩි තබන ලද්දේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් ඉල්ලා සිටි කප්පම් මුදල් නොගෙවීම හේතුවෙන් W15 හෝටලයට වෙඩි තබන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් යැයි තමා සිතූ නිසා බව මූලික සාක්ෂි වලදී තවදුරටත් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, හමුදා සැරයන් රුවිරංග මෙම විමර්ශන කමිටුවට පවසා තිබේ. එම වෑන් රථය තුළ සිටියේ පොලිස් නිලධාරීන් බව විශ්වාස කිරීමට හේතු තිබුනේ නම් තමා කිසි විටෙකත් වෑන් රථයට වෙඩි නොතබන බව ද ඔහු පැවසීය. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂි පහත පරිදි වේ:

ප්‍ර: මේ වෙඩි වැදුනේ පොලිස් කණ්ඩායමට බව දැන ගත්තාම මහත්මයාට මොකක්ද හිතුණේ?

උ: මට ලොකු upset එකක් හිතුණා. එහෙම දෙයක් මම දැනගෙන කළේ නැහැ. මම ඒ ආපු CI සර්ට කිව්වා "සර්, සමාවෙන්න මම පොලීසියෙන් බව දන්නෙ නැහැ" කියල. ඒ පාර ඒ සර් කිව්වා, "සාජන්, ඔයාගේ job එක නේ ඔයා කළේ " කියල.

එපමණක් නොව, පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර වෑන් රථය දෙසට ගමන් කිරීමට පටන් ගන්නා විට, වෑන් රථය තවමත් W15 හෝටලය ඉදිරිපිට නවතා තිබූ බව හමුදා සැරයන් රුවිරංග සිය සාක්ෂියේ සඳහන් කර තිබේ. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර වෑන් රථයට වෙඩි තැබීමට නියෝග කළේ පොලිස් ජංගම මුර සංචාර නිලධාරීන්ගෙන් බේරීම සඳහා වෑන් රථයේ සිටි කණ්ඩායම වේගයෙන් පලා යාමට පටන් ගත් බැවිනි. හමුදා සැරයන් රුවිරංග තම වෙඩි තැබීම හේතුවෙන් වෑන් රථය තුළ මිය ගියේ කවුරුන්ද යන්න පිළිබඳව තවමත් නොදනී. 2023-12-31 දින උදෑසන වැලිගම පොලිස් ස්ථානයට ගෙන එන විට ඔහු වෙඩි තැබූ වෑන් රථය හඳුනාගෙන තිබුණි. ඔහු විසින් එල්ල කරන ලද වෙඩි පහරින් වෑන් රථයට හානි සිදුවී ඇති බව වැලිගම පොලිස් ස්ථානයේදී ද නිරීක්ෂණය කර තිබුණි. වෙඩි තැබීමෙන් වෑන් රථයට හානි සිදු වූ ස්ථාන සම්බන්ධයෙන් සළකා බැලීමේ දී වෑන් රථයට එම හානිය සිදුවී ඇත්තේ ඔහුගේ වෙඩි තැබීම නිසා යන කාරණය සම්බන්ධයෙන් හමුදා සැරයන් රුවිරංගට තහවුරු විය.

හරස් ප්‍රශ්න කිරීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් උගත් නීතිඥවරයා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, තමන් 2004 දී ශ්‍රී ලංකා හමුදාවට බැඳුණු බවත්, රටේ උතුරු ප්‍රදේශවල මෙහෙයුම් රාජකාරිවල නිරත වූ බවත් හමුදා සැරයන් රුවිරංග මහතා ප්‍රකාශ කර තිබේ,. W15 හෝටලයේ සිට මීටර් 200-300 ක් පමණ දුරින් පිහිටි ස්ථානයක රතිඤ්ඤා පුපුරන්නාක් වැනි හඬක් තමාට මුලින්ම ඇසුණු බව ඔහු ප්‍රකාශ කර ඇත. ඕනෑම කෙනෙකුට පොලිස් ජීප් රථයේ පැමිණීම හඳුනා ගැනීමට සහ නිරීක්ෂණය කිරීමට හැකි වන පරිදි ප්‍රදේශය පුරා ප්‍රමාණවත් ආලෝකයක් තිබූ බවත් ඔහු ප්‍රකාශ කර ඇත. පොලිස් නිල ඇඳුමින් සැරසුණු පොලිස් සාජන් අජිත් සිසිර කුමාර, පොලිසියේ බවට සඳහනක් සහිත පොලිස් ජීප් රථයකින් බැස වෑන් රථය දෙසට ගමන් කිරීම, වෑන් රථය තුළ සිටි අය පොලිස් ජීප් රථයේ පැමිණීම හඳුනා ගත් බවට නිශ්චිත ඇඟවීමක් බව හමුදා සැරයන් රුවිරංග මහතා ප්‍රකාශ කළේය. මෙම පොලිස් ජීප් රථය දැක ගම්මානවල සිටින සමහර පුද්ගලයින් කලබල වී පලා යන ආකාරය තමා දුටු බව හමුදා සැරයන් රුවිරංග මහතා තව දුරටත් අදහස් දක්වමින් මෙම කරුණ තහවුරු කර ඇත. ගමේ මාර්ගවල ඉඳහිට මුර සංචාරයේ යෙදෙන මෙම ජීප් රථයේ සිටියදී ඔහු මෙය නිරීක්ෂණය කර තිබුණි.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා, මෙම සාක්ෂිකරු වෙඩි තැබීමේදී වෑන් රථයේ ටයර් ඉලක්ක කර වෙඩි තැබීම සිදු කරන ලද්දේ නම් පොලිස් සැරයන් උපුල්ගේ මරණය වළක්වා ගත හැකිව තිබූ බව පෙන්වීමට උත්සාහ ගෙන තිබේ. කෙසේ වෙතත්, හමුදා සැරයන් රුවිරංග පැහැදිලි කර ඇත්තේ වෑන් රථය පලා යාමේ අපේක්ෂාවෙන් වේගයෙන් ධාවනය වූ බැවින් එසේ කිරීම අපහසු වූ බවයි. නවතා තිබූ වෑන් රථයේ සිටි පුද්ගලයින් පොලිස් නිලධාරීන් නම්, පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර නවතා තිබූ වෑන් රථය දෙසට යන විට ඔවුන් එම වාහනයෙන් බැස තමන් පොලිස් නිලධාරීන් බව හඳුන්වා දිය යුතුව තිබූ බව හරස් ප්‍රශ්න ඇසීමේදී අසන ලද ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු දෙමින් හමුදා සැරයන් රුවිරංග මහතා පවසා තිබේ.

පොලිස් සැරයන් අජිත් සිසිර කුමාරගේ සාක්ෂි සම්බන්ධයෙන් මෙන්, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා මෙම විමර්ශන කමිටුව ඉදිරියේ හමුදා සැරයන් රුවිරංග අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බවට යෝජනා කිරීමට උත්සාහ කර නොමැත. එපමණක් නොව, වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිය පමණක් ඉටු කර ඇති බවත් කිසිදු අඩුපාඩුවක් සිදුවීම සම්බන්ධයෙන් ඔවුන්ට වරද පැටවිය නොහැකි බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂි දීමේදී විශේෂයෙන් ප්‍රකාශ කර කළේ ය. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාරගේ මෙන්ම හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි

කිසිදු අවස්ථාවක දී විවාදයට ලක්කිරීමට /විශ්වසනීයත්වය සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා උත්සාහ කළේ නැත.

විමර්ශන කමිටුව මෙහිදී නැවත අවධාරණය කරන්නේ, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා, පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස සහ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා යන අයගේ සාක්ෂි සත්‍ය සාක්ෂි මෙන් මෙම වාර්තාවේ පිළිගෙන ඇති බවයි. මෙම නිගමනයන් සඳහා හේතු මෙම වාර්තාවේ වෙනත් ස්ථානවල දක්වා තිබේ. මෙම සාක්ෂි, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි KDH වෑන් රථය ඉමදූව පිවිසුමෙන් දකුණු අධිවේගී මාර්ගයට ඇතුළු වීම නැවැත්වූ පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි මගින් සනාථ වන බව කමිටුවේ අදහස විය. මෙම වාර්තාවේ ඉදිරි පිටුවල, කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායමේ සාමාජිකයින් විසින් 2023-12-31 දින වැලිගම පොලිසියට මුලින්ම ලබා දුන් ප්‍රකාශය එනම්, W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් වෙඩි තැබූ නිසා පමණක් ඔවුන් ප්‍රතිප්‍රහාර එල්ල කළ බවට වන ප්‍රකාශය වැලිගම වෙඩිතැබීමේ සිද්ධියේ නිවැරදි සිද්ධිය ලෙස සැළකිය යුතුය යනුවෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ස්ථාවරය ප්‍රතික්ෂේප කිරීමට ද කමිටුව තීරණය කර ඇත.

මේ අනුව, විමර්ශන කමිටුව හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගැනීමට තීරණය කරයි.

හමුදා සැරයන් රුවිරංගගේ ස්වභාවය සහ ඔහු ගත් සත්‍ය ස්ථාවරයන් සලකා බැලීමේදී, W15 හෝටලයේ වෙඩි තැබීම සිදු වූ ආකාරය සනාථ කිරීමට ඔහුගේ සාක්ෂි උපකාරී වන බව පැහැදිලිය. හමුදා සැරයන් රුවිරංග වෑන් රථයට වෙඩි තබා ඇති ආකාරය; කොළඹ අපරාධ කොට්ඨාසයට අයත් වෑන් රථයේ උප පොලිස් පරීක්ෂක මධුරංග අසුන්ගෙන සිටි ස්ථානය; උප පොලිස් පරීක්ෂක මධුරංගට වෑන් රථයේ පිටුපස දොර වැසීමටවත් නොහැකි වීම; වෙඩි වැදුනේ උප පොලිස් පරීක්ෂක මධුරංගගේ දණහිසට පහළින් කකුලට වීම; යන සියල්ල තුලින් මෙම සිදුවීම සිදුවී ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සහ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස විසින් විස්තර කරන ලද ආකාරයට බව පෙන්නුම් කරයි. එබැවින්, වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සහ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස විසින් විස්තර කරන ලද ආකාරයටම සිදුවී ඇති බව සනාථ කරන තවත් සාක්ෂියක් ලෙස හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂිය යොදාගත හැකිය.

### 6) උප පොලිස් පරීක්ෂක මාවනානේ හේවා ගාමිණී ජයසේකරගේ සාක්ෂිය

උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර 2023-12-31 දින අලුයම වන විට දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ/පිටවීමේ ස්ථානයේ රාත්‍රී රාජකාරි නිලධාරියා ලෙස කටයුතු කළේය. ඔහුගේ සාක්ෂියට අනුව, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ/පිටවීමේ පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරියාට 2023-12-31 දින අලුයම 2.43 ට P-21 ලෙස සලකුණු කර මෙම කමිටුවට ඉදිරිපත් කරන ලද පණිවිඩය ලැබී තිබුණි. ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ/පිටවීමේ පොලිස් ස්ථානයට ගාල්ල පොලිස් මෙහෙයුම් කාමරයෙන් මෙම පණිවිඩය ලැබී තිබුණි. වැලිගම වෙඩි තැබීමේ සිදුවීමකින් පසු KDH මාදිලියේ වෑන් රථයක් පලා යන බව

පණිවිඩයේ සඳහන් විය. කොළඹ දෙසින් පැමිණෙන වාහන සඳහා පිටවීමේ දොරටුවේ සිටි උප පොලිස් පරීක්ෂක ජයසේකරට මෙම පණිවිඩය ලබාගන්නා නිලධාරියා විසින් මෝටරෝලා සන්නිවේදන කට්ටලය හරහා මේ පිළිබඳව දැනුම් දෙන ලදී.

ඉන්පසු අනෙක් ගේට්ටුවේ සිටි, එනම් ඉමදූව පිවිසුමේ සිට අධිවේගී මාර්ගයේ කොළඹ දෙසට ගමන් කිරීම සඳහා වන කොටසේ සිටි, පොලිස් නිලධාරියා, සැක සහිත වෑන් රථය ඇතුල්වන ස්ථානයට පැමිණෙන විට ගේට්ටුව අසල නතර කළ බව පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතාට දන්වා ඇත. එම පණිවිඩය ඇසූ සැණින්, පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර සහ පොලිස් සැරයන් විජේවික්‍රම වහාම සැක සහිත වෑන් රථය තිබූ ස්ථානයට දිව ගියහ. පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතා වෑන් රථයේ පිටුපස වීදුරුව කැඩී ඇති බව දුරසිට නිරීක්ෂණය කළේය. ඔහු වෑන් රථය අසලට පැමිණි විට, ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස හඳුන්වා ගත් පුද්ගලයෙකු ඔහුට හැඳුනුම්පතක් ලබා දුන්නේය. එම හැඳුනුම්පතේ ඡායාරූපය පැහැදිලි නැති බව ඔහුට පෙනී ගියේය. ඒ අතරතුර වෑන් රථයේ සිටි අය  කොළඹට යාමට අවසර දෙන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියයේය. වෙඩි වැදී තුවාල ලැබූ පුද්ගලයින් වෑන් රථය තුළ සිටින බව ඔවුන් හෙළි කර නොතිබුණි.

පසුව උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතා විසින්, සැකකාර වෑන් රථය නිදහස් නොකරන ලෙසත්, මාතර කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් ලබා දෙන උපදෙස් අනුව ක්‍රියා කරන ලෙසත් තමන්ට උපදෙස් දුන් පොලිස් මහාමාර්ග කොට්ඨාශයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා මහතා සම්බන්ධ කර ගත්තේය. පසුව උප පොලිස් පරීක්ෂක ජයසේකර මහතා මාතර කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා වූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතා ඇමතූ අතර, හැකි ඉක්මනින් වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා එවීමට පියවර ගන්නා බවට ඔහුට දැනුම් දෙන ලදී. ඉන්පසු, විශේෂ කාර්ය බලකා නිලධාරීන් පිරිසක් ද අධිවේගී මාර්ග පිවිසුමට පැමිණ සිටියහ. වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක උපුල් කුමාර මහතා ද ඉමදූව පිවිසුමට ළඟා විය. ඉදිරිපස වීදුරුව සහ කැඩුණු පසුපස වින්ඩ්ස්ක්‍රීනය හරහා උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතා වෑන් රථය තුළ සිටින පුද්ගලයින් දැක තිබේ. වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක එහි පැමිණි පසු ඔවුන් වාහනයෙන් බැස තිබුණි. ඔවුන් ඔහුට මෙසේ පවසා තිබුණි  “මචං අපි පොලිසියේ, ඩියුටි එකකට ආවේ මචං පොඩි මිස්ටේක් එකක් වුණා, අපට ආයේ කොළඹ යන්න ඕනේ, මේ වෙච්ච සිද්දිය ගැන IGත් දන්නවා”  උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකරගේ සාක්ෂිවලට අනුව ඔහුට මේ බව පවසා ඇත්තේ අයි.පී නිශාන්ත ලෙස හඳුනාගත් අයෙකි.

ඉන්පසුව, 1990 සුවසැරිය ගිලන් රථය එහි පැමිණ සැක සහිත වෑන් රථයේ බිම  වැතිර සිටි පුද්ගලයා ඔසවා ගිලන් රථයට ගෙන යන ලද අතර, තුවාලකරුගේ ජැකට්ටුව තුළ එකතු වූ රුධිරය බිමට ගලා ගොස් තිබුණි. අනෙක් වෙඩි වැදුණ තුවාල සහිත පුද්ගලයා කොර ගසමින් යානයෙන් ගිලන් රථයට ඇවිද ගොස් තිබුණි. ඔහුගේ කකුලට වෙඩි වැදී ඇති බව  එම පුද්ගලයා ඔහුට පවසා තිබුණි.

ගාල්ල මෙහෙයුම් කාමරයේ P-21 පණිවිඩයේ සඳහන් වූ ආකාරයට එය වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු පලා යන වෑන් රථයකි. උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර පොලිස් සැරයන් විජේවික්‍රමට T56 රයිෆලයකින් සන්නද්ධ වන ලෙස උපදෙස් දී තිබුණි.

උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතාගේ සාක්ෂියට අනුව, සැකකාර වෑන් රථයේ සිටි පුද්ගලයින් කොළඹට යාමට අවසර ඉල්ලා කළ ඉල්ලීම ඔහු ප්‍රතික්ෂේප කළේය. වෑන් රථයේ සිටි පුද්ගලයින් කිසි විටෙකත් අසල පිහිටි කිසිදු රෝහලක් පිළිබඳව සොයා බලා නොතිබූ අතර, වෑන් රථයේ බිම බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු සිටින බව උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතාගේ අවධානයට යොමු කර නොතිබුණි. පසුව, බරපතල තුවාල ලැබූ පුද්ගලයා මිය ගොස් ඇති බව ඔහුට දැනගන්නට ලැබුණි.

අලුයම 3.10 ට අධිවේගී මාර්ග පිවිසුමේදී වෑන් රථය නැවැත්වීම පිළිබඳවත්, වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා අලුයම 3.20 ට එම ස්ථානයට පැමිණීම පිළිබඳවත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා මහතාට තමන් විසින් දැනුම් දුන් බවට, උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතා සාක්ෂි ලබා දී ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතීඥවරයා උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර මහතාට පහත සඳහන් පරිදි යෝජනා කර ඇති අතර එයට ලබාදුන් පිළිතුරු පහතින් නැවත ඉදිරිපත් කර ඇත:

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරනවා, නිශාන්ත කියන මහත්මයා කිව්වා කියලා සාක්ෂිකරු මෙහෙම ප්‍රකාශයක් කළා. "මේ සිද්ධිය IG දන්නවා." එහෙමද ඔහු කිව්වේ?

උ: මේ case එක IG දන්නා case එකක් කියලා තමයි කිව්වේ.

ප්‍ර: මෙහි 3 වැනි පිටුවේ 15 වැනි පේළියේ තිබෙනවා, සිද්ධියට අදාළව නොවෙයි, "මේක IGත් දන්නවා" කියලා තමයි තිබෙන්නේ?

උ: ඔව්.

ප්‍ර: සාක්ෂිකරු බොහොම වැදගත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් නේ. මේ සිද්ධිය කියලාවත්, මේ case එක ගැන කියලාවත් නොවෙයි; "මේක IGත් දන්නවා" කියලා තමයි සාක්ෂිකරුගේ ප්‍රකාශයෙන් සාක්ෂිකරු කියා තිබෙන්නේ. ඒක හරි නේද?

උ: නිවැරදියි.

ප්‍ර: මම සාක්ෂිකරුට වැදගත් යෝජනාවක් කරනවා. මේ අවස්ථාව වෙන කොට IP නිශාන්ත සාක්ෂිකරුට මේ කථාව කිව්වේ වැලිගම පොලිස් ස්ථානයේ මූ.පො.ප. උපුල් කුමාර එතැනට එන්න ඉස්සෙල්ලා නේද?

උ: ඔව්.

ප්‍ර: වැලිගම පොලිස් ස්ථානයේ මූ.පො.ප. උපුල් කුමාර එතැනට ආවේ පාන්දර 3.20ට?

උ: ඒ වාගේ වෙලාවක් වෙන්න ඇති.

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරනවා, Acting IG දේශබන්දු තෙන්නකෝන් මහත්මයා මේ case එක දැන ගත්තේ පාන්දර 3.30ට කියලා? එහෙම නම් IP නිශාන්ත කියා තිබෙන්නේ බොරුවක් කියලා මම යෝජනා කරනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

උ: ඒක ගැන කියන්න මම දන්නේ නැහැ. නිශාන්ත මහත්මා මට කිව්වේ මේ ගැන IG දන්නවා කියලයි. ඒ අයට කොළඹ යන්න දෙන්න කියලා තමයි කිව්වේ.

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරනවා, මේ සම්බන්ධයෙන් IG මොනවත්ම දන්නේ නැති කථාවක් IP නිශාන්ත විසින් සාක්ෂිකරුට කියා තිබෙන්නේ කියලා?

උ: ස්වාමීනි, IP නිශාන්ත මහත්මයා මට කිව්වේ, මේක IGත් දන්නවා. ගැටලුවක් නැහැ. ඒ අයට කොළඹ යන්න දෙන්න කියලා තමයි මගෙන් ඉල්ලීමක් කළේ. මේ ආපු ගමන IG මහත්මයාත් දන්නවා. ගැටලුවක් නැහැ. අපිට යන්න දෙන්න කියලා තමයි ඒ මහත්මයා ඉල්ලීමක් කළේ. ඒ මහත්මයා ඉල්ලීමක් කළේ කොළඹ යන්න දෙන්න කියලා.

වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිදු අවස්ථාවක මෙම විමර්ශන කමිටුව ඉදිරියේ උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකර අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බවට යෝජනා කිරීමට උත්සාහ කළේ නැත. එපමණක් නොව, 2023.12.31 දින අලුයම දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ/පිටවීමේ ස්ථානයේ සේවය කළ නිලධාරීන් සිදු කර ඇත්තේ ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීම පමණක් බවත්, ඔවුන්ගේ පැත්තෙන් කිසිදු අඩුපාඩුවක් සිදුවූයේ යැයි ඔවුන්ට දොස් පැවරිය නොහැකි බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂි දීමේදී විශේෂයෙන් ප්‍රකාශ කර ඇත. මේ අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිදු අවස්ථාවක උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකරගේ සාක්ෂිවලට විරුද්ධව කරුණු දැක්වීමට / එම සාක්ෂි අසත්‍ය බව ප්‍රකාශ කිරීමට උත්සාහ කළේ නැත. එබැවින් මෙම විමර්ශන කමිටුව උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකරගේ සාක්ෂි මෙම කමිටුව ඉදිරියේ ඉදිරිපත් කර ඇති සත්‍ය සාක්ෂි ලෙස පිළිගැනීමට තීරණය කරයි.

7) <u>උප පොලිස් පරීක්ෂක සුදත් ධර්ම ශ්‍රී පුල්ලේපෙරුමගේ සාක්ෂිය.</u>

මොහු කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂවරයා වූ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ පුද්ගලික සහකාර ලෙස කටයුතු කළ පුද්ගලයා ය. ඔහුගේ රාජකාරිය වූයේ වැඩබලන අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයේ ලේඛන සකස් කිරීම සහ ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම මගින් වැඩබලන අධ්‍යක්ෂවරයාට සහාය වීමයි. පොලිස් පෝරම අංක 439 වැනි ලේඛනවල රාජකාරි නියෝග සටහන් කිරීම සඳහා කාර්යාලයේ ලේඛන පවත්වාගෙන යන බව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම ලබා දුන් සාක්ෂිය විය. උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම පවසන පරිදි, කොළඹ අපරාධ කොට්ඨාසය භාර නිලධාරි අන්ස්ලම් ද සිල්වා 2023.12.30 වෙනි දින කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමට වැලිගමට යාම සඳහා අවසර ඉල්ලා සිටියේ යැයි පැවසෙන 439 පෝරමයට අදාළ සටහන අදාළ ලේඛනයට පසුව ඇතුල් කර ඇත. මෙම 439 පොලිස් පෝරමය කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂ කාර්යාලයෙන් 2023.12.29 වෙනි දින යවා ඇති බව පෙන්වීම සඳහා එම සටහන පසුව එකතු කර තිබුණි. එම පොතෙහි තිබූ සියලු ම සටහන් අලුත් පොතක නැවත ලියන ලෙස උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකාට උපදෙස් දී තිබුණේ එම පසුව ඇතුළත් කිරීමෙන් බේරීම

සඳහා ය. කොළඹ අපරාධ කොට්ඨාසය භාර නිලධාරී අන්ස්ලම් ද සිල්වා විසින් 2023.12.30 වෙනි දින කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායමට වැලිගම බලා යාමට අවසර ඉල්ලා සිටි බව කියන අංක 439 පොලිස් පෝරමය ලේඛනයේ නිසි ලෙස ඇතුළත් කර ඇති බව ඇඟවීම සඳහා මෙය සිදු කරන ලදී. උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම එම මුල් ලේඛනය කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකාගේ නිවසට රැගෙන ගොස් එහි ඇතුළත් කර තිබූ සටහන් අලුත් පොතක නැවත ලිවීමට උපදෙස් දෙමින් එය ඇයට භාර දී ඇත්තේ මේ සඳහා ය. ඇත්ත වශයෙන් ම, කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකා ඒ වන විට ප්‍රසූත නිවාඩු මත ඇගේ නිවසේ රැඳී සිටියාය. මෙය සිදුවී ඇත්තේ මෙම සිද්ධියෙන් බොහෝ කලකට පසුව ය. මෙම ලේඛනය 'බැහැරයාමේ ලියවිලි ලේඛනය' ලෙස හඳුන්වනු ලැබේ.

'බැහැරයාමේ ලියවිලි ලේඛනය' නැවත ලිවීමට සැලැස්වූ මෙම ක්‍රියාව නීති විරෝධී බව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම විමර්ශන කමිටුව ඉදිරියේ පිළිගෙන තිබේ. පොලිස් සැරයන් උපුල්ගේ මරණයෙන් පසුව කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ උපදෙස් මත ඔහුට එය කිරීමට සිදු වූ බව ඔහුගේ ස්ථාවරයයි. සිදුවී තිබූ බරපතල සිදුවීමක් සැඟවීමේ අරමුණින් මෙය සිදු කර ඇති බව පෙන්වන උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුමගේ සාක්ෂිය මෙය වේ. කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂ කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන 'බැහැරයාමේ ලියවිලි ලේඛනයේ' අදාළ පිටු මෙම විමර්ශන කමිටුව ඉදිරියේ P-23 ලෙස සලකුණු කරන ලදී. ලබා දී තිබූ නව පොතෙහි සටහන් නැවත ලිවීම අවසන් කරනු ලැබීමෙන් පසුව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකාගේ නිවසින් එම අලුතින් ලියන ලද ලේඛනය ලබාගෙන ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, එකී 439 පොලිස් පෝරමය බැහැරට යැවීමට අදාළ සටහන් ඇතුළත් කිරීම 2023.12.29 දින ඒ වන විටත් ඇතුළත් කර තිබූ තවත් සටහන් දෙකක් අතරට සම්බන්ධ කිරීමෙන් එකතු කර ඇති බව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම මහතා තහවුරු කර ඇත. 'බැහැර යාමේ ලියවිලි ලේඛනය' වෙනස් කිරීමේ එම ක්‍රියාව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන භාර ගැනීමෙන් පසුව සිදු කර තිබුණා විය හැකි බව ද උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම ප්‍රකාශ කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්කිකරුට පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කර ඇත:

ප්‍ර: මම යෝජනා කරනවා, දේශබන්දු තෙන්නකෝන් මහත්තයා වැඩබලන අධ්‍යක්ෂ නෙවිල් සිල්වා මහත්මයාට හරි ඔබතුමාට හරි මේ කාටවත් මෙහෙම පොතක් වෙනස් කරන්න කියලා උපදෙස් දුන්නේ නැහැ කියලා

උ: පිළිගන්නවා, ස්වාමීනි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා ඉහත යෝජනා ඉදිරිපත් කිරීමට අමතරව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම විසින් ලබා දුන් සාක්ෂිවල සත්‍යතාවය දැඩි ලෙස අභියෝගයට ලක් කර නොමැති බව පෙනෙන්නට තිබේ. උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුමගේ සාක්ෂිය කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකාගේ සාක්ෂි මගින් හොඳින් සනාථ වේ.

විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවන ලද පොලිස් පරීක්ෂක ශ්‍රියා බණ්ඩාර විජේතුංගගේ සාක්ෂිය මගින් ද කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව සේවය කළ කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකා 2024.07.07 දින සිට 2025.01.31 දින දක්වා කාලය තුළ ප්‍රසූත නිවාඩු මත සිටි බව විධිමත් ලෙස තහවුරු කර ඇති බව කමිටුව අවධානයට ගනියි. මේ වන විටත් ඉහත සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා කාන්තා පොලිස් කොස්තාපල් 6751 ඉනෝකාගේ සාක්ෂිය හෝ පොලිස් පරීක්ෂක ශ්‍රියා බණ්ඩාර විජේතුංගගේ සාක්ෂිය යන කවරක් හෝ අභියෝගයට ලක් කිරීමට උත්සාහ කර නැත. එම හේතු නිසා, විමර්ශන කමිටුව උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුමගේ සාක්ෂිය මෙම කමිටුව ඉදිරියේ ඉදිරිපත් කර ඇති සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගැනීමට තීරණය කරයි.

8) <u>වැඩබලන පොලිස්පති, ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වීරසූරිය ලියන ආරච්චිගේ සමන් ප්‍රියන්තගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු දැනට වැඩබලන පොලිස්පති ලෙස කටයුතු කරන ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වේ. ඔහු 1998.05.20 වෙනි දින පොලිස් කොස්තාපල්වරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වී ඇත. 2023.02.16 වෙනි දින ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස පත් කරනු ලැබීමෙන් පසු, 2024.09.27 දින වැඩබලන පොලිස්පති ලෙස පත් කරනු ලැබීමට පෙර කාලය තුළ ඔහු පොලිසියේ ප්‍රධාන තනතුරු කිහිපයක් දරා ඇත: අපරාධ සහ රථවාහන අංශ භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර; උතුරු පළාත භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර; සහාය සේවා භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර; මධ්‍යම පළාත භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර; අපරාධ සහ රථවාහන අංශ භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර (නැවතත්) සහ උතුරු මැද පළාත භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර එම තනතුරු වේ. මෙය සිදුවූයේ 2024.02.21 වෙනි දින පැවති ජනාධිපතිවරණයෙන් නව ජනාධිපතිවරයා තේරී පත් වීමෙන් පසුව ය.

වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිවලට අනුව, 2024.07.24 දින සිට වගඋත්තරකාර පොලිස්පතිවරයා පොලිස්පති ධූරයේ කාර්යයන් ඉටු කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වළක්වන ලද පසුව පවා, වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පතිවරයා ලෙස ඔහුගේ වැටුප සහ සේවයේ නියුතු නිලධාරියෙකුට ගෙවිය යුතු ආහාර දීමනාව සහ තවත් දීමනා දෙකක් හැර අනෙකුත් දීමනා සහ වරප්‍රසාද අඛණ්ඩව ලබා ගත්තේ ය. මෙය නතර වූයේ 2025.02.27 වෙනි දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් නඩුවේ සැකකරුවෙකු ලෙස දේශබන්දු තෙන්නකෝන් මහතා අත්අඩංගුවට ගැනීමට නියෝග කළ නියෝගය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ය. මෙම ගැටලුව සම්බන්ධයෙන් ගරු නීතිපතිවරයාගෙන්, විගණකාධිපතිවරයාගෙන් සහ අවසානයේ ජනාධිපති ලේකම්වරයාගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසුව වැඩබලන පොලිස්පතිවරයා විසින් මෙම පියවර ගෙන තිබේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අනුමත කර ඇති P-2 ත්‍යාග වවුචරය සහ එයට අමුණා ඇති P-3, P-4, P-5 සහ P-7 ලෙස සලකුණු කරන ලද ආවරණ ලිපි වැඩබලන පොලිස්පතිවරයාට පෙන්වන ලදී. මේ සියල්ල වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි කණ්ඩායමේ වෙඩි තැබීමෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් 57241 උපුල්ට ත්‍යාගයක් ලෙස රුපියල් මිලියන 1.5 ක මුදලක් ගෙවීම අනුමත කිරීම සහ එය ගෙවීමට අදාළ ලියවිලි ය. කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස්

සැරයන් උපුල් ඝාතනයට ලක් වූ සිද්ධිය සැක සහිත බැවින් ඔහුට රුපියල් මිලියන 1.5 ක මුදලක් ගෙවීම වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා විසින් අනුමත නොකර තිබිය යුතු බව වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිය විය; එය නීති විරෝධී ක්‍රියාවක සලකුණු පෙන්නුම් කරන අතර තෙවන පාර්ශවයක් විසින් පවත්වන ලද පරීක්ෂණයකින් ද එය තහවුරු කර නොමැත. P-2 ලියවිල්ල අනුව මෙම ත්‍යාග මුදල ගෙවීම අනුමත කිරීම සහ ගෙවීම පොලිස්පතිවරයාගේ අංක 1972/2007 දරන චක්‍රලේඛයට (P-40) සහ ත්‍යාග ගෙවීම සම්බන්ධයෙන් වන පොලිස් නියෝගවලට පටහැනි බව වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිය විය.

2024.10.14 වෙනි දින තම කාර්යාලයට ලැබුණු පෙත්සමකට අනුව, කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් නීති විරෝධී ක්‍රියාවක නිරත වී ඇත්දැයි තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස තමන් නියෝග කර ඇති බව ද වැඩබලන පොලිස්පතිවරයා සාක්ෂි දෙමින් තවදුරටත් ප්‍රකාශ කර ඇත. මෙම විමර්ශනය භාරගෙන ඒ සම්බන්ධ ඉදිරි කටයුතු කරන ලෙස ඔහු විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට උපදෙස් දී ඇත්තේ එම පෙත්සම මත ය.

ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කරන ලද විමසුම් පිළිබඳව උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා වැඩබලන පොලිස්පතිවරයාගේ අවධානය යොමු කළේය. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙත යවන ලද ලිපිය P-45 ලෙස සලකුණු කර මෙම කමිටුවට ඉදිරිපත් කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් එයට එවන ලද ප්‍රතිචාරය P-46 ලෙස සලකුණු කර ඇත. වැලිගම වෙඩි තැබීමේ සිද්ධියේ දී කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් කිසිදු වරදක් සිදු කර නොමැති බව එම ලිපිය මගින් වගඋත්තරකාර පොලිස්පතිවරයා ජාතික පොලිස් කොමිෂන් සභාවට ලිඛිතව දන්වා ඇත. 2024.02.22 දිනැති මෙම ලිපිය එවා ඇත්තේ වැලිගම වෙඩි තැබීමේ සිද්ධියෙන් මාස දෙකකට පමණ පසුව ය. කෙසේ වෙතත්, ඒ වන විට වැලිගම පොලිස් නිලධාරීන් ඉදිරියේ හෙළිදරව් වී තිබූ කරුණු දෙස බැලීමේ දී, එම අවස්ථාවේ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ගේ පැත්තෙන් පැහැදිලි නීති විරෝධී ක්‍රියාවක් සිදුවී ඇතැයි දැකිය හැකි බව වැඩබලන පොලිස්පතිවරයා මෙම විමර්ශන කමිටුව ඉදිරියේ පැහැදිලිව ප්‍රකාශ කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා සිද්ධිය පිළිබඳ අසත්‍ය විස්තරයක් ජාතික පොලිස් කොමිෂන් සභාවට ලබා දී ඇති බව වැඩබලන පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ ලබා දුන් ඔහුගේ සාක්ෂියේ දී සඳහන් කර ඇත. 2025.02.24 වන දින වැඩබලන පොලිස්පතිවරයා සත්‍ය කරුණු සඳහන් කරමින් ජාතික පොලිස් කොමිෂන් සභාවට සවිස්තරාත්මක වාර්තාවක් ලබා දී ඇත. එම වාර්තාව P-50 ලෙස සලකුණු කර ඇති මෙම කමිටුවට ඉදිරිපත් කර ඇත. මෙය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් වැඩබලන පොලිස්පතිවරයා වෙත යවන ලද, P-49 ලෙස සලකුණු කර මෙම කමිටුවට ඉදිරිපත් කරන ඇති, ලිපියට ප්‍රතිචාරයක් ලෙස යවා ඇත.

ලබා ගැනීමට තිබෙන ද්‍රව්‍ය අනුව, මෙම කාරණය සම්බන්ධයෙන් තමන්ගේ නිරීක්ෂණය වන්නේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා වැලිගම පොලිසිය හැර වෙනත් ඒකකයක් මගින් විමර්ශණයක් සිදුකිරීමට සැලැස්වීමෙන් හිතාමතාම වැළකී සිටින බවත්, එය වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම වෙඩි තැබීමේ සිද්ධියට යම් ආකාරයකින් සම්බන්ධ වී ඇති බැවින් ඔහුට සත්‍ය කරුණු සැඟවීමට අවශ්‍ය වී ඇති බවට ඇඟවීමක් වන බවත් වැඩබලන පොලිස්පතිවරයා සිය සාක්ෂියේ පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අවස්ථාවේ පවා ලබා ගත හැකිව තිබූ සාක්ෂි අයිතම වන, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය එම ස්ථානයේ නවතා තිබූ කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය ඉදිරිපිටට පැමිණ නතර කළ විට කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම තමන්ව හඳුන්වාදීමට හිතාමතාම ඉදිරිපත් නොවීම; වැලිගම පොලිස්

රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය පැමිණ එහි නතර කළ පසු කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය වේගයෙන් ධාවනය කරමින් ඔවුන් පලා යාම; පසුව, කොළඹ අපරාධ කොට්ඨාශයේ එම වෑන් රථය බිඳීගිය වීදුරු සහිතව දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ දී පොලිස් නිලධාරීන් විසින් නතර කර තිබී සොයා ගැනීම යන සාක්ෂි පිළිබඳ සඳහන් කරමින් වැඩබලන පොලිස්පතිවරයා ඒ සියල්ල ඔවුන් 2023.12.31 වෙනි දින W15 හෝටලය ඉදිරිපිට නීති විරෝධී ක්‍රියාවක නිරත වූ බව ඇඟවෙන පැහැදිලි ඇඟවීම් බව මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කළේ ය. මෙම වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශන කණ්ඩායමක් විසින් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග නොකිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා ගත් ක්‍රියාමාර්ගයට කිසිදු සාධාරණීකරණයක් නොමැති බවට වැඩබලන පොලිස්පතිවරයා දිවුරුම් දී සාක්ෂි දුන්නේ එම පදනම මත ය. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මෙම අසාර්ථකත්වය සඳහා ඇති එකම නිගමනය වැලිගම වෙඩි තැබීමේ සිද්ධියට ඔහු සම්බන්ධ වී සත්‍යය සඟවා එය හෙළිදරව් වීම වැළැක්වීමට ඔහු තුළ තිබූ අභිප්‍රායය බව වැඩබලන පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි දුන්නේ එම පදනම මත ය.

ජාතික පොලිස් කොමිෂන් සභාව වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගෙන් ද එම ප්‍රශ්නය ම විමසා ඇත. මෙම සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරීන්ගෙන් සිදුවී ඇති අඩුපාඩු සොයා ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස විශේෂ විමර්ශන ඒකකයට නියෝග කර ඇත්තේ වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා බව කමිටුව නිරීක්ෂණය කරයි. වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳ සත්‍ය වාර්තාව, මෙම කමිටුව ඉදිරියේ P-50 ලෙස සලකුණු කරන ලද ලේඛනය මගින් ජාතික පොලිස් කොමිෂන් සභාවට වාර්තා කර ඇත්තේ වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා බව මෙම කමිටුව නිරීක්ෂණය කරයි. පිටු එකහමාරක ලිපියක් වන P-46 ලියවිල්ල මෙන් නොව, P-50 ලියවිල්ල යනු වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් ජාතික පොලිස් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද පිටු පහහමාරක දීර්ඝ වාර්තාවක් බව කමිටුව නිරීක්ෂණය කරයි.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මේ වන විට ජනාධිපති අරමුදලින් කරන ලද ගෙවීම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වමින් සිටින බවත්, එයට ජනාධිපති අරමුදලින් පොලිස් සැරයන් උපුල් වෙත රුපියල් මිලියන 2.5 ක් ගෙවීම ද ඇතුළත් බවත් වැඩබලන පොලිස්පතිවරයා මෙම විමර්ශන කමිටුවේ අවධානයට යොමු කර ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් තවදුරටත් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ජනාධිපති අරමුදලෙන් පොලිස් සැරයන් උපුල්ට රුපියල් මිලියන 2.5ක් නිදහස් කිරීමට පියවර ගැනීම එවකට ශ්‍රී ලංකා පොලිසිය භාර ගරු අමාත්‍යවරයාගේ ඉල්ලීම මත සිදු කළ යුතු බවත්, අමාත්‍යවරයාට එසේ කිරීමට හැකි වන පරිදි වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් එවැනි අවශ්‍යතාවයක් පිළිබඳව ගරු අමාත්‍යවරයාට දැනුම් දිය යුතුව තිබූ බවත් වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිය විය. වගඋත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂියේ දී තමන් එවකට ජනාධිපතිවරයා සමග සාකච්ඡාවක් පැවැත්වූ බවත්, ජනාධිපති අරමුදලින් පොලිස් සැරයන් උපුල්ට ගෙවීමට රුපියල් මිලියන 2.5ක් නිදහස් කිරීමට ජනාධිපතිවරයා එකඟ වූ බවත් පිළිගෙන ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි.

වැඩබලන පොලිස්පතිවරයා මාතර කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා විසින් අත්සන් කර ඇති, P-51 ලෙස සලකුණු කර ඇති 2025.05.09 දිනැති ලිපිය ඉදිරිපත් කර ඇත. එම ලිපියට අනුව, මාතර කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරියෙකුට හෝ වැලිගම පොලිස් ස්ථානයේ කිසිදු නිලධාරියෙකුට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ආරම්භ කර නොමැති බව අනාවරණය වේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා එවැනි කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස

උපදෙස් දී නොමැති බව ද එයින් හෙළි වේ. පවතින සාක්ෂි අනුව, වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ ගමන් කළ නිලධාරීන් අගය කර ත්‍යාග පිරිනැමිය යුතුව තිබූ බව වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිය වේ.

සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විසින් වෙඩි තැබූ බවට චෝදනා එල්ල වී ඇත්නම්, නදුන් චින්තකගේ (හරක් කටාගේ) මත්ද්‍රව්‍ය ජාවාරම් ජාලය පිළිබඳ විමර්ශනය කරනවාට වඩා, එම වෙඩිතැබීමට වගකිව යුතු පුද්ගලයින් සොයා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය පරීක්ෂණයක් පැවැත්වීම වඩා වැදගත් බව වැඩබලන පොලිස්පතිවරයා සිය සාක්ෂියේ සඳහන් කර ඇත. මන්ද, එවැනි සිදුවීමක් සිදුවී තිබුණා නම්, එවැනි සංවිධානාත්මක අපරාධ කල්ලිවලට එරෙහිව ක්‍රියාත්මක වන පොලිස් නිලධාරීන්ගේ ජීවිතවලට එය තර්ජනයක් වී ඇති බැවින් එයින් දුරදිග යන ප්‍රතිවිපාක ඇති කළ හැකි බැවිනි. කමිටුව ඉදිරියේ ඇති සාක්ෂි අනුව, ඉහත විමර්ශන කිසිවක් සිදුවී නොමැති බව කමිටුව අවධානයට ගනියි.

සිද්ධිය වූ දින (2023.12.31) සිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා පොලිස්පති ධූරයේ කාර්යයන් ඉටු කිරීමෙන් වළක්වන ලද දිනය (2024-07-24) දක්වා කාලය තුළ, වැලිගම වෙඩි තැබීම කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී ක්‍රියාවක් බවට කිසිවෙකු පැමිණිලි කර නොමැති බව වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා වැඩබලන පොලිස්පතිවරයාට යෝජනා කළ විට, වගඋත්තරකාර පොලිස්පතිවරයා පොලිස්පති ධූරයේ කාර්යයන් ඉටු කරන තාක් කල් එවැනි තොරතුරු හෙළි කිරීමට කිසිවෙකු එඩිතර නොවන බව වැඩබලන පොලිස්පතිවරයා විමර්ශන කමිටුව ඉදිරියේ ප්‍රකාශ කළේ ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් සිදුකරන ලද හරස් ප්‍රශ්න කිරීමේදී අසන ලද ප්‍රශ්න පරීක්ෂා කිරීමේ දී, වගඋත්තරකාර පොලිස්පතිවරයා වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂිවල විශ්වසනීයත්වය බරපතල ලෙස අභියෝගයට ලක් කර ඇති බවක් හෙළි නොවෙයි. අනෙක් අතට, වැඩබලන පොලිස්පතිවරයා 2024.09.27 දින එම ධූරයට පත්වීමෙන් පසු, වැඩබලන පොලිස්පතිවරයා ලෙස ඔහු සම්බන්ධ වී ඇති කටයුතු පිළිබඳව විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දී ඇත. ඇත්ත වශයෙන්ම, 2023.12.31 දින පැලැන, වැලිගම සිද්ධිය සිදු වන විට මෙම සාක්ෂිකරු උතුරු මැද පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර හෙබවීය. එබැවින්, එම සිද්ධිය සිදු වූ අවස්ථාවේ දී වැලිගම වෙඩි තැබීමේ සිද්ධියට මෙම සාක්ෂිකරුට කිසිදු සම්බන්ධයක් තිබී නැත. ඉහත සඳහන් කළ පරිදි, මෙම වාර්තාවේ වෙනත් තැන්වල දක්වා ඇති හේතු නිසා, එම වෙඩි තැබීම සිදු වූ අවස්ථාවේ එම ස්ථානයේ සිටි අය, එනම් එවකට කොළඹ අපරාධ කොට්ඨාසය භාර නිලධාරී අන්සලෙම් ද සිල්වා; පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස; පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර; සහ හමුදා සැරයන් රුවිරංග විසින් විස්තර කර පැහැදිලි කරන ලද ආකාරයට කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල් ඝාතනය වූ වෙඩි තැබීමේ සිද්ධිය සිදු වූ බව පිළිගැනීමට විමර්ශන කමිටුව තීරණය කර ඇත. විමර්ශන කමිටුව දැනටමත් දක්වා ඇති හේතු නිසා, කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය දකුණු අධිවේගී මාර්ගයේ ඉමදුව පිවිසුමට පැමිණීමෙන් පසු සිදුවූ සිදුවීම්වලට සම්බන්ධ වූ පොලිස් නිලධාරීන් විසින් ඉහත සඳහන් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සනාථ කරන බව නිගමනය කර ඇත.

ඉහත හේතූන් මත, වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ සාක්ෂිය මෙම කමිටුව සත්‍ය ලෙස පිළිගෙන ඇති අනෙකුත් සාක්ෂි මගින් හොඳින් සනාථ වන බව විමර්ශන කමිටුව නිශ්චය කරයි. වැඩබලන පොලිස්පතිවරයාට වගඋත්තරකාර පොලිස්පතිවරයා ව්‍යාජ ලෙස වරදෙහි පැටලීමට කිසිදු අවශ්‍යතාවයක්

හෝ චේතනාවක් තිබිය යුත්තේ මන්දැයි විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් හෝ පදනමක් නොපෙනෙයි. ඇත්ත වශයෙන්ම, වැඩබලන පොලිස්පතිවරයා විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා වැරදිකරු බවට පෙන්වා දෙමින් ඔහුගේ සාක්ෂියේ සඳහන් කර ඇති සෑම දෙයක් ම වෙනත් සාක්ෂි මත පදනම් වී ඇති බවත්, මෙම කමිටුව ඉදිරියේ සිදුකෙරෙන විමර්ශනය අතරතුර එහි ගුණාත්මකභාවය අවල බවත් විමර්ශන කමිටුව නිරීක්ෂණය කළේ ය. එබැවින්, මෙම සාක්ෂි සත්‍යවාදී ලෙස පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීම කමිටුවට සම්පූර්ණයෙන්ම ආරක්ෂාකාරී බව මෙම කමිටුවේ අදහස වේ. ඇත්ත වශයෙන්ම, මේ වන විටත් ඉහත සඳහන් කර ඇති පරිදි, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ වැඩබලන පොලිස්පතිවරයා ලබා දුන් සාක්ෂිය ද වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් බරපතල ලෙස අභියෝගයට ලක් නොකළේ ය.

9) <u>කාන්තා පොලිස් සැරයන් 275 කලහේපාඩි කනකනම්ගේ නාලිකා දිල්මා තිලකරත්නගේ සාක්ෂිය</u>

ඇය 2009 සිට 2024 දක්වා බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කළා ය. වගඋත්තරකාර පොලිස්පතිවරයා පොලිස්පති ධුරයට පත්වීමට පෙර බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තනතුර ද හෙබවූයේ ය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් බස්නාහිර පළාතේ පොලිස් නිලධාරීන්ට පළාතෙන් පිටත රාජකාරි වලට ගමන් කිරීම සඳහා ලබා දුන් අවසරයට අදාළ වාර්තා පවත්වාගෙන යාමේ වගකීම කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා සතු විය. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ලියවිල්ලක් මගින් අවසරය ලබා දුන් පසු, එම ලිපිය ලැබීම සහ අනුමැතියෙන් පසු එම ලිපිය යැවීම යන දෙකම ලේඛනයක ඇතුළත් කරනු ලැබේ. එම ලිපි අදාළ කාර්යාල වෙත යැවීමට පෙර ඒ පිළිබඳ සටහන් කර ගන්නා ලේඛනය ‘යවන ලිපි ලේඛනය' ලෙස හැඳින්වේ. මෙම සාක්ෂිකරු P-16 ලෙස සලකුණු කර ඇති අංක 439 පොලිස් පෝරමය සහ P13, P14, P15 ලෙස සලකුණු කර ඇති ආවරණ ලිපි හඳුනාගෙන ඇති අතර, එම ලේඛන සත්‍ය වශයෙන්ම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයෙන් යවා ඇත්තේ 2024.01.02 දින බවට ඇයගේ සාක්ෂිය වේ.

මෙම ලියවිලි 2023.12.29 දින යවා ඇති බව පෙන්වීම සඳහා යවන ලිපි ලේඛනයේ ව්‍යාජ සටහන් ඇතුළත් කිරීමට තමාට බල කරන ලද බව කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා වැඩිදුරටත් සාක්ෂි දෙමින් පැවසුවාය. ඇය පවසන ආකාරයට, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ සේවය කළ පොලිස් පරීක්ෂක බණ්ඩාර විසින් එසේ කිරීමට බලපෑම් කිරීම නිසා ඇය එසේ සිදුකර ඇත. පොලිස් පරීක්ෂක බණ්ඩාර වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාර වෙනුවෙන් කටයුතු කළේ ය. ඇය මෙම මුල් ලේඛනය හඳුනා ගත් අතර එහි තිබූ ඇගේ අත් අකුරු හඳුනා ගත්තාය. බලපෑම් මත, කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා මෙම ලියවිලි පිටතට යැවීම SDIG/WP/ S6/23602/2023 අංක යටතේ 2023.12.29 දින යවන ලද බව පෙන්වන පරිදි සටහන් තැබුවා ය. SDIG/ WP/S6/23602/2023 යන අංකය ලබා දෙන ලද එම ලියවිල්ල සහකාර පොලිස් අධිකාරී නුගේගොඩ විසින් ලබා දෙන ලද අවසරය පිළිබඳ ලියවිල්ල බව ඇය පිළිගෙන ඇත. P-16 ලෙස සලකුණු කර ඇති අංක 439 පොලිස් පෝරමයෙහි දැක්වෙන මෙම අංකය එම ලේඛනයේ යැවීම සඳහා ලබා දෙන ලද සත්‍ය අංකය නොවන බව ද ඇය පිළිගෙන ඇත. ඇත්ත වශයෙන්ම, P-16 කිසි විටෙකත් 2023.12.29 දින යැවීම සඳහා ලැබී නොතිබූ බව ඇයගේ සාක්ෂිය විය. මෙම කමිටුවට ඉදිරිපත් කරන ලද P-53 ලෙස සලකුණු කරන ලද යවන ලිපි ලේඛනය ඇය විසින් හඳුනාගෙන ඇත. මෙම ලේඛනයේ (P-53) මුල් පිටපත මෙම කමිටුවට ඉදිරිපත් කරන ලද අතර, පසුව කමිටුව ස්වකීය ප්‍රයෝජනය සඳහා අදාළ පිටු වල පිටපත් ලබාගෙන, අපරාධ පරීක්ෂණ

දෙපාර්තමේන්තුව මේ වන විටත් මෙම කාරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරගෙන යන බැවින් එම මුල් ලේඛනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට නිකුත් කළේ ය. එම ලැයිස්තුවේ, මෙම සාක්ෂිකරු මෙම සිද්ධියට අදාළ අංක 439 පොලිස් පෝරමය අනුක්‍රමික අංක 49 සහ 50 යටතේ ඇතුළත් කිරීම් ලෙස මුලින් සටහන් කර තිබූ ස්ථානය හඳුනාගෙන ඇත. ඉන් පසුව, පොලිස් පරීක්ෂක බණ්ඩාර විසින් 2023.12.29 දිනය යටතේ එය සටහන් කිරීමට ඇයට බල කළ විට, ඇය 2023.12.29 දින සහකාර පොලිස් අධිකාරී නුගේගොඩ විසින් ලබා ගත් අවසරයට අදාළ ලේඛනයට ඒ වන විටත් ලබා දී තිබූ ව්‍යාජ අංකයක් සටහන් කර ඇත. ඇය P-16 හි ඇතුළත් කර තිබූ මුල් සටහන්, එනම් අනුක්‍රමික අංක 49 සහ 50 යටතේ ඇතුළත් කර තිබූ සටහන් දැන් යමෙකු විසින් කපා හැර ඇති බව ද ඇය නිරීක්ෂණය කළාය.

තමාට P-16 ලැබුණු බවත්, එම ලියවිල්ලට අදාළ සටහන් ඇතුළත් කළේ 2024.01.02 දින බවත් කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා සාක්ෂි ලබා දෙන අතරතුර පිළිගත්තා ය. ඒ වන විට වැලිගම දී සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියකින් කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල් මිය ගොස් ඇති බව ඇය දැන සිටි බවත් ඇය සඳහන් කළා ය. කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ද එදින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට පෞද්ගලිකව ම පැමිණි බව ඇගේ මතකය වේ. කෙසේ වෙතත්, එම ලියවිල්ල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ පොලිස් පරීක්ෂක බණ්ඩාර විසින් ඇය වෙත එවන ලදී. කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා 2024.01.02 දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට පැමිණ මෙම පෝරමයට අත්සන් ලබා ගත් බවත්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායමට 2023.12.29 දින වැලිගමට යාම සඳහා අත්සන් කර අනුමැතිය ලබා දී ඇති බව පෙන්වීම සඳහා සියලු ම සටහන් සාදා ඇති බව සහතික කර ගත් බවත් මෙම සාක්ෂිවලින් පෙනී යයි. මෙසේ සිදු කර ඇත්තේ, මෙසේ සිදු නොකළේ නම්, තමන් විසින් භාරගෙන තිබූ නීති විරෝධී ක්‍රියාව සිදු කිරීම සඳහා වැලිගමට ගිය කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක් සිදු කළ බව වසන් කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලය තුළ සාක්ෂි ගෙතීම සඳහා ය. මෙම ලේඛන වෙනස් කිරීම සිදු කර ඇත්තේ අදාළ කාර්යය වැරදී ගොස් වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ගේ වෙඩි තැබීමකින් කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් මිය ගිය පසුව ය.

බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ නිලධාරීන් විසින් ලබා දුන් නීති විරෝධී නියෝගවලට කීකරු වීම ප්‍රතික්ෂේප කළ හොත් තමන්ට කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටතට මාරුවීමක් ලැබෙනු ඇතැයි තමන් බිය වූ බව ද කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා පැහැදිලි කර ඇත. ඇය පවසන ආකාරයට එසේ බියවීමට හේතුව, එවැනි මාරුවීමක් ලැබුණ හොත් මරදාන පොලිස් නිල නිවාසයේ ඇයගේ නිල නිවස අහිමි වීමට ඉඩ තිබීමයි. ඇය ඒ වන විට කුඩා දරුවන් දෙදෙනෙකුගේ මවක් වූ බැවින් එවැනි අවදානමක් ගැනීමට තමන් අකමැති වූ බව ඇය ප්‍රකාශ කර ඇත.

මෙම අවස්ථාවේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ තමන් P-16 හි සඳහන් දිනය වන 2023.12.29 දින අංක 439 (P-16) පෝරමයට අත්සන් කර තමන්ගේ අනුමැතිය ලබා දී එය අවසන් කළ බව ය. කෙසේ වෙතත්, එය තමන්ගේ අත් අකුරු බවත්, P-16 හි අදාළ ස්ථානයේ 2023.12.29 දිනය ඇතුළත් කළේ තමන් බවත් කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මා නිශ්චිතවම සඳහන් කළා ය. ඇත්ත වශයෙන්ම, කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඔවුන් සිව් දෙනෙකු කැඳවා වැලිගම W15 හෝටලයට වෙඩි තැබීමේ කාර්යය පැවරුවේ 2023.12.30 දින උදෑසන බව ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂිය විය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලින් පෙනී යන්නේ පොලිස් පරීක්ෂක බණ්ඩාර ඒ වන විට බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාරවරයා නොවන බව තහවුරු කිරීමට ඔහු අසාර්ථක උත්සාහයක් ගෙන ඇති බව ය. කෙසේ වෙතත්, සාක්ෂිකාරිය ඇගේ මුල් ස්ථාවරයෙහි ම සිටිමින් මෙම ස්ථාවරය ප්‍රතික්ෂේප කර ඇත. පොලිස් පරීක්ෂක බණ්ඩාර බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පුද්ගලික සහකාර ලෙස විධිමත් ලෙස පත් කරනු ලැබුවද නැද්ද යන්න කුමක් වුවත්, එයට පෙර පුද්ගලික සහකාර ලෙස සේවය කළ නිලධාරියා එයට කලකට පෙර සේවයෙන් විශ්‍රාම ගොස් සිටි බැවින් ඇත්ත වශයෙන් ම එවකට බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු සියලු ම ලියකියවිලි සකස් කරන ලද්දේ පොලිස් පරීක්ෂක බණ්ඩාර විසින් බව මෙම සාක්ෂිකාරියගේ ස්ථාවරය විය. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකාරිය බොරු සාක්ෂි ලබා දෙන බවට ඇයට යෝජනා කළ විට, සාක්ෂිකාරිය එම යෝජනාව ප්‍රතික්ෂේප කර තිබුණි. එබැවින් එම, යෝජනාව තවමත් යෝජනාවක් ලෙස පමණක් පවතී.

W15 හෝටලය ඉදිරිපිට දී තමන් ප්‍රතිප්‍රහාර එල්ල කළේ නාඳුනන සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සාමාජිකයෙකු විසින් වෙඩි තැබූ විට පමණක්ය යනුවෙන් ප්‍රකාශ කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් විසින් 2023.12.31 වෙනි දින වැලිගම පොලිසියට ලබා දුන් මුල් විස්තරය වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධ නිවැරදි විස්තරය ලෙස පිළිගත යුතුය යනුවෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් දරන ලද ස්ථාවරය ප්‍රතික්ෂේප කිරීමට මෙම වාර්තාවේ ඉදිරි පිටුවල දී මෙම කමිටුව තීරණය කර ඇත. තමන් මෙම P-16 ලියවිල්ල අත්සන් කළේ 2023.12.29 දින බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා ලබා දුන් සාක්ෂිය සත්‍ය සාක්ෂියක් ලෙස කමිටුව පිළිගන්නේ නැත. මේ අනුව, කාන්තා පොලිස් සැරයන් නාලිකා දිල්මාගේ සාක්ෂිය සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගැනීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

10) <u>සහකාර පොලිස් අධිකාරී ඩිලාන් චාමර දොඩන්ගොඩගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී - පරිපාලන ලෙස කටයුතු කළේ ය. ඔහු P-14 ලෙස සලකුණු කර ඇති ලේඛනය වන කොළඹ අපරාධ කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා ආමන්ත්‍රණය කර කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී - පරිපාලන විසින් අත්සන් කරන ලද ආවරණ ලිපිය හඳුනා ගත්තේ ය. P-14 ලෙස සලකුණු කරන ලද ලියවිල්ල මෙම සාක්ෂිකරුට පෙන්වූ විට, එහි පහළින් ඔහුගේ තනතුරු නාමය සහ නිල මුද්‍රාව පෙනෙන්නට තිබුණ ද ඔහු මෙම ලියවිල්ලට තමන් අත්සන් කර ඇති බව තරයේ ප්‍රතික්ෂේප කර ඇත. මෙම දිනයේ තමන් කොළඹ අපරාධ කොට්ඨාශයේ කාර්යාලයේ සිටි නමුත් කිසිවෙකු තමන්ගේ අත්සන සඳහා මෙම ලිපිය ගෙනආවේ නැති බව ඔහු ප්‍රකාශ කර ඇත. ඒ වෙනුවට, සහකාර පොලිස් අධිකාරී ධර්මකීර්ති මෙම ලේඛනයට සහකාර පොලිස් අධිකාරී - පරිපාලන ලෙස අත්සන් කර ඇති බව සිතිය හැකි ය. සහකාර පොලිස් අධිකාරී ධර්මකීර්ති කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී - පරිපාලන තනතුර දැරුවේ නැත. අනෙක් අතට, මෙම සාක්ෂිකරු එදින කොළඹ අපරාධ කොට්ඨාශයේ කාර්යාලයට පැමිණ සිටියදී, මෙම ලිපියේ පහළින් වෙනත් අයෙකුගේ අත්සනට යටින් ඔහුගේ නිල මුද්‍රාව තබා තිබුණි. මේ අනුව, මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව, P-14 අව්‍යාජ ලිපියක් නොවේ.

ත්‍යාග වවුචරය වන P-2 මෙම සාක්ෂිකරුට පෙන්වූ විට, මෙම ත්‍යාග වවුචරය හැකි ඉක්මනින් සම්පූර්ණ කර අත්සන් කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයාට අවශ්‍ය වූ බවට කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂවරයාගේ පුද්ගලික සහකාර ලෙස කටයුතු කරන පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම තමන්ට බල කර ඉල්ලා සිටි බැවින් තමන් කොළඹ අපරාධ කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී - පරිපාලන ලෙස මෙයට අත්සන් කළ බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වේ. තමන්ට එම ත්‍යාග වවුචරය අත්සන් කිරීම ප්‍රමාද කළ නොහැකි වූයේ එම පීඩනය නිසා බව ඔහු ප්‍රකාශ කළේ ය. මෙම සාක්ෂිකරුට අනුව, ඔහු P-2 අත්සන් කළේ එම හේතුව නිසා ය. කෙසේ වෙතත්, පසුව තමන්ට වැටහුණු පරිදි, කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල් නීති විරෝධී ක්‍රියාවක් අතරතුර මිය ගිය බව තමන් පසුව දැනගත් බැවින් මෙම ත්‍යාග වවුචරයට තමන්ගේ නිර්දේශය ලබාදීම වැරදි බව ඔහුගේ සාක්ෂිය වේ. ඒ වන විටත් ඔහු P-2 ත්‍යාග වවුචරයඅත්සන් කර යවා තිබුණි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සේවය කරන සහකාර පොලිස් අධිකාරීවරයෙකු වන මෙම සාක්ෂිකරු, දූෂණ විරෝධී පනතේ දූෂණය නැමති වරදෙහි අර්ථ දැක්වීම තුළ මෙය දූෂණයක් බව පිළිගෙන තිබේ. සත්‍ය සිදුවීම පිළිබඳ පසුකාලීන හෙළිදරව් කිරීම්වලට අනුව, මෙම ත්‍යාගය කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් ඔහුගේ මරණය වෙනුවෙන් ඔහුට නීත්‍යානුකූලව ගෙවිය යුතු නැති බව ඔහුගේ සාක්ෂිය වේ. P-2 ලියවිල්ල පරීක්ෂා කිරීමේ දී, එම ත්‍යාග වවුචරය අදාළ සියලු ම නිලධාරීන් විසින් 2023.12.31 දින ම සම්පූර්ණ කර ඇති බවත්, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මෙන්ම වැඩබලන පොලිස්පතිවරයා ද වශයෙන් 2024.01.01 දින වගඋත්තරකාර පොලිස්පති වරයා එයට අවසන් අනුමැතිය ලබා දී ඇති බවත් පෙනී යයි.

හරස් ප්‍රශ්න කිරීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න බොහෝ ගණනක් අසා නැත. ඇත්ත වශයෙන්ම, ඔහු මෙම සාක්ෂිකරුගේ සාක්ෂි පිළිගන්නා බව පෙනෙන්නට තිබේ. ඔහු මෙම සාක්ෂිකරුගෙන් ඇසූ ප්‍රශ්න රටාවෙන් එය දැකගත හැකි ය. මෙම සාක්ෂිකරු බොරු සාක්ෂි ලබා දෙන බව ඔහු කිසි විටෙකත් යෝජනා කර නැත. මෙම සාක්ෂිකරු තරමක් අකමැත්තෙන් සිටි බව විමර්ශන කමිටුව මුලින් නිරීක්ෂණය කළද, පසුව ඔහු පොලිස් සැරයන් උපුල් වෙත ත්‍යාගය ගෙවීම නිර්දේශ කිරීමේදී ඔහුගෙන් අඩුපාඩුවක් සිදුවී ඇති බව පිළිගත්තේය.

11) <u>වගුරුවෙල ගමරාළලාගේ වානක ජීවන්ත පල්ලෙවත්ත (ජේලර්) ගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු බෝගම්බර බන්ධනාගාරයට අනුයුක්තව සිටින ජේලර්වරයෙකු වන අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් ප්‍රකාශ සටහන් කර ගෙන තිබුණේ මෙම සාක්ෂිකරු ඉදිරියේ ය. එය සිදු වූයේ වගඋත්තරකාර පොලිස්පතිවරයා බෝගම්බර බන්ධනාගාරයේ රිමාන්ඩ් භාරයේ සිටියදී ය. අංක BR 6314/2023 දරන නඩුවට අදාළව මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නියෝගයක් මත වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීමට අවසර ලබා දී තිබුණි. මෙම සාක්ෂිකරු P-56(A) ලෙස සලකුණු කර ඇති 2025.03.20 දිනැති මෙම අධිකරණ නියෝගය හඳුනාගෙන ඇත. බන්ධනාගාරයේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීම සාර්ථකව නිම කිරීමෙන් පසු තමන් විසින් ලොග් පොතෙහි තබා ඇති සටහන් ද මෙම සාක්ෂිකරු හඳුනාගෙන ඇත. මෙම සටහන P-56(B) ලෙස සලකුණු කර මෙම කමිටුවට ඉදිරිපත් කරන ලදී. මෙම සාක්ෂිකරු P-56(B)(i) සහ P-56(B)(ii) ලෙස තමන්

විසින් තබා ඇති සටහන් හඳුනාගෙන තහවුරු කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ප්‍රකාශ සටහන් කර ගැනීමේදී සිදුවූ කිසිදු කරුණක් සම්බන්ධයෙන් ඔහු විසින් කිසිදු පැමිණිල්ලක් කර නොමැති බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් ප්‍රකාශ සටහන් කර ගැනීම සම්පූර්ණයෙන් ම මෙම සාක්ෂිකරු ඉදිරියේ සිදු කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් හරස් ප්‍රශ්න කිරීමේ දී අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, වගඋත්තරකාර පොලිස්පතිවරයා පොලිස්පතිවරයා වූ බැවින් ඔහු විශේෂ කොටසක තබා සිටි බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. එසේ කරන ලද්දේ ඔහුට විශේෂ ආරක්ෂාවක් ලබා දීම සඳහා ය. තවද, වගඋත්තරකාර පොලිස්පතිවරයා බිම නිදා සිටි බව ද ඔහු ප්‍රකාශ කළේ ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා, ඒ අවස්ථාවේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා හොඳ මානසික තත්ත්වයකින් නොසිටි බව පෙන්වීමට අසාර්ථක උත්සාහයක් ගෙන ඇත. කෙසේ වෙතත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් කිසිදු කරුණක් පිළිබඳව පැමිණිලි කර නොමැති බවත්, ඔහු රිමාන්ඩ් බන්ධනාගාරයේ රඳවා සිටින තවත් එක් පුද්ගලයෙක් ලෙස රැඳී සිටින්නේය යන්නත් මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වේ. බන්ධනාගාර නීති රීති වලට අනුව, රිමාන්ඩ් බන්ධනාගාරයේ රැඳී සිටින අතරතුර ඥාති හිතවතුන් හමුවීමට හෝ නීති ආධාර ලබා ගැනීමට හෝ නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබා ගැනීමට රිමාන්ඩ් භාරයේ සිටින කිසිවෙකුට කිසිදු බාධාවක් නොමැති බව මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය විය.
හරස් ප්‍රශ්න ඇසීමේ දී, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා ඉහත සඳහන් කළ ප්‍රශ්න හැර, මෙම සාක්ෂිකරුගෙන් බොහෝ සෙයින් ප්‍රශ්න අසා නැත. මෙම සාක්ෂිකරු අසත්‍ය සාක්ෂි ලබා දෙන බව ඔහු කිසි විටෙකත් යෝජනා කර නැත. ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, විමර්ශන කමිටුව එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

12) <u>පොලිස් සැරයන් සමරකෝන් විජේවික්‍රම විදානේ මුහමදිරම්ගේ උපුල් වසන්ත අල්විස් විජේවික්‍රමගේ සාක්ෂිය.</u>

මෙම සාක්ෂිකරු 2023.12.31 දින දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් සැරයන්වරයෙකි. ඔහු කොළඹ දෙස සිට පැමිණෙන වාහන සඳහා පිටවීමේ ස්ථානයේ සිටියේ ය. ඉමදූව අධිවේගී මාර්ග පොලිස් ස්ථානයේ සිටි උපසේවා නිලධාරියා 'මෝටරෝලා' සන්නිවේදන උපකරණය හරහා ඔහුට ගාල්ල මෙහෙයුම් මැදිරියෙන් ලැබුණු පණිවිඩය පිළිබඳව අලුයම 2.43 ට මෙම සාක්ෂිකරුට දැනුම් දී තිබුණි. වෙඩි තැබීමේ සිද්ධියකට සම්බන්ධ වීමෙන් පසු පලා ගිය සුදු පැහැති KDH වර්ගයේ වෑන් රථයක් නැවැත්වීමට පියවර ගන්නා ලෙස එම පණිවිඩය මගින් ඉල්ලා ඇති බව ඔහුට දැනුම් දෙන ලදී. එම සැකකාර වෑන් රථය අධිවේගී මාර්ගයට ඇතුළු වීමට පැමිණිය හොත් එය නවතා එම වෑන්රථය සහ එහි සිටින අය අත්අඩංගුවට ගත යුතු බව ඔහුට ලැබුණු උපදෙස විය. මෙය ගාල්ල මෙහෙයුම් මැදිරිය විසින් එම ප්‍රදේශයේ සියලු ම ස්ථාන වෙත යවන ලද පණිවිඩයකි.

අලුයම 3.10 ට පමණ, අනෙක් ගේට්ටුවේ (එනම් ඉමදූව දෙස සිට කොළඹ දෙසට ගමන් කිරීමට වාහන ඇතුළු වන ගේට්ටුවේ) රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරියා, ගාල්ල මෙහෙයුම් කාමරයෙන් ලැබුණු පණිවිඩයේ විස්තර කර ඇති සුදු පැහැති KDH වර්ගයේ වෑන් රථය පිවිසුම වෙත ළඟා වී කොළඹ දෙසට යාමට උත්සාහ කරන විට එය නවත්වා ගත් බව ඔහුට දන්වා සිටියේය. එම තොරතුර ලැබුණු විට, මෙම සාක්ෂිකරු සහ අනෙක් පොලිස් කොස්තාපල්වරයා වහාම සැක සහිත වෑන් රථය නතර කළ ගේට්ටුව වෙත දිව ගියහ. පසුපස ආසනයේ දකුණු පැත්තේ වාඩි වී සිටි පුද්ගලයා ඔහුට හැඳුනුම්පතක් ලබා දී තමා ප්‍රධාන පොලිස් පරීක්ෂක සිල්වා බව කියා සිටියේය. කෙසේ වෙතත්, එම හැඳුනුම්පතේ ඡායාරූපය මැකී ගොස් තිබූ බැවින්, පොලිස් සැරයන් විජේවික්‍රම එම හැඳුනුම්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කර ඇත. පසුව ඔහු තම ජංගම දුරකථනයෙන් මෙම සිදුවීම පිළිබඳව ඉමදූව මහාමාර්ග පොලිසියේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක සමන් කුමාර වෙත දැනුම් දී ඇත. පොලිස් පරීක්ෂක සමන් කුමාර වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයාට ඒ බව දැනුම් දෙන ලෙස සාක්ෂිකරුට උපදෙස් දී ඇති අතර, පසුව මෙම සාක්ෂිකරු වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා වූ පොලිස් පරීක්ෂක උපුල් කුමාරට මේ පිළිබඳව දැනුම් දී ඇත. මිනිත්තු විස්සකින් (20) තමන් ඉමදූව පිවිසුම වෙත ළඟා වන බවත්, වෑන් රථය රඳවා තබා ගන්නා ලෙසත්, තමන් පැමිණෙන තුරු වෑන් රථය හෝ එහි ගමන් කරන්නන් නිදහස් නොකරන ලෙසත් ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් කුමාර ඔහුට පවසා ඇත. මඳ වේලාවකට පසු, වෑන් රථයේ පිටුපස තට්ටුව මත යමෙක් වැතිරී සිටින බව පොලිස් සැරයන් විජේවික්‍රම දුටුවේ ය. එසේ සිටීමට හේතුව විමසූ විට, අනෙක් අය පවසා ඇත්තේ ඔහු තුවාල ලබා ඇති බවයි. පසුව, ඔවුන්ගේ ඉල්ලීම පරිදි තුවාලකරු රෝහලට යැවීම සඳහා ඔහු 1990 සුවසැරිය ගිලන් රථයක් අමතා ඇත.

ප්‍රධාන පොලිස් පරීක්ෂක උපුල් කුමාර වෑන් රථය අසලට පැමිණි පසු, ඔහු එහි සිටි සියලු දෙනාට ම වෑන් රථයෙන් බසින ලෙස ඉල්ලා සිටියේ ය. වෑන් රථයේ තට්ටුව මත වැතිර සිටි තුවාලකරු ගිලන් රථයේ රැගෙන ආ ට්‍රොලිය මත තබා එය ගිලන් රථයට පටවා ඇත. 1990 සුවසැරිය ගිලන් රථයේ සේවය කළ හෙදියට තුවාලය බැලීමට අවශ්‍ය වූ අතර, තුවාලකරු ගෙල දක්වා ම සම්පූර්ණයෙන් වසා තිබූ (ශීපරය දමා තිබූ) ජැකට්ටුවක් ඇඳ සිටියේ ය. පොලිස් සැරයන් විජේවික්‍රම එය විවෘත කළ විට තුවාලකරු ඇඳ සිටි ටී-ෂර්ටය ලේ වලින් තෙත් වී ඇති බව දුටුවේය. එබැවින් ටී-ෂර්ටය ඉවත් කිරීමට නොහැකි විය. එවිට හෙදිය කතුරක් භාවිතා කරමින් ටී ෂර්ට් එක කපා එය විවෘත කළේය. පොලිස් සැරයන් විජේවික්‍රම එම පුද්ගලයාගේ පපුවේ වම් පැත්තේ පිළිස්සුම් සලකුණු සහිත තුවාලයක් දුටුවේය. තුවාලය මත රෙදි කැබැල්ලක් තබා ගත් හෙදිය, හෘද ස්පන්දන නිරීක්ෂණ යන්ත්‍රයකට රෝගියා සම්බන්ධ කළ පසු රෝගියාගේ හෘද ස්පන්දන මිනුම 52 ක් ලෙස යන්ත්‍රයේ පෙන්නුම් කළේ ය. ඉන්පසු, රෝගියා ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවන බවත් කරාපිටිය රෝහලට ගෙන යා යුතු බවත් හෙදිය ඔහුට පවසා ඇත. කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ තුවාල ලැබූ අනෙක් පුද්ගලයා කොර ගසමින් ගිලන් රථය වෙත ඇවිද ගිය බව පොලිස් සැරයන් විජේවික්‍රම පවසා ඇත. එම පුද්ගලයා අතේ පිස්තෝලයක් තිබුණි. කෙසේ වෙතත්, ඔහු ගිලන් රථයට නැගීමට පෙර පිස්තෝලය වෙනත් කෙනෙකුට භාර දෙන ලෙස මෙම සාක්ෂිකරු නියෝග කර තිබුණි. රෝගීන් 1990 සුවසැරිය ගිලන් රථයෙන් රෝහලට ගෙන යන ලදී. ගිලන් රථය සහ වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා ආසන්න වශයෙන් එකම වේලාවේ ඉමදූව පිවිසුමට පැමිණ තිබුණි. කොළඹ අපරාධ කොට්ඨාසයේ වෑන් රථය තුළ සිට ගිලන් රථයට ගෙන යාමට රෝගියා එසවූ විට, ඔහු ඇඳ සිටි ජැකට්ටුව තුළ එකතු වී තිබූ රුධිරය පහළට ගලා යන ආකාරය පොලිස් සැරයන් විජේවික්‍රම දැක ඇත.

කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ සිටි පුද්ගලයින් මුල් අවස්ථාවේ දී තමන්ට කොළඹ දෙසට ගමන් කිරීමට ඉඩ දෙන ලෙසට බල කර ඉල්ලා සිටි බව තවත් ප්‍රශ්නවලට පිළිතුරු දුන් මෙම සාක්ෂිකරුගේ

ස්ථාවරය විය. මුලදී කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ සිටි පුද්ගලයින් වෑන් රථය තුළ බරපතල තුවාල ලැබූ පුද්ගලයෙකු සිටින බව හෙළි කර නොතිබුණි. වෑන් රථය තුළ සිටි කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ සාමාජිකයින් එහි වැතිර සිටි පුද්ගලයා තුවාල ලබා ඇති බව හෙළි කර තිබුණේ වෑන් රථයේ තට්ටුව මත පුද්ගලයෙකු වැතිර සිටින සිටින බව පොලිස් සැරයන් විජේවික්‍රම බිඳුණු වීදුරු හරහා දුටු පසුව ය. තුවාල ලබා වෑන් රථය තුළ වැතිර සිටි පුද්ගලයා පොලිස් සැරයන් උපුල් ය.

මෙම සාක්ෂිකරු ප්‍රදේශයේ පිහිටා ඇති ආසන්න රෝහල්වලට ඇති දුර පැහැදිලි කර ඇත. මෙම සාක්ෂිකරුට අනුව, W15 හෝටලයට ආසන්නත ම රෝහල එහි සිට මිනිත්තු තුනක් දුරින් (කිලෝමීටරයක් පමණ දුරින්) පිහිටා ඇත. ඒ රජයේ රෝහලක් වූ වැලිගම වලාන රෝහල යි. මාතර මහ රෝහල W15 හෝටලයේ සිට කිලෝමීටර හතරක් පමණ දුරින් පිහිටා ඇති අතර, අහංගම නගරයේ ද ප්‍රාදේශීය රෝහලක් තිබුණි. W15 හෝටලයේ සිට පැමිණ ඉමදුව අධිවේගී මාර්ග පිවිසුමට ළඟා වීමට අහංගම ප්‍රාදේශීය රෝහල පසු කළ යුතු ය. මෙම සාක්ෂිකරුට අනුව, W15 හෝටලයේ සිට කරාපිටිය රෝහලට යාමට අවම වශයෙන් මිනිත්තු හතළිහක් ගතවනු ඇත. කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් ඒ අවස්ථාවේ කිසිදු රෝහලක් සොයා ගැනීමට හෝ රෝහලකට යාමට කිසිසේත් උනන්දු නොවූ බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වේ. ඇත්ත වශයෙන්ම, කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායමේ කිසිවෙක් තුවාල ලැබූ පොලිස් සැරයන් උපුල් 1990 සුවසැරිය ගිලන් රථයට රැගෙන යාමට මුලදී උදව් කර නොතිබුණි. තවද, පිටුපස අසුනේ වාඩි වී සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ ස්ථානාධිපතිවරයා තමන්ට කොළඹට යාමට අවශ්‍ය බව බලකර පවසා ඇති අතර, 'අපි යමු යන්න' යනුවෙන් පවා පවසා ඇත. ඉන්පසුව මෙම සාක්ෂිකරු පොලිස් කොස්තාපල් 4094 ජයසිංහට කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයෙන් එය පණගන්වන යතුර ඉවත් කරන ලෙස උපදෙස් දී, වෑන් රථය ඉලක්ක කර ගනිමින් ඔහු ගෙන ආ T56 රයිෆලය සූදානම්කර, ඔවුන් පැන ගිය හොත් ඔවුන්ට වෙඩි තබන බවට තර්ජනය කර ඇත. තුවක්කු පිළිබඳව හුරුපුරුදු ඕනෑම අයෙකු වෙඩි තැබීමට සූදානම් වීමේ එවැනි ක්‍රියාවකින් පසු පැන යාමට එඩිතර වන බව ඔහුගේ සාක්ෂිය වේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, පොලිස් සැරයන් විජේවික්‍රම ඉමදුව අධිවේගී මාර්ග පිවිසුමේදී සිදු වූ සිදුවීම් අනුපිළිවෙල සම්බන්ධයෙන් ඔහුගේ ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇත.

පොලිස් සැරයන් විජේවික්‍රම මෙම විමර්ශන කමිටුව ඉදිරියේ අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බව යෝජනා කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිදු අවස්ථාවක උත්සාහ කළේ නැත. ඇත්ත වශයෙන්ම, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය උප පොලිස් පරීක්ෂක ගාමිණී ජයසේකරගේ සාක්ෂි මගින් සම්පූර්ණයෙන් ම සනාථ වේ. එපමණක් නොව, 2023.12.31 දින අලුයම දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදුව පිවිසුමේ/පිටවීමේ ස්ථානයේ සිටි නිලධාරීන් ඔවුන්ගේ රාජකාරි ඉටුකිරීම පමණක් සිදු කර ඇති බවත්, ඔවුන්ගේ පැත්තෙන් සිදු වූ කිසිදු අඩුපාඩුවක් සම්බන්ධයෙන් ඔවුන්ට වරදක් කිව නොහැකි බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය සාක්ෂි දීමේදී විශේෂයෙන් ප්‍රකාශ කර ඇත. මේ අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිදු අවස්ථාවක මෙම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි පරස්පර බව සඳහන් කිරීමට/හෝ අසත්‍ය බව ප්‍රකාශ කිරීමට උත්සාහ කර නැත. එම හේතූන් මත විමර්ශන කමිටුව පොලිස් සැරයන් විජේවික්‍රමගේ සාක්ෂිය තමන් ඉදිරියේ ඉදිරිපත් කර ඇති සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගැනීමට තීරණය කරයි.

13) <u>පොලිස් කොස්තාපල් රියදුරු විජේකෝන් හේරත් මුදියන්සේලාගේ ඉෂාන් නිරෝෂ් බණ්ඩාරගේ සාක්ෂිය</u>

මෙම සාක්ෂිකරු කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්ත පොලිස් කොස්තාපල් රියදුරෙකු වන අතර ඔහු කොළඹ අපරාධ කොට්ඨාශයේ අංක WP PK 7225 දරන KDH වර්ගයේ වෑන් රථයේ බඳෙහි ස්ටිකර් ඇලවීමට පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්සට උදව් කර ඇත. එම ස්ටිකර් ඇලවීම 2023.12.30 දින අපරභාගයේ කොළඹ අපරාධ කොට්ඨාශ පරිශ්‍රයේ දී සිදු විය. පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස එදින සවස එම වෑන් රථයෙන් යාමට සූදානම් වන්නේ කොහේ දැයි තමාට හෙළි නොකළ බව පොලිස් කොස්තාපල් රියදුරු බණ්ඩාර සිය සාක්ෂියේ දී පවසා ඇත. ස්ටිකර් ගෙන එන ලද්දේ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස විසිනි. පොලිස් කොස්තාපල් රියදුරු බණ්ඩාර එම අවස්ථාවේ ඔහු සේවය කළ කොළඹ අපරාධ කොට්ඨාශ කාර්යාලයෙන් කතුරක් ගෙනැවිත්, ස්ටිකර් කපා වෑන් රථයේ අලවා තිබුණි. එම ස්ටිකරය අළු-රිදී පැහැයෙන් යුක්ත විය. ස්ටිකර් ඇලවීම පොලිස් කොස්තාපල් රියදුරු අමිලගේ සහාය ඇතිව පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස විසින් ම සිදු කරන ලදී. පොලිස් කොස්තාපල් රියදුරු බණ්ඩාර යනු උප පොලිස් පරීක්ෂක මධුරංගගේ ඒකකයට, එනම් බස්නාහිර පළාත් දූෂණ මර්දන ඒකකයට අනුයුක්ත පොලිස් කොස්තාපල් රියදුරෙකි. මෙම කමිටුව වෙත ඉදිරිපත් කරන ලද P-58(A) සහ P-58(B) ලෙස සලකුණු කරන ලද ඡායාරූපය පෙන්වූ විට, පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාර එම ඡායාරූපවල තිබූ වෑන් රථයේ අලවා තිබූ ස්ටිකරයේ ඉතිරි සලකුණු හඳුනාගෙන ඇත. ඒවා ඔහු සහ අනෙක් දෙදෙනා 2023.12.30 දින අපරභාගයේ කොළඹ අපරාධ කොට්ඨාශ පරිශ්‍රයේ දී ස්ටිකරය අලවා තිබූ ස්ථාන බව ඔහු තහවුරු කළේ ය.
පසුදා උදෑසන සිදුවූ වෙඩි තැබීමකින් කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් මිය ගොස් ඇති බවත්, එම ස්ටිකර් අලවන ලද වෑන් රථය පැදවා ඇත්තේ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස බවත් ඔහු පසුව දැනගෙන තිබුණි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාර තම මූලික පරීක්ෂණ වාර්තාවේ ඒ වන විටත් ප්‍රකාශ කර ඇති කරුණු එපරිද්දෙන් ම නැවත අවධාරණය කර තිබුණි. ස්ටිකර් අලවන අවස්ථාවේ වාහනයේ පෙනුම වෙනස් කිරීමට තමා අදහස් නොකළ බව හරස් ප්‍රශ්න කිරීමේ දී තවදුරටත් පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. කෙසේ වෙතත්, වෑන් රථයේ ස්ටිකරය ඇලවීමේ අරමුණ කුමක්ද යන්න තමා නොදන්නා බව නැවත ප්‍රශ්න කිරීමේ දී පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාර ප්‍රකාශ කර ඇත.

ඉහත කරුණු හැරුණු විට, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාර විසින් ලබා දෙන ලද සාක්ෂිවල සත්‍යතාව පිළිබඳව බරපතල ලෙස අභියෝග කර නැත. ඇත්ත වශයෙන්ම, පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාර වෙඩි තැබීමේ සිද්ධියට හෝ එහි සූදානමට කිසිදු සම්බන්ධයක් නැත. වෑන් රථයේ ස්ටිකරයක් ඇලවූයේ මන්දැයි ඔහු දැන සිටියේ නැත. ස්ටිකරය ඇලවීම කොළඹ අපරාධ කොට්ඨාස පරිශ්‍රය තුළ සිදු කළ නිසා ඔහු එයට සහාය වී ඇත. පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාරගේ සාක්ෂිය පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස විසින් ලබා දුන් සාක්ෂි මගින් හොඳින් සනාථ වේ. ඉහත තත්වයන් සැලකිල්ලට ගැනීමේ දී, පොලිස් කොස්තාපල් රියදුරු නිරෝෂ් බණ්ඩාරගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු

හේතුවක් නැත. එබැවින්, විමර්ශන කමිටුව එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

14) <u>සහකාර පොලිස් අධිකාරී අරුමප්පෙරුම ආරච්චිගේ චන්දිමා නිරෝෂනී අරුමප්පෙරුමගේ සාක්ෂිය.</u>

ඇය අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ පරිගණක අපරාධ විමර්ශන ඒකකයට අනුයුක්ත සහකාර පොලිස් අධිකාරිවරියකි. 2024.01.18 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා සහ එවකට නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා සහභාගී වූ මාධ්‍ය සාකච්ඡාවේ පිටපතක් ඉදිරිපත් කිරීම සඳහා ඇය විමර්ශන කමිටුව ඉදිරියට පැමිණියාය. කෙසේ වෙතත්, මෙම පටිගත කිරීම 'යූ ටියුබ්' මාධ්‍යයෙන් බාගත කර ගත් පටිගත කිරීමක් යන පදනම මත එය ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විරෝධතාවය පළ කළේය. විමර්ශන කමිටුව මෙම විරෝධතාවය සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා ඉදිරිපත් කළ කරුණු සහ අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කරුණු විභාග කළේ ය. ඉන්පසුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් මතු කරන ලද විරෝධතාවය සහ එය යූ ටියුබ් මාධ්‍යයෙන් බාගත කර මෙම විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කිරීමට හේතු වූ තත්වයන් සලකා බැලීමෙන් පසු කමිටුව මෙම මාධ්‍ය සාකච්ඡාව කමිටුව ඉදිරියේ ප්‍රදර්ශනය කිරීමට ඉඩ නොදීමට තීරණය කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස, තවදුරටත් මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි සටහන්කර ගැනීම නවත්වා මෙම සාක්ෂිකාරිය නිදහස් කිරීමට කමිටුව තීරණය කළේ ය. එබැවින්, කමිටුව ස්වකීය අවසාන නිගමනය සඳහා මෙම සාක්ෂිකාරියගේ සාක්ෂි හෝ මෙම පටිගත කිරීමේ අන්තර්ගතය සැලකිල්ලට නොගනියි.

15) <u>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කොස්ගහමුලගෙදර ප්‍රගීත් බුද්ධික සමරපාලගේ සාක්ෂි</u>

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික සමරපාල අපරාධ බුද්ධි විශ්ලේෂණ හා නිවාරණ කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේ ය. පොලිස් ත්‍යාග අරමුදලෙන් ත්‍යාග ගෙවීම සඳහා වන ඉල්ලීම් ක්‍රියාවලිය අනුකූලනය කිරීම මෙම අංශයේ වගකීම වේ. මෙම අංශය නියෝජ්‍ය පොලිස්පති - අපරාධ යටතේ ක්‍රියාත්මක වේ. ත්‍යාගය ගෙවීමට පෙර, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට එය පොලිස්පතිවරයා වෙත යොමු කිරීමට පෙර අදාළ සියලු ම ලියවිලි ගොනුවෙහි අමුණා ඇති බව සහතික කිරීම මෙම අංශයේ වගකීමක් වේ. P-2 ත්‍යාග වවුචරය යනු වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ගෙවීම අනුමත කර පසුව ගෙවීම සඳහා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික සමරපාලගේ අංශයට යවා ඇති ත්‍යාග වවුචරයකි. ඔහුට 2024.01.02 දින මෙම ගොනුව ලැබී ඇත.

මුලදී මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ පොලිස්පතිවරයා විසින් මෙම ත්‍යාග වවුචරය අනුමත කර පසුව එය ඔහුගේ අංශයට යැවීමට හැකි බව ය. කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් 57241 උපුල් වෙත ත්‍යාගය ගෙවීමට අදාළව පවත්වාගෙන යන PHQ/ CCB/ C5/ 2024 දරන මෙම C-5 ගොනුව සම්පූර්ණ ගොනුවක් නොවන බව වැඩිදුර ප්‍රශ්න කිරීම් හමුවේ මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත. ත්‍යාගයක් ගෙවීම සඳහා තම අංශය විසින් සියලු විස්තර සත්‍යාපනය කළ යුතු බව සහ ත්‍යාගයක් සඳහා හිමිකම් පෑම

නීත්‍යානුකූල එකක් සහ අව්‍යාජ එකක් බවට සෑහීමකට පත්වීමට අවශ්‍ය බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වේ. එසේ කළ යුත්තේ මෙම ගෙවීම් සිදු කරනු ලබන්නේ අධිකරණය විසින් වරදකරුවන් වූ පුද්ගලයින්ට පනවන ලද දඩ මුදල් හරහා එකතු කරන ලද මහජන මුදල් වලින් බැවිනි.

මරණ පරීක්ෂණ කටයුතු පිළිබඳ විස්තර, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව, රජයේ රස පරීක්ෂක වාර්තාව, අදාළ පොලිස් නිලධාරීන් ත්‍යාගයට අදාළ රාජකාරිය සඳහා පොලිස් ස්ථානයෙන් පිටව යන විට කරන ලද සටහන් සහ අදාළ රාජකාරිය නිමකර ආපසු පැමිණි පසු එම පොලිස් නිලධාරීන් විසින් කරන ලද සටහන් වැනි ලේඛන එම ගොනුවේ තිබිය යුතු බව මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත. එම ලේඛන කිසිවක් මෙම C-5 ගොනුවේ නොමැති බව මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත. මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල් වෙත පොලිස් ත්‍යාග අරමුදලෙන් රුපියල් මිලියන 1.5 ක මුදලක් ගෙවීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අනුමත කිරීමට පෙර කිසිවෙකු එම ලේඛන ඉල්ලා සිටි බවට හෝ ඒ සඳහා උනන්දුවක් දැක්වූ බවට කිසිදු ඇඟවීමක් නැත.

කොළඹ අපරාධ කොට්ඨාසයේ පොලිස් සැරයන් උපුල් සහ ඔහුගේ කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක නිරත වී ඇති බව පසුව දැනගත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික සමරපාල, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පොලිස් සැරයන් උපුල් වෙත ත්‍යාගය ගෙවීමට අනුමත කිරීමට පෙර මෙම ගොනුව ඔහුගේ අංශයට පැමිණියේ නම්, එය අනුමත කිරීමට පිළිගත හැකි පදනමක් නොමැති බැවින් ඔහු මෙම ගෙවීම නිර්දේශ නොකරන බව ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ. එබැවින් එම ලේඛන කිසිවක් නොමැතිව 2024.01.01 දින ම P-7 හි පහළින් සටහනක් පමණක් තබා මෙම ත්‍යාගය ගෙවීම සඳහා අනුමැතිය ලබා දීමෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් සිදු කර ඇත්තේ අක්‍රමවත් ගෙවීමක් ය යන්න ඔහුගේ සාක්ෂිය වේ.

මේ අනුව, සිද්ධිය සිදුවී දින දෙකක් ඇතුළත, එනම් 2024.01.01 දින, පොලිස් සැරයන් 57241 උපුල් වෙත රුපියල් මිලියන 1.5 ක මුදලක් ගෙවීම සහතික කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා මූලිකත්වය ගෙන ඇති බව පැහැදිලි ය. ත්‍යාගය සඳහා මූලික ඉල්ලීම පිළිවෙලින් කොළඹ අපරාධ කොට්ඨාසය භාර නිලධාරියා, සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) - කොළඹ අපරාධ කොට්ඨාසය, අධ්‍යක්ෂ- කොළඹ අපරාධ කොට්ඨාසය, නියෝජ්‍ය පොලිස්පති - කොළඹ යන අය විසින් 2023-12-31 දිනම ආරම්භ කර නිර්දේශ කර ඇති බව සැලකිල්ලට ගත යුතුය. P-2, P-3, P-4, P-5 සහ P-6 ලෙස සලකුණු කර ඇති ලියවිලි වලින් මෙය පැහැදිලි වේ.

ඉහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් ලියන ලද ලිපිවල අන්තර්ගතයන් එකිනෙකට වෙනස් නොවන බව මෙම සාක්ෂිකරු තවදුරටත් පිළිගෙන ඇත. මෙය එක් එක් පුද්ගලයා මුල් ලිපිය පිටපත් කර එය ප්‍රමාණවත් බව පිළිගෙන ඇති බවට වන ඇඟවීමකි. හරස් ප්‍රශ්න ඇසීමේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, අවශ්‍ය ලියකියවිලි ගොනුවේ නොමැති නම් ඒවා ඉල්ලා සිටීම තමන්ගේ වගකීම බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත. පසුව මාතර මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගය සලකා බැලීමේදී, නීති විරෝධී ක්‍රියාවක නියැලී සිටි පුද්ගලයෙකුට පොලිස් ත්‍යාග අරමුදලෙන් රුපියල් මිලියන 1.5 ක් ගෙවා ඇති බව ඔහු පිළිගෙන තිබේ. මේ සඳහා හේතු දක්වමින් සාක්ෂිකරු පැහැදිලි කර ඇත්තේ ගොනුව තමන් වෙත පැමිණෙන විට වගඋත්තරකාර පොලිස්පතිවරයා ගෙවීම අනුමත කර තිබූ බැවින් මුදල් ගෙවීම සඳහා පියවර ගැනීමට සිදු වූ බවයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික සමරපාල විසින් ලබා දුන් සාක්ෂිවල සත්‍යතාව අභියෝගයට ලක් කර ඇති බවක් කමිටුවට නොපෙනෙයි. ඉහත තත්වයන් සැලකිල්ලට ගැනීමේ දී, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, ස්වකීය අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

16) <u>ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම් තනුජා නයෝමි ප්‍රනාන්දුගේ සාක්ෂිය</u>

P-45, P-46, P-47, P-48, P-49, සහ P-50 ලෙස සලකුණු කර ඇති ලේඛන විධිමත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට මෙම සාක්ෂිකාරිය කැඳවන ලදී. ඇත්ත වශයෙන්ම, මෙම සාක්ෂිකාරිය එම ලේඛනවලට අදාළ කාලයේ ජාතික පොලිස් කොමිෂන් සභාවේ (NPC) ලේකම්වරිය නොවීය. මේ අනුව, ඇය මෙම ලේඛන විධිමත් ලෙස ඉදිරිපත් කරමින් මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දුන්නා පමණි. P-45 යනු 2024.01.07 දින '*Weligama Fatal Shooting Raises Questions Over Communication Lapses Over Police Ops*' (වැලිගම මාරාන්තික වෙඩි තැබීම පොලිස් මෙහෙයුම්වල සන්නිවේදන අඩුපාඩු සම්බන්ධ ප්‍රශ්න මතු කරයි) යන ශීර්ෂය යටතේ 'සන්ඩේ ටයිම්ස්' පුවත්පතේ පළවූ ලිපියක විස්තර කර ඇති සිදුවීම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉල්ලා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2024.01.30 දින පොලිස්පතිවරයා වෙත යවන ලද ලිපියකි. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් P-45 සඳහා යවන ලද 2024.02.22 දිනැති පිළිතුර P-46 ලෙස සලකුණු කර ඇත. එම ලිපියේ (P-46) වගඋත්තරකාර පොලිස්පතිවරයා වැලිගම පොලිස් ස්ථානයේ නිලධාරීන් හෝ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් ඔවුන්ගේ පැත්තෙන් සිදු වූ කිසිදු වරදක් සඳහා වගකිව යුතු නොවන බව ජාතික පොලිස් කොමිෂන් සභාවට නිශ්චිතව ම දන්වා ඇත. වෙනත් වචන වලින් කිවහොත්, 2023.12.31 වෙනි දින වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධිය සිදු වූ විට, එම සිද්ධියට සම්බන්ධ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් ඔවුන්ගේ නිල රාජකාරි විෂය පථය තුළ ඉතා නිවැරදි ලෙස ක්‍රියා කර ඇති බව P-46 හි වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇති අදහස වේ. 2024.02.22 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම මතය ජාතික පොලිස් කොමිෂන් සභාවට දැනුම් දී ඇති බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

මෙම සාක්ෂිකාරිය කමිටුව ඉදිරියේ මෙම ලිපි විධිමත් ලෙස ඉදිරිපත් කිරීම සඳහා පමණක් කැඳවනු ලැබ ඇති බැවින් මෙම විමර්ශන කමිටුව පසුව මෙම වාර්තාවේ වෙනත් තැනක මෙම ලේඛනවල අන්තර්ගතය සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. එබැවින්, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා ද මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අභියෝගයට ලක් කිරීමට උත්සාහ කළේ නැත. ඇත්ත වශයෙන්ම, ඇය කමිටුව වෙත ඉදිරිපත් කළ ඇතැම් ලියවිලි වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අත්සන් කරන ලද ලියවිලි වේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ සාක්ෂියේ දී P-45 සහ P-46 ලෙස සලකුණු කර ඇති ලියවිලි පිළිගෙන ඇත. P-47 සහ P-48 ලෙස සලකුණු කර ඇති ලිපි සමාන ලිපි වේ. P-50 යනු ජාතික පොලිස් කොමිෂන් සභාවෙහි P-49 විමසුමට ප්‍රතිචාර වශයෙන් වැඩබලන පොලිස්පතිවරයා විසින් යවන ලද වාර්තාවකි.

17) <u>කාන්තා පොලිස් කොස්තාපල් 6754 මාකුඹුරේ ගෙදර හේරත් මුදියන්සේලාගේ ඉනෝකා චාන්දනීගේ සාක්ෂිය</u>

මෙම සාක්ෂිකාරිය අවස්ථා දෙකක දී කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සේවය කළ අයෙකි . සිද්ධියට අදාළ අවස්ථාවේ දී, කොළඹ අපරාධ කොට්ඨාස අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයේ බාහිර ලේඛන රෙජිස්ටරය නඩත්තු කිරීමේ වගකීම ඇය විසින් දැරීය. ඒ වන විට, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වන අතර, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි ස්ථානාධිපතිවරයා ලෙස කටයුතු කළේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා ය.

ඇය 2024-07-07 සිට 2025-01-31 දක්වා ප්‍රසූත නිවාඩු මත සිටි බව පවසා ඇත.කොළඹ අපරාධ කොට්ඨාසයෙහි අධ්‍යක්ෂවරයාගේ කාර්යාලයට අනුයුක්තව සිටි උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම, ඇය අමතා බාහිර ලේඛන රෙජිස්ටරයේ දැනටමත් ඇතුළත් කර ඇති ඇතුළත් කිරීම් නැවත ලිවීමට උපදෙස් දුන්නේය. උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම පසුව එම ලේඛනය සහ හිස් පොතක් ද ගෙනැවිත් එම උපදෙස් සමඟ ඇයට භාර දී ඇත. ඇය 2024-07-07 දින ඇගේ ප්‍රසූත නිවාඩු ආරම්භ කර ඇති බැවින්, මෙය එදිනට පසුව සිදුවී ඇති බව පැහැදිලිය. මෙය 2024 ඔක්තෝබර් මාසයේ යම් දිනක සිදු වන්නට ඇති බව ඇගේ මතකයේ ඇති සාක්ෂියකි. ඒ වන විට වැලිගම වෙඩි තැබීමේ සිද්ධියකදී කොළඹ අපරාධ කොට්ඨාසයෙහි පොලිස් සැරයන් උපුල් මිය ගිය බව ඇය දැන සිටි බව විමර්ශන කමිටුව ඉදිරියේ ඇය පැහැදිලිව ප්‍රකාශ කර ඇත.

ඇය සිය සාක්ෂියේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ නව ලේඛනයේ තමාගේම අත් අකුරින් සටහන් නැවත ලියා ඇති බවයි. මෙම ක්‍රියාව නුසුදුසු සහ නීති විරෝධී බව ඇය දැන සිටියද, ඇය එය කළේ උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම විසින් ඇයට එසේ කිරීමට බල කළ බැවිනි. ඇය නිරත වූ ක්‍රියාවෙහි බරපතලකම පිළිබඳව ඇය දැන සිටියද මෙය සිදු විය. P-23 ලෙස සලකුණු කරන ලද, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ලද මෙම රෙජිස්ටරය, ඇය විසින් හඳුනාගෙන ඇත. ඇය පැරණි සහ නව රෙජිස්ටරයන් දෙකම උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම වෙත භාර දුන් බවත් ඇය තවමත් ප්‍රසූත නිවාඩු මත සිටියදී ටික කලකට පසු එය ලබා ගැනීමට නැවත ඇගේ නිවසට ඔහු පැමිණි බවත් ඇය සාක්ෂි දී ඇත . 2023-12-30 වන දින වැලිගම බලා යන ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායමට අදාළ 439 පොලිස් පෝරමය, 2023-12-29 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයෙහි අධ්‍යක්ෂ කාර්යාලයෙන් යවන ලද බව ව්‍යාජ ලෙස පෙන්වීමට මෙය සිදු කල බව ඇය පිළිගනී. එය එසේ නොවන බව ඇය දැන සිටියාය.

2023-12-30 දින පොලිස් පරීක්ෂක ජයතිලක මහතාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායම විසින් සිදු කරන ලද ගමන් වලට අදාළ 439 පොලිස් පෝරමය පවා බාහිර ලේඛන රෙජිස්ටරයට අනුව යවා ඇත්තේ 2023-12-30 දින වන බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කරයි. වැඩබලන අධ්‍යක්ෂ නෙවිල් ද සිල්වා විසින් රාත්‍රියේ වැලිගමට යන ලෙස උපදෙස් දෙනු ලැබුවේ 2023-12-30 වන දින උදෑසන බව ද ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සාක්ෂි දී ඇත. ඒ පොලිස් පරීක්ෂක ජයතිලක ඒ වන විටත් වෙනත් කණ්ඩායමක් සමඟ මාතර බලා පිටත්ව ගොස් තිබූ අවස්ථාවේදීය.

වග උත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා, කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකා විසින් ලබා දුන් සාක්ෂිවල විශ්වසනීයත්වය බරපතල ලෙස අභියෝගයට ලක් කර නොමැත. පෙර දක්වා

ඇති හේතු නිසා,විමර්ශන කමිටුව දැනටමත් උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුමගේ සාක්ෂි සත්‍ය සාක්ෂි ලෙස පිළිගැනීමට තීරණය කර ඇත.

පොලිස් පරීක්ෂක ශ්‍රියා බණ්ඩාර විජේතුංග මහත්මියගේ සාක්ෂියෙන් විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකා මහත්මිය, 2024-07-07 සිට 2025-01-31 දක්වා කාලය තුළ ප්‍රසූත නිවාඩු ලබා සිටි බවයි. නඩුවේ සියලු සිද්ධීන් සැලකිල්ලට ගනිමින්, කාන්තා පොලිස් කොස්තාපල් 6754, ඉනෝකාගේ සාක්ෂිවල විශ්වසනීයත්වය සැක කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් හෝ පදනමක් නොමැත. මේ අනුව,විමර්ශන කමිටුව ඇගේ සාක්ෂි පිළිගැනීමට තීරණය කරයි.

18 ) <u>පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුමගේ සාක්ෂිය.</u>

කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) කාර්යාලයේ තබා ඇති බාහිර ලේඛන රෙජිස්ටරය පවත්වාගෙන යාමේ වගකීම පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුම සතු විය. අදාළ අවස්ථාවේදී, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) ලෙස කටයුතු කළේ සහකාර පොලිස් අධිකාරී චාමර ගොඩගේ ය. උප පොලිස් පරීක්ෂක පුල්ලේපෙරුම ඉදිරියේ, ඔහු කොළඹ අපරාධ කොට්ඨාසයෙහි අධ්‍යක්ෂ කාර්යාලයට කැඳවනු ලැබූ බව ඔහු සාක්ෂි දී ඇත. එම අවස්ථාවේදී, 2023-12-30 වන දින වැලිගම බලා ගමන් කළ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායමට අදාළ 439 පොලිස් පෝරමය 2023-12-29 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයෙහි අධ්‍යක්ෂ කාර්යාලයෙන් යවන ලද බව පෙන්වීම සඳහා එම ඇතුළත් කිරීම් නව ලේඛනයක නැවත ලිවීමට පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුම හට උපදෙස් දෙන ලදී. අලුතින් ලියා ඇති ලේඛනය ඉදිරිපත් කර ඇති අතර, එය P-62 ලෙස සලකුණු කර ඇත. 2023-12-31 වන දින වෙඩි තැබීමේ සිද්ධියේදී කොළඹ අපරාධ කොට්ඨාසයෙහි පොලිස් සැරයන් උපුල් මිය ගිය බව පොලිස් සැරයන් ඕවපෙරුම දැන සිටි අතර ඒ වන විට එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් ආරම්භ කර තිබුණි. ඒ ආකාරයෙන්ම, පැරණි ලේඛනයේ එම කොටස ඔවුන්ගේ අත් අකුරින් තිබූ බැවින්, නව ලේඛනයේ මෙම ඇතුළත් කිරීම් ලිවීමට තවත් නිලධාරීන් හතර දෙනෙකු දායක වූ බව සාක්ෂි දී ඇත. වැලිගම සිද්ධියට අදාළ 439 පොලිස් පෝරමය, 2023-12-29 දින කොළඹ අපරාධ කොට්ඨාසයෙහි අධ්‍යක්ෂ කාර්යාලයෙන් යවා ඇති බව ව්‍යාජ ලෙස පෙන්වීමට, මෙය නීති විරෝධී ලෙස සිදු කළ බව පොලිස් සැරයන් ඕවපෙරුම පිළිගෙන ඇත.

මෙම නඩුවේ සියලු තත්වයන් සැලකිල්ලට ගන්නා විට, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුව ට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, අවසාන තීරණය සඳහා පොලිස් සැරයන් සුනන්ද ඕවපෙරුමගේ සාක්ෂි මත ක්‍රියා කිරීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

19) <u>කාන්තා පොලිස් පරීක්ෂක යටියන්තොට ඩයස් දමයන්ති ස්වර්ණලතා සමරසිංහගේ සාක්ෂි</u>

2019-2022 කාලය තුළ කාන්තා පොලිස් පරීක්ෂක සමරසිංහ කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්ත කර ඇත. වර්තමානයේ පවා ඇය කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සේවය කරයි. කොළඹ අපරාධ

කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන බාහිර ලේඛන රෙජිස්ටරය පවත්වාගෙන යාමට ද ඇය දායක වී ඇත. මෙම සාක්ෂිකරු P-62 ලෙස ඇය හඳුනා ගන්නා, නව පොතක ඇගේ අත් අකුරින් එම කොටස ලියා ඇති බව පිළිගෙන ඇත. අංක WP PK 7225 දරන වාහනයේ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන් විසින් සිදු කරන ලද ගමන් බිමන් සම්බන්ධ සටහන ඇය විසින් ඇගේ අත් අකුරින්, 2023-12-29 දින සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) කාර්යාලයෙන් යවන ලද ලෙස ව්‍යාජ ලෙස පෙන්වමින් ඇතුළත් කර ඇති බව ඇය පිළිගෙන ඇත. 2023-12-29 දින වැලිගම බලා පිටත්ව යන පොලිස් පරීක්ෂක ජයතිලකගේ කණ්ඩායමට අදාළ 439 පොලිස් පෝරමය, එම රෙජිස්ටරයේම 2023-12-30 දින සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) කාර්යාලය, කොළඹ අපරාධ කොට්ඨාසය වෙතින් යවන ලද ලෙස පෙන්වමින් ඇතුළත් කර ඇති බව මෙහිදී සටහන් කර ගත යුතුය. මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත්තේ මෙම සිදුවීමෙන් මාස 6-7 කට පමණ පසු නව පොතක් නැවත ලිවීම සිදු කර ඇති බවයි. ඒ වන විට එම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව ද ඇය තහවුරු කරයි.

මෙම සාක්ෂිකරු කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී (පරිපාලන) කාර්යාලයේ පවත්වාගෙන ගිය නිල ලේඛනය වෙනස් කිරීම සිදු කළේ එය කොළඹ අපරාධ කොට්ඨාසයෙහි ඝාතනයට ලක් වූ පොලිස් සැරයන් උපුල්ට අදාල ගෙවීම් සිදු කිරීම පිණිස යැයි සිතමින් බව ප්‍රකාශ කළද, ඒ වන විට සියලුම ගෙවීම් අනුමත කර ගෙවා තිබූ බව විමර්ශන කමිටුව සටහන් කරයි. එම කරුණ 2024-01-01 වන විටත් අවසන් වී තිබිණ . එබැවින්, එම පදනම මත මෙම ලේඛනය වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණි. උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල් වරයා විසින් මෙම කරුණ ඇගේ අවධානයට යොමු කළ විට, ඇගේ ස්ථාවරය වෙනස් කරමින් මෙම සාක්ෂිකරු පැවසුවේ පොලිස් සැරයන් උපුල්ට ලැබිය යුතු විශ්‍රාම වැටුපට එය බලපානු ඇතැයි විශ්වාස කරමින් ඇය එම වෙනස් කිරීම සිදු කළ බවයි. කාන්තා පොලිස් පරීක්ෂක සමරසිංහ, එය ඇය විසින් සිදු කරන ලද නීති විරෝධී ක්‍රියාවක් බව පිළිගනී. පසුව ඇය මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ප්‍රකාශ කළේ එම නීති විරෝධී උපදෙස්වලට අනුකූල වීම ප්‍රතික්ෂේප කළහොත් ස්ථානයෙන් පිටතට මාරු කිරීම වළක්වා ගැනීම සඳහා , පීඩනය මත එසේ කළ බවයි.

මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් අනෙකුත් සාක්ෂිකරුවන් තම කාර්යාලවල තබා ඇති බාහිර ලේඛන රෙජිස්ටර වෙනස් කළ බවට ප්‍රකාශ කළ අවස්ථා වලදී මෙන්, මෙම නඩුවේ සියලු තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුව ට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, විමර්ශන කමිටුව එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි පිළිගැනීමට තීරණය කරයි.

## 20) <u>කන්නන්ගර කෝරළළාගේ දෝන නෙල්කා ශ්‍යාමලී ජයතිලකගේ සාක්ෂි</u>

මෙම සාක්ෂිකාරිය පොලිස් මූලස්ථානයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයේ පොලිස් ත්‍යාග ගෙවීම් අංශය භාරව සිටියාය. ඇය යටතේ සේවය කළ නිලධාරීන් අට දෙනෙක් සිටියහ. පොලිස් ත්‍යාග ගෙවීම් කරන ක්‍රියාවලිය ඇය විසින් පැහැදිලි කර ඇත. P-7 හඳුනා ගනිමින්, හඳුනා නොගත් තුවක්කුකරුවෙකුගේ වෙඩි තැබීමකින් ඔහු මිය ගිය බවට වන පදනම මත පොලිස් සැරයන් 57421 උපුල්ට, ත්‍යාගයක් ලෙස 2024-01-01 දින රුපියල් මිලියන 1.5 ක ගෙවීමක් වග උත්තරකාර පොලිස්පතිවරයා විසින් අනුමත කර ඇති බව ඇය ප්‍රකාශ කර ඇත. 2024-01-01 දිනම ගෙවීම අවසන් කිරීමට පියවර ගත යුතු බව වගඋත්තරකාර පොලිස්පතිවරයා තම ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට දැනුම් දී ඇති බව ඇය සාක්ෂි දී ඇත. ඒ අනුව, ප්‍රධාන

ගණකාධිකාරීවරයාගේ උපදෙස් මත, ඇය පොලිස් සැරයන් උපුල්ගේ බිරිඳ වන M. L. K. L. කුමුදුනීගේ නම ලියා රුපියල් මිලියන 1.5 ක චෙක්පතක් ලබා දුන්නාය.

හරස් ප්‍රශ්න ඇසීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, නව වැටුප් ගෙවීම අනුමත කිරීමේ අවසාන බලය ඇත්තේ පොලිස්පතිවරයාට බව ඇය නැවත අවධාරණය කර ඇත.

වග උත්තරකාර පොලිස්පති වරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා මෙම සාක්ෂිකරුගේ විශ්වසනීයත්වයට දොස් තැබීමට උත්සාහ කළේ නැත. ඇය සිය සාක්ෂියේ සඳහන් කළේ ඇයගේ නිල තත්ත්වය තුළ ත්‍යාගය ගෙවීම සම්බන්ධයෙන් ඇයට කළ යුතු කොටස පමණි. ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත.

21) <u>පොලිස් පරීක්ෂක විජේතුංග මුදියන්සේලාගේ ශ්‍රියා බණ්ඩාර විජේතුංගගේ සාක්ෂිය.</u>

පොලිස් පරීක්ෂක ශ්‍රියා බණ්ඩාර විජේතුංග මහතා 2025-02-25 දින කොළඹ අපරාධ කොට්ඨාසයට සම්බන්ධ වී ඇති අතර එය මෙම වසරේ දිනයකි. කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්ත කාන්තා පොලිස් කොස්තාපල් 6754 ඉනෝකා මහත්මිය, 2024-07-07 සිට 2025-01-31 දක්වා කාලය තුළ ප්‍රසූත නිවාඩු මත සිටි බව විධිමත් ලෙස තහවුරු කිරීම සඳහා ඔහු විමර්ශන කමිටුව ඉදිරියට කැඳවන ලදී. වග උත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා හරස් ප්‍රශ්න කිරීමේදී මෙම සාක්ෂිකරුගෙන් කිසිදු ප්‍රශ්නයක් විමසා නොමැත. ඒ හා සමානව, වග උත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා (ඉහත සඳහන් කර ඇති පරිදි), කාන්තා පොලිස් කොස්තාපල් 6751 ඉනෝකාගේ සාක්ෂිය හබ කිරීමට උත්සාහ කර නොමැත. එබැවින්, විමර්ශන කමිටුව පොලිස් පරීක්ෂක ශ්‍රියා බණ්ඩාර විජේතුංග මහතා විසින් ලබා දුන් සාක්ෂි පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට තීරණය කරයි.

22) <u>ප්‍රධාන පොලිස් පරීක්ෂක විලියම් බ්‍රිට්ස් අසංක තුසිත කුමාරගේ සාක්ෂි.</u>

මෙම සාක්ෂිකරු විශේෂ විමර්ශන අංශයේ අංක 7 විමර්ශන ඒකකය භාර නිලධාරියා වේ. මෙම සාක්ෂිකරුට අනුව, මෙය පොලිස්පතිවරයා යටතේ සෘජුවම පවතින ඒකකයකි. 2023-12-31 දින කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්ත පොලිස් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදී තුවාල සිදුවූ, වැලිගම සිදු වූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමට වග උත්තරකාර පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා කිසිදු අවස්ථාවක කිසිදු නියෝගයක් ලබා දී නොමැති බව මෙම සාක්ෂිකරු තහවුරු කර ඇත.

විශේෂ විමර්ශන ඒකකය විසින් සිදු කර ඇති එකම විමර්ශනය වන්නේ වත්මන් වැඩබලන ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් නියෝග කරන ලදුව යොමු අංක Staff DIG/IG/Out/05/4033/2024 යටතේ සිදුකරන ලද පරීක්ෂණයකි.

හරස් ප්‍රශ්න ඇසීමේ දී, වග උත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් උගත් නීතිඥවරයා ඇසූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත්තේ රන්මුනි උවන්නෙ ඇන්ස්ලම් ද සිල්වා මහතාට එක් අවස්ථාවකදී විශේෂ විමර්ශන ඒකකයට පැමිණෙන ලෙස දැනුම් දී තිබුණද ඔහු ප්‍රකාශයක් ලබා දීමට පැමිණ නොමැති බවයි.

මෙම සාක්ෂිකරු හරස් ප්‍රශ්න කිරීමේදී පහත කරුණු ද තහවුරු කර ඇත: විශේෂ විමර්ශන ඒකකයේ ප්‍රධාන අරමුණ වන්නේ අවශ්‍ය විටෙක පරීක්ෂණ පැවැත්වීමෙන් පොලිස් නිලධාරීන්ගේ විනයට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම බව, විශේෂ විමර්ශන ඒකකය අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ කොටසක් නොවන බව; සහ විශේෂ විමර්ශන ඒකකය පොලිස්පතිවරයාගේ ඍජු අධීක්ෂණය යටතේ පවතින බව. හරස් ප්‍රශ්න කිරීමේදී තවදුරටත් පිළිතුරු දෙමින්, හඳුනාගත් පුද්ගලයෙකුගේ පැමිණිල්ලක් ලැබීමෙන් පසු වැඩබලන පොලිස්පතිවරයා 2024-10-01 දින මෙම විමර්ශනයට නියෝග කර ඇති බව, මෙම සාක්ෂිකරු තහවුරු කර ඇත. එම පෙත්සමේ සිදුවීම් පහක් අඩංගු බවත්, ඉන් එකක් “W15” හෝටලයට වෙඩි තැබීම බවත් මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇත.

වග උත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයාගේ ඉතා කෙටි හරස් ප්‍රශ්නවල කොටසක් වන ඉහත ප්‍රශ්න හැරුණු විට, වග උත්තරකාර පොලිස්පතිවරයාගේ නීතිඥවරයා විසින් ඔහුගේ සේවාදායකයාට පක්ෂව මතු කරන ලද කිසිවක් නොමැත. ඇත්ත වශයෙන්ම, මෙම සාක්ෂිකරු අසත්‍ය ප්‍රකාශ කරන බවට යෝජනා කරන කිසිදු යෝජනාවක් වග උත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් මෙම සාක්ෂිකරුට ඉදිරිපත් කර නොමැත. මෙම පරීක්ෂණය අතරතුර, පොලිස් සැරයන් 57241 උපුල් මිය ගොස් පොලිස් පරීක්ෂක මධුරංගට තුවාල සිදු කරමින් වැලිගම පැලැනේදී සිදු වූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට වග උත්තරකාර පොලිස්පතිවරයා උත්සාහ කළේ නැත. ඇත්ත වශයෙන්ම, වග උත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂි අතරතුර වෙනත් ඒකකයක් විසින් පරීක්ෂණයක් මෙහෙයවීමට නියෝගයක් නොකිරීම සාධාරණීකරණය කිරීමට ඉතා දැඩි උත්සාහයක් ගත්තේය. මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී වරයාගේ , වැලිගම සහකාර පොලිස් අධිකාරී වරයාගේ සහ වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක වරයාගේ අධීක්ෂණය යටතේ වැලිගම පොලිස් ස්ථානය විසින් පවත්වන ලද විමර්ශනය සාධාරණීකරණය කිරීමට ද ඔහු උත්සාහ කළේය. අනෙක් අතට, විමර්ශන කමිටුව විසින් කැඳවනු ලැබූ මෙම සාක්ෂිකරු විශේෂ විමර්ශන ඒකකයේ සිදු වූ සිදුවීමක් පිළිබඳව මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට පැමිණියේය. තවද, මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂි ඔහු විසින් නිල වශයෙන් ලබා දුන් සාක්ෂි ලෙස පමණක් ලබා දී ඇත. ඉහත තත්වයන් යටතේ, මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂි, සත්‍ය සාක්ෂි ලෙස පිළිගැනීමෙන් වැළකී සිටීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, මෙම සාක්ෂිකරු විසින් ලබා දුන් සාක්ෂි පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

වග උත්තරකාර පොලිස්පතිවරයා විසින් ලබා දුන් සාක්ෂි සහ මෙම විමර්ශන කමිටුව ඉදිරියේ වග උත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් කැඳවන ලද අනෙකුත් සාක්ෂිකරුවන් විසින් ලබා දුන් සාක්ෂි වෙත යොමු විය යුතු සුදුසු අවස්ථාව මෙය බව විමර්ශන කමිටුව සිතයි. උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් සාක්ෂි දීමට කැඳවනු ලදුව,විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් තවත් සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුගේ සාක්ෂි සම්බන්ධයෙන්, විමර්ශන කමිටුව, අනෙකුත් චෝදනා සම්බන්ධයෙන් සලකා බලන අවස්ථාවේදී (එනම්, චෝදනා පත්‍රයේ චෝදනා අංක 17-19 සහ 22-23) කටයුතු කරනු ඇත.

23) <u>වග උත්තරකාර පොලිස්පති තෙන්නකෝන් මුදියන්සේලාගේ වංශාලංකාර දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සාක්ෂි.</u>

වග උත්තරකාර පොලිස්පතිවරයා මූලික සාක්ෂි දෙමින්, මුලින්ම ශ්‍රී ලංකා පොලිසියේ ඔහුගේ වෘත්තීය ජීවිතය තුළ දැරූ විවිධ තනතුරු පිළිබඳව සඳහන් කර ඇත. ඔහු පරිවාස සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස ශ්‍රී ලංකා පොලිසියට සම්බන්ධ වූ දිනය, එනම් 1998-02-23 දින, ඊට ඇතුළත් වේ. ඉන්පසු ඔහු 2024-06-24 දිනැති නියෝගය මගින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පොලිස්පති කාර්යාලයේ කාර්යයන් ඉටු කිරීමෙන් ඔහුව වළක්වන තෙක්, ඔහු දැරූ විවිධ තනතුරු විස්තර කරයි. ඇත්ත වශයෙන්ම, ආරම්භයේදීම (පළමු දිනයේම, එනම් 2025-05-19 දින) විමර්ශන කමිටුව මෙම කරුණු පිළිගැනීම් ලෙස සටහන් කර ඇත.

ඉන්පසු වග උත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ සුදුසුකම් පැහැදිලි කර ඇත. ඒ අනුව, ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිතව කලා උපාධිධාරියෙකු ලෙස සමත් වී ඇති අතර කැලණිය විශ්ව විද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබා ඇත. ඊට අමතරව, රුසියාව, චීනය, දකුණු කොරියාව, ඉන්දියාව සහ තායිලන්තය වැනි රටවල පොලිසියේ ඔහුගේ රාජකාරි විෂය පථය සම්බන්ධයෙන් උසස් අධ්‍යාපනය ලබා ඇත. ඔහු මහා බ්‍රිතාන්‍යයේ ස්කොට්ලන්ඩ්යාඩ් හි අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් පුහුණුව ලබා ඇති පොලිස් නිලධාරියෙකි.

ඔහු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස උසස් කරන ලද වහාම, 2019-11-29 දින සිට ක්‍රියාත්මක වන පරිදි බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස පත් කරන ලදී. ඉන්පසුව, ඔහු 2023-11-29 දින වැඩබලන පොලිස්පති ලෙස පත් කරන ලදී. ඔහුගේ සාක්ෂි දීමේදී, ඔහු රට තුළ ඉහළ යන අපරාධ රළ මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති, ආරම්භ කර ඇති ,සහ ක්‍රියාත්මක කර ඇති විවිධ ක්‍රියාමාර්ග විස්තරාත්මකව පැහැදිලි කර ඇත. ඔහුගේ වෘත්තීය කාලය තුළ, ඔහු ගාල්ලේ සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙසත්; මාතර කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලෙසත්; ගාල්ල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලෙසත්; සහ පොලිස් අපරාධ බුද්ධි විශ්ලේෂණ සහ නිවාරණ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙසත් කටයුතු කර ඇත. මූලික සාක්ෂි දෙමින් ඔහු රට තුළ පවතින මත්ද්‍රව්‍ය බෙදා හැරීමේ ජාලවලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා ඔහු විසින් ගෙන ඇති පියවර සහ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති විස්තර කිරීමට කාලය ගෙන ඇත. නඳුන් චින්තක වික්‍රමරත්න (හෙවත් හරක් කටා) මැඩගස්කරයේ සිට ශ්‍රී ලංකාවට ගෙන ආ ආකාරය; රැඳවුම් භාරයේ සිටියදී හරක් කටා පැන යාමට ගත් උත්සාහයන් සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මගින් ඔහුගේ මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලයේ කොටසක් හෙළිදරව් කිරීම සඳහා කරන ලද පරීක්ෂණ සහ අදාළ කරුණු ද ඔහු විස්තරාත්මකව පැහැදිලි කර ඇත.

වග උත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ සාක්ෂියේදී පිළිගෙන ඇත්තේ 2023-12-29 වන දින උදෑසන ත්‍රස්ථ විමර්ශන කාර්යංශයෙහි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න අල්විස්, පොලිස් විශේෂ ඒකකයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා සහ වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී නෙවිල් සිල්වා සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡාවක් පැවැත්වූ බවයි. මෙම සාකච්ඡාවේදී කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත එය ලබා දීමට පෙර 'FNA' සටහන තැබූ බවත්, අත්සන් කර, දාතම යොදා R-2 ලේඛනය මත තම මුද්‍රාව තැබූ බවත් ඔහු පිළිගෙන ඇත. R-2 ලිපියට අමුණා ඇති ලැයිස්තුවේ සිටින පුද්ගලයින් 149 දෙනාගේ වැඩිදුර තොරතුරු සොයා ගැනීම සඳහා පරීක්ෂණ සිදු කරන ලෙස මෙම

සාකච්ඡාවේදී සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට උපදෙස් දුන් බව ඔහු ප්‍රකාශ කළේය. හරක් කටාට එරෙහිව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ක්‍රියාදාමය පිළිබඳව සැක මතු කළ බැවින්, විමර්ශනයේ මෙම කොටස සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත භාර දීමට තීරණය කළ බව වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත. මේ අනුව, ඔහුට අනුව, මෙම විමර්ශනය අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට නොව කොළඹ අපරාධ කොට්ඨාසයට පැවරීම සුදුසු යැයි ඔහු සිතුවේ ඒ නිසාය. හරක් කටාගේ මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය පිළිබඳ විමර්ශනය සිදු කළේ පොලිසියේ අංශයක් වූ අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව බව සත්‍යයකි. වග උත්තරකාර පොලිස්පතිවරයාට අනුව පවා අදාළ විදේශ රටෙන් හරක් කටා ගෙන ඒමට ගිය අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමකි. වසර එකහමාරකට වැඩි කාලයක් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තු පරිශ්‍රයේ හරක් කටා රඳවා තබා ගනිමින් හරක් කටාට එරෙහිව විමර්ශනය සිදු කළේ අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව බව ද ඔහු සාක්ෂි දී ඇත. 2023-11-30 දින වැඩබලන පොලිස්පතිවරයා ලෙස පත් කිරීමෙන් පසුව, හරක් කටා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විමර්ශනයේ ප්‍රගතිය සොයා බැලීමට ඔහු පියවර ගත්තේය.අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කාර්ය බහුල කාලසටහන් නිසා, මෙම විමර්ශනය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට වැඩි යමක් කළ නොහැකි බව අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ප්‍රසාද් රණසිංහ ඔහුට දන්වා තිබුණේ එවිටය. ත්‍රස්ථ විමර්ශන ඒකකයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න අල්විස් ,අදාළ දුරකථන විස්තර විශ්ලේෂණය කර, හරක් කටා සමඟ සම්බන්ධතා ඇති පුද්ගලයින් බවට සැක කරන පුද්ගලයින්ගේ ලැයිස්තුවක් සකස් කර ඇති බව ඔහු එම මූලාශ්‍රයෙන්ම දැනගෙන තිබුණි. R-2 ලිපියට අමුණා ඇති පුද්ගලයින් 149 දෙනෙකුගේ ලැයිස්තුව මෙයයි. මේ අනුව, අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අඛණ්ඩ විමර්ශනයෙන් R-2 ලිපියෙහි සඳහන් පුද්ගලයින්ට අදාළ කොටස ඔහු විසින් ඉවත් කර ,2023-12-29 දින කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වෙත පවරා ඇති බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. R-2 ලිපිය සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාසය විසින් නිශ්චිතවම කළ යුතු දේ පිළිබඳව ඔහු වාචික උපදෙස් ලබා දුන් බව ඔහුගේ ස්ථාවරයයි. මේ අනුව, 'FNA' අකුරු තුන ලිවීම හැරුණු විට, වග උත්තරකාර පොලිස්පතිවරයා ලබා දුන් බව කියන උපදෙස්, වාචික උපදෙස් වේ.

කෙසේ වෙතත්, වග උත්තරකාර පොලිස්පතිවරයා නිශ්චිතවම පිළිගෙන ඇත්තේ අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව පොලිස්පතිවරයාගේ ඍජු අධීක්ෂණය යටතේ පවතින බවයි. කොළඹ අපරාධ කොට්ඨාසය බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති යටතේ ඍජුවම පවතින බැවින් එය පොලිස්පතිවරයාගේ ඍජු අධීක්ෂණයට යටත් නොවන බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. ඔහුට අනුව ඒ අවස්ථාව වන විට අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවෙහි කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයෙකු පත් කර නොමැත. මෙය ඔහුගේම සාක්ෂි මගින් තේරුම් ගත හැකිය. ශ්‍රී ලංකා පොලිසියේ මෙම අධීක්ෂණ ව්‍යුහය, ඔහු විස්තරාත්මකව පැහැදිලි කර ඇත. වග උත්තරකාර පොලිස්පතිවරයා ද පිළිගෙන ඇත්තේ, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන් දෙසීයකට වඩා අඩු වුවද, අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් ගණන නිසැකවම නිලධාරීන් දහසකට වඩා වැඩි බවයි. කොළඹ අපරාධ කොට්ඨාසයට බලය ඇත්තේ බස්නාහිර පළාත තුළ පමණක් බව ඔහු සාක්ෂි දී ඇත.කොළඹ අපරාධ කොට්ඨාසය බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරයෙකු යටතට පත්වන බවට එය අනුකූල වේ. කෙසේ වෙතත්,අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට එහි බලය සම්බන්ධයෙන් එවැනි භූගෝලීය සීමාවක් නොමැත. එබැවින් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවට දිවයින පුරා බලයක් ඇති අතර එම නිසා, එයට රටේ ඕනෑම ප්‍රදේශයක පරීක්ෂණ පැවැත්විය හැකිය.

2023-12-29 දින පැවති සාකච්ඡාවේදී, R-2 ලිපියට අමුණා ඇති ලැයිස්තුවේ පුද්ගලයින් 149 දෙනෙකු සම්බන්ධයෙන් බුද්ධි තොරතුරු සැපයීම සහ වග උත්තරකාර පොලිස්පතිවරයා විසින් වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත පවරා ඇති විමර්ශනයට පහසුකම් සැලසීම සඳහා පොලිස් විශේෂ ඒකකයේ අධ්‍යක්ෂවරයා වූ ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා වෙත පවරා ඇති බව වග උත්තරකාර පොලිස්පතිවරයා සාක්ෂි දී ඇත.

තම පළාතේ සිට පොලිස් නිලධාරීන් කණ්ඩායමකට වෙනත් පළාතකට යාමට අවසර දීමේ බලය ඇත්තේ ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ට බව පිළිගන්නා අතරම, R-3 ලෙස සලකුණු කර ඇති පොලිස්පතිවරයාගේ අංක 2694 චක්‍රලේඛය, ඒ සඳහා මාර්ගෝපදේශ සපයා ඇති බව ඔහුගේ ස්ථාවරයයි.විමර්ශන කමිටුව ඉදිරියේ ඔහු මෙම චක්‍රලේඛය (R-3) හඳුනාගෙන ඇත. හදිසි අවස්ථාවකදී, R-3 චක්‍රලේඛයට අනුව අනුමැතිය ලබා දිය හැකි බලයලත් නිලධාරියාගේ වාචික අනුමැතිය ඇතිව ,අදාළ පොලිස් කණ්ඩායම්වලට තම අධිකරණ බලයෙන් පිටත ගමන් කිරීමට හැකි බව වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත. වැඩබලන පොලිස්පතිවරයා සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට මෙම පරීක්ෂණය සිදු කිරීමට R-2 ලිපිය මගින් උපදෙස් දී ඇති හෙයින්, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩ බලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට මාතර ප්‍රදේශයට කණ්ඩායම් යැවීමට බලය ලැබෙන බවට වග උත්තරකාර පොලිස්පතිවරයා ස්ථාවරයක් ගෙන ඇත . කෙසේ වෙතත්, වග උත්තරකාර පොලිස්පතිවරයා R-2 ලිපියෙහි 2023-12-29 දින ලියා ඇත්තේ 'FINA' ලෙස පමණි.

වග උත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂි දීමේදී විමර්ශන කමිටුව ඉදිරියේ ප්‍රකාශ කිරීමට උත්සාහ කර ඇත්තේ, අදාළ අවස්ථාවේදී, ඔහු බස්නාහිර පළාත භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පමණක් වූ බවත් බස්නාහිර පළාත භාර ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ඔහුගේ මූලික තනතුර දැරූ අතර වැඩබලන පොලිස්පතිවරයා ලෙස කටයුතු කළ බවත්ය.හරක් කටා සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විමර්ශනයෙන් (R-2) කුඩා කොටසක් භාර ගැනීමට සහ 2023-12-29 දින එම කාර්යය පමණක් කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩ බලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට වෙත පැවරීමට වැඩබලන පොලිස්පතිවරයා ලෙස තමාට බලය ඇති බවට ඔහු විසින්ම කරන ලද ප්‍රකාශයට, මෙය පටහැනි බව පෙනේ.

ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම විසින් සිදු කිරීමට නියමිත සංචාරය පිළිබඳව දකුණු පළාතේ පොලිස් අධිකාරිය දැනුවත් කිරීමට අදාළ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායම අසමත් වීම සාධාරණීකරණය කිරීමේ උත්සාහයක් ලෙස, වග උත්තරකාර පොලිස්පතිවරයා ගෙන ඇති ස්ථාවරය වන්නේ එම ප්‍රදේශයේ නිලධාරීන්ට හරක් කටා සහ ඔහුගේ මත්ද්‍රව්‍ය ජාලය සමඟ සම්බන්ධතා තිබීමේ හැකියාව හේතුවෙන් එය යුක්ති සහගත බවයි.

2023-12-30 දින කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායම විසින් සිදු කිරීමට නියමිත විමර්ශනයට එවැනි පූර්ව දැනුම්දීමක් මගින් අගතියක් ඇති විය හැකි බව ඔහුගේ ස්ථාවරයයි. ඔහු සිය සාක්ෂියේදී මෙම කරුණ විස්තරාත්මකව පැහැදිලි කර ඇත. ඒ සමඟම, 2023-12-30 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම වැලිගමට යාම මාතර පොලිස් බලධාරීන්ට දැනුම් නොදුන් පදනමක් තුළ ,2023-12-29 දින පොලිස් පරීක්ෂක ජයතිලකගේ කණ්ඩායම මාතරට ගමන් කිරීම මාතර පොලිස් බලධාරීන්ට දැනුම් දුන්නේ මන්දැයි පැහැදිලි කිරීම, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂ නෙවිල් ද සිල්වා විසින් කළ යුතු බව ඔහු ප්‍රකාශ කර ඇත.

විමර්ශන කමිටුව විසින් විමසීමේදී, වග උත්තරකාර පොලිස්පතිවරයා සාමාන්‍ය තත්වයන් යටතේ කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන්ට නිල ඇඳුම් ඇඳිය යුතු බව පිළිගෙන ඇත. රහසිගත මෙහෙයුම් වලදී පොලිස් කණ්ඩායම්වලට සිවිල් ඇඳුමින් ක්‍රියා කිරීමට අවසර දී ඇතත්, එවැනි අවස්ථාවන්හිදී පවා අවම වශයෙන් එක් නිලධාරියෙකු නිල ඇඳුමින් සිටිය යුතු බව පොලිස් චක්‍රලේඛවල අවධාරනය කර ඇති බව ඔහු පිළිගෙන ඇත. R-2 ලිපිය සම්බන්ධයෙන් ඔහු ලබා දුන් නියෝග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂවරයාට පැවරෙන බව ඔහුගේ ස්ථාවරයයි. 2023-12-29 දින තම කාර්යාලයේදී කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂවරයාට කිසිදු ආකාරයක නීති විරෝධී නියෝගයක් ලබා දුන් බව, වග උත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ සාක්ෂියේදී ප්‍රතික්ෂේප කර ඇත.

වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා රෝගී, වයෝවෘද්ධ නිලධාරියෙකු ලෙසත්, හෘද රෝගියෙකු ලෙසත්, බයිපාස් සැත්කමකට භාජනය වී කකුල් වල ගැටලුවක් ඇතිව ඇවිදීමේ අපහසුතාවයක් ඇති පුද්ගලයෙකු ලෙසත් විස්තර කර ඇත. වග උත්තරකාර පොලිස්පතිවරයාට අනුව, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා වැලිගම වැනි දුර ප්‍රදේශයක මෙහෙයුමක් කිරීමට තරම් ශාරීරිකව යෝග්‍ය පුද්ගලයෙකු නොවේ. 2023-12-30 දින වැලිගම බලා පිටත්ව ගිය කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන්ගේ කණ්ඩායමේ සංයුතිය පිළිබඳව ඔහු නොදැන සිටි බවත්, එම කණ්ඩායම වැලිගම බලා ගමන් කළ වාහනයේ අනන්‍යතාවය ඔහු නොදැන සිටි බවත් වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි (මෙය P-16.ට පටහැනිය; 439-පොලිස් පෝරමය).

2023-12-30 දින වැලිගමට ගිය ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ අවම වශයෙන් එක් නිලධාරියෙකු නිල ඇඳුමින් සැරසී නොසිටීම සම්බන්ධයෙන්, පහත සඳහන් ප්‍රශ්න සහ පිළිතුරු වලින් වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය පෙන්වනු ඇත.

ප්‍ර. පැහැදිලියි. චෝදනා පත්‍රයේ තිබෙන නිසා මේ ප්‍රශ්නය අහන්නේ. ඔබතුමා කොයි වෙලාවක කරි 30 වැනි දා කණ්ඩායමට " නිල ඇඳුම් වලින් යන්න එපා. සිවිල් ඇඳුම් වලින් යන්න*

උ. වගකිව යුතු නිලධාරියෙක් හැටියට කිසිසේත්ම නැහැ. අපේ උගත් විනිසුරුතුමා මතක් කළ -ඇත්ත වශයෙන්ම පොලිස්පති චක්‍රලේඛයක් තිබෙනවා, එවැනි team එකක් යන කොට අ කරමින් එක නිලධාරියෙක් හෝ uniform එකෙන් යන්න ඕනෑ කියලා. ඒවා අනුගමන කරන්න එපා කියලා මම කිසි වෙලාවක ඒ කණ්ඩායම් වලට කියලා නැහැ. ඒ සියලු වගකීම කණ්ඩායම් භාරව ගිය ප්‍රධාන නිලධාරියා විසින් භාරගත යුතුයි. එහෙම් ඇයි එහෙහි ගියේ නැත්තේ කියලා, මම කියලා නැහැ. යන්න එපා හෝ යන්න කියලා හෝ. එකෙම කියලා නැහැ.

වග උත්තරකාර පොලිස්පතිවරයා සිය සාක්ෂියේදී, අනුමැතිය ලබා දෙමින් 439 පොලිස් පෝරමය (P-16) අත්සන් කළ බව පිළිගෙන ඇති අතර, ඔහු 2023-12-29 දින බස්නාහිර පළාත භාර ජොෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස P-16 අත්සන් කළ බව ඔහුගේ නිශ්චිත ප්‍රකාශිත ස්ථාවරයයි.විමර්ශන කමිටුව මෙම ප්‍රශ්නය වග උත්තරකාර පොලිස්පතිවරයාගෙන් කිහිප වතාවක්ම අසා ඇත. එම ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී, වග උත්තරකාර පොලිස්පතිවරයා 2023-12-29 දින 439 පොලිස් පෝරමය (P-16) අත්සන් කළ බව නැවත නැවතත් තහවුරු කර ඇත. අනෙක් අතට, 2023-12-30 වන දින රාත්‍රී 8.30 ට වැලිගම බලා යාමට කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කාර්යාලයෙන් පිටත්ව යන විට ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රධාන පොලිස් පරීක්ෂක

ඇන්ස්ලම් ද සිල්වා විසින් තබන ලද සටහනේ සඳහන් කර ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා, වැලිගම බලා ගමන් කරන්නේ ආවරණ අනුමැතිය ඇතිව පමණක් බව ඔහුම මුලින්ම පිළිගත්තේය (පූර්ව අනුමැතියට යටත්ව).

හරක් කටාගේ අනුගාමිකයින් අත්අඩංගුවට ගැනීමට වැලිගමට ගිය කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායමේ නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදී ඇති බැවින්, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා, තමා සම්බන්ධ කර ගැනීමට උත්සාහ කරන බව, 2023-12-31 දින අලුයම 3.30 ට දුරකථන ඇමතුමක් මගින් පොලිස් විශේෂ ශාඛාවේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා මහතා තමාට දැනුම් දුන් බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. තුවාල ලැබූ එක් නිලධාරියෙකුගේ තත්ත්වය බරපතල බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා මහතා ද දන්වා තිබේ. ඔහුගේ නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නය සහ ඔහු විසින් සපයන ලද පිළිතුර පහත පරිදි නැවත ඉදිරිපත් කිරීම අදාළ වනු ඇත.

ප්‍ර . මහත්මයා ,ඒ වෙලාවේ ඔබතුමා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත සොයිසා මහත්මයාට ඒ නිලධාරීන් පිළිබඳව මොනවා හරි සොයා බලන්න කියලා කිව්වාද?

උ. ඔව්. WI5 කෝට්ලය ළඟ සිද්ධිය වෙලා තිබෙන බව එයා කියද්දී මම විශ්වාස කළා කෝට්ලයක් ළඟ මේ වාගේ සිද්ධියක් වෙලා නම් ස්ථිර වශයෙන්ම ඒ වාගේ දෙයක් වීමට එම නිලධාරින් ගිහිල්ලා එම හෝට්ලයේ මත් පැන් බොන්න ඇති කියලා, මත් පැන් බිලා කවුරු හරි එතැන හිටපු මිනිස්සුත් එක්ක කලහයක් ඇති කර ගන්න ඇති. ඒකේ ප්‍රතිඵලයක් වශයෙන් වෙඩි තැබීමත් කරලා ඇති, මුන් අපට කොළේ වහලා මේ කථාවක් කියනවාදෝ කියලා මට නිකම් හිතුණා, ඒ නිසා එකෙනෙහිම, ඔටෝමැටිකලි මට කියවිච්ච දේ තමයි මුන් බලාද සිටියේ කියලා බලන්න, වහාම කට්ටිය දම්මලා සොයන්න මුන් බිලාද කියලා කියන එක. මුන් බිලා ගිහිල්ල ඔතැන පිස්සු කෙළින්න ගිහිල්ලා ඕක වෙලාද කියලා මට ඉක්මනට බලලා කියන්න කියලා මම කථා කරලා කිව්වා.

කෙසේ වෙතත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා එවැනි ස්ථාවරයක් තහවුරු නොකළ බව පිළිගෙන තිබේ.

ඉන් අනතුරුව , වහාම වැලිගමට ගොස් සත්‍ය වශයෙන්ම කුමක් සිදුවූයේ දැයි සොයා බලා තොරතුරු තමන් වෙත වාර්තාකරන ලෙස වග උත්තරකාර පොලිස්පතිවරයා වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට දුරකථනයෙන් උපදෙස් දී ඇත.

වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා වැඩබලන පොලිස්පතිවරයාගේ උපදෙස් මත වැලිගම බලා යන බවට උදෑසන 5.30 ට සටහනක් ඇතුළත් කිරීමෙන් පසු කොළඹ අපරාධ කොට්ඨාසයෙහියෙන් පිටව ගිය බව ඔහුගේ ස්ථාවරයයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා වැලිගම බලා යන අතරතුර, ඔහු වග උත්තරකාර පොලිස්පතිවරයාට ඇමතුම් කිහිපයක් ලබා දී තත්වය දැනුම් දී ඇති අතර, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා මහතා විසින් දමන ලද පිටවීමේ සටහන පරීක්ෂා කල බවත් මෙම කණ්ඩායම නිල රාජකාරියේ යෙදීමට වැලිගම බලා ගොස් ඇති බවත් තහවුරු කර ඇත. අදාළ ප්‍රශ්න සහ පිළිතුරු පහතින් දක්වා තිබේ;

ප්‍ර . 30 වැනි දා පිටව ගිය කණ්ඩායම-ඒ තුමා හිටපු දෙපාර්තමේන්තුව නේ. 30-වැනි දා සම කණ්ඩායම පිටව යාම පිළිබඳව නිල outing එකක් පැහැදිලිව ලියලා තිබෙනවාද කියලා කියන්න කොරතුරු සටහන් පොත්? ඒක පැහැදිලි කරලා කියන්න?

උ . ඔව් ස්වාමීනි. 30 වෙනිදා ගිය කන්ඩායමට 31 වනදා අලුයම සිදුවූ සිද්ධියෙන් පසුව මට ඒක දැනුම් දුන්නාට පස්සේ මම වැඩ බලන අධ්‍යක්ෂවරයාට කිව්වා, "වහාම වැලිගම ප්‍රදේශයට ගිහිල්ලා වෙලා තිබෙන සිද්ධිය පිළිබඳව සොයා බලලා ඇත්තට මොකක්ද වෙලා තිබෙන්නේ කියලා මට කියන්න " කියලා. ඒ අනුව නෙවිල් සිල්වා මහත්මයා වැලිගම බලා යන්න කලින් ස්වාමීනි, කොළඹ අපරාධ කොට්ඨාසයට ගිහිල්ලා එතැන උසස් නිලධාරීන්ගේ ගමන් සටහන් පොත් පාන්දර 5.30ට විතර ඔහු බස්නාහිර පළාතෙන් පිටව යාමට කලින් මගේ උපදෙස් පරිදි යන්නේ කියලා ලිඛිත සටහනක් යොදලා තමයි ගිසින් තිබේ. ඒ වෙලා ඔහු එගත් සටහනක් යොදලා ඉවර වෙලා වැලිගම බලා යන අතරතුර අධිවේගී මාර්ගයේ ගමන් කරන අවස්ථාවේදී අවස්ථා ගණනවකදී මට මේ සිද්ධිය පිළිබඳව යථාවත් කරන්න, update කරන්න කථා කළ ස්වාමීනි.

ඒ වෙලාවේදී ඔහු පැවසූ එක් කරුණක් තමයි. මම ගිහින් පාන්දර 5.300 නිලධාරියෙක් ලවා ජ කොල්ලෝ යොදවලා ගිය out එක සම්බන්ධව මම පරික්ෂා කෙරුවා කියලා, පරික්ෂා කිරීමේදී ඒකේ කිසිම අඩුපාඩුවක් නැති වන ආකාරයට පො. ප. ඇන්සලම් ද සිල්වා විසින් out එකක් දාලා ගිහින් තිබෙන්නේ. ඒ නිසා official රාජකාරියකට ගිය බව තහවුරු වනවා කියලා මට ඒ කාරණාව ස. පො. නෙවිල් සිල්වා එදිනම පැවසුවා. මම ඒ නිසා ඒ සම්බන්ධව දැනුවත් වුණා, ස්වාමීනි.

වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා කරාපිටිය රෝහලේ පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කළ පුද්ගලයා සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, කණ්ඩායමේ සාමාජිකයින් මත්පැන් පානය කර නොමැති බව තමන් වෙත තහවුරු කර ඇති බවයි.

වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන් “W 15” හෝටලයේ ඉදිරි පස පරීක්ෂා කිරීමට උත්සාහ කළ අතර නාඳුනන පුද්ගලයෙකු විසින් කොළඹ අපරාධ කොට්ඨාසයෙහි කණ්ඩායමට වෙඩි තැබූ බව , අදාළ සියලුම නිලධාරීන්, එනම් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සහ මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ, විසින් තමාට දැනුම් දුන් බවයි. ඔහුගේ සාක්ෂියේ අදාළ කොටස පහත පරිදි වේ .

ප්‍ර . එකකොට ඔබතුමා දන්නවා, ඔබතුමාගේ පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදිලා තිබෙනවා?

උ . ස්වාමීනි. මම හිතන්නේ මගේ අතින් කොටසක් අතපසු වුණය. 3 විස්තරය මට කි කොහොමද කියන කාරණාව සම්බන්ධයෙන් මට සඳහන් කරන්න බැරුව ගියා, ඔබතුමා අවසරය ඉල්ලනවා ස්වාමීනි, ඒක නැවත වතාවක් කියන්න. මොකද, නිශාන්ත සොයි මහත්මයා ඉස්සර වෙලාම ඒක කියන කොට මේක කොහොම වුණා කියලාද මට කිව්වේ කිය කාරණාව සම්බන්ධයෙන්, ස්වාමීනි.

නිශාන්ත සොයිසා මහත්මයා මුලින්ම කිව්වේ කරා කරලා, කොළඹ අපරාධකොට්ඨාසයෙහි එසේ කට්ටිය මෙතැති යන කොට නාඳුනන පුද්ගලයෙක් ඔය " W15" එක අසල ඉඳලා ඔහු පරීක්ෂා

කරන්න උත්ස කරලා තිබෙනවා ඒ අය. ඒ වෙලාවේදී ඒ නාඳුනන පුද්ගලයා විසින් කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකේ නිලධාරිය වෙඩි තැබීමක් කරලා තිබෙනවා. සීසීඩී එකේ නිලධාරීන් ඔහුට ප්‍රතිප්‍රහාරයක් එල්ල = තිබෙනවා. ඒ අවස්ථාවේදී එතැනට පැමිණි මොබයිල් එක. වැලිගම පොලිසියේ, ඔවුන් වී කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකේ නිලධාරීන්ට වෙඩි තැවීමක් කරලා තිබෙනවා, ඒකෙන් තමයි මේ අය තුවාල තිබෙන්නේ. තවම investigation එක යනවා. ඉතින් මේක හරියට කායෙන් වුණයද කි කවම හොයනවා කියන කාරණාව පිළිබඳව දළ අදහසක් තමයි දුන්නේ. ඊට පසු අවස්ථා මට වැඩ බලන අධ්‍යක්ෂ නෙවිල් සිල්වා කථා කරලා ඒකම තව ටිකක් විස්තරාත්මකව පැල කළා, ඒක වුණේ එහෙමයි කියලා. ඊට පසුව අවස්ථාවක මට කථා කළා ජ්‍යෙෂ්ඨ අධිකාරි, මාතර, පණ්ඩුල වීරසිංහ මහත්මයා. ඔහු විසිනුත් කිව්වේ කථා කරහා, මේ මෙහෙමයි කියන එක. ඊට පස්සේ උදෑපන වුණාට පස්සේ, එළිය වැටුණාට පස්සේ DIG, දකුණු පළාත කථා කළා. ඔහුත් කිව්වේ මේ විධි යයි කියලා, මට සෑම කෙනෙකුම = මේ සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරීන්, පළමු වරට මේ සම්බන්ධයෙන් හිටපු ස්ථා ප්‍රකාශ කළ ආකාරයට මේ සිද්ධිය වුණා කියන කාරණාව තමයි ස්වාමීනි. මට දැනුම් දීම කලේ.

විමර්ශන කමිටුව විසින් විමසීමෙන් පසු, වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත්තේ, නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි තැබීමට ප්‍රතිචාර ලෙස ලෙස කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන් නාඳුනන තුවක්කුකරුවෙකුට වෙඩි තබන අවස්ථාවේ ,වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් වෙඩි තැබීමෙන්, කොළඹ අපරාධ කොට්ඨාසයෙහි නිලධාරීන් දෙදෙනෙකු තුවාල ලබා ඇති බව, වැලිගම බලධාරීන් 2023-12-31 දින මාර්තු මස උදෑසන වන විට තමාට දැනුම් දුන් බවයි. එය වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ගේ මූලික සාක්ෂියෙන් ලබාගත් පහත උපුටා ගැනීම මගින් පැහැදිලි වේ.

<u>පරීක්ෂණ කමිටුවෙන්</u>

ප්‍ර. ඒ කියන්නේ ඒ අවස්ථාව වන විට ?

උ. ඒ අවස්ථාව වන විට , එදා ස්වාමීනි.පලමු දිනයේදී .

ප්‍ර. 31 වනදා උදේ?

උ. 31 වැනිදා උදේ වෙන කොට.

ප්‍ර. 31 වැනිදා උදේ ඔය කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකේ දෙදෙනාට කුවාල වුණේ කාගේ වෙඩි පහරකින්ද Bun එක ගැන අවබෝධයක් තිබුණාද?

උ. මොබයිල් එකෙන් වෙඩි තියලා තමයි මේ ගොල්ලන්ට ඒ වෙලාවේ. අර an as වෙලාවෙඩි තිබ්බා. මේ ගොල්ලොත් ඒ ගොල්ලන්ට වෙඩි තිබ්බා. ඒ වෙලාවේ මේ සොල්ලන්ව හඳුනා ගන්න බැරුව වැලිගම පොලිසියේ ජීප් එකෙන් වෙඩි තිබ්බා, ඒකෙන් තමයි මැරිලා තිබෙන්නේ කියන එක තමයි කිව්වේ, ස්වාමීනි. මැරිලා හෝ අර දෙදෙනාට වෙඩි වැදුණේ.

ප්‍ර. ඒක ගැන අවබෝධයක් තිබුණා?

උ. ඔව්. තිබුණා.

ප්‍ර. එතකොට ඔබතුමා දන්නවා, වැලිගම පොලිස් කොට්ඨාසය අයිති වෙන්නේ මාතර

උ. ඔව්. එහෙමයි.

ප්‍ර. මාතර කොට්ඨාසය භාරව හිටියේ කවුද, ඒ වෙලාවේ?

උ. එවකට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයා තමයි එතැන කොට්ඨාසය භාර නිලධාරියා වශයෙන් කටයුතු කළේ.

ප්‍ර. එතකොට ඔබතුමා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් හැටියට පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් ඇහුවාද, මොකක්ද එතැන වෙලා තිබෙන්නේ කියලා?

උ. මම වීමසීමක් කළා.

ප්‍ර. එතකොට නෙවිල් සිල්වා මහත්මයා සහ නිශාන්ත සොයිසා මහත්මයා කියපු දේද, ඊට පරස්පර දෙයක්ද පණ්ඩුල කිව්වේ?

උ. පණ්ඩුල වීරසිංහ මහත්මයා තමයි මම දන්නා විධියට මේ අපරාධ ස්ථානය හෝ සිද්ධිය වෙච්ච ස්ථානයට පළමු වරටම ගිය ජ්‍යෙෂ්ඨම නිලධාරියා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයෙක් වශයෙන්. ඔහු සිද්දිය වෙච්ච ස්ථානය උදේ 6.00 වෙද්දී නරඹලා තිබෙනවා. 6.30 විතර වෙද්දී ඔහු ගිහින් තිබෙනවා, වැලිගම පොලීසියට. මට ඔහු ඒ අවස්ථාවේදී කෝල් එකක් දීලා කථා කරලා කිව්වා, ම ඇහුවා, ඇත්තටම කියන්න පණ්ඩුල, මේකේ වෙලා තිබෙන කථාව මොකක්ද කියලා මට ඇත්තටම කියන්න කියලා. එහිදී ඔහු මට සඳහන් කළේ. ඔහු ඒ අවස්ථාව වන විට කොළඹ අපරාධ කොට්ඨාසයේ සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරීන් එක්ක වැලිගම mamh nón fâm nh කරලා ඔවුන්ගෙන් වීමසීමක් කරලා තිබුණා. එතකොට ඇවිල්ලා මිනිසා අපට වෙඩි තිබ්බා, එතකොට අපි ඒ මිනිහාට වෙඩි තිබ්බා, එතකොට ඇවිල්ලා කරලා තිබුණා. ඒ ගොල්ලන් කියලා තිබුණා, කණ්ඩායමක් ඇවිල්ලා අර පැත්තට වෙඩි තිය කියා හිටියා. ඊට පස්සේ ඇවිල්ලා අපි වෙඩි තිබ්බා ඒ ගොල්ලන්ට කියන කථාව, ඒ ගොල්ලොත් කියලා තිබුණා. මුලිකවම ගත්තාම තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබීබෙ නැහැ කියන කථාව සනාථ කර ගන්න තරම් ප්‍රමාණවත් කරුණක් ඒ වෙද්දී හෙළිදරව් වෙලා තිබුණේ නැහැ. ස්වාමීනි. කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකේ නිලධාරීන් කියනවා, අර පැත්තේ ඉඳලා අපට වෙඩි තිබ්බා කියලා. එතකොට අපි ඒ ගොල්ලන්ට වෙඩි තිබ්බා කියලා කියනවා. මොබයිල් එකේ කට්ටිය කියනවා. අපි එතකොට ඇවිල්ලා වෙඩි තිය කියා හිටපු වාහනයට වෙඩි තිබ්බා කියලා. ඒ කථාව ඔක්කෝම සැසඳුණා. අපට කිසිම evidence එකක් තිබුණේ නැහැ. කවුරු හරි කියනවා නම් ඇවිල්ලා හැංගිලා ඉඳලා මිනිහෙක් අපට වෙඩි කියලා පැනලා ගියා කියලා ස්වාමීනි. අපි ඒක නැහැ කියලා තහවුරු කර ගන්නා තෙක්ම අපට ඒක බැහැර කරන්න බැහැ නේ, කවුරුත් කිව්වොත් එහෙම ඇවිල්ලා, මට මෙතැන ඉඳලා මිනිහෙක් වෙඩි තිබ්බා කිව්වොත්, පරීක්ෂණාත්මක දේවල් වලින් පසුව - එතැනත් මම ඉදිරියේදී කිය නම්, ස්වාමීනි. එහෙම පරස්පරයක් එන්න හේතුව මොකක් ද කියලා, අපට කවුරු හරි මිනිහෙක් හැංගිලා වෙඩි

තිබ්බා. ඒ හින්දායි මම වෙඩි තිබ්බේ ඒ මිනිහාට, එතකොට මට තව පැත්තකින් මිනිහෙක් වෙඩි තිබ්බා කියලා කිව්වාම, මේ වෙඩි තියපු එකයි අර පැත්තෙන් දෙවැනියට ආපු වෙඩි තියපු වාහනයේ කට්ටියයි ඔක්කෝම පිළිගන්නවා, එහෙම තමයි වුණේ කියලා. නැත්තේ, අර පැත්තේ ඉඳලා වෙඩි තියපු මිනිහා විතරයි ස්වාමීනි. ඒක ඇත්ත කථාවක්ද, බොරු කථාවක්ද, මොකක් ද කියන කාරණාව සම්බන්ධයෙන් ඔය වාතාවරණය තුළ කිසිම idea එකක් කාටවත් තිබුණේ නැහැ. ඉතින් පණ්ඩුල වීරසිංහ කිව්වෙත් කථා කරලා, ඔය කියන කථාව අනුව සර්, මේකයි වෙලා තිබෙන්නේ කියලා. මොකද, ඔහු ඇහෙන් දැකපු සාක්ෂිකාරයෙක් නොවෙයි නේ ස්වාමීනි, වුණේ මොකක් ද කියන එක සම්බන්ධයෙන් මෙන්න මෙහෙම තමයි වෙලා තිබෙන්නේ කියලා කිව්වේ. ඉතින් ඔහු දෙන අර්ථ නිරූපණය අනුව තමයි ස්වාමීනි. ඉහළ ඉහළ නිලධාරීන් හැම එක්කෙනෙකුම මට කථා කළාම කිව්වේ. පණ්ඩුල වීරසිංහ ගිහිල්ලා inquiry කරලා තිබෙන මේක තමයි තත්ත්වය කියලා.

ප්‍ර. එතකොට ඔබතුමා තහවුරු කර ගන්නාද scene of crime එකට, අපරාධ ස්ථානීය පරීක්ෂණයට ඔය කියන පණ්ඩුල මහත්මයා ගිහිල්ලා, observe කරලා, නිරීක්ෂණය කරලා ද ඔබතුමාට ඔය විස්තර කිව්වේ කියලා?

උ. ස්වාමීනි, ශ්‍රී ලංකා පොලිසියේ තිබෙන ක්‍රම වේදය අනුව ගිනි අවි පාවිච්චි කරලා වෙඩි තැබීමක් වුණොත් එහෙම ඒ ස්ථානයට SOCO නිලධාරින් කැඳවීම අත්‍යවශ්‍යයි. ගිනි අවි විතරක් නොවෙයි, කැපුම් කෙටුම් වුණත් කැඳවනවා, ස්වාමිනි. නමුත් firearms පාවිච්චි කළොත් ප්‍රනිවාර්යයෙන්ම ඒකට, ඒ scene එක විමර්ශනය සඳහා සඳ SOCO නිලධාරින් යනවා. SOCO නිලධාරින් ඉන්නේ ස්වාමීනි, කොට්ඨාසයක් භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යටතේ, ඔහුගේ පාලිස් අධිකාරි කාර්යාලය ඇතුළේමයි තිබෙන්නේ ඒ කාර්යාලය සහ විද්‍යාගාරයත්. ඒ අනුව ම පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් ඇහුවා. "SOCOලා සීන් එක සම්බන්ධයෙන් " කියලා. " ඔව් සර් ඒවා ඔක්කොම කරනවා " කියලා. ඒ අනුව මම තහවුරු කර ගත්තා. SOCO නිලධාරීන් ඇවිල්ලා අපරාධ ස්ථානය ආරක්ෂා කරලා, එහි විද්‍යාත්මකව සාක්ෂි එකතු කිරීමේ කටයුත්තට අත ගහලා තිබෙනවා කියන කාරණය. ඊට අමතරව ඔහු මට දැනුවත් කළා, මේ ස්ථානයේ CCTV පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම ඔහු විසින් කොට්ඨාස අපරාධ විමර්ශන අංශය, DCDB කියලා හඳුන් වන diviපොලිස් පරීක්ෂක on යටතේ තිබෙන separate unit එකක්. හැම diviපොලිස් පරීක්ෂක on එකකම තිබෙනවා DCDB කියලා Diviපොලිස් පරීක්ෂක onal Crime Investigation Bureau වශයෙන් හඳුන්වන එකක්, Directive Bureau. කොට්ඨාස අපරාධ වීම යන අංශය. ඒසේ OICට ඔහු responපොලිස් පරීක්ෂක bility එක පැවරුවා කියලා වටේ තිබෙන CCTV කැමරා සියල්ල බලන්න කියලා. ඒ වගකීම ඔහුට භාර දුන්නා කියලා කිව්වා. ඒ අනුව මම දැන ගත්තා, වැලිගම HOI විසින් මේ inquiry එක කළාට මේ inquiry එක supervise කරන්නේ. SSP පණ්ඩුල වීරසිංහ. මොකද ස්වාමීනි, පොලිසියේ තිබෙන වර්ගී කරණය අනුව මේ කේස් එක HQIට handle කරන්න බැහැ. මොකද, හේතුව පොලිසියේ තිබෙනවා අපරාධ බල අපරාධ කියලා වර්ගයක් තිබෙනවා. GCR grave crimes කියලා. එතකොට සාමාන්‍ය පොලිසියකදී නම් grave crime එකක් විභාග කරන්න ඕනෑ OIC stations. Grave crimes වර්ගී කරණය කරලා තිබෙන්නේ, සොරකමක් නම් මුදල් වටිනාකම් අනුව. රුපියල් 50,000ට වඩා අඩු ඒවා සුළු සොරකම්, රුපියල් 50,000 සිට 100,000 ඒවා grave crimes. ලක්ෂයට එහා පැත්තේ ඒවා D report. D report කියන්නේ ස්වාමීනි, reportable crimes කියලා. ඒ හැම crime එකක් සම්බන්ධව report එකක් පොලිස් මූලස්ථානයට එවන්න ඕනෑ. එතකොට D report කියන ඒවා ASP විසින් viපොලිස් පරීක්ෂක t කරලා, එතැන

බලලා, investigation එක handle කරන්න ඕනෑ ASP කෙනෙක් ඇවිල්ලා. ඒ වර්ගී කරණය අනුව මේක D report එකක්. වෙඩි තබලා පුද්ගලයකු මිය ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව මේකේ investigation officer වෙන්නේ දිස්ත්‍රික්කය භාර ASP ස්වාමීනි. මේ සිද්ධියේ බරපතළකම අනුව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා ගිහිල්ලා, උසස් නිලධාරීන් ගමන් සටහන් පොතේ වැලිගම පොලීසියේ, අංක 15 ක් යටතේ instructions දීලා තිබෙනවා මේ investigation කළ යුතු ආකාරය සම්බන්ධව. එතකොට Director ASP Diviපොලිස් පරීක්ෂක onගේ superviපොලිස් පරීක්ෂක on එක යටතේ ASP විසින් මෙහෙයවන inquiry එකක් diviපොලිස් පරීක්ෂක onal ස්වාධීන අංශ වන SOCO සහ DCE සම්බන්ධ වූ inquiry එකක් මේ ස්ථානයේ ආරම්භ වෙලා තිබුණා කියන කාරණාව 31 වැනි උදේ 10, 11 වෙන විට මට තහවුරු වෙලා තිබුණා, පණ්ඩුලගෙන් ලැබූ feedback එකත් එක්ක.

මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතාගේ උපදෙස් මත වැලිගම පොලිස් ස්ථානය විසින් ස්වාධීන පරීක්ෂණයක් පවත්වන බවට පොලිස්පතිවරයා සිය මූලික සාක්ෂි තුළ නිශ්චිතවම ප්‍රකාශ කර ඇත. පහත සඳහන් ආකාරයෙන් ඔහු සිය සෑහීමකට පත්වීම දක්වා ඇත.

ප්‍ර. ගොල්ලන් විසින් කරනවා කියලා කිව්වා. ප්‍රකාශ සටහන් කිරීම සහ අනෙක් කණ්ඩ කරුවේ. ඔතැන කණ්ඩායම් දෙකක් ඉන්නවා. එකක් කොළඹින් ගිය කණ්ඩායම. අනෙ 2.ප වැලිගම විසින් කරලා තිබෙනවා. එතකොට ඔබතුමා ඒ අවස්ථාවේදී වැඩ සෑහිමකට පත් වුණාද?

උ. මට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයා ඒ සිද්ධිය සම්බන්ධ කෙනෙක් නොවෙයි නේ. ඔහු මේකට කිසිම සම්බන්ධතාවත් නැහැ. ඒ නිසා ඔහුගේ අධීක්ෂණය යටතේ මේ විමර්ශනය කෙරෙනවා. එයාට ඉහළින් ඉන්න DIG කෙනෙක් සහ SDIG කෙනෙක් ඉන්නවා. එයා ඒ විමර්ශනය ස්වාධීනව කරනවාද කියලා සොයලා බලන්න, ඒ නිසා ඒ ව්‍යුහය යටතේ එතැන අකටයුත්තක් වෙන්නේ නැහැ කියන කාරණය සම්බන්ධයෙන් මට පූර්ණ විශ්වාසයක් තිබුණා.

ඊට අමතරව, වග උත්තරකාර පොලිස්පතිවරයා ද ප්‍රකාශ කර ඇත්තේ, මාතර සහ හම්බන්තොට නියෝජ්‍ය පොලිස්පති ධුරය දැරූ සරත් කුමාර ද අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා එහි සිටි බවයි. වැලිගම පොලිස් ස්ථානය විසින් සිදු කරන ලද විමර්ශනය, (වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක වරයා යටතේ ක්‍රියාත්මක වූ රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම විසින් සිදුකල වෙඩි තැබීමකින් කොළඹ අපරාධ කොට්ඨාසයෙහි සාමාජිකයින් දෙදෙනෙකු තුවාල ලැබූ සිද්ධිය සම්බන්ධයෙන්) ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීම පිණිස වෙනත් ඒකකයකට මාරු කිරීමේ අවශ්‍යතාවයක් පිළිබඳව කිසිදු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, ඔහු අවසන් වරට පොලිස්පති කාර්යාලයේ කාර්යයන් ඉටු කළ දිනය දක්වා, කිසිදු අවස්ථාවක තමා වෙත දැනුම් දී නොමැති බව ඔහු තවදුරටත් ප්‍රකාශ කර ඇත. 2024-06-24 දින ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝගය මගින් ඔහුට එසේ කිරීම තහනම් කරන තෙක් මෙය සිදු විය. එපමණක් නොව, එම විමර්ශනය වැලිගම පොලිස් ස්ථානයෙන් පිටතට ගෙන ස්වාධීන ඒකකයකට ලබා දිය යුතුව තිබුණේ මන්ද යන්නට හේතුවක් තමා නොදකින බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් දිනය වන විටත් ඔහුගේ ස්ථාවරය වූයේ , වැලිගම පොලිසියෙන් මෙම විමර්ශනය ඉවත් කර වෙනත් ඒකකයකට නොපැවරීම ගැන ඔහු සම්පූර්ණයෙන්ම සෑහීමකට පත්වන බවත්, ඒ පිළිබඳව පසුතැවිලි නොවන බවත්ය. ඉහත සඳහන් කරුණු සඳහා ඔහු ආරෝපණය කර ඇති හේතුව නම්, අපරාධ පරීක්ෂන දෙපාර්තමේතුව ඔහුගේ ඍජු අධීක්ෂණය යටතේ පවතින බැවින්, මෙම විමර්ශනය අපරාධ පරීක්ෂන දෙපාර්තමේතුවට

පැවරුයේ නම් චෝදනා එල්ල විය හැකි බවයි. පහත උපුටා දැක්වීමෙන් ඔහුගේ ස්ථාවරය අවබෝධ කොට ගත හැකිය.

ප්‍ර. දේශබන්දු මහත්මයා, ඔබතුමා දන්නවා පොලිස්පති චක්‍රලේඛයක් තිබෙනවා, යම් කොට්ඨාසයක යම් අපරාධයක් සිද්ධ වෙලා ඒක ගැන විමර්ශනයක් සිද්ධ වෙද්දී ඒ විමර්ශනය කෙළින්ම පොලිස්පතිට පුළුවන් අරගෙන ඔබතුමා යටතේ තිබෙන සුවිශේෂ අංශ, ඒ කියන්නේ. Colombo කොළඹ අපරාධකොට්ඨාසයෙහි , එහෙම නැත්නම් ප්‍රධාන පොලිස් පරීක්ෂක D එකට පවරන්න. ඒ චක්‍රලේඛය අනුව එහෙම පවරා දීම සිද්ධ කරන්නේ මොනවාගේ කරුණු සලකා බලලාද පොලිස්පති කෙනෙක්?

උ. ස්වාමීනි. මේ සිද්ධිය වුණේ දකුණු පළාතේ. දකුණු පළාතට ඉන්නවා වෙනම Senior DIG කෙනෙක්. දකුණු පළාතේ සිද්ධිය වූ මාතර සහ හම්බන්තොට ප්‍රදේශයට වෙනම DIG කෙනෙක් ඉන්නවා. මාතර කොට්ඨාසයට ඉන්නවා වෙනම ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයෙක්. මේ සිද්ධිය වෙන අවස්ථාවේදී ස්වාමීනි මම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිරට අමතරව වැඩ බලන පොලිස්පති ධූරයෙන් කටයුතු කළා ස්වාමීනි. ඒ වන විට ප්‍රධාන පොලිස් පරීක්ෂක D එකේ සෘජු අධීක්ෂණ නිලධාරියා මම, එනකොට මම කිව්වා Senior DIG කෙනෙක් ඒ වෙලාවේ සිටියේ නැහැ කියලා. Senior DIG කෙනෙක් ප්‍රධාන පොලිස් පරීක්ෂක D එක භාරව කවදාවක් ඉඳලා නැහැ. මේ ළඟදී තමයි 88. පොලිස් පරීක්ෂක U cam g . ප්‍රධාන පොලිස් පරීක්ෂක D අයික්ෂණ නිලධාරියා මම. ප්‍රධාන පොලිස් පරීක්ෂක D සහ පොලිස් පරීක්ෂක U කියන අංශ දෙකම භාරව හිටියේ මම, මගේ යටතේ තිබෙන කණ්ඩායමක් තමයි කොළඹ අපරාධකොට්ඨාසයෙහි කියන්නේ. ඒ කියන්නේ මට අයික්ෂණ වස කීමක් තිබෙන ආයතනයක්. DIG Colombo වට මම ඉන්නේ. එතකොට කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකෙන් ගිහිල්ලා සිද්ධ වෙච්ච සිද්ධියක් සම්බන්ධව මම කොළඹ අපරාධකොට්ඨාසයෙහි එකෙන් ටීම් එකක් දැම්මත්, එස් අයියු එකෙන් වීම් එකක් දැමීමත් දකුණු පළාත භාර Senior DIG යටතේ කෙරෙන විමර්ශනයට වැඩිය ඒක ස්වාධීනව වුණේ නැහැ. මම ඒක එත්තෙන් ගලවලා සීඅයිඩී එකට දාලා මේක යට ගැහුවා කියලා චෝදනාවක් මට අදත් ඒමේ හැකියාවක් තිබුණා, මම ඒ දේ කරලා තිබුණා නම්. ඒ නිසා මම අදත් සතුටු වෙනවා, මගේ සෘජු අධීක්ෂණය යටතේ තිබුණු අංශයකට දමන්නේ නැතිව මාතරින් කෙරුණ ඒ independent inquiry එක කරන්න ඉඩ දීම සම්බන්ධයෙන්. මම අදත් ඒ ගැන සෑහිමකට පත් වෙනවා. මොකද, මම ඒ වෙලාවේ බැරි වෙලාවක් මත ආලා තිබුණා නම්, සීඅයිඩී එකට හරි එස් අයියු එකට හරි මය නිලධාරීන් මොනවා කරි, මය නිලධාරීන් 3.8 වැනිදා ගිහිල්ලා මේක වුණේ මෙහෙම නොවෙයි නියන කථාවට අමතරව සීඅයිඩී එක මොකක්ද ස්වාමීනි මෙක් සොයාගෙන තිබෙන පරිවේෂණීය සාක්ෂිය, මහ ඔකොම නොවෙයි මෙහෙමියි වුණේ කියන්න. කිසිම දෙයක් සොයාගෙන නැහැ. මේ හුදු ප්‍රකාශ කයක් මත නේ ස්වාමීනි මේ කථාව ගොඩ නැගිලා තිබෙන්නේ. මේ ගොල්ලන් මුලින් හිටපු ස්ථාවරයට වඩා අද වෙන කොට ස්ථාවරය වෙනස් වෙලා තිබෙන්නේ මේ ගොල්ලන් සිසින් කියපු ප්‍රකාශ මත නේ. මොනවාද පරිවේෂණීය සාක්ෂි වලින් සොයාගෙන තිබෙන්නේ මේක වුණේ දැන් කියන කතාවට අනුව කියලා මම තරයේ විස්වාස කරනවා, නය වතාවක් එක කථාවක් කියලා තිබෙනවා, උසාවි දෙකක දිවුරුම් දිමකුත් ඇතුළත්ව දිවුරුම් ප්‍රකාශ සහ දිවුරුම් දීම් ඇතුළත්ව. මම ස්ථිරව ප්‍රකාශ කරනවා තව වැඩි දවසක් පන්න කලින් - ඒ දවස මට කියන්න බැහැ. මේ ගොල්ලන් ආයෙන් ප්‍රකාශ කරනවද, අපි දෙවැනි සැරේට කියපු ස්ථාවරයක් වැරදියි. වෙලා තිබෙන්නේ පළමුවැනි එක කියලා මොකද, දෙකරක් දිවුරුම් දිලා බොරු කියපු

මිනිසුන්ට තව වතාවක්, - මම ඒක කියපු දවසට මම නොතැන හිටියත්, පිරිතුමාට මම කොහොම හරි දුරකථනයෙන් කරි අමතලා කියන්නම්, මෙන්න තව කථාවක් කියලා තිබෙනවා කියලා

ඉන් අනතුරුව පසු කාලීනව වුවද , මාතර කොට්ඨාසයේ උසස් පොලිස් නිලධාරීන් එවැනි කිසිදු අවශ්‍යතාවයක් තම අවධානයට යොමු නොකළ බව වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත. මෙය පහත උපුටා දැක්වීමෙන් පිළිබිඹු වේ.

ප්‍ර. මට අතිශයින් වැදගත් වෙනවා. තව එක කරුණක් දැන් ඔබතුමා ජෙයෂ්ඨ පොලිස් අධිකාරිතුමා විමර්ශනයක් කරක යනවා කිව්වා. ඒ කරගෙන යන විමර්ශනය ගැන නියෝජය පොලිස්පති මාතර - හම්බන්තොට අපිතලා සිරිතුමා ඔහුයෙන් ඒක ගැන තොරතුරු වීම කලල්ල දැන ගත්තාද?

උ. ඔව්. සාමාන්‍යයෙන් දවසක උදේට පළාතක situation එක සම්බන්ධයෙන් ඒ පළාතේ Senior DIG මහත්මයා පොලිස් පතිට කථා කරන්න මන විනාඩි කිහිපයක්, සාමාන්‍යයෙන් උදේ හයට කලින්, ඒ කථා කරන අවස්ථාවේ පළාතේ වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් update කිරීමක් කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, මේ වැලියම එක සම්බන්ධයෙන් සතියක් විතර යනකම් මේ අක් තත්ත්වය මේකයි, මේකේ තත්ත්වය මේකයි කියලා, මොකද, පොලිස්පතිව දැනුවත් කිරීම ඒ පැත්තේ ඉන්න Senior DIG මහත්මයාගේ වගකීමක්. වැඩිමනත් වශයෙන් DIG මාතරට මාව අල්ඩෙට් කරන්න යමක් තිබුණොත් එයා Senior DIG කියනකම් ඉන්නේ නැහැ. එයාට කෝල් එකක් අරගෙන කීමේ හැකියාව තිබෙනවා. ඒ විධියට මේ කාල සීමාව ඇතුළත ඩී අයිරි මාතර සහ සීනියර් ඩීඅයිජී දකුණු පළාත විසින් අවස්ථා ගණනාවකදී මට කථා කරලා තිබෙනවා දිනපතාම ඒ කථා කරන අවස්ථා වල මම ඔවුන්ගෙන් මේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශන වල ප්‍රගතියත් විමසලා තිබෙනවා. මම එහෙම වීමසන්නේ නැතිව මේ විමර්ශන වල ප්‍රගතිය. ඔවුන් විසින් කියපු අවස්ථාත් තිබෙනවා. ඒ අවස්ථාවල මෙම විමර්ශන වල වර්තමානයේ පවතින තත්ත්වය පිළිබඳ ඔවුන් මාව යථාවත් කරලා තිබෙනවා.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා විසින් ගන්නා ලද/ ඔහුගෙන් ලැබුනු ඇමතුම් සම්බන්ධයෙන්, අදහස් දක්වමින් වගඋත්තරකාර පොලිස්පතිවරයා එම ඇමතුම්, ඒ අවස්ථාවේ පොලිස් විශේෂ ඒකක අධ්‍යක්ෂවරයා සහ පොලිස්පතිවරයා අතර හුවමාරු වූ ඇමතුම් ලෙස පිළිගෙන ඇත. එම ඇමතුම් සාමාන්‍ය රාජකාරි කටයුතුවලදී ලැබුණු ඇමතුම් බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. කෙසේ වෙතත්, 'W15" හෝටලය සම්බන්ධයෙන් තොරතුරු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටි බව ඔහු ප්‍රතික්ෂේප කර ඇත. මාතර මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේ සැකකරුවෙකු ලෙස තමා නම් කිරීමේ හැකියාවට බියෙන්, තම වගකීමෙන් ගැලවීම සඳහා ,ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා, ඒ සම්බන්ධයෙන් ව්‍යාජ සාක්ෂි ලබා දී ඇති බව ඔහුගේ ස්ථාවරයයි. වැලිගම පොලිස් ස්ථානය විසින් සිදු කරන ලද විමර්ශනයේ අඩුපාඩුවක් ඇති බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා තමාට දැනුම් දුන් බව ද ඔහු ප්‍රතික්ෂේප කරයි. කෙසේ වෙතත්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස උසස් කිරීමෙන් පසු, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිශාන්ත ද සොයිසා මාතර සහ හම්බන්තොට ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස පත් කිරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට නිර්දේශ කළේ තමන් බව වගඋත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන ඇත. මාතර සහ හම්බන්තොට ප්‍රදේශය භාර නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා ඉන් පසුව වත් මේ සම්බන්ධයෙන් ඔහුට වාර්තා ඉදිරිපත් නොකළ බව ඔහුගේ ස්ථාවරයයි.සාමාන්‍යයෙන්,වැලිගම

පොලිසිය විසින් වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ලේ යම් අඩුපාඩුවක් නිරීක්ෂණය කර ඇත්නම්, මාතර උසස් නිලධාරීන් ඒ සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා වගකිව යුතු බව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. එම නිසා, වෙඩි තැබීමේ සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරීන්ගේ යම් අඩුපාඩුවක් තිබේද යන්න පිළිබඳව පරීක්ෂණයක් පැවැත්වීමට පොලිස් මූලස්ථානයේ ඔහු යටතේ ඇති විශේෂ විමර්ශන ඒකකය යොමු කිරීම නුසුදුසු යැයි ඔහු සිතා ඇත.

වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර රථයේ වෙඩි තැබීමට ලක් වූ ස්ථානයේ සිට , ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේදී පොලිස් නිලධාරීන් විසින් ඔවුන් නතර කරන ස්ථානය දක්වා, අතර තුර කාලය තුළ කොළඹ අපරාධ කොට්ඨාස කණ්ඩායම සිටියේ කොහේද යන්න පිළිබදව පිළිබඳව වග උත්තරකාර පොලිස්පතිවරයා දැන නොසිටි බව පහත උපුටා දැක්වීමෙන් පෙනී යනු ඇත.

ප්‍ර: ඔබතුමා දන්න විධියට ඒ වෙද්දී ඔවුන්ව රෝහල්ගත කරන්න පියවර අරගෙන තිබුණාද නැද්ද?

උ: 3.30 ට නිශාන්ත සොයිසා මහත්තයා මට කථා කරන අවස්ථාවේදීත් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදිලා තුවාලයි, එක්කෙනෙකුට අසාධ්‍යයි කියන මූලික තොරතුර තමයි ලබා දුන්නේ. රෝහල් ගත කිරීමක් හෝ ඔවුන් දැන් සිටින ස්ථානයක් පිළිබඳ දැනුම් දුන්නේ නැහැ. එවැනි දෙයක් කිව්වාට පස්සේ මට අනෙක් පැත්ත හැරිලා නිදා ගන්න පුළුවන්කමක් නැහැ, ස්වාමීනි. මේ සිද්ධිය සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු දැනගෙන අවශ්‍ය උපදෙස් දීම මගේ වගකීම, ස්වාමීනි. ඊට පස්සේ මම ඔහුටත්, කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂටත්, ඊට පස්සේ එවකට ප්‍රදේශය භාරව සිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ටත් මම අවස්ථා ගණනාවකදී කරුණා කාරණා විමසුවා. ඒ පසු අවස්ථාවකදී මට දැන ගන්න ලැබුණා, මේ නිලධාරීන් වෙඩි වැදීමෙන් පස්සේ ඉමදූව පිවිසුම අසලට ආපු අවස්ථාවේ එතැනදී රඳවා ගත්තා. එතැනදී වැලිගම HQI ගේ මැදිහත් වීම මත '1990 සුව සැරිය' ගිලන් රථයකින් මේ අය කරාපිටිය රෝහලට ප්‍රතිකාර සඳහා රැගෙන ගියා කියන කාරණාව දැන ගත්තා. ඒ හැරෙන්න මේ අය රෝහලට ගෙන යන අතරතුර, ඊට පස්සේ ඉමදූව මුර පොළේ ගිහිල්ලා හිර වෙලා ඉන්න අතරතුර මට ඒ අය සමඟ කිසිම communication එකක් තිබ්බෙන් නැහැ. මම ඒ සිද්ධිය සම්බන්ධයෙන් දන්නෙත් නැහැ. මෙහි සාක්ෂි ලියැවුණු ආකාරයට 3.42, 3.43 විතර වෙන කොට ඉමදූව මුර පොළෙන් මේ අය පිටත් කරලා යවලා තිබ්බා, කරාපිටිය රෝහල කරා. මට මේ සිද්ධිය සම්බන්ධයෙන් පළමු වරට දැනුවත් වුණේ පැය 3.30ට. ඒ කියන්නේ මට දැනුම් දීම වෙලා විනාඩි 10කින් විතර ගත වෙද්දී ඔවුන් කරාපිටියට ගෙනිහිල්ලා. ඒ නිසා ඔවුන්ව රෝහල් ගතකරන ආකාරය සම්බන්ධයෙන් හෝ රෝහල් ගත කළ යුතු ස්ථානය සම්බන්ධයෙන් කිසිම කෙනෙකු මගෙන් උපදෙස් පැතුවෙත් නැහැ. මම ඒ අයට උපදෙස් දීලාත් නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඉමදූව හයිවේ එන්ට්‍රන්ස් එකට ඔය CCD එකේ කණ්ඩායම ආවා කියලා මහත්මයා දැන ගත්තේ කීයට විතරද?

උ: එදා පාන්දර 3.30 න් පසු අවස්ථාවක, ස්වාමීනි. ඒ කියන්නේ, නිශාන්ත සොයිසා මහත්මයා විසින් මුලින් මට දැනුම් දුන්නාට පස්සේ නැවත නැවත ඒ අයත් කථා කරනවා, මම ඒ අයත් සමඟ යථාවත් වන අවස්ථාවකදී, මට හරියටම ඒ වෙලාව කියන්න බැහැ. නමුත්, අවස්ථාවකදී,-

ප්‍ර: පැයක් විතර වාගේ ඇතුළත?

උ: පැයකට වඩා අඩු කාලයක් ඇතුළත වෙන්නත් පුළුවන්. මේ ගොල්ලන් Imaduwa exit එකේ තියාගෙන ඉන්නවා, නැහැ ප්‍රශ්නයක් නැහැ සර්. මේ ගොල්ලන්ව මෙතැනින් සුව සැරියෙන් අරගෙන ගිහිල්ලා තිබෙනවා කියන කථාවන් කවුරු හරි කථා කරලා කිව්වා.

මෙම සිද්ධිය ස්වාධීන විමර්ශන ඒකකයක් මගින් විමර්ශනය කිරීමට පියවර ගැනීමට අපොහොසත් වීම පිළිබඳ චෝදනාව සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා ගත් ස්ථාවරය පෙන්වීමට පහත උපුටා ගැනීම ද අදාළ වේ.

ප්‍ර: ඔබතුමා පැහිමකට පත් වුණාද පණ්ඩුල වීරසිංහ මහත්මයා අපරාධ ස්ථානය පිළිබඳ කරන විමර්ශනය පිළිබඳව?

උ: ඔව්, සාමාන්‍යයෙන් රටේ වෙන තැනක ඔය වාගේ සිද්ධියක් වුණොත් කරන විධියටම කිසි අඩුපාඩුවක් නැතිව විමර්ශනයක් කරලා තිබෙනවා, ස්වාමිනි.

ප්‍ර: ඒ වාගේ ඒ පොලිස් කණ්ඩායම් අධීක්ෂණය කරන ඉහළ පොලිස් නිලධාරින්ගෙනුත් අධීක්ෂණය හරියට වෙනවාද කියලා ඔබතුමා බැලුවාද?

උ: බැලුවා. මම කලිනුත් පැහැදිලි කළා, ස්වාමීනි.

ප්‍ර: ඒක අතිශය වැදගත්, අධීක්ෂණය කියන කොටස විමර්ශනය කරන ගරු විනිසුරුතුමාට?

උ: එයාව supervise කරනවා නේ, DIG.-

ප්‍ර: ඔබතුමා දන්නවා, කොළඹ අපරාධ කොට්ඨාසයේ ඍජු අධීක්ෂණය කරන්නේ කොළඹ දිසාව භාර DIG බව?

උ: ඔව්

ප්‍ර: ඔහු විසින් මේ කණ්ඩායම් ගැන සිද්ධ වෙච්ච සිද්ධිය ගැන අධීක්ෂණය පසුව හෝ අධීක්ෂණය සිදු කිරීම ගැන ඔබතුමා සොයා බැලුවාද?

උ: ස්වාමීනි. මේ සිද්ධිය 31 වැනි දා අලුයම වුණාට පස්සේ නිල වශයෙන් HQI වැලිගම විසින් දුරකථන පණිවුඩයක් ඒවා තිබෙනවා, කොළඹ CCD එකට. ඒ කියන්නේ සිද්ධිය වෙච්ච ප්‍රදේශයේ පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින් සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරින් කොළඹ අපරාධ

කොට්ඨාසයේ නේ. ඒ කොට්ඨාසයට officially inform කරලා තිබෙනවා සිද්ධිය සම්බන්ධයෙන් telephone message එකකින්. ඒ message එකේ පිටපතක් DIG Colombo විසින් ගෙන්වා ගෙන තිබෙනවා, ඔහුගේ කාර්යාලයට. ඊට පස්සේ ඔහු ඒ message එක සම්බන්ධයෙන් දුරකථනයෙන් මට කථා කරලා කිව්වා. වැලිගම HQI inform කරලා තිබෙනවා, මේ සිද්ධියට සම්බන්ධ වෙච්ච නිලධාරීන් සිටි පරණ ස්ථාවරය අනුව, පාර්ශව තුනක් සම්බන්ධ වුණාය කියනවා, නාඳුනන කණ්ඩායමක් වෙඩි තැබුවා, තවම ඒ සම්බන්ධයෙන් අනාවරණය වෙලා නැහැ. ඊට පස්සේ මොබයිල් එකෙන් වෙඩි තියලා තමයි මේ නිලධාරියා තුවාල වුණේ කියන ඒ යථා තත්ත්වය සම්බන්ධව ඒ පරණ ස්ථාවරයට අනුව කටයුතු මේ අය මෙහෙම ප්‍රකාශ කරනවා කියලා කෙටි පණිවුඩයක් දැනුම් දීලා තිබුණා ඒ පණිවුඩය අනුව මේ වෙඩි තැබීම ඇත්ත වශයෙන්ම කවුරුන් විසින් කළාද, ඒක වුණේ කොහොමද කියන කාරණාව සම්බන්ධව විමර්ශනයක් ඒ වනකොටත් මාතර SSPගේ මාර්ගයෙන් ආරම්භ වෙලා තිබුණු නිසා ඒ විමර්ශන වල අවසානයේ නිගමන වලට එළඹෙන තාක්කල් මේකට වග කිව යුත්තේ CCD නිලධාරින් ද, මේකට වග කියන්න ඕනැ වැලිගම නිලධාරීන්ද, මේ දෙගොල්ලන්ම නැතිව පාතාලයේ කණ්ඩායමක් ඇත්තටම ඇවිල්ලා වෙඩි තියල වෙච්ච කාරණාවක් ද කියලා අවසන් අදියරේ තීරණයකට එන්න බැරි නිසා කිසිම විමර්ශනයක් කොළඹ CCD නිලධාරීන්ට විරුද්ධව ආරම්භ කරන්න කටයුතු කළේ නැහැ, ස්වාමීනි.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඒ වාගේම වැලිගම පොලිසියේ නිලධාරීන්ට හෝ මාතර කොට්ඨාසය භාර නිලධාරීන්ට ඒ වෙද්දි මොකවත්ම action එකක්,-

උ: නැහැ. ස්වාමීනි.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා තමාට ලැබී ඇති සහ තමන් විසින් යවා ඇති ලිපි පිළිගෙන ඇත. මාතර-හම්බන්තොට භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් ඔහුට ඉදිරිපත් කරන ලද වාර්තාවක් මත පදනම්ව, ඔහුගේ ලිපියේ අඩංගු කරුණු ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ බව ඔහුගේ ස්ථාවරයයි. මෙම වෙඩි තැබීමේ සිද්ධියට සම්බන්ධ කිසිදු නිලධාරියෙකුට එරෙහිව තමන් කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව ඔහු පිළිගෙන ඇති අතර, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යවන ලද ලිපියේ අන්තර්ගතයේ වගකීම ඔහු භාරගෙන ඇත.

එම සිද්ධිය සැබවින්ම වෙනස් ආකාරයකින් සිදුවී ඇති බව තහවුරු කර ගැනීමට ඔහුට අද්භූත බලයක් නොතිබූ බව ඔහුගේ ස්ථාවරයයි. ඒ සම්බන්ධයෙන් අසන ලද අදාළ ප්‍රශ්නයට ඔහු දුන් දීර්ඝ පිළිතුරෙන් පහත කොටස මෙසේ නැවත ඉදිරිපත් කළ හැකිය:

එබඳු තත්ත්වයක් තුළ ඒ ගිය මිනිස්සු කිසි කෙනෙක් ඇවිල්ලා එදා කියලා තිබුණේ නැහැ. අපි පොලිස් ජීප් එක කියලා දැක දැකත්, අපි පොලිස්පති යවපු වැඩකටනේ ආවේ. ඒ හින්දා අපි ඇදලා ආවා කියලා, එහෙම කවුරුවත් කියලා තිබුණේ නැහැ. ස්වාමීනි. ඒ වාතාවරණය තුළ තිබ්බිච්ච තත්ත්වයත් එක්ක පමයි ස්වාමීනි. ඒ වාර්තාව සපයලා තිබෙන්නේ. ඒක පොලිස්පති වෙත ආවාට

පසුව මට දිවැස් නැහැනේ. ස්වාමීනි ඒක එහෙම නොවෙයි කියලා දැන ගන්න, මම පදනම් කරගන්නේ නිලධාරීන් එවපු වාර්තා, ස්වාමීනි. ඒ වාර්තාව අනුව තමයි ස්වාමීනි. ජාතික පොලිස් කොමිෂන් සභාවට යැව්වේ ඒ වාර්තාව. එහෙම නැතුව ජාතික පොලිස් කොමිෂන් සභාවට බොරු කියලා, අසත්‍ය කරුණු කියා පාලා, සංගන්න, බේරන්න අවශ්‍යතාවකට නොවෙයි. මම කවුරුවත් එවෙලේ එව්වේ.

මෙම පිළිතුර දීමත් සමඟම වැලිගම පොලිස් ස්ථානය විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් කරන ලද විමර්ශනය ප්‍රමාණවත් බව ඔහු නැවතත් පවසා තිබේ. මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දෙන අවස්ථාවේදී පවා වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙය තමාගේ මතය බව තහවුරු කර ඇත. අදාළ ප්‍රශ්නය සහ පිළිතුර පහත පරිදි වේ:

ප්‍ර: අතිශය වැදගත් කොටසක් clear කරගෙනම යන්න ඕනෑ. පොලිස්පතිතුමාට සෘජු බලයක් තිබෙනවානේ, CID එකට සමහර විමර්ශන කොට්ඨාසයෙන් ගලවා භාර දෙන්න. පොලිස්පති චක්‍ර ලේඛනයක් ඒකට තිබෙනවානේ. පොලිස් නියෝගයක් තිබෙනවා. ඒ පොලිස් චක්‍ර ලේඛන සහ නියෝග අනුව ඔබට කෙටියෙන් ඕනෑ නම් කියන්න පුළුවන්, පොලිස්පතිතුමා කෙළින්ම මැදිහත් වෙලා යම් කිසි කොට්ඨාසයක තිබෙන, එක්කෝ පොලිස් ස්ථානයක තිබෙන ඉන්වෙස්ටිගේෂන් එකක් ගලවා අරගෙන සීඅයිඩී එකට දෙන අවස්ථා, පැහැදිලි කරන්න. මේ උතුම් වූ විනිසුරුතුමන්ලාට ?

උ: එතැනදී බලන්න ඕනෑ, යම් කිසි සිද්ධියක් වෙලා තිබෙනවා නම්, ඒ පොලිසියේ මිනිස්සුන්ගේ involvement එකක් තිබෙනවා නම්. ඒ සිද්ධියට; ඒ හින්දා ඒ පොලිසියෙන් විමර්ශනය කළොත් එහෙම, ඒ පොලීසියේ මිනිස්සු ඒකට පක්ෂග්‍රාහිව ඒ මිනිස්සු බේරෙන්න වැඩ කරයි කියලා පෙනෙනවා නම්. එතැනින් ගලවා ඉවත් කරලා CID එකට හෝ නැත්නම් වෙන Unit එකකට හෝ දමන්න පුළුවන්. එහෙම නැත්නම් සමහර වෙලාවට ඒ පැත්තේ මිනිස්සු පෙළපාලියක්, උද්ඝෝෂණයක්, පිකටිං එකක් කළොත්, මේ පොලිසිය විශ්වාස නැහැ අපට; මේ ගොල්ලන් තමයි මේක කළේ, මේක විශ්වාස නැහැ කියලා, එහෙම නැත්නම් නිලධාරීන්ට විරුද්ධව කිව්වොත්, මෙයා මේකට සම්බන්ධයි කියලා, පොලිස්පතිවරයාට පුළුවන් ඒක දමන්න.

ඊට පසුව ජාතික පුවත්පත්වල, රූපවාහිනී වල කියනවා, කථා කරලා වෙන්න, මේක මෙහෙම වුණේ කියලා. එතකොට දමන්න පුළුවන්, පොලිස්පතිවරයාට. එහෙම නැත්නම් ජාතික වශයෙන් සුවිශේෂී වැදගත්කමක් තිබෙනවා නම්, රටට බලපාන, ලොකු sensitive එකක් තිබෙනවා නම් පොලිස්පතිවරයාට අභිමතයක් තිබෙනවා, රයිට්, මෙතැනින් කරන්න එපා inquiry එක, දමන්න CID එකට කියලා.

මට නම් මේ සිද්ධිය සම්බන්ධයෙන් එබඳු category එකකට වැටෙනවා කියලා කිසිම ආකාරයේ වැටහීමක් තිබුණේ නැහැ. අදටත් මම එහෙම විශ්වාස කරන්නෙත් නැහැ. ඒ නිසා එහෙන් කරපු inquiry එක ප්‍රමාණවත් කියලා - ජාතික ජන බලවේගයේ රජයක් එනකම් ඉඳලා අපි ලියන්නේ කියන නිර්නාමික පෙත්සමකට මේ Inquiry එක ආරම්භ වෙලා තිබෙන බව ස්වාමීනි, මගේ ප්‍රකාශය ගත් දවසේ බන්ධනාගාරයේදී මම දැන ගත්තා. එතැනදීම මම දැන ගත්තා, මොකද මේ යන පාර, මොකක්ද අවශ්‍යතාව කියලා. එතකොට ජාතික ජන බලවේගයේ රජයක් එනකන්ම

ඉදලා තිබෙනවා ඉවසා ගෙන කවුරු හරි කෙනෙක් ඒ තිබෙන තොරතුරු ටික දෙන්න. ඒ කියන්නේ වෙන රජයක් යටතේ දෙන්න ඉදලා නැහැ. ඒ තොරතුරු, ජාතික ජන බලවේගයේ රජයක් එනකම්ම ඉදලා තිබෙනවා, ඉවසාගෙන, මොකද, හේතුව වෙන රජයක් යටතේ ඒ තොරතුරු දීලා එයා සෑහීමකට පත් වෙලා නැහැ. ඉතින් එතැනින්ම තේරෙනවා. ස්වාමීනි අපි ඉන්නකොට ඒක ලැබුණේ නැහැ කියන එක. අපිට දීලා නැහැ ඒ තොරතුරු කවුරුවත්.

වෑන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) නිලධාරීන් වැලිගම රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදුනු නිලධාරීන්ට තමන්ව හඳුන්වා දීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙමින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) කණ්ඩායම වැලිගම රාත්‍රී ජංගම මුර සංචාරයේ නිලධාරීන්ට තමන් හඳුන්වා දිය යුතුව තිබූ බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා ද අදහස් දක්වා ඇත. ඒ අවස්ථාවේ දී CCD හි KDH වෑන් රථය ඉදිරිපිට ඔවුන්ගේ Land Cruiser පොලිස් ජීප් රථය නැවැත්වූයේ වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය බව වෑන් රථයේ සිටි CCD කණ්ඩාම විසින් හඳුනා ගැනීමට අපොහොසත් වීම යන කරුණ පිළිගත නොහැකි බව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මතය විය. වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ නිලධාරීන්ගෙන් මිදී එම ස්ථානයෙන් වේගයෙන් පලා ගිය CCD කණ්ඩායම් සාමාජිකයින්ගේ ක්‍රියාව වගඋත්තරකාර පොලිස්පතිවරයා ද හෙළා දැක ඇති බවට මෙමගින් පැහැදිලි වේ. මේ සම්බන්ධයෙන් අදාළ උපුටා ගැනීම පහතින් ඉදිරිපත් කෙරේ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: අර මහත්මයා කිව්වා වාගේ ඇන්සලම් ද සිල්වා මහත්මයාගේ කණ්ඩායම වැලිගම ජංගම මුර සංචාරයේ නිලධාරීන්ට කථා කරලා නැහැ?

උ: ස්වාමීනි, වෙඩි තැබීම වුණාට පස්සෙත් කථා කරලා නැහැනේ. වෙඩි වැදීගෙන මේ ගොල්ලන් ඇවිල්ලා තිබෙනවා නේ ස්වාමීනි. මම කියන්නේ, වෙඩි වැදුණාට පස්සේ සාමාන්‍යයෙන් අපි කවුරු වුණත් අපිත් එක්ක ගිය කණ්ඩායමක ගිය මිනිහෙකුට වෙඩි වැදුණා නම්, මේ මිනිහා මැරෙයිද කියන ප්‍රශ්නය උඩ, වෙඩි වැදුණාට පස්සේ ස්වාමීනි, නිකම් අත පය සීරිලා තිබෙන්නේ නැහැ නේ. අඩු ගණනේ අපට මේ සාක්ෂි වලින් හෙළිදරව් වුණේ. අර මනුස්සයා ඇඳගෙන හිටපු ජැකට් එකවත් මේ ගොල්ලන් ගලවලා බැලුවේ නැහැ කියලා නේ, මේ ඉමදුවේදී අර 1990 න් ඇවිල්ලා බලනකල්. නමුත්, ඒ අස්සේ කියනවා කථා කරලා, අඳුරු තැනකට දාලා ගහගෙන ආපු නොම්මර තහඩු ගලවල අයින් කරලා, වාහනයේ original සවි කෙරුවා කියලා. ඒ ගොල්ලන් එහෙම කරලා තිබෙනවා නම් ස්වාමීනි, ඒ කටයුත්තටත් විනාඩි කිසිපයක් ගතවෙන්න ඇති නේ, අඩු ගණන් විනාඩි 5ක්, 10ක්වත් ගත වෙන්න ඇති නේ. එතකොට මේ ගොල්ලන්ට තමන් එක්ක ආසු මිනිහාට වෙඩි වැදිලා තිබුණා නම්, ඉස්පිරිතාලයට ඇතුල් කිරීම තමයි ඊළඟට තිබෙන ප්‍රමුඛතම රාජකාරිය කියලා වැටහීමක් තිබුණා නම් ඊට වඩා ටිකක් ඉක්මන් කරගන්න තිබුණා ඔය කටයුත්ත.

ප්‍ර: දැන් මහත්මයාගේ මතය අනුව ඔය CCD එකේ කණ්ඩායමට වැලිගම ජංගම මුර සංචාරයේ යෙදුණු නිලධාරීන්ට කථා කරලා උදවු ගන්න තිබුණා?

උ: මම කියන්නේ. සිද්ධියට පෙර කෙසේ වෙතත්, සිද්ධියක් වුණා නේ ස්වාමීනි. ඊට පසුව හෝ ඔවුන්ට තිබුණා කථා කරන්න. මම දන්නේ නැහැ ස්වාමීනි, කොතෙක් දුරට ප්‍රායෝගිකද කියලා මේ වාහනය පොලිස් වාහනයක් කියලා අපි හඳුනා ගත්තේ නැහැ කියන කථාව. ඔබතුමා ඉතාම හොඳින් බුද්ධිමත්ව ප්‍රශ්න කිහිපයක් ඇනුවා සාක්ෂිකාරයින්ගෙන්, ඔය වාහනය යන කොට පාර දෙපැත්තේ හිටපු මිනිස්සු ප්‍රතිචාර දක්වන්නේ කොහොමද කියලා. එතකොට මේ සාක්ෂිකාරයෝ කථා කරලා කිව්වා, සමහර මිනිස්සු දුවනවා කියලා, සමහර මිනිස්සු හැංගෙනවා කියලා. එහෙම එකක් තිබුණාම, මේ ජීප් එක මෙතැනට ආවා නම්, එතැන තිබුණු ආලෝක තත්ත්වයක් එක්ක මේක නිල් පාට පොලිස් කියලා ගහලා තිබුණු ජීප් එකක් කියලා අර මිනිස්සු කිව්වා නම්, ඕක දැක්කේ නැතුවයි අපි ගියේ කියලා කියන කථාව කොයි තරම් දුරට ඔබතුමා සැලකිල්ලට ගන්නවාද කියලා මම දන්නේ නැහැ ස්වාමීනි. එහෙම දැක්කා නම්, ඒ වාහනයෙන් වෙඩි තියන කොට එයා දැනගන්න ඕනෑ පොලිසියෙනුයි මේ වෙඩි තියන්නේ කියලා. පොලිසියෙනුයි මේ වෙඩි තියන්නේ කියලා දැනගත්තාට පස්සේ එයාලා කළ යුතුව තිබුණේ ඒ මොහොතේ හරි වාහනය නතර කරලා, වෙඩි තැබීම නතර කරපුවාම බැහැලා ඇවිල්ලා, වෙඩි තියන්න එපා. අපි පොලිසියේ නිලධාරින්, කරුණා කර මේක ඇතුළේ ඉන්න මිනිස්සුන්ට වෙඩි වැදිලා, මේ මිනිස්සු ඉස්පිරිතාලේ ගෙනියන්න උදවු කරන්න කියලා කියන එක. එහෙම දැක දැකත් මේ ඉමඳුව වාගේ තැනකට එනකල් ආපු එක අනුව මම හිතන්නේ නැහැ. ඒ ගොල්ලන් බුද්ධිමත් ක්‍රියා මාර්ගයක් අරගෙන තිබෙනවා කියලා. සාමාන්‍ය දැනීමට අනුව එහෙම කරපු එක හොඳයි කියලා මට හිතෙන්නේ නැහැ.

ප්‍ර: දැන් වැලිගම පොලිසියෙන් ජංගම මුර සංචාරයෙන් එතැනට ඇවිල්ලා තිබෙන බව සත්‍යයි?

උ: ඔව්, දැන් එය සනාථ වෙලා තිබෙනවා නේ ස්වාමිනි. ඒ නිලධාරීන් ප්‍රකාශයක් දීලා තිබෙනවා නේ.

ප්‍ර: මහත්මයා එතැන සිටියේ නැති බව මම දන්නවා. මහත්මයාගේ මතය අනුව ඒ ගොල්ලන් uniform එකෙන් හිටපු බවත් සත්‍යයක්?

උ: ඒ අය සහ හමුදාවේ නිලධාරීන් ඔක්කොම uniform ඇඳලා තිබෙන්නේ.

ප්‍ර: හැබැයි, හමුදා නිලධාරින් බැස්සේ නැහැ. 'පොලිස්' කියා mark කරපු ජීප් එකක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍යයෙන් පොලිස් කියලා පින්තාරු කර තිබුණු ජීප් රථයක්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්තයා කියන්නේ, ඒ තත්ත්වය යටතේ ඔය CCD එකේ කට්ටිය අනිවාර්යයෙන්ම ඔය වැලිගම පොලිසියෙන්, එහෙම නැත්නම් මොකක්හරි පොලිස් ස්ථානයකින්, ජංගම මුර සංචාරය කියන්නේ මොකක්ද කියන එක අමුතුවෙන් ඒ ගොල්ලන්ට පැහැදිලි කළ යුතු දෙයක් නොවෙයි නේ. ඒ ගොල්ලන් පොලිසියේ සේවය කරන අය නේ. මේ පොලිසියේ ජංගම මුර සංචාරයේ යෙදෙන ජිප් එකක් තමයි ඔතැනට ආවේ කියන එක දැනගත යුතුව තිබුණා?

උ: මගේ පුද්ගලික අදහස අනුව නම් එහෙම දැනගන්න තිබුණා. මගේ පුද්ගලික අදහස ඔබතුමාගේ දැන ගැනීම සඳහා විතරයි කියන්නේ. ඔය දෙපාර්ශ්වයම ටිකක් ඉවසිලිවන්තව ක්‍රියා කළා නම් වෙඩි තියාගත්ත එකත් වළක්වාගන්න තිබුණා කියලා මම හිතනවා ස්වාමීනි. ඒකෙන් මම අදහස් කරන්නේ, අපේ නීතිඥ මහත්මයා හරස් ප්‍රශ්න වලදී ඒක ඇහුවා. ජංගම මුර සංචාරය ඔය ස්ථානයට ආපු අවස්ථාවේදී කරපු වෙඩි තැබීමක්; CCD නිලධාරීන් වෙඩි තැබීම නතර වෙලා තිබුණා කියලා මේ සාක්ෂි වලින් කියැවුණා. ඒ කියන්නේ නවත්වලා තිබුණු CCD වාහනයේ ඉඳලා කරපු වෙඩි තැබීම නතර වුණු අවස්ථාවේ තමයි වැලිගම පොලිසියේ ජීප් එක ඇවිල්ලා තිබෙන්නේ. ඒ වෙලාවේ ඇවිල්ලා මඟ හරස් කරලා නැවැත්තුවා කියලා කිව්වා, වාහනය. ඒ වෙලාවේ මේ ගොල්ලන්ගේ චෝදනාව තමයි මේ ආපු වාහනය හඳුනා ගන්න බැරි වුණා කියන එක. එතකොට මේ නිල ඇඳුමෙන් ආපු එක නිලධාරියෙක් බැහැලා වාහනය පැත්තට පොඩ්ඩක් ආවා කියලා කියනවා. ඒ වෙලාවේ මේ ගොල්ලන්ට තිබුණා කියලා මම විශ්වාස කරනවා, මේ වාහනයෙන් ඔතැනින් එක පාර පැනලා යන එක නවත්වා ගන්න, ඊට වඩා ඒ ගොල්ලන් ගාව තිබුණු තුවක්කු බලය හරි strength එක හරි පාවිච්චි කරලා ඊට වඩා effective විධියට වැඩ කරන්න තිබුණා. එකකොට ඒ පැත්තෙන් ඒ ගොල්ලන්ගේ වගකීමකුත් මම දකිනවා.

ප්‍ර: ඒ කියන්නේ වැලිගම mobile එක?

උ: එහෙමයි. වැලිගම mobile එකත් මීට වඩා, ඒ සාජන් මහත්මයෙක් නේ in-charge විධියට ඇවිල්ලා හිටියේ. සමහර විට එතැන ටිකක් experience තිබෙන IP කෙනෙක්, SI කෙනෙක් වාගේ හිටියා නම් ඒ වෙලාවේ, සමහර විට ඊට වඩා හොඳට ඒක handle කරන්න තිබුණා කියලා මම හිතනවා ඔච්චර දුර දිග යන්නේ නැතුව. ඊළඟට, CCD එකේ නිලධාරීන් ඒ වෙලාවේ ක්‍රියා කරපු ආකාරය, දුර දිග බලන්නේ නැතිව ගත්ත ක්‍රියා මාර්ගය නිසා තමයි දෙවැනි වෙඩි තැබීමක් දක්වා මේක දුර දිග ගිහින් තිබෙන්නේ. ඒ දෙවැනි වෙඩි තැබීම නිසා තමයි මේ නිලධාරීන් දෙදෙනා මැරිලා තිබෙන්නේ, එතකොට මාතර මහේස්ත්‍රාත්තුමාගේ මරණ පරීක්ෂණයේදී එතුමා නිගමනයකට ඇවිල්ලා තිබෙනවා පුද්ගලික ආරක්ෂාවේ අයිතිය යටතේයි මේ ගොල්ලන් වෙඩි තැබුවේ කියලා හමුදා නිලධාරියා ඔක්කොම එතැනින් නිදහස් කර තිබෙනවා, අපි ඒ සම්බන්ධයෙන් කථා කරන්න කැමැති නැහැ. නමුත්, මෙතැනදී අනාවරණය වෙච්ච කරුණු අනුව තමන්ව පසු කර පළා යන වාහනයකට වෙඩි තබා තිබෙනවා ඒ පිරිස. ඒ වෙඩි තැබීමෙන් තමයි මේ පුද්ගලයින් මිය ගිහින් තිබෙන්නේ සහ තුවාල ලබා තිබෙන්නේ කියලා අපි සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී ඔබතුමාගේ අවධානයට යොමු කළා. කෙසේ වුණත් ඒක අදාළ නැහැ මෙතැනට, මම කියන්නේ මේ නිලධාරීන් කණ්ඩායම් දෙක වගකීමෙන් යුතුව ක්‍රියා කළ යුතුව තිබුණා. ඒකෙන් මම පොඩ්ඩක්වත් කියන්නේ නැහැ, පළවෙනියට වුනා කියන සිද්ධිය, ඒ කියන්නේ CCD එකේ නිලධාරීන් හෝටලය දෙසට වෙඩි තැබීමක්, ඒ වාගේම හෝටලය පැත්තේ ඉඳලා මේ ගොල්ලන්ට වෙඩි තැබුවා කියන කථාවත්, ඒ දෙකට යටත්ව මම කථා කරන්නේ නැහැ. ඒවා ඔක්කොම ඇත්තට කොහොම වුණාද කියන කාරණාව සනාථ කරගන්නත් එක්ක මම මේ කථාව කියන්නේ.

ප්‍ර: දැන් මහත්මයා කියන්නේ, CCD එකේ අය වැලිගම පොලිස් ජීප් එක දැක්කේ නැහැ එතැනින් යන කොට කියන එක පිළිගන්න බැහැ කියලා?

උ: මට නම් ස්වාමීනි. ප්‍රායෝගික තත්ත්වයත් එක්ක පිළිගන්න බැහැ. ඇන්සලම් ද සිල්වාට දෝංකාරය නිසා කන් දෙකට අත් දෙක තියාගෙන පහත් වුණා කියන එක මට විශ්වාස කරන්න පුළුවන්, මොකද, ඔහුගේ වයස සහ ඔහුගේ රෝගී තත්ත්වයත් එක්ක. නමුත්, රියදුරා වාහනය එළවන්න ඕනෑ ඉස්සරහා බලාගෙන, ස්වාමීනි. මොකද, එයාට බැහැ නේ ඔළුව අස්සේ හංගාගෙන යන්න. එතකොට එයා ඒක දැකිය හැකිව තිබුණා. ඇන්සලම් ද සිල්වා ලෙඩෙක් කියන එක මම කලිනුත් ප්‍රකාශ කළා, මිනිහාට shock එකක් එන්න ඇති වෙඩි තියද්දි ඇති වෙච්ච කම්පනයත් එක්ක, මිනිහා කන් දෙකට අත් දෙක තියාගෙන පහත් වුණා ය කියන එක. සාමාන්‍යයෙන් මෙහෙම මෙහෙම වෙඩි කියනවා නම් කවුරු හරි ඇවිල්ලා, එතැන ඉන්න බැහැනේ ස්වාමීනි. ඒ හේතුව නිසා අපට ඒ කථාව පිළිගන්න පුළුවන් ස්වාමීනි. නමුත්, රියදුරා සහ ඉස්සරහා අසුනේ හිටපු අනෙක් නිලධාරියා ඒක නොදැක ගියා කියලා කියන කාරණාව මට නම් පිළිගන්න බැහැ ස්වාමීනි. ඒ වෙලාවේ ඒක කොහොම වුණාද කියලා ඒ ගොල්ලන් කියන කථාව. නමුත්. සාමාන්‍ය පුද්ගලයෙක් වශයෙන් මට පුද්ගලිකව නම් හිතන්නේ නැහැ එහෙම නොදැක ඉන්න ඉඩ තිබුණා කියලා. මොකද, පොලිස් කියන වාහනය ගිනි පෙට්ටියක් වාගේ එකක් නොවෙයි නේ ස්වාමීනි. අර කිව්වා වාගේ පොඩි ළමයෙක් වුණත් හඳුනන වාහනයක් නේ ස්වාමීනි.

ප්‍ර: ඕක තමයි සාමාන්‍ය තත්ත්වය යටතේ ඕනෑම පොලිස් නිලධාරියෙකුගේ මතය, ඔය සිද්ධිය සම්බන්ධයෙන්. මේ වැලිගම පොලිසියේ ජීප් එක දැක්කේ නැහැ කියන එක සම්බන්ධයෙන්?

උ: බහුතරයක් මිනිස්සුන්ගේ අදහසක් වෙයි ස්වාමීනි ඒක. අනුන්ගේ අදහසක් මට කියන්න බැහැ ස්වාමීනි.

ප්‍ර: මහත්මයා කිව්වා වාගේ ඒක ප්‍රායෝගිකව වෙන්න අමාරුයි නේ?

උ: මම හිතනවා ස්වාමීනි.

ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම 2023-12-30 දින W15 හෝටලය ඉදිරිපිට නිල රාජකාරී කටයුත්තක නිරත වූ බව දැනටත් තමන් දරන මතය බව වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් නැවතත් නැවතත් ප්‍රකාශ කරන ලදී. තවද, 2023-12-29 දින පොලිස් මූලස්ථානයේදී තමන් වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාසයේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත ලබා දුන් නියෝගය ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්සලම් ද සිල්වා විසින් තම කණ්ඩායම මෙහෙයවූ බව ද වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. මෙය පහත උපුටා දැක්වීමෙන් පිළිබිඹු වේ:

ප්‍ර: ඔබතුමා සාක්ෂි දෙමින් සිටියේ මෙම සිද්ධියට පාදක වන W15 හෝටලය ඉස්සරහට ගිය පොලිස් කණ්ඩායම් දෙක ගැන. ඔබතුමාගේ නිරීක්ෂණය අනුව 2023.12.30 දින ඇන්සලම් සිල්වා මහත්මයාගේ නායකත්වයෙන් කොළඹ අපරාධ කොට්ඨාසයේ කණ්ඩායම නිත්‍යානුකූල කාර්යයකට ගියා කියලා ඔබතුමා නිරීක්ෂණය කරනවාද?

උ: ඔව් මම නිරීක්ෂණය කරනවා. ඔවුන් පිට වීමට පෙර යොදලා ගිහින් තිබුණු පිට වීමේ සටහන් අනුව, මා විසින් 2023.12.29 වෙනි දින උදේ පොලිස් මූලස්ථානයේදී කොළඹ අපරාධ

කොට්ඨාසයේ වැඩ බලන අධ්‍යක්ෂකට මා විසින් දීපු නියෝගයට අනුකූලව ඒ ලැයිස්තුවේ සඳහන් පුද්ගලයි අත්අඩංගුවට ගන්න යනවා කියලා යොදලා තිබෙන පිට වීමේ සටහන් එක්ක, ශ්‍රී ලංකා පොලිසියට අයිති වාහනයකින් යාම සඳහා අයදුම්පතක් යොදලා ඒකට පූර්ව අනුමැතිය ගත්තා කියලා සටහන් යොදලා යාම සම්බන්ධව ඔවුන් නීත්‍යානුකූල රාජකාරියට ගියේ කියලා මම පිළිගන්නවා.

වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් කිසිදු වරදක් සිදු නොකළ බවත්, ඔවුන් තම නිල රාජකාරිවල පමණක් නිරත වූ කණ්ඩායමක් බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා, විමර්ශනයේදී සාක්ෂි ලබා දෙන අතරතුර පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර සහ හමුදා සැරයන් රුවිරංග යන අයගේ සාක්ෂි අභියෝගයට ලක් කිරීමට උත්සාහ නොකිරීම මගින් මෙය සනාථ වේ. වැලිගම වෙඩි තැබීමේ සිද්ධියේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් දෙදෙනා තුවාල ලැබූ ආකාරය සම්බන්ධයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්සලම් ද සිල්වා ප්‍රමුඛ කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලබා දුන් මූලික තොරතුරු/විස්තරය මත වගඋත්තරකාර පොලිස්පතිවරයා තවමත් විශ්වාසය තබන බව ඔහුගේ ස්ථාවරයයි. ඒ පදනම මත ඔහු මෙම කමිටුවට පෙන්වා දීමට උත්සාහ කර ඇත්තේ සැක කටයුතු නාඳුනන තුවක්කුකරුගෙන් එල්ල වූ බවට අනුමාන කළ හැකි හිස් පතරොම් පෙට්ටි තිබූ බවයි. මාතර SOCO නිලධාරීන්ට එම ස්ථානයේ හිස් පතොරම් කිහිපයක් හමු වූ බව ඔහුගේ ස්ථාවරයයි. CCD හිටපු පොලිස් පරීක්ෂක මධුරංග විසින් පතොරම් 09 ක් වෙඩි තබා ඇති බැවින්, ඉතිරි පතොරම් භාවිතා කරමින් වෙඩි තබා ඇත්තේ සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් විය යුතු බව ඔහු ප්‍රකාශ කර ඇත. මාතර SOCO නිලධාරීන් ඔවුන්ගේ විමර්ශනයේදී කිසිදු නීති විරෝධී ක්‍රියාවක නිරත වී නොමැති බව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරයයි.

වැලිගම පොලිස් විමර්ශකයින් ඔවුන්ගේ විමර්ශනයේදී අදාළ CCTV දර්ශන කිසිවක් සොයා නොගැනීම පිළිබඳව තමා සෑහීමකට පත්වන බව අපරාධය සිදු වූ ස්ථානය වටා ඇති CCTV දර්ශන සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය යි.

වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාසයෙහි PS උපුල් වෙත ත්‍යාග මුදල අනුමත කිරීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා දුන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ එම කණ්ඩායම තම රාජකාරී සීමාව තුල කටයුතු කර ඇති බවට ඔහු සෑහීමකට පත් වන බවයි; ඔහු බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස සහ වැඩබලන පොලිස්පතිවරයා ලෙස අනුමැතිය ලබා දෙමින් P-7 අත්සන් කිරීමට පෙර මෙම කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක නිරත වී නොතිබුණි. P-2 සිට P-7 දක්වා සලකුණු කර ඇති ලේඛන කමිටුව ඉදිරියේ ඔහුට පෙන්වූ පසු ඔහු ඒවා හඳුනාගෙන පිළිගෙන ඇත. පොලිස් ත්‍යාග අරමුදලෙන් මෙම ත්‍යාගය ගෙවීම සඳහා ඔහුගේ අනුමැතිය නිර්දේශ කිරීමේදී/ලබා දීමේදී ඒ පිළිබඳ සැක කිරීමට ඔහුට කිසිදු හේතුවක් නොතිබූ බව ඔහුගේ ස්ථාවරයයි.

මේ සම්බන්ධයෙන් කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් ඔහුට ලබා දුන් තොරතුරු අනුව ඔහු ක්‍රියා කළ බව ඔහුගේ ස්ථාවරයයි. ඔහුගේ සාක්ෂියෙන් ලබාගත් පහත උපුටා දැක්වීමෙන් මෙය පිළිබිඹු වේ:

උ: උපුල් නිලධාරියා මිය ගිය අවස්ථාවේ සිට වැඩ බලන අධ්‍යක්ෂකත් එක්ක මට ඒ සම්බන්ධව communication එක තිබුණා. ඒ වාගේම උසස් නිලධාරීන්, DIG Colombo මේ සම්බන්ධයෙන් කථා කළා. ඒත් එක්කම දකුණු පළාතේ උසස් නිලධාරීන් කථා කරලා ඒ අනුව CCD එකේ සිටින පොලිස් සැරයන් උපුල් තමයි මිය ගියේ කියන කාරණාව මට හොඳින් තහවුරු වෙලා තිබුණේ, ඒ අවස්ථාව වන විට.

ප්‍ර: ඔබතුමා ඔහුගේ සේවා කාලය ගැන තහවුරු කර ගැනීමක් කළාද?

උ: ඔව්. ඇත්ත වශයෙන්ම නිලධාරියෙක් මිය ගියාට පස්සේ ඒ නිලධාරියා කෙබඳු ආකාරයේ නිලධාරියෙක්ද යන්න විමසීම සාමාන්‍ය දෙයක්. ඒ අනුව එම නිලධාරියා මිය ගියා කියපු අවස්ථාවේ වැඩ බලන අධ්‍යක්ෂ නෙවිල් සිල්වා මහත්මයා ඒ නිලධාරියා පිළිබඳව මට දීර්ඝ විස්තරයක් කළා. බොහොම ශෝකානුකූලව ඒ නිලධාරියා කථා කරලා කිව්වා, "අපිත් එක්ක වැඩ කරපු ඉතාම හොඳ, අවංක, කාර්ය ශූර නිලධාරියෙක්, මේ සිද්ධියෙන් විශාල පාඩුවක් වුණේ කියලා. ඒ වාගේම එම නිලධාරියා ආර්ථික දුෂ්කරතා තිබෙන නිලධාරියෙක්. ඉස්කෝලේ යන වයසේ ගැහැණු දරුවන් දෙදෙනෙක් සිටින නිලධාරියෙක්. ඒ නිලධාරියාගේ පඩියෙන් තමයි ගෙදර මිනිස්සු ජීවත් වෙන්නේ ඒ නිලධාරියාගේ ගෙවල් දොරවල් වලටත් අපි ගිහින් තිබෙන අවස්ථා තිබෙනවා සර්. ඒ නිසා ඒ අයට මොකක් හෝ සැලකීමක් කළ යුතුව තිබෙනවා. මළ ගෙදරවත් කර ගන්න පුළුවන් තත්ත්වයක් තියේවිද දන්නේ නැහැ. උදව් කරලා හැම දෙයක්ම සොයා බලා කරන්න වෙනවා. මට හරිම කනගාටුයි" කියලා කිව්වා. ඒ වගේ වේදනාත්මක ආකාරයෙන් එම නිලධාරියා පිළිබඳව විශාල තොරතුරක් කියලා තමයි මට විස්තර කිව්වේ.

ප්‍ර: ඔබතුමා අවස්ථා ගණනකදී මාතර ASP මහත්මයාට, ඒ වාගේම DIG මහත්මයාට, නි.පො. ප. කට, ඒ වාගේම ජෝ. නි.පො. ප. කට කථා කළා කිව්වා, මේ ඉල්ලුම් පත අත්සන් කරන්න ඉස්සෙල්ලා එම නිලධාරියාගේ මරණය හදිසි මරණයක්, ඒ හදිසි මරණය සම්බන්ධයෙන් ගරු අධිකරණයට කරුණු වාර්තා කළාද, නැද්ද කියන කාරණය තහවුරු කරලා දැන ගත්තාද?

උ: පැහැදිලිවම ස්වාමීනි, මේ ක්‍රියාවලිය සිදු වුණු අවස්ථාවේ ඉඳලා වැඩ බලන පොලිපතිවරයා හැටියට ඒ සම්බන්ධයෙන් වන දේවල් පිළිබඳව නිරන්තරයෙන් update වුණු නිලධාරියෙක් මම. මේ සම්බන්ධයෙන් පරීක්ෂා කරන්න මහේස්ත්‍රාත්තුමා ආවාද, මහේස්ත්‍රාත්තුමා පරීක්ෂණය ආරම්භ කළාද, ඔබලා සාක්ෂි මෙහෙය වනවාද. කවුද සාක්ෂි මෙහෙය වන්නේ, ඒ ආදී තොරතුරු සියල්ලම පිළිබඳ යථාවක් වුණු නිලධාරියෙක් මම, මේ සිද්ධිය වුණාට පස්සේ, නිලධාරියෙක් මිය ගියා, පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූවා, අධිකරණයට කරුණු වාර්තා කළා, එම නිලධාරියා ජීවත්ව සිටියේ නැහැ. මේ ආදි කරුණු සියල්ල පිළිබඳවම යථාවක් වීමක් වුණා. මම හෝ කවරු හෝ පොලිස්පති වශයෙන් සිටින නිලධාරියෙක් මේ සම්බන්ධයෙන් අහක බලාගෙන ඉන්නේ නැහැ. මොකද, ඒ වෙලාවේ ප්‍රධාන වශයෙන්ම කථා කළේ ඒ සිදුවීම පිළිබඳව නිසා. එම සිදු වීම වුණු දවසේ වෙන දේකට වඩා මේ සිදුවීම ගැන තමයි කථා කළේ. මේ සියලු දේවල් සම්බන්ධයෙන් මම යථාවත් වෙලා සිටියේ.

ප්‍ර: ඔබතුමා මීට ඉස්සෙල්ලාත් මේක කිව්වා. නමුත්, මේක අතිශය වැදගත්. එම නිලධාරීන් පිටව යෑමට අදාළ අවුට් එකක් තිබෙනවාද, නැද්ද කියන කාරණය තහවුරු කර ගන්නාද?

උ: ස්වාමීනි, මම මීට කලිනුත් ප්‍රකාශයක් කළා. එදා උදේ නෙවිල් සිල්වා යන ගමන්ම කිව්වා කියලා ඔහු පනාමාරට CCD එකට ගිහිල්ලා බැලුවා නිත්‍යානුකූලව අවුට් එකක් දාලා තිබෙනවාද කියලා. ඒකේ උපුල්ගේ නම සඳහන් වෙනවා කියලා මට කථා කරලා කිව්වා.

වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුව ඔහු මේ සම්බන්ධයෙන් කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයා පවා අමතා ඇති බව සැලකිල්ලට ගත යුතුය. බලපෑමට ලක් වූ පවුල්වලට අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව ත්‍යාග මුදල් ගෙවීම සහතික කිරීමට තමා දායක වූ අනෙකුත් අවස්ථා පිළිබඳවද ඔහු සිය සාක්ෂියේදී විස්තරාත්මකව පැහැදිලි කර ඇත.

තම නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් කකුලට වෙඩි වැදුණු උප පොලිස් පරීක්ෂක මධුරංග ඇතුළු කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ අනෙක් නිලධාරීන්, වැලිගම පොලිස් රාත්‍රී මුර සංචාරයේ යෙදුණු ජීප් රථයේ නිලධාරීන්, ජීප් රථයෙන් බැස වෙඩි තැබීම සිදුවන බව පෙනෙන නවතා තිබූ කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය දෙසට ගමන් කළ පොලිස් සැරයන් සිසිර කුමාර, පලා යන වෑන් රථයට වෙඩි තැබූ හමුදා සැරයන් රුචිරංග යන අයට ත්‍යාග මුදල් ගෙවීමට පියවර නොගත් බව වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇතවගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුව, එයට හේතුව වී ඇත්තේ එම නිලධාරීන්ට එවැනි ත්‍යාග මුදලක් ගෙවීමට කිසිදු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නිර්දේශ කර නොතිබීමයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් කොළඹ නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර, කොළඹ මධ්‍යම කොට්ඨාශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ලීලාරත්න සහ කොළඹ වංචා විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බාලසූරිය යන මහත්වරුන්ගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළ බවත්, මරණින් පසු පොලිස් සැරයන් උපුල්ට උප පොලිස් පරීක්ෂකවරයෙකු ලෙස උසස්වීමක් ලබා දීම සඳහා එම කමිටුවෙන් නිර්දේශයක් ලබා ගත් බවත් පිළිගෙන ඇත. මරණින් පසු පොලිස් සැරයන් උපුල්ට එම උසස්වීම ලබා දීමේදී නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කළ බවට ඔහු සෑහීමකට පත්වන බව ඔහුගේ ස්ථාවරයයි.

ඝාතනයට ලක් වූ පොලිස් සැරයන් උපුල්ගේ පවුලට පොලිස් ත්‍යාග අරමුදලින් රුපියල් ලක්ෂ පහළොවක් (15) ක් ගෙවීම සම්බන්ධයෙන් ගෙවීමට තදින්ම නිර්දේශ කරමින්, කොළඹ නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා දුරකථනයෙන් අමතා තමාට දැනුම් දුන් බව ඔහු විසින් වැඩි දුරටත් දන්වා සිටී. මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රශ්නය සහ පිළිතුර පහත පරිදි වේ:

ප්‍ර: ඔබතුමා දැන් කිව්වා, ඒ නිලධාරියාගේ ආර්ථික තත්ත්වය, ඒ නිලධාරියාගේ මුළු පවුලම යැපෙන්නේ ඒ නිලධාරියාගේ වැටුපෙන් විතරක් කියලා, දරුවෝ දෙදෙනෙක් ඉන්නවා කියලා. ඒ දියණියන් දෙදෙනෙක්ය කියලා. දියණියන් දෙදෙනා ඉස්කෝලේ යනවා කියලා. ඒ කරුණු ගැන කොයි වෙලාවක හරි ඒ මිය ගිය නිලධාරියා අදාළ වන පොලිස් වසමේ ස්ථානාධිපතිගෙන් කරුණු තහවුරු කර ගත්තාද? ඒ ගැන විස්තර සඳහන් කරන්න?

උ: චන්ද්‍ර කුමාර, නියෝජ්‍ය පොලිස්පති, කොළඹ දිශාව ළඟට ඒ reward application එක ආවාට පස්සේ ඔහු මට දුරකථනයෙන් කථා කළා. කථා කරලා ඇහුවා, "මේ reward application එකට Directorගෙන් ඇවිල්ලා තිබෙනවා ලක්ෂ 15 ක් දාලා. මේක සාමාන්‍යයෙන් මීට කලිනුත් CCD

> එකේ කට්ටිය මැරුණාම පාස්කු ප්‍රහාරයේ කට්ටියක් අත්අඩංගුවට ගන්න ගිහිල්ලා තුන්දෙනෙක් මැරුණා එක දවසේ. තුන්දෙනාටම ලක්ෂ 15, 15 දීලා තිබෙනවා. ඒ නිසා වෙන්න ඇති මේ ගොල්ලෝ මේක දාලා තිබෙන්නේ. මේක සම්බන්ධව මම හොයලා බැලුවා. මම ගලේවල OICට කියලා නිලධාරියෙක් ගෙදරට යවලා හොයලා බැලුවා ඇත්තටම ඒ මිනිසුන් ආර්ථික දුෂ්කරතා තිබෙනවාද කියලා. කථාව නම් ඔක්කෝම ඇත්ත සර්. මගේ අදහස නම් මේ ලක්ෂ 15 ඒ මිනිහාට දෙන එක සාධාරණයි. සර් මොකද හිතන්නේ " කියලා කථා කරලා මගෙන් ඇහුවා.
>
> මම කිව්වා, " ඒ මිනිහාගේ කථාවත් ඇත්ත නම්, ඒ මනුෂ්‍යයාට ඔය වාගේ ආර්ථික දුෂ්කරතා තිබෙනවා නම්, ඒ මිනිහා හොඳ මිනිහෙක් නම්, රාජකාරියකට ගිහිල්ලා මැරිලා තිබෙන්නේ. මීට කලින් මිනිසුන්ටත් ලක්ෂ 15 ක් දීලා තිබෙනවා නම් ඔයාගේ නිර්දේශය ඔය එව්වොත්, මමත් ස්ථිර වශයෙන් ඕක අනුමත කරනවා ලක්ෂ 15 ක් දෙන එකට " කියලා මම කිව්වා.

වගඋත්තරකාර පොලිස්පතිවරයා තම කනිෂ්ඨ නිලධාරීන්ට ත්‍යාග අයදුම්පතෙහි රුපියල් මිලියන 1.5 ක අගයක් ඇතුළත් කිරීමට බලපෑම් කළ බව ප්‍රතික්ෂේප කර ඇත. ඝාතනයට ලක් වූ පොලිස් සැරයන් උපුල්ට රුපියල් මිලියන 1.5 ක ත්‍යාගය ගෙවීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නිසි ක්‍රමවේදයට සිදු වූ බව ඔහුගේ ස්ථාවරයයි.

ආරක්ෂක උපදේශකයෙකු ලෙස සම්බන්ධ වීමට ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් ඔහුට කළ යෝජනාව සම්බන්ධයෙන් සඳහන් කිරීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් එවැනි යෝජනාවක් තිබූ බවත්, ලිඛිත ලිපියක් යවමින් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බවත් තම සාක්ෂියේ සඳහන් කර ඇත. W15 හෝටලයේ හිමිකරු යැයි කියනු ලබන ජමාල්ඩීන් නමින් හැඳින්වෙන පුද්ගලයා සහ මෙම සිදුවීම අතර කිසිදු සම්බන්ධයක් තිබූ බව ද ඔහු ප්‍රතික්ෂේප කරයි. එමෙන්ම, කොළඹ ඩාර්ලි පාරේ පිහිටි ඉඩමක් සම්බන්ධ ආරවුලට තමාගේ යම් සම්බන්ධයක් තිබෙන බව ද ඔහු ප්‍රතික්ෂේප කරයි. W15 හෝටලයේ හිමිකරුට එරෙහිව තමාට කිසිදු වෛරයක් නොමැති බව ද වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය සාක්ෂියේදී ප්‍රකාශ කර ඇත.

අදාළ කාර්යාලවල පවත්වාගෙන යනු ලබන ලේඛන සංඛ්‍යාව වෙනස් කිරීම පිළිබඳව කමිටුව ඉදිරියේ ප්‍රකාශ කළ පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වන්නේ අදාළ ලේඛන නීති විරෝධී ලෙස වෙනස් කිරීමේ ක්‍රියාවන් සඳහා වගකීම භාර ගත යුත්තේ එම කාර්යාල භාරව සිටින අදාළ නිලධාරීන් බවයි. කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් පොලිස් නිලධාරීන්ට අදාළ ලේඛන වෙනස් කිරීමට බල කළ ආකාරය පැහැදිලි කරමින් එම නිලධාරීන් විසින් දුන් සාක්ෂිවල සත්‍යතාව අභියෝගයට ලක් කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා උත්සාහ කර නොමැති බව ද සැලකිල්ලට ගත යුතුය. එම පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි සම්බන්ධයෙන් කාරණාවේදී මෙම වෙනස්කම් ඔහුගේ අණ පරිදි සිදු නොකළ බවට පමණක් ඔහු ප්‍රකාශ කරයි.

2023-12-30 දින W15 හෝටලයේ ඡායාරූප සහ දර්ශන පට තමාට ලබා දුන්නේ උප පරීක්ෂක ප්‍රියංකර බවට නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා කළ ප්‍රකාශය අසත්‍ය බව වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත. ඔහු නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගෙන් W15 හෝටලය පිළිබඳ තොරතුරු ලබා ගත් බවට එල්ල වන චෝදනාවද ඔහු විසින් ප්‍රතික්ෂේප කරයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය ප්‍රධාන සාක්ෂි විභාගය අවසානයේ පහත පරිදි ප්‍රකාශ කර ඇත.

ප්‍ර: ඔබ කොයි වෙලාවක හරි සක්‍රිය විධියට හෝ නිශ්චය විධියට හෝ කිව්වාද, W15ට වෙඩි තියන්න කියලා?

උ: කිසිසේත්ම නැහැ.

ප්‍ර: ඔබ කොයි වෙලාවක හෝ ඔය යන ගමනේ නිලධාරීන්ට ආයුධ අරගෙන යන්න කිය කිව්වාද?

උ: මම කිව්වේ නැහැ. නමුත් ප්‍රමාණවත් ආරක්ෂාව සලසා ගෙන යන්න කියලා එයාලම ඩිරෙක්ටර් කියා තිබෙන බව ඒ අය ප්‍රකාශ කර තිබෙනවා. ඒ අනුව තමයි ඔවුන් ආයුධ අරගෙන ගිහින් තිබෙන්නේ.

ප්‍ර: එහෙම ආයුධ අරගෙන ගියා කියන එක ඔබ දැනගෙන හිටියාද?

උ: නැහැ. මම පසුව දැන ගත්තා.

ප්‍ර: යන්න ඉස්සෙල්ලා දැනගෙන හිටියාද?

උ: යන්න ඉස්සෙල්ලා දැනගෙන හිටියේ නැහැ.

මෙම කාල වකවානුවේ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා විසින් ඔහුට ලබා දුන් නීති විරෝධී නියෝගයකට වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විරුද්ධ වූ සිද්ධියක් ද ඔහු විස්තර කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය ප්‍රධාන සාක්ෂි විභාගය අවසානයේ, ඔහුට එරෙහිව එල්ල කර ඇති චෝදනා ප්‍රතික්ෂේප කරමින් පහත පරිදි ප්‍රකාශ කර ඇත:

ප්‍ර: ඔබතුමාට වෙන මොනවා හෝ මේ උතුම් වූ පරීක්ෂණ කමිටුවට කියන්න තිබෙනවා නම්, අවසාන වශයෙන් කියන්න?

උ: ස්වාමීනි, මම කලිනුත් ප්‍රකාශ කළා වාගේ, මම මේක සලකන්නේ, කාගේ හෝ වුවමනාවකට, ඒක දේශපාලන වුවමනාවක් වෙන්නත් පුළුවන්, හැබැයි දේශපාලන වුවමනාවකටත් වඩා පුද්ගලයින් කිහිප දෙනෙක් සම්බන්ධයෙන් මගේ අදහසක් තිබෙනවා. ඒක මම ප්‍රකාශ කරන්න යන්නේ නැහැ. තමා විසින් නිර්මාණය කරගත් පෙත්සමකට, තමන්ට ඕනෑ ආයතනයකට දාලා, තමන්ට ඕනෑ විධියට සාක්ෂි හදාගෙන කරපු inquiry එකක් විතරයි. නිශාන්ත සොයිසා මහත්මයා කරලා තිබෙන මේ අසත්‍ය ප්‍රකාශය හැරුණු විට මට විරුද්ධව, මගේ වුවමනාවට මේක වුණා කියන එක සම්බන්ධයෙන් කිසිම සාක්ෂියක් හෙළිදරව් වුණේ නැහැ ස්වාමිනි. මම මෙතැන වාඩි වෙලා පසුගිය දවස් වල අහගෙන සිටියා. CID එක පවත්වපු විමර්ශනයේදීත්, මම උපදෙස් දීලා ගිහින් මේක කෙරෙව්වා කියලා පරිවේෂණීය සාක්ෂියක්වත්, වෙන සාක්ෂියක්වත්, කිසි දෙයක් හෙළිදරව් වෙලා

නැහැ ස්වාමිනි. එහෙම අවස්ථාවක මම මේ රටේ නාමිකව පොලිස්පති වශයෙන් ඉන්න කොට මාව අත් අඩංගුවට අරගෙන, අනික් මිනිස්සු ඔක්කොටම රිට් අයදුම්පතක් මඟින් අත්අඩංගුවට ගැනීම වළක්වා තිබුණු අවස්ථාවක, උසාවියෙන් දවස් 20 ක් රක්ෂිත බන්ධනාගාරගත කළා ස්වාමීනි. ඒ දවස් 20 ඇතුළත මම කිසිම වරප්‍රසාදයක් ඉල්ලුවේ නැහැ. සාමාන්‍යයෙන් මට නිදාගන්න මෙට්ටයක් හෝ ඉල්ලීමේ හැකියාව තිබුණා. මම ඒ කිසිම දෙයක් ඉල්ලන්නේ නැතුව ගත කළා. මොකද, හේතුව ඒ දීපු අයුක්ති සහගත තීන්දුව නිසා මට වෙච්ච අගතිය සම්බන්ධයෙන් මා තුළ තිබුණු දැඩි මානසික පීඩාව නිසා මම එහෙම කළේ. මොකද, හේතුව කවදා හරි දවසක මේකෙන් මට යුක්තියක් ඉෂ්ට වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. මට විරුද්ධව කිසිම සාක්ෂියක් ඉදිරිපත් වෙලා නැහැ. ඒ නිසා මට අවසන් වශයෙන් කියන්න තිබෙන්නේ, ඔබතුමා පිළිබඳව තිබෙන විශ්වාසය සහ ඔබතුමා වාගේම අනෙක් විනිසුරුතුමන්ලා දෙදෙනා ගැන තිබෙන විශ්වාසය නිසා තමයි අපි තීරණය කළේ මේ පරීක්ෂණයට සහභාගි වෙන්න. එහෙම නැත්නම් ඕනෑ තීන්දුවක් ගන්න කියලා ස්වාමීනි, මට මේකට පෙනී සිටින්නේ නැතිව ඉන්න තීරණයක් ගන්න තිබුණා. නමුත්, මම තීරණය කළා ඔබතුමා ඉස්සරහට ඇවිල්ලා අපේ පැත්තෙන් කරුණු කාරණා කියනවා කියලා, ඔබතුමා මොන තීන්දුවක් දුන්නත්, අපි ඒ තීන්දුව හිස නවා පිළිගන්නවා. නමුත්, මේක ඉතිහාසගත වෙනවා. පොලිසියේ ඉතිහාසය අවුරුදු 158 යි. පළමුවැනි වතාවට මේ Act එක යටතේ ඇවිල්ලා පොලිස්පතිවරයෙක් සම්බන්ධයෙන් ක්‍රියා කරන අවස්ථාවක් මේක. මේක ඉතිහාසගත වෙනවා. ඉතිහාසගත වෙනවා වාගේම ඉදිරි කාලයේදී ඒ සම්බන්ධව මිනිස්සු ගොඩක් දේවල් කථා කරයි. ඒ නිසා ඔබතුමාගෙන් අපි ඉල්ලා සිටින්නේ, කරුණාකර මේ එළඹුණු සාක්ෂි එක්ක බලලා ඔබතුමාගේ අභිමතය පරිදි සුදුසු තීන්දුවක් ලබා දෙන්න කියලා.

24) <u>අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් කළ හරස් ප්‍රශ්න විභාගය</u>

අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් වැදගත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසන ලදී. එම හරස් ප්‍රශ්න විමසීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා R-2 හි ලැයිස්තුගත කර ඇති අත්අඩංගුවට ගත් පුද්ගලයින් 149 දෙනෙකුගේ පරීක්ෂා කිරීමේ තොරතුරු පමණක් ලබාගෙන ඇති බවත්, එම කාර්යය පමණක් වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත පවරා ඇති බවත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා (හරස් ප්‍රශ්න කිරීමේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා ලබා දී ඇති පිළිතුරු අනුව) විසින් තහවුරු කර ගෙන ඇත.

හරක් කටා විසින් ක්‍රියාත්මක කරන ලද මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය මැඩපැවැත්වීම සඳහා සිදු කරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබා ඇති ප්‍රගතිය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයා සෑහීමකට පත් නොවන බවට ප්‍රකාශ කර ඇතත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක්/ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ උදාසීනත්වය සහ එසේත් නැතහොත් *හරක් කටා* සංවිධානාත්මක අපරාධවලට අනුග්‍රහය දක්වන ලද දූෂිත ක්‍රියාකාරකම්වලට ඔවුන්ගේ සම්බන්ධය එවැනි කටයුතු වලට අනුබල දෙනු ඇතැයි යන කරුණ මත ඉහත කාර්යය කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂවරයාට පැවරීමට තීරණය කළ බව වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂිය වන අතර මෙය ඉතා වැදගත් වේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය හරස් ප්‍රශ්න කිරීමේදී ස්ථාන කිහිපයකදී පැහැදිලි ස්ථාවරයක් ගෙන ඇති අතර, කෙසේ වෙතත්, සංවිධානාත්මක අපරාධ සම්බන්ධයෙන් හරක් කටාගේ ගනුදෙනුවලට එරෙහිව ප්‍රධාන විමර්ශනය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ඉදිරියට ගෙන ගිය බව ඔහු පැවසීය. කොළඹ අපරාධ කොට්ඨාශයේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතාට R-2 පැවරීමෙන් තමා අපේක්ෂා කළ එකම අරමුණ දකුණු පළාතේ *හරක් කටා* විසින් ක්‍රියාත්මක කරන ලද මත්ද්‍රව්‍ය බෙදාහැරීමේ ජාලය විනාශ කිරීම බව ඔහු විශේෂයෙන් ප්‍රකාශ කර ඇත. මෙම මෙහෙයුම වැලිගම ප්‍රදේශයේ සහ එහි තදාසන්න ප්‍රදේශවල සිටින ලිපිනයන් සොයාගත් පුද්ගලයින් කෙරෙහි පමණක් කේන්ද්‍රගත වී සිදු කළ බව වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ප්‍රකාශ කර ඇත. R=2 ට අමුණා ඇති ලැයිස්තුවේ සිටින සියලු දෙනාගේම තොරතුරු පරීක්ෂා කිරීම අවසන් කරන තුරු සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා වැලිගම ප්‍රදේශයට දිනපතා කණ්ඩායම් යවනු ඇතැයි තමන් අපේක්ෂා කරන බව වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත්තේ එබැවිනි.

2023-12-29 වන දින මාතර ප්‍රදේශයට ගිය පළමු කණ්ඩායම කොළඹ අපරාධ කොට්ඨාශයෙහි පොලිස් පරීක්ෂක ජයතිලකගේ කණ්ඩායම බව සාක්ෂිවලින් හෙළි වී තිබේ. 2023-12-30 දින රාත්‍රියේ පිටත්ව ගිය ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා ගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ පරීක්ෂණ කොට්ඨාශ (CCD)කණ්ඩායම දෙවන කණ්ඩායමයි. පළමු කණ්ඩායම පුද්ගලයින් 11 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව වාර්තා වුවද, දෙවන කණ්ඩායම R-2 හි ලැයිස්තුගත කර ඇති පුද්ගලයින් සම්බන්ධයෙන් කිසිවක් සිදු කර නොමැත2023-12-31 දින සිදු වූ මෙම වෙඩි තැබීමෙන් පසු කොළඹ අපරාධ පරීක්ෂණ කොට්ඨාශය කිසිවක් සිදු නොකළ බව වගඋත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන ඇත. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත තමා දැඩි උනන්දුවකින් හා මනා දැනුවත්භාවයකින් ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට කොළඹ අපරාධ කොට්ඨාශය අපොහොසත් වීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පැහැදිලි කිරීම පහත උපුටා දැක්වීම් දෙකෙන් පිළිබිඹු වේ:

ප්‍ර: හැබැයි ඒ මෙහෙයුම ඉවර වුණේ නැහැ?

උ: බැරි වුණානේ මෙක නිසා. මේ සිද්ධියෙන් පස්සේ ඒක කඩාකප්පල් වෙලා ගියා ස්වාමීනි.

ප්‍ර: මට තේරෙන්නේ නැත්තේ ඒක කඩා කප්පල් වුණේ කොහොමද පොලිස්පතිතුමා?

උ: ස්වාමීනි, 29 වෙනි දා ගිය කණ්ඩායම මේකෙන් 11දෙනෙක් අත්අඩංගුවට ගෙන ගෙනාවා. 30 වෙනි දා ගිය කණ්ඩායම මේ කියපු රාජකාරියට යනවා කියලා පිටවෙලා ගිහින්, වෙන සිද්ධියක් එතැන සිද්ධ වුණා. ඊට පස්සේ නිලධාරියෙක් මැරුණා. ඊට පස්සේ සීසීඩී එකට පවරපු ජොබ් එක එතැනින් ඇත්ත වශයෙන් කඩා කප්පල් වෙලා ගියා. මේ සිද්ධිය නොවෙන්න ස්ථිර වශයෙන්ම, -31 වෙනි දා, ජනවාරි 01 වෙනි දා ආදී වශයෙන් මාසයක් විතර ඇතුළත මේ 149 දෙනා ඉවර කරලා දෙන්න කියලා මම කිවේ - ඒක කෙරනවා. නමුත් මේ අනපේක්ෂිත සිද්ධිය නිසා ඒ වැඩේ නතර වුණා කියන එක තමයි මම කියන්නේ.

ප්‍ර: ඒ කියන්නේ CCD එකෙන් 30 වෙනි දා ගිය කණ්ඩායම් කළ වැඩේ නිසාද කඩාකප්පල් වුණේ?

උ: ඔව් ස්වාමිනි. ඒකේ ගිය නිලධාරියෙක් මැරුණාට පස්සේ ඒ වැඩේ තවදුරටත් සීසීඩී එකෙන් නොකෙරෙන තත්ත්වයට පත් වුණා. ඊට පස්සේ කණ්ඩායම් මේ සඳහා යැවීමක් වෙලා නැහැ.

...

ප්‍ර: සාක්ෂිකරු කිව්වා, මෙම සිද්ධියෙන් පස්සේ මේ වැටලීම් නැවතුණා කියලා?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: මම අහන්නේ, මෙම සිද්ධිය ශක්තියක් කරගෙන full force එකෙන් ගහන්න ඕනෑ නැද්ද පාතාලයට?

උ: එසේ ගැසිය යුතුව තිබෙනවා, ස්වාමීනි. නමුත්, කරුණු කාරණා යෙදිච්ච ආකාරය අනුව, විශේෂයෙන්ම මේකට CID එක දිගටම යොදවලා නිශ්චිත result එක ගන්න බැරි නිසයි CCD එක දැම්මේ කියලා මම කලින් අවස්ථාවේ ප්‍රකාශ කළා, ඒකට දාපු CCD එකේ team එක ගිහිල්ලා මේ වාගේ සිද්ධියක් ඇති වුණා. එතකොට ප්‍රායෝගිකව එතැනදී පොලිස් නිලධාරියෙකුත් මැරුණා. ඊට පස්සේ ප්‍රායෝගිකව ඇති වෙච්ච පසුබෑස්ම නිසා නැවත වතාවක්. - ඒක අනිවාර්යයෙන්ම කළ යුතුව තිබුණා. නමුත්, ඒ සිදුවීමෙන් වූ පසු බෑමත් එක්ක ඒ කර්තව්‍ය සඳහා නැවත වතාවක් අඛණ්ඩව teams යෙදවීම කඩා කප්පල් වෙලා තිබෙනවා.

<u>පරීක්ෂණ කොමිටුවෙන් :</u>

ප්‍ර: මේ වාගේ සිද්ධියක් ඇති වුණා කියන එකන් සාක්ෂිකරු අදහස් කරත් CCD එසේ නිලධාරීන් වැරදි වැඩක් කළා කියලාද?

උ: නැහැ. CCD එකේ නිලධාරීන් නීත්‍යානුකූලව රාජකාරී කරන්න ගිය වෙලාවේ වෙච්ච වෙඩි කැබීමකින් නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදී එක් නිලධාරියෙකු මියයෑම සහ අනෙක් නිලධාරියාට තුවාල සිදු වීම. අන්න ඒ නිසා CCD එකෙන් teams මේකට අඛණ්ඩව දාන්න කියපු වැඩ පිළිවෙළ එතැනින් කඩා කප්පල් වුණා; පසු බෑමකට ලක් වුණා කියන එක තමයි මම අදහස් කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ තුන්වැනි පාර්ශ්වයකින් වෙඩි නියපු එක ගැන?

උ: තුන්වැනි පාර්ශ්වයකින් හෝ කවුරු හරි තියපු වෙඩි පහරකින් එක් නිලධාරියෙක් මැරිලා, තවත් නිලධාරියෙක් තුවාල වීමෙන් පස්සේ මේ වැඩේ ඇනහිටියා කියන එක තමයි මම කියන්නේ.

***

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරන්නේ ඇනහිටින්න නොවෙයි, ඒක තව ශක්තියක් කර ගන්න තිබුණා කියන එකයි. සාක්ෂිකරු ලස්සන වචනයක් කිව්වා, අපරාධකරුවන් තුළ, පාතාලය තුළ

මානසික භීෂණයක් ඇති කරන්න, - සාක්ෂිකරුට දැනෙන විධියට මෙම සිදුවීමේදී අසාධාරණ චෝදනාවක් නේ මුලින්ම ආවේ. ඒ කියන්නේ, Wi5 හෝටලයට කොන්ත්‍රාත් එකකට ගිහින් වෙඩි තිබ්බා වාගේ කථාවක් සමාජගත කරලා, ඊට වඩා වැඩි මෙහෙවරක් නැවත්වුවා කියන එකනේ පෙනී යන්නේ, නමුත්, සාක්ෂිකරු ඒකෙන් ශක්තියක් අරගෙන අඩුම තරමේ මේ ප්‍රහාරකයෝ සොයන්න යම්කිසි මෙහෙවරක් කරන්න ඒ නිලධාරීන්ට වග කීමක් නැද්ද? සාක්ෂිකරුට නොවෙයි මම අහන්නේ. ඒ ප්‍රදේශයේ නිලධාරීන්ට හරි වගකීමක් නැද්ද?

උ: අනිවාර්යයෙන්ම මට මේ සිද්ධිය සැල කරපු වෙලාවේ ඉඳලාම මම දීපු මූලික instruction එකක් තමයි මේ CCD එකට වෙඩි තිබ්බේ කවුද කියලා හොයන්න කියන එක. කවුරු හරි වෙඩි තිබ්බා නම් හොයන්න. එහෙම කවුරු හරි වෙඩි තිබ්බේ නැත්නම් ඒක clear - cut ඇවිල්ලා වෙඩි තියලා නැහැ කියලා report කරන්න ඕනැ. ඒ දෙකෙන් එකක් ගත්තා නම් මෙතැනදී තීන්දුවකට එන්න තිබුණා. මම ඉස්සෙල්ලා පැහැදිලි කළා වාගේ මේ සම්බන්ධයෙන් විමසනයක් මාතර පොලිස් කොට්ඨාසයෙන් වුණා. ඒ අය අවසාන වශයෙනුත් තීන්දුවකට ඇවිල්ලා නැහැ. තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබ්බේ නැහැ කියලා. නමුත්, තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තිබ්බා කියලා සනාථ කර ගන්න සාක්ෂියකුත් හම්බ වෙලා නැහැ. අදටත් ඒක නොවිසඳුණු තත්ත්වයේ තිබෙන ප්‍රශ්නයක්......"

වැලිගම පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වෙත මුලින්ම ප්‍රකාශ ලබා දී ඇත්තේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ නිලධාරීන් බව වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් කිසිඳු සඳහනක් කර නැත. මෙම කටයුත්ත 2023-12-31 වන දින උදෑසන 6.00 ට අපරාධය සිදු වූ ස්ථානයේ සිටම සිදු කර ඇත. කෙසේ වෙතත්, මෙම පරීක්ෂණය පුරාවටම වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ අදාළ සැකකාර පුද්ගලයා පරීක්ෂා කිරීමට යාමේදී නාඳුනන තුවක්කුකරුවෙකු කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි තැබූ බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වන්නේ වෑන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි වැදුණු අතර, අදාළ සැකකාර පුද්ගලයා පලා ගිය බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුව, කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ සිටි SI මධුරංග, කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් වෙඩි තැබීම සිදු වූ දිශාවට වෙඩි තබා ඇත්තේ එම අවස්ථාවේදීය. වගඋත්තරකාර පොලිස්පතිවරයා මේ මොහොතේ ද ඒ පිළිබඳව දරන මතය එලෙසම වේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා තවමත් එම මතයේම සිටීමට උනන්දු වන්නේ මන්ද යන්න විමර්ශන කමිටුවට මතු වූ මූලිකම ගැටළුයි.

පොලිස්පතිවරයා ලෙස ඔහු 2024-07-24 වන දින දක්වා පොලිස්පති ධූරයේ රාජකාරී ඉටු කරමින් සිටියේය. වර්තමානය වන විට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඔහුව පොලිස්පති ධූරයේ රාජකාරී ඉටු කිරීමෙන් වළක්වා ඇත. සිද්ධිය සිදු වූ අවස්ථාවේ ඔහු අපරාධ ස්ථානයේ සිට නැත. ඔහු කිසි විටෙකත් ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සහ කණ්ඩායම සමඟ කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයෙන් ගියේ නැත. සිද්ධියෙන් පසුව ද ඔහු වැලිගම පොලිස් ස්ථානයට හෝ අපරාධ ස්ථානයට ගියේ ද නැත.

ටික කලකට පසු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම විමර්ශනය භාර ගන්නා ලදී. කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ උප පොලිස් පරීක්ෂක මධුරංග විසින් කිසිඳු සාධාරණීකරණයකින් තොරව හිතාමතාම W15 හෝටලයට වෙඩි තබා ඇති බව ගරු මාතර මහේස්ත්‍රාත්වරයා නිගමනය කළේය. මහේස්ත්‍රාත්වරයා විසින් නාඳුනන තුවක්කුකරුවෙකු විසින් එවැනි වෙඩි තැබීමක් සිදු කළ බව කියැවෙන

කරුණු අසත්‍ය ප්‍රකාශයක් සහ සත්‍ය වශයෙන්ම සිදු නොවූවක් බව 2025-02-27 දිනැති ඔහුගේ නියෝගයෙහි දක්වා ඇති හේතු මත පදනම්ව නිගමනය කර ඇත. වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් 2023-12-31 වන දින පෙ.ව. 06.00 ට අපරාධ ස්ථානයේ සිටම වැලිගම පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වෙත සත්‍ය සිදුවීම ප්‍රකාශ කළහ. වගඋත්තරකාර පොලිස්පතිවරයා එම සාක්ෂිය අභියෝගයට ලක් නොකරයි. ඉන්පසුව, SOCO නිලධාරීන් විසින් එම ස්ථානයේ තිබී සොයා ගත් බව කියන හිස් පතරොම් කොපු විශ්ලේෂණය කිරීමෙන් පසු, රජයේ රස පරීක්ෂකවරයා විසින් එහි තිබී සොයාගත් සියලුම හිස් පතරොම් කොපු එකම ආයුධයකින් වෙඩි තැබූ ඒවා බව සනාථ කරමින් වාර්තාවක් (P-11) ඉදිරිපත් කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාට තවමත් එම කරුණු සැලකිල්ලට ගැනීමට කිසිදු උනන්දුවක් නොමැත. කෙසේ වෙතත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා රුසියාව, චීනය, දකුණු කොරියාව, ඉන්දියාව සහ තායිලන්තය වැනි රටවල පොලිසියේ තම රාජකාරි විෂය පථය සම්බන්ධයෙන් උසස් අධ්‍යාපනය ලබා ඇති පොලිස් නිලධාරියෙකු වන අතර මහා බ්‍රිතාන්‍යයේ ස්කොට්ලන්ඩ්යාඩ් හි අපරාධ විමර්ශනය සම්බන්ධයෙන් පුහුණුව ලබා ඇති පොලිස් නිලධාරියෙකි. ඉහත සඳහන් සියලු කරුණු සැලකිල්ලට ගනිමින්, මෙම සිද්ධියට අදාළ කරුණු, තත්වයන් සහ ස්වාභාවිකවම සිදු වී ඇති සිදුවීම් සිදු වී ඇති ආකාරය සියල්ල සළකා බලන විට, වගඋත්තරකාර පොලිස්පතිවරයා තවමත් දරන දෘෂ්ටිකෝණය/ස්ථාවරය කිසිසේත් සනාථ නොවන බව විමර්ශන කමිටුවේ මතයයි.

එම නිසා , වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධිය වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කිරීමට උත්සාහ කර ඇති ආකාරයටම සිදු වූ බවට පිළිගැනීමට විමර්ශන කමිටුවට නොහැකි වේ. මේ අනුව, වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධිය වග උත්තරකාර පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කිරීමට උත්සාහ කර ඇති ආකාරයටම සිදුවී ඇති බවට වන වග උත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි විමර්ශන කමිටුවට පිළිගැනීමට නොහැකි වේ. වැලිගම පොලිස් ස්ථානයට කළ පළමු ප්‍රකාශ මාලාවේදී සහ මරණ පරීක්ෂණයේදී සාක්ෂි දුන් ආකාරයට, ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා සහ ඔහුගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් ප්‍රකාශ කළ ආකාරයට, මෙම වෙඩි තැබීමේ සිද්ධිය සිදු වූ බවට වග උත්තරකාර පොලිස්පතිවරයාට නිගමනය කළ හැකි හෝ කළ යුතු කිසිදු පදනමක් නොමැති බව විමර්ශන කමිටුවේ අදහසයි. සත්‍ය වශයෙන්ම, මාතර උගත් මහේස්ත්‍රාත්වරයා පවා 2025-02-27 දිනැති ඔහුගේ නියෝගය පරිදි කොළඹ අපරාධ කොට්ඨාශ සාමාජිකයින්ගේ සාක්ෂි පිළිගෙන නොමැත.

විමර්ශන අඛණ්ඩව සිදුවන අතරතුර වග උත්තරකාර පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ දිගින් දිගටම ප්‍රකාශ කර සිටියේ W15 හෝටලය ඉදිරිපිට කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයට නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තැබීමක් සිදු කර ඇති බව මෙන්ම එවැන්නක් සිදුවීමට ඇති හැකියාව කිසිවෙකුට බැහැර කළ නොහැකි බවය. කෙසේ වෙතත්, වැලිගම පොලිස් ස්ථානය විසින් සිදු කරන ලද විමර්ශනයේ ප්‍රගතිය කුමක්දැයි තමා නොදන්නා බව ඔහු පැහැදිලිවම ප්‍රකාශ කර ඇත. මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මහතා පැහැදිලිව ප්‍රකාශ කර ඇත්තේ වැලිගම පොලිස් ස්ථානය විසින් සිදු කරන ලද විමර්ශනය ඉන් පසුව සිදු නොවූ බවයි. මෙම සිද්ධියට අදාළ සාක්ෂි වසන් කිරීම සම්බන්ධයෙන් වැලිගම පොලිස් ස්ථානයේ මූලස්ථාන පොලිස් පරීක්ෂකවරයා මාතර මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ චෝදනා ලැබ සිටින බව සත්‍යයකි.

වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ නියුතු නිලධාරීන්ට තමන්ව හඳුන්වා දීමට ඉදිරියට පැමිණිය නොහැකි වූයේ මන්දැයි විමසූ විට කොළඹ අපරාධ කොට්ඨාශ සාමාජිකයින් එසේ සිදු කළ බව පිළිගත් වග උත්තරකාර පොලිස්පතිවරයා ඒ සම්බන්ධයෙන් වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ගේ කිසිදු වරදක් නොමැති බව ඔහු පිළිගෙන තිබේ. පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛවලට අනුව, එම අවස්ථාවේදී අවම වශයෙන් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ එක් සාමාජිකයෙකු හෝ නිල ඇඳුමින් සැරසී සිටිය යුතු වූ බව වග උත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන ඇත. කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන්ගේ පාර්ශවයෙන් සිදු වූ එම අපොහොසත් වීම (එනම්, අවම වශයෙන් එක් කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරියෙකු නිල ඇඳුමින් සැරසී සිටීමට අපොහොසත් වීම) ඔහු පිළිගෙන ඇත.

වෙඩි තැබීම සිදුවන අවස්ථාවේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ නියුතු නිලධාරීන් පැමිණි විට, කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරියා වේගයෙන් පලා යාම පිළිබඳ ඔහුගේ අදහස පහත උපුටා දැක්වීමෙන් පිළිබිඹු වේ:

ප්‍ර. සභාපතිතුමාට වැඩිය මම පියවරක් ඉදිරියට ගොස් ප්‍රශ්නය අහනවා. තුන්වැනි පාර්ශ්වයක් කොළඹින් ගිය කණ්ඩායමකට පාර අයිනේ ඉඳන් වෙඩි තිබ්බා නම් වැලිගම කණ්ඩායමක් එකතු කළා නම් ප්‍රහාරකයාට ප්‍රහාරයක් දෙන්න තිබුණේ නැද්ද?

උ. ඇත්ත වශයෙන්ම එසේ කිරීමට ද හැකියාවක් තිබුණා. මොවුන් ප්‍රකාශ කර තිබෙන ආකාරයට ජීප් එක එන අවස්ථාවේ පාර හරස් කරපු වෙලාවේ ඔබ කියනවා වාගේ වැලිගම පොලිසියේ ජීප් එකට ගිහිල්ලා කථා කරලා අපට මෙහෙම සිද්ධියක් වුණා. ඒකයි අපි වෙඩි තිබ්බේ දෙපැත්තම එකතු වෙලා අර මිනිහා අල්ලා ගන්න ක්‍රියා කරමු කියලා කටයුතු කිරීමේ අවස්ථාවක් තිබුණා.

ප්‍ර. ඒ විතරක් නොවෙයි, තව එස්. ටී. එෆ්. බස් එකක් තිබුණා, පොඩ්ඩක් එහා. ඒ ගොල්ලන්ගෙනුත් support එකක් ගන්න තිබුණා?

උ. ඒ ගොල්ලන් එහෙම කියලා තිබෙනවා. එහෙම තිබුණා නම් ඒ අයගේ support එක ගැනීමේ හැකියාව තිබුණා..

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර. ඒ වෙලාවේ ආවේ වැලිගම පොලිසියේ නයිට් මොබයිල් එක නේ. නයිට් මොබයිල් එක යන්නේ සිද්ධියක් සිද්ධ වෙලා කියලා දැන ගෙන ඒක විමර්ශනය කරන්න නොවෙයි නේ?

උ. මේක වෙන වැඩකට ගිහිල්ලා එන එකක්. මෙතැනදී අහම්බෙන් සෙට් වෙච්ච එකක් නේ, ස්වාමීනි.

ප්‍ර. නයිට් මොබයිල් එක සිද්ධියක් වුණත් නොවුණත් සංචාරය කරනවා?

උ. එහෙමයි.

ප්‍ර. පාරේ තිබෙනවා?

උ. ඔව්.

ප්‍ර. ඒක තමයි නයිට් මොබයිල් එක කියන්නේ?

උ. එහෙමයි.

ප්‍ර. සිද්ධියක් වන නොවන එක වෙන එකක්?

උ. එහෙමයි, ස්වාමීනි.

ප්‍ර. ඒ වාගේ වෙඩි තැබීමක් සිද්ධ වුණොත් ඒ ගොල්ලෝ යන පාරේ ඒක අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන්ගේ විෂය පථයට වැටෙනවා නේ?

උ. අනිවාර්යයෙන්ම විෂය පථයට වැටෙනවා. ඒ ගොල්ලන්ගේ ඇස් ඉදිරිපිට ඒ වාගේ දෙයක් සිදු වුණා නම් ඒ ගොල්ලෝ අනිවාර්යයෙන්ම මැදිහත් වෙන්න ඕනෑ, ස්වාමීනි.

ප්‍ර. ඒ බව කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ අය නොදැන ගන්න හේතුවක් නැහැ නේ?

උ. එතැන හිටපු නිලධාරීන්ගේ ජොෂ්ඨත්වයයි, ඒ ගොල්ලන්ගේ අත් දැකීම් එක්ක ඒක ඒ ගොල්ලෝ නොදැන ගන්න විධියක් නැහැ, ස්වාමීනි.

ප්‍ර. එහෙම නම් ඒ ගොල්ලන් අනිවාර්යයෙන්ම කළ යුතුව තිබුණේ මොබයිල් එකේ සහය පැතීම.

උ. අනිවාර්යයෙන්ම ඒ ගොල්ලන්ගේ සහාය ලබා ගැනීමට ඒ අය කටයුතු කළ යුතුව තිබුණා.

තවද, වග උත්තරකාර පොලිස්පතිවරයා විසින් සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත පවරා ඇති මෙහෙයුමේ සාධාරණීකරණය කල නොහැකි මෙන්ම හදිසි අවසානය පහත ප්‍රශ්න සහ පිළිතුරු වලින් පැහැදිලි වේ:

ප්‍ර: ඒක මර්දනය කරන්න යවපු නිලධාරීන්ට දැන් ඔය හරියට ගියේ ඔය විමර්ශනයට අදාළ සැකකරුවන් හොයන්න නේ ඔය හරියේ සංචාරය කළේ?

උ: එහෙම කියලා නේ ලියලා ගිහින් තිබෙන්නේ.

ප්‍ර: එහෙම ගියාම සංවිධානාත්මක අපරාධකරුවන්ගෙන් කියලා විශ්වාස කරන්න පුළුවන් වෙඩි තැබීමකට ලක් වෙලා පොලිස් නිලධාරීන් මිය ගියාම ඒක භයානක තත්ත්වයක් කියලා මහත්මයා පිළිගන්නවාද?

උ: ඔව්. ඔවුන් කියපු විධියටත් පාතලයේ ඒ ලිස්ට් එකේ මිනිසුන් අල්ලන්න ගියාම පාතාලයේ මිනිහෙක් වෙඩි තියලා පොලිස් නිලධාරියෙක් මැරුණා නම් ඒක බරපතළ තත්ත්වයක්, ස්වාමීනි.

ප්‍ර: ඒක බරපතළ තත්ත්වයක්. මොකද, වෙඩි තියපු මිනිහාත් හොයා ගන්න නැහැ?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: එතකොට පාතලයේ හෝ නාඳුනන තුවක්කුකරුවෙක් හෝ රාජකාරියට ගිය පොලිස් නිලධාරියෙක් වෙඩි තබා ඝාතනය කරනවා කියන්නේ බරපතළ තත්ත්වයක්?

උ: ඔව්.

ප්‍ර: ඒක නිසා දැන් මහත්මයා කියන විධියට සම්පූර්ණයෙන්ම විමර්ශන සංවිධානය කඩාගෙන වැටුණා?

උ: ඔව්. ඒක මම ආයේ කරන්න අත ගැහුවා නම් අනිවාර්යයෙන්ම- මට ඒක කරන්න බැරුව ගියා. STF එක වාගේ එකක් එක්ක combined කරලා තමයි ඊළඟ සැරේ කරනවා නම් කරන්න වෙන්නේ. මොකද, threat එකක් තිබුණා ඒ level එකත් එක්ක. මොකද හේතුව ස්වාමීනි, underworld එකේ මිනිහෙක් වෙඩි තිබ්බා කියලා ඒ ගොල්ලෝ කිව්වා නේ කථා කරලා. එහෙම එකක් වෙලා නැහැ පලයල්ලා භය නැතුව කියලා තව කණ්ඩායමක් මට යවන්න පුළුවන් වාතාවරණයක් තිබුණේ නැහැ. මොකද, නිලධාරීන්ගේ ජීවිත නැති වුණොත් ඒක වග කීමක් වනවා නේ.

ප්‍ර: ඒක ඇත්ත වශයෙන්ම සංවිධානාත්මක අපරාධකාරයෝ වෙඩි තියලා ඒ වෙඩිල්ලකින් පොලිස් සැරයන් උපුල්ව ඝාතනය කළා නම් ඒ හේතුවෙන් ඔය විමර්ශන සංවිධානය ඔබතුමා කරන්න පටන් ගත්ත කර්තව්‍ය සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටුණා නම් සංවිධානාත්මක අපරාධකාරයෝ ජයග්‍රහණය කරලා තිබෙනවා?

උ: ඔව්, ඒ ලැයිස්තුවේ කට්ටිය අල්ලන එක break වුණා එතැනින්. නමුත්, යුක්තියේ මෙහෙයුම මත්ද්‍රව්‍ය වැටලීම කරන එක අපි නතර කළේ නැහැ. මාතර ප්‍රදේශයේ වැඩ නැවැත්වූයේත් නැහැ. නමුත්, මේ ලිස්ට් එක ඔස්සේ මිනිසුන් අත්අඩංගුවට ගැනීම break වුණා. එය මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ට ලැබිච්ච ජයග්‍රහණයක් විධියට සලකන්න පුළුවන්.

ප්‍ර: එහෙම බැලුවාම හරක් කටාගේ ජාලය සම්බන්ධව කරන විර්මශනය පවත්වාගෙන යන්න කලින් ඒ වෙඩි තියපු එක ගැන විර්මශනය කරලා මොකක් හරි කරන්න ඕනෑ?

උ: අනිවාර්යයෙන්ම කවුරු හරි මිනිහෙක් වෙඩි තියලාද, එහෙම නැත්නම් මිනිහා තිබ්බේ නැහැ කියන කථාව ඇත්ත ද කියන එක තහවුරු කර ගත යුතු වනවා.

වෙඩි තැබීමේ සිද්ධියෙන් පසු කොළඹ අපරාධ කොට්ඨාශ වෑන් රථය එහි පැමිණි විට, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන්ගේ සාක්ෂි සමඟ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා වග උත්තරකාර පොලිස්පතිවරයාට කරුණු ඉදිරිපත් කළ විට, කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ සාමාජිකයින් අධිවේගී මාර්ග පිවිසුමේ පොලිස් නිලධාරීන්ට වෑන් රථය තුළ වෙඩි වැදී තුවාල ලැබූ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු සිටින බවත්, විශේෂයෙන් තුවාල ලැබූවන්ගෙන් එක් අයෙකුගේ තත්ත්වය බරපතල බවත් හෙළි කිරීමට අපොහොසත් වීම කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ සාමාජිකයින්ගේ පාර්ශවයෙන් සැක සහිත හැසිරීමක් බව වග උත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන තිබේ. තවද, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන්ගේ හැසිරීම සැක සහිත නොවන බව වග උත්තරකාර පොලිස්පතිවරයා පැහැදිලිවම ප්‍රකාශ කර ඇත. ප්‍රාදේශීය පොලිස් බලධාරීන්ට දැනුම් නොදී වැලිගමට යන ලෙස කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) නිලධාරීන්ට කිසි විටෙකත් උපදෙස් නොදුන් බව වග උත්තරකාර පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත.

වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල්ට ත්‍යාග පිරිනැමීමේ සඳහා ඔහු විසින් ලබා දුන් අනුමැතිය සම්බන්ධයෙන් වග උත්තරකාර පොලිස්පතිවරයා පැවසූ පරිදි වර්තමානයේ පවා මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් මහතාට ත්‍යාග පිරිනැමීමේ කිසිදු වරදක් නොමැති බවයි. මෙය පහත ප්‍රශ්නෝත්තර වලින් පිළිබිඹු වේ:

ප්‍ර: අවුරුදු එකහමාරකට පස්සේ ඒ දෙස බලන කොට මේ නිලධාරින්ගේ ක්‍රියාකාරිත්වය ගැන ප්‍රශ්න සහගත බවක් පේන්නේ නැත්ද?

උ: මට තවම එහෙම පේන්නේ නැහැ. එයට හේතුව වශයෙන් අද උදෙත් මම කරුණු දැක්වූවා. ඔවුන් දැනට සිටින තත්ත්වයත් ඉදිරියේදී නැවත වෙනස් කරයි කියලා දැඩි විශ්වාසයක් මට තිබෙනවා.

රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදුණු වැලිගම පොලිස් නිලධාරීන්ට හෝ කොළඹ අපරාධ කොට්ඨාශයේ අනෙකුත් සාමාජිකයින්ට ත්‍යාග පිරිනැමීමට කිසිදු පියවරක් නොගත්තේ මන්දැයි උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා වග උත්තරකාර පොලිස්පතිවරයාගෙන් විමසූ විට, වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වූයේ අණදෙන නිලධාරියා යටතේ සිටින අය විසින් එවැනි අයදුම්පතක් ඉදිරිපත් කර නොමැති බවයි. තවත් අවස්ථාවක, සිද්ධියට සම්බන්ධ පොලිස් නිලධාරීන්ගේ ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය හෝ නීති විරෝධීභාවය පිළිබඳ අවසාන නිගමනයක් නොමැති බැවින් එවැනි පිරිනැමීම් සිදු කළ නොහැකි බව වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය විය. එසේ නම්, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් සඳහා පමණක් ත්‍යාගය අනුමත කළේ මන්දැයි විමසූ විට, විමර්ශන

කම්ටුවට පිළිගත හැකි කිසිදු විශේෂත්වයක් /පැහැදිලි කිරීමක් ලබා දීමට වග උත්තරකාර පොලිස්පතිවරයා අපොහොසත් වී ඇත. හරස් ප්‍රශ්න ඇසීමේදී ඔහුගේ සාක්ෂි වලින්ම උපුටා ගන්නා ලද පහත උපුටා දැක්වීමෙන් මෙම ස්ථාවරය පිළිබිඹු වේ:

උ. ඒවා විමර්ශනයට භාජනය වෙනවා ස්වාමීනි. ඒ ප්‍රශ්නගත අවස්ථාවල් විමර්ශනයට භාජනය වෙලා, ක්ලියර් එකක්, තීරණයක් ඇවිල්ලා ඒ ඉන්ක්වයරි කරන කට්ටිය ගෙන්වලා මේ ගොල්ලන් මේ මේ කරුණු අනුව කියලා තිබෙන්නේ බොරු, මේක නොවෙයි මෙතැන වෙලා තිබෙන්නේ කියලා.

ප්‍ර. කවුද ඒවා විමර්ශනය කළේ?

උ. මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ පූර්ණ අධීක්ෂණය යටතේ ASP වැලිගම තමයි ඔය ඉන්ක්වයරිය හැන්ඩල් කරලා තිබෙන්නේ.

***

ප්‍ර දේශබන්ධු මහත්මයා, 31 වෙනකොට සම්පූර්ණ රාජ්‍ය යාන්ත්‍රණය සහ ඔබ දෙපාර්තමේන්තුව මිය ගිය උපුල් කියන නිලධාරියා පොලිස් දෙපාර්තමේන්තුවේ වීරයෙක් කරලා 3 වැනිදා වන කොට උසස් වීමකටත් නිර්දේශ වෙලා ඉවරයි?

උ. ඔව්.

ප්‍ර. නමුත්, ඒ හා සමගාමීව ඒකාබද්ධ යුද හමුදා පොලිස් කණ්ඩායමකුත් වැලිගම හිටියා, මේකට සම්බන්ධ වෙච්ච?

උ. 'යුක්තිය' මෙහෙයුම යටතේ ආවේ කියලා ඒ ගොල්ලන් කියලා තිබෙනවා.

ප්‍ර. ඔබතුමාගේ මෙහෙයුම යටතේ තව කට්ටියක් හිටියා?

උ. ඔව්.

ප්‍ර. දැන් ඒ අයට කිසි ඇගැයීමක් වුණේ නැහැ?

උ. ස්වාමීනි, ඔබතුමාට මම පැහැදිලිව කියන්න ඕනෑ. මියගිය නිලධාරියා කොළඹ අපරාධ කොට්ඨාසයට අනුයුක්තව හිටපු නිලධාරියෙක්. ඔහු කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) commander හැටියට හිටපු නිලධාරියෙක්. ඒ නිසා එයාට මැරුණාට පස්සේ reward එකක් දීම initiate කරලා තිබෙනවා කියලා කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ OIC සහ director ඒ ක්‍රියාවලියේ, - වැලිගම පොලිසියේ නිලධාරීන් අගයලා ඔහු හමුදා නිලධාරියෙකුටත් reward දෙන්න පුළුවන්. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙම initiate කරනවා නම් HOI වැලිගම ඒක initiate කරලා, ASP වැලිගම, SSP මාතර DIGලා හරහා මට ආවා නම් reward එකක් දෙන්න කියලා

ඒ ගොල්ලන් කරලා තිබෙන ක්‍රියාවලිය යහපත් තත්ත්වයක් තිබුණා නම් මට ඒකටත් දෙන්න තිබුණා. නමුත්, මේකේ මැරුණු මනුස්සයාට හැර ඒ ගිය team එකේ අනෙක් මිනිස්සුන්ටවත් ඒ ගොල්ලන් යෝජනාවක් ගෙනැල්ලා නැහැ. reward එකක් දෙන්න කියලා.

ප්‍ර. ඒක තමයි. මම ඔබට යෝජනා කරන්නේ කොළඹ අපරාධ කොට්ඨාසයේ ස්ථානාධිපතිගේ ක්‍රියා කලාපයම අස්භාවිකයි කියලා. මොකද, තුවාල වෙච්ච මිනිහාට ඉල්ලන්නේ නැහැ.

උ. ගරු ඔබතුමාගේ අවධානයට මම යොමු කරනවා, එදා reward application එකේ මේ මනුස්සයාට ලක්ෂ 15ක් දීලා ඇන්සලම් ද සිල්වා ඇතුළු අනෙක් කණ්ඩායමේ මිනිස්සුන්ටත් ලක්ෂ 5 ගානේ දුන්නේ නැත්තේ ඇයි කියලාද ඔබතුමා අහන්නේ.

ප්‍ර. දෙන්න ඕනෑ කියලායි මම කියන්නේ?

උ. ඇයි ඒ? අද ඔබතුමාම තර්ක කරනවා, අර මනුස්සයාට ලක්ෂ 15 ක් දුන් එක වැරදියි කියලා.

ප්‍ර. නැහැ. නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර. මම හිතන්නේ, එතුමා ඒ ප්‍රශ්නය ඇහුවේ ඔබතුමාගේ ස්ථාවරය ඒක නම් මිය ගිය,?

උ. ඔහු මිය ගිය නිසා පමණයි ස්වාමීනි, ඔහුට ලක්ෂ 15 ක් දුන්නේ. මේ ප්‍රශ්නයට අදාළ විමර්ශනයක් යනවා, විමර්ශනයෙන් මොකක් හරි තීරණයක් එනකල් මේකට අදාළ කිසි කෙනෙකුට ගෙව්වේ නැහැ. උපුල් කියන නිලධාරියාත් මැරුණේ නැත්නම් එයාට මේ reward එක දෙන්නේ නැහැ.

ප්‍ර. දැන් ඔබතුමාටම සැකයක් තිබෙනවා. මියගිය කෙනාට ගෙවනවා, compensation-?

උ. ඔව්.

ප්‍ර. ඊට පස්සේ ඔබතුමා කියනවා, අනෙක් තුවාල ලැබූ සහ වීර ක්‍රියාවක් කරපු කට්ටියට විමර්ශනයක් තියලා ගෙවන්න ඕනෑ කියලා. ඔබතුමා මියගිය අයටත් විමර්ශනයක් තියාගෙන මේකේ හරි වැරදි තෝරාගෙන ගෙව්වොත් හොඳයි කියන එක හිතුවේ නැද්ද?

උ. මම කිසිසේත් ඒ විධියට හිතන්නේ නැහැ, ස්වාමීනි. සිද්ධියකින් ඒ නිලධාරියා ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. ඒ ඉදිරිපත් වෙච්ච කරුණු කාරණාවල ඒ මැරුණු පුද්ගලයා වරදක් කළා කියලා කිසිම ආකාරයකින් සටහනක් වෙන්නේ නැහැ. කොළඹින් මේ ගොල්ලන්ව වාහනයට දමාගෙන අරගෙන ගිහිල්ලා තිබෙන්නේ?

කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායම W15 හෝටලය ඉදිරිපිටදී නාඳුනන තුවක්කුකරුවෙකු අත්අඩංගුවට ගැනීමට උත්සාහ කළ අවස්ථාවේදී ඔහු විසින් කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් වෙඩි තබා ඝාතනය කළ හේතුව පදනම් කරගනිමින් මෙම ත්‍යාගය අනුමත කර පිරිනමාඇත. කෙසේ වෙතත්, 2023-12-31 දින පෙ.ව. 6.00 වන විට වග උත්තරකාර පොලිස්පතිවරයාට වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ සාමාජිකයෙකු ලෙස සිටියදී ඔහුගේ T56 තුවක්කුවෙන් වෙඩි තැබූ හමුදා සැරයන් රුවිරංගගෙන් කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් සහ උප පොලිස් පරීක්ෂක මධුරංග වෙඩි වැදී තුවාල ලබා ඇති බව නිශ්චිතවම දැන ගැනීමට හැකි වූ බව පිළිගත යුතුය. ඔහුගේ පරස්පර විරෝධී ස්ථාවර දෙක සලකාබලන විට , වග උත්තරකාර පොලිස්පතිවරයා පහත පරිදි ප්‍රකාශ කර තිබුණි:

ප්‍ර. P2 තැගි වවුවරයේ තිබෙන්නේ පොලිස් සැරයන් උපුල් කියන නිලධාරියා නාඳුනන තුවක්කුකරුවකුගේ වෙඩි පහරින් මිය ගියා කියලානේ?

උ. එහෙමයි.

ප්‍ර. ඒකේ සත්‍යතාවක් නැහැ නේ?

උ. ඒකේ සත්‍යතාව පිළිබඳ තවම නිලධාරින් කථා කරලා කියලා තිබෙනවා මොබයිල් එකෙන් වෙඩි තියලා තමයි මේවා වුණේ කියලා. ඒකේ ගැටලු සහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත්, අපට final තීරණයකට එන්න බැහැ. මොකද, නාඳුනන මිනිස්සු තිබ්බා කියන කාරණාව තවම නිෂේධ වෙලා නැහැ.

කෙසේ වෙතත්, වැලිගම පොලිස් ස්ථානය විසින් මේ දක්වා සිදු කරන ලද විමර්ශනයෙන් එවැනි කිසිදු ස්ථාවරයක් නිසැකවම තහවුරු කර නොමැති බව වග උත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන ඇත.

තවදුරටත් ප්‍රශ්න කළ විට, 2023-12-31 වන විට කුමන ප්‍රකාශය නිවැරදිද යන්න පිළිබඳව නිශ්චිත සොයාගැනීමක් නොමැති බව වග උත්තරකාර පොලිස්පතිවරයා අකමැත්තෙන් වුවත් පිළිගෙන ඇත. නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තැබූ බවට වන ප්‍රකාශය මත රඳා පැවතීමට වග උත්තරකාර පොලිස්පතිවරයා දැක්වූ උනන්දුව සහ කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන්ට තුවාල සිදු කළේ කුමන වෙඩි තැබීමෙන් ද යන්න පිළිබඳව ඔහුගේ සාක්ෂි අතරතුර සටහන් කර ඇති පහත ප්‍රශ්න සහ පිළිතුරු වලින් පැහැදිලි වේ.

ප්‍ර. ඒක පැත්තකින් කියන්න. ඒක නොවෙයි. අපි තීරණය කරන්නේ මේකනේ. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකෙන් මුලදී කියපු කතන්දරය විශ්වාස කරන්න, ඒ ගොල්ලන් කියපු ප්‍රකාශය හැර - ඇත්තටම ඔව්, ඒක එහෙම වෙන්න පුළුවන් කියලා හිතන්න වෙන බාහිර සාක්ෂියක් ස්වාධීන හෝ තහවුරු වෙන සාක්ෂියක් නැද්ද?

උ. ඒ ගොල්ලන් මුලින් කියපු කථාව පිළිගන්නත්, ඒ ගොල්ලන් කරන හුදු ප්‍රකාශ හැරෙන්න අපිට වෙන දේකුත් නැහැ. ඒ ගොල්ලන් දෙවැනියට කියපු ස්ථාවරයක් හරි කියලා පිළිගන්නත් ඒ ගොල්ලන් කියන කථාව හැර වෙන කථාවක් නැහැ. සාක්ෂියක් විධියට.

ප්‍ර. එතකොට ජංගම මුර සංචාරයේ යෙදුණු අයගේ ප්‍රකාශ?

උ. ජංගම මුර සංචාරයේ යෙදුණු අය කියන්නේ, - තුන්වැනි පාර්ශ්වයක් වෙඩි තැබුවාය කියන කථාව.

ප්‍ර. ඒ ගොල්ලන් කියන්නේ නැහැනේ? ජංගම මුර සංචාරයේ යෙදුණු කට්ටිය කියන්නේ නැහැනේ?

උ නැහැ. ජංගම මුර සංචාරයේ යෙදුණු අය කියන්නේ නැහැ. ස්වාමීනි. මේගොල්ලන් කථා කරලා කිව්වානේ, අපට ඉස්සෙල්ලාම පාතාලයේ කට්ටියක් වෙඩි තිබ්බාය කිව්වානේ. ඒක එහෙම වුණා කියන්නත් සාක්ෂියක් නැහැ. නොවුණා කියන්නත් සාක්ෂියක් නැහැ, ස්වාමීනි.

ප්‍ර. එහෙම වුණාය කියලා සාක්ෂියක් නැහැ?

උ. නැහැ.

ප්‍ර: මම මේ කථා කරන්නේ අනිත් පැත්තට. ජංගම මුර සංචාරයේ කට්ටිය ඒ වෙලාවේම එතැනට ආපු කට්ටියක්.

උ. ඔව්.

ප්‍ර. ඒ ගොල්ලන් එහෙම එකක් කියන්නේ නැහැ?

උ. එහෙම එකක් කියන්නේත් නැහැ.

ප්‍ර. ඒ ගොල්ලත් මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යටතේ ඉන්නා කට්ටිය. HIQ මහත්තයා යටතේ ASP අරුණලාල් යටතේ ඉන්නා කට්ටිය?

උ. ඔව්.

ප්‍ර. ඒ ගොල්ලන් ඉස්සරවෙලාම එතැනට ආවේ?

උ. ඔව්.

ප්‍ර. ඒ විතරක් නොවෙයි, වෙඩි තිබ්බේ?

උ. ඔව්.

ප්‍ර. වෙඩි තිබ්බේ, වෙඩි තියමින් ඉන්නා කට්ටියකට? කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටියට?

උ. ඒ ගොල්ලන් -

ප්‍ර. මොකද, නැද්ද?

උ. වීදුරුව ඇතුළෙන් වෙඩි තබන අවස්ථාවේ ගිනි පුපුරු යනවා කියලා දැක්කා. නමුත් වාහනය නතර කරන අවස්ථාවේදී වෙඩි තැබීම අවසන් වෙලා තිබුණා.

ප්‍ර. ඒක හරි. හැබැයි, වෙඩි තියමින් හිටියා දැක්කා?

උ. ඒ ගොල්ලන් දැක්කා කියලා කියනවා. ඒ ගොල්ලන්ගේ නිලධාරීන් දැක්කා කියලා කියනවා.

ප්‍ර. සාක්ෂි හරින්නේ එතකොට?

උ. ඔව්.

ප්‍ර. ඒ වෙඩි පහරවල් වැදිච්ච කෙනෙක් හිටියේ නැහැ? කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය තියපු වෙඩි පහරවල් වැදිච්ච මිනිහෙක් හිටියේ නැහැ?

උ. ඔව්. ඉතින් තුවාල වෙලාවත්. මැරිලාවත් නැහැනේ ඒ වෙලාවේ.

ප්‍ර. හැබැයි, වෙඩි පහරවල් හෝටලයට වැදිලා තිබෙනවා? ප්‍ර:

උ. ඔව්.

ප්‍ර. මිනිහෙක් අල්ලා ගෙන නැහැ. පැනලා ගියපු මිනිහෙක් පස්සේවත් අල්ලාගෙන නැහැ.

උ. ඔව්.

ප්‍ර. කවුරුවත් එහෙම දැකලාය කියන්නේත් නැහැ?

උ. සිසිඩී එකෙන් වෙඩි තියලා තියනවා.

ප්‍ර. මොබයිල් එකේ කට්ටිය ඒක දැකලා තිබෙනවා?

උ. ඔව්. ස්වාමිනි.

ප්‍ර. වෙඩි වැදිලා හානි වෙලා තිබෙනවා, හෝටලයට?

උ. ඔව්. ස්වාමිනි.

ප්‍ර. ඒවායෙන් සාමාන්‍යයෙන් අදහස් වෙන්නේ නැද්ද, මොබයිල් එකේ team එක කියන එක වැඩිය වෙන්න පුළුවන් කියලා?

උ. එහෙම එකක් ස්වාමීනි, මට තීරණය කරන්න බැහැ. නමුත් ඒ මොබයිල් එකේ කියන කට්ටිය -

ප්‍ර. නැහැ, තීරණය කරන්න නොවෙයි.

උ. මොබයිල් එකේ කට්ටිය තියපු වෙඩි පහරවල් තමයි කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ වාහනයේ හිටපු මිනිස්සුන්ට වැදුණේ කියන කථාව පිළිගන්න පුළුවන්. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ වාහනය ඇතුළේ හිටපු මිනිස්සුන්ට වැදුණේ මොබයිල් එකේ මිනිස්සු තියපු වෙඩි පහරවල් කියන එක විශ්වාස කරන්න පුළුවන්.

ප්‍ර. මම අහන්නේ මෙන්න මේ ප්‍රශ්නය. ඔය කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටියත් පොලිස් නිලධාරින්.

උ. ඔව්.

ප්‍ර. මොබයිල් එකේ කට්ටියත් පොලිස් නිලධාරින්.

උ. එහෙමයි, ස්වාමීනි.

ප්‍ර. ඔය විමර්ශනය කරපු හෝ නොකරපු හෝ අයත් පොලිස් නිලධාරින්.

උ. ඔව්, ස්වාමීනි.

ප්‍ර. මහත්මයා, පොලිස්පති.

උ. ඔව්.

ප්‍ර. එවකට වැඩබලන පොලිස්පති.

උ. ඔව්.

ප්‍ර. ඒ කියන්නේ අන්තිම බලධාරියා. ඊට ඉහළින් එක් කෙනෙක් නැහැනේ පොලීසියේ? එතකොට පොලීසියේ නිලධාරින් කොට්ඨාස දෙකක්, දෙකක් කියනවා.

උ. ඔව්.

ප්‍ර. එකකට එකක් විරුද්ධයි.

උ. එකකට එකක් විරුද්ධයි කියන මතයට ස්වාමීනි, - මොකද, මුල් අවස්ථාවේදී වැලිගම පොලීසියේ කට්ටිය කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටියට නොහඳුනන පුද්ගලයෙක් වෙඩි තැබුවාය කියන ස්ථාවරය ප්‍රතික්ෂේප කර තිබුණේ නැහැ.

ප්‍ර. කවුද, ප්‍රතික්ෂේප කළේ නැත්තේ?

උ. වැලිගම පොලීසියේ කට්ටිය. වැලිගම පොලීසියේ මොබයිල් එකේ කට්ටිය අර මුල් අවස්ථාවේදී

ප්‍ර. ඒ ගොල්ලන් එහෙම එකක් දැකලා නැහැ.

උ. ඒක තමයි. එහෙම එකක් දැකලා නැහැ. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය කිව්වා, මේ පැත්තට එල්ල කරලා වෙඩි තිබ්බා කියලා.

ප්‍ර. ඒක තමයි මම කියන්නේ. ඒ ගොල්ලන් එහෙම එකක් දැකලා නැහැ.

උ. දැකලා නැහැ කියලා පිළිගන්නවා.

ප්‍ර. ඒ ගොල්ලන් එහෙම එකක් දැකලා නැත්නම් - මම මේ අහන ප්‍රශ්නය ගැන පොලිස්පතිතුමා විධියට හිතන්න.

උ. හරි.

ප්‍ර. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ නිලධාරින් කොළඹ ඉඳන් ඇවිල්ලා එක්කෝ හෝටලයට හෝ පැනලා ගියපු පුද්ගලයෙකුට හෝ කාට හෝ වෙඩි තියපු කට්ටිය.

උ. ඔව්.

ප්‍ර. බැලූ බැල්මට ඒ ගොල්ලන්ට හේතුවක් නැහැ.

උ. ඔව්.

ප්‍ර. වෙඩි තැබීමට හේතුවක් නැහැ.

උ. ඔව්.

ප්‍ර. ඒ වාගේම වෙඩි තියලා මැරිච්ච කෙනෙකුත් නැහැ.

උ. ඔව්.

ප්‍ර. මොබයිල් එකේ කට්ටිය - වැලිගම මොබයිල් එකේ කට්ටිය එහෙම නොවෙයි. ඒ ගොල්ලන් සම්පූර්ණයෙන්ම ස්වාධීන කණ්ඩායමක්.

උ. ඔව්.

ප්‍ර. ඒ ගොල්ලන් දන්නේ නැහැනේ, මෙතැන මොකක්ද කියලා. පොලීසියේ, කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටියක් ඉන්නවා ද කියලා දන්නේත් නැහැ.

උ. එහෙමයි. ස්වාමිනි.

ප්‍ර. දන්නවා නම් වෙඩි තියන්නේ නැහැනේ.

උ. ඔව්.

ප්‍ර. ඒ ගොල්ලන් හිතුවේ මේ ගොල්ලන් පාතාලයේ කට්ටියක් කියලා. එතකොට ඒ ගොල්ලන් වෙඩි තිබ්බා.

උ. එහෙමයි. ස්වාමීනි.

ප්‍ර. එතකොට කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ එක් කෙනෙක් මැරුණා.

උ. එහෙමයි. ස්වාමීනි.

ප්‍ර. ඒ ගොල්ලන් දකින්නේ නැහැ. පැනලා ගියපු පුද්ගලයෙක් මහත්මයා පොලිස්පති විධියට, ඔය කියන කණ්ඩායම් දෙකේම නායකයා විධියට මොබයිල් එකේ කණ්ඩායම කියන එක ඒ විධියට වෙන්න පුළුවන් කියලා මහත්මයාට හිතුණේ නැද්ද?

උ. ස්වාමීනි, වැලිගම පොලිසියෙන් ඔය මොබයිල් එක පොලිසියේත් ස්ථානාධිපති තමයි වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක, ඔහු ඒ ගොල්ලන්ගේ මේ සිද්ධියෙන් පස්සේ 31 වැනිදා උදේ 6-7 වෙන කොට ලිඛිතව පණිවුඩයක් ලබා දීලා තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය ඇතුළු තවත් වගකිව යුතු ආයතන ගණනාවකට, එහිදී ඔහු මේ සිද්ධිය සම්බන්ධව කියා තිබෙන්නේ ඒ වෙන කොට වැලිගම පොලීසිය දරපු ස්ථාවරය. ඔබතුමා සඳහන් කළා වාගේම වැලිගම පොලිසියේ මොබයිල් එකෙන් මේ මනුස්සයෙකුට වෙඩි තියලා ඒ කෙන් තමයි මේ අය

තුවාල වුණේ කියන කාරණාව සඳහන් වෙනවා. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ වාහනයේ හිටපු කට්ටිය ඒ ගොල්ලන්ට හඳුනන්නේ නැති පුද්ගලයෝ කණ්ඩායමක් වෙඩි තිබ්බා කියලා කියනවා; ප්‍රකාශ කරනවා. මේක සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා තිබෙනවා කියලා දැනුම් දීලා තිබෙනවා. ඒක තමයි ඔවුන්ගේ ස්ථාවරය වෙලා තිබෙන්නේ. ඒ නිසා මට මේ කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය බොරු කියන්නේ. වැලිගම කට්ටිය තමයි ඇත්ත කියන්නේ කියලා එතැනදී වෙනසක් හඳුනා ගන්න බැහැ. නමුත් වැලිගම කට්ටිය කියන ප්‍රකාශයත් සත්‍යයි. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය කියන කථාවත් සත්‍යයි කියන එක තමයි මගේ ස්ථාවරය වුණේ.

ප්‍ර. වැලිගම මොබයිල් එකේ කට්ටිය කියන එක සත්‍යයක් නම්, කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කණ්ඩායම මුලදී කියපු එක අසත්‍යයක් නම්, කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කණ්ඩායම අනිවාර්යයෙන්ම නීත්‍යානුකූල නොවන දෙයක් කර තිබෙන්නේ? ඒක හරිද?

උ. ස්වාමිනි, ඒකට මම පිළිතුරක් දෙන්නේ, මම ඒ වන විට හෝ මගේ වාරණ නියෝගය ලැබෙන තාක්කල් කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය අසත්‍යයක් කිව්වේ කියන කාරණාව සම්බන්ධයෙන් මගේ කිසිම දැනුමක් නැහැ. එදාට පසුව තිබුණු තත්ත්වයක් පිළිබඳව තමයි ඔබතුමා මගෙන් විමසීමක් කරන්නේ. ඒ කියන්නේ කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය කිව්වේ බොරුවක් කියලා -

ප්‍ර. නැහැ. ඒ දෙකම නොවෙයි. මම කියන්නේ '' නම් ''; "if" -

උ. බොරුවක් නම් ඉතින් ඒක

ප්‍ර. එච්චරයි. ඔබතුමා ගත් මතය නොවෙයි.

උ. බොරුවක් නම්, ඒක වැරදියි කියන එක පිළිගන්නවා.

ප්‍ර. ඒක නීත්‍යානුකූල නොවන ක්‍රියාවන්නේ?

උ. බොරුවක් නම් -

ප්‍ර. ඔක ඇත්තක් ද, බොරුවක්ද කියලා හොයා ගන්න නම් විමර්ශනයක් කරන්න වෙනවා.

උ. අනිවාර්යයෙන්ම.

ප්‍ර. ඒ විමර්ශනය වැලිගම - වැලිගම පොලීසිය මාතර පොලීසිය යටතේ තිබෙන්නේ?

උ. ඔව්.

ප්‍ර. එතකොට ඒක එක පැත්තක්.

උ. ඔව්.

ප්‍ර. කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එක තව පැත්තක්.

උ. ඔව්.

ප්‍ර. එතකොට වැඩියෙන්ම හොඳ ක්‍රියාව තමයි ඔය දෙකටම නැති ස්වාධීන unit එකකට ඕක භාර දෙන එක.

උ. මට ඒ වෙලාවේ එහෙම දෙයක් හිතුණේ නැහැ. මොකද, හේතුව ස්වාමීනි, කවුරුවත් කියලා තිබුණේ නැහැ, - මේ කරන විමර්ශනය පිළිබඳ සැක පහළ කරලා තිබුණේ නැහැ. අඩුම ගණනේ මාතර මහෙස්ත්‍රාත්වරයාට ඔය CCTV අරගේ මෙහේ කථාවක් තිබුණා නම්, මේක වෙන බාහිර එකකට දමන්න කියලා මට කිව්වා නම්, අනිවාර්යයෙන්ම ප්‍ර: මම නොකර ඉන්නේ නැහැ. මොකද, හේතුව මට කිසිම කෙනෙක්ගෙන් - මම කොළඹ ඉන්නේ. මට නිරීක්ෂණය වුණේත් නැහැ. එහේ හිටපු අයට නිරීක්ෂණය වෙලාත් නැහැ, එහෙම අවශ්‍යතාවක් තිබෙනවා කියලා.

ප්‍ර. වැලිගමින් හෝ මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් හෝ ඔය සිද්ධිය සම්බන්ධයෙන් කරපු විමර්ශන කොච්චර කාලයක් විතර තිස්සේ කරගෙන ගියාද, සාමාන්‍ය තත්ත්වයකට එන්න?

උ. සාමාන්‍යයෙන් මාසයක විතර වාගේ කාලයක්.

ප්‍ර. එතකොට ඒක ඉවර වුණාද? එහෙම නැත්නම් ඊට කලින් CID එකෙන් භාර ගත්තාද?

උ. නැහැ. ඒක දිගටම කෙරෙමින් පැවතුණා. මාසයක් විතර වෙනකම් ස්පීඩ් ගිහිල්ලා ඊට පසුව තව තව අලුතින් සිදුවීම් එද්දී ඒක ටිකක් උදාසීන ස්වරූපයෙන් ඇදි ඇදී තිබුණා, ස්වාමීනි.

ප්‍ර. ඔය විමර්ශනයෙන් ප්‍රතිඵල දෙකක් වෙන්න පුළුවන්. එකක් තමයි සීසීඩී එකේ කට්ටිය කරපු දේ නීත්‍යානුකූල නොවෙයි කියන එක.

උ. ඔව්.

ප්‍ර. එහෙම නැත්නම් කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) එකේ කට්ටිය ඇත්තටම නීත්‍යානුකූල වැටලීමකට ඇවිල්ලා, ඔය කියපු විදියට නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි පහරට ලක්වුවා කියන එක. ඔය දෙකෙන් එකක්නේ, වෙන්න පුළුවන්.

උ. ඔව්.

ප්‍ර. ඒ දෙකෙන් එකක්වත් හොයා ගෙන නැහැනේ, 31 වෙනකොට?

උ. ඔව්.

ප්‍ර. මොකද, විමර්ශන මාසයක් විතර ගියා නේ?

උ. ඔව්. අපිට අපේක්ෂා කරන්නත් බැහැ ස්වාමීනි, ඒ වාගේ දවස් 2ක් ඇතුළත ඇවිල්ලා ඕකටත් තීරණයක් හොයාගන්න පුළුවන් වෙයි කියලා.

වගඋත්තරකාර පොලිස්පතිවරයා ද පිළිගෙන ඇත්තේ 2023-12-31 දින අපරාධය සිදු වූ ස්ථානයට වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා නොපැමිණි බවයි. එයට හේතුව ලෙස ඔහු දක්වන්නේ වැලිගම පොලිස් ස්ථානය විසින් පවත්වන ලද විමර්ශනවලට බලපෑම් කළ බවට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට අභූථ චෝදනා එල්ල වීමට ඇති හැකියාවයි. කෙසේ වෙතත්, මෙම වෙඩි තැබීමේ සිද්ධියේදී වෙඩි තැබූ බවට ප්‍රකාශ කළ පාර්ශව දෙකක් තිබේ. එක් පාර්ශවයක් වන්නේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයයි. අනෙක් පාර්ශවය වන්නේ සීඅයි ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් සීසීඩී කණ්ඩායමයි. වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ ප්‍රකාශය වන්නේ W15 හෝටලයට වෙඩි තැබූ පුද්ගලයින් කණ්ඩායමකට ඔවුන් වෙඩි තැබූ බවයි, එයට හේතුව ලෙස දක්වන්නේ හෝටල් ඔවුන් හිමියන්ගෙන් කප්පම් ගැනීමට තැත් කළ බවට ඇති වූ සැකයයි.

වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම වැලිගම පොලිස් ස්ථානයේ කොටසකි. වැලිගම රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය එහි පැමිණීමෙන් පසු කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායම එම ස්ථානයෙන් පලා යාම වැරදි බව වග උත්තරකාර පොලිස්පතිවරයා පවා දැන් පිළිගෙන ඇත. 2023-12-31 දින පෙ.ව. 6.00 වන විට පොලිස් සැරයන් සිසිර කුමාර සහ හමුදා සැරයන් රුචිරංග වැලිගම අපරාධ ස්ථානාධිපතිවරයාට සාක්ෂි ලබා දුන්නද, වැලිගම පොලිස් ස්ථානය කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන්ට එරෙහිව වැඩිදුර පරීක්ෂණයක් හෝ පියවරක් ගෙන නොමැත. ඔවුන් 2023-12-31 දිනම නිදහස් කර ඇත. විමර්ශන සිදුවෙමින් පවතින බව වග උත්තරකාර පොලිස්පතිවරයා තවමත් පවසයි. එම පරීක්ෂණයෙන් ලැබී ඇති ප්‍රතිඵල ඔහු නොදනී. ස්වාධීන ඒකකයක් මගින් සිදු කිරීමට පරීක්ෂණයක් යොමු නොකළේ මන්ද යන්න පිළිබඳව හේතුවක් ලබා දීමටද වග උත්තරකාර පොලිස්පතිවරයා අපොහොසත් වී ඇත. මෙම වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනය භාර ගැනීමට ස්වාධීන විමර්ශන ඒකකයක් මෙහෙයවීමට එකල වගඋත්තරකාර පොලිස්පතිවරයා අපොහොසත් වීම පමණක් නොව, එවැනි උපදෙස් ලබා දීමට තමා කටයුතු නොකිරීම ඔහු තවමත් සාධාරණීකරණය කරන නිසා තත්වය තව දුරටත් බරපතල වේ.

P-45, P-46, P-47 සහ P-48 සම්බන්ධයෙන්, වග උත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වනුයේ සිද්ධිය පිළිබඳව නියෝජ්‍ය පොලිස්පතිවරයා තමාට දැනුම් දුන් කරුණු ජාතික පොලිස් කොමිසමට දැනුම් දුන් බවය. වත්මන් වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය විසින් ජාතික පොලිස් කොමිසමට ඉදිරිපත් කරන ලද වාර්තා වන P-49 සහ P-50 ඉදිරිපත් කළ විට, ඔහු පහත පිළිතුර ලබා දුන්නේය:

ප්‍ර. P49 සහ P50 කියන ලේඛන බලන්න, වර්තමාන වැඩබලන පොලිස්පති ප්‍රියන්ත වීරසූරියට විමසා තිබෙන ලේඛනය සහ ඔහුගේ ප්‍රතිචාරය. ඔබතුමා ඒ දෙකේ යම්කිසි වෙනසක් දකිනවාද? වර්තමාන වැඩ බලන පොලිස්පතිවරයා දීර්ඝ විමර්ශන ප්‍රගතියක් -

උ. ඔහු ඒ වාර්තාව යවලා තිබෙන්නේ අර සිද්ධියට සම්බන්ධ වුණු නිළධාරින් විසින් CID විමර්ශනය ආරම්භ කළාට පස්සේ ලැබුණු ප්‍රකාශ වලින් අනාවරණය වුණු කරුණු. එවැනි නිලධාරීන් විසින් කරන ප්‍රකාශයක්, මා රාජකාරි කළ කාල සීමාව තුළ එවැනි ප්‍රකාශයක් ගිහින් තිබුණේ නැහැ. එහෙම එකක් තිබුණා නම් සමහර විට මමත් එවැනි වාර්තාවක් එවන්න තිබුණා.

ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා (WP PK-7225 වැන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ කණ්ඩායම් නායකයා) විසින් දරන ලද ස්ථාවරය නම්, 2023-12-31 දින රාත්‍රියේ වැලිගම W15 හෝටලයට වෙඩි තැබීමේ නීති විරෝධී මෙහෙයුමක් ඔවුන් සිදු කළේ වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් ඒ සම්බන්ධයෙන් ඔවුන්ට ලබා දුන් නීති විරෝධී උපදෙස් මත බවයි. එසේ නම්, වග උත්තරකාර පොලිස්පතිවරයා හෝ වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා හෝ ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා ඔහුගේ කණ්ඩායම ආරක්ෂා කිරීමට මෙතරම් උත්සුක වන්නේ ඇයි? මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂිවලින් මෙම කරුණ සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි කිරීමක් සොයාගත නොහැකි විය. පොලිස්පතිවරයෙකුගේ පැත්තෙන් එවැනි උනන්දුවක් දැක්වීම කිසිසේත්ම සාධාරණීකරණය කළ නොහැක.

අනෙක් අතට, ඔහු පොලිස්පතිවරයා වන බැවින් ඔහු වැලිගම පොලිස් ස්ථානය, මාතර පොලිස් කොට්ඨාශය, කොළඹ අපරාධ කොට්ඨාශය සහ ශ්‍රී ලංකා පොලිසියේ අනෙකුත් සියලුම නිලධාරීන් අධීක්ෂණය කරයි. එසේ නම්, ඔහු අනුවාදයක් තෝරා ගත්තේ මන්ද යන ප්‍රශ්නය පැන නගී, එය දැන් එහි කතුවරුන් විසින්ම සහ මාතර උගත් මහේස්ත්‍රාත්වරයා විසින් 2025-02-27 දිනැති නියෝගයෙන් අවලංගු කර ඇත. වග උත්තරකාර පොලිස්පතිවරයා වර්තමානයේ පවා ස්වාධීන පරීක්ෂණයක් මෙහෙයවීමට කිසිදු උනන්දුවක් නොදක්වමින් ඔහුගේ ක්‍රියාව සාධාරණීකරණය කිරීමට උත්සාහයක යෙදෙන බැවින් තත්වය තවදුරටත් බරපතල වේ.

උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා පෙන්වා දුන් පරිදි, වග උත්තරකාර පොලිස්පතිවරයා සිය දෙවන දිවුරුම් ප්‍රකාශයෙන් 2023-12-31 දින වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය භාරව සිටි පොලිස් සැරයන් 16089 අජිත් සිසිර කුමාරගේ ප්‍රකාශය ප්‍රතික්ෂේප කර ඇත. මෙය 2025-06-09 දිනැති ඔහුගේ දෙවන දිවුරුම් ප්‍රකාශයේ 90 වන වගන්තියෙන් පිළිබිඹු වේ. එබැවින් මේ සම්බන්ධයෙන් වග උත්තරකාර පොලිස්පතිවරයා විවිධ කාලවලදී විවිධ ස්ථාවරයන් දරා ඇති බව දැකිය හැකිය. මෙය ඉතාමත්ම වැදගත් කරුණක් බැවින්, විමර්ශන කමිටුවේ මතය වන්නේ එය වග උත්තරකාර පොලිස්පතිවරයා විසින් ගනු ලබන ස්ථාවරයන්හි විශ්වසනීයත්වය පිළිබඳ ගැටලුවේ මූලයටම දිශානත වන බවයි. එහෙත් එය ඔහුට පක්ෂව නොවේ. උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා 2025-06-09 දිනැති ඔහුගේ දෙවන දිවුරුම් ප්‍රකාශයේ 83 වන වගන්තිය වග උත්තරකාර පොලිස්පතිවරයාට ඉදිරිපත් කළේය. එම වගන්තියෙන් (83 වගන්තිය), වග උත්තරකාර පොලිස්පතිවරයා තම දෙවන දිවුරුම් ප්‍රකාශයේ පවා, වැලිගම පොලිස් රාත්‍රී මුර සංචාරයේ යෙදෙන ජීප් රථය පැමිණ W15 හෝටලය ඉදිරිපිට කොළඹ අපරාධ

කොට්ඨාශ කණ්ඩායම් සාමාජිකයින් වෙඩි තබන අවස්ථාවේ නතර කළ විට කොළඹ අපරාධ කොට්ඨාශ වෑන් රථය වේගයෙන් පලා යාම සාවද්‍ය බව පිළිගෙන ඇති බව දැකගත හැකිය. වග උත්තරකාර පොලිස්පතිවරයාගේ අදහස මෙය නම්, වැලිගම W15 හෝටලය ඉදිරිපිට කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායම් සාමාජිකයින්ගේ ක්‍රියාවන් සාධාරණීකරණය කිරීමට ඔහු තවමත් උත්සාහ කරන්නේ මන්ද? ඔහු උතුරු පළාත් සභාවට යවන ලද වාර්තාවේ කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන්ගේ කිසිදු වරදක් නොමැති බව සඳහන් කළේ කුමන හේතුවක් උදෙසාද? එපමණක් ද නොව, 2023-12-31 වන දින අලුයම 2.20 ට පමණ වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධිය කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ සාමාජිකයින් මුලින්ම වැලිගම පොලිස් ස්ථානයට පැවසූ ආකාරයටම සිදුවී ඇති බව වග උත්තරකාර  පොලිස්පතිවරයා වර්තමානයේ පවා මෙම විමර්ශන කමිටුවට ඒත්තු ගැන්වීමට උපරිම උත්සාහයක් දරයි. මේ වන විට ප්‍රධාන පොලිස් පරීක්ෂ ඇන්ස්ලම් ද සිල්වා සහ ඔහුගේ අනෙකුත් කණ්ඩායම් සාමාජිකයින් ඔවුන්ගේ මුල් ස්ථාවරය අතහැර දමා ඇති බැවින් මෙය වඩාත් වැදගත්කමක් සහ ගැටලුසහගත බවක් ඇති කරයි. එසේ නම්, වග උත්තරකාර  පොලිස්පතිවරයා තවමත් එම ප්‍රකාශය තහවුරු කිරීමට උත්සාහ කිරීමේ අවශ්‍යතාවය කුමක්ද? එය එහි කතුවරුන් විසින්ම දැන් අතහැර දමා ඇති අනුවාදයකි, ඔවුන් ගොතන ලද බව පිළිගන්නා ලද අනුවාදයකි. මෙම කමිටුව එවැනි අනුවාදයක් නිවැරදි අනුවාදය ලෙස පිළිගත යුතුද? පිළිතුර පැහැදිලිවම නැත.

25) <u>නියෝජ්‍ය පොලිස්පති කපුගමරාලලාගේ ජගත් චන්ද්‍ර කුමාරගේ සාක්ෂි.</u>

මෙම සිද්ධියට අදාළ කාලය තුළ මෙම සාක්ෂිකරු කොළඹ දිස්ත්‍රික්කය භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා වූ අතර එම නිසා මෙම කාලය තුළ කොළඹ අපරාධ කොට්ඨාශය ඔහුගේ ඍජු අධීක්ෂණයට යටත් විය. කොළඹ මධ්‍යම; කොළඹ දකුණ; කොළඹ උතුර; කොළඹ වංචා විමර්ශන කාර්යාංශය; සහ කොළඹ අපරාධ කොට්ඨාශය යන පොලිස් අංශ සියල්ලම මෙම සාක්ෂිකරු විසින් කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස අධීක්ෂණය කරන ලදී. 2023-12-31 දින වැලිගම වෙඩි තැබීමේ සිද්ධියට අදාළ කාලය තුළ කොළඹ නියෝජ්‍ය පොලිස්පති ධුරයේ කටයුතු කළේ මෙම සාක්ෂිකරු ය. හරක් කටාගේ හෙරොයින් බෙදාහැරීමේ ජාලය පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමේ වගකීම කොළඹ අපරාධ කොට්ඨාශය වෙත පවරා ඇති බව මෙම සාක්ෂිකරු මුලින්ම තම සාක්ෂියේ සඳහන් කිරීමට උත්සාහ කළද, පසුව ඔහු ප්‍රකාශ කර තිබුණේ වග උත්තරකාර  පොලිස්පතිවරයා විසින් කොළඹ අපරාධ කොට්ඨාශය වෙත ලබා දුන් පැවරුම හරක් කටා සමඟ සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයින් සම්බන්ධයෙන් පමණක් සීමා වූ බවයි. වැඩිදුර ප්‍රශ්න කිරීමේදී, ඒ සම්බන්ධයෙන් කිසිදු ලේඛනයක් තමා දැක නොමැති බව ඔහු පිළිගත්තේය. මේ අනුව, හරක් කටාගේ ගනුදෙනුවලට අදාළ පරීක්ෂණ අධීක්ෂණය කළ බව ඔහු කියා සිටියද, ඔහු මේ දක්වා R-2 වාර්තාවවත් දැක නොමැති පුද්ගලයෙක්ය. කෙසේ වෙතත්, ඔහු තම මතකයෙන් මෙම කමිටුවට පවසා ඇත්තේ ලැයිස්තුවේ පුද්ගලයින් 149 දෙනෙකුගේ නම් අඩංගු බවයි. එවිට ඔහුට මෙම සංඛ්‍යාව මතක තබා ගත හැකි වූයේ කෙසේද සහ එය ඔහුගේ මතකයෙන් විමර්ශන කමිටුවට පැවසුවේ කෙසේද යන ප්‍රශ්නය පැන නගී. ඔහු ඉදිරිපත් කර ඇති එකම පැහැදිලි කිරීම නම් ඒ අවස්ථාවේ කොළඹ අපරාධ කොට්ඨාශ (CCD) අධ්‍යක්ෂවරයා ඔහුට පැවසූ බවයි. ප්‍රශ්න කළ විට, මෙම සාක්ෂිකරු පසුව පිළිගෙන ඇත්තේ පැවරුමට අදාළ මූලික ලේඛනය පවා නොබලා ඔහුට කිසිදු පරීක්ෂණයක් ඵලදායී ලෙස අධීක්ෂණය කළ නොහැකි බවයි. මෙය පහත ප්‍රශ්න සහ පිළිතුරු වලින් පිළිබිඹු වේ:

ප්‍ර: එතකොට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා ඒ ලේඛනය ට දුන්නා කියලා ඔබතුමා දන්නවද?

උ: ඒක කොළඹ අපරාධ කොට්ඨාශයට විමර්ශන සඳහා භාර දුන්නා කියලා මම දැන ගත්තා.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: ඒ ලේඛනය දැකලා තිබෙනවාද?

උ: නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒක මොන වගේ ලේඛනයක් ද කියලා මහත්මයා දන්නේ නැහැ?

උ: මම දන්නේ නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒක කවද භාර දීපු ලේඛනයක් ද කියලාත් දන්නේ නැහැ?

උ: නැහැ ස්වාමීනී.

ප්‍ර: ඒකෙන් බලාපොරොත්තු වෙච්ච විමර්ශනය මොකක්ද කියලාවත් මහත්මයාට අවබෝධයක් නැතුව ඇති?

උ: ස්වාමීනී, මගේ මතකයේ හැටියට ඒකේ නම් 149 ක් වගේ ප්‍රමාණයක් තිබුණා. ඔවුන් සම්බන්ධව.-

ප්‍ර: දැක්කෙ නැහැ කිව්ව නේ?

උ: මට අධ්‍යක්ෂවරයා කියා තිබුණා. ලේඛනය දැක්කේ නැහැ. නමුත්, අධ්‍යක්ෂවරයා මට කියා තිබුණා මෙන්න මෙහෙම විමර්ශනයක් භාර දුන්නා කියලා.

ප්‍ර: සාමාන්‍යයෙන් අධ්‍යක්ෂවරයාත් එක්ක විමර්ශන ගැන කථා කරනවාද?

උ: එහෙමයි ස්වාමීනී.

ප්‍ර: හැමදාම වගේ?

උ: අපි රැස්වෙනවා දින දෙක තුනකට සැරයක්. එතකොට අපි සමාලෝචනය කරනවා විමර්ශන සම්බන්ධයෙන්.

ප්‍ර: ඔය වගේ සාකච්ඡා කරපු අනෙක් විමර්ශන මොනවද?

උ: ස්වාමීනී, ඒ කාල වකවානුවේම තමයි. තවත් අපරාධකරුවන් තවත් සිටිනවා, හරක් කටාට අමතරව. කොළඹ අපි හඳුනාගත්ත කිඹුලා ඇළේ ගුණා, වැල්ලේ සාරංග, පුකුඩි කන්නා.

ප්‍ර: කිඹුලා ඇළේ ගුණා ගැන මොන වගේ විමර්ශනයක් ද කළේ?

උ: ස්වාමීනී, මම කොළඹ හිටපු කාලය තුළ සිදු වූ යම් යම් අපරාධ වලදී මේ නම් කියැවුණා. මොවුන්ගේ සම්බන්ධතා කියැවුණා.

ප්‍ර: ඒකේ විමර්ශනය මොකක්ද කියලා හරියටම මතක නැහැ? y:

උ: මත්ද්‍රව්‍ය ජාලය සම්බන්ධයෙන් තමයි ප්‍රධානම විමර්ශනය සිදුවුණේ.

ප්‍ර: මහත්මයාට මතකද නැද්ද කියන්න?

උ: ස්වාමීනි, මට මතක තිබෙන්නේ, ඔවුන්ගේ අනුගාමිකයන්, ලංකාවේ ක්‍රියාකාරීන් සම්බන්ධ විමර්ශන තමයි භාර දුන්නේ.

ප්‍ර: කී දෙනෙක්ද?

උ: ප්‍රමාණයක් දන්නේ නැහැ.

ප්‍ර: මේකේ 149 මතක හිටියේ කොහොමද?

උ: අධ්‍යක්ෂවරයා කියා තිබුණා.

ප්‍ර: ඒක මහත්මයාට මතක හිටියේ කොහොමද කියන එක මට ප්‍රශ්නයක්. මහත්මයා ඔය ලේඛනය දැක්කේ නැහැ?

උ: ලේඛනය දැක්කේ නැහැ ස්වාමීනි.

ප්‍ර: අද වෙනකල් දැකලා තිබුණේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: 149 මතකයි?

උ: ඔව්.

ප්‍ර : ඒකයි මම ඇහුවේ තිබුලා ඇළේ ගුණා ගැන. මෙසේ විතරක් 149 ප්‍රමාණය මතක හිටියේ කොහොමද?

උ: ඒක මාධ්‍ය වලත් ගියා ස්වාමීනි.

ප්‍ර: මාධ්‍ය වල ගිය නිසා?

උ: එහෙමයි.

ප්‍ර: ඒ කියන්නේ වැලිගම සිද්ධිය මාධ්‍ය වල ගිය නිසාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: දැන් මේ විමර්ශනය මහත්මයා අධීක්ෂණය කළාද නැද්ද?

උ: සෘජුව අධීක්ෂණයක් නොවෙයි ස්වාමිනි.

ප්‍ර: මහත්මයාට තේරෙනවද මම අහන කාරණය ?

උ: එහෙමයි.

ප්‍ර: මහත්මයා, අපරාධ අංශයේ නියෝජ්‍ය පොලිස්පති. විමර්ශනය අධීක්ෂණය කරන්න බැහැ නේ ඔය මොකක්වත් දකින්නේ නැතුව? එහෙම පුළුවන්ද අධීක්ෂණ කරන්න?

උ: බැහැ ස්වාමිනි.

2023-12-30 වන දින වැලිගම බලා යාමට ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) කණ්ඩායම නිර්දේශ කිරීම සඳහා 439 පොලිස් පෝරමයක් අත්සන් කළ බව නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර පිළිගෙන ඇත. මූලික අදියරේදී තමාට එවැනි 439 පොලිස් පෝරම ලේඛන 100 ක් පමණ ලැබුණු බව හෙතෙම ප්‍රකාශ කර තිබුණද, වැඩිදුර ප්‍රශ්න කිරීම් හමුවේ, දිනකට තම කාර්යාලයට එවැනි 439 පොලිස් පෝරම ලේඛන 02 ක් හෝ 03 ක් පමණක් ලැබුණු බව පිළිගෙන ඇත.

නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා P-13 සිට P -16 දක්වා සලකුණු කර ඇති ලියකියවිලි හඳුනාගෙන ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලෙම් ද සිල්වා මහතාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) නිලධාරීන් කණ්ඩායම නිල රාජකාරියක නිරත වීම සඳහා වැලිගමට ගොස් ඇති බවට තමා සෑහීමකට පත් වූ බැවින්, ත්‍යාග ගෙවීම නිර්දේශ කිරීම සඳහා P-13 සිට P-16 දක්වා අත්සන් කළ බව ඔහුගේ ස්ථාවරය විය.

ඔහුට අනුව, ඔහු මෙය වැඩබලන අධ්‍යක්ෂ කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා, මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ සහ සහකාර පොලිස් අධිකාරී මාතර අරුණලාල් යන අයගෙන් තහවුරු කරගෙන ඇත. නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතාගේ ස්ථාවරය වනුයේ කොළඹ අපරාධ කොට්ඨාශය (CCD) කණ්ඩායමේ උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන දෙදෙනා නාඳුනන තුවක්කුකරුවෙකුගෙන් එල්ල වූ වෙඩි ප්‍රහාරයකින් තුවාල ලබා ඇති බව ඔහු විසින් තවමත් දරන මතය බවයි. එසේ කියන ලද්දේ, 2024-12-05 වන දින දක්වා ඔහු කොළඹ නියෝජ්‍ය පොලිස්පති ලෙස කොළඹ අපරාධ කොට්ඨාශය (CCD) භාරව සහ එය අධීක්ෂණය කර තිබියදී ය.

මේ සම්බන්ධයෙන් ඔහුගේ ස්ථාවරය පහත සඳහන් ප්‍රශ්න සහ පිළිතුරුවලින් රැස්කර ගනු ඇත:

ප්‍ර: ඔය සිද්ධියට පසුව කවදා වෙන කල් CCD එකේ සිටියාද?

උ: 2024.12.05 වැනිදා වෙන කල් කොළඹ දිශාව කාරව සිටියා ස්වාමීනි. 2024.12.05 වැනිදා තමයි හිම ස්ථාන මාරුවීම් ලැබුවේ.

ප්‍ර: දැන් මහත්තයාගේ ස්ථාවරය CCD එක් පොලිස් සැරයන් උපුල්ව වෙඩි වැදුණේ නාඳුනන තුවක්කුකරුවෙක් කියපු වෙඩි පහරකින් කියන එක?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා ඒක කියන්නෙත් එවකට CCD එක භාරව හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයා විදියට?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: CCD එකේ මහත්මයා නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට සිටියා 2024.12.05 වැනි දා වෙන කල්?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මේ සිද්ධියට පස්සේ අවුරුද්දකට ආසන්න කාලයක් සිටියා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා එවකට CCD එක භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විධියට මහත්මයාගේ ස්ථාවරය සහ මහත්මයාගේ අවබෝධය CCD එකේ 2023.12.31 වැනිදා වෙඩි වැදිලා තුවාල වෙච්ච SI මධුරංගට තුවාල වුණේ නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි පහරකින් කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක ස්ථිරයි?

උ: මා දැනට දන්නේ එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒක තමයි මහත්මයා සොයා ගත්තේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගේ අවබෝධය අනුව වෙන කවුරුවත් වෙන විධියකට සොයා ගෙන

උ: මා දන්නා තරමින් නැහැ ස්වාමිනි.

ප්‍ර: මහත්මයාගේ සාක්ෂිය අනුව, මහත්මයා ඔය මතයට ආවේ මාතර සිය විමර්ශනය භාරව ඉන්න නිලධාරීන්ගෙන් කරුණු විමසලා?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී, මාතරින් ස්වාමීනි.

ප්‍ර: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කවුද?

උ: ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ.

ප්‍ර: මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීවරයා මහත්මයාට කිව්වේ ඔය විධියට ඔහ වුණා කියලාද?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයා තමන්ට කිව්වේ. ඔය CCD එකේ කුවාල වෙච්ච දෙදෙනාට තුවාල වුණේ නාඳුනන තුවක්කුකරුවකුගේ වෙඩි ප්‍රහාරයකින් ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: වැලිගම මූ. පො. ප. ටත් කථා කළාද?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: වැලිගම පොලිස් නිලධාරීන් ඉහළ සිට පහළ සියලු තනතුරු, OIC (Crimes). නියෝජ්‍ය පොලිස්පතිවරයා, මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරය, වැලිගම ඒ එස්පී. වැලිගම එව්වා අයි. වැලිගම OIC (Crimes), ඒ ගොල්ලෝ සේරම ඔය ස්ථාවරය තමයි අරගෙන තිබෙන්නේ?

උ: ස්වාමීනි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කියපු දේ පමණයි මම දන්නේ. අනෙක් අය සමඟ මම සම්බන්ධ වුණේ නැහැ.

ප්‍ර: මහත්තයා ඔය ටික වාර්තාවකින් ද ගෙන්වා ගත්තේ නැත්නම් වාචිකවද? ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් වාර්තාවක්ද ගෙන්වා ගත්තේ, නැත්නම් වාචිකවද?

උ: වාචිකව, දුරකථනයෙන් සම්බන්ධ වුණේ.

ප්‍ර: පණ්ඩුල වීරසිංහ මහත්මයා ඔක තමයි සොයාගෙන තිබෙන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: මහත්තයා කටයුතු කළේ ඒ අනුව?

උ: මම විශ්වාස කළා ස්වාමිනි

ප්‍ර: තාමත් විශ්වාස කරන්නේ එහෙම?

උ: වෙනත් දෙයක් දැනගන්න ලැබුණේ නැහැ ස්වාමීනි, ඒ නිසා.

මෙම සාක්ෂිකරු මෙන් නොව, අවම වශයෙන් ප්‍රශ්න කිරීම් හමුවේ වගඋත්තරකාර පොලිස්පතිවරයා, කොළඹ අපරාධ කොට්ඨාශයේ (CCD) කණ්ඩායම රුගත් වෑන් රථයට වෙඩි තැබුවේ වැලිගම රාත්‍රී ජංගම මුර සංචාරයේ සාමාජිකයෙකු වූ හමුදා සැරයන් රුචිරංග බව මේ දක්වා දැන නොසිටි බවට ස්ථාවරය ගෙන නොමැති බව විමර්ශන කමිටුවට මෙහිදී නිරීක්ෂණය කිරීම සිදු වේ. මේ අනුව, කමිටුව ඉදිරියේ ඇති ප්‍රශ්නය වන්නේ මෙම විමර්ශන කමිටුව ඉදිරියේ මෙම සාක්ෂිකරු සහාය දැක්වීමට උත්සාහ කර ඇත්තේ කාගේ සිදුවීම් අනුවාදයට ද යන්නයි. එය ඔහුගේම අනුවාදයක් වන නමුත් එය නොපවත්නා ස්ථාවරයකි.

තවදුරටත් යොමුකළ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී, 2003 දී අවිස්සාවේල්ල සහකාර පොලිස් අධිකාරී ලෙස කටයුතු කළ අවස්ථාවේ පොලිස් නිලධාරියෙකු ඝාතනය වූ සිද්ධියක විස්තර මෙම සාක්ෂිකරුට මතක ඇති බව අනාවරණය විය. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් මාසයේදී සිදු වූ වෙඩි තැබීමේ සිද්ධිය සම්බන්ධයෙන්, මෙම සාක්ෂිකරුට කිසිදු වැදගත් කරුණක් මතක නැත. එය එසේ සිදුවන්නේ එම අදාළ අවස්ථාවේ කොළඹ අපරාධ කොට්ඨාශය ඍජුවම ඔහුගේ විෂය පථය යටතේ තිබියදී ය. රට තුළ පුළුල් ලෙස ප්‍රසිද්ධියට පත් වූ සහ මෙරට ජනතාවගේ දැඩි අවධානයක් ලැබුණු, 2023-12-31 දින වැලිගම වෙඩි තැබීමේ සිදුවීමට අදාළ කරුණු මෙම සාක්ෂිකරුට මතක නොතිබුනේ මන්දැයි විමර්ශන කමිටුව ඉදිරියේ පිළිගත හැකි පැහැදිලි කිරීමක් නොමැත. වසර 20 කට වැඩි කාලයකට පෙර 2003 සිදුවීමට අදාළ කරුණු තවමත් ඔහුගේ මනසෙහි නැවුම්ව පැවතීම, මෙම තත්වය තවත් උග්‍ර කරයි. කමිටුවේ අදහස්වලට අනුව, නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා ගන්නා මෙම ස්ථාවරය, විශේෂයෙන් ඔහු අදාළ අවස්ථාවේ කොළඹ අපරාධ කොට්ඨාශය ඍජුවම අධීක්ෂණය කළ නියෝජ්‍ය පොලිස්පතිවරයා වූ බැවින්, ඔහුගේ විශ්වසනීයත්වයට බරපතල ලෙස බලපානු ඇත.

වැලිගම වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල්ට උසස්වීමක් නිර්දේශ කළ, වගඋත්තරකාර පොලිස්පති විසින් පත් කරන ලද කමිටුවේ සභාපතිවරයා මෙම සාක්ෂිකරු ය. මෙම සාක්ෂිකරුගේ සභාපතිත්වයෙන් යුත් එම කමිටුව, එවකට කොළඹ මධ්‍යම ජ්‍යෙෂ්ඨ

පොලිස් අධිකාරී ලලිත් ලීලාරත්න සහ කොළඹ වංචා විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක බාලසූරිය යන අයගෙන් සමන්විත විය. පොලිස් සැරයන් උපුල් හට උසස්වීමක් ලබා දීමට මෙම කමිටුව ඒකමතිකව නිර්දේශ කළ බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියයි. ත්‍යාග අයදුම්පත නිර්දේශ කර අත්සන් කර වගඋත්තරකාර පොලිස්පති වෙත යොමු කිරීම ද ඔහු පිළිගනී. පොලිස් සැරයන් උපුල් නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි තැබීමකින් මිය ගිය බව මාතර ප්‍රදේශයේ අදාළ පොලිස් බලධාරීන්ගෙන් තහවුරු කර ගැනීමෙන් පසු තමා සෑහීමකට පත් වූ බව ඔහුගේ ස්ථාවරයයි. වැලිගම පොලිස් ස්ථානයෙන් යම් ජංගම මුර සංචාරයක් පැමිණීම ගැන ඔහු දැන සිටියේදැයි විමසූ විට, ඔහු මෙම කමිටුව ඉදිරියේ පහත පිළිතුරු ලබා දී ඇත:

<u>පරීක්ෂණ කමිටුවෙන්</u>

ප්‍ර: සාක්ෂිකරුට මොකක්ද මතක?

උ: ජංගම මුර සංචාරයක් සම්බන්ධව.

ප්‍ර: එතැනදී මොකක්ද වෙලා තිබෙන්නේ?

උ: වැලිගම පොලිසියේ ජංගම මුර සංචාරක රථයක් මෙම ස්ථානයට ඇවිල්ලා කියලා එම වාර්තාවේ තිබුණා.

ප්‍ර: සාක්ෂිකරුට මතක එවරයි ද?

උ: ඔව්, ස්වාමිනි.

ප්‍ර: එච්චරයි මතක?

උ: එහෙමයි.

ප්‍ර: වැලිගම පොලිසියේ රාත්‍රී ජංගම මුර සංචාරයේ,-

උ: ඒ නිලධාරීන් එම ස්ථානයට පැමිණියා කියලා ඒ වාර්තාවේ සඳහන් වුණා මතකයි.

ප්‍ර: මොකකින්ද ඇවිල්ලා තිබෙන්නේ?

උ: "ජංගම සංචාරය" කියලා තමයි සඳහන් වුණේ, ස්වාමීනි.

ප්‍ර: පයින් ද , වාහනයකින්ද?

උ: වාහනයකින්, ස්වාමීනි.

ප්‍ර: මොන වගේ වාහනයකින්ද?

උ: ජංගම සංචාරයක් කියලා තමයි සඳහන් වුණේ. වාහනයේ වර්ගය සඳහන් වුණාද කියලා මට මතක නැහැ. ස්වාමීනි.

ප්‍ර: වාහනයේ වර්ගය ඕනෑ නැහැ මහත්මයා. බස් එකක්ද, මොකක්ද?

උ: ජංගම රථය කියලා තමයි සඳහන් වෙලා තිබුණේ, ස්වාමීනි. මොකක්ද කියලා සඳහන් වෙලා තිබුණේ නැහැ.

ප්‍ර: සාමාන්‍යයෙන් පොලිස් ජංගම මුර සංචාර විවිධ වාහන වලින් යනවාද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: එදා ගිය වාහනය මොකක්ද කියලා මහත්වයා දන්නේ නැද්ද? මේ වෙන කොටත් දන්නේ නැද්ද?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: බස් එකක්ද, මෝටර් සයිකල් එකක් ද කියලා දන්නෙ නැද්ද?

උ: ජංගම රථයක් කියලා තමයි මම දන්නේ, ස්වාමීනි.

ප්‍ර: ජංගම සංචාරවල මෝටර් සයිකලුන් යනවා නේද?

උ: ඔව්, මෝටර් සයිකලුත් යනවා, ස්වාමීනි.

ප්‍ර: මෝටර් සයිකල් එකක් ද ගියේ කියලාත් මහත්මයා දන්නේ නැද්ද?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: මේ වෙනකල් දන්නේ නැද්ද?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: දන්නවා නම්, මේ අහන ප්‍රශ්න වලට උත්තර දෙනවානේ. නේද?

උ: එහෙමයි. ස්වාමීනි.

මෙම සාක්ෂිකරු විසින් ලබා දී ඇති ඉහත සඳහන් සාක්ෂි ස්වයං-පැහැදිලි කිරීමකි. එබැවින්, 2023-12-30 දින කොළඹ අපරාධ කොට්ඨාශය කණ්ඩායම වැලිගමට ගිය අවස්ථාවේ අදාළ අවස්ථාවේදී කොළඹ අපරාධ

කොට්ඨාශය විසින් සිදු කරන ලද පරීක්ෂණ අධීක්ෂණය කළ බව පැවසෙන මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවල ගුණාත්මකභාවය තේරුම් ගැනීමට තවත් හේතු අවශ්‍ය නොවන බව කමිටුවේ අදහසයි. මෙම සිද්ධියට අදාළ දිනයේදී කොළඹ අපරාධ කොට්ඨාශය අධීක්ෂණය කළා යැයි කියන කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයා, වැලිගම පොලිසියේ සිට වෙඩි තැබීම සිදු වූ ස්ථානයට ජංගම මුර සංචාරයක් ලෙස යතුරුපැදියක් පැමිණී තිබීමේ හැකියාව බැහැර නොකරන බව පැවසීම ප්‍රමාණවත්ය. මෙම අවබෝධය සහිතව ඔහු, ත්‍යාග මුදලක් නිර්දේශ කර ඇති අතර අදාළ වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය පොලිස් සැරයන් උපුල් හට උසස්වීමක් නිර්දේශ කළ කමිටුවේ සභාපතිත්වය දරයි. මෙම ගුණත්වයේ සාක්ෂි පිළිගැනීමට සහ ඒ අනුව ක්‍රියා කිරීමට නොහැකි වීම පිළිබඳව මෙම කමිටුව කනගාටුව ප්‍රකාශ කරයි.

26) <u>අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාරගෙන් හරස් ප්‍රශ්න විමසීම.</u>

උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා ඔහුගෙන් විමසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ ඇන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමට නිල ඇඳුමින් වැලිගමට යාමට අවසර දුන් බවයි. එම කණ්ඩායම 2023-12-30 දින සිවිල් ඇඳුමින් වැලිගමට යාමට උත්සාහ කරන බව ඔහු දැන සිටියේ නම්, ඒ ආකාරයෙන් ඔවුන්ට වැලිගමට යාමට ඉඩ නොදෙන බව ඔහුගේ ස්ථාවරය විය. කෙසේ වෙතත්, උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා P-15 ලේඛනය පදනම්ව සිදු කරන ලද ප්‍රශ්න කිරීම් හමුවේ, ඔහුගේ නිර්දේශය ලබා දෙන අවස්ථාවේ දී පවා, P-15 ලේඛනයේ සඳහන් කර ඇත්තේ මෙම කණ්ඩායම සිවිල් ඇඳුමින් වැලිගමට යාමට අවසර ඉල්ලා ඇති බවට වග, ඔහුට පිළිගැනීමට සිදුවිය. මෙම සාක්ෂිකරු වගඋත්තරකාර පොලිස්පති වෙත නිර්දේශ කර ඇත්තේ එම ඉල්ලීමයි. මේ අනුව, මෙම සාක්ෂිකරු මේ සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධී ස්ථාවරයන් දෙකක් ගෙන ඇත.

මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ කොළඹ අපරාධ කොට්ඨාශයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් උපුල් ඝාතනය වූ වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳව ඔහුට දැනුම් දුන්නේ 2023-12-31 දින ඔහු තම කාර්යාලයට පැමිණීමෙන් පසුව පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා අතර කාලයේ දී බවයි.

ඔහුට අනුව, ඒ අවස්ථාවේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඔහුට පවසා තිබුණේ නාඳුනන තුවක්කුකරුවෙකුගේ වෙඩි තැබීමකින් පොලිස් සැරයන් උපුල් මිය ගිය බවත්, උප පොලිස් පරීක්ෂක මධුරංග තුවාල ලැබූ බවත්ය. පෙ.ව. 9.30 ත් 10.00 ත් අතර කාලය තුළ කාර්යාලයට පැමිණි පසු සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් මෙම සිද්ධිය පිළිබඳව ඔහුට දැනුම් දී තිබුණද, අද දක්වාම සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම සිද්ධිය පිළිබඳව දැනගත්තේ කුමන වේලාවකදැයි ඔහු නොදනී. මේ සම්බන්ධයෙන් ඔහුගෙන් අසන ලද ප්‍රශ්නවලට මෙම සාක්ෂිකරු විසින් ලබා දී ඇති පිළිතුරුවලින් පෙනී යන්නේ මෙම සාක්ෂිකරු මෙම ගැටලුවේ බරපතලකම තේරුම් නොගන්නා බව හෝ ඇගයීමක් නොකරන බව හෝ ඒ ගැන තැකීමක් නොකරන බවයි. මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය නම්, ඔහු 2024-12-05 වන දින දක්වා කොළඹ අපරාධ කොට්ඨාශයේ කටයුතු අධීක්ෂණය කරන නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස කටයුතු කළද, මෙම සිද්ධිය පිළිබඳව තවදුරටත් විමර්ශනය කිරීමට ඔහු උනන්දු නොවූ බවයි. මේ සම්බන්ධයෙන් නැවත නැවතත් ප්‍රශ්න කරන විට ඔහු ලබා දී ඇති නිදහසට කරුණු මෙම කමිටුවට පිළිගත නොහැකිය.

ඇත්ත වශයෙන්ම, ඒවා නිදහසට කරුණු නොවේ. මෙම ප්‍රශ්නවලට මුහුණ දුන් විට මෙම සාක්ෂිකරු නොසන්සුන් විය. මෙම සාක්ෂියේ අදාළ කොටස් පහත පරිදි අර්ථ නිරූපණය කිරීමට වඩා පිටපත් කර දැක්වීම අර්ථාන්විත ය:

ප්‍ර: එදා W15 හෝටලය ආසන්නයේ වෙච්ච සිද්ධිය තමුන් දැන ගත්තේ කීයටද?

උ: ස්වාමීනි. මගේ මතකයේ හැටියට නවයා හමාර, දහය වාගේ වෙලාවක තමයි දැන ගත්තේ.

ප්‍ර: උදේ?

උ: උදේ. ස්වාමීනි.

ප්‍ර: කවුද තමුන්ට නවයාහමාර, දහයට විතර ඒ සිද්ධිය දැනුම් දුන්නේ?

උ: මගේ මතකයේ හැටියට වැඩ බලන අධ්‍යක්ෂවරයා විසින් තමයි මට සිද්ධිය දැනුම් දුන්නේ.

ප්‍ර: නම වශයෙන් සඳහන් කළොත් කවුද?

උ: සහකාර පොලිස් අධිකාරි නෙවිල් ද සිල්වා.

ප්‍ර: තමුන්ට දැනුම් දුන්න විධියට සිද්ධිය කීයට විතරද වෙලා තිබෙන්නේ?

උ: අලුයම කියලා කිව්වේ, ස්වාමීනි.

ප්‍ර: කියට විතරද?

උ: පාන්දර 4 වාගේ වෙලාවක.

ප්‍ර: තමුන් තමයි අධික්ෂණ නිලධාරියා හැටියට කටයුතු කරන්නේ කොළඹ අපරාධ කොට්ඨාශයේ?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: තමා ඒ සිද්ධිය ගැන දැනුවත් වුණා කිව්වේ කියටද?

උ: නවයහමාර, දහය වාගේ වෙලාවට, ස්වාමීනි.

ප්‍ර: දැන් අධීක්ෂණ නිලධාරියා හැටියට තමන් යටතේ තිබෙන කණ්ඩායමක් යම්කිසි සිද්ධියකට මුහුණ පැවාම ඒක තමුන්ට දැනුම් දෙන්න වග කීමක් තිබෙනවා නේද ඉතාම කඩිනමින්.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: මේ අවස්ථාවේදී එහෙම දෙයක් වෙලා තිබෙනවාද?

උ: නැහැ. ස්වාමිනි. මට ඒක පසුව තමයි දැනුම් දිලා තිබෙන්නේ.

ප්‍ර: දැන් තමුන් කියන විධියටම තුනයි ගණනට වෙච්ච සිද්ධියක් තමුන්ට දැනුම් දෙන කොට වෙලාව කීයද කිව්වේ?

උ: නවයාමාර, දහය වාගේ වෙලාවට තමයි.

ප්‍ර: අධීක්ෂණ නිලධාරියා හැටියට එහෙම සිද්ධියක් වුණාම ඉතා කඩිනමින් ඒක තමුන්ට කවුද දැනුම් දෙන්න ඕනෑ?

උ: අධ්‍යක්ෂවරයා දැනුම් දිය යුතුයි. ස්වාමීනි.

ප්‍ර: අධ්‍යක්ෂවරයා තමුන්ට දැනුම් දුන්නේ මොකක්ද ඒ අවස්ථාවේ?

උ: මේ සිද්ධිය සම්බන්ධයෙන් ස්වාමීනි, දැනුම් දුන්නා. නාඳුනන වෙඩික්කරුවකුගේ වෙඩි පහරකට ලක් වෙලා දෙදෙනෙක් තුවාල ලැබුවා; පොලිස් සැරයන්වරයා මිය ගියා; කරාපිටිය රෝහලට ඇතුළු කළා කියන විස්තරය මූලික වශයෙන් ලබා දුන්නා, ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ, සිද්ධිය සිදු වෙලා පැය කීයකට විතර පස්සේද අධීක්ෂණ නිලධාරියා හැටියට තමුන්ට ඒ දැනුම් දීම කරලා තිබෙන්නේ?

උ: පැය දෙක, තුනකට පස්සේ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: අධ්‍යක්ෂවරයා දැනගෙන තිබෙන්නේ කීයටද?

උ: ඒක දන්නෙ නැහැ. ස්වාමීනි.

ප්‍ර: දන්නෙ නැහැ?

උ: අධ්‍යක්ෂවරයා දැනගත් වෙලාවක් සම්බන්ධව මම දැනුවත් නැහැ. ස්වාමිනි.

ප්‍ර: තවම දන්නේ නැද්ද?

උ: උදෑසන  සිද්ධිය වුණ ගමන් උදෑසන කිව්වා කියලා ආරංචිය තිබුණේ, අධ්‍යක්ෂවරයා කිව්වේ පාන්දර කිව්වා කියන එක වෙලාවක් සඳහන් කළේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: හරියටම වෙලාව නොවෙයි. සිද්ධිය සිදු වූ වහාම වාගේ අධ්‍යක්ෂවරයා දැන ගෙනද?

උ: ඒ සම්බන්ධව දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මේ වන කල් දන්නේ නැද්ද?

උ: දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට ප්‍රශ්නයක් වුණේ නැද්ද, මහත්මයාට සෘජු අධීක්ෂණ නිලධාරියා විධියට නවයාහමාර වන කල් ඒ සිද්ධිය ගැන මහත්මයාට කිව්වේ නැහැ කියන එක කවුරුවත්?

උ: ප්‍රශ්නයක් වුණා, ස්වාමීනි. මම ඒ සම්බන්ධව විමර්ශනය කළා. අධ්‍යක්ෂවරයාගෙන් විමසා සිටියා ප්‍රමාදයට හේතුව සම්බන්ධව.

ප්‍ර: එකකොට?

උ: එතකොට මොකුත් කිව්වේ නැහැ, ස්වාමීනි.

ප්‍ර: මුකුත් කිව්වේ නැහැ?

උ: නැහැ

ප්‍ර: මහත්මයාටත් ප්‍රශ්නයක් නැහැ?

උ: සිදුවීම සිදු වුණාට පස්සේ උසාවියේ නේ. වැඩිදුර සොයා බැලුවේ නැහැ.

ප්‍ර: සොයා බලන්න අවශ්‍යතාවකුත් වුණේ නැහැ.

උ: තිබුණා, ස්වාමීනි.

ප්‍ර: හොයලා බැලුවාද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මොකක්ද සොයා ගත්තේ?

උ: ඒ සිදුවීම ගැන අධ්‍යක්ෂවරයා විසින් දැනුම් දුන්න දේ නිවැරදියි කියලා පරීක්ෂා කළා, ස්වාමීනි.

ප්‍ර: සිද්ධිය ගැන නොවෙයි, මම අහන්නේ. මහත්මයාට දැනුම් දුන්නේ නැති එක ගැන?

උ: වෙනම විමර්ශනයක් කළේ නැහැ. ස්වාමිනි.

ප්‍ර: මහත්මයාට උනන්දුවක් තිබුණා ද ඒක හොයා ගන්න? විමර්ශන ගැන නේ හැම තිස්සේම කියනවා නේ.

උ: මට ඒ ගැන උනන්දුවක් තිබුණේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගෙන් දැන් අපි ප්‍රශ්න අහන්නේ මහත්මයා කියන දේ ගැන උනන්දුවක් තිබෙන නිසා.

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: නීතිඥ මහත්වරු දෙපැත්තෙන්ම ප්‍රශ්න අහන්නේ ඒ කියන දේ සම්බන්ධව උනන්දුවක් තිබෙන නිසා

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: වෙන වචන වලින් කියනවා, සාක්ෂිකාරයෙක් හෝ කවුරු හරි කියන දෙයක් එලෙසම පිළිගන්න පුළුවන්ද, බැරිද කියන එක. එහෙම නේද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මහත්මයා සැකකාරයන්ගෙන් ප්‍රශ්න අහලා ඇති නේද?

උ: එහෙමයි, ස්වාමිනි.

ප්‍ර: උනන්දුවක් නැත්නම් දෙයක් හොයාගන්න පුළුවන් ද කාගෙන් හරි?

උ: බැහැ. ස්වාමිනි.

ප්‍ර: බැහැනේ?

උ: බැහැ, ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට අධීක්ෂණ නිලධාරියෙක් විධියට වගකීමක් නැද්ද, මෙච්චර වෙලා මහත්මයා කිව්වා නේ, වගකීමක් තිබෙනවාය කියලා මහත්මයාට වහාම දැනුම දෙන්න.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: මහත්මයා නිදාගෙන හිටියත් මහත්මයාට දැනුම් දෙන්න ඕනෑ-

උ: එහෙමයි.

ප්‍ර: මහත්මයා ඇහැරෙන කල් ඉන්න ඕන නැහැනේ?

උ: නැහැ. ඕනෑ වෙලාවක දැනුම් දෙන්න ඕනෑ.

ප්‍ර: රාජකාරි දුරකථන හැමෝටම දීලා තිබෙනවා?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ඒවා off කරන්න බැහැ?

උ: බැහැ, ස්වාමීනි.

ප්‍ර: රෑ කීයට හරි, කොච්චර මහන්සි වෙලා නිදා ගත්තත්, කොච්චර තද නින්දේ හිටියත් උත්තර දෙන්න ඕනෑ?

උ: ඕනෑ වෙලාවක උත්තර දෙන්න ඕනෑ, ස්වාමීනි.

ප්‍ර: උදේ නවයහමාර කියන්නේ නිදා ගන්න වෙලාවක් නොවෙයි නේ?

උ: නැහැ, ස්වාමීනි. කාර්යාල වේලාව.

ප්‍ර: මහත්මයාට කාර්යාලයේදී ද ඒක කිව්වේ?

උ: කාර්යාලයේ ඉන්න වෙලාවේ.

ප්‍ර: කාර්යාලයට ආවාට පස්සේ කිව්වේ?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: කාර්යාලයෙන් ද මහත්මයා දැන ගත්තේ?

උ: නැහැ. අධ්‍යක්ෂවරයා මගේ දුරකථනයට කථා කළා.

ප්‍ර: මම අහන්නේ, ඒක අධීක්ෂණ නිලධාරියෙක් විධියට මහක්මයාට ප්‍රශ්නයක් වුණේ නැද්ද?

උ: ස්වාමීනි. ඒ වෙලාවේ ලොකු සිද්ධියක් වෙලා නිලධාරියෙකුත් මිය ගිහිල්ල තිබෙන නිසා මට ඒ ගැන වැඩි අවධානයක් යොමු කරන්න බැරිවුණා, ස්වාමීනි.

ප්‍ර: ඒකනෙ මහත්මයා මම ප්‍රශ්නයක් ඇහුවේ. මේ වන කල් මහත්මයා දන්නේ නැද්ද කියලා.

උ: අලුයම කියලා දැන ගන්න ලැබුණා ස්වාමීනි, අධ්‍යක්ෂවරයාගෙන්, මේ ගොල්ලෝ විස්තරය සඳහන් කළා කියලා.

ප්‍ර: මහත්මයාට හම්බ වෙච්ච වෙලාව ගැනයි මේ ප්‍රශ්න කරන්නේ. ඒ වෙලාවේ busy කියමු කෝ?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: පස්සේත් ඉතින් මහත්මයාට ප්‍රශ්නයක් නැහැ. මහත්මයා දැනටත් දන්නේ බොහොම ටිකයි නේ. එහෙම නේද?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: දැනටත් ප්‍රශ්නයක් නැහැ. මහත්මයාට මේ සිද්ධිය ගැන දැනටත් ප්‍රශ්නයක් නැහැ නේ?

උ: තිබෙනවා, ස්වාමීනි. අධිකරණයේ කටයුත්තක් තිබෙන නිසා.

ප්‍ර: අධිකරණයේ කටයුත්ත තිබෙන්නේ අධිකරණයේ නේ. මම අහන්නේ මහත්මයාට? මහත්මයා CCD එකේ හිටියේ 2024.12.05 වැනි දා වන කල් ?

උ: එහෙමයි. Colombo DIG, ස්වාමීනි.

ප්‍ර: Colombo DIG. CCD එක භාරව සිටියේ. 2024.12.05 වැනි දා වන කල් මහත්මයාට CCD එකේ අය හරි දෙයක් කළාද, වැරදි දෙයක් කළාද කියන එක සම්බන්ධයෙන් එච්චර ප්‍රශ්නයක් තිබුණේ නැහැ කියලා කිව්වොත් හරිද?

උ: ඒ වන කොටත් විමර්ශනයක් යන නිසා ස්වාමීනි, මම බැලුවේ නැහැ.

ප්‍ර: මම කිව්වේ මහත්මයාට? විමර්ශන කිහිප ආකාරයකින් කළා නේ.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: 2024.12.05 වන දා වනකොට CID එකෙනුත් පටන් අරගෙනද?

උ: එහෙමයි, ස්වාමිනි.

ප්‍ර: හරිද?

උ: හරි.

ප්‍ර: අඩු ගණනේ ඒක මහත්මයා දැනගෙන හිටියාද?

උ: දැනගෙන හිටියා, ස්වාමිනි.

ප්‍ර: මහත්මයාට ප්‍රශ්නයක් තිබිලා නැහැ. ඒකයි ඔය කියන දෙයින් තේරෙන්නේ. හරි නම් හරි කියන්න. වැරදි නම් වැරදියි කියන්න. වැරදියි කියනවා නම්, වැරදියි කියන්න හේතුව කියන්න? විමර්ශන අංශ වලින් CID එකෙන් කරනවා. මාතර පොලිසියෙන් කරනවා.

උ: ඔව්. ඒ නිසා මම සොයා බලන්න ගියේ නැහැ. විමර්ශන වලට බාධාවක් වෙයි කියලා මම සොයා බලන්න ගියේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: ඉතින් මහත්මයාම නේ කිව්වේ. මහත්මයා ජොෂ්ඨ පොලිස් අධිකාරිට කථා කළා කියලා?

උ: එක පාරක් කථා කළා.

ප්‍ර: දැන් කියනවා, බාධාවක් වෙයි කියලා -

උ: සිද්ධිය වූ දිනයේ, සිද්ධිය නිවැරදිව දැන ගන්න කථා කළා. ස්වාමීනි, ඊට පස්සේ කථා කළෙ නැහැ.

ප්‍ර: ප්‍රමාදය පිළිබඳව මහත්මයාට තවම ප්‍රශ්නයක් නැහැ?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: මේ පුද්ගලයා මිය ගිහිල්ලා තිබෙන්නේ කීයටද?

උ: රෝහලට ඇතුළත් කළාට පස්සේ.

ප්‍ර: කීයට විතරද?

උ: ස්වාමීනි, පාන්දර.

ප්‍ර: ඒක මහත්මයා දැන ගන්න කොට පැය 4 ක් විතර ගිහිල්ලා?

උ: එහෙමයි.

ප්‍ර: ඒකත් මහත්මයාට ප්‍රශ්නයක් නැහැ?

උ: ප්‍රශ්නයක් තිබෙනවා, ස්වාමීනි. නිලධාරියෙක් මිය ගිහිල්ලා.

ප්‍ර: ප්‍රශ්නයක් තිබෙනවා නම් මොකක් හරි කරන්න එපා යැ. මහත්මයා. මොකක්ද කරලා තිබෙන්නේ?

උ: විමර්ශනයක් කරන්න තරම් සාධාරණ හේතුවක් තිබුණේ නැහැ ස්වාමීනි.

ප්‍ර: විමර්ශනයක් නොවයි. " ඇයි මට කිව්වේ නැත්තේ " කියලාවත් ඇහුවේ නැද්ද?

උ: ඇහුවා, ස්වාමිනි.

ප්‍ර: ඒකට හේතුවක් දුන්නාද?

උ: වැඩ කටයුතු නිසා කියා ගන්න බැරි වුණා කියලා කිව්වා. මිය ගිහිල්ලා, එයා රෝහලට ගිහිල්ලා තිබෙනවා. පාන්දරම එයත් මාතරට ගිහිල්ලා තිබුණා, ස්වාමීනි.

ප්‍ර: කවුද එයාට යන්න කිව්වේ?

උ: දන්නේ නැහැ.

ප්‍ර: මහත්මයා කිව්වාද?

උ: නැහැ.

ප්‍ර: මේ වෙනකල් දන්නේ නැහැ. අධ්‍යක්ෂවරයාට මාතරට යන්න කිව්වේ කවුද කියලා?

උ: සාමාන්‍යයෙන් ඔහුගේ කණ්ඩායමක් නිසා ඔහු යා යුතුයි, අධ්‍යක්ෂවරයා හැටියට.

ප්‍ර: මහත්මයාගේ කණ්ඩායමක් නොවෙයිද, මේ කණ්ඩායම?

උ: මගේ කණ්ඩායමක් තමයි, ස්වාමිනි. මගේ යටතේ රාජකාරි කරන අය.

ප්‍ර: මහත්මයා මරණ ගෙදර ගියාද?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ඇත්තටම තමන්ගේ තනතුර මොකක්ද?

උ: නියෝජ්‍ය පොලිස්පති, ස්වාමීනි.

ප්‍ර: ඒ කියන්නේ තමන්ට මේ තනතුර සඳහා රජයෙන් වැටුප් ගෙවලා, රජයෙන් සියලු පහසුකම් දීලා ඔතැන තියලා තිබෙන්නේ ඇයි?

උ: ඒ අදාළ බල ප්‍රදේශයේ රාජකාරී සම්බන්ධව වග කියන්න, ස්වාමීනි.

ප්‍ර: වාහනයක් දිලා, ඩ්‍රයිවර් කෙනෙක් දිලා, ටෙලිෆෝන් දීලා, පෙට්‍රල් දීලා, ඒ සියල්ලම කරලා තිබෙන්නේ මොකටද කියලා මම අහන්නේ.

උ: රාජකාරී කටයුතු සඳහා, ස්වාමීනි.

ප්‍ර: එතකොට තමන් තමන්ගේ රාජකාරිය හරියට කළාද?

උ: එහෙමයි. ස්වාමිනි.

ප්‍ර: කළා නම් කොහොමද, - තමන්ට මේ ගැන අවබෝධයක් ලැබෙන්නේ, 9.30 - 10.00 ත් අතර?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: සිද්ධිය වෙලා තිබෙන්නේ 3.00 ට වාගේ?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: එතකොට තමන් මේ ප්‍රමාදය ගැන සොයා බැලුවේ නැද්ද?

උ: ස්වාමීනි. සිදුවීමෙන් නිලධාරියෙක් මිය ගියා කියලා, ලොකු operartion එකක් කළ නිසා නිලධාරීන්ගේ චිත්ත ධෛර්යයට බාධාවක් වෙයි කියලා මම කිසිම විමර්ශනයක් ආරම්භ කළේ නැහැ.

ප්‍ර: එතකොට තමන්ගේ අධික්ෂණය මොකක්ද?

උ: මම ඒ වෙලාවේ මගේ වැඩි අවධානය යොමු කළේ, මිය ගිය සහ තුවාල ලැබූ නිලධරින්ගේ සුභ සාධනය සම්බන්ධව.

ප්‍ර: එතකොට රජයෙන් තමන්ට මෙච්චර වියදම් කරලා, මෙච්චර තනතුරු දීලා, සැප පහසුකම දිලා තිබෙද්දී තමන් තමන්ගේ රාජකාරිය හරියට කළා කියලා තමන් සෑහිමකට පත් වෙනවාද?

උ: ඔව්. ස්වාමීනි. මම වසර හතරක පමණ කාලයක් කොළඹ නියෝජ්‍ය පොලිස්පති හැටියට රාජකාරි කළා.

ප්‍ර: වසර හතරේම කළේ ඔහොමද, ඔය විධියටමද?

උ: නැහැ. රාජකාරී විශාල ප්‍රමාණයක් කළා, ස්වාමීනි.

ප්‍ර: තමන්ට ඉහළින් ඉන්නේ, ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාත් දැන ගත්තේත් ප්‍රමාද වෙලාද?

උ: අධ්‍යක්ෂවරයා කිව්වා. උදෑසනම ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය පොලිස් අධිකාරීවරයාට දැනුම් දුන්නා කියන එක.

ප්‍ර: ඒ කියටද?

උ: වෙලාවක් ඇහුවේ නැහැ, ස්වාමීනි. මා දැනුවත් වෙන කොට එතුමා දැනුවත් වෙලා කියන කථාව තමයි කිව්වේ. වෙලාවක් මම ඇසුවේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: චන්ද්‍ර කුමාර මහත්මයා, ඔබතුමා නියෝජ්‍ය පොලිස්පතිවරයා නේ?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ඔබතුමා දිගටම ලංකාවේ හිටියාද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: අසනීප තත්ත්වයක් මොනවා හරි තිබෙනවාද?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: දැනටත් නැහැ නේද?

උ: නැහැ

ප්‍ර: ඔබතුමා හරියට කකුල් ගස්සන නිසා ඇහුවේ මම. හොඳට ඉන්න, සන්සුන්ව.

උ: පළමුවැනි වතාව ස්වාමිනි.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: මොකක්ද කිව්වේ?

උ: මේ වාගේ ප්‍රකාශයක් දෙන්නේ පළමුවැනි වතාවට, ස්වාමීනි.

ප්‍ර: මොන වාගේ ප්‍රකාශයක්ද?

උ: මේ වාගේ කොමිෂන් සභාවක් ඉදිරියේ,

ප්‍ර: සාක්ෂි දීලා නැද්ද කලින්?

උ: කොමිෂන් සභාවක් ඉදිරියේ දිලා නැහැ. ස්වාමීනි.

ප්‍ර: උසාවි වල සාක්ෂි දීලා තිබෙනවාද?

උ: එහෙමයි. ස්වාමිනි.

***

ප්‍ර: දැන් මහත්මයා සන්සුන්ව ඉඳගෙන, එහෙ මෙහ දඟලන්නේ නැතුව සාක්ෂි දෙන්න ඕනෑ.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: මහත්මයා දැන් මේ ගරු කමිටුවට කිව්වා නේ, තමුන්ගේ අද මතයක්, නාඳුනන කුවක්කුකාරයෙක් වෙඩි තිබ්බේ කියලා?

උ: එහෙමයි, ස්වාමීනි.

උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් වෙඩි තැබීමෙන් තුවාල ලැබූ ආකාරය පිළිබඳව නැවත නැවතත් ප්‍රශ්න මතු වුවද, මෙම සාක්ෂිකරු එම ස්ථාවරයම, එනම් නාඳුනන පුද්ගලයෙකුගේ වෙඩි තැබීමෙන් තුවාල ලැබූ බවට වූ ස්ථාවරය නිරන්තරයෙන් පවත්වා ගෙන ගොස් ඇත. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් තොරතුරු ලැබීමෙන් පසු මෙම සිද්ධිය දැනුම් දීමට තමා වගඋත්තරකාර

පොලිස්පතිවරයාට කතා කළ විට, ඒ වන විට වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම සිද්ධිය පිළිබඳ අවබෝධයෙන් සිටි බව ඔහු පිළිගෙන ඇත. මේ අනුව, 2023-12-31 දින අලුයම උදාවීමට පෙර මෙම සිද්ධිය ගැන දැන සිටි ධූරාවලියේ අනෙක් පිරිස විසින් මෙම සාක්ෂිකරු අඳුරේ තබා ඇති බව සාක්ෂි මගින් මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ධනාත්මකව තහවුරු වී තිබේ.

එක් අවස්ථාවකදී, මෙම සාක්ෂිකරු පවසා ඇත්තේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වැලිගම බලා අධිවේගී මාර්ගයේ යමින් සිටි අතරතුරේදී තමාට දුරකථනයෙන් කතා කළ බවයි. කෙසේ වෙතත්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සහ වගඋත්තරකාර පොලිස්පතිවරයා යන දෙදෙනාටම අනුව, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා උදෑසන 6.00 ට පෙර වැලිගමට පැමිණ තිබුණි. උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මෙම සාක්ෂිකරුට කමිටුව ඉදිරියේ බොරු සාක්ෂි ලබා දෙන බවට යෝජනා කර ඇත්තේ එම පදනම මත ය. මෙම අභියෝග කිරීම් හමුවේ නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර පසුව එය අසත්‍ය බව පිළිගෙන තිබේ. මෙම සාක්ෂියේ අදාළ කොටස මෙම ස්ථාවරය පිළිබිඹු කරයි:

ප්‍ර: එතකොට තමුන්ට අඩු ගානේ නෙවිල් සිල්වා මාතරට යනවා කියලාවත් කියලා ගියේ නැහැ? හරිද? තමුන්ට කථා කළේ 9.30 ට 10.00 ට විතර එහේ ඉඳන් නේ ? මාතර ඉඳන්?

උ: අතරමඟ යන ගමන්.

ප්‍ර: මම තමුන්ට යෝජනා කරනවා සම්පූර්ණ අසත්‍යයක් මේ කමිටුව හමුවේ කියන්නේ කියලා? නෙවිල් සිල්වා උදේ 6 වෙනකොට වැලිගම සිටියා කියලා?

උ: යන ගමන් කියලා තමයි මට දැනුම් දුන්නේ.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: අතරමඟ යනවා නම් 9.30 වෙනකම නෙවිල් සිල්වා ඔතැනට ගිහිල්ලා නැහැ? ඒක හරි නේ?

උ: ඒක දන්නේ නැහැ.

ප්‍ර: දන්නේ නැහැ නොවෙයි. මහත්මයා O/Level වත් pass ඇති නේ?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා දැන ගත්තේ 9.30 ට නම්, නෙවිල් සිල්වා කියනවා නම් අතරමඟදී තමයි මේ call දෙන්නේ කියලා. 9.30 වෙනකම් නෙවිල් සිල්වා එතැනට ගිහිල්ලා නැහැ?

උ: ඔව්.

ප්‍ර: ඒක තේරෙනවාද?

උ: ඒක තේරෙනවා.

ප්‍ර: මම දන්නේ නැහැ කියන්නේ මොකක්ද? තේරුණාද?

උ: තේරුණා.

ප්‍ර: මම දන්නේ නැහැ කිව්වේ අසත්‍යයක්ද?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඇයි අසත්‍ය ප්‍රකාශ කළේ?

උ: ඒක මට හරියට නිශ්චිත නැති වුණ නිසා.

ප්‍ර: මම මුලදිත් කිව්වා ඔය වැඩේ කරන්න එන්න එපා.

උ: එහෙමයි ස්වාමීනි. සමාවෙන්න ස්වාමිනී.

ප්‍ර: ප්‍රශ්නයක් ඇහුවාම ඒක තේරුම් අරගෙන හරි උත්තරය දෙන්න. ඕක පොඩි ළමයකුට තේරෙන්නේ නැද්ද? නෙවිල් සිල්වා අතරමඟදී call කළා නම්, මහත්මයාට call එක ආවේ 9.30 ට නම්, 9.30 වෙනකම් නෙවිල් සිල්වා එතැනට ගිහිල්ලා නැහැ? දන්නේ නැහැ කියන්නේ මොකක්ද? ඒකත් දන්නේ නැත්නම් මහත්මයා මම දන්නේ නැහැ, කොහොම රජයේ සේවයේ ඉන්නවාද කියලා.

උ: නැහැ ස්වාමිනි මම කිව්වේ 6 වෙන කොට එතැන සිටියාද කියන එක දන්නේ නැහැ කියලා.

ප්‍ර: ඒක ඇහුවේ පස්සේ මහත්මයා.

උ: එහෙමයි ස්වාමිනි.

යවන ලිපි ලේඛනයෙහි (Outward Document register)වෙනස්කිරීම් පිළිබඳ සාක්ෂි විමසූ විට, නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා ප්‍රකාශ කර ඇත්තේ එම වෙනස්කිරීම් පිළිබඳව තමා නොදන්නා බවයි. අතිරේක සොලිසිටර් ජනරාල්වරයා පැ-75 ලේඛනය ඔහුට පෙන්වූ විට පවා, එය වැරදි බව ඔහු පිළිගන්නේවත් එය සිදු වූ ආකාරය පැහැදිලි කරන්නේවත් නොමැත. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂි පහතින් පිටපත් කර ඇත:

ප්‍ර: මේ register එක අනුව යවලා තිබෙන්නේ කවදද ?

උ: ඒක ගැන දැනීමක් නැහැ ස්වාමීනි 01.01 කියලා සඳහන් වෙන්නේ.

ප්‍ර: 2024.01.01?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: පොලිස් සැරයන් උපුල් මැරුණේ කවදද?

උ: 31 පාන්දර

ප්‍ර: මැරුණට පස්සේ නේද මේක යවලා තිබෙන්නේ මහත්මයාගේ කාර්යාලයෙන්?

උ: උපන් දිනය අනුව 01.01 යවලා තිබෙන්නේ කාර්යාලයෙන්.

ප්‍ර: ඒක මහත්මයාට ප්‍රශ්නයක් නැද්ද?

උ: මම දන්නේ නැහැ ස්වාමිනි, කොයි වෙලේද යැව්වේ කියලා. මම අත්සන් කරලා ඒක දාලා තිබෙනවා. නිසි අවසරය තිබෙනවා. මම දන්නේ නැහැ. කාර්යාලයේ ලේඛන.

ප්‍ර: මහත්මයාගේ කාර්යාලයනේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: මහත්මයා යටතේ ඉන්න නිලධාරියෙක් නේ?

උ: එහෙමයි ස්වාමිනි.

ප්‍ර: ඒක මහත්මයාට ප්‍රශ්නයක් නැද්ද?

උ: ස්වාමීනි. මේකේ ලේඛනගත වෙනවට වඩා, නිසි අවසරය නිසි පරිදි ලබා ගෙන තිබෙන එක පිළිබඳව තමයි අපි අවධානය යොමු කරන්නේ. ලේඛනවල කුමක් සඳහන් වුණත් මෙතැන අවසරය හරි කියලා මම පිළිගන්නවා.

ප්‍ර: 01 වැනිදා මහත්මයාගේ නිර්දේශය ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ගියා නම්, 30 වැනිදා යන්නේ කොහොමද? කොහේද තිබුණේ නිසි අවසරයක්?

උ: මා දන්නා තරමින් මේක 29ම ගිහිල්ලා තිබෙනවා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාට.

ප්‍ර: එහෙම නම් මේ ලේඛනය වැරදියිනේ?

උ: නිසි අවසරය ලබා ගත්තා කියලා දන්නවා.

ප්‍ර: මේ ලේඛනයේ තිබෙන සටහන ගැන මම අහන්නේ. මහත්මයා තමයි කියන්නේ නිසි අවසරය සහිතව කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයාගේ කාර්යාලයේ ඔය ලිපි ලේඛන නඩත්තු කරන්නේත් ආණ්ඩුවේ වියදමින් ?

උ: එහෙමියි ස්වාමීනි.

ප්‍ර: 29 වැනිදා යවන්න ඕනෑ එක 01 වැනිදා මැරණට පස්සේ යවන්න පුළුවන්ද?

උ: බැහැ ස්වාමිනි.

ප්‍ර: එතකොට මේ සටහන අසත්‍ය සටහනක්ද?

උ: ඒක ඒ ලේඛනය භාර නිලධාරිගෙන් අහන්න ඕනෑ.

ප්‍ර: කවුරු යෙදුවත් මේ සටහන අසත්‍ය සටහනක්ද?

උ: අසත්‍යයයි. එදාට සටහන් කළාද කියලා මට දැනීමක් නැහැ.

ප්‍ර: කවදට සටහන් කළා කියලද?

උ: 01.01 දිනයේ සටහන් කළාද කියලා මට දැනීමක් නැහැ. ඒක සඳහන් වෙලා තිබෙනවා. ඒක වරදක්.

ප්‍ර: ඒක අසත්‍ය සටහනක්ද? නැත්නම් මහත්මයා කියන්නේ ඒක සත්‍ය සටහනක් කියලාද?

උ: ස්වාමීනී. ඒ ගැන මට කියන්න අපහසුයි. ඒක කුමන හේතුවක් නිසා එහෙම වුණාද කියන එක මම දන්නේ නැහැ.

ප්‍ර: හේතුව නොවෙයි මහත්මයා මම අහන්නේ. මම අහන්නේ ඒක සත්‍ය ද අසත්‍යයද කියලායි?

උ: මේ ලේඛනයේ සටහන් වෙලා තිබෙනවා ස්වාමිනි. 01.01 වෙනි දිනයේ කියලා.

ප්‍ර: සටහන් වෙලා තිබෙන බව ඇත්ත. ඒ සටහන් වෙලා තිබෙන එක සත්‍ය කරුණක්ද අසත්‍ය කරුණක්ද?

උ: ඒක ඒ නිලධාරියාගෙන් අසන්න ඕනෑ සටහන් වෙලා තිබෙනවා. ඒක අසත්‍ය කරුණක්.

ප්‍ර: මහත්මයායෙන් වගකීමක් තිබෙනවාද මහත්මයාගේ office එකේ දේවල් නිසියාකාරව ඉටු කරන්න?

උ: තිබෙනවා.

ප්‍ර: DIG විධියට මේක මහත්මයාට බරපතළ කාරණයක් ද එහෙම නැත්නම් එච්චර බරපතළ නැති කාරණයක්ද?

උ: ඒක එච්චරම බරපතළ නැහැ. අපි නිසි පරිදි අවසරය දීලා තිබෙන නිසා ඒක ප්‍රමාද වෙනවා. සමහර වෙලාවට වාචිකවත් අපි අවසර දෙනවා. ඒක එවරම බරපතළ දෙයක් හැටියට මම සලකන්නේ නැහැ.

ප්‍ර: මහත්තයාට ආවා නේ reward application එක?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: මහත්මයා කිච්චනේ පිට වීමේ සටහන්, අනෙකුත් ලේඛන ගෙනැල්ලා පරීක්ෂා කර බලලා සෑහීමකට පත් වුණාට පස්සෙ තමයි ඒක අත්සන් කළේ කියලා?

උ: එහෙමයි ස්වාමීනි.

ප්‍ර: ඒකට මේකේ අදාළත්වයක් තිබෙනවාද නැද්ද?

උ: එහෙම දෙයක් මට අනාවරණය වුණේ නැහැ ස්වාමීනි. ලේඛන පරීක්ෂා කරන කොට.

ප්‍ර: මේ ලේඛනය තිබුණේ කාගේ භාරයේද?

උ: මගේ කාර්යාලයේ ලිපිකරු භාරයේ.

ප්‍ර: අනාවරණය වෙන්නේ මහත්මයා බැලුවොත් නේ?

උ: එහෙමයි.

ප්‍ර: මහත්මයා බැලුවද?

උ: මම ඒක බැලුවේ නැහැ.

ප්‍ර: පස්සේ හරි බැලුවාද?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: මහත්මයා, පොලිසියේ නිලධාරියෙක් මැරුණා නේ?

උ: එහෙමයි.

ප්‍ර: වෙඩි තැබීමකින්?

උ: එහෙමයි ස්වාමීනි

ප්‍ර: ඊට පස්සේවත් බැලුවේ නැද්ද ඔය අනුමැතිය මහත්මයාගේ කාර්යාලයෙන් ගිහිල්ලා තිබෙන්නේ යන කොට මේ ගොල්ලන්ට ගිහිල්ලා තිබෙනවාද නැද්ද කියලා?

උ: මේ සම්බන්ධව මම දැනුවත් වෙලා හිටියේ නැහැ. වැරදි දිනයක් සඳහන් වෙලා කියලා මම දැනුවත් වෙලා හිටියේ නැහැ. මම අත්සන් කළා. අත්සන් කරලා ලබා ගන්නවා.

ප්‍ර: නිවැරදි දිනයක් සටහන් වෙලා කියලා ද, වැරදි දිනයක් සටහන් වෙලා කියලාද?

උ: වැරදි දිනයක් සටහන් වෙලා කියලා මම දැනුවත් වෙලා හිටියේ නැහැ.

ප්‍ර: දැන් නේ මහත්මයා දන්නේ ?

උ: දැන් දන්නේ, ස්වාමීනි.

ප්‍ර: මහත්මයා දැන් දන්නේ මහත්මයාගේ කාර්යාලයෙන් වෙච්ච දේවල්?

උ: එහෙමයි.

ප්‍ර: අද 2025 ජුනි මාසේ 24 වැනි දා තමයි මහත්මයා මේක දන්නේ?

උ: එහෙමයි.

ප්‍ර: මෙකේ අයව සටහනක් දාන්න හේතුවක් තිබෙනවාද, කවුරු හරි දාපු නිලධාරියෙක්?

උ: මම දන්නා තරමින් එහෙම නැහැ. ස්වාමිනි.

ප්‍ර: සාමාන්‍ය වශයෙන් මෙකේ දමන දිනය ඔය ලේඛනය යවනු ලබන දිනය නේද?

උ: ඒක වෙනස් වෙන්න පුළුවන්. අත්සන් කරන දිනය සහ යවනු ලබන දිනය වෙනස් වෙන්න පුළුවන්, ලේඛන අනුව.

ප්‍ර: ලේඛනයේ අත්සන් කිරීමක් ගැන නොවෙයි මම අහන්නේ, අත්සන් කළා හරි, නැතුව හරි, නිර්දේශ කළා හරි නැතුව හරි නිර්දේශ නොකරත් යවන්න පුළුවන් නේ ?

උ: ඔව් ස්වාමීනි.

ප්‍ර: නිර්දේශ කිරීම අනිවාර්ය නැහැනේ, ලියුමක් යවන්න?

උ: නැහැ.

ප්‍ර: ප්‍රතික්ෂේප කරලා හරි, භාර අරගෙන හරි යවනු ලබන ලේඛනය ගැන අපි කථා කරන්නේ, ඒ ලිපියේ තිබෙන අන්තර්ගතය ගැන නොවෙයි?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: සාමාන්‍ය තත්ත්වය යටතේ ලේඛනයක් යම් කිසි දිනයක යැව්වා කියලා සටහන් වනවා නම්, ඒකෙන් මහත්මයා පිළිගන්නවාද ඒ දිනයේ තමයි මහත්මයාගේ කාර්යාලයෙන් ඔය ලේඛනය යැව්වේ කියලා. වෙන අයගේ කාර්යාල ගැන නොවෙයි අහන්නේ?

උ: ලේඛනයට අනුව ඒ දිනයේ තමයි කියලා පිළිගන්නවා.

ප්‍ර: ඔය register එකට අනුව ජනවාරි 01 වැනි දා නම් ඔය ලේඛනය යවලා තිබෙන්නේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට ඕක 29 වැනි දා අත්සන් කරන්න බැහැ කියන එක මහත්මයා පිළිගන්නවාද?

උ: 01 වැනි දා ගියොත් අත්සන් කරන්න බැහැ. ස්වාමීනි.

ප්‍ර: ඒක අදාළ කාරණයක් ද මේ ත්‍යාගය නිර්දේශ කරන්න, එහෙම නැත්නම් අදාළ නැති කරුණක්ද?

උ: ලොකු අදාළත්වයක් නැහැ. ස්වාමීනි.

ත්‍යාග වවුචරය මත ඔහු කර ඇති නිර්දේශය පිළිබඳ සඳහන් කරමින්, නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර මහතා පහත පරිදි ප්‍රකාශ කර ඇත:

ප්‍ර: බලන්න, වවුචරයේ පිටුපස තිබෙනවා, තෑගි අරමුදලේ විවුචරය. ඒක බලන්න, ඔබතුමා ඒක අත්සන් කර තිබෙනවාද කියලා?

උ: මේකේ මට අත්සන් කරන්න නැහැ. Covering letter එක පමණයි අත්සන් කර තිබෙන්නේ.

ප්‍ර: බලන්න මහත්මයා එකේ දාලා තිබෙන විස්තරය හරිද කියලා, ඔය තෑගි වවුචරය ආවාට පස්සෙද ඔබතුමා ආවරණ ලිපිය හදන්නේ?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: එතකොට මහත්මයා ඉස්සෙල්ලා තැගි වවුචරයෙන් තමයි මේ ක්‍රියාවලිය ආරම්භ වෙන්නේ. හරිද?

උ: එහෙමයි.

ප්‍ර: ඔබතුමා ආවරණ ලිපියට පදනම් කර ගත්තේ මොන කරුණුද?

උ: ස්වාමීනි, ඒක අපරාධ වාර්තා කොටාට්ඨාසයේ නිලධාරීන්ගේ එවනු ලබන වාර්තාවක් මත පදනම්ව.

ප්‍ර: මේ සිද්ධියට එහෙම වාර්තාවක් ගෙන්වා ගත්තාද?

උ: මේකට කොට්ඨාසයෙන් ත්‍යාග ඉල්ලුම් පත්‍රය එව්වා.

ප්‍ර: නැහැ. නැහැ. තමන්ගේ ලියුම හදන්න පදනම් කර ගත්තේ මොන කරුණු ද කියලා මම ඇහුවේ?

උ: කොළඹ අපරාධ කොට්ඨාසයේ අධ්‍යක්ෂවරයාගේ ලිපිය.

ප්‍ර: ඒ කියන්නේ. P. 5 කියන ලේඛනයද?

උ: එහෙමයි.

ප්‍ර: P 5 කියන ලිපිය තමන් ඒ විධියටම copy කළාද?

උ: වෙනස් කරන්න දෙයක් නැහැ. ස්වාමිනි.

ප්‍ර: තමන් අධීක්ෂණ නිලධාරියා නේ. කොහේවත් ඉන්න අධ්‍යක්ෂවරයෙක් කියන දෙයක් තමන් පිළිගන්න ඕනැද?

උ: ස්වාමීනි, මේ සම්බන්ධයෙන් දැනුවත් වෙලා තිබෙන්නේ ඒ විස්තරයේ තිබෙන ඒ ලියුම නිසා. ඒක තමයි මම උඩට forward කරන්නේ, මේකේ සඳහන් කරන කරුණු.

ප්‍ර: ඔබ ස්වාධීනව මේක හොයලා බලලාද?

උ: බලනවා, ස්වාමිනි.

ප්‍ර: කොහොමද එහෙම වෙන්නේ කියලා මම අහන්නේ?

උ: අධ්‍යක්ෂවරයාට කථා කරලා වැඩිදුර විස්තර ගන්නවා.

ප්‍ර: එතකොට එයා කොළඹට ඇවිල්ලාද ?

උ: දුරකථනයෙන් කථා කළේ. මම දන්නා විධියට එතකොට මාතර. දුරකථනයෙන් කථා කරලා විස්තර ගත්තා. ගලේ වෙල පොලීසිය යවලා මම විස්තර හොයා ගත්තා. ඒ වාගේම කරා පිටිය රෝහලෙන් මම විස්තර ලබා ගත්තා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගෙන් විමසීම් කරලා තමයි මේ reward paper එක සාධාරණීකරණය කළේ. මම ඊට පස්සේ නියෝජ්‍ය පොලිස්පතිතුමාටත් මෙක සඳහන් කළා.

ප්‍ර: ඔබතුමා මේ කමිටුවට මීට ඉස්සෙල්ලා කිව්වා නේද වැලිගමින් වෙඩි කියලා තමයි මේ කට්ටිය මැරුණේ කියලා?

උ: නාඳුනන්න සැකකරුවෙක්.

ප්‍ර: නැහැ. නැහැ, පසුව?

උ: නැහැ ස්වාමිනි.

ප්‍ර: මහත්මයා පසුව දැන ගත්තාද වැලිගම පොලිසියේ Army එකේ soldier කෙනෙක් වෙඩි තැබීමකින් මිය ගියා කියලා?

උ: එහෙම කථාවක් දැන ගත්තා, ස්වාමීනි.

ප්‍ර: කථාවක් මිසක් ස්ථිර නැහැ?

උ: ස්ථිර නැහැ. අධිකරණයේ නඩුවක් තිබෙන නිසා.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: කථාවක්?

උ: නැහැ. ස්වාමීනි මට දැනගන්න ලැබුණා.

ප්‍ර: කොහෙන්ද?

උ: කුමන හෝ කාරණාවකින්, මාධ්‍ය වලින් හරි මට දැන ගන්න ලැබුණා. මම දැනුවත් වෙලා හිටියේ.

ප්‍ර: මාධ්‍යවලින්?

උ: වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂකගේ වාර්තාවෙන් ඒ බව සඳහන් වුණා. ඒ දෛනික වාර්තාවේ සඳහන් වෙලා තිබෙන කරුණු තමයි.

ප්‍ර: මොකක්ද ඒකේ සඳහන් වුණේ?

උ: ඒකේ සඳහන් වුණා, වැලිගමින් ජංගම සංචාරයේ ගිය රථයක් මේ ස්ථානයට ඇවිල්ලා තිබෙනවා කියලා.

ප්‍ර: ඒක මහත්මයා රථයක් ආවා කියලා කිව්වාට මහත්මයා දැන ගත්තේ නැහැ මෝටර් සයිකලයකින් ආවාද, බස් එකකින්ද ආවාද, මොකකින් ආවාද කියලා?

උ: එහෙමයි. ස්වාමීනි.

***

ප්‍ර: ඔබතුමා බලන්න, ඔබතුමාගේ ඔය ලිපියයි, තෑගි වඩුවරයේ විස්තරයයි හරිද කියලා. මම ඇහුවා නේ, අඩුපාඩුවක් තිබෙනවාද කියලා?

උ: නැහැ. ස්වාමීනි. මම අඩුපාඩුවක් දකින්නේ නැහැ

උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් තුවාල ලැබූ ආකාරය පිළිබඳව අසන ලද ප්‍රශ්නවලට මෙම සාක්ෂිකරු ලබා දුන් පිළිතුරු හමුවේ, උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා , වැලිගම පොලිස් ස්ථානයේ පවත්වාගෙන යන නිලධාරී මුර සංචාර පොතෙහි (OVB) හි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ විසින් තබන ලද සටහන් ඉදිරිපත් කර, එම සටහන් මෙම සාක්ෂිකරු ලවා කියවීමට සැලැස්වීය. පහත උපුටා දැක්වීම් නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාරගේ මේ සම්බන්ධයෙන් වන ප්‍රතිචාරය පෙන්නුම් කරනු ඇත.

ප්‍ර: ඔබ කිව්වානේ මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහත්මයාගෙන් කරුණු විමසලා මෙම සිද්ධිය ගැන දැනගත්තා කියලා?

උ: එහෙමයි.

ප්‍ර: දැන් ඔබට පණ්ඩුල වීරසිංහ මහත්මයාගේ සටහන පෙන්වනවා. (සාක්ෂිකරු එම ගමන් සටහන කියවා ගනී.) මහක්ෂයාට මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ මේ සටහන අනුව කියලා තිබෙන දේ ඔබට තේරෙනවාද ?

උ: එහෙමයි.

ප්‍ර: මොකක්ද ඔබගේ ඒ ගැන වටහා ගැනීම?

උ: ස්වාමීනි. දෙසැම්බර් 31 වෙනි දා අළුයම සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් ස්ථාන පරීක්ෂාවකින් පසුව මෙම ජොෂ්ය පොලිස් අධිකාරිවරයා ඒ සටහන යොදලා තිබෙන්නේ. ඒ සිදුවුණු සිදුවීම සඳහන් කරලා තිබෙනවා.

ප්‍ර: මොකක්ද සඳහන් කරලා තිබෙන සිදුවීම?

උ: CCD විමර්ශන කණ්ඩායමක් වැලිගම W15 හෝටලය අසලට ඇවිල්ලා පුද්ගලයෙක් පරීක්ෂා කරන කොට සිදු වූ වෙඩි හුවමාරුවකින් පොලිස් නිලධාරියෙක් තුවාල වී කෙනෙකු මිය ගිය බවටත්, වැලිගම ජංගම සංචාරයේ යෙදී සිටියදී එම ස්ථානයට පැමිණ වෙඩි තැබීමක් සිදු කර ඇති බවටත් එම නිලධාරියා සඳහන් කරලා තිබෙනවා.

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර: වැලිගම ජංගම මුර සංචාරයෙන් වෙඩි තැබීමක් සිද්ධ වුණු බව මහත්මයා දැන්ද දැන ගත්තේ?

උ: නැහැ ස්වාමිනි වැලිගම HQI දෛනික වාර්තාවේ ඒක සඳහන් වෙලා තිබුණා.

ප්‍ර: CCD එකේ කට්ටියට  වෙඩි වැදීම සම්බන්ධයෙන් ජොෂ්ය පොලිස් අධිකාරිවරයා මොනවාද කියන්නේ ?

උ: තුවාලකාරයෝ දෙන්නා රෝහල්ගත කරලා, එක් අයෙකු මිය ගිය සිද්ධිය කියනවා.

ප්‍ර: කාගේ වෙඩි පහරින් ද, කාගේ වෙඩි පහරක්ද වැදිලා තිබෙන්නේ?

උ: කවුද කියන එක කිව්වේ නැහැ.

***

ප්‍ර: කියන්න ඕනෑ නැහැ මේකේ තිබෙනවානේ, ඔබතුමා මේක මෙච්චර වෙලා කියෙව්වනේ ?

උ: ඒකේ වෙඩි තිබ්බේ කවුද කියන එක තිබුණේ නැහැ. මරණකරු මැරීමට වෙඩි තැබූ පුද්ගලයා සම්බන්ධව සඳහනක් නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර: මහත්මයාට අකුරු කියවන්න පුළුවන්ද ?

උ:	එහෙමයි.

***

ප්‍ර:	මහත්මයා දන්නවානේ CCD වැන් රථයේ වීදුරු වලට වෙඩි වැදිලා හානියක් වුණා කියලා?

උ:	Damage කියලා දන්නවා.

ප්‍ර:	කවුරුන් විසින් තැබූ වෙඩි පහර වලින් ද ඒ අලාභානි ඇති වුණේ, විශේෂයෙන්ම නිලධාරියෙක් මිය ගියේ සහ තව කෙනෙක් තුවාල වුණේ කියලා අවබෝධයක් දැන් තිබෙනවාද?

උ:	මේ සටහනින් පස්සේ තිබෙනවා.

ප්‍ර:	මොකක්ද තිබෙන අවබෝධය?

උ:	ඒකේ ජංගම සංචාරයෙන් පැමිණි නිලධාරීනුත් වෙඩි තැබීමක් සිදු කරලා තිබෙනවා

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර:	තුවාල වෙලා තිබෙන්නේ කොහොමද ? ජංගම සංචාරයේ වෙඩි පහර වලින් නේද CCD එකේ කට්ටියට වෙඩි තියලා තිබෙන්නේ?

උ:	ඒ බව නිවැරදිව සඳහන් වෙලා තිබෙනවා මම දුටුවේ නැහැ ස්වාමිනි. මට සමහර ඒවා කියවා ගන්න-

***

**(සාක්ෂිකරුට නැවත කියවා ගැනීම සඳහා පණ්ඩුල වීරසිංහ මහතාගේ සටහන ලබා දෙයි.)**

ප්‍ර:	ඔබතුමා ඔය කොටස ශබ්ද නගා කියවන්න?
**(සාක්ෂිකරු එම කොටස ශබ්ද නඟා කියවයි )**

ප්‍ර:	ඒ කේ පැය කීයට ද තිබෙන්නේ?

උ:	ඒකේ වේලාවක් සඳහන් වෙන්නේ නැහැ. ස්වාමීනි.

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර: මේ වාර්තාව අනුව මොකක්ද වෙලා තිබෙන්නේ?

උ: මේ සටහනට අනුව වැලිගම පොලීසියේ ජංගම මුර සංචාරයේ ගිය රථයෙන් CCD එකේ නිලධාරීන් ගිය වාහනයට වෙඩි තැබීමක් සිදු කර තිබෙනවා කියලා සඳහන් වෙනවා.

ප්‍ර: නමුත්, මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා සාක්ෂිකරුට කිව්වේ ඒක නොවෙයි නේද?

උ: නැහැ. මේ සටහන දමන්නේ අටයි ගාණට. මම නවයයි ගාණට තමයි ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිට කථා කරන්නේ.

ප්‍ර: ඒ කියන්නේ මේ සටහන දැම්මාට පස්සේ ද?

උ: එහෙමයි, ස්වාමීනි. මේ සටහන නිලධාරි මහත්මා 8.10 ට දාලා තිබෙන්නේ.

ප්‍ර: සාක්ෂිකරු මෙක දැනගත්තේ උදේ 9.30 ට විතර නේද?

උ: ඔව්

ප්‍ර: මේක දැන ගත්තේ තැගි වවුචරය approve කරන වේලාවේදී ද ? ඊට පස්සේ ද?

උ: ඊට කලින්, ස්වාමීනි.

ප්‍ර: කවදාද?

උ: 31 වැනි දා උදේ. මේ සිද්ධිය දැනුම් දුන්නාට පස්සේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි මේ සිද්ධිය සම්බන්ධයෙන් මාතර SSPට කථා කරලා බලනවා. ඒ වෙලාවේ තමයි මට කිව්වේ මෙහෙම සිද්ධියක් වෙලා කියලා.

ප්‍ර: එතකොට මේ සටහන දාලා ඉවරයි නේද?

උ: එහෙමයි.

ප්‍ර: සාක්ෂිකරු මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට කථා කළේ 31 වැනි දා උදේ 9.30 ට පස්සේ ද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: මාතර ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරිවරයා මේ සටහන නිලධාරීන්ගේ ගමන් සටහන් පොතේ දමන්නේ 31 වැනි දා උදේ 8.10ට ද?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: උදේ 8.10 ට සටහන දාලා කියන්නේ CCD එකේ නිලධාරින්ට වෙඩි වැදුණේ වැලිගම පොලිසියේ ජංගම මුර සංචාරයේ යෙදිච්ච පොලිස් නිලධාරින් තියපු වෙඩි ප්‍රහාර වලින් කියලා?

උ: එහෙම කියන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මේ ඒ සටහන?

උ: සටහනේ එහෙම තිබෙනවා, ස්වාමීනි.

ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ විසින් තබන ලද සටහන පැ-77 ලෙස ලකුණු කොට මෙම විමර්ශන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

මේ අනුව, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් වෙඩි වැදී තුවාල ලැබූ ආකාරය සම්බන්ධයෙන් වන නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාරගේ සාක්ෂිය, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දුන් වෙනත් කිසිදු සාක්ෂිකරුවෙකු විසින් තහවුරු නොකෙරෙන සාක්ෂියක් බව මෙම විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වේ. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි පවා මෙම සාක්ෂිකරු විසින් ගන්නා ලද ස්ථාවරය තහවුරු නොකරන බව කමිටුව සටහන් කර ගනී.
මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය නම්, උප පොලිස් පරීක්ෂක මධුරංග තුවාල ලබා පොලිස් සැරයන් උපුල් මිය ගියේ රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදුනු වැලිගම පොලිසියේ පොලිස් නිලධාරීන් විසින් සිදු කළ වෙඩි තැබීමෙන් බව අද දක්වාම ඔහු නොදන්නා බවයි. මෙය පහත සඳහන් ප්‍රශ්න සහ පිළිතුරු වලින් වටහා ගත හැකිය. නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාරගේ සාක්ෂියේ මෙම කොටස ස්වයං පැහැදිලි කිරීමක් වන අතරම ඔහුගේ සාක්ෂියේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් නිවැරදි දෘෂ්ටිකෝණයක් ලබා දීමට සමත් වන බැවින් එම කොටස පිටපත් කිරීම වඩාත් සුදුසු වනු ඇතැයි කමිටුව සිතයි.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: දේශබන්දු මහත්මයා තමන්ට කිව්වාද, මොබයිල් එකෙන් තමයි මේ වෙඩි තැබීම කරලා තිබෙන්නේ කියලා?

උ: නැහැ. ස්වාමීනි

***

ප්‍ර: මගේ ප්‍රශ්නය ඒක නොවෙයි. ඔබතුමානේ, CCD එකේ ආසන්නතම අධීක්ෂණ නිලධාරියා? ලොකු අයගෙන් ආසන්නතම අධීක්ෂණ නිලධාරියා?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: එකකොට, ඔබට උඩින් සිටින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති; වැඩ බලන පොලිස්පති සිද්ධිය දැනගෙනත් ඉවරයි.

උ: එහෙමයි.

ප්‍ර: ඔබ කථා කරන කල් දේශබන්දු මහත්මයා ඔබට කිව්වේත් නැහැ නේද?

උ: කිව්වේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: මගේ ප්‍රශ්නය මේකයි . එතකොට මහත්මයාට පුදුම හිතුණේ නැද්ද, මගේ ප්‍රධානියා මේක දැනගෙනත් ඇයි මට කිව්වේ නැත්තේ කියලා? අනිවාර්යයෙන්ම ඔබතුමාට කියන්න ඕනිනේ.

උ: ස්වාමීනි, විමර්ශන කණ්ඩායමට අවශ්‍ය උපදෙස් දීලා තිබුණා. මට කථා කළේ නැහැ.

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර: මහත්මයා, අනිත් අය සියලුම දෙනා උදේ 6 වෙනකොට ඕක දැනගෙන ඉවරයි. මහත්මයාට පුදුම නැද්ද. මහත්මයා අද වෙන කල් ඕක ගැන දන්නේ නැහැ කියන එක? ඒක ගැන මහත්මයාට පුදුම නැද්ද?

උ: 9.30 වෙනකොට මම දැන ගත්තා, ස්වාමීනි.

ප්‍ර: මොබයිල් එකෙන් වෙඩි තියලා මේ අය මැරුණා කියලා අනිත් කට්ටිය සියලු දෙනාම දැනගෙන ඉවරයි.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: මහත්මයාට පුදුම නැද්ද, මහත්මයා දැන ගත්තේ අදයි කියන එක ගැන?

උ: මට දැනුම් නොදීම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා, ස්වාමීනි.

ප්‍ර: දැනුම් දීලා හරි, දැනුම් නොදී හරි අද වෙන කල් මහත්මයා දන්නේ නැහැනේ? දැනුම් දීම පැත්තකින් තියමුකෝ. මහත්මයා අද වෙනකල් දන්නේ නැහැ.

උ: කුමක් සම්බන්ධයෙන් ද, ස්වාමීනි.

ප්‍ර: මොබයිල් එකෙන් වෙඩි තියලා මේ මිනිහාව මැරුවා කියලා.

උ: දන්නේ නැහැ, ස්වාමීනි.අද වෙනකල් දන්නේ නැහැ.

ප්‍ර: මහත්මයාට අමතරව මේ රටේ තව කවුද නොදැනගෙන සිටියේ?

උ: ඒ සම්බන්ධයෙන් දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: ඔන්න ඔතන තමයි ප්‍රශ්නය. මේ රටේ සිටින වගකිව යුතු සහ අවශේෂ හැමෝම දන්නවා. නමුත්, CCD එක භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා දන්නේ නැහැ?

උ: පිළිතුරක් නැත.

උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා මෙම සාක්ෂිකරුට ඔහු හිතාමතාම අසත්‍ය ප්‍රකාශ කළ බවට යෝජනා කර තිබුණේ ඉහත කරුණු සැලකිල්ලට ගනිමිනි. උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා මෙම කමිටුවට <u>පැ-78</u> ලෙස ළකුණු කරන ලද වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ඇමතුම් විස්තර වාර්තාව ඉදිරිපත් කර ඇත. 2023-12-31 වන දින අලුයම 4.50 ට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සාක්ෂිකරුට ඇමතූ බව දැක්වෙන පැ-78(අ) සටහන වෙත ඔහු මෙම සාක්ෂිකරුගේ අවධානය යොමු කළේය. ඇමතුම් වාර්තාවලින් පෙනී යන්නේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා 2023-12-31 වන දින පෙ.ව. 7.13 ට ද ඔහු ඇමතූ බවයි. මෙය හමුවේ, මෙම සාක්ෂිකරු පහත පරිදි ප්‍රතිචාර දක්වා ඇත:

<u>පරීක්ෂණ කමිටුවෙන්</u> :-

ප්‍ර: අලුයම 4.45ට Director (CCD) එකෙන් මහත්මයාට කෝල් එකක් ඇවිල්ලා කියලා record වෙලා තිබෙනවා.

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: මහත්මයා තත්පර 78 ක් කථා කරලා තිබෙනවා කියලා ටෙලිෆෝන් වාර්තාවේ තිබෙනවා. හරිද?

උ: එහෙමයි, ස්වාමීනි.

ප්‍ර: ඔය වෙලාවේදීත් CCD එකේ Director මහත්මයා ඔය සිද්ධිය සම්බන්ධයෙන් මහත්මයාට කියලා නැහැ?

උ: මට ඒ ගැන මතකයක් නැහැ. ස්වාමීනි.

ප්‍ර: මොකක්ද?

උ: මට නිශ්චිතව කියන්න බැහැ. කිව්වාද නැද්ද කියලා. මට මතක නැහැ, ස්වාමීනි.

ප්‍ර: කිව්වා නම් මහත්තයාට මතක හිටින්න ඕනෑද ?

උ: කිව්වා නම් මතක හිටින්න ඕනෑ.

ප්‍ර: ඒ නිසා වෙන්න ඇති මහතත්යා ස්ථිරවම කිව්වේ, 9.30ට තමයි මහත්මයා දැන ගත්තේ කියලා.

උ: ඔව්. මට මතකයේ තිබෙන්නේ ස්වාමීනි, ඒ වාගේ වෙලාවට කථා කළා කියලා වාගේ තමයි. ඉස්සර වෙලා කථා කරපු එක මට මතක නැහැ.

ප්‍ර: මම කලිනුත් ඇහුවා නේ මහත්මයා, මේ වාගේ සිද්ධි කීයකට මහත්මයා මුහුණ දීලා තිබෙනවාද කියලා.

උ: එකයි, ස්වාමිනි.

ප්‍ර: ඒක අවිස්සාවේල්ලේ සිද්ධිය නේ.

උ: එහෙමයි.

මෙම සාක්ෂිකරුගේ ස්ථාවරය වන්නේ අපරාධය සිදු වූ ස්ථානයට තමන් ගිය බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා ඔහුට පැවසූ බව යි. අපරාධය සිදු වූ ස්ථානය පිළිබඳව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා ඔහුට විස්තර කර තිබුණද, ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ දැනුවත්බව පහත ප්‍රශ්නෝත්තර මගින් නිර්ණය කළ හැකිය:

ප්‍ර: එතකොට ඒ හෝටලයේ සාමාන්‍ය මිනිහෙකුගේ ගණනට වඩා උසින් තිබෙන බෝඩ්වලටයි, උඩ තට්ටුවේ කාමර වලටයි. ස්පා කාමරයට අරවාට මේවාට වෙඩි වැදිලා තිබුණා කියලා කිව්වාද, ASP මහත්මයා?

උ: නැහැ. එහෙම එකක් කිව්වේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: පණ්ඩුල මහත්මයා කිව්වේ නැහැ?

උ: කිව්වේ නැහැ.

ප්‍ර: නෙවිල් සිල්වා කිව්වාද? බලන්න ගියා කිව්වානේ නෙවිල් සිල්වා එතැනට?

උ: වෙඩි පහරවල් ඇතුළේ තිබෙනවා කියලා කිව්වා. කොහේද කියලා හරියට කිව්වේ නැහැ. කාමරවල ද, කොහේද කියලා කිව්වේ නැහැ.

<u>**පරීක්ෂණ කමිටුවෙන්**</u> :-

ප්‍ර: මහත්මයා දැන් මේ වෙනකොට දන්නවාද, වෙඩි පහරවල් තිබ්ච්ච තැන්?

උ: නැහැ. ස්වාමීනි.

ප්‍ර: හෝටලයේ කාමරයකට වෙඩි පහරවල් -

උ: බෝඩ් එකේ තිබුණා කියන එක දන්නවා, ස්වාමීනි.

ප්‍ර: කාමරයේ?

උ: කාමරයේ තිබුණු එක දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: තවම දන්නේ නැහැ?

උ: දන්නේ නැහැ. ස්වාමීනි.

ප්‍ර: තවම දන්නේ නැහැ?

උ: තවම දන්නේ නැහැ. මේ අවස්ථාවේ තමයි දන්නේ, ස්වාමීනි.

ප්‍ර: 2024.12.05 වෙන කල් දැනගෙන හිටියේ නැහැ. W 15 හෝටලයේ කාමරයට වෙඩි වැදිලාය කියලා?

උ: නැහැ. ස්වාමීනි. දැනගෙන හිටියේ නැහැ.

ප්‍ර: මහත්මයා ජංගම මුර සංචාරයෙන් වෙඩි තිබ්බා කියලාත් දැනගෙන නැහැ නේ. තවම දන්නේ නැහැනේ.

උ: එහෙමයි, ස්වාමීනි.

කෙසේ වෙතත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙන්ම සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා යන දෙදෙනාම මෙම කමිටුව ඉදිරියේ පවසා ඇත්තේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා කිසි විටෙකත් අපරාධය සිදු වූ ස්ථානයට නොපැමිණි බවයි. එබැවින්, මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර විසින් ලබා දී ඇති සාක්ෂි අසත්‍ය බව පැහැදිලිය.

හරස් ප්‍රශ්න විමසීම අවසානයේදී ද, මෙම සාක්ෂිකරු පුනර්වාචනය කර ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම නීති විරෝධී ක්‍රියාවක නිරත වී ඇති බව ඒ අවස්ථාව වන විටත් තමාට නොතේරෙන බවයි. මේ අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් කැඳවන ලද නියෝජ්‍ය

පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර විසින් ලබා දුන් සාක්ෂි සම්පූර්ණයෙන්ම අසත්‍යයක් ලෙස ප්‍රතික්ෂේප කළ යුතු බව කමිටුවට ඒත්තු ගැන්වී ඇත.

27) විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහගේ සාක්ෂි.

මෙම සාක්ෂිකරු 2022-05-26 සිට 2024-01-07 දක්වා වන කාලය අතරතුර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයා විය. ඔහු සේවයෙන් විශ්‍රාම ගියේ පසුව සඳහන් කළ දිනයේ ය. නදුන් චින්තක වික්‍රමරත්න නොහොත් හරක් කටා මැඩගස්කරයේ සිට ශ්‍රී ලංකාවට ගෙන ඒමට ඔහු දායක වූයේ මෙම කාලයේදී ය . හරක් කටා ශ්‍රී ලංකාවට රැගෙන ආ ආකාරය ඔහු විස්තර කර ඇත. ඔහුගේ මතකයට අනුව, මෙය සිදු වූයේ 2023-03-14 හෝ ඊට ආසන්න දිනකදීය. රැඳවුම් නියෝග මත හරක් කටා වසර එකහමාරක් පමණ කාලයක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රඳවාගෙන සිටි අතර, එම කාලය තුළ එකී සැකකරු අත්අඩංගුවෙන් පැන යාමට උත්සාහ දරා තිබුණි. ත්‍රස්ත විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න අල්විස් හරක් කටා සමඟ යම් සම්බන්ධයක් ඇති දුරකථන අංක පිළිබඳ විශ්ලේෂණයක් සකස් කර තිබුණි. පසුව, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න අල්විස් ඔහුට පවසා තිබුණේ තමා සකස් කළ දුරකථන අංක ලැයිස්තුව වගඋත්තරකාර පොලිස්පති, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සහ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා යන අය වෙත ලබා දුන් බවයි. මෙම සාක්ෂිකරු එම කාරණා දැනගත් නිශ්චිත දිනයන් පිළිබඳ සඳහන් කර නොමැති වුවද, ඔහු ඉන් දින 07 කට පසු, එනම් 2024-01-07 වන දින විශ්‍රාම ගිය බවට මෙම සාක්ෂිකරු සාක්ෂි සපයයි. මේ අනුව, බොහෝ දුරට මෙම සාක්ෂිකරු 2023-12-29 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා අනෙක් අය සමඟ පැවැත්වූ රැස්වීම පිළිබඳ සඳහන් කරන්නට ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේදී උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහ මහතා ප්‍රකාශ කර ඇත්තේ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කිහිප දෙනෙකු දූෂිත බවට කටකතාවක් පැතිර ගිය බවයි. ඒ සම්බන්ධයෙන් ඔහු යම් යම් පියවර ගෙන තිබුණි. ඔහු විමර්ශන සිදු කළ ද , අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ කිසියම් දූෂිත නිලධාරියෙකු සිටින බව හෝ දූෂිත ක්‍රියාකාරකම් පවතින බව තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස ඔහුට හමු නොවූ බව ඔහුගේ ස්ථාවරය යි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවලට අනුව, එකල පැවති ඇතැම් කටකතාවල අන්තර්ගතයන් ඔහුට ද එරෙහිව විය. ඔහුගේ ධුර කාලය තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ දූෂිත නිලධාරීන් සිටීම හෝ දූෂිත ක්‍රියාකාරකම් පැවතීම පිළිබඳ ගැටළුවක් පැවති බවට මෙම විමර්ශන කමිටුවට ඒත්තු ගැන්වීම සඳහා ඔහු කිසිදු නිශ්චිත තොරතුරක් හෝ අවස්ථා හෝ සිදුවීම් හෝ සාක්ෂි ලබා නොදේ.

අනෙක් අතට, ඒ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි ඉතා දක්ෂ නිලධාරීන් සිටි බව ඔහු පිළිගෙන තිබේ. තමාගේ ධුර කාලයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ දූෂිත නිලධාරීන් හෝ දූෂිත ක්‍රියාකාරකම් පිළිබඳ ගැටළුවක් පැවතියේ නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි නියෝජ්‍ය පොලිස්පතිවරයා ලෙස තමා ද ඊට වගකිව යුතු වන බව ද ඔහු පිළිගෙන තිබේ.

2023-12-29 දිනට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දූෂිත යැයි තහවුරු කිරීමට උත්සාහ කරනු පිණිස වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම සාක්ෂිකරුගේ සාක්ෂි මෙහෙයවීමට පියවර ගෙන තිබෙන්නට ඇත. .හරක් කටා ට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පැවති විමර්ශනයෙන් කොටසක් පමණක් ඉවත් කර, එය 2023-12-29 දින කොළඹ අපරාධ කොට්ඨාසයේ වැඩබලන අධ්‍යක්ෂ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වෙත, වැලිගම සහ එහි තදාසන්න ප්‍රදේශවල අත්අඩංගුවට ගැනීම් කෙරෙහි පමණක් අවධානය යොමු කරන ලෙසට වන උපදෙස් ද ලබා දෙමින් පැවරීමේ තම ක්‍රියාව සාධාරණීකරණය කිරීමක් ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා එම කරුණ තහවුරු කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි. කෙසේ වෙතත්, මෙම විමර්ශන කමිටුව හමුවේ මෙම සාක්ෂිකරු තහවුරු කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති ලෙස එවකට ඔහු සිදු කළ විමර්ශනවලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තුළ යම් දූෂිත නිලධාරියෙකු සිටින බව හෝ දූෂිත ක්‍රියාකාරකම් පවතින බව තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් හමු නොවූ බවයි.

හරක් කටා පැන යාමට උත්සාහ කිරීමේ යම් සිද්ධියක් පැවතියද, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වූයේ එය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ එක් නිලධාරියෙක් අනෙක් නිලධාරීන් අතර නිදිමත ඇති කරවන ද්‍රව්‍යයක් අඩංගු බව කියැවෙන රසකැවිලි කිහිපයක් බෙදා දුන් සිද්ධියක් බවයි. ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබුවේ එක් නිලධාරියෙකු පමණක් බව ද සත්‍යයකි.

විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහ මහතාගේ සාක්ෂිවල විශ්වසනීයත්වයට අභියෝග කිරීමට උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා උත්සාහ දරා නොමැත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි හෙළා දැකීමට කමිටුවට කිසිදු හේතුවක් නොමැත. කෙසේ වෙතත්, මෙම කමිටුව ඉදිරියේ මෙම සාක්ෂිකරු තහවුරු කර ඇති සියල්ල නම් ඒ අවස්ථාවේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දූෂිත නොවූ බවයි. එබැවින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් ගත් ස්ථාවරයට පරස්පර බවක් මතු කරයි.

28) <u>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරාගේ සාක්ෂි.</u>

මෙම සාක්ෂිකරු අදාළ අවස්ථාවේදී පොලිස් අධිවේගී මාර්ග සංචාරක කොට්ඨාසයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කළේය. 2023-12-31 දින පෙ.ව. 3.15 ට පමණ, දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමේ සිටි උප පොලිස් පරීක්ෂක ජයසේකරගෙන් ඔහුට ඇමතුමක් ලැබී තිබුණි. ගාල්ල මෙහෙයුම් කාමරයෙන් ඔවුන්ට පණිවිඩයක් ලැබුණු බවත් එහිදී වෙඩි තැබීමේ සිදුවීමකින් අනතුරුව පලා යන වෑන් රථයක් නවත්වන ලෙස ඔවුන්ට උපදෙස් ලැබුණු බවත් උප පොලිස් පරීක්ෂක ජයසේකර ඔහුට දන්වා තිබුණි. උප පොලිස් පරීක්ෂක ජයසේකර සඳහන් කරමින් සිටියේ **<u>පැ-21</u>** ලෙස ලකුණු කර ඇති පණිවිඩය පිළිබඳය. මෙම සාක්ෂිකරුට උප පොලිස් පරීක්ෂක ජයසේකරගෙන් මෙම ඇමතුම ලැබෙන විට, සැක කටයුතු වෑන් රථය අධිවේගී මාර්ග පිවිසුමට පැමිණ නොතිබුණි.

වෑන් රථය ඉමදූව අධිවේගී මාර්ගයේ පිවිසුමට පැමිණි පසු උප පොලිස් පරීක්ෂක ජයසේකර මහතා නැවතත් ඔහුව අමතා ඇත. ඒ අවස්ථාවේදී නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා ද ඔහු අමතා මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතා ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරන ලෙස පවසා

තිබුණි. ඉන්පසු මෙම සාක්ෂිකරු මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ මහතා අමතා ඇති අතර, ඔහු මෙම සාක්ෂිකරුට වෑන් රථයේ සිටි පුද්ගලයින් වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතාට භාර දෙන ලෙස දැනුම් දී තිබුණි. ඒ අනුව, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ සිටි නිලධාරීන් වෑන් රථය සහ ඔවුන් භාරයේ සිටින පුද්ගලයින් වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක මහතාට භාර දීමට පියවර ගෙන තිබුණි. ඒ අවස්ථාවේදී, තුවාල ලැබූ පුද්ගලයින් දෙදෙනෙකු ද සුවසැරිය ගිලන් රථයෙන් රෝහලට යවා තිබුණි. මේ සම්බන්ධයෙන් කිසිදු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු තමාට බලපෑම් කිරීමට උත්සාහ නොකළ බව ඔහු පවසා තිබේ.

හරස් ප්‍රශ්න විමසීමේදී උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා මහතා එම කරුණුම පුනර්වාචනය කර ඇත. සිදු වූවා යැයි කියනු ලබන වෙඩි තැබීමේ සිද්ධිය වැලිගම දී සිදු වූ බව තමා දැනගත් බවත්, මෙම වෑන් රථය සම්බන්ධයෙන් පණිවිඩය ලැබුණු බව උප පොලිස් පරීක්ෂක ජයසේකර මහතා අලුයම 3.10 ට පෙර සහ වෑන් රථය අධිවේගී පිවිසුමට පැමිණීමට පෙර තමාට දැනුම් දුන් බවත් ඔහු ප්‍රකාශ කර ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේදී උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් ඔහු වෙත යොමු කරන ලද ප්‍රශ්නවලට තවදුරටත් පිළිතුරු ලබා දෙමින්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා මහතා ප්‍රකාශ කර ඇත්තේ සැක කටයුතු වෑන් රථය සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් රැගෙන යන බවට විශ්වාස කිරීමට සහ අපේක්ෂා කිරීමට හේතු ඇති බැවින්, තමා උප පොලිස් පරීක්ෂක ජයසේකර මහතාට T56 අවියකින් සන්නද්ධව සිටින ලෙස උපදෙස් දුන් බවයි. ගැලනිගම අධිවේගී මාර්ග පිවිසුමේ ප්‍රධාන මෙහෙයුම් කාමරයට මෙම පණිවිඩය ලැබුණු පසු, පණිවුඩය අධිවේගී මාර්ගයේ සියලුම පිටවීම් සහ පිවිසුම් වෙත දැනුම් දෙන බව මෙම සාක්ෂිකරුගේ සාක්ෂියයි. වෑන් රථය තුළ තුවාල ලැබූ පුද්ගලයින් සිටි බවත් ඔවුන් පොලිස් නිලධාරීන් බවත් අනාවරණය වීමෙන් අනතුරුව , උප පොලිස් පරීක්ෂක ජයසේකර මහතා එම නව හෙළිදරව්ව පිළිබඳව ද මෙම සාක්ෂිකරුට දැනුම් දී තිබුණි. මේ සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂිය පහතින් පිටපත් කර ඇත :

ප්‍ර: ඔවුන්ව රඳවා ගෙන ඉද්දී එතැන හිටපු ඔබගේ අධිවේගී මාර්ගයේ හිටිය යම් පොලිස් නිලධාරියෙක් ඔබට කථා කළාද?

උ: කථා කළා.

ප්‍ර: ඒ කවුද?

උ: උ. පො.ප. ජයසේකර.

ප්‍ර: එතකොට ජයසේකර ඔබට කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරින් කෙනෙක් දෙන්නෙක් තුවාල වෙලා ඉන්නවා කියලා, ඒ සිද්ධියේ විස්තර ඔක්කොම කිව්වාද?

උ: එහෙමයි. ස්වාමීනි.

ප්‍ර: ඒ වාගේම එතැන හිටිය එක නිලධාරියෙක් කිව්වාද, ඔවුන් පැමිණ තිබෙන්නේ IG මහත්මයාගේ වැඩකට, ඔවුන්ට ඉක්මනට කොළඹ යන්න ඕනෑ කියලා දැනුවත් කළා කියලා?

**(සාක්ෂිකරු කල්පනා කරයි.)**

උ: ඒ වාගේ මතකයක් තිබෙනවා.

තවදුරටත් පිළිතුරු දෙමින්, මෙම සාක්ෂිකරු පිළිගෙන ඇත්තේ වෑන් රථයේ ජ්වලන යතුර ඉවත් කරගෙන T56 අවියක් එල්ල කර වෑන් රථය පලා යාම නැවැත්වූ අධිවේගී මාර්ග පිවිසුමේ සිටි නිලධාරීන්ට ත්‍යාග පිරිනැමිය යුතු බවත්ය.

උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මෙම සාක්ෂිකරුගේ සාක්ෂිවල විශ්වසනීයත්වය අභියෝගයට ලක් කර නොමැත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට කමිටුවට ද හේතුවක් නොමැත.

29) <u>විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී හෙට්ටිආරච්චිගේ නෙවිල් වර්ජින්ටන් ද සිල්වාගේ සාක්ෂි</u>

වැලිගම වෙඩි තැබීමේ සිද්ධිය සිදු වූ 2023-12-31 දිනය වන විට කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ පුද්ගලයා වන්නේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ය. R-2 ට ඇමුණු ලැයිස්තුවේ සිටින පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා 2023-12-29 දින තමාට උපදෙස් දුන් ආකාරය ඔහු විසින් විස්තර කර ඇත. ඔහුගේ සාක්ෂියට අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට නිදිමත ද්‍රව්‍යයක් සහිත රසකැවිලි කිහිපයක් ලබා දී ''හරක් කටා'' නැමැත්තාට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ භාරයෙන් පැන යාමට සහාය වූ පුද්ගලයින් අත්අඩංගුවට ගන්නා ලෙස ඔහුගෙන් ඉල්ලා සිට ඇත . එම රසකැවිලි අනෙක් අයට බෙදා දුන්නේ පොලිස් නිලධාරියෙකු බව ද මෙම සාක්ෂිකරු කමිටුවට පවසා ඇත. ඔහුගේ සාක්ෂියට අනුව, R-2 ට ඇමුණු ලැයිස්තුවේ සිටින පුද්ගලයින් 149 දෙනා අත්අඩංගුවට ගැනීම සඳහා අඛණ්ඩ මෙහෙයුම් සිදු කරන ලෙස 2023-12-29 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුට වාචික උපදෙස් ලබා දී ඇත. ඒ අවස්ථාවේදී, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ප්‍රසන්න අල්විස් සහ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා සහ තවත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිප දෙනෙකු එහි සිට ඇත. ඔහුගේ සාක්ෂියට අනුව, ඔහු විසින් සිදු කරන මෙම මෙහෙයුම, ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා බුද්ධි තොරතුරු ලබා දීමෙන් සහාය ලබා දෙන ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාට උපදෙස් දී ඇත. ලැයිස්තුවේ නම් කර ඇති පුද්ගලයින්ගෙන් බහුතරයක් වැලිගම සහ එහි තදාසන්න ප්‍රදේශවල පදිංචි පුද්ගලයින් බව මෙම සාක්ෂිකරු නිශ්චිතවම ප්‍රකාශ කර ඇත. මෙය වැදගත් සාධකයක් වන අතර, එම නිසා, ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු විසින් සපයන ලද සාක්ෂි පහත නැවත ඉදිරිපත් කර ඇත:

ප්‍ර: ඔබතුමාට දළ වශයෙන් අවබෝධය තිබෙන විධියට ඔය 149 ක කණ්ඩායම ලංකාවේ කොයි ප්‍රදේශවලද සිටියේ?

උ: ස්වාමීනි, වැඩි වශයෙන් සිටියේ දකුණු පළාතේ. වැලිගම,මාතර,මිරිස්ස වාගේ ප්‍රදේශ වල තමයි වැඩි හරියක්ම සිටියේ. නමුත් සමහර ඒවා කොළඹ තිබෙන address තිබුණා.

ප්‍ර: ඔබතුමා දන්නා විධියට ඔය නඳුන් චින්තක වික්‍රමරත්න කියන සැකකරුගේ මව් ගම කොහේද ?

උ: මාතර, මිදිගම ප්‍රදේශය තමයි ඔහුගේ මව් ගම වශයෙන් ඔහු පාවිච්චි කරන්නේ.

ප්‍ර: දැන් ඔය 149 න් කොච්චර ප්‍රමාණයක් ඒ ප්‍රදේශය ආශ්‍රිතව සිටියාද?

උ: වැඩි ප්‍රමාණයක්ම සිටියේ ඒ ප්‍රදේශවල ස්වාමීනි.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයාගෙන් ලැබුණු උපදෙස් අනුව, පළමු පියවර ලෙස පොලිස් පරීක්ෂක ජයතිලකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායම වැලිගම ප්‍රදේශයට යැවීමට ඔහු විසින් පියවර ගෙන ඇත. ඔහුගේ සාක්ෂියට අනුව, ඒ අවස්ථාවේ දී කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි ස්ථානාධිපති, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා විසින් දෙවන කණ්ඩායමක් සමඟ යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වී ඇත. ඒ අවස්ථාවේ දී, මෙම සාක්ෂිකරු ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාට එම දිනයේම නොයන ලෙසත් 2023-12-30 දින වැලිගමට යන ලෙසත් පවසා ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂි මගින් මෙය සනාථ නොවේ. ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා එවැනි මෙහෙයුම් සඳහා ශාරීරිකව නුසුදුසු පුද්ගලයෙකු බවට ඔහු දරන මතය නිසා, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි මගින්ද මෙය සනාථ නොවේ.

කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි බල සීමාව කොළඹ දිස්ත්‍රික්කයට පමණක් සීමා වී ඇති බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ද පිළිගෙන ඇති නමුත්, කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත සිදු කරනු ලබන වෙනත් ඕනෑම පරීක්ෂණයක් සිදු කරන ලෙස පොලිස්පතිවරයාට උපදෙස් දිය හැකිය. සාමාන්‍ය තත්ත්වයන් යටතේ දී, කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි නිලධාරීන් නිල ඇඳුමින් වැඩ කළ යුතු බව මෙම සාක්ෂිකරු ද ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව, සිවිල් ඇඳුමින් මෙහෙයුම් සිදු කළ හැකි වුවද, ඔවුන් විසින් තම හැඳුනුම්පත් රැගෙන යා යුතු බවත්, එවැනි මෙහෙයුම් අතරතුර එවැනි අවශ්‍යතාවක් ඇති වුවහොත්, ප්‍රාදේශීය පොලිසියට තමන්ව හඳුන්වා දිය යුතුවත් ඇත. විශේෂයෙන්ම සිවිල් ඇඳුමින් සැරසුණු එවැනි පොලිස් නිලධාරීන් තම බල සීමාවෙන් පිටත ප්‍රදේශයකට ආයුධ රැගෙන යන විට, මෙම ක්‍රියාවේ වැදගත්කම මෙම සාක්ෂිකරු අවධාරණය කර ඇත. එවකට කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි වැඩබලන අධ්‍යක්ෂ තනතුර දැරූ, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ අදහස මෙම සාක්ෂි යෙහි අඩංගු වේ. කෙසේ නමුත්, මෙම වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමට, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම වෙත තමන්ව හඳුන්වා දීමට අපොහොසත් වීමෙන් පසුව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ හැසිරීම ඔහුගේ චින්තනයට අනුකූල නොවන බව මෙම අවස්ථාවේදී පැවසීම ප්‍රමාණවත්ය.

ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමට 2023-12-30 දින වැලිගමට යාමට හැකි වන පරිදි 2023-12-29 දින පොලිස් ආකෘති පත්‍රය 439 නිර්දේශ කිරීම තමන්ට මතක බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් P-13 සිට P-16 දක්වා හඳුනා ගනිමින් ප්‍රකාශ කර ඇත.

වැලිගමට ගිය ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ පොලිස් පරීක්ෂක නිශාන්තගෙන් 2023-12-31 දින පෙරවරු 2.45 සිට පෙරවරු 3.00 දක්වා කාලය තුළදී සහකාර

පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට දුරකථන ඇමතුමක් ලැබ ඇත. මෙම සාක්ෂිකරු මෙම දුරකථන සංවාදයේ අන්තර්ගතය පහත සඳහන් ආකාරයෙන් විස්තර කර ඇත:

ප්‍ර: මහත්මයා, 30 වැනිදා මධ්‍යම රාත්‍රිය පහුවෙලා කොයි වෙලාවක හරි මොකක් හෝ සිදුවීමක් සිදු වුණා කියලා ඔබතුමා දැන ගත්තාද? ඒක කාගෙන්ද දැන ගන්නේ ?

උ: උතුමාණෙනි, මම 30 වැනිදා රාත්‍රී නින්දට ගියා. එසේ නින්දට ගියාට පස්සේ මගේ මතකයේ හැටියට පාන්දර 2.45 ත්, 3 ත් අතර කාලයේ මගේ දුරකථනය නාද වුණා. මම බැලුවා. බලනකොට IP නිශාන්ත කථා කරන්නේ. එතකොට IP නිශාන්ත මට එක පාරටම කිව්වා, "සර්, අපට වෙඩි වැදුණා. අපි ඉස්පිරිතාලෙකට යන ගමන් ඉන්නේ" කියලා. උතුමාණෙනි, ඇත්තටම මම හිතුවා, මේ කියන්නේ බොරුවක් කියලා. එකකොට මම කිව්වා, "නිශාන්ත, බොරු කියන්න එපා" කියලා. ඊට පස්සේ කිව්වා, "ඇත්ත සර්, අපි මිරිස්ස පැත්තේ ඉඳලා වැලිගම පැත්තට එද්දී ලොකු බෑග් එකක් කරේ දමාගත් පුද්ගලයෙක් පාර අයින දිගේ අනිත් පැත්තට යනවා දැක්කා, එයාව චෙක් කරන්න හිතාගෙන වාහනය slow කරද්දී එයා පැනලා දිව්වා. දුවනවාත් එක්කම ඒ ගොල්ලන්ට වෙඩි ප්‍රහාර කිහිපයක් ආවා. ඒ නිසා අපේ හිටපු මධුරංගත් ඒ පැත්තට වෙඩි තිබ්බා. ඒ එක්කම අපි එතැනින් බැස්සේ නැහැ, අපේ තුවාලකාරයෝ ඉන්න නිසා ඒ එක්කම අපි ආවා. අපේ තුවාලකාරයෝ ඉන්න නිසා අපි රෝහලක් සොයාගෙන යන ගමන් කියලා මට කිව්වා. මම කිව්වා, ඉක්මනින් hospital එකකට යන්න කියලා. උතුමාණෙනි, නිලධාරීන්ට වෙඩි වැදුණා කිව්වාම, ඇත්තටම ඒ වෙලාවේ මොකක්ද කරන්නේ කියලා හිතාගන්න බැරි වුණා. ඒ තත්ත්වයට මුහුණ දුන්නාම තමයි තේරෙන්නේ. පසුව මම ටික වෙලාවක් වාඩි වෙලා ඉඳලා ඉක්මනින්ම මගේ ආසන්නම රාජ්‍ය නිලධාරියා වෙන්නේ DIG Colombo. මම ඔහුට දුරකථන දුරකථන ඇමතුම් කිහිපයක් ගත්තා. නමුත් answer කළේ නැහැ. ඊට පස්සේ මම වැඩ බලන පොලිස්පතිතුමාටත් කිහිප වතාවක්ම ගත්තා. Answer කළේ නැහැ. ඒ උදේ පාන්දර නිසා වෙන්න ඇති. පසුව මම කල්පනා කරමින් ඉඳලා, මම කොළඹ අපරාධ කොට්ඨාසයේ ඉඳලා කිලෝ මීටර් 22 ක් ඈතින් නවගමුවේ ඉන්නේ. මම කොහොමත් දන්නවා, මට ඒ ප්‍රදේශයට යන්න වෙනවා කියලා. ඒ නිසා මම ෆෝන් එකත් අතේ කියාගෙන bathroom එකටත් ගිහිල්ලා සූදානම් වන ගමන්ම මට එක පාරටම සොයියා මහත්මයාට මතක් වුණා. මේ operation එකේ වැඩි කාර්ය භාරයක් ඔහුත් කළා. ඔහුට මම call එකක් අරගෙන කිව්වා, "සර්, මෙන්න මෙහෙම සිද්ධියක් ඇති වුණා. මෙන්න මෙහෙම කියනවා, පොලිස්පතිතමාට මේ පණිවුඩය දීලා මට උපදෙසක් අරන් දෙන්න මොකක්ද කරන්නේ කියලා." ම ඒ අතරතුර ලැහැස්ති වෙලා කොළඹ අපරාධ කොට්ඨාශයට එන්න පිටත් වුණා. මට 4 විතර වෙනකොට කොළඹ අපරාධ කොටට්ඨාසයට එන්න පුළුවන් වුණා. ඊට පස්සේ නිශාන්ත මහත්මයා මට call එකක් අරගෙන කිව්වා. "නෙවිල්, මම IGPට කිව්වා, ඔයා ටක්ගාලා යන්න" කියලා. ඊට පස්සේ මම CCD එකට ආවා, එනකොට ඒ වෙලාවේ හිටපු SI ලියනගේ හිටියා. මම SI ලියනගේට කථා කරලා කිව්වා, මෙහෙම සිද්ධියක් වෙලා තිබෙනවා, මගෙත් එක්ක යන්න ලැහැස්ති වෙන්න කියලා. එහෙම කියලා අරගොල්ලෝ අවුට් එක ආපු පොතගෙනැල්ලා මට පෙන්වන්න කියලා මේ කිව්වා. ඔහු unit one එකේ නිලධාරියෙක්, ඊට පස්සේ මම ඒ පොත බැලුවා. ඇන්ස්ලම් සිල්වා පැය 20.30ට ඒකේ අවුට් එක ආලා තිබෙනවා, ආවරණ අනුමැතියට යටත්ව යනවා කියලා. ඒ අවශ්‍ය සටහන දාලා තිබෙනවා. ඒ අනුව මම දැනගත්තා, මේක නිවැරදියි. සටහන දාලා තිබෙනවා කියලා. මම ඊට පස්සේ ටක් ගාලා highway එකෙන් මාතරට යන්න පිටත් වුණා.

ප්‍ර: නෙවිල් සිල්වා මහත්මයා, ඔබතුමා නෙවිල් ද සිල්වා නේද?

උ: එහෙමයි.

සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ සාක්ෂි අනුව, ඔහු විසින් පොලිස් පරීක්ෂක නිශාන්තගේ සිදුවීම් විස්තරය විශ්වාස කර තිබේ.

මාතර උගත් මහේස්ත්‍රාත්වරයා විසින් ඔවුන්ව සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගැනීමට 2025-02-27 දින නියෝගය ප්‍රකාශයට පත් කර තිබීම යන කාරණය හේතුකොට ගෙන, 2023-12-30 දින තම උපදෙස් මත වැලිගමට ගිය ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයින් විසින් 2023-12-31 දින උදෑසන තමන්ට දැනුම් දුන් ආකාරයට වඩා වෙනස් ආකාරයකින් වෙඩි තැබීමේ සිද්ධිය සිදුවී ඇති බවට ප්‍රකාශයක් සිදුකර ඇති බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ප්‍රකාශ කර ඇත. මෙම සාක්ෂිකරුට අනුව, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයින් විසින් මෙම වෙනස් විස්තරය අඩංගු ප්‍රකාශය 2025-03-06 දින, උගත් මහේස්ත්‍රාත්වරයාගේ 2025-02-27 දින නියෝගයෙන් පසුව සිදුකර ඇත.

2023-12-31 දින උදෑසන වැලිගම W15 හෝටලය ඉදිරිපිට සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියේදී ඇත්ත වශයෙන්ම සිදුවූයේ කුමක්දැයි තහවුරු කර ගැනීමට තමා උනන්දු වූ බව මෙම සාක්ෂිකරු ප්‍රකාශ කර ඇතත්, 2024-12-03 දින ඔහු විසින් කොළඹ අපරාධ කොට්ඨාශය හැර යන තෙක්ම, කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි වැඩබලන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ සිය ධූර කාලය තුළ, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයින් විසින් ඔහුට විස්තර කරන ලද සිදුවීම්වල සත්‍යතාව තහවුරු කර ගැනීමට ඔහු ගත් එකම ක්‍රියාමාර්ගය වී ඇත්තේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයින්ගෙන්ම එම තොරතුරු ලබා ගැනීම පමණි.

2023-12-31 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම විසින් තමන්ට විස්තර කරන ලද සිදුවීම්වල සත්‍යතාව තමා විසින් වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක, වැලිගම සහකාර පොලිස් අධිකාරී සහ මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී යන අයගෙන් තහවුරු කර ගන්නා ලද බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ප්‍රකාශ කළද, ඔවුන්ගෙන් ඔහුට දැන ගැනීමට ලැබුණේ නාඳුනන තුවක්කුකරුවෙකු විසින් සිදු කරනු ලැබූ වෙඩි තැබීමකින් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන අය තුවාල ලැබූ බව පමණි. ඔහුගේ සාක්ෂියට අනුව, 2023-12-31 දින මුළු දවස පුරාම ඔහු කතා කළ ඕනෑම අයෙකුගෙන් ඔහු විසින් රැස් කරගත් දෙය නම්, W15 හෝටලය ඉදිරිපිට දී නාඳුනන තුවක්කුකරුවෙකු විසින් එල්ල කරන ලද වෙඩි උණ්ඩවලින් උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන අය වෙඩි වැදී තුවාල ලබා ඇති බවයි. කලින් සඳහන් කළ පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයා පවා පළමුව එම දෙයම පැවසීමට උත්සාහ කිරීමෙන් අනතුරුව, 2023-12-31 දින පෙ.ව. 6.00 ට පමණ, පලා යන කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් වෑන් රථයට වෙඩි තැබුවේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර කණ්ඩායම බව තමාට දැන ගැනීමට ලැබුණු බව වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පිළිගත් බව, කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද්දේය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් ප්‍රශ්න කිරීමේදී, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා එම කතාව වෙනස් කර, රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි වැලිගම පොලිස් නිලධාරීන් විසින් කොළඹ අපරාධ

කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි තැබූ බව තමා දැනගත් බව පිළිගත්තේය. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම ප්‍රශ්නයට පිළිතුරු දුන් ආකාරය පහතින් නැවත ඉදිරිපත් කිරීම වැදගත් වේ:

ප්‍ර: ඊට වඩා වෙනස් කරුණක් මහත්මයා 31 වැනි දා දැන ගත්තාද?

උ: ඔව්. ඊට පස්සේ මට දැන ගන්න හම්බ වුණා මොබයිල් එකේ තියපු නිලධාරීන්ගේ වෙඩි පහරවල් අපේ නිලධාරින්ට වැදිලා තිබෙනවා කියන එක.

ප්‍ර: කොයි වෙලාවේද දැන ගත්තේ?

උ: මම දැන ගත්තේ ස්වාමීනි,-

**(සාක්ෂිකරු කල්පනා කරයි.)**

ඔව්, මම හිතන්නෙ, Postmortem එකෙන් පස්සෙ.

මෙම සාක්ෂිකරු විසින් මුලින් ප්‍රකාශ කිරීමට උත්සාහ කරන ලද්දේ, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන් විසින් කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි තැබූ බව, පොලිස් සැරයන් උපුල්ගේ පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන අධිකරණ වෛද්‍ය නිලධාරියා තමාට පැවසූ බව වුවද, තවදුරටත් ප්‍රශ්න කිරීමෙන් පසු ඔහු එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගත්තේය. ඉන්පසු, ඔහු නැවතත් කතාව වෙනස් කර එය ඒ අවස්ථාවේ ඔහු විශ්වාස කළ දෙයක් බව පැවසීය. වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක ඒ අවස්ථාවේ ඔහුට පැවසූ සිදුවීම්වල විස්තරය මෙය නොවන බව ඔහු වැඩිදුරටත් කමිටුවට පවසා ඇත. වෙඩි තැබීමේ සිද්ධිය සිදු වන අවස්ථාවේදී වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය W15 හෝටලයට පැමිණීම පිළිබඳව උප පොලිස් පරීක්ෂක මධුරංග කිසිවක් පවසා නොමැති බව පෙන්වීමට P-9 ඔහුට පෙන්වූ විට, මෙම සාක්ෂිකරු ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් වැළකී සිටියේය.

සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ සාක්ෂියට අනුව, සිද්ධියේ සත්‍යතාව තහවුරු කර ගැනීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ඔහුට උපදෙස් ලබා දී ඇති ඇතත්, ඔහු කිසි විටෙකත් සිද්ධිය වූ ස්ථානයට නොගිය බවත්, වැලිගම පොලිස් ස්ථානයට පමණක් ගිය බවත් පිළිගෙන ඇත. අපරාධය සිදු වූ ස්ථානයට නොගියයේ මන්දැයි විමසූ විට, ඒ අවස්ථාවේ දී වැලිගම පොලිසිය විසින් සිදු කරනු ලබන පරීක්ෂණවලට බලපෑම් කිරීමට උත්සාහ කළ බවට චෝදනා එල්ල විය හැකි බැවින් ඔහු එසේ කිරීමෙන් වැළකී සිටි බව කමිටුවට පවසා ඇත. පරීක්ෂණ සිදු කළේ වැලිගම පොලිස් ස්ථානය වන අතර සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ගොස් ඇත්තේ එම ස්ථානයට වන බැවින් මෙම ප්‍රකාශයට කිසිදු පදනමක් නොමැත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා සිය සාක්ෂියේදී තමන් විසින් සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට වැලිගමට ගොස්, විමසීම් කර, සිද්ධිය සිදු වූ ආකාරය පිළිබඳව නැවත වාර්තා කරන ලෙස උපදෙස් දුන් බව ප්‍රකාශ කළද, තමන්ගේ වෙනස් කළ විස්තරයන් පිළිබඳව ප්‍රශ්න කිරීමේදී මෙම සාක්ෂිකරු ගත් ස්ථාවරය නම්, වැලිගම පොලිසිය දැනටමත් මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ආරම්භ කර ඇති බැවින්, ඔහු අදහස් කළේ තුවාල ලැබූ පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පමණක් කටයුතු කිරීමට මිස සිද්ධියේ සත්‍යතාව

තහවුරු කිරීමට නොවන බව බවයි. එවිට මෙම කමිටුව විසින් සලකා බැලිය යුතු ප්‍රශ්නය වන්නේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා උදේ පාන්දරම සහ කිසිදු ප්‍රමාදයකින් තොරව වැලිගම පොලිස් ස්ථානයට ගියේ මන්ද යන්නයි. තුවාල ලැබූ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් දෙදෙනා කරාපිටිය රෝහලට ගෙන ගිය බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඒ වන විට දැන සිට ඇත. එබැවින්, වැලිගම හි සුභසාධන කටයුතු සඳහා කිසිදු අවශ්‍යතාවක් නොතිබුණි. ඔහුට අනුව, වැලිගම පොලිසිය විසින් සිදු කරනු ලබන විමර්ශනයට බලපෑම් නොකිරීමට ඔහු ප්‍රවේශම් විය. වහාම වැලිගමට යන ලෙස උපදෙස් දුන්නේ වගඋත්තරකාර පොලිස්පතිවරයා වන අතර, එබැවින් ඔහු වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නියෝගය පරිදි ගොස් ඇත. එසේ නම්, වගඋත්තරකාර පොලිස්පතිවරයා, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට වැලිගමට යන ලෙස උපදෙස් දුන්නේ ඇයි? වැලිගමදී, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා කර ඇති එකම දෙය වැලිගම පොලිස් ස්ථානයට ගොස් මේ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනවල නියැලී සිටි ඉහළ නිලධාරීන් සමඟ කතා කිරීම පමණි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට අනුව, විමර්ශනවලට ඇඟිලි ගැසීම් පිළිබඳ ඇති විය හැකි චෝදනාවලට බියෙන් සිදු වීම වළක්වා ගැනීමට ඔහුට අවශ්‍ය වූ දෙයද එයමයි. එම නිසා, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට අනුව, එහි ප්‍රතිඵලය නම්, විමර්ශකයින් අතරට ඔහුගේ ක්ෂණික පැමිණීම වැලිගම පොලිසියේ අඛණ්ඩ පරීක්ෂණවලට බලපෑම් කිරීමට සහ බාධා කිරීමට විය හැකි බව කෙනෙකුට නිවැරදිව හෝ වැරදි ලෙස අනුමාන කළ හැකිය. උදෑසන 6.00 වන විට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වහාම වැලිගමට පැමිණීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වෙනත් පැහැදිලි කිරීමක් නොමැති වීමෙන් මෙම උපකල්පනය වඩාත් තහවුරු වේ. එපමණක් නොව, මෙම සිදුවීම සැබවින්ම සිදුවූයේ කෙසේද යන්න සොයා ගැනීමට සහ ඔහුගේ සොයාගැනීම් නැවත වගඋත්තරකාර පොලිස්පතිවරයාට වාර්තා කිරීමට ඔහු උනන්දු නොවූ බව ඔහුගේ සාක්ෂිවලින් පෙනී යයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට ලබා දී තිබූ නිශ්චිත උපදෙස ද එයයි. (වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂිවලට අනුව).

2024-12-03 වන දින දක්වා තමන් විසින් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වැඩබලන අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ කාලය තුළදී 2023-12-31 දින උදෑසන වැලිගම W15 හෝටලය ඉදිරිපිට වෙඩි තැබීමේ සිද්ධිය සිදු වූ ආකාරය පිළිබඳව, ඔහු සතුව තිබූ දැනුමට, උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන අයට වෙඩි තබා තුවාල කළේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් බවට කිසිදු තොරතුරක් ඇතුළත් නොවූ බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම කමිටුව ඉදිරියේ ස්ථිරව ප්‍රකාශ කර ඇත. එම දිනය මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් වසරකට ආසන්න කාලයක් ගතවන දිනයකි. එනම්, වෙඩි තැබීමේ සිද්ධියෙන් තවත් වසරක් පමණ ගතවන තුරු, උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන අයට වෙඩි තබා තුවාල කළේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා දැන සිට නැත. ඔහුගේ සාක්ෂියට අනුව, එම කාලය තුළදී ද වෙනස් ආකාරයකින් සිතීමට ඔහුට කිසිදු සැකයක් ඇති වී නැති බවත්, ඔහුට ඒ සම්බන්ධයෙන් වෙනස් තොරතුරක් නොලැබුණු බවත් ප්‍රකාශ වේ.

සිද්ධිය දැනගත් පසු කොළඹ නියෝජ්‍ය පොලිස්පතිවරයාට තමන් දුරකථනයෙන් කතා කිරීමට උත්සාහ කළ නමුත් එය අසාර්ථක වූ බව මෙම සාක්ෂිකරු සිය සාක්ෂියේදී සඳහන් කර ඇත.

ඝාතනයට ලක් වූ පොලිස් සැරයන් උපුල් යන අයට ගෙවිය යුතු ත්‍යාගය පිළිබඳ ලබා දුන් නිර්දේශය පිළිබඳව, මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය වන්නේ, 2023-12-31 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා විසින් එදින ඔහුට විස්තර කරන ලද විස්තරය පිළිගත් පදනම මත, රුපියල් මිලියන 1.5 ක් ගෙවීමට

ත්‍යාග වවුචරය ඔහු නිර්දේශ කළ බවයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් 2023-12-30 දින රාත්‍රී 8.30 ට ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා වැලිගම බලා පිටත්ව යන විට ඇතුළත් කළ සටහන් කිරීම පමණක් පරීක්ෂා කර තිබුණි. අවිවාදයෙන්ම, මෙම සාක්ෂිකරු, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා විසින් නැවත පොලිස් ස්ථානයට පැමිණි බව සඳහන් කිරීමට ඔහුගේ ආපසු ඇතුළත් කිරීමේ සටහන කරන තෙක්වත් බලා සිට නැත. පොලිස් නිලධාරියෙකු භාරගත් රාජකාරිවලට සිදු වූ දේ පිළිබඳව ඔහු විසින් පැහැදිලි කරන්නේ ආපසු ඇතුළත් කිරීමේ සටහනේ බව කමිටුව සටහන් කරයි. ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් යුත් කොළඹ අපරාධ කොට්ඨාශයෙහි කණ්ඩායම සැබවින්ම නිල රාජකාරියක නිරත වූ බවට මතයක් ගොඩනගා ගත්තේ කෙසේද යන්න පැහැදිලි කිරීමක් ඉල්ලා සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් ප්‍රශ්න කළද, ඔහු විසින් එම පිළිතුරම ලබා දුන්නේය, එනම් ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා විසින් ඔහුට පැවසූ දේ මත ඔහු විශ්වාසය තැබූ බවයි. පොලිස් සැරයන් උපුල් යන අයට රුපියල් මිලියන 1.5 ක් ගෙවීම සඳහා ත්‍යාග වවුචරය නිර්දේශ කිරීමට තීරණය කිරීමට කිසිදු පදනමක් තිබීම පිළිබඳව කමිටුවේ සෑහීමකට පත්වන පරිදි පැහැදිලි කිරීමට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා අපොහොසත් විය. කොළඹ අපරාධ කොට්ඨාශයට ආපසු පැමිණීමෙන් පසු, රාත්‍රී 8.30 ට ඔහු කළ ආපසු පැමිණීමේ සටහන පිළිබඳව ප්‍රශ්න කළ විට, නිලධාරී පැමිණීමේ පොතෙහි (OVB) තැබූ එම සටහනේ තමා විසින් වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් සැරයන් උපුල් යන අයට වෙඩි තබා තුවාල කිරීමේ සිදුවීමක් පිළිබඳව කිසිවක් සඳහන් නොකළ බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට පිළිගැනීමට සිදුවිය.

සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සිය සාක්ෂියේ නිශ්චිතවම සඳහන් කර ඇත්තේ මෙම සිද්ධියේ සත්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා නොව, තුවාල ලැබූ පුද්ගලයාගේ සහ මියගිය පුද්ගලයාගේ සුභසාධනය පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා තමාට වැලිගමට යන ලෙස උපදෙස් දී ඇති බවයි. මේ අනුව, මෙම සාක්ෂිකරු විසින්ම පිළිගත් පරිදි, 2023-12-31 දින දවස පුරා ඔහුගේ අවධානය යොමු වී ඇත්තේ තුවාල ලැබූ පුද්ගලයා සහ මියගිය පුද්ගලයා සම්බන්ධයෙන් සුභසාධනය සඳහා ය. ඔහුට අනුව, සත්‍යය තහවුරු කර ගැනීමට සහ සත්‍ය ලෙසම වැලිගම වෙඩි තැබීමේ සිදුවීම සිදු වූ ආකාරය පිළිබඳව නැවත ඔහුට වාර්තා කරන ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසි විටෙකත් ඔහුට උපදෙස් දී නැත. ඔහු අපරාධ ස්ථානයට නොපැමිණ ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස මෙම සිද්ධිය සිදු වූ ආකාරය පිළිබඳව ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම විසින් ලබා දුන් විස්තරයට සහායට හෝ විරුද්ධව, සිද්ධිය වූ ස්ථානයේ කිසිදු විශේෂ නිරීක්ෂණයක් පිළිබඳව ඔහු කිසිවක් දැන සිට නැත. ඔහුට අනුව, වැලිගම පොලිස් ස්ථානය විසින් විමර්ශනය සිදු කරමින් පැවතුනි. ඔහුගේ දැනුමේ තිබූ විස්තරය, වැලිගම පොලිස් බලධාරීන්ගේ දැනුමේ විස්තරය නොවේ. එම පැහැදිලි, සැක සහිත තත්ත්වයන් හමුවේ, ඔහු විසින් රුපියල් මිලියන 1.5 ක ගෙවීමක් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායම හි පොලිස් සැරයන් උපුල් යන අයට පමණක් සිදු කිරීමට ඉතා ඉක්මනින් වගඋත්තරකාර පොලිස්පතිවරයාට නිර්දේශ කර ඇත. මෙම සාක්ෂිකරු ඔහුගේ ක්‍රියාව සඳහා කිසිදු පදනමක් පැහැදිලි නොකරන නමුත් මෙම කමිටුව විසින් තමා විශ්වාස කරන ලෙස ඉල්ලා සිටී.

නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා විසින් එවන ලද W15 හෝටලය පිළිබඳ කිසිදු තොරතුරක් ලැබුණු බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ප්‍රතික්ෂේප කර තිබේ. සිය සාක්ෂි දීමේදී, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාට එරෙහිව බරපතල

චෝදනාවක් එල්ල කරන අතර, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මෙම කමිටුව ඉදිරියේ දී තමාට එරෙහිව අසත්‍ය සාක්ෂි ලබා දුන්නේ එම චේතනාව මත බව පෙන්වීමට ඔහු උත්සාහ කළේය.

යම් විමර්ශනයක් සම්බන්ධයෙන් හාඩි මොහොමඩ් ඉස්මයිල් ජමාල්ඩීන් නම් පුද්ගලයෙකුට තමා යටතේ පණිවිඩයක් යවා ඇති බව මෙම සාක්ෂිකරු පිළිගෙන තිබුණි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උපදෙස් මත, තමාට නම මතක නැති මුස්ලිම් පුද්ගලයෙකුට එරෙහිව පැමිණිලි කළ කාන්තාවකට යුක්තිය ඉටු වන බව සහතික කිරීම සඳහා ඔහු අධිකරණයට ගිය බව ද ඔහු පිළිගෙන තිබේ.

යවන ලිපි ලේඛනයේ, වෙනස්කම් පිළිබඳව විමසූ විට, එවැනි ලේඛන වෙනස් කිරීමට තමන් විසින්උපදෙස් ලබා දීම ඔහු ප්‍රතික්ෂේප කර ඇත.

30) <u>සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් හරස් ප්‍රශ්න කිරීම.</u>

උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසූ අතර, මෙම කමිටුවේ සලකා බැලීම සඳහා වැදගත් කරුණු රාශියක් මතු වී තිබේ. හරස් ප්‍රශ්න ඇසීමේ දී සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මහතා නැවත අවධාරණය කර ඇත්තේ, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් ඔවුන්ට වෙඩි තැබීම හේතුවෙන් තම කණ්ඩායමේ සාමාජිකයින්ට වෙඩි වැදුණු බව ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ සාමාජිකයින් කිසි විටෙකත් ඔහුට පවසා නොමැති බවයි. හරස් ප්‍රශ්න ඇසීමේ දී මෙම සාක්ෂිකරු නිශ්චිතවම පිළිගෙන ඇත්තේ, මෙම සිදුවීමෙන් පසු, R-2 සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ සිදු කිරීමට හෝ මෙම සිද්ධිය වටා ඇති කරුණු සම්බන්ධයෙන් වෙනත් ඕනෑම පරීක්ෂණයක් සිදු කිරීමට, 2023-12-29 දින පොලිස් පරීක්ෂක ජයතිලකගේ කණ්ඩායම සහ 2023-12-30 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම වැනි කණ්ඩායම් යැවීමට තමා කිසිදු පියවරක් නොගත් බවයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ සාක්ෂිවලින් ද පැහැදිලිව පෙනී යන්නේ, R-2 සම්බන්ධයෙන් විමර්ශනය දිගටම කරගෙන යාමට හෝ 2023-12-31 දින උදෑසන වැලිගම W15 හෝටලය ඉදිරිපිට සිදුවූයේ කුමක්දැයි හරියටම සොයා ගැනීමට කිසිදු පියවරක් ගන්නා ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුට උපදෙස් දී නොමැති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා ද ගත් ස්ථාවරය මෙයයි. උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා තමා දැනටමත් ආරම්භ කර ඇති විමර්ශනය සම්බන්ධයෙන් ඉතිරි විමර්ශනය ඉදිරියට ගෙන නොයන්නේ මන්දැයි විමසූ විට, මෙම සාක්ෂිකරුට කමිටුවට පිළිගත හැකි හේතු ඉදිරිපත් කිරීමට නොහැකි විය.

පහත සඳහන් සිදුවීම් සිදුවීම ස්වාභාවිකද යන්න පිළිබඳව මෙම සාක්ෂිකරුගෙන් විමසන ලදී, එනම්: වැලිගම රාජකාරියේ යෙදී සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් රැගත් වෑන් රථයට, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් සිදු කළ වෙඩි තැබීමේ සිදුවීම; වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර රථයේ සිටි නිලධාරීන් විසින් සිදු කළ වෙඩි තැබීම් මධ්‍යයේ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් රැගත් වෑන් රථය වේගයෙන් ගොස් පලා යාම; වෙඩි තැබීමේ සිද්ධියෙන් ටික වේලාවකට පසු ඉමදූව අධිවේගී මාර්ග පිවිසුම වැනි දුර බැහැර ස්ථානයකට කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය ගමන් කිරීමේ සිදුවීම; කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම කොළඹ දෙසට අධිවේගී මාර්ගයේ ගමන් කිරීමට උත්සාහ කළ සිදුවීම. කෙසේ වෙතත්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් වැළකී සිටියේය.

ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි පොලිස් නිලධාරීන් විසින්, කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් කිසිදු වරදක් සම්බන්ධයෙන් සැක නොකළේ නම්, වෙඩි වැදී තුවාල ලැබූවන් ඇතුළු කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමේ සාමාජිකයින් රැගත් වෑන් රථය අධිවේගී මාර්ග පිවිසුම හරහා කොළඹ බලා ගමන් කිරීම බලහත්කාරයෙන් වැළැක්වීම ස්වාභාවිකදැයි විමසූ විට, එය ස්වාභාවික සිදුවීමක් ලෙස පිළිගත නොහැකි බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා පිළිගෙන තිබේ.

කොළඹ අපරාධ කොට්ඨාශයෙහි ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමට වෙඩි තැබුවේ වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථයේ සිටි නිලධාරීන් විසින් බව තමා දැන නොසිටි බැවින්, ඔහු විසින් 2023-12-31 දින උදෑසන වගඋත්තරකාර පොලිස්පතිවරයා ඇමතූ විට, එවැනි තොරතුරු වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනුම් දුන්නේ නැති බව මෙම සක්ෂිකරුගේ ස්ථාවරයයි.

මෙය වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ගන්නා ලද ස්ථාවරයට වඩා බෙහෙවින් වෙනස් ය. මෙම සාක්ෂිකරුගෙන් අසන ලද, ඉහත සඳහන් කාරණයට අදාළ තවත් ප්‍රශ්න කිහිපයකට, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා නිහඬව සිටියේය.

සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ගේ සාක්ෂියට අනුව, කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ වෙඩි තැබීමෙන් හානි වූයේ W15 හෝටලයේ උඩුමහලේ කාමරයක් බව ඔහු නොදනී. වැඩිදුර ප්‍රශ්න කිරීම් හමුවේ, W15 හෝටලය ඉදිරිපිට බිම සිට පලා යන සැකකරුවෙකු ඉලක්ක කර ගනිමින් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ නිලධාරීන් ඉහළ මහලේ කාමරයකට වැරදීමකින් වෙඩි තබා ඇති බවට කමිටුවට ඒත්තු ගැන්වීමට මෙම සාක්ෂිකරු අසාර්ථක උත්සාහයක් ගත්තේය. එවැනි තත්ත්වයක් යටතේ, පොලිස් සැරයන් උපුල් යන අයට රුපියල් මිලියන 1.5 ක් ගෙවීමට ඔහු නිර්දේශ කළේ මන්දැයි ඇසූ ප්‍රශ්නයට සාක්ෂිකරු පිළිතුරු දුන්නේ නැත. පසුව, එවැනි වරදකාරී තත්ත්වයක් තිබියදී, කොළඹ අපරාධ කොට්ඨාශයෙහි පොලිස් සැරයන් උපුල් යන අයට රුපියල් මිලියන 1.5ක් ත්‍යාගයක් ලෙස ගෙවීමට නිර්දේශ කිරීම වැරදි බව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා පිළිගෙන තිබේ. මෙය සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සිය සාක්ෂියේ මුල් අවධියේදී ගත් ස්ථාවරයන්ගෙන් ප්‍රබල වෙනස්වීමකි.

ශ්‍රී ලංකා පොලිසිය විසින් ලබා දී ඇති නිල දුරකථන ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමේ නිලධාරීන් භාවිත නොකළේ මන්දැයි උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විමසූ විට, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා නිහඬව සිටියේය. වෙඩි වැදුණු උප පොලිස් පරීක්ෂක මධුරංග සහ මියගිය පොලිස් සැරයන් උපුල් යන සමහර නිලධාරීන් වැලිගමට යන විට ජැකට් පැළඳ සිටියේ මන්දැයි විමසූ විට, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා පිළිගත්තේ එය ස්වාභාවික සිදුවීමක් නොවන බවයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මුලින් ප්‍රකාශ කිරීමට උත්සාහ කළේ, ඔහු විසින් වැලිගම පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේ දී, අත්අඩංගුවට ගෙන වැලිගම පොලිස් ස්ථානයේ තබා තිබූ කොළඹ අපරාධ කොට්ඨාශයෙහි වෑන් රථයේ බඳෙහි අලුතින් අලවා තිබූ ස්ටිකර්වල සලකුණු තමා නිරීක්ෂණය නොකළ බවයි. කෙසේ වෙතත්, මාතර අපරාධ ස්ථාන නිලධාරීන් (SOCO) විසින් මෙම කමිටුවට P-58 (AI සහ P-58(B) ලෙස ඉදිරිපත් කරන ලද වෑන් රථයේ ඡායාරූප පෙන්වා සිටි විට, සාක්ෂිකරු පිළිතුරක් ලබා නොදී නිහඬව සිටියේය. පසුව ඔහු පිළිගත්තේ වෑන් රථයේ එවැනි සලකුණු නිරීක්ෂණය නොකිරීම ඔහුගේ පැත්තෙන් සිදු වූ වරදක් බවයි. මෙම වෙඩි තැබීමේ සිද්ධියේදී උප පොලිස් පරීක්ෂක මධුරංග සහ මියගිය පොලිස් සැරයන් උපුල් යන දෙදෙනාට වෙඩි වැදී තුවාල සිදුවී ඇති බවට ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා සහ පොලිස් කොස්තාපල් රියදුරු දුලිප් ගිහාන් පියතිස්ස යන අය විසින් විස්තර කරන ලද

ආකාරයට, සහ පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර, හමුදා සැරයන් රුවිරංග, උප පොලිස් පරීක්ෂක ජයසේකර සහ ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ පොලිස් සැරයන් විජේවික්‍රම යන අය විසින් තහවුරු කළ ආකාරයට මෙම සාක්ෂිකරුට එකින් එක අයිතම ධනාත්මක සාක්ෂි ලෙස ඉදිරිපත් කළ විට, මෙම සාක්ෂිකරුට එම වරදකාරී තත්ත්වයන් කිසිවක් පැහැදිලි කිරීමට නොහැකි විය.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි පවා සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ගත් ස්ථාවරයට සහාය නොදක්වන බව මෙම කමිටුවේ නිරීක්ෂණයයි. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහ විසින් කරන ලද සටහන P-77 ලෙස සලකුණු කර මෙම විමර්ශන කමිටුව හමුවට ඉදිරිපත් කර ඇත. P-77 හි අන්තර්ගතය සම්බන්ධයෙන් ගත් කල, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ ප්‍රකාශ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී පණ්ඩුල වීරසිංහගේ සටහන් මගින් තහවුරු නොකරන බව කමිටුව නිරීක්ෂණය කරයි. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර සහ හමුදා සැරයන් රුවිරංගගේ සාක්ෂි වලට වගඋත්තරකාර පොලිස්පතිවරයා අභියෝග කර නැත. කෙසේ වෙතත්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් මෙම කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමට උත්සාහ කළ විස්තරවලට ඔවුන්ගේ සාක්ෂි සහාය නොදක්වයි. 2023-12-31 දින ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ නියතුව සිටි උප පොලිස් පරීක්ෂක ජයසේකර සහ පොලිස් සැරයන් විජේවික්‍රමගේ සාක්ෂිවලට වගඋත්තරකාර පොලිස්පතිවරයා අභියෝග කර නැත. කෙසේ වෙතත්, ඔවුන්ගේ සාක්ෂි ද, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් මෙම කමිටුවට ඉදිරිපත් කිරීමට උත්සාහ කළ විස්තරවලට සහාය නොදක්වයි. ඉහත සඳහන් හේතූන් මත, විමර්ශන කමිටුව නිගමනය කරන්නේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම කමිටුව ඉදිරියේ හිතාමතාම අසත්‍ය ප්‍රකාශ කර ඇති බවයි. එබැවින්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ සාක්ෂි සම්පූර්ණයෙන්ම අසත්‍යයක් ලෙස ප්‍රතික්ෂේප කිරීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

31) <u>තානේෂ් බර්නාඩ් ඩයස්ගේ සාක්ෂි</u>

තානේෂ් බර්නාඩ් ඩයස් මහතා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමනාකරු වේ. මෙම සාක්ෂිකරුගේ සාක්ෂි හරහා වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ වගඋත්තරකාර පොලිස්පතිවරයා අතර කිසිදු ගනුදෙනුවක් නොමැති බව තහවුරු කිරීමට උත්සාහ කළේය. කෙසේ වෙතත්, මෙම සාක්ෂිකරු විසින් ඉදිරිපත් කර ඇති R-18 ලෙස සලකුණු කර ඇති ලේඛනය වන 2021-07-08 දිනැති ලිපිය, R-18(A) ලෙස සලකුණු කර ඇති ලේඛනය වන 2021-08-07 දින ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් ගනු ලැබූ තීරණයේ කාර්යය සටහන් සහ R-19 ලෙස සලකුණු කර ඇති 2021-05-11 දිනැති වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ප්‍රතිචාරය පහත සඳහන් කරුණු තහවුරු කරයි: ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය, 2021-08-07 දින, ආරක්ෂක උපදේශකයෙකු ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සේවය එහි දක්වා ඇති නිශ්චිත මුදලක් ගෙවීමේ පදනම මත ලබා ගැනීමට තීරණය කළේය; ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාට මෙම තනතුර අත්සන් කර පිළිගැනීමට හැකි වන පරිදි ගිවිසුමක් යවා ඇත; වගඋත්තරකාර පොලිස්පතිවරයා 2021-05-11 (R-19) දිනැති ලිපිය මගින් ආරක්ෂක උපදේශක තනතුර පිළිගැනීම ප්‍රතික්ෂේප කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම තනතුර භාරගෙන නොමැති බැවින්, මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කිසිදු මුදලක් වගඋත්තරකාර පොලිස්පතිවරයාට ගෙවා නොමැති බව මෙම සාක්ෂිකරු විසින් තහවුරු කර ඇත. කෙසේ වෙතත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අත්සන් කළ යුතු

පිළිගැනීමේ ගිවිසුම, යම් කාලයක්, එනම් R-18 හි දිනය වන 2021-08-07 සිට R-19 හි දිනය වන 2021-11-05 දක්වා කාලය තුළ වගඋත්තරකාර පොලිස්පතිවරයා සමඟ පොරොත්තු වෙමින් පැවති බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කරයි. මේ අනුව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමනාකරු වන තනේෂ් බර්නාඩ් ඩයස් මහතා විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ වගඋත්තරකාර පොලිස්පතිවරයා අතර ඉහත සඳහන් ප්‍රමාණයට යම් ගනුදෙනුවක් සිදුවී ඇති බව මෙම කමිටුව ඉදිරියේ තහවුරු කර ඇති බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කරයි.

32) <u>සුදන්තිත්තලපිටියේ ප්‍රියන්ත ජයතිලක පෙරේරාගේ සාක්ෂි</u>

ප්‍රියන්ත ජයතිලක පෙරේරා මහතා පොලිස් මූලස්ථානයේ ගිණුම් අංශයේ ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන ගිණුම්කරු ලෙස කටයුතු කළේය. පොලිස් ත්‍යාග අරමුදලෙන් පොලිස් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට අදාළ කරුණු කිහිපයක් පිළිබඳව ඔහු විස්තරාත්මකව පැහැදිලි කර ඇත. ඔහුගේ සාක්ෂියට අනුව, පොලිස්පතිවරයා විසින් එවැනි ත්‍යාගයක් ගෙවීම අනුමත කිරීමෙන් පසු ත්‍යාගයක් ගෙවීමට ගත් ඕනෑම තීරණයක නිවැරදිභාවය තවදුරටත් විමර්ශනය කර පරීක්ෂා කිරීම ඔහුගේ බලතල තුළ නොමැත. මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේදී උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා මෙම සාක්ෂිකරු අවමානයට පත් කිරීමට උත්සාහ කර නැත.

පොලිස් සැරයන් උපුල් යන අයට සිදු කළ ත්‍යාගය ගෙවීම සම්බන්ධයෙන්, මෙම කමිටුව ඉදිරියේ විමර්ශනයට ලක්ව ඇති කාරණය වන්නේ වගඋත්තරකාර පොලිස්පතිවරයා එම ත්‍යාගය ගෙවීම අනුමත කළ පදනම නීත්‍යානුකූල ද යන්නයි. එබැවින්, මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ඇති ගැටලුවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සුළු වටිනාකමක් දක්වනු ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන ගිණුම් නිලධාරී ප්‍රියන්ත ජයතිලක පෙරේරා මහතාගේ සාක්ෂි අවසන් වීමත් සමඟ, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් R-1 සිට R-19 දක්වා ලේඛන සලකුණු කරමින් ඔහුගේ නඩුව අවසන් කළේය.

## 5. චෝදනා පත්‍රයේ චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 සහ චෝදනා අංක 13, 14, 15, 16 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් එළඹුණු ලද නිගමන:

මෙම වාර්තාවේ දක්වා ඇති හේතු මත, 2023-12-31 දින අලුයම 2.20 සිට අලුයම 2.30 දක්වා වැලිගම, පැලැන හි W15 හෝටලය ඉදිරිපිට සිදු වූ වෙඩි තැබීමේ සිද්ධියට තුඩු දුන් සිදුවීම් අනුපිළිවෙල, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා විසින් මෙම කමිටුව ඉදිරියේ විස්තර කළ ආකාරයට සිදුවී ඇති බව විමර්ශන කමිටුව තීරණය කර ඇත. මෙම වාර්තාවේ දැනටමත් සඳහන් කර ඇති පරිදි, මෙම සාක්ෂි තවත් බොහෝ සාක්ෂිකරුවන් විසින් සනාථ කර ඇති බව කමිටුව නිගමනය කර ඇත. කමිටුව විසින් එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සාරාංශ කර විශ්ලේෂණය කළ විට, එම අනෙකුත් සාක්ෂිකරුවන් මෙම කමිටුව ඉදිරියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂිය සනාථ කර ඇති ආකාරය දැනටමත් පෙන්වා දී ඇත.

උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් සාක්ෂිකරුවන් 31 දෙනෙකුගේ සාක්ෂි මෙහෙයවීමට විමර්ශනය අතරතුර පියවර ගෙන ඇත. එම සාක්ෂිකරුවන් 31 දෙනාගෙන් සාක්ෂිකරුවන් 10 දෙනෙකු පමණ කැඳවනු ලැබුවේ 2025-02-27 සිට 2025-03-19 දක්වා කාලය තුළ මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගවලට අවනත නොවී වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පලා ගොස් ඇති බව තහවුරු කිරීමට සාක්ෂි ලබා දීම සඳහා ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ද සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ගොනු කළේය. ඔහුගේ සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවේ නම් 15 ක් අඩංගු විය. කෙසේ වෙතත්, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා කමිටුව ඉදිරියේ සාක්ෂිකරුවන් 07 දෙනෙකුගේ පමණක් සාක්ෂි මෙහෙයවීය. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ඉල්ලීම පරිදි කැඳවූ සාක්ෂිකරුවන්ගෙන් හතර දෙනෙකු, එනම් විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති සුමිත් ප්‍රසාද් රණසිංහ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ජ්‍යෙෂ්ඨ මානව සම්පත් කළමනාකරු තනේෂ් බර්නාඩ් ඩයස් සහ ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන ගිණුම් නිලධාරී ප්‍රියන්ත ජයතිලක පෙරේරා යන මහත්වරුන්, වගඋත්තරකාර පොලිස්පතිවරයාට පක්ෂව කිසිදු කරුණක් තහවුරු නොකළ නමුත් වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ගැනීමට උත්සාහ කළ ස්ථාවරයන් නිෂේධනය කරන ඇතැම් කරුණු සහිත ස්ථාවරයන් ස්ථාපිත කළහ. විමර්ශන කමිටුව විසින් මෙම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සාරාංශය සහ විශ්ලේෂණය සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේදී මෙම නිගමන සඳහා හේතු දැනටමත් ලබා දී ඇත.

මෙම වාර්තාවේ දක්වා ඇති හේතූන් මත, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සාක්ෂි ලබා දුන් නියෝජ්‍ය පොලිස්පති ජගත් චන්ද්‍ර කුමාර සහ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් ලබා දුන් සාක්ෂි ප්‍රතික්ෂේප කිරීමට විමර්ශන කමිටුව තීරණය කර ඇත. ඒ හා සමානවම, මෙම වාර්තාවේ දක්වා ඇති හේතූන් මත, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා සහ කමිටුව ඉදිරියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂියට සහාය දුන්/තහවුරු කළ අනෙකුත් සාක්ෂිකරුවන් විසින් ගන්නා ලද ස්ථාවරයන්ට පටහැනිව, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ගන්නා ලද ස්ථාවරයන් ප්‍රතික්ෂේප කිරීමට ද විමර්ශන කමිටුව තීරණය කර ඇත.

මේ අනුව, විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත්තේ, 2023-12-29 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ඔහු විසින් ලියන ලද අකුරු තුනක් පමණක් (එනම්, FNA) සහිත R-2 ලේඛනය භාර දී, ඔහු කියා සිටි එම ලැයිස්තුවේ සිටින පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සඳහා සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට වැලිගමට කණ්ඩායම් යවන ලෙස වාචික උපදෙස් ලබා දුන් බවයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා පසුදා මාතර ප්‍රදේශයට පොලිස් පරීක්ෂක ජයතිලකගේ කණ්ඩායම යවා ඇත. එම කණ්ඩායම විසින් සැකකරුවන් 11 දෙනෙකු අත්අඩංගුවට ගෙන නැවත කොළඹට පැමිණ ඇත. ඉන්පසු සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා 2023-12-30 දින උදෑසන ඔහුගේ කාර්යාලයේදී ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා, පොලිස් පරීක්ෂක දුනුසිංහ, උප පොලිස් පරීක්ෂක මධුරංග සහ පොලිස් පරීක්ෂක නිශාන්ත යන කණ්ඩායමට නීති විරෝධී නියෝගයක් ලබා දුන්නේ රාත්‍රියේ දී වැලිගමට ගොස් පැලැන W15 හෝටලයට වෙඩි තැබීමටය. කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂිවලින් හෙළි වී ඇත්තේ, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අනුමත කරන ලද පොලිස් පෝරම 439 නොමැතිව, මෙම නීති විරෝධී මෙහෙයුම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම ශ්‍රී ලංකා පොලිසියට අයත් වාහන අංක WP PK 7225 දරන KDH වර්ගයේ වෑන් රථයෙන් ගමන් ගත් බවයි.

ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම වැලිගමට ගිය පසු, ගාලු පාරේ රථවාහන තදබදය අඩු වන තෙක් බලා සිට 2023-12-31 දින අලුයම 2.20 ට පමණ W15 හෝටලයට ගොස් එහි ඉදිරිපිට වෑන් රථය නතර කර ඇත. කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ උප පොලිස් පරීක්ෂක මධුරංග විසින් වෑන් රථයේ පිටුපස වම් පැත්තේ දොර විවෘත කර W15 හෝටලයට වෙඩි තබා ඇත. වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර ජීප් රථය එහි පැමිණ ඇත්තේ ඒ අවස්ථාවේදීය. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර වැලිගම පොලිස් ජීප් රථයෙන් බැස (එය කොළඹ අපරාධ කොට්ඨාශයේ රථය ඉදිරිපිට නවතා තැබූ පසුව, පොලිස් ජීප් රථය එම ස්ථානයට පැමිණ ඇති බව වෑන් රථයේ සිටි පුද්ගලයින්ට පෙන්වීමට විය හැකිය) පැමිණි විට, වෑන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම, පොලිස් ජීප් රථය පසුකර ගෙන වේගයෙන් පලා ගොස් ඇත. වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි හමුදා සැරයන් රුවිරංග, කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් රැගෙන පලා යන වෑන් රථයට වෙඩි තබා ඇත්තේ එම ක්‍රියාවලියේදීය. කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් රැගත් වෑන් රථයට, වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි නිලධාරීන්ගෙන් වෙඩි ප්‍රහාරයක් එල්ල වී ඇත. වැලිගම පොලිස් ජීප් රථය කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය පිටුපසින් ලුහුබැඳ ගිය නමුත් එය සාර්ථක නැත. වෙඩි තැබීමෙන් පසුව පවා කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය පලා ගොස් ඇත. කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය තවදුරටත් කැඩුණු වීදුරු සහිතව ඉදිරියට ගොස් ඇත්තේ තුවාල ලැබූවන් සමඟ වීම වඩාත්ම වැදගත් දෙය වේ. 2023-12-31 වන දින අලුයම 3.10 ට දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉමදූව පිවිසුමට ළඟා වන තෙක් කාලය තුල කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය එය සිටි ස්ථානය පිළිබඳව කිසිවෙකු දැන සිටියේ නැති බව විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත.

ඉහත සඳහන් කාලය තුළ දී ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා සහ එම කණ්ඩායමේ තවත් කිහිප දෙනෙකු සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සම්බන්ධ කර ගත් බව විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා පවා ඔහුගේ සාක්ෂියේදී මෙම කරුණ සනාථ කර ඇත. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ සාක්ෂියට අනුව, වැලිගමට යැවූ කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමට වෙඩි ප්‍රහාරයක් එල්ල වූ බව දැනුම් දීම සඳහා අලුයම 2.45 ත් අලුයම 3.00 ත් අතර කාලය තුළ පොලිස් පරීක්ෂක නිශාන්ත ඔහුට කතා කර ඇත.

මේ අනුව, කාලය පිළිබඳව සලකා බලන විට, මෙය කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම රැගත් වෑන් රථය අධිවේගී මාර්ගයට පැමිණීමට තීරණය කිරීමට පෙරය. ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ සාක්ෂියට අනුව, ඒ අවස්ථාවේදී සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සම්බන්ධ කර ගත් විට, ඊළඟට කළ යුතු දේ පිළිබඳව පැහැදිලි උපදෙස් ලබා දී නැත. වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳ පුවත අලුයම 2.45 සිට අලුයම 3.00 දක්වා කාලය තුළ ඔහුට දැනුම් දීමෙන් පසුව සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ගත් පළමු පියවර වූයේ වගඋත්තරකාර පොලිස්පතිවරයා ඇමතීම බව කමිටුව ඉදිරියේ පැහැදිලි විය. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා, වගඋත්තරකාර පොලිස්පතිවරයා සමඟ සම්බන්ධ වීමට සමත් නොවූ නිසා ඔහු නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාගේ සහාය පතා ඇත. ඉන්පසුව, වැලිගමට ගිය කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමට වෙඩි තබා ඇති බවට වගඋත්තරකාර පොලිස්පතිවරයාට පළමුව දැනුම් දුන්නේ නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා විසින් වේ. නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයාව සම්බන්ධ කර ගැනීමට සමත් වූයේ අලුයම 3.30 ට පමණ වේ. මේ අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙඩි තැබීමේ සිද්ධිය දැන ගන්නා විට, කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථය ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමට පැමිණ තිබුණි. මේ අනුව, මෙම කරුණු වලින් කමිටුවට ලබා ගත හැකි සාධාරණ නිගමනය නම්, කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම කරාපිටිය

රෝහලට යාමට අසල ඇති අධිවේගී පිවිසුමට යන මාර්ගය සොයා ගැනීමට තනිවම තීරණය කළේ තුවාල ලැබූවන් වෑන් රථයේ සඟවාගෙන බවයි. සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් පැහැදිලි වැඩිදුර උපදෙස් නොමැති විට මෙම තීරණය ගැනීමට කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායමට සිදු වී ඇත.

ඉහත පසුබිම තුළ, නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා විසින් මෙම සිද්ධිය පිළිබඳ පුවත වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනුම් දී තිබුණි. වගඋත්තරකාර පොලිස්පතිවරයා නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසාට ලබා දුන් ප්‍රතිචාරයෙන් සහ අනෙකුත් කරුණු සමඟින්, මෙම කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත්තේ, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් මෙම කණ්ඩායම එවීම ගැන වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසි විටෙකත් පුදුම නොවූ බවයි. අනෙක් අතට, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා ඒ අවස්ථාවේ හොඳින් දැන සිට ඇත්තේ කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම නීති විරෝධී මෙහෙයුමක යෙදී සිටියදී වෙඩි වැදී ඇති බවයි. නමුත් වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳ පුවත දැනුම් දීම සඳහා සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වගඋත්තරකාර පොලිස්පතිවරයා සම්බන්ධ කර ගැනීමට පෙර දෙවරක් සිතා නැත. ඔහු වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනුම් දීමට අවශ්‍ය වූ මෙම සිදුවීම කුමක්ද? එය සිදුවීම් මාලාවක් විය, එනම්: කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ සාමාජිකයින් W15 හෝටලයේදී වෙඩි තැබීමේ සිද්ධියක්; රාත්‍රී ජංගම මුර සංචාරයේ යෙදී සිටි වැලිගම පොලිස් නිලධාරීන් විසින් කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ සාමාජිකයින්ට වෙඩි තැබීමේ සිද්ධියක්; වැලිගම පොලිස් රාත්‍රී ජංගම මුර සංචාර රථයෙන් පලා යන කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් රැගෙන යන වෑන් රථයේ සිදුවීමක්; කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් රැගත් වෑන් රථයේ වීදුරුවලට හානි සිදුවීම සහ කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් දෙදෙනෙකුට වෙඩි වැදී තුවාල ලැබීමේ සිද්ධියක්; කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරියකු ඉතා අසාධ්‍ය තත්ත්වයේ පසුවන සිද්ධියක්. කෙසේ වෙතත්, කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් ඉහත සඳහන් සියලු නීති විරෝධී ක්‍රියාවන්හි නිරත වී ඇති බව ශ්‍රී ලංකා පොලිස් ප්‍රධානියාට, එනම් වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනුම් දීමට තීරණය කිරීමට පෙර සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා දෙවරක් සිතා නැත. සාක්ෂිවලින් පෙනී යන්නේ එම සියලු නීති විරෝධී ක්‍රියාවන් කෙසේ හෝ කිසිදු පැකිලීමකින් තොරව සහ හැකි ඉක්මනින් පොලිස් ප්‍රධානියාගේ (වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ) අවධානයට යොමු කිරීමට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා නොසැලෙන උත්සාහයක් ගෙන ඇති බවයි. ඇත්ත වශයෙන්ම, මේ දක්වා කිසිදු අවස්ථාවක, මෙම නීති විරෝධී මෙහෙයුම සඳහා ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම වැලිගමට යැවීමේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ ක්‍රියාව සම්බන්ධයෙන් වරදක් හඳුනාගෙන ගැනීමට හෝ විවේචනය කිරීමට හෝ කිසිදු පියවරක් ගැනීමට හෝ වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ක්‍රියා කර නොමැත. ඊට පටහැනිව, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් තවමත් කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා සහ මෙම සිද්ධිය වසන් කිරීමට සහාය වූ සියලු දෙනා ආරක්ෂා කරයි. මෙය වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිර්දෝෂීභාවය පිළිබඳ කිසිදු උපකල්පනයකට අනුකූල නොවන නමුත් කොළඹ අපරාධ කොට්ඨාශයේ කණ්ඩායම විසින් සිදු කරන ලද වෙඩි තැබීමේ සිද්ධියට ඔහුගේ හවුල්කාරිත්වය පිළිබඳව කරන පැහැදිලි ඇඟවීමකි.

මෙම කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත්තේ, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට වහාම වැලිගමට යන ලෙස නියෝග කර ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයා බවයි. මේ අනුව, 2023-12-31 වන දින පෙ.ව. 6.00 පමණ වන විට, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වැලිගම පොලිස් ස්ථානයේ සිට ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උපදෙස් මත එහි ගොස්, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද

සිල්වා විසින් වැලිගම පොලිස් ස්ථානයේ සිදු කළ දේ කමිටුව විසින් මෙම වාර්තාවේ විස්තර කර ඇත. මාතර කොට්ඨාශයේ අපරාධ ස්ථාන නිලධාරීන් (SOCO) විසින් ගන්නා ලද කොළඹ අපරාධ කොට්ඨාශයේ වෑන් රථයේ ඡායාරූපය සම්භාව්‍ය උදාහරණයකි. සත්‍ය ලෙසම සිදු වුයේ කුමක්දැයි සොයා බලා සොයා ගැනීමට සහ නැවත වගඋත්තරකාර පොලිස්පතිවරයාට වාර්තා කිරීමට, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උපදෙස් මත වැලිගමට ගිය සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා විසින් වැලිගම පොලිස් ස්ථානයේ කිසිවක් කර නැත. ඊට හේතුව කුමක්ද? හේතුව නම් ඇත්ත වශයෙන්ම සිදු වූ දේ ඔහු ඒ වන විටත් දැන සිටීමයි .

නමුත් සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා වැලිගමට පැමිණීමෙන් සිදු වූ එක් ප්‍රතිඵලයක් තිබේ. පොලිස් සැරයන් අජිත් සිසිර කුමාර සහ හමුදා සැරයන් රුවිරංග විසින් 2023-12-31 දින පෙ.ව. 6.00 වන විට අපරාධ ස්ථානයේදීම වැලිගම පොලිස් ස්ථානාධිපති අපරාධ අංශයට ප්‍රකාශ ලබා දුන්නද, වැලිගම පොලිස් ස්ථානය කිසිවක් කර නැත. වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් සිදු කර ඇත්තේ ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමට ගොස්, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා ඇතුළු කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් භාරයට ගෙන, ඔවුන් වැලිගම පොලිස් ස්ථානයට ගෙනැවිත් ඔවුන්ව නිදහස් කිරීම පමණි. මේ වන විට, වගඋත්තරකාර පොලිස්පතිවරයා වැලිගම සිටි ඔහුගේ නියෝජිත සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා හරහා සිදුවීම් නිරීක්ෂණය කරමින් සිට ඇත. වැලිගම පොලිස් ස්ථානය, මාතර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ගේ මඟ පෙන්වීම යටතේ පරීක්ෂණයක් පවත්වා ඇති බව අවධාරනය කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් කොතරම් උත්සාහ කළත්, ඔවුන් කර තිබුණේ ඊට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ දෙයකි. ඒ වන විට වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නියෝජිත සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා, වැලිගම පොලිස් මූලස්ථාන පරීක්ෂක සමඟ ඉතා සමීපව කටයුතු කර ඇත. මෙය වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් විමර්ශනවලට මැදිහත් වී ඇති බවට පැහැදිලි ඇඟවීමක් නොවේද? එසේ නම්, කොළඹ අපරාධ කොට්ඨාශයේ සාමාජිකයින් විසින් සිදු කරන ලද වෙඩි තැබීමේ සිද්ධියට වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ කිසිදු සම්බන්ධයක් එයින් පෙන්නුම් නොවේද? මෙම කරුණු වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිර්දෝෂීභාවය පිළිබඳ කිසිදු උපකල්පනයකට අනුකූල නොවේ.

මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් දින 02ක් ඇතුළත මෙම වෙඩි තැබීමේ සිද්ධියෙන් මියගිය පොලිස් සැරයන් උපුල් යන අයට උසස්වීමක් ලබා දීමට සහ ත්‍යාගයක් ප්‍රදානය කිරීමට මූලික වී ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයාය. එම උසස්වීමක් ලබා දීම සහතික කිරීමට සහ පොලිස් සැරයන් උපුල් යන අයට ත්‍යාගයක් අනුමත කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා දැඩි හදිස්සියක සිට ඇත. ඕනෑම මිණුම් දණ්ඩකට අනුව මෙම ක්‍රියාවලිය නීති විරෝධී බව දැන් සොයාගෙන ඇත. එම සාධක සැලකිල්ලට ගනිමින්, විමර්ශන කමිටුවට ලබා ගත හැකි සාධාරණ සැකයෙන් ඔබ්බට ඇති එකම නොබිඳිය හැකි නිගමනය නම්, නීති විරෝධී මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම වැලිගමට යැවීමේ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගේ ක්‍රියාව, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ඉල්ලීම පරිදි සිදු කර තිබීමයි. ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ඔප්පු කරන ලද කරුණු මත, මෙම කමිටුවට ලබා ගත හැකි එකම නොබිඳිය හැකි නිගමනය එය වන අතර එය වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිර්දෝෂීභාවය පිළිබඳ වෙනත් ඕනෑම කල්පිතයක් බැහැර කිරීමට යොමු කෙරේ. වෙනත් වචන වලින් කිවහොත්, මෙම විමර්ශන කමිටුව විසින් ලබාගෙන ඇති නිගමන, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිර්දෝෂීභාවය පිළිබඳ කිසිදු කල්පිතයකට අනුකූල නොවේ.

මෙම වාර්තාවේ දක්වා ඇති හේතු නිසා, විමර්ශන කමිටුව නිගමනය කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා, පොලිස් සැරයන් උපුල් යන අයට රුපියල් මිලියන 1.5 ක ත්‍යාගයක් නීති විරෝධී ලෙස අනුමත කර ඇති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ඉල්ලීම පරිදි පොලිස් සැරයන් උපුල් යන අයට උසස්වීමක් ද ලබා දී ඇත. ඇත්ත වශයෙන්ම, පොලිස් සැරයන් උපුල් යන අය ජීවතුන් අතර සිටියේ නම්, ඔහු දැන් මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන නඩුවේ සැකකරුවෙකු ලෙස පෙනී සිටිය යුතුව තිබුණි. මෙය විශේෂයෙන් එසේ වන්නේ, ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ නායකත්වයෙන් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමේ සියලුම සාමාජිකයින්, ව්‍යතිරේකයකින් තොරව, දැන් එම නඩුවේ සැකකරුවන් ලෙස පෙනී සිටින බැවිනි. මේ අනුව, ඉහත සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පොලිස් සැරයන් උපුල් යන අයට ලබා දුන් ත්‍යාගය නීති විරෝධී ලෙස ප්‍රදානය කිරීමෙන් මෙම කමිටුවට ලබා ගත හැකි නිගමන ද වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිර්දෝෂීභාවයට අනුකූල නොවේ. මෙය විශේෂයෙන් එසේ වන්නේ ජාතික පුවත්පතක පළ වූ ලිපියක් උපුටා දක්වමින් ජාතික පොලිස් කොමිසම මෙම සිදුවීම පිළිබඳව ඔහුගෙන් විමසූ විට පවා, වගඋත්තරකාර පොලිස්පතිවරයා හිතාමතාම කිසිවෙකුට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොමැති බැවිනි. ජාතික පොලිස් කොමිසමට වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පිළිතුර වූයේ කොළඹ අපරාධ කොට්ඨාශ නිලධාරීන් කිසිදු වරදක් කර නොමැති බවයි. මෙය සිද්ධියෙන් මාස දෙකකට පමණ පසු සිදු විය.

ශ්‍රී ලංකා පොලිසියේ කිසිදු ස්වාධීන ඒකකයක් මගින් මෙය විමර්ශනය කිරීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිදු පියවරක් ගෙන නොමැති බව විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා ඒ සම්බන්ධයෙන් ලබා දී ඇති පැහැදිලි කිරීම්, මෙම කමිටුව විශ්වාස කරන පරිදි , සියලු සාධාරණ මනසක් ඇති පුරවැසියන් විසින් ප්‍රතික්ෂේප කළ යුතු හේතු වේ. එම හේතු නිදහසට කරුණු ලෙස පිළිගැනීමට නොහැකි වීම පිළිබඳව විමර්ශන කමිටුව කනගාටු වේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයාට යොමු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන්, මෙම කාරණයේ තත්ත්වයන් යටතේ, W15 හෝටලය ඉදිරිපිට සැබවින්ම සිදුවූයේ කුමක්දැයි නිශ්චිතවම නිගමනය කළ නොහැකි බව ඔහු විසින් පිළිගෙන ඇති බව ද මෙම කමිටු වාර්තාවේ සඳහන් කර ඇත. කෙසේ වෙතත්, පොලිස් සැරයන් උපුල් යන අය නාඳුනන තුවක්කුකරුවෙකු විසින් ඝාතනය කරන ලද බවට ව්‍යාජ පදනමක් මත පොලිස් සැරයන් උපුල් යන අයට රුපියල් මිලියන 1.5 ක ත්‍යාගයක් අනුමත කිරීමට ඔහු වහාම කටයුතු කර ඇත. මෙය මෙම කමිටුව ඉදිරියේ වගඋත්තරකාර පොලිස්පතිවරයාට බිඳ හෙළිය නොහැකි නොහැකි ස්ථාවරයක් බව විමර්ශන කමිටුව නිරීක්ෂණය කරයි.

දකුණු අධිවේගී මාර්ගයේ ඉමදුව පිවිසුමේ රාජකාරියේ යෙදී සිටි නිලධාරීන් විසින් ලබා දුන් සාක්ෂි වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් අභියෝගයට ලක් කර නොමැත. ඔවුන්ගේ සාක්ෂිවලට අනුව, පොලිස් පරීක්ෂක නිශාන්ත ලෙස හඳුන්වා දුන් නිලධාරියා ඔවුන්ට පවසා ඇත්තේ එකල පොලිස්පතිවරයාගේ ආශිර්වාදය ඇතිව ඔවුන් මෙහෙයුමක් සඳහා එම ප්‍රදේශයට පැමිණි බවයි. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 9 (ඇ) වගන්තිය, සාක්ෂි ආඥා පනතේ විධිවිධාන නොතකා සාක්ෂි පිළිගැනීමට මෙම විමර්ශන කමිටුවට අවසර ලබා දෙයි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සාක්ෂි දීමට කැඳවනු ලැබූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා පවා මෙම ස්ථාවරය තහවුරු කළේය. එනම් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා ඔහුගේ සාක්ෂියේදී ඉමදුව අධිවේගී මාර්ග පිවිසුම් නිලධාරීන් ඒ බව තමාට පැවසූ බව තහවුරු කළේය. ඔහු

වෙනුවෙන් සාක්ෂි දීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා කැඳවනු ලැබූ වේ වගඋත්තරකාර පොලිස්පතිවරයාය.

සාක්ෂිවලින් පෙනී යන්නේ ඉමදූව අධිවේගී මාර්ග පිවිසුම් නිලධාරීන්ට ඒ බව පවසා ඇත්තේ පොලිස් පරීක්ෂක නිශාන්ත ලෙස හඳුන්වා දී ඇති පුද්ගලයා බවයි. පොලිස් පරීක්ෂක නිශාන්ත රටින් පිටව ගොස් ඇති බැවින් මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි දීමට කැඳවිය නොහැකිය. එබැවින්, එම ප්‍රකාශයේ සත්‍යතාව මත පමණක් ක්‍රියා කිරීමට විමර්ශන කමිටුව අපේක්ෂා නොකරයි. කෙසේ වෙතත්, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේදී, කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි වෑන් රථය නතර කළ විට, එම කණ්ඩායමේ සාමාජිකයෙකු විසින් එවැනි ප්‍රකාශයක් කරන ලද බව යන කරුණ තවමත් එලෙසම පවතී. පෙර සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂිකරු වන ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී මයුර පෙරේරා විසින් ද මෙය සනාථ කරයි. මේ අනුව, ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේ රාජකාරියේ යෙදී සිටින පොලිස් නිලධාරීන්ට එවැනි ප්‍රකාශයක් කර ඇති බව විමර්ශන කමිටුව ඉදිරියේ තහවුරු වී ඇත. කෙසේ වෙතත්, කමිටුව එම ප්‍රකාශයේ සත්‍යතාව මත විශ්වාසය නොතබනු ඇත.

ඉහත සඳහන් හේතූන් මත, විමර්ශන කමිටුව නිගමනය කරන්නේ, 2023.12.31 වන දින අලුයම 2.30 සිට අලුයම 2.30 දක්වා කාලය තුළ සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා හරහා ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම විසින් සිදු කරන ලද සැක සහිත, නීති විරෝධී වෙඩි තැබීමේ ක්‍රියාවට මූලිකත්වය ගෙන ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයා බවයි. එබැවින්, චෝදනා පත්‍රයේ සඳහන් චෝදනා අංක 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10 සහ චෝදනා අංක 13, 14, 15, 16 සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වරදකරු බව විමර්ශන කමිටුව විසින් නිශ්ශය කර ගනී.

**6. චෝදනා පත්‍රයේ චෝදනා අංක 11 සහ අංක 12 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් එළඹුණ ලද නිගමන:**

මෙම වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳව වගඋත්තරකාර පොලිස්පතිවරයාට මුලින්ම දැනුම් දී ඇත්තේ 2023-12-31 දින අලුයම 3.30 ට පමණය. තුවාල ලැබූ පුද්ගලයින් සමඟ ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම රැගත් කොළඹ අපරාධ කොට්ඨාශයෙ හි වෑන් රථය අලුයම 3.10 ට පමණ ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමට ළඟා වී ඇත. මේ අනුව, තුවාල ලැබූ පුද්ගලයින් රැගෙන කොළඹට යාමට වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායමට උපදෙස් දී ඇති බවට තහවුරු කිරීමට කිසිදු ධනාත්මක සාක්ෂියක් මෙම කමිටුව ඉදිරියේ අනාවරණය වී නොමැත. තවද, ඉහත සඳහන් කළ පරිදි, ඔප්පු කරන ලද කරුණු වලින් කමිටුවට ලබා ගත හැකි සාධාරණ නිගමනය නම්, තුවාල ලැබූවන් වෑන් රථයේ සඟවා කරාපිටිය රෝහලට යාමට කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායම අසල අධිවේගී මාර්ග පිවිසුමට යාමට තනිවම තීරණය කර ඇති බවයි. ඒ වන විට සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාට වගඋත්තරකරු පොලිස්පතිවරයා සම්බන්ධ කර ගැනීමට නොහැකි වීම මත, සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වාගෙන් පැහැදිලි වැඩිදුර උපදෙස් නොමැති වීම හේතුවෙන් කොළඹ අපරාධ කොට්ඨාශ කණ්ඩායමට මෙම තීරණය ගැනීමට බල කෙරුණු බව මෙම විමර්ශන කමිටුවේ අදහස වේ.

ඉහත පසුබිම් කරුණු සහ මෙම කමිටුව විසින් එළැඹුණු නිගමන සැලකිල්ලට ගනිමින්, චෝදනා පත්‍රයේ චෝදනා අංක 11 සහ චෝදනා අංක 12 සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වරදකරු නොවන බව විමර්ශන කමිටුව තවදුරටත් නිශ්චය කරයි.

**7. චෝදනා පත්‍රයේ අංක 17, 18 සහ 19 චෝදනාවලට අදාළ සාක්ෂි සාරාංශය සහ ඇගයීම;**

වගඋත්තරකාර පොලිස්පතිවරයාට භාර දී ඇති චෝදනා පත්‍රයේ චෝදනා අංක 17, 18 සහ 19, 2025-02-27 දින අංක BR/6314/2023 නඩුවේදී ගරු මාතර මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළුව ඊට අනුබද්ධ අනෙකුත් නියෝගවලට පටහැනි වෙමින්, රටේ පොලිස්පතිවරයා වන වගඋත්තරකරු සැඟවී සිටි බවට එල්ල වන චෝදනාව මත පදනම් වූ චෝදනා වේ. මෙය, 2025-02-27 දින අංක BR/6314/2023 නඩුවට අදාළව ගරු මාතර මහේස්ත්‍රාත්වරයා විසින් නියෝගය ලබා දුන් දින සිට 2025-03-19 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා, මාතර මහේස්ත්‍රාත් අධිකරණයට භාර වූ දිනය දක්වා අතරතුර කාලය තුළ වේ. විමර්ශන කමිටුව දැන් මෙම චෝදනා සම්බන්ධයෙන් කටයුතු කිරීමට යෝජනා කරනු ඇත. එසේ කිරීමෙන්, ඒ සම්බන්ධයෙන් විමර්ශන කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි මුලින්ම සාරාංශ කර ඇගයීමට ලක් කරනු ඇත.

1) <u>පොලිස් කොස්තාපල් රියදුරු 80188 හේවා කොලොම්බගේ ප්‍රසාද්ගේ සාක්ෂි</u>

මෙම සාක්ෂිකරු, වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-02-28 දින ඔහුගේ හෝකන්දර නිවසින් පිටව යන තෙක් ආසන්න වශයෙන් වසර පහක කාලයක් වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සේවය කළ පොලිස් කොස්තාපල් රියදුරු වේ. 2025-02-28 වන දින උදෑසන, සුපුරුදු පරිදි පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් එම අවස්ථාවේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා භාවිත කළ ටොයොටා ප්‍රාඩෝ ජීප් රථය සෝදා ඇති අතර, පෙ.ව. 10.30 ට පමණ වගඋත්තරකාර පොලිස්පතිවරයා පැමිණ ජීප් රථයේ පිටුපස අසුනට ගොඩ වී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා ගමන් කරන විට සාමාන්‍යයෙන් ඔහු සමඟ ගමන් ගන්නා පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ජීප් රථයේ ඉදිරිපස අසුනට ගොඩ වී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්ට ජීප් රථය කොස්වත්ත හන්දියේ ලාෆ්ස් සුපිරි වෙළඳසැලට පදවා එය ඉදිරිපිට නවතා තබන ලෙස උපදෙස් දී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා ජීප් රථයෙන් බැස එහි පිටුපසට ගොස් ඇත්තේ එහිදීය. ඒ අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වාහනයෙන් බැස යන විට, පුද්ගලික ආරක්ෂක නිලධාරී මහේෂ් උදාර ද ජීප් රථයේ ඉදිරිපස අසුනෙන් බැස ගොස් තිබුණි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා ටොයොටා ප්‍රාඩෝ ජීප් රථයෙන් බැසගත් පසු, ඔහු පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්ට පවසා ඇත්තේ වාහනය ඉදිරියට පදවා ගෙන යන ලෙසත්, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් පවසන පරිදි, කිලෝමීටර හතරක් පමණ දුරින් පිහිටා ඇති *උතුවන්කන්ද* අසල වාහනය තබා ගන්නා ලෙසත්ය. පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් පැය එකහමාරක් පමණ කාලයක් *උතුවන්කන්ද* අසල වාහනය තබාගෙන එහි රැඳී සිට ඇත.

රථය ආපසු වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවසට ගෙන ගොස් එහි ගාල් කළේය. වාහනය ගාල් කළ පසු, එය නිවසට පැමිණීමෙන් අනතුරුව ඔහු සාමාන්‍යයෙන් සිදු කරන පරිදි පසුපස අසුන පරීක්ෂා කළ විට, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් විසින් ජීප් රථයේ පිටුපස අසුනේ ආම් රෙස්ට් එක යට තිබූ වගඋත්තරකාර පොලිස්පතිවරයා භාවිතා කළ පිස්තෝලය සොයා ගන්නා ලදී. පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් පිස්තෝලය රැගෙන වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවසේ සිටි ක්‍රිෂාන් ශාන්ත නැමැති වෙනත් ආරක්ෂක නිලධාරියෙකුට භාර දී ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා ප්‍රාඩෝ ජීප් රථයෙන් බසින විට, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මිතුරා වන සුරංගගේ ජීප් රථය වැනි තවත් ජීප් රථයක් පිටුපසින් පැමිණ පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්ගේ ජීප් රථය පිටුපසින් ගාල් කරනු පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් දැක ඇත.

ඔහු හෝකන්දර නිවසට පැමිණි පසු (2025-02-28 වැනි දින වගඋත්තරකාර පොලිස්පතිවරයා බැස්සවූ පසු) ජීප් රථයේ පිටුපස අසුනේ තිබී ගත් පිස්තෝලය, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවෙස් පරිශ්‍රයේ තිබූ රෙදි සෝදන යන්ත්‍රයක් තුළ ඇඳුම්වල ඔතා තිබියදී සොයාගත් බව පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් පසුව දැනගත්තේය. පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් 2025-02-28 දින සවස පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ද හමුවී ඇත. පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් 2025-02-28 දින සිට තවත් දින දොළහක් පමණ අමාත්‍ය ආරක්ෂක අංශයට වාර්තා කරන ලෙස බලධාරීන් උපදෙස් දෙන තෙක් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවසේ රැඳී සිටියේය. එම ඒකකය පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් ඒ වන විට අනුයුක්තව සිටි ඒකකයයි.

පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් මෙම විමර්ශන කමිටුව ඉදිරියේ වැඩිදුර සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර තිබුණේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා පළමු වරට තම නිල පිස්තෝලය මේ අයුරින් වාහනය තුළ දමා ගොස් තිබූ බවයි.

හරස් ප්‍රශ්නවල අසන අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා සුපුරුදු ගමන් මාර්ගයට වඩා වෙනස් ගමන් මාර්ගයක ගමන් කිරීමට තමාට උපදෙස් ලබා නොදුන් බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා පලා යන බවක් තමාට නොහැඟුනු බව ද පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කර නොමැත. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්න පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ ඔහු මෙම සාක්ෂිකරු අපකීර්තියට පත් කිරීමට උත්සාහ කර නොමැති බවයි. මෙම සාක්ෂිකරු විමර්ශන කමිටුව ඉදිරියේ බොරු සාක්ෂි ලබා දෙන බවට ඔහු කිසිසේත් යෝජනා කර නොමැත. ඇත්ත වශයෙන්ම, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් යනු වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් වසර පහක් සේවය කළ නිලධාරියෙකි. වගඋත්තරකාර පොලිස්පතිවරයා 2023-11-29 දින වැඩබලන පොලිස්පති ලෙස පත් කරන ලද අතර 2024-02-26 දින පොලිස්පතිවරයා ලෙස පත් කරන ලදී. එබැවින්, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වැඩබලන පොලිස්පතිවරයා ලෙස පත් කිරීමට පෙර සිටම ඔහු වෙනුවෙන් සේවය කළ පුද්ගලයෙකු බව පැහැදිලිය. ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, විමර්ශන කමිටුව එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

2) <u>පො.කො. 91484 කන්දප්පා හෙට්ටිගේ මහේෂ් උදාරගේ සාක්ෂි.</u>

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පුද්ගලික ආරක්ෂක නිලධාරියෙකු ලෙස පොලිස් කොස්තාපල් මහේෂ් උදාර කටයුතු කළ අතර, එබැවින් 2025-02-28 වන දින උදෑසන වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ හෝකන්දර නිවසින් පිටව යන විට ටොයොටා ප්‍රාඩෝ ජීප් රථයේ ඉදිරිපස අසුනේ ගමන් කර ඇත. එය පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් විසින් පදවන ලද වාහනයයි. ඒ අවස්ථාවේ වාහනයේ මගීන් තිදෙනෙකු පමණක් ගමන් කර ඇති අතර, එනම් රියදුරු ලෙස පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්, පුද්ගලික ආරක්ෂක නිලධාරියා ලෙස පොලිස් කොස්තාපල් මහේෂ් උදාර සහ වම් පසුපස අසුනේ වගඋත්තරකාර පොලිස්පති යන අයවලුන්ය. කොස්වත්ත හන්දියේ පිහිටි ලාෆ්ස් පිරවුම්හල සුපිරි වෙළඳසැල ඉදිරිපිට ජීප් රථය නතර කර ඇති බවත්, එම අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා ජීප් රථයෙන් බැස ඇති බවද පොලිස් කොස්තාපල් මහේෂ් උදාර තහවුරු කරයි.

හෝකන්දර නිවසින් පිටව යන අවස්ථාවේදී සහ වගඋත්තරකාර පොලිස්පතිවරයා උදෑසන ජීප් රථයෙන් තමා සමඟ පැමිණෙන ලෙස පොලිස් කොස්තාපල් මහේෂ් උදාරගෙන් ඉල්ලා සිටි විට, ඔහු නිසි ලෙස ඇඳ පැළඳ නොසිටි බව පොලිස් කොස්තාපල් මහේෂ් උදාර, වගඋත්තරකාර පොලිස්පතිවරයාට පවසා තිබුණි. මන්ද යත් ඔහු ඇඳ සිටියේ ට්‍රැක් බොටම් එකක් සහ ටී-ෂර්ට් එකක් පමණි. ඉන්පසු වගඋත්තරකාර පොලිස්පතිවරයා මහේෂ් උදාරට එලෙස පැමිණෙන ලෙස පවසා ඇති අතර, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර, ඔහු නිවසේ සිටියදී ඇඳ සිටි ඇඳුම වූ ට්‍රැක් බොටම් එකක් සහ ටී-ෂර්ට් එකක් ඇඳගෙන වගඋත්තරකාර පොලිස්පතිවරයා සමඟ ගියේ ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා කොස්වත්ත හන්දියේදී ජීප් රථයෙන් බසින විට, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ද සුපුරුදු පරිදි හැකි ඉක්මනින් වාහනයෙන් බැස්සේය. ඔහුගේ මතකයේ හැටියට, වගඋත්තරකාර පොලිස්පතිවරයා ටී-ෂර්ට් එකක් සහ කලිසමක් හෝ ට්‍රැක් බොටම් එකක් ඇඳ සිටියේය. වගඋත්තරකාර පොලිස්පතිවරයා බෑගයක් රැගෙන සුරංගගේ වාහනයට නැග පිටුපස අසුනේ වාඩි විය. එබැවින්, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ද එම ජීප් රථයටම නැඟී සුපුරුදු පරිදි ඉදිරිපස අසුනේ වාඩි වී වගඋත්තරකාර පොලිස්පතිවරයා සමඟ ගියේය. සුරංගගේ වාහනය එතැනින් යූ-ට(ර්)න් එකක් ගෙන ඇති අතර, ඒ අවස්ථාවේදීම වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින්, පොලිස් කොස්තාපල් මහේෂ් උදාරගෙන් විමසා ඇත්තේ ඔහුත් එම ජීප් රථයට නැග්ගේ ඇයි දැයි යන්නයි. ඔහුගේ අවසරයකින් තොරව පොලිස් කොස්තාපල් මහේෂ් උදාර වාහනයට නැගීම වරදක් ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා දැක ඇති බව පෙනී යයි. වාහනයට නැගීමට ඔහුට විශේෂයෙන් උපදෙස් දී නොතිබුණ ද, ඔහු සාමාන්‍යයෙන් සිදු කරන ආකාරයට පමණක් කටයුතු කළ බව පොලිස් කොස්තාපල් මහේෂ් උදාරගේ අදහසයි. මෙයට හේතුව වන්නේ ඔහු වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ පුද්ගලික ආරක්ෂක නිලධාරියා වීමයි. ඉන් සුළු වේලාවකට පසු, සුරංගගේ ජීප් රථය පාර අයිනේ නතර කළ අතර, පොලිස් කොස්තාපල් මහේෂ් උදාරට වාහනයෙන් බැස ආපසු නිවසට යන ලෙස වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් උපදෙස් දී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා රැගත් සුරංගගේ ජීප් රථය ඉදිරියට ගමන් කර ඇත. ඉන්පසු, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ගමන් කරමින් සිටි ත්‍රිරෝද රථයක නැගී හෝකන්දර පිහිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ නිවසට පැමිණ ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට අධිකරණ නියෝගයක් ලබා දී ඇති බව 2025-02-28 දින සවස ඔහුට දැන ගන්නට ලැබී ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් ඇසූ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පොලිස් කොස්තාපල් මහේෂ් උදාර මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා සුපුරුදු ගමන් මාර්ගයට වඩා වෙනස් ගමන් මාර්ගයක ගමන් කිරීමට උපදෙස් නොදුන් බවත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා පලා යන බවක් තමාට නොහැඟුනු බවත්ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කර නොමැත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්න පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ ඔහු මෙම සාක්ෂිකරු අපකීර්තියට පත් කිරීමට උත්සාහ කර නොමැති බවයි. මෙම සාක්ෂිකරු විමර්ශන කමිටුව ඉදිරියේ අසත්‍ය සාක්ෂි ලබා දුන් බවට ඔහු කිසි විටෙකත් යෝජනා කර නැත. ඇත්ත වශයෙන්ම, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර යනු වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුයුක්තව සිටින පුද්ගලික ආරක්ෂක නිලධාරීන්ගෙන් කෙනෙකි. ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, විමර්ශන කමිටුව පොලිස් කොස්තාපල් මහේෂ් උදාරගේ සාක්ෂි සත්‍ය සාක්ෂි ලෙස පිළිගෙන එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

3) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බාලසූරිය මොහොට්ටි අප්පුහාමිලාගේ සම්පත් කුමාර සේනාරත්නගේ සාක්ෂි.

ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න යනු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ස්ථානාධිපතිවරයා වේ. ඔහුගේ සාක්ෂිය වන්නේ 2025-02-28 දින වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවස සෝදිසි කිරීම සඳහා වැඩබලන පොලිස්පතිවරයා විසින් ඔහුට උපදෙස් දෙන ලද බවයි. මෙය 2025-02-27 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද නියෝගය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සිදු කරන ලදී. එම නියෝගය **P-1** ලෙස සලකුණු කර මෙම කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ඇත. ඒ අනුව, 2025-02-28 දින ප.ව. 10.00 ට පමණ, පොලිස් නිලධාරීන් කණ්ඩායමක් සමඟ ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හෝකන්දර නිවස සෝදිසි කිරීමක් සිදු කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ආරක්ෂක නිලධාරීන් විසින් ඔහුගේ හෝකන්දර නිවසේ නවාතැන් ලෙස භාවිතා කර ඇති බව පෙනෙන කොටසක තබා ඇති රෙදි සෝදන යන්ත්‍රයක් තුළ ඇඳුම්වල ඔතා තිබූ වගඋත්තරකාර පොලිස්පතිවරයාට නිකුත් කරන ලද නිල පිස්තෝලය (අංක E 8751 දරන CZ 85 BCAL9LUGER වර්ගයේ) ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න මහතාට හමු වූයේ එම අවස්ථාවේදී ය.

2025-02-28 සිට 2025-03-19 දක්වා කාලය තුළ ඔහු බොහෝ ස්ථාන සෝදිසි කළ බව ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නගේ සාක්ෂිය වේ. ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න පොලිස් නිලධාරීන් කණ්ඩායම් කිහිපයක් යොදවා වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා ගැනීමට උත්සාහ කර ඇත. 2025-02-27 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ඔහු මෙය සිදු කර ඇත. එවකට වගඋත්තරකාර පොලිස්පතිවරයා භාවිතා කළ නිල පිස්තෝලය, එහි පතොරම් දොළහක් අඩංගු මැගසිනයක් සමඟ සොයා ගනු ලැබුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නගේ කණ්ඩායම විසිනි. එම පිස්තෝලය රෙදි සෝදන යන්ත්‍රයක් තුළ ඇඳුම්වල ඔතා තිබී සොයා ගන්නා ලදී. එම රෙදි සෝදන යන්ත්‍රය ඒ වන විට භාවිතයේ පැවති බවට සලකුණු නොතිබූ බව ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න ප්‍රකාශ කර ඇත.

ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න එදිනම රාත්‍රියේ, එනම් 2025-02-28 වන දින ගිරිඋල්ල ප්‍රදේශයේ වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මහ ගෙදර ද සෝදිසි කර ඇත. කෙසේ වෙතත්, ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න ඒ වන විට එම නිවසේ කිසිවෙකු සිටිනු දැක නැත. ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නට එම නිවසේ කිසිදු පුද්ගලයෙකුගේ ජීවත් වන බවට කිසිදු සලකුණක් නිරීක්ෂණය වී නැත. ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න රාත්‍රියේ එහි ගොස් සිටි බැවින්, එම නිවස තුළ හෝ පිටත කිසිදු ආලෝකයක් දැල්වෙනු ඔහු දැක නැත.

හරස් ප්‍රශ්න අසන අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න මහතා ප්‍රකාශ කර ඇත්තේ, ගේට්ටුව දම්වැලක් සහ ඉබි යතුරු දමා අගුළු දමා තිබූ බැවින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මහ ගෙදර පරිශ්‍රය තුළට තමා නොගිය බවයි. ගිරිඋල්ල ප්‍රදේශයේ පිහිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මහ ගෙදර අවට සෝදිසි කිරීම් සිදු කිරීම සඳහා තවත් නිලධාරීන් කණ්ඩායමක් යොදවා ඇති බව ඔහු මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත. ඒ, වගඋත්තරකාර පොලිස්පතිවරයා ගමන්කළ ස්ථාන සම්බන්ධයෙන් ඉඟියක් සොයා ගැනීම සඳහා ය. මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න මහතා මෙම පියවර ගෙන තිබුණි.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක් ඔහු සන්තකයේ නොමැතිව වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට උත්සාහ කර ඇති බවයි. එවිට ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න පිළිතුරු දී ඇත්තේ 2025-02-27 දින ප්‍රකාශයට පත් කරන ලද නියෝගය මගින් වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කරන ලෙස නියෝග කර ඇත්තේ ගරු මහේස්ත්‍රාත්වරයා විසින්ම බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙවැනි තවත් කරුණු කිහිපයක් අසා සිටියේය: ගරු මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය, වැඩබලන පොලිස්පතිවරයාට සහ ගරු නීතිපතිවරයාට දැනුම් දීමෙන් පසු වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම; අභියාචනාධිකරණ නඩුව විභාග වෙමින් පවතින බව යනාදිය සම්බන්ධයෙනි. කෙසේ වෙතත්, එම ප්‍රශ්න හෝ සාක්ෂිකරු එම ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරු මෙම සාක්ෂිකරු ගත් ස්ථාවරයට බලපා නොමැත. ඒවා ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නගේ සාක්ෂිවල විශ්වසනීයත්වයට ද බලපා නොමැත. වගඋත්තරකරු පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නගෙන් විවිධ ආකාරයේ ප්‍රශ්න යොමුකරමින් හරස් ප්‍රශ්න ඇසුවද, හරස් ප්‍රශ්න කිරීමේදී වගඋත්තරකරු පොලිස්පතිවරයා ගෙන ඇති ස්ථාවරය පැහැදිලි නොවූයෙන්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුට ඉදිරිපත් කර ඇති පහත සඳහන් ප්‍රශ්න මගින් වඩාත් හොඳින් ගොනු කර ගත හැකි වනු ඇත:

ප්‍ර: මහත්මයා කොටුවිල පොලිස් ස්ථානයේ ඉන්න නිලධාරියෙක් ද, එතන ගේට්ටුව ගාවදි එතුමාව අත්අඩංගුවට ගන්න පුළුවන්කමක් තිබෙනවා නේද බලාගෙන හිටිය නම්. ඔබේ නිලධාරීන් එතන හිටිය නම් ඔයාට ඇරෙස්ට් කරන්න පුළුවන් නේද එයාව නිරීක්ෂණය කලා නම්?

උ: මගේ නිලධාරින් එතන හිටියේ නැහැ.

ප්‍ර: මම කියන්නේ සීඅයිඩී එකේ නිලධාරින් ගේට්ටුව ඉස්සරහ හිටිය නම් අත්අඩංගුවට ගැනීමේ හැකියාවක් තිබුනා නේද. 18 වෙනිදා වරෙන්තුවක් තිබුනා නේද. 19 ඇරෙස් කරන්න තිබුනා නේද. හිටිය නම් ගන්න තිබුනේ මොනවද කියන්න. හිටිය නම් අත්අඩංගුවට ගන්න පුළුවන් කියලා මම ඔබට යෝජනා කරනවා. නිලධාරින් දාලා හිටියා නම් අත් අඩංගුවට ගත හැකිව තිබුනා කියලා මම යෝජනා කරනවා?

උ: 19 වෙනිදා එතුමා උසාවියට එන බව අපිට කියලා තිබුනා නම් අපි දාන්න ඕනේ නැහැ.

ප්‍ර: තමුන්ගේ දෙපාර්තමේන්තුවේ හිටිය ප්‍රධානියා නිසා පොලිස් නිලධාරින් කව්රුවත් මේ පුද්ගලයාව අත්අඩංගුවට ගන්න ඉදිරිපත් වුනේ නැහැ කියලා මම කියනවා?

උ: මම දන්නේ නැහැ.

ප්‍ර: ඔබතුමාගේ රෑන්ක් එක මොකක්ද?

උ: ප්‍රධාන පොලිස් පරීක්ෂක.

ප්‍ර: ඔබතුමාවත් මේ පුද්ගලයාව අත් අඩංගුවට ගන්න තරම් ප්‍රමාණවත් උත්සාහයක් දැරුවා කියලා X1 වාර්තාව අනුව පේන්නේ නැහැ කියලා මම කියනවා?

උ: පිලිගන්නේ නැහැ.

ප්‍ර: ඒ වගේම මම කියා සිටිනවා පහලම පොලිස් නිලධාරියාගේ සිට ඉහලම පොලිස් නිලධාරියා දක්වා දේශබන්දු මහත්මයාව අත්අඩංගුවට ගන්න කල යුතු මට්ටමේ උනන්දුවකින් කටයුතු කෙරුවේ නැහැ කියලා මම යෝජනා කරනවා?

උ: පිලිගන්නේ නැහැ.

නැවත විභාගයේදී උගත් සහකාර පොලිස් අධිකාරීවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න මෙම කමිටුව ඉදිරියේ තහවුරු කර ඇත්තේ, ඒ සඳහා දින ගණනාවක් කණ්ඩායම් ගණනාවක් යොදවා තිබුණද, තමාට හෝ ඔහුගේ කණ්ඩායමේ සාමාජිකයින්ට හෝ වෙනත් කිසිවෙකුට වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා ගැනීමට නොහැකි වූ බවයි. මෙම කාලය තුළදී වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා ගෙන අත්අඩංගුවට ගැනීමට බොහෝ නිලධාරීන්ට දුර බැහැර ප්‍රදේශවලට යාමට සිදු වූ බැවින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශාල වියදමක් දැරීමට සිදු වූ බවට ද ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්න මෙම කමිටුව ඉදිරියේ සාක්ෂි දී තිබේ.

ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, විමර්ශන කමිටුව ප්‍රධාන පොලිස් පරීක්ෂක සේනාරත්නගේ සාක්ෂි සත්‍ය සාක්ෂි ලෙස පිළිගෙන එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

4) උප පොලිස් පරීක්ෂක රාජපක්ෂ ආරච්චිලාගේ මහින්ද රාජපක්ෂගේ සාක්ෂි.

ඩිජිටල් අධිකරණ වෛද්‍ය විශ්ලේෂණ කටයුතු සම්බන්ධයෙන් සුදුසුකම් ලත් නිලධාරියෙකු වන උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ, වගඋත්තරකාර පොලිස්පතිවරයා තම ටොයොටා ප්‍රාඩෝ ජීප් රථයෙන් බැස, කොස්වත්ත හන්දියේ ලාෆ්ස් පිරවුම්හල සුපිරි වෙළඳසැල ඉදිරිපිට ඔහුගේ මිතුරා සුරංගගේ ජීප් රථයට නැගි ස්ථානයට ගොස් ඇත. උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ 2025-03-27 දින එම ස්ථානයට ගොස් ලාෆ්ස් පිරවුම්හලේ සවිකර තිබූ සී.සී.ටී.වී පරීක්ෂා කර ඇත. එය පටිගත වී ඇති දර්ශන නැවත බැලූ විට ජීප් රථ දෙකක් පැමිණෙන බවත්; එක් ජීප් රථයකින් පුද්ගලයින් දෙදෙනෙකු බැස යන බවත්; තවත් ජීප් රථයකට පුද්ගලයින් දෙදෙනෙකු නැගී සිටින බවත් එම සී.සී.ටී.වී දර්ශනවල සටහන් වී ඇති බව උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ සොයා ගෙන ඇත. කැමරාව එම ජීප් රථ නවතා තිබූ ස්ථානයෙන් තරමක් ඈත ස්ථානයක සවි කර තිබූ බැවින්, එම සී.සී.ටී.වී දර්ශනවල සිටින සියලුම පුද්ගලයින් හඳුනා ගැනීමට උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂට නොහැකි වී තිබේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා එහි සිටින බව හඳුනා ගැනීමට උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂට නොහැකි වුවද, එම වීඩියෝවේ වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුයුක්තව සේවය කළ පුද්ගලික ආරක්ෂක නිලධාරියා වන මහේෂ් උදාර එම අවස්ථාවේ එහි තිබූ අනෙක් ජීප් රථයෙන් බැස ඇවිද යන පුද්ගලයින් දෙදෙනාගෙන් එක් අයෙකු ලෙස ඔහු හඳුනාගෙන ඇත. උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ මෙම සී.සී.ටී.වී දර්ශන පරීක්ෂා කර ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිවරයා මාතර මහේස්ත්‍රාත් අධිකරණයට භාර වීමෙන් පසු කාලයකදී ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ මහතාගෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කර නැත. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්න පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ ඔහු මෙම සාක්ෂිකරු අපකීර්තියට පත් කිරීමට උත්සාහ කර නොමැති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා කිසි විටෙකත් මෙම සාක්ෂිකරු විමර්ශන කමිටුව ඉදිරියේ අසත්‍ය සාක්ෂි ලබා දෙන බවට යෝජනා කර නැත. ඇත්ත වශයෙන්ම, වගඋත්තරකාර පොලිස්පතිවරයා මාතර මහේස්ත්‍රාත් අධිකරණයට භාර වීමෙන් පසුව පවා උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂ මහතා තම කාර්යය ඉටු කළේය. ඇත්තෙන්ම ඔහු සී.සී.ටී.වී කැමරාවේ වගඋත්තරකාර පොලිස්පතිවරයා හඳුනා ගත්තේ නැත. දැනටමත් ඉහත සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ රියදුරු පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද්ගේ සාක්ෂි සහ ඔහුගේ පුද්ගලික ආරක්ෂක නිලධාරි මහේෂ් උදාරගේ සාක්ෂි අභියෝගයට ලක් කර නොමැත. එම සාක්ෂිකරුවන් දෙදෙනා මෙම කමිටුව ඉදිරියේ ප්‍රකාශ කළේ එකම කරුණුය. ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නැත. එබැවින්, විමර්ශන කමිටුව උප පොලිස් පරීක්ෂක මහින්ද රාජපක්ෂගේ සාක්ෂි සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගෙන එහි අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට තීරණය කරයි.

5) ප්‍රධාන පොලිස් පරීක්ෂක හේනදීරගේ ලලිත සුමින්ද ගුණසේකරගේ සාක්ෂි.

විමර්ශන කමිටුව ඉදිරියේ සාක්ෂි දෙමින්, ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසේකර **2025-06-09** දින සහතික කළ දිවුරුම් ප්‍රකාශය හඳුනාගෙන ඉදිරිපත් කර ඇති අතර එය මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ඉදිරිපත් කර ඇත. **X1** ලෙස සලකුණු කර ඇති ඔහුගේ ප්‍රකාශයේ, වගඋත්තරකරු පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම සඳහා ඔහුගේ මඟ පෙන්වීම යටතේ යොදවා ඇති

නිලධාරීන්ගේ විස්තර දක්වා ඇති අතර, ඔහුගේ උපදෙස් යටතේ යොදවා ඇති නිලධාරීන් විසින් යොදන ලද සටහන් වල පිටපත් ද ඔහුගේ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇත. මෙම මෙහෙයුම් අතරතුර, වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා, ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමින්ද ගුණසේකර, විවිධ ප්‍රදේශ අටක ස්ථාන අටක් සෝදිසි කර ඇත. එම ස්ථාන ලැයිස්තුව **X1** සමඟ අමුණා ඇත. ඔහු විසින් යොදවා ඇති නිලධාරීන් විසින් කරන ලද සවිස්තර වාර්තා සහ සවිස්තර සටහන් ද ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණසේකරගේ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලින් පෙනී යන්නේ ඔහු පහත සඳහන් ස්ථාවරයන් භාරගෙන ඇති බවයි; එය පහත ප්‍රශ්නවලින් පිළිබිඹු වේ.

ප්‍ර: මම යෝජනාවක් වශයෙන් කරන්නේ. පිළිගන්නවා නම් පිළිගන්න. ගොඩක් බලලා තියෙන්නේ පන්සල් සහ ආරන්‍ය?

උ: මම බලපු ස්ථාන **8** න් **4** ක් විහාරස්ථාන. **4** ක් ගොඩනැගිලි සහ වෙනත් ලිපිනයන් බව පිළිගන්නවා.

ප්‍ර: ඇත්තටම මේ කිසිම දෙයක් එතුමාගේ පුද්ගලික ජීවිතයට සම්බන්ධ නැති ස්ථාන තමයි මේ පරීක්ෂා කර තියෙන්නේ කියලා මම යෝජනා කරනවා. පිළිගන්නවා නම් පිළිගන්න. නැත්නම් නැහැ කියන්න ?

උ: මම එහෙම පිළිගන්නේ නැහැ ස්වාමීනි. මෙයට හේතුව වුනේ මම මේ සඳහා සහභාගිවුනේ මෙම අධිකරණ නියෝගය ලබාදුන් පෙබරවාරි **27** ත් වෙනිදායින් පසුව මාර්තු මාසයේ **07** වෙනිදා. ඒ කියන්නේ ඒ වෙන කොට මාධ්‍ය මඟින් ප්‍රචාරය කරලා විවිධ ක්‍රමවේදයන් ඔස්සේ තොරතුරු ලැබෙමින් පැවතුනා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත. ඒ අනුව ලැබෙන තොරතුරු මත තමයි මෙම පරීක්ෂා කිරීම සිදු කළේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුගෙන් අසන ලද ඉහත ප්‍රශ්න තුළින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමින්ද ගුණසේකර මහතාට යෝජනා කරන්නේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා ඉතා හොඳින් සැඟවී සිටි බවත්, එම නිසා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ඔවුන්ගේ සියලු බලය යොදාගෙන වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටි ස්ථානය සොයා ගැනීමට නොහැකි වූ බවත්ය. ඉහත කරුණු වලට යටත්ව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්න පරීක්ෂා කිරීමෙන් පෙනී යන්නේ ඔහු මෙම සාක්ෂිකරු අපකීර්තියට පත් කිරීමට උත්සාහ කර නොමැති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරු විමර්ශන කමිටුව ඉදිරියේ අසත්‍ය සාක්ෂි ලබා දෙන බවට ස්ථාවරයක් ගෙන නොමැත. වගඋත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂියේදී පිළිගෙන ඇත්තේ ඔහු සාමාන්‍යයෙන් පදිංචිව සිටින ස්ථානවලින් ඈත්ව සිටි බවයි. ඉහත තත්වයන් සැලකිල්ලට ගනිමින්, මෙම සාක්ෂිකරුගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නොමැත. එබැවින්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක සුමින්ද ගුණසේකර විසින් ලබා දුන් සාක්ෂි සත්‍ය

සාක්ෂියක් ලෙස පිළිගැනීමටත්, අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමටත් විමර්ශන කමිටුව තීරණය කරයි.

6) <u>සහකාර පොලිස් අධිකාරී බටුගෙදර අප්පුහාමිලාගේ වික්‍රම් කුමාර වීරසේකරගේ සාක්ෂි.</u>

සහකාර පොලිස් අධිකාරී වීරසේකර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අපරාධ බුද්ධි ඒකකයේ ප්‍රධානියා වේ. ඔහු 2025-05-31 දින අත්සන් කළ දිවුරුම් ප්‍රකාශය හඳුනා ගෙන, ඉදිරිපත් කර ඇති අතර එයම විමර්ශන කමිටුවට ඉදිරිපත් කර ඇත. 2025-05-31 දිනැති ඔහුගේ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇති ඇමුණුම්වල ඔහු විසින් විවිධ ස්ථානවල නිරීක්ෂණ රාජකාරි සඳහා යොදවා ඇති නිලධාරීන්ගේ විස්තර සහ ඔවුන් විසින් යොදන ලද සටහන් ඇතුළත් වේ. මෙම ලැයිස්තුවේ පොලිස් නිලධාරීන් 48 දෙනෙකු සිටින අතර සහකාර පොලිස් අධිකාරී වීරසේකරගේ කණ්ඩායම් විසින් සෝදිසි කර නිරීක්ෂණ සිදු කළ ස්ථාන ගණන 51 කි. මෙම මෙහෙයුම් 2025-02-28 සිට 2025-03-20 දක්වා කාලය තුළ සිදු කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයාගේ ස්ථාවරය, මෙම සාක්ෂිකරුට ඔහු විසින් කරන ලද පහත යෝජනා මගින් ගොනු කර ගත හැකිය.

ප්‍ර: ඒ කියන්නේ ඔබේ ආවේක්ෂණ කරපු නිළධාරින්, ඔබට මේ ආවේක්ෂනය හා විමර්ෂනය කරන්න කියලා දීපු අය හොදට දැන ගෙන ඉදලා තියෙනවා රිට් නඩුවක් දේශබන්ධු මහත්තයාගේ තියෙනවා කියලා නේද?

උ: මේ නඩුව පැවැත්වෙන දින නිලධාරින් කන්ඩායම් කීපයක් යොමු කලා මේ පාර්ශ්වය සඳහා පැමිණෙන අය සම්බන්ධයෙන් ආවේක්ෂණයට. ඒ අවස්ථාවේදී තමා මේ පුද්ගලයා අපිට අනාවරණය වුනේ. ඒ අනුව ඔහු සම්බන්ධයෙන් ආවේක්ෂණය සිදු කලා.

ප්‍ර: ඒ මහත්තයාගෙන් කෙලින්ම අහන්න තිබුනානේ ප්‍රකාශයක් සටහන් කරලා කොහේද දේශබන්දු මහත්තයා ඉන්නේ කියලා? ඒක කරලා නැහැ කියලා මම යෝජනා කරනවා ?

උ: එහෙමයි ප්‍රකාශයක් සටහන් කර නැහැ.

ප්‍ර: ඒ වගේම 20 ඉන්නේ ?....... (කියවා සිටි) එහෙම ලිපිනයක් ඔබ ආවේක්ෂනය කලා ද?

උ: ඔව්.

ප්‍ර: මෙතන ඉන්නවානේ නීතිඥ මහත්තයාත් ඉන්නවා, එයාගේ කාර්යාලයේ වැඩ කරන නීතිඥයෝ නොවන අයත් ඉන්නවා ඒ ගොල්ලන්ගෙන් මේ දේශබන්දු මෙතනට එනවාද කියලා ප්‍රකාශයක් සටහන් කරන්න තිබුනානේ?

උ: බුද්ධි අංශ නිලධාරින්ට යොමු කරපු නිලධාරීන්ට පැහැදිලි කර දුන්නේ ප්‍රකාශ සටහන් කිරීමක් නොවේ. ඒ ගොල්ලන්ට මෙම ස්ථානයට පැමිණීම පිටවීම හෝ වෙනත් සම්බන්ධාවයක් ගොඩ නැගීම සම්බන්ධයෙන් තොරතුරු බලලා දැනුම් දෙන්න තමා දැනුවත් කලේ.

ප්‍ර: මම දැන් ඔබට යෝජනාවක් කරනවා ඔය විතරක් නොවේ අර එතුමා අභියාචනාධිකරණයට ඉදිරිපත් කරපු දිවුරුම් ප්‍රකාශය සහතික කරපු නිතිඥ මහත්තයාගේ කාර්යාලයටත් ඔය නිලධාරීන් ගියානේ පොලිස් නිළධාරින් CID එකේ ?

උ: එහෙමයි.

ප්‍ර: හැබැයි ප්‍රකාශයක් සටහන් කලේ නැහැනේ?

උ: නැහැ

ප්‍ර: එතුමාට දිගටම නිතිඥ සහාය ලබාදිපු තවත් කොළඹ ප්‍රදේශයේ ඉන්න නිතිඥවරු 03 දෙනෙක්ගේ ගෙදරටත් ගිහිල්ලා ආවේක්ෂණ කටයුතු කලා කියලා කියා සිටිනවා ?

උ: ගෙවල් ආසන්නයේ

ප්‍ර: හැබැයි ඒ එක නිතිඥමහත්තයෙක්ගෙ වත් ප්‍රකාශයන් සටහන් කර ගත්තේ නැහැ කියලා මම යෝජනා කර සිටිනවා.

උ: ප්‍රකාශ සටහන් කිරීම මේ රාජකාරියේ කොටසක් නොවේ.

ප්‍ර: මම කියා සිටිනවා ඒ වෙලාවේ ඔබතුමාටනිතිඥවරුන්ගෙන් ප්‍රශ්න අහන්න එපා. තොරතුරු ගන්න එපා කියලා ඔබතුමන්ලට උපදෙස් ලැබිතිබුනා වැඩ බලන පොලිස්පතිතුමාගෙන් කියලා මම යෝජනා කරනවා?

උ: ඒ සම්බන්ධයෙන් මා දැනුවත් නැහැ.

ප්‍ර: මම කියා සිටිනවා අවංකවම ඔබ ඇතුළු සී අයි ඩී නිලධාරින්ට මෙයා ඉන්න තැන ගැන දැන ගැනීමට අවශ්‍යතාවයක් තිබුනා නම් ඕනැ තරම් හැකියාව තිබුනා මම යෝජනා කරපු ආකාරයට විමසීම කලා නම් කියලා?

උ: පිළිගන්නේ නැහැ

ප්‍ර: ඒ කොටස ඉෂ්ඨ කරන්නේ නැතිව ඔබතුමා මෙතනට ඇවිල්ලා ඔහු සැඟව සිටියා කියලා සාක්ෂි ලබා දෙනවා කියලා ? ඔබගේ රාජකාරිය හරියටම කරන්නේ නැතිව ඒ දූර්වලකම මැද්දේ සිට ඔහු සැඟව සිටියා කියලා ඔබ සාක්ෂි දෙනවා කියලා යෝජනා කරනවා ?

උ: පිළිගන්නේ නැහැ. මගේ රාජකාරිය මට උපදෙස් ලබා දුන්නේ පුද්ගලයන් හමු වී ප්‍රකාශ සටහන් කිරීම වත්, ඔවුන් හමුවෙලා තොරතුරු ගැනීමවත් නොවේ අවට සිට මේ තොරතුරු ආවෙක්ෂණය කරලා සාර්ථක තොරතුරක් ලැබුනොත් අදාල විමර්ෂණ කණ්ඩායමක් වෙත යොමු කිරීම? ඒ නිසා මා පිළිගන්නේ නැහැ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුට කරන ලද යෝජනා තවමත් යෝජනා ලෙස පවතී. ඔහු මෙම සාක්ෂිකරුට කළ යෝජනාවල අර්ථය කුමක් වුවත්, ඒ සඳහා විශාල පොලිස් නිලධාරීන් සංඛ්‍යාවක් යොදවා තිබියදීත්, වගඋත්තරකාර පොලිස්පතිවරයා කිසිවෙකුට සොයා ගැනීමට නොහැකි වූ බව සත්‍යයකි. එම තත්වයන් සැලකිල්ලට ගනිමින්. සහකාර පොලිස් අධිකාරී වීරසේකරගේ සාක්ෂි අවිශ්වාස කිරීමට විමර්ශන කමිටුවට කිසිදු හේතුවක් නැත. ඔහු මේ වසරේ මාර්තු මාසයේදී තම තනතුරු බලය තුළ තම රාජකාරි ඉටු කළ නිලධාරියෙකි. එබැවින්, සහකාර පොලිස් අධිකාරී වීරසේකරගේ සාක්ෂි සත්‍ය සාක්ෂියක් ලෙස පිළිගෙන අවසාන තීරණය සඳහා මෙම සාක්ෂි මත ක්‍රියා කිරීමට විමර්ශන කමිටුව තීරණය කරයි.

7) <u>ප්‍රධාන පොලිස් පරීක්ෂක පස්ගම විදානලාගේ අසෝක ෂෙල්ටන් කරුණාතිලකගේ සාක්ෂි.</u>

2023-12-31 වන දින වැලිගම දී සිදු වූ මෙම වෙඩි තැබීමේ සිද්ධිය පිළිබඳ වැලිගම පොලිස් ස්ථානයෙන් විමර්ශනය සිදු කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කණ්ඩායමේ ප්‍රධානියා වන්නේ ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලකය. වැඩබලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ උපදෙස් පරිදි, ඔහුගේ කණ්ඩායම 2024-10-14 වන දින විමර්ශනය සිදු කර ඇත. 2025-02-27 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් මරණ පරීක්ෂණයට අනුව නියෝගය ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මහතා වහාම වැඩබලන පොලිස්පතිවරයා සහ ගරු නීතිපතිවරයා යන දෙදෙනාටම වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට නියමිත බව 2025-02-28 දින උදෑසනම දැනුම් දීමට පියවර ගෙන තිබේ. මෙය ලිඛිතව සිදු කර ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මහතාට අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා සෙවීම 205-02-28 දින උදෑසන සිටම ආරම්භ කර ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රැසක් යොදවාගෙනයි. කෙසේ වෙතත්, යොදවා ඇති කිසිදු කණ්ඩායමකට වගඋත්තරකාර පොලිස්පතිවරයා සිටින ස්ථානය සොයා ගැනීමට උපකාර විය හැකි කිසිදු වැදගත් කරුණක් සොයා ගත නොහැකි විය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා විදේශගත වී රට හැර යනු ඇතැයි යන බියෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා රට හැර යාම වැළැක්වීම සඳහා අධිකරණ නියෝගයක් ලබා ගැනීමට ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මහතා පියවර ගෙන තිබේ. 2025-03-01 දින මෙම සාක්ෂිකරු වගඋත්තරකාර පොලිස්පතිවරයා රටින් පිටවීම වැළැක්වීම සඳහා විදෙස් ගමන් තහනමක් ලබාගෙන ඇත. ඉන්පසුව, 2025-03-11 දින, වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට ගත් අසාර්ථක උත්සාහයන් පිළිබඳව ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මහතා මාතර ගරු මහේස්ත්‍රාත්වරයා වෙත කරුණු වාර්තා කර ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක විසින් ගොනු කරන ලද එම වාර්තාව මත, මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් 2025-03-11 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා වහාම

අත්අඩංගුවට ගැනීම සඳහා විවෘත වරෙන්තුවක් නිකුත් කර ඇති බව සඳහන් විය. ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක 2025-05-31 දිනැති ඔහුගේ දිවුරුම් ප්‍රකාශය මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ඉදිරිපත් කර ඇති අතර, ඔහු 2025-03-11 දින මාතර මහේස්ත්‍රාත් අධිකරණයට විවෘත වරෙන්තුවක් ඉල්ලා ඉදිරිපත් කළ වාර්තාව ද **X1** ලෙස සටහන් කර එයට අමුණා ඇත. ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරන ලද විවෘත වරෙන්තුව ද **X2** ලෙස සටහන් කර ඇති ඔහුගේ දිවුරුම් ප්‍රකාශයට අමුණා ඇත.

2023-12-31 වන දින උදෑසන කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි තැබුවේ W15 හෝටලය ඉදිරිපිට රැඳී සිටි පුද්ගලයෙකු බවට කිසිදු සාක්ෂියක් විමර්ශන අතරතුරදී නොලැබුණු බව ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලකගේ සාක්ෂිය වේ. වැලිගම අපරාධ අංශයේ ස්ථානාධිපතිවරයා සහ අනෙකුත් නිලධාරීන් ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් ආරම්භ කිරීමට කිසිදු අර්ථවත් පියවරක් ගෙන නොමැති බව ඔහුගේ සාක්ෂියයි. 2023-12-31 දින කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්ට වෙඩි තැබූ බව කියන නාඳුනන තුවක්කුකරු පිළිබඳ තොරතුරු සොයා ගැනීමට හේතුවන කිසිදු පරීක්ෂණයක් මාතර කොට්ඨාශයේ කිසිදු නිලධාරියෙකු මෙතෙක් සිදු කර නොමැති බවට මෙම සාක්ෂිකරුගේ ද සාක්ෂිය වේ. ඉමදූව අධිවේගී මාර්ග පිවිසුමේදී වෑන් රථයේ සිටි කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන්, වැලිගම මූලස්ථාන පොලිස් පරීක්ෂක විසින් තම භාරයට ගෙන ඇතත්, ඔවුන්ගේ ප්‍රකාශ සටහන් කර ගැනීමෙන් අනතුරුව ඔවුන් සියලු දෙනා නිදහස් කර ඇති බවත්, ඉන් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලක සොයාගෙන ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලකගෙන් අසන ලද ප්‍රශ්න මඟින් කුමන ආකාරයෙන් හෝ ඔහුගේ සාක්ෂිවල ස්ථාවරයෙහි වෙනසක් සිදු වී නැත. මෙම අවස්ථාවේදී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් ප්‍රධාන පොලිස් පරීක්ෂක කරුණාතිලකගෙන් මෙම අවස්ථාවේ අසන ලද බොහෝ ප්‍රශ්න අදාළ නොවන බව කමිටුව සොයාගන්නා ලදී. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුට කරන ලද යෝජනා පහත පරිදි වේ.

ප්‍ර: හැම එකේම කියලා තියෙනවා ඉන්ටඩික් කරලායි ඇවිත් තියෙන්නේ කියලා ඇන්සලම්ගේ එක කියවන්න, දුලිප්ගේ එක කියවන්න, නොදන්න විදිහට කතා කරන්න එපා. ඒ.එස්.පි ලත් ඇවිත් කියනවා දන්නේ නැහැ කියලා, මම කාගෙන් අහන්නද මේක? මගේ සේවාදායකයාට සාධාරණයක් වෙන් ඕන ? මම කියනවා ඔබතුමාට ඒ ගොල්ලන්ට රස්සාවල් නැති වෙලා වැටුපත් නැති වෙලා ඒ අසරණ තත්වය උඩ දිපු ප්‍රකාශ තමා ඔබතුමා ලග තියෙන්නේ කියලා?

උ: මම ඒක පිළිගන්නේ නැහැ. .....

...

ප්‍ර: ඔබතුමා දන්නවා නේද යම්කිසි මනුස්සයෙක් ඒ ලිපිනයේ ඉන්වාද නැද්ද කියන එක රජයේ නිලධාරියෙක් ගෙන් ගන්න පුළුවන් වැදගත්ම තහවුරු කිරීම ග්‍රාම නිලධාරිවරයාගේ ප්‍රකාශයක් සටහන් කරන්න ඕන ? ඔබ ගංගානි පෙදෙසට අදාල හෝකන්දර, උතුර ග්‍රාමනිලධාරී වසමේ ග්‍රාම නිලධාරිවරයාගේ ප්‍රකාශයක් සටහන් කලාද මේකට ඉස්සෙල්ලා ?

උ: මෙම දේශබන්දු මහත්තයාව අත්අඩංගුවට ගන්න කියලා නියෝගයක් ලැබුනාට පස්සේ අධිකරණයෙන් ඒ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමිය විසින් කණ්ඩායම් කීපයක් පත් කලා ස්වාමිනි. ඒ අනුව තමා කලින් සදහන් කල නිලධාරින් විමර්ෂන වලට යොමු කලේ. නමුත් මට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකියාවක් ලැබුනේ නැහැ. අනිත් නිලධාරින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරන්න ඇති.

ප්‍ර: ඔබතුමා වගකිම පවරන්න එපා ජේෂ්ඨ මහත්මයා? ඔබතුමා කැදෙව්වා ද නැද්ද කියලා මම අහන්නේ ? CID නිලධාරියෙක් තමන් කරපු දෙපාර්තමේන්තුවේ වගකීම ගන්න ? මට උත්තරය දෙන්න ? මම මුතුමාල මැඩම්ව ගෙන්න ද ප්‍රශ්න අහන්න?

උ: මේ සම්බන්ධව විමර්ෂනය කරන්න කන්ඩායම් කීපයක් පත් කලා. දේශබන්දු මහත්මයා ඉන්න තැන් හොයන්න එතුමාගේ පදිංචි ලිපිනයන් හොයන්න, එතුමාගේ දේපල කොහෙද තියෙන්නේ හොයන්න වෙනම නිලධාරි කොටසක් පත් කලා. එතුමා සම්බන්ධයෙන් හොයන්න වෙනම නිලධාරින් කොටසක් පත් කලා මගේ රාජකාරිය වුනේ ප්‍රධාන විමර්ෂනය සහ මේ අධිකරණ කටයුතු තමා මම කලේ.

ප්‍ර: ඔබතුමාගේ කරපු කාර්යය බලද්දී ඔබතුමා ග්‍රාමනිලධාරි වාර්තාවක් සටහන් කරලා නැහැ කියලා මම කියනවා?

උ: නිවස පරික්ෂා කලා ස්වාමිනි. නිවසේ සිටියේ නැහැ.

ප්‍ර: ඔහු පදිංචියේ ඉන්නවාද නැද්ද කියන එක ගත්තේ නැහැ කියලා මම ඔබට යෝජන කරනවා?

උ: විමර්ෂණ වලදී අනාවරණය වුනා එම ලිපිනය ඔහුට අයත් එකක් නෙමේ කියලා. හාමුදුරු කෙනෙක්ට අයත් ඉඩමක් කියලා තමා අනාවරණය වුනේ.

ප්‍ර: පොලිස් දෙපාර්තමේන්තුවේ තියෙනවා තෙන්නකෝන් මුදියන්සේලාගේ වංශාලංකාර දේශ බන්දු තෙන්නකොන් කියලා මහත්තයෙක් පොලිසියට බැදුනා කියලා ෆයිල් එකක් තියෙනවාද පොලිස්පතිතුමා යටතේ තියෙන මානව සම්පත් හා කළමනා කරණ අංශයේ ?

උ: ඒ මා කලිනුත් සදහන් කලේ ඒකයි එම කටයුතු සම්බන්ධයෙන් වෙනම නිලධාරියෙක් පත්කර තිබුනේ.

ප්‍ර: ඒකේ සඳහන් වෙන ලිපිනය ගැන ඔබතුමා බැලුවේ නැහැ?

උ: ඒ කොටස් විමර්ෂණය කරන්න වෙනම නිලධාරියෙක් පත්කලා. ඔහුගේ දේපල සම්බන්ධයෙන් හොයන්න, ඔහු පදිංචි ස්ථාන හොයන්න, වෙනම කණ්ඩායමක් පත් කර තිබුනේ.

ප්‍ර: ඒ අනුව ගිහිල්ලා ඔබතුමාගේ ඔය කවුරු හරි පත් කරපු නිලධාරියෙක් ඒ ගිරිඋල්ල ප්‍රදේශයේ ග්‍රාමනිලධාරි වසමෙන් ගිහිල්ලා ඔය ලිපිනයේ දේශ බන්දු මහත්තයා ඉන්නවාද නැද්ද කියලා පදිංචිය තහවුරු කරගැනීමේ ප්‍රකාශයක් සටහන් කර ගෙන නැහැ කියලා මම යෝජනා කරනවා?

උ: මට මතක නැහැ ස්වාමිනි. නමුත් ඒ ස්ථානය පරීක්ෂා කලා නිලධාරීන්.

8) <u>සහකාර පොලිස් අධිකාරී අබේසේකර ගම්ලත්ගේ යසස් ස්වර්ණ කීර්තිසිංහගේ සාක්ෂි.</u>

සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස කටයුතු කරයි. මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් 2025-02-27 දින වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා නියෝගයක් නිකුත් කිරීමෙන් පසු, වගඋත්තරකාර පොලිස්පතිවරයා පිලිබඳ නිරීක්ෂණ සිදු කිරීමට, සොයා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම සඳහා මෙහෙයුම් පැවැත්වීමට ඔහු භාරව සිටියේය. සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ 2025-03-08 සිට 2025-03-18 දක්වා කාලය තුළ මෙම මෙහෙයුම් සිදු කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා ඔහු සෝදිසි කිරීම් සිදු කළ ස්ථාන, ඔහු නිරීක්ෂණ සිදු කළ ස්ථාන පිළිබඳ විස්තර අමුණා <u>**P-80**</u> ලෙස සලකුණු කර ඇති දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ ඔහු යටතේ නිලධාරීන් තිස් දෙනෙකු කණ්ඩායම් තුනකට යොදවා බොහෝ ස්ථාන සෝදිසි කර ඇත. නුගේගොඩ, හෝකන්දර, ගම්පහ, නිට්ටඹුව, ගිරිඋල්ල, බෝපිටිය සහ හලාවත යන ප්‍රදේශ ඔහු සෝදිසි මෙහෙයුම් සිදු කර ඇති ප්‍රදේශ කිහිපයකි. ගිරිඋල්ලේ පිහිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ මහ ගෙදර වටා නිරීක්ෂණ සිදුකිරීමේදී ද සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ දායක විය. මෙම මෙහෙයුම් සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශාල වියදම් දැරීමට සිදු වූ බවට ඔහුගේ සාක්ෂි ලබා දෙයි. ඉහත උත්සාහයන්වල නිරත වූවද, ඔහුගේ කණ්ඩායම් කිසිවකට එම කාලය තුළ වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා ගැනීමට නොහැකි වූ බව මෙම සාක්ෂිකරු ඔහුගේ සාක්ෂියේ සඳහන් කර ඇත.

හරස් ප්‍රශ්න ඇසීමේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ මහතා ප්‍රධාන සාක්ෂි විමසීමේදී සිටි ස්ථාවරයම පවත්වා ගෙන ගොස් ඇත. මේ අනුව, හරස් ප්‍රශ්න ඇසීම හේතුවෙන් මෙම සාක්ෂිකරුට ප්‍රධාන සාක්ෂි විමසීමේදී දැනටමත් විස්තර කර ඇති කරුණු නැවත නැවතත් පැවසීමට දෙවන අවස්ථාවක් පමණක් ලැබී ඇත.
වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා සහකාර පොලිස් අධිකාරී ස්වර්ණ කීර්තිසිංහ මහතාගෙන් ප්‍රශ්න ලෙස: ඔහු සෝදිසි වරෙන්තුවක් ලබා ගත්තේද යන ප්‍රශ්නය; ඔහුගේ ස්ථිර නිවසේ ලිපිනය තහවුරු කර ගැනීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සේවා වාර්තාව පරීක්ෂා කළේද යන ප්‍රශ්නය; ඔහු නිරීක්ෂණ සිදු කළ ස්ථාන අවට සිටින පුද්ගලයින්ගෙන් ප්‍රකාශ සටහන් කර ගත්තේද යන ප්‍රශ්නය, විමසූ අතර මෙම විමර්ශන කමිටුවට වගඋත්තරකාර පොලිස්පතිවරයාට පක්ෂව සලකා බැලිය හැකි කිසිදු කරුණක් මතු කර නැත. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා විසින් මෙම සාක්ෂිකරුට කරන ලද යෝජනා පහත උපුටා දැක්වීම් දෙක මගින් දැකගත හැකිය.

ප්‍ර: මම මේ ඔබතුමාට දෝෂාරෝපණය කරනවා නොවෙයි. දැන් ඔය ''තොරතුරු දුන්නා,තොරතුරු දුන්නා'' කියලා කියනවානේ? ඒ තොරතුරු දුන් මිනිස්සු පෞද්ගලික තරහක් මත දෙන තොරතුරුද නැද්ද කියලාවත් අඩු ගානේ තහවුරු කර ගන්න ඕනෑ නේද? එහෙම එකක් තිබෙනවානේ, ඔබතුමා ඉහළ නිලධාරියෙන්නේ?

උ: පැහැදිලි නැහැ.

ප්‍ර: යම් කිසි පෞද්ගලික තොරතුරු දුන්නා කියලානේ මේ කියන්නේ. ඒ දීපු තොරතුරු දේශබන්දු මහත්තයා සම්බන්ධයෙන් හරි, වෙනත් පුද්ගලයෙක් සම්බන්ධයෙන් හරි තිබෙන තරහක් මත දීපු තොරතුරක්ද?

උ: නැහැ.

ප්‍ර: ඒක තහවුරු කර ගත්තාද?.

උ: නැහැ, අපට අවශ්‍යතාව තිබුණේ දේශබන්දු තෙන්නකෝන් මහත්තයා අත්අඩංගුවට ගැනීමයි විමර්ශනය තුළින්; වෙන සිද්ධියක් නොවෙයි.

ප්‍ර: මම කියන්නේ ඒ තොරතුරක තිබෙන ක්‍රෙඩිබිලිටි, සම්මාණනීයත්වයවත් තහවුරු කර ගන්නේ නැතිව ඔහේ අරගෙන ගිහිල්ලා කියලා මම මේ කියන්නේ, තමන්ගේ ආවේක්ෂණය?

උ: ප්‍රතික්ෂේප කරනවා.

ප්‍ර: එහෙම නැත්නම් එකම නිලධාරීන් දෙන්නෙක්, -මාර්තු 10 ගැන කියන්නේ- කොහුවල, මාලබේ, ගිරිඋල්ල, කිරුළපන, නිට්ටඹුව, කෝට්ටේ මෙහෙම පාර දිගට දේශබන්දු මහත්තයා ඉන්නවා කියලාද බල බලා ගියේ?

උ: නැහැ.

.......

ප්‍ර: මේ නිලධාරියා අහවල් ස්ථානයට යනවා, මේ නිලධාරියා අහවල් තැනට යනවා, යන්නේ කුමන කරුණක් මතද? දැන් අතිරේක සොලිසිටර් ජෙනරාල් මහත්තයා අහනකොට ඔබතුමා කිව්වා වාහනයකින් යන්නේ, කැමට වියදම් යනවා, අතිරේක බටා අනුමත කරනවා කියලා. එහෙම කරන්න ඉස්සෙල්ලා මේ කරන දේ ප්‍රයෝජනවත් කාර්යයක් කියලා තහවුරු කර ගත්තේ නැද්ද?

උ: විමර්ශන නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා තමයි අදාළ ලිපිනයන්වලට යොමු වෙන්නේ, ඔවුන්ට විශ්වාසයක් තිබෙන, විශ්වාසදායක තොරතුරු අනුව තමයි ඔය කියන ලිපිනයන් පරීක්ෂා කරලා, ආවේක්ෂණ රාජකාරි කරලා, විමර්ශනය සිදු කළේ.

ප්‍ර: මහත්තයා කොයියම්ම වෙලාවකවත් නීතිඥ මහත්වරු ඉන්න ප්‍රදේශ ගැන, දේශබන්දු මහත්තයා ඇසුරු කළ, නඩු කියපු නීතිඥ මහත්වරු පිළිබඳව ආවේක්ෂණයක් කළේ නැද්ද?

උ: නැහැ.

ප්‍ර: ඔබතුමා ඒ මහත්තයා පෙනී හිටපු අධිකරණවලට, ඒ මහත්තයා එනවාද නැද්ද කියලා විමර්ශන කළේ නැද්ද?

උ: නැහැ.

ප්‍ර: ඒ අනුව මම මහත්තයාට යොජනා කරනවා තමුන් ඒ මහත්තයාගේ ග්‍රාම නිලධාරිගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තේ නැහැ කියලා? පදිංචි ස්ථාන දෙකේම ග්‍රාම නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගත්තේ නැහැ?

උ: නැහැ.

ප්‍ර: මම කියා සිටිනවා තමුන් පෞද්ගලිකව මැදිහත් වෙලා අම්මාගෙන්, අක්කාගෙන්, අයියාගෙන්, බිරිඳගෙන කියන අයගෙන් තමුන් ප්‍රකාශ සටහන් කර ගත්තේ නැහැ කියලා?

උ: ඔව්, මම ප්‍රකාශ සටහන් කර ගත්තේ නැහැ.

ප්‍ර: ඒ වාගේම ඒ මහත්තයාගේ නිවාස දෙක වෙච්ච, ගිරිඋල්ලේ පිහිටි නිවසත්, ගංගානි ප්‍රදේශයේ තිබෙන නිවසත් ඇතුළට ගිහිල්ලා පරීක්ෂා කරලා බැලුවේ නැහැ කියලා මම කියනවා?

උ: මගේ කණ්ඩායම කළේ නැහැ.

ප්‍ර: ඒ වාගේම මම තමුන්ට කියනවා, මේ මහත්තයා 19වෙනි දා පෙනී සිටියානේ, 19වෙනි දා උසාවියට ගියානේ?

උ: එහෙමයි.

ප්‍ර: ඒ 19 වෙනි දා යනකොට උසාවියට යනතුරු ඔය කිසිම නිලධාරියෙක් ඔහුව අත්අඩංගුවට ගන්න කටයුතු කළෙත් නැහැ කියලා මම යෝජනා කරනවා?

උ: අත්අඩංගුවට ගත්තේ නැහැ.

ප්‍ර: ඔබතුමාට මම ටිකක් සරල විධියට කියනවා, හිටපු පොලිස්පතිතුමා නිසා ඔබතුමාගේ නිලධාරීන් උනන්දුවෙන් මොහුව අත්අඩංගුවට ගන්න කටයුතු කරලා නැහැ කියලා මම යෝජනා කරනවා?

උ: පිළිගන්නේ නැහැ.

9) <u>වැඩ බලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වීරසූරිය ලියන ආරච්චිගේ සමන් ප්‍රියන්තගේ සාක්ෂිය.</u>

වැඩබලන පොලිස්පතිවරයා සාක්ෂි දෙමින් කියා සිටියේ 1999-04-09 දින දේශබන්දු තෙන්නකෝන් මහතා පරිවාස සහකාර පොලිස් අධිකාරීවරයෙකු ලෙස සිටියදී මධ්‍යම අවි ගබඩාවෙන් 0.38 විශේෂ ආර්මීනියස් රිවෝල්වරයක් නිකුත් කර ඇති බවයි. නැවතත් 2000-01-07 දින සහකාර පොලිස් අධිකාරී දේශබන්දු

තෙන්නකෝන් මහතා එම රිවෝල්වරය මධ්‍යම අවි ගබඩාවට භාර දී ඇති අතර එදිනම E8751 අංක දරන මිලිමීටර් 9 CZ 85 පිස්තෝලයක් මධ්‍යම අවි ගබඩාවෙන් දේශබන්දු තෙන්නකෝන් මහතාට නිකුත් කර ඇත. හෝකන්දර නැගෙනහිර, ගංගානි උද්‍යානයේ 7 වන පටුමගෙහි අංක 76/6A දරන ඔහුගේ නිවස පරීක්ෂා කළ පොලිස් නිලධාරියා විසින් ඇඳුම්වල ඔතා අතහැර දැමූ රෙදි සෝදන යන්ත්‍රයක පතොරම් 10 ක් සමඟ තිබී සොයා ගන්නා ලද්දේ මෙම මිලිමීටර් 9 පිස්තෝලයයි. අවියක් නිකුත් කර ඇති ඕනෑම පොලිස් නිලධාරියෙකු වගකීමෙන් යුතුව එවැනි අවියක් ඔහු සන්තකයේ තබා ගත යුතු බවට වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂියයි. මෙම සාක්ෂිකරුට අනුව, අවියක් සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් ඕනෑම පොලිස් නිලධාරියෙකුට අදාළ වන නීති රීති වගඋත්තරකාර පොලිස්පතිවරයාට ද අදාළ වේ.

වැඩබලන පොලිස්පතිවරයා සිය සාක්ෂි ලබාදීමේදී **P-32**, **P- 33** සහ **P-34** ලෙස සලකුණු කර ඇති ලේඛන ඉදිරිපත් කර ඇත. මෙම ලේඛන මගින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ආරක්ෂාව සැපයීම සඳහා විශේෂ කාර්ය සාධක බලකායේ නිලධාරීන් ඇතුළු පොලිස් නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යොදවා ඇති බව තහවුරු කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-02-28 වන දින උදෑසන හෝකන්දර නිවසින් පිටව යන විට පවා වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුයුක්ත කර ඇති මෙම ආරක්ෂක නිලධාරීන් පිරිස එහි සිට ඇත.

කමිටුව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් වැඩබලන පොලිස්පතිවරයා ප්‍රකාශ කර ඇත්තේ, 2025-02-27 වන දිනම, වගඋත්තරකාර පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා අත්අඩංගුවට ගැනීමට මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගය පිළිබඳව තමාට දැනුම් දුන් බවයි. ඉන්පසුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා කණ්ඩායම් කිහිපයක් යෙදවීමට වැඩබලන පොලිස්පතිවරයා පියවර ගෙන තිබේ. කෙසේ වෙතත්, ඒ වන විට වගඋත්තරකාර පොලිස්පතිවරයා තම නිවසින් පිටව ගොස් සිටි අතර, වැඩබලන පොලිස්පතිවරයා විසින් ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා යොදවා තිබූ පොලිස් කණ්ඩායම්වලට ඔහුව සොයාගත නොහැකි විය. මෙම කරුණු මත, මාධ්‍ය නිවේදනයක් නිකුත් කිරීම මගින් වගඋත්තරකරු පොලිස්පතිවරයා සොයා ගැනීම සඳහා මහජන සහාය ඉල්ලා සිටින ලෙස වැඩබලන පොලිස්පතිවරයා, පොලිස් මාධ්‍ය ප්‍රකාශක, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග මහතාට උපදෙස් ලබා දී ඇත. 2025-03-06 දින වැඩබලන පොලිස්පතිවරයාගේ ප්‍රධානත්වයෙන් සියලුම පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සහභාගී වූ සමුළුවක්ද පවත්වා ඇති අතර, එහිදී වගඋත්තරකරු පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීම සඳහා පොලිසිය ගත යුතු පියවර මොනවාද යන්න සාකච්ඡා කරන ලදී. මෙම සමුළුව මාර්ගගත සමුළුවක් විය. වැඩබලන පොලිස්පතිවරයා විසින්, 2025-03-06 දින සියලුම පළාත්වල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් දාහතක් සමඟ පැවති මෙම සමුළුවේ කාර්ය සටහන්, **P-35** ලෙස සලකුණු කර ඉදිරිපත් කර ඇත. ඉන් පසුව, වැඩබලන පොලිස්පතිවරයා විසින් රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය පොලිස්පති පොලිස් විශේෂ ශාඛාව, බස්නාහිර පළාත් බුද්ධි අංශයේ අධ්‍යක්ෂ වෙත පිළිවෙලින් **P-36**, **P-37** සහ **P-38** සළකුණු කර ඇති ලිපි මගින්, තොරතුරු රැස් කිරීමට සහ වගඋත්තරකරු පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට සියලු පියවර ගන්නා ලෙස උපදෙස් දී ඇත. වැඩබලන පොලිස්පතිවරයා මෙම ලිපි ලියා ඇත්තේ 2025-03-06 දින පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් සමඟ පැවැත්වූ සමුළුවෙන් අනතුරුවය. **P-36, P-37** සහ **P-38** යන 2025-03-09 දිනැති ලිපි වැඩබලන පොලිස්පතිවරයා විසින් අත්සන් තබා ඇත. කෙසේ වෙතත්, වගඋත්තරකරු පොලිස්පතිවරයා 2025-03-19 දින මාතර මහේස්ත්‍රාත් අධිකරණයට භාර වන තෙක් ශ්‍රී ලංකා පොලිසියේ කිසිඳු ශාඛාවක පොලිස් නිලධාරියෙකුට වගඋත්තරකරු පොලිස්පතිවරයා සොයා ගැනීමට නොහැකි විය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටීමේ ක්‍රියාව; මෙම සිදුවීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පැවැත්වීමට නියෝග නොකිරීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ක්‍රියාව සහ ගරු මාතර

මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගවලට අවනත වීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා අපොහොසත් වීම යන සියල්ල තුළින් ශ්‍රී ලංකා පොලිසිය සමස්තයක් ලෙස අපකීර්තියට පත් කර ඇති බව වැඩබලන පොලිස්පතිවරයා සිය සාක්ෂියේදී පැහැදිලිව ප්‍රකාශ කර ඇත. අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමට වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටීම කිසිසේත් පිළිගත නොහැකි බවත්, එය රටේ පොලිස්පතිවරයාට නුසුදුසු බවත් ඔහුගේ සාක්ෂියයි.

මෙම අවස්ථාවේදී කමිටුව විසින් වැඩබලන පොලිස්පතිවරයාගේ සවිස්තරාත්මක පැහැදිලි කිරීමේ හරස් ප්‍රශ්නවලින් ලබාගත් පහත කොටස නැවත ඉදිරිපත් කිරීම යෝග්‍ය වනු ඇත:

ප්‍ර: මම කියනවා මේ ඉන්න දේශබන්දු මහතාගේ නැෂනල් අයි. ඩී එක තිබෙනවා නේ? ඒකේ තිබෙනවා මහගෙදර ලිපිනය ? අන්න ඒ ලිපිනයේ ඔය ආවේක්ෂණ කරපු අය ගිහිල්ලා විමර්ශනය කලේ නැහැ කියලා පිළිගන්නවාද නැද්ද? ගිරිඋල්ලේ?

උ: මට ලැබුනු තොරතුරු අනුව ගිරිඋල්ල, අම්පිටිය මේ හෝකන්දර පොලිස්පති නිල නිවස ඒ හැම එකක්ම පොලිස් පරීක්ෂාවට ලක් වුනා.

ප්‍ර: දැන් ඔබතුමා කියන දේ නෙවෙයි?

උ: හෝමාගම පරීක්ෂාවට ලක් වෙන්න වුනෙත් හෝමාගම නිවසේ ගෙදර විවෘත කරලා දුන්නා අපි එතුමාගේ බිරිඳට එන්න කියලා. ඒ බිරිඳගේ පරීක්ෂාව යටතේ ඒ සිද්ධිය වුනේ. එතකොට එක කාමරයක් වහලා තිබුනා. පර්මනන්ට්ම වහලා තිබුණා. ඒක ඇරියේ නැහැ හෝ කන්දර දැනට පදිංචි නිවස. අපි කිව්වා ඒ සම්බන්ධයෙන් විවෘත කරලා දෙන්න කියලා. මම හිතන්නේ විමර්ශන නිලධාරීන් විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඊට පස්සේ අපි ඒ අවශ්‍ය බලය යොදලා විවෘත කලා. එදින තමයි ඒ පිස්ටල් එක අවි හා උණ්ඩ ඒ පරීක්ෂණයෙන් තමයි හම්බ වෙන්නේ ස්වාමීනි. ඒ කාමරේ නෙවෙයි වෙනත් තැනක තිබිලා වොෂින්මැෂින් එක ඇතුළේ තිබිලා තමයි හම්බ වෙන්නේ.

ප්‍ර: දැන් මම කියනවා අර මේ ඔය මහ ගෙදර සහ ගංගානි පෙදෙසේ තිබෙන නිවසටයි ඔබතුමා සර්ච් වොරන්ට් ගත්තේ නැහැ කියලා අධිකරණයෙන්?

උ: සර්ච් වොරන්ට් අවශ්‍ය වෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: ස්ථානීය පරීක්ෂණය සඳහා?

උ: සැකකරුවෙක් සැඟවිලා ඉන්න අධිකරණ නියෝගයක් තිබෙනවා.

ප්‍ර: ස්ථානයකට ඇතුළු වෙන්න සෝදිසි වරෙන්තුවක් ඕන. පුද්ගලයෙකු අත්අඩංගුවට ගන්න අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් ඕන?

උ: එහෙම එකක් නැහැ ස්වාමීනි.

ප්‍ර: පොලිස්පතිතුමා හැටියට කියන්නේ ඕනම කෙනෙකුගේ ගෙදරට ඔබට ඇතුළුවෙන්නපුලුවන්කියලද?

උ: පුලුවන්. අපිට අධිකරණ නියෝගයක් තිබෙනවා මෙයා අධිකරණ නියෝගයෙන් පැනලා ගිහිල්ලා ඉන්නවා. අපිට ආපහු සර්ච් වොරන්ට් ඕන නැහැ ස්වාමීනි. ශ්‍රී ලංකා නීතියට අනුව අපි පොලිසියට එහෙම ගන්න ගියොත් පොලිසියට නිවාස පරීක්ෂාවක් කරන්න ඕන නැහැ. මත්ද්‍රව්‍ය තිබෙනවා නම් ඕනෑම වෙලාවක පරීක්ෂා කරන්න පුලුවන්, ගිනි අවි තිබෙනවා නම් පරීක්ෂා කරන්න පුලුවන්. එතකොට පුපුරණ ද්‍රව්‍ය තිබෙනවා නම් ඕනෑම වෙලාවක පුලුවන්. ඕනෑම අවස්ථාවක සෝදිසි වරෙන්තු අවශ්‍ය වෙන්නේ නැහැ ස්වාමීනි.

ප්‍ර: අර ගිරි උල්ලේ මහ ගෙදර නැෂනල් අයි.ඩී. එකේ තිබෙන ගෙදරට ගිහිල්ලා ඔය කියන කාල පරිච්ඡේදයේ එක වතාවක් හරි ගිහිල්ලා හෙව්වද?

උ: ඒ සම්බන්ධයෙන් විමර්ශන නිලධාරීන්ගෙන් තමයි දීර්ඝ ලෙස සිද්ධිය මට පෞද්ගලිකව මතක නැහැ. මොකද මම ඒ සම්බන්ධයෙන් අතෙන්ට ගියාද මෙතෙන්ට ගියාද කියලා මම විමසීම් කරන්නේ නැහැ. ඒ විමර්ශන නිලධාරීන්ගෙන් අධ්‍යක්ෂවරයාගෙන් තමයි ඒ සම්බන්ධව විමසීම් කළ යුතු වෙන්නේ. මට දැනුම්දුන් පරිදි ඒ හැම ස්ථානයක්ම පරීක්ෂාවට ලක්කලා කියන එක තමයි මට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිතුමා මට ප්‍රකාශ කරලා තිබෙන්නේ. මට නැවත එහෙම පරීක්ෂා කළාද කියලා හරස් පරීක්ෂාවක් කරලා පෞද්ගලිකව මම වෙන කෙනෙක් දාල පරීක්ෂාවක් සිදු කරන්නේ නැහැ.

ප්‍ර: මම කියනවා 901/1 මත්තේගම, බෝපිටිය කියන එකට කිසිම අවස්ථාවක ගියේ නැහැ කියලා. ඒක නිලධාරිනුත් දන්නවා ඒක නිසා මම කියන්නේ. වෙනම ගන්න පුලුවන් අපිට. මම ඔබතුමා කිව්ව නිසා කියන්නේ ඒ නිවසට කිසිම අවස්ථාවක ගියේ නැහැ කියලා?

උ: මට ලිපිනයන් සම්බන්ධයෙන් මතක නැහැ. උගත් නීතීඥතුමා අහන්නේ අහවල් තැන මම හැංගිලා හිටියා. හැබැයි මම හිටිය තැන හොයා ගත්තේ නැහැනේ කියන එකනේ. ඒ සම්බන්ධයෙන් මම හිතන්නේ පොලිස්පතිවරයා විදියට එහෙම හැංගිලා ඉන්න තැන මාව හොයාගත්තද කියලා අහන එක මේ විනිශ්චය සභාවටත් කරන මම හිතන්නේ ඒ වගේ අපහාසයක් ස්වාමීනි.

වැඩබලන පොලිස්පතිවරයාගේ සාක්ෂි පිළිගැනීමට තීරණය කිරීමට හේතු විමර්ශන කමිටුව දැනටමත් දක්වා ඇත. මීට පෙර දක්වා ඇති හේතු මත, වැඩබලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරියගේ ඉහත සඳහන් සාක්ෂි ද පිළිගැනීමට මෙම කමිටුව තීරණය කර ඇත.

10) <u>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී කුමාර බුද්ධික මනතුංගගේ සාක්ෂි</u>

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග 2024 දෙසැම්බර් සිට 2025-06-30 දින දක්වා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ලෙස කටයුතු කරන ලදී. පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ලෙස ඔහු ශ්‍රී ලංකා පොලිසියට අදාළ තොරතුරු සාමාන්‍ය ජනතාව වෙත බෙදා හැරීම සඳහා සියලුම ප්‍රධාන මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීමේ කාර්යභාරය ඉටු කරන බවට ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ . සියලුම ප්‍රධාන මාධ්‍ය ආයතනවල WhatsApp කණ්ඩායමක් සහ විද්‍යුත් තැපැල් කණ්ඩායමක් පිහිටුවා ඇති ශ්‍රී ලංකා

පොලිස් අධිකාරී බුද්ධික මනතුංග පොලිස් මාධ්‍ය අංශයේ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සඳහා මාධ්‍යවේදීන් කැඳවීමට පියවර ගෙන තිබේ. ඔහු පවසන පරිදි, පැය 24 පුරාම ක්‍රියාත්මක වන මෙහෙයුම් මැදිරියක් ඇති පොලිස් මාධ්‍ය අංශයේ නිලධාරීන් 100 කට අධික පිරිසක් ඔහු යටතේ සේවය කරති. මෙම නිලධාරීන් සියලුම ප්‍රධාන රූපවාහිනී නාලිකාවල ප්‍රවෘත්ති විකාශන නිරීක්ෂණය කිරීම, සියලුම ප්‍රධාන පුවත්පත් කියවීම, සමාජ මාධ්‍ය කණ්ඩායම්වල ක්‍රියාකාරීව සම්බන්ධ වීම හරහා, ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධව හා එරෙහිව ඇති සාමාජීය තොරතුරු රැස් කිරීම සහ නිවැරදි තොරතුරු එම නාලිකා හරහා සමාජයට ලබා දීම යන දෙකම සිදු කරයි. ශ්‍රී ලංකා පොලිසිය විසින් ගනු ලබන ස්ථාවරයන් , ක්‍රියාමාර්ග ආදිය රටේ ජනතාවට දැනුම් දීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංගගේ නිලධාරීන් පියවර ගනු ලබන්නේ එම ක්‍රියාවලිය තුළින්ය . පොලිස් මාධ්‍ය අංශය පොලිස්පතිවරයාගේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

ඉහත අධීක්ෂණ ක්‍රියාවලිය හරහා, 2025-02-27 දින මාතර උගත් මහේස්ත්‍රාත්වරයාගේ නියෝගයට රට පුරා පුළුල් ප්‍රචාරයක් ලබා දී තිබුනු බව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග දැන සිටියේය.

ඉන් දින කිහිපයකට පසු, මාතර මහේස්ත්‍රාත් අධිකරණය විසින් ප්‍රකාශ කරන ලද 27-02-2025 දිනැති නියෝගයට අනුකූලව වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගෙන ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා පොලිසිය සමත් නොවන්නේ මන්දැයි තොරතුරු සෙවීම සඳහා මාධ්‍ය නිලධාරීන් ගණනාවක් නිතිපතා ඔහු හා සම්බන්ධ වීමට පටන් ගෙන තිබුණි. එබැවින් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග වැඩබලන පොලිස්පති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරියගෙන් උපදෙස් ලබාගෙන මාධ්‍ය හමුවක් කැඳවා සාමාන්‍ය ජනතාවගෙන් මහජන සහය ඉල්ලා සිටියේ වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට හේතු විය හැකි ඕනෑම තොරතුරක් ලබා දෙන ලෙසටය. මෙම මාධ්‍ය හමුව 2025-03-06 දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග විසින් පවත්වන ලදී.එම මාධ්‍ය හමුවේදී ශ්‍රී ලංකා පොලිසිය විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා අත්අඩංගුවට ගැනීමට ගෙන ඇති පියවර පිළිබඳව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග මහජනතාවට දැනුම් දී තිබේ. 2025-02-27 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් පසුව වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටි බවට සියලු මාධ්‍යවල පුළුල් ලෙස ප්‍රචාරය වූ අතර, එමඟින් ඔහු හා සම්බන්ධ වූ මාධ්‍ය ආයතනවල පුද්ගලයින් ශ්‍රී ලංකා පොලිසියේ පියවර සහ ස්ථාවරය පිළිබඳ වැඩිදුර තොරතුරු රැස් කල බව ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ .'ශ්‍රී ලංකා පොලිසිය තම පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමට සොයන ලෝකයේ එකම පොලිසියයි' වැනි ප්‍රකාශ ප්‍රකාශ කරමින් පොදු මහජනතාව සහ මාධ්‍ය නිලධාරීන් සමාජ මාධ්‍යවල පවා අහිතකර ප්‍රකාශ නිකුත් කිරීමට කටයුතු කළ බවට මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ සඳහන් වේ.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග විසින් 2025-05-31 දින අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය **<u>P-81</u>** ලෙස සලකුණු කර මෙම කමිටුවට ඉදිරිපත් කර ඇත.

2025-03-06 දින පටිගත කරන ලද මාධ්‍ය සාකච්ඡාව අනුවාදනය කිරීමට ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග සූදානම්ව සිටියද, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා එම පියවරට විරුද්ධ විය සාකච්ඡාව සම්බන්ධයෙන් විමර්ශන කමිටුව ඉදිරියේ එම විරෝධතාවය හමුවේ සහ එම මාධ්‍ය . ෂ්ඨභෞතිකව පෙනී සිටිමින් ජ්‍යෙ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග විසින්ම සාක්ෂි ලබා දී ඇති බැවින්, යෝජිත මාධ්‍ය සාකච්ඡාවේ පටිගත කිරීම කමිටුව ඉදිරියේ නැවත අනුවාදනය කිරීමට ඉඩ නොදීමට විමර්ශන කමිටුව තීරණය කළේය.

සමාජ මාධ්‍යවල පළ වූ විවිධ සටහන් සහ ඔහුගේ නිල තත්ත්වය තුළ ඔහු දන්නා රටේ ප්‍රකාශයට පත් කරන ලද අනෙකුත් ප්‍රවෘත්ති කියවා බැලූ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග, මෙම කමිටුව ඉදිරියේ ඔහුගේ සාක්ෂියේදී පැහැදිලිව සඳහන් කර ඇත්තේ, අත්අඩංගුවට ගැනීමෙන් බේරීම සඳහා පොලිසියෙන් සැඟවී සිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ හැසිරීම නිසැකවම මහජනතාවගේ මනසෙහි ශ්‍රී ලංකා පොලිසියට අපකීර්තියක් ගෙන දුන් බවයි. අත්අඩංගුවට ගැනීමෙන් බේරීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටීමේ මෙම ක්‍රියාවන් පොලිස්පති කාර්යාලයට ද අපකීර්තියක් ඇති කර ඇති බවට ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ .ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ .ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග තවදුරටත් තම සාක්ෂියේදී සඳහන් කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටීමේ ක්‍රියාව හරහා ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි මහජනතාව තබා තිබූ විශ්වාසය ද හානි වී බිඳී ගිය බවයි.

2025-03-06 දින පැවති මාධ්‍ය හමුව හරහා මහජන සහාය ඉල්ලා සිටීමට ගත් තීරණය වැඩබලන පොලිස්පතිවරයාගේ එකඟතාවය ඇතිව ගත් බව ද ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග ප්‍රකාශ කර තිබේ.

වැඩබලන පොලිස්පති ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ප්‍රියන්ත වීරසූරියද සිය සාක්ෂි මගින් මෙම ස්ථාවරය සනාථ කර තහවුරු කළේය.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග සාක්ෂි ලබා දීමේදී එදිනම එනම් 2025-06-01 දින නිකුත් කරන ලද ලිඛිත මාධ්‍ය ප්‍රකාශයක් ද ඉදිරිපත් කර ඇත මෙය .P-82 ලෙස සලකුණු කර තිබුණිෂ්ඨ පොලිස් ජ්‍යෙ . අධිකාරී බුද්ධික මනතුංගට අනුව, ලිඛිත මාධ්‍ය ප්‍රකාශයේ අන්තර්ගතය ද විද්‍යුත් වශයෙන් සම්ප්‍රේෂණය කරන ලද මාධ්‍ය සාකච්ඡාවේ අන්තර්ගතයට සමාන වේ.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසුව ද, එම හරස් ප්‍රශ්න විමසීම මෙම සාක්ෂිකරුට ඔහුගේ ප්‍රධාන සාක්ෂියේදී ඔහු සඳහන් කළ දේ නැවත පැවසීමට දෙවන අවස්ථාවක් පමණක් විය ශ්න කිරීමෙන් මෙම කමිටුවටහරස් ප්‍ර .වගඋත්තරකාර පොලිස්පතිවරයාට පක්ෂව සලකා බැලිය හැකි කිසිවක් මතු වී නොමැත. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග හෙළිදරව් කර සිටියේ, 2025-03-06 දින පැවති මාධ්‍ය හමුවේදී ඔහු මහජනතාවට අනතුරු ඇඟවීමක් පවා සිදු කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයාට සැඟවීමට හෝ සැඟවීමට යමෙකු සහාය දෙන්නේ නම්, දණ්ඩ නීති සංග්‍රහයේ 209 වගන්තිය යටතේ පොලිසියට ක්‍රියා කිරීමට සිදුවන බවයි.

හරස් ප්‍රශ්න ඇසීමේදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග ප්‍රකාශ කර ඇත්තේ ෆේස්බුක් වැනි සමාජ මාධ්‍ය තුළ ශ්‍රී ලංකා පොලිසියට එරෙහිව යම් අදහසක් පළ වූ සෑම අවස්ථාවකම, එම සමාජ මාධ්‍ය සංසදයේ පළ කරන ලද අදහසක් මගින් ශ්‍රී ලංකා පොලිසියේ ස්ථාවරය පෙන්වීමට තමන් පියවර ගත් බවයිමෙම . යනය කිරීමෙන්සියලු තොරතුරු අධ්‍ය, වගඋත්තරකාර පොලිස්පතිවරයා අත්අඩංගුවට ගැනීමෙන් බේරීමට සැඟවී සිටීම නිසා ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත්ව ඇති බවට ඔහුගේ සාක්ෂියේ සඳහන් වේ . වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් කරන ලද පහත යෝජනාව සහ මෙම සාක්ෂිකරු විසින් සපයන ලද පිළිතුරු නැවත ඉදිරිපත් කිරීම වැදගත් වේ.

ප්‍ර: මම ඔබතුමාට යෝජනා කරනවා, ඔබතුමා බොහොම පෞද්ගලික වෛරයකින්, තරහකින් යුක්තව දේශබන්ධු තෙන්නකෝන්ට විරුද්ධව comment කරපු, ලියපු කෙනෙක් කියලා. පිළිගන්නවා නම් පිළිගන්න?

උ: ස්වාමීනි, කිසිසේත්ම නැහැ. මොකද, මගේ වෘත්තීය ජීවිතයේ එතුමා මට සෑහෙන උපකාර කරපු කෙනෙක්. එතුමා සම්බන්ධයෙන් මගේ හිත ඇතුළේ කිසිම තරහක් නැහැ. මොකද, ඒ කාලයේ තිබුණු conference වලදී පවා මම හොඳින් වැඩ කරනවා කියා එතුමා මාව අගය කළා. මගේ වෘත්තියේ ඉන්න ජ්‍යෙෂ්ඨම නිලධාරියා එහෙම කරන කොට ඒක මගේ හදවතට දැනුණා. අද දක්වාම මට එතුමා සම්බන්ධයෙන් කිසිසේත් පුද්ගලික වෛරයක් නැහැ. මට සමාවෙන්න. ඇත්තටම මට මේ වෙලාවේ මුහුණ දිගන්නත් බැරි මට්ටමක මම හිටියේ. මට පුද්ගලික වෛරයක් නැහැ. නමුත්, මම වෙච්ච දේ ගැන සත්‍ය කියනවා නම්, මම දැන් ඉන්න තනතුර පොලිස් මාධ්‍ය ප්‍රකාශක නම් ස්වාමීනි, මම ඒ ක්‍රියාවලිය කළ යුතුයි. නමුත්, පුද්ගලික වශයෙන් ගත්තොත් සහ වෘත්තීය වශයෙනුත් ඒ කාලයේ එතුමා මට උපකාර කළා. මට කිසිම පළිගැනීමේ අවශ්‍යතාවක් නැහැ.

ප්‍ර: අද දවසේ පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා හැටියට නොවෙයි ඔබතුමා මේ කමිටුව ඉස්සරහා පෙනී සිටින්නේ?

උ: ස්වාමීනි, මම මේ අද සාක්ෂි ලබා දීම සිද්ධ කරන්නේ මාධ්‍ය ප්‍රකාශකවරයා වශයෙන් මම ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන්.

ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් වූ බවට නිගමනය කිරීමට පෙර සමීක්ෂණයක් පැවැත්වූයේ දැයි වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග මහතාගෙන් විමසූ විට, ඔහු ලබා දී ඇති පිළිතුර මෙයයි.

ප්‍ර: මහත්තයා ඔබතුමාගේ අතේ මහජන සමීක්ෂණයක් කරලා තිබෙනවාද, - you are a lawyer. ඒ නිසා අහන්නේ - මහජන සමීක්ෂණයක් කරලා මහජන මත විමසුමක් ඔබතුමාගේ අතේ තිබුණාද ඒ ප්‍රකාශය කරන වෙලාවේ? මම අහන්නේ, I am talking about a document. එහෙම එකක් අතේ තිබිලාද ඒ ප්‍රකාශය කළේ කියලා මම අහන්නේ ?

උ: කිසිසේත්ම මත විමසුමක් කරලා අපකීර්තියක් කියන එක මැනීමට ප්‍රායෝගිකව හැකියාවක් නැහැ. නමුත් අපට කෙනෙක් කථා කරන විදියට සහ යම්කිසි කෙනෙක්, එක සිදුවීමක් ගැන පුද්ගලයෝ 1,000 ක් comment කරන කොට 900 ක් කියනවා නම් " මේ බලන්න. මේක ඔය ගොල්ලන්ට ලජ්ජාවක්, ඇයි ඔය ගොල්ල මේක කරනනේ " කියලා ක්‍රියන කොට ඒක 100 දෙනයි නම් කියන්නේ, " නැහැ ඒක හරි කියලා " -100 දෙනෙකුත් හිටිය නැති තරම් - " ඔය ගොල්ල බලන්න, ඔය ගොල්ලන්ට ඔයගොල්ලන්ගේ පොලිස්පතිතුමා සොයා ගන්න බැහැ. ලෝකයේ ඉන්න එකම පොලීසිය තමයි පොලිස්පතිව සොයන" කියලා කියන කොට ඒ හරහා සාමාන්‍ය බුද්ධියක් තිබෙන පුද්ගලයෙක් වශයෙන් මට හැඟෙනවා මේක අපට අපකීර්තියක් කියලා. සමාජයෙන් ආයෙත් මත විමසුමක් call කරලා, ඡන්ද වීමසුමක් කරලා බලන්න දෙයක් නැහැ; ඒක සාමාන්‍ය දැනීම.

අවසාන වශයෙන්, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා මෙම සාක්ෂිකරුට පහත පරිදි යෝජනා කර ඇත:

ප්‍ර: මම කියනවා ඔබතුමා ඔය comments තිබෙනවා, මෙහෙම ආකල්පයක් තිබුණා කියලා තනිකරම කියන්නේ තමුන්ගේ පෞද්ගලික මතයක් කියලා, පොලීසියේ මතය ඕක නොවෙයි කියලා මම කියනවා? පිළිගන්නවා නම් පිළිගන්න, නැත්නම් නැහැ කියන්න.

උ: කිසිසේත්ම පිළිගන්නේ නැහැ. මොකද, මට මගේ පෞද්ගලික මතයක් ඉදිරිපත් කරන්න හැකියාවකුත් නැහැ. මම අර කිව්වා වාගේ මගේ ඔළුවට ඇත්තටම මුළු පොලීසියේම - මම කිව්වා වාගේ - විද්‍යුත්, social media හරහා තමයි යන්නේ. මට එතකොට මේක ඉතා හොඳින් තේරෙනවා. මාධ්‍යවේදීන් සියලු දෙනාත් කථා කරන්නේ මට. එතකොට ඔවුන්ගේ අදහස් සියල්ල ප්‍රකාශ කරන්නේ මට. එතකොට මට තමයි මේක හොඳටම feel වෙන කෙනා.

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරනවා, දේශබන්දු තෙන්නකෝන් මහතාට විරුද්ධව කරපු campaign වල සාක්ෂිකරුත් කොටස්කාරයෙක් කියලා? තමුන් ඒ සම්බන්ධයෙන් විවේචන කරපු නිලධාරියෙක් කියලාත් මම යෝජනා කරනවා?

උ: ස්වාමීනි. මම කලින් මේ සම්බන්ධයෙන් උත්තර දුන්නා. එතුමා සම්බන්ධයෙන් මගේ තිබෙන බැඳීම ගැනත් මම කිව්වා. මම ඒ සියල්ල ගැන කිව්වා. මම පොලිසියේ මාධ්‍ය ප්‍රකාශක හැටියට හිටපු කාලයේදී ඒවායින් තොරව තමයි මම කටයුතු කළ යුත්තේ. නමුත්, එතුමා සම්බන්ධයෙන් පෞද්ගලිකව මගේ තිබෙන කරුණ මම කිව්වා. එම නිසා කිසිසේත්ම මට පෞද්ගලික මට්ටමට යෑමට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. මම මුල් දවස්වල ඕකට comment නොකර හිටියේත් ඒ කරුණ මතත් පදනම් වෙලා. මේකට comment කිරීම කියන එකත් මට මුල් අවස්ථාවේදී comment කිරීමට යෑම කියන එකත් ඒක ලොකුවට ආයෙ ආයෙත් රට තුළ - මොකද, මම ප්‍රකාශයක් නිකුත් කළ ගමන් ඒක පොලීසියේ නිල ප්‍රකාශයක් බවට පත් වෙනවා. ඒ අනුව මේක අනවශ්‍ය ගැටුමකට යයි. තව තව අපට ගැටුමක් ඇති වෙයි කියන එක ගැනත් මට හිතුණා. වෙන එකක් තියා මුල් අවස්ථාවේදී මහජනතාවගේ සහාය පැතිය යුතුයි කියන තීරණය එන වෙලාවේදීත් මම නැවත වතාවක් වැඩබලන පොලිස්පතිතුමා එක්කත් කිව්වා, " සර් දැන් අපි අපේ පොලිස්පතිතුමා අත්අඩංගුවට ගන්න මහජනතාවගේ සහාය පතනවා " කියන එකත් ඒකත් තව කෙනෙක් තව පැත්තකින් හිතන්න පුළුවන් මේකත් අප කීර්තියක් නේද කියලා. ඒ මට්ටමට පොලිසිය පත් වුණා ද කියලා හිතන්න පුළුවන්. මම ඒ විධියට පැති ගණනාවක් ගැන හිතුවා. ඒ වෙලාවේ ජනතාවත් බලාගෙන ඉන්නවා මුකුත් කරන්නේ නැද්ද කියලා. ඒ නිසා තමයි අපි කිව්වේ, මහජනතාවත් දන්නවා නම් මේ ගැන අපට දැනුම් දෙන්න කියලා. කාටවත් මොහුව හංගාගෙන ඉන්නත් බැහැ. ඒ විධියට හංගා ගෙන හිටියොත් අපි 209 වන වගන්තිය යටතේ කටයුතු කරනවා කියලාත් කිව්වා. මේ සියලු කටයුතු කළේ මම කිව්වා වාගේ පෞද්ගලික මට්ටමින් මට කිසිම අවශ්‍යතාවක් තිබුණේ නැහැ. නමුත්, මම වෘත්තීය වශයෙන් එය කළ යුතුයි. මොකද, මම නියෝජනය කරන්නේ පොලීසිය නම්, මහජනතාව සහ පොලිසිය අතර පාලම මම නම්, මම ඒක කළ යුතුයි

ප්‍ර: මම සාක්ෂිකරුට යෝජනා කරනවා, වැඩබලන පොලිස්පතිතුමාගේ වත් අවසර නැතිව social media සහ පෞද්ගලික campaign වල ඉඳගෙන පොලිසිය තමුන්ට දිලා නැති බලයක් පාවිච්චි කරලා comments සහ මත ප්‍රකාශ කිරීම දිගින් දිගටම කරපු නිලධාරියෙක් තමුන් කියලා?

උ: මම පිළිගන්නේ නැහැ. ස්වාමිනි.

මෙම සාක්ෂිකරු සමඟ, උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා චෝදනා අංක 1-16 හැර අනෙකුත් චෝදනා සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂිකරුවන් කැඳවීම අවසන් කළේයපෙර සඳහන් කළ පරිදි ., වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා, ඔහුගේ නම් පහළොවක් අඩංගු සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව විමර්ශන කමිටුවට ඉදිරිපත් කර තිබුණිකෙසේ වෙතත් ., වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් සාක්ෂි දීමට සාක්ෂිකරුවන් හත් දෙනෙකු පමණක් කැඳවන ලදීමෙයට . වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි ද ඇතුළත් වියකෙසේ වෙතත් ., 17, 18 සහ 19 චෝදනා සම්බන්ධයෙන් ඔහු ගත් ස්ථාවරය පැහැදිලි කිරීමට අදාළ වන්නේ වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ සාක්ෂි පමණිඑබැවින් ., කමිටුව දැන් චෝදනා අංක 17, 18 සහ 19 සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය පරීක්ෂා කරනු ඇත.

**8. වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් චෝදනා අංක 17, 18 සහ 19 සම්බන්ධයෙන් දරන ස්ථාවරය:**

ඔහුගේ සාක්ෂි අතරතුර, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ස්ථාවරය වන්නේ, මාතර ප්‍රදේශයේ අධිකරණවල සේවය කරන තමන් හඳුනන පුද්ගලයෙකු විසින් 2025-02-27 දින සවස මාතර මහේස්ත්‍රාත් අධිකරණය විසින් ඔහුට එරෙහිව 2025-02-27 දින ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් ඇති බව ඔහුට දන්වන ලද බවයි. ඊළඟ පියවර වන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමා අත්අඩංගුවට ගැනීම බව තමා දන්නා බව වගඋත්තරකාර පොලිස්පතිවරයා ද මෙම කමිටුව ඉදිරියේ පැහැදිලිව ප්‍රකාශ කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-02-27 දින රාත්‍රියේම තම නීතිඥයින් හමුවී තමා අත්අඩංගුවට ගැනීම වැළැක්වීම සඳහා අභියාචනාධිකරණයෙන් නියෝගයක් ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණයේ රිට් අයදුම්පතක් ගොනු කිරීමට හැකි වන පරිදි පෙරකලාසියකට අත්සන් කර තිබුණි. 2025-03-03 දින සවස 4.00 ට පමණ මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද 2025-02-27 දිනැති නියෝගයේ සහතික කළ පිටපතක් තමාට ලැබුණු බව ඔහුගේ ස්ථාවරය විය. 2025-03-04 දින උදෑසන ඔහු එය ඔහුගේ නීතිඥයින්ට ලබා දී තිබුණි. ඔහු වෙනුවෙන් රිට් අයදුම්පතක් සාර්ථකව ඉදිරිපත් කළ හැකි බව නීතිඥවරු ඔහුට පවසා තිබුණි. ඔහුගේ සාක්ෂි අනුව, රිට් අයදුම්පත 2025-03-07 දින ගොනු කරන ලද අතර, ඊට අදාල කරුණු ඉදිරිපත් කිරීම 2025-03-10 දින අභියාචනාධිකරණය ඉදිරියේ සිදුවූ අතර 2025-03-12 දිනට කල් තබන ලදී. 2025-03-12 දින අභියාචනාධිකරණය සිය නියෝගය 2025-03-17 දිනට වෙන් කර ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාට දැනගන්නට ලැබී ඇත්තේ ඔහු වෙනුවෙන් ගොනු කරන ලද රිට් අයදුම්පත 2025-03-17 දිනැති නියෝගයෙන් අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කරන ලද බවයි. ඔහු තම නීතිඥවරුන් අමතා 2025-03-19 දින මාතර ගරු මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ පෙනී සිටීමට කටයුතු සූදානම් කර ඇත. එම පදනම මත, වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-02-27 දින මාතර උගත් මහේස්ත්‍රාත්වරයා විසින් ලබාදුන් නියෝගය වැරදි බවට වන පදනම මත නීතියෙන් ඔහුට ලබා දී ඇති අයිතියක් ක්‍රියාත්මක කළ ඔහුගේ ස්ථාවරය විය.

2025-02-28 සිට 2025-03-19 දක්වා කාලය තුළ හෝකන්දර පිහිටි තම නිවසින් බැහැරව සිටීම සම්බන්ධයෙන් උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින්, වගඋත්තරකාර පොලිස්පතිවරයා පහත සඳහන් දේ පැවසීය:

ප්‍ර: සාක්ෂිකරු, මේ මරණ පරීක්ෂණ නියෝගය ආවට පස්සේ ඔබතුමා හෝකන්දර නිවසින් පිටව ගියා?

උ: ඔව්, 28 වැනිදා.

ප්‍ර: 28 වැනිදා උදැසන ගියානේ?

උ: ඔව්, උදේ දහයහමාරට, එකොළහට විතර ගියා.

ප්‍ර: ඔබ ගිහිල්ලා කොස්වත්ත හන්දියෙන් බැහැලා මිත්‍රයෙකුගේ වාහනයක ගියා?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර: ඔබතුමා මුලින් ඒ ස්ථාවරය ගත්තේ නැහැනේ? ඒ කාරණය මුල් ප්‍රකාශයේ කළේ නැහැනේ?

උ: කවදාද, මම CID එකට ප්‍රකාශයක් දීලා තිබෙන්නේ. 24 වැනිදා වගේ දවසක නේද?

ප්‍ර: ඔබතුමා ප්‍රකාශ දෙකක් දුන්නා. ඔබ මුල් ප්‍රකාශයේ කිව්වේ, වාහනයෙන් ඇවිල්ලා කොස්වත්තෙන් බැහැලා ත්‍රිරෝද රථයකින් ගියා කියලා?

උ: ඔව්.

ප්‍ර: ඊට පස්සේ අපි ලාෆ් ආයතනයේ CCTV කැමරා පද්ධතියෙන් බැලුවාම සුරංග මහත්මයාගේ වාහනයෙන් ගිය බව දැන ගත්තා. ඔබ ඒක පිළිගත්තානේ?

උ: ඔව්. මම කිව්ව කාරණය සනාථ වෙලා තිබෙනවා. මම මගේ නිල රථයෙන් ඇවිල්ලා කොස්වත්ත හන්දියෙන් බැස්සා කියන කථාව මම බොරුවක් කියලා නැහැ. මම ඒ කථාව පිළි අරගෙන තිබෙනවා.

ප්‍ර: ඔබගේ රියැදුරා මේ කමිටුවට සාක්ෂි දුන්නානේ. නේද?

උ: ඔව්, ස්වාමීනි.

<u>පරීක්ෂණ කමිටුවෙන් :-</u>

ප්‍ර: රියැදුරාගේ සාක්ෂිය පිළිබඳව මහත්මයාට ප්‍රශ්නයක් තිබෙනවාද?

උ: මට ගැටලුවක් නැහැ, ස්වාමීනි.

ප්‍ර: ඒ පුද්ගලයා කිව්වේ ඒ පුද්ගලයා දන්න දේවල්?

උ: ඔව්, ස්වාමීනි.

ප්‍ර. ඒ පුද්ගලයා කිව්ව දේවල් සත්‍ය යයි නේද?

උ: ඔව්, ඒ පුද්ගලයා කිව්ව දේවල් සත්‍යයි. ඒ වාගේම මගෙත් එක්ක සමීපව ගමන් කරපු මගේ ආරක්ෂක නිලධාරියෙක් වශයෙන් සිටි කොස්තාපල්වරයෙක් වන උදාර කියන පුද්ගලයාගේ ප්‍රකාශයත් සත්‍යයයි. ඒ ප්‍රකාශ දෙකේ මට හබ කරන්න දෙයක් නැහැ, ස්වාමීනි.

මේ අනුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා තම රියදුරු, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් විසින් සපයන ලද සාක්ෂි සහ ඔහුගේ පුද්ගලික ආරක්ෂක නිලධාරී, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර විසින් සපයන ලද සාක්ෂි පරස්පර කිරීමට උත්සාහ කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කරයි.

ඔහු ගිරිඋල්ල ප්‍රදේශයේ පිහිටි ඔහුගේ පාරම්පරික නිවසේ සැඟවී සිටියාදැයි විමසූ විට, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ප්‍රතිචාරය මෙසේ විය:

ප්‍ර: ඔව්, සහතික පිටපත. සහතික පිටපත ගන්න කල් ගියා. ඒක ලැබුණේ 3 වැනි දා. 7 වැනි දා දිවුරුම් ප්‍රකාශය අත්සන් කරලා දැම්මා කියලා කිව්වා නේ.

උ: ඔව්.

ප්‍ර: එතකල් ඔබතුමා හිටියේ ඔබතුමාගේ ගිරි උල්ල නිවසේ?

උ: එහෙමයි.

ප්‍ර: ඔබ හැංගිලා හිටියේ?

උ: මගේ නිවසේ හැංගිලා ඉන්න අවශ්‍යතාවක් නැහැ.

ප්‍ර: ප්‍රසිද්ධියේ හිටියාද?

උ: ප්‍රසිද්ධියේ කියන්නේ මම නිවසේ ජීවත් වුණා. හැංගිලා හිටියා කියලා කිව්වාම මම ඒ ගෙදර කොහේ හරි මුල්ලකට වෙලා හැංගිලා දොර වහගෙන හිටියා නොවෙයි. මගේ නිවසේ කාලය ගත කරන කොට මම ඉන්න විධියක් තිබෙනවා. ඒ විධියට මම ඒ නිවසේ සිටියා.

ප්‍ර: ඒ හිටියේ කොහොමද?

උ: මම ගෙදර සාමාන්‍යයෙන් ඉන්න ආකාරයට. මම එදා ඉඳලා නිදා ගන්න කාමරයේ ඇඳේ නිදාගෙන, එදා ඉඳන් කෑම කාපු කෑම කාමරයේ කෑම කාලා හිටියා. ඒ ගෙදර මම හිටපු විධියක් තිබුණා. දොර වහගෙන ඇතුළට වෙලා රෙද්දක් පොරවා ගෙන හැංගිලා වාගේ අදහසක් එනවා හංගිලා ඉන්නවා කියන එකෙන්. එහෙම නැහැ. මම සාමාන්‍ය ස්වරූපයෙන් ඒ ගෙදර ජීවත් වුණා.

ප්‍ර: ඔබතුමා ඒ නිවසට ගියේ, කොළඹ ආවේ ත්‍රිරෝද රථ වලින් කියලා කිව්වාද?

උ: ඔව්.

ප්‍ර: ඔබතුමා එන ගමන් ත්‍රිරෝද රථ රියදුරන්ට වැඩිපුර මුදල් දීලා, ඔවුන්ගේ ජංගම දුරකථන වලින් තමුන්ට අවශ්‍ය නීති උපදෙස් ගන්න නීතිඥ මහත්වරුන්ට WhatsApp calls ගත්තා කියලා කිව්වාද?

උ: ප්‍රකාශ කළා.

ප්‍ර: ඔබතුමා මාතර මහෙස්ත්‍රාත් අධිකරණයට භාර වෙන්නේත් ත්‍රිරෝද රථයකින් කළුතර හරහා කියලා සඳහන් කළාද?

උ: ප්‍රකාශ කළා.

මෙම නඩුවේ සියලු තත්වයන් සහ ඉදිරිපත් කරන ලද සාක්ෂි සැලකිල්ලට ගත් විට, වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-02-28 දින වන විට නිතිපතා පදිංචිව සිටි කොළඹ පිහිටි ඔහුගේ සුපුරුදු නිවාසවලින් ඈත්ව සිටීමට හේතුව සම්බන්ධයෙන් කිසිදු පිළිගත හැකි හේතුවක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව පෙනේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා තම බිරිඳ සහ දරුවා සමඟ ඔහුගේ හෝකන්දර නිවසේ ජීවත් වූ බව පිළිගෙන ඇත. ගිරිඋල්ල පාරම්පරික නිවස විදුලිය පවා නොමැති පාළු නිවසක් බව ද ඔහු පිළිගෙන ඇත. ඔහුගේ වයෝවෘද්ධ මව තම සහෝදරිය සමඟ ජීවත් වෙමින් සිටි බවද ඔහු පවසා ඇත. විදුලිබල මණ්ඩලය දිගු කලක් එම නිවසට විදුලිය විසන්ධි කර තිබූ බැවින්, ඉටිපන්දම් ආධාරයෙන් රාත්‍රියේ ඔහු තම ගිරිඋල්ල පාරම්පරික නිවසේ ජීවත් වූ බව වගඋත්තරකාර පොලිස්පතිවරයා පිළිගෙන ඇත.

ඔහු තම මිතුරා වන සුරංගගේ ජීප් රථයෙන් ඉතා කෙටි දුරක් ගමන් කළ බවත්, පසුව කිසිදු ආරක්ෂාවක් හෝ වෙනත් පුද්ගලයෙකු නොමැතිව ත්‍රිරෝද රථයකින් ගිරිඋල්ලෙහි පිහිටි ඔහුගේ පාරම්පරික නිවසට තනිවම ගමන් කළ බවත් වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් පිළිගෙන ඇත. අදාළ මුළු කාලයම ඔහු තම ගිරිඋල්ල පාරම්පරික නිවසේ ගත කළ බව ඔහුගේ ස්ථාවරයයි. පෙරකලාසියකට අත්සන් කිරීම වැනි වැඩ සඳහා ඔහු අවස්ථා කිහිපයකදී තනිවම ත්‍රිරෝද රථවලින් කොළඹට ගිය බවත් ඔහු ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ප්‍රකාශ කර ඇත්තේ මෙම කාලය තුළ තමා කිසිදු දුරකථනයක් භාවිතා නොකළ බවත්, ගිරිඋල්ල ප්‍රදේශයේ පිහිටි ඔහුගේ පාරම්පරික නිවස දූවිලි වලින් පිරී තිබූ බවත්; පළිබෝධකයන්ගෙන් හානි වූ බැවින් පදිංචියට සුදුසු නොවන බවත්ය. වගඋත්තරකාර පොලිස්පතිවරයා තම සාක්ෂියේදී රියදුරු ප්‍රසාද් විසින් පදවන ලද ජීප් රථයේ තම පුද්ගලික පිස්තෝලය දමා ගිය බව පිළිගෙන ඇත.

මෙම කාල සීමාව තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තමා අත්අඩංගුවට ගැනීමට නියමිත බව වගඋත්තරකාර පොලිස්පතිවරයා දැන සිටි බව පහත උපුටා ගැනීමෙන් පෙනී යනු ඇත. මෙම උපුටා ගැනීම පහත පරිදි වේ:

ප්‍ර: 2025 මාර්තු 3 වැනිදා?

උ: ඔව්.

ප්‍ර: එතකොට ඊට පස්සේත්, 2025 මාර්තු 3 වැනිදායින් පස්සෙත් මහත්මයා දැනගෙන හිටියා. නියෝගයක් තිබෙනවා මහෙස්ත්‍රාත්තුමාගේ, ඒක නිසා පොලීසියෙන් කොයි වෙලාවක හරි අත්අඩංගුවට ගන්නවාය කියලා ඒක හරිද?

උ: නියෝගය කිව්වාට පස්සේ මහෙස්ත්‍රාත්වරයා මෙහෙම නියෝගයක් කරලා තිබෙනවායි කියලා මම දැන ගත්තා, ස්වාමීනි.

ප්‍ර: එතකොට මහත්මයා තේරුම් ගත්තාද, ඒ නියෝගය අනුව පොලීසියෙන්, නැත්නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වෙන් ක්‍රියා කරනවාය කියලා?

උ: ක්‍රියා කරන්න පුළුවන් කියලා මම දැන ගත්තා.

ප්‍ර: එතකොට ඉස්සර වෙලාම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වේ කට්ටිය එයි කියලා බලාපොරොත්තු වෙන්න පුළුවන්, ඔය හෝකන්දර නිවසට. හරිද?

උ: ඔව්.

ප්‍ර: මොකද, එතැන තමයි මහත්මයා හිටියේ?

උ: ඔව්.

ප්‍ර: එතැන මහත්මයා හිටියා නම්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු වෙන් ඇවිල්ලා අත් අඩංගුවට ගන්නවා. ඒක හරි නේ?

උ: වෙන්න පුළුවන්.

## 9. චෝදනා පත්‍රයේ චෝදනා අංක 17, 18 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන:

වගඋත්තරකාර පොලිස්පතිවරයා සොයා ගැනීමට සහ අත්අඩංගුවට ගැනීමට උත්සාහ කළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ සාක්ෂි පිළිගැනීමට තීරණය කර ඇත්තේ මන්දැයි විමර්ශන

කමිටුව දැනටමත් දක්වා ඇත. මෙය සිදු වූයේ රටේ පොලිස්පතිවරයා සොයා ගැනීමට මහජන සහාය ඉල්ලා ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග 2025-03-06 දින මාධ්‍ය හමුවක් පවත්වමින් සිටින අතරතුරදීය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා, ඔහුගේම සාක්ෂිවලට අනුව, ගිරිඋල්ල ප්‍රදේශයේ ඔහුගේ අතහැර දැමූ පාරම්පරික නිවසේ දුෂ්කර තත්වයන් යටතේ සිටිමින් බොහෝ කරදර සහ දුෂ්කරතාවන්ට මුහුණ දී ඇත. මේ ඔහු හෝකන්දර පිහිටි ඔහුගේ නිවසේ හෝ කොළඹ පොලිස්පතිවරයාට පවරා ඇති නිල බංගලාවේ නිතර පදිංචිව සිටියා යන සාධකය නොසලකාහරිමින්ය.

ඔහුගේම රියදුරු, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් සහ ඔහුගේ පුද්ගලික ආරක්ෂක නිලධාරී, පොලිස් කොස්තාපල් මහේෂ් උදාර ඔවුන්ගේ සාක්ෂිවල විස්තර කර ඇත්තේ, ඉදිරියේදී සිදුවීමට නියමිත අත්අඩංගුවට ගැනීම වළක්වා ගැනීම සඳහා වගඋත්තරකාර පොලිස්පතිවරයා තම විචක්ෂණශීලී පියවර ගෙන අනාවරණය නොවී පලා ගිය ආකාරයයි. ඔහු එසේ කරනා විටත්, මාතර ගරු මහේස්ත්‍රාත්වරයා 2025-02-27 දිනැති ඔහුගේ නියෝගයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට තමා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරන ලෙස නියෝග කර ඇති බව වගඋත්තරකාර පොලිස්පතිවරයා හොඳින් දැන සිටියේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පොලිස්පතිවරයාගේ ඍජු අධීක්ෂණය යටතේ පවතී. එපමණක් නොව, මුළු ශ්‍රී ලංකා පොලිසියම පොලිස්පතිවරයාගේ මග පෙන්වීම සහ අධීක්ෂණය යටතේ පවතී. වගඋත්තරකරු මේ රටේ පොලිස්පතිවරයා ය. මේ අනුව,අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමාව අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීම සඳහා සැඟවී සිටීම, මේ රටේ පොලිස්පති ධුරය දරන තැනැත්තා සිදු කරාවි යැයි කිසිවෙකු අපේක්ෂා නොකරන ක්‍රියාවක් වේ.

ශ්‍රී ලංකා පොලිසිය තම කටයුතු කරගෙන යන ආකාරය පිළිබඳව මහජනතාව නිසැකවම විශාල විශ්වාසයක් තබා ඇත. නීතිගරුක පුරවැසියන් ලෙස පොලිස් නිලධාරීන් ආදර්ශයක් තැබිය යුතු බවට සැකයක් නැත. එවිට පමණක් ඔවුන්ට අනෙකුත් පුරවැසියන්ට නීතියට අවනත වීමට බල කළ හැකිය.

මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව හමුවේ වගඋත්තරකාර පොලිස්පතිවරයා සමඟ සැකකරුවන් ලෙස පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු නම් කර තිබුණද, ඔවුන්ගෙන් කිසිවෙකු අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටි බවට හෝ සැඟවී සිටි බවට කිසිදු සාක්ෂියක් නොමැත. මේ අනුව, එම පදනම මත මහජනතාව ඔවුන් අපකීර්තියට පත් කළේ නැත.

මාතර මහේස්ත්‍රාත් අධිකරණ නියෝගය නිකුත් කළ දින සිට සැඟවී සිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ක්‍රියාවන් මහජනතාවට වැටහුණු ආකාරය මෙම විමර්ශන කමිටුව ඉදිරියේ ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංගගේ සාක්ෂි මගින් හෙළි විය. මෙම සිදුවීම් සඳහා ලබා දුන් පුළුල් ප්‍රචාරය තුළින් මහජනතාව දැනුවත් විය. පොලිස් මාධ්‍ය අංශයේ ප්‍රධානියා වූ ජ්‍යෝෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග පවසන පරිදි, මේ සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ කටයුතුවලට එරෙහිව මහජනතාවගෙන් එල්ල වන විවේචනවලට මුහුණ දීම ශ්‍රී ලංකා පොලිසියට අපහසු විය.

2025-02-27 දින අංක BR/6314/2023 නඩුවේ මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළුව ඊට අනුශාංගික අනෙකුත් නියෝගවලට අවනත නොවීමෙන්

වගඋත්තරකාර පොලිස්පතිවරයා, පොලිස්පතිවරයා ලෙස සැඟවී සිටීමේ පදනම මත චෝදනා අංක 17 සහ 18 ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි උගත් නීතිඥවරයා විසින් මෙම කමිටුව ඉදිරියේ CA රිට් 168/2025 හි R-6 ලෙස සලකුණු කරන ලද අභියාචනාධිකරණ නියෝගය ඉදිරිපත් කරන ලදී. මෙම නඩුවේ පෙත්සම්කරු වන්නේ වගඋත්තරකාර පොලිස්පතිවරයා ය. එම නඩුවේ නියෝගය අභියාචනාධිකරණය 2025-03-17 දින ප්‍රකාශයට පත් කළේය. එම නියෝගයේ අභියාචනාධිකරණයේ වැඩබලන සභාපතිවරයා පහත පරිදි තීරණය කර ඇත:

> *"අනුකූල වීමේ සහ පැමිණිලි කිරීමේ මූලධර්මය අධිකරණ පද්ධතියේ අඛණ්ඩතාව ආරක්ෂා කරන හොඳින් ස්ථාපිත සහ ගෝලීය වශයෙන් පිළිගත් මූලධර්මයකි. එය පුද්ගලයන්ට අධිකරණ නියෝගයක් අසාධාරණ යැයි විශ්වාස කළත්, පළමුව එයට අනුකූල විය යුතු බවත්, පසුව එයට අභියෝග කිරීමට අවශ්‍ය නම් නිසි නීතිමය මාර්ග හරහා සහනයක් ලබා ගත යුතු බවත් නියම කරයි.*
>
> *මෙම නඩුවේදී, පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස, පෙත්සම්කරු නීතියට අනුගත වීමෙන් ආදර්ශයක් තැබිය යුතු යැයි අපේක්ෂා කෙරේ. මහේස්ත්‍රාත්වරයාගේ නියෝගය වැරදි හෝ අසාධාරණ බව ඔහු විශ්වාස කරන්නේ නම්, නිසි ක්‍රියාමාර්ගය වන්නේ එය මග හැරීම නොව නීතිමය යාන්ත්‍රණයන් හරහා එයට අභියෝග කිරීමයි. අනුකූල වීම ප්‍රතික්ෂේප කිරීමෙන් සහ සැඟවී සිටීම හේතුවෙන්, ඔහු ආරක්ෂා කිරීමට බැඳී සිටින නීති පද්ධතියම අඩපණ කරයි. එවැනි ක්‍රියාමාර්ග අධිකරණය කෙරෙහි මහජන විශ්වාසය දුර්වල කරනවා පමණක් නොව, පුද්ගලයන් තමන්ගේම අවශ්‍යතා මත පදනම්ව අධිකරණ නියෝග තෝරා බේරා අනුගමනය කරන භයානක පූර්වාදර්ශයක් ද සපයයි.*
>
> *පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි උගත් ජනාධිපති නීතිඥවරයා තර්ක කරන්නේ, අත්අඩංගුවට ගැනීමේ නියෝගය නිකුත් කිරීමට පෙර, පෙත්සම්කරුගෙන් කිසිදු ප්‍රකාශයක් සටහන් කර නොගත් බවයි. කෙසේ වෙතත්, පෙත්සම්කරු සක්‍රීයව අත්අඩංගුවට ගැනීම මගහරිමින් සැඟවී සිටින විට, බලධාරීන්ට ඔහුගෙන් එවැනි ප්‍රකාශයක් ලබා ගැනීමට නොහැකි වන බව පැහැදිලිය. ඔහු හිතාමතාම නොපැමිණීම නිසි නීතිමය ක්‍රියාවලියට බාධා කරන අතර, නීත්‍යානුකූල ක්‍රියා පටිපාටි මග හරිමින් සිටියදී අත්අඩංගුවට ගැනීමේ නියෝගයට අභියෝග කිරීමෙන් ඔහුට දැන් මෙම තර්කය ඉදිරිපත් කල නොහැක."*

2025-03-17 දින අභියාචනාධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද නියෝගයට වගඋත්තරකාර පොලිස්පතිවරයා අභියෝග කර නොමැත. මෙම කරුණ 2025-05-28 දින කමිටුව ඉදිරියේ වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ එකඟතාවය ඇතිව පිළිගැනීමක් ලෙස සටහන් කර ඇත. එබැවින්, අභියාචනාධිකරණයේ නිගමනය වලංගුව පවතී.

2025-02-27 දින අංක BR/6314/2023 නඩුවේ මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද නියෝගයට අවනත නොවී වගඋත්තරකාර පොලිස්පතිවරයා සැඟවී සිටීමට පටන් ගත් අතර, ඔහුගේ නිල රියදුරු, පොලිස් කොස්තාපල් රියදුරු ප්‍රසාද් සහ ඔහුගේ පුද්ගලික ආරක්ෂක නිලධාරී, පොලිස් කොස්තාපල් මහේෂ්

උදාර යොදා ගනිමින් ඔහුව ඔහුගේ මිතුරා වන සුරංගගේ ජීප් රථය වෙත ප්‍රවාහනය කළ අතර එමඟින් ඔහු හෙළි නොකළ ස්ථානයකට ගෙන යන ලදී. එම අවස්ථාවේ දී වගඋත්තරකාර පොලිස්පතිවරයාට අනුයුක්ත කර තිබූ ආරක්ෂක කණ්ඩායම පිළිබඳව වැඩබලන පොලිස්පතිවරයා මෙම කමිටුව ඉදිරියේ දැනටමත් විස්තර කර ඇත. හෝකන්දර නිවසින් පිටව යන විට වගඋත්තරකාර පොලිස්පතිවරයා ඔහුගේ පිස්තෝලය රැගෙන ගියේය. පසුව ඔහු එය ජීප් රථයේ අතහැර දැමීය. අවසානයේ ඔහු අතුරුදහන් වූ විට ඔහු තම ආරක්ෂක කණ්ඩායම නොසලකා හැරියේය.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, චෝදනා පත්‍රයේ 17 සහ 18 චෝදනා සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වැරදිකරු බව විමර්ශන කමිටුව තීරණය කරයි.

**10. චෝදනා පත්‍රයේ චෝදනා අංක 19 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන:**

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංගගේ සාක්ෂිවලින් හෙළි වූ පරිදි, ගරු මාතර මහේස්ත්‍රාත්වරයා විසින් 2025-02-27 දින ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් පසු සැඟවී සිටි වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ක්‍රියාමාර්ග, එම නඩුවේ නිසි නීති ක්‍රියාවලිය අවතක්සේරුට ලක් කෙරේ. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රතිරූපයට සහ කීර්ති නාමයට ද කැළලක් ඇති කළ බවට සැකයක් නැත. නීතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය භාර දී ඇති රටේ ප්‍රධාන ආයතනය වන්නේ ශ්‍රී ලංකා පොලිසියයි. වගඋත්තරකාර පොලිස්පතිවරයා වගකිව යුතු ඉහත සඳහන් ක්‍රියාමාර්ග, ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි මහජනතාව තුළ ඇති මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වී ඇති බව විමර්ශන කමිටුවේ අදහසයි. අනෙක් අතට, එමඟින් රටේ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජනතාව තබා ඇති මහජන විශ්වාසය ද බිඳ වැටී ඇත. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ එම ක්‍රියාවන් සඳහා කිසිදු සාධාරණීකරණයක් හෝ නිදහසට කරුණක් විමර්ශන කමිටුවට නොපෙනේ. අභියාචනාධිකරණයේ රිට් අයදුම්පතක් ගොනු කර ඇති නිසා අත්අඩංගුවට ගැනීමෙන් වැළකී සිටීමට ඔහුට අයිතියක් ඇති බවට වගඋත්තරකාර පොලිස්පතිවරයා විසින් ලබා දී ඇති නිදහසට කරුණ කමිටුව ප්‍රතික්ෂේප කරයි.

ඉහත සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා විසින් මෙම කමිටුවට ඉදිරිපත් කර ඇත්තේ CA රිට් 168/2025 හි **R- 6** ලෙස සලකුණු කර ඇති අභියාචනාධිකරණයේ නියෝගයයි. එම නඩුවේ නියෝගයේ අභියාචනාධිකරණය පහත පරිදි ද කටයුතු කර ඇත:

> *‘■ ■ ■. මෙම පසුබිම සමඟ, නඩුව විශ්ලේෂණය කිරීමෙන්, පෙත්සම්කරු සාමාන්‍ය පුරවැසියෙකු නොවන බව අපට පෙනේ. ඔහු පොලිස් බලකායේ ඉහළම තනතුරක් දරන අතර, පොලිස්පති ලෙස සේවය කරන අතර, එම තනතුර තුළින් රට තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමේ යුතුකම ඔහුට පැවරේ. පොලිස් නිලධාරියෙකු ලෙස ඔහුගේ සේවා කාලය තුළ, පෙත්සම්කරු අධිකරණ නියෝග පිළිපදිමින් බොහෝ සැකකරුවන් සහ/හෝ වැරදිකරුවන් අධිකරණයට ඉදිරිපත් කර තිබිය හැකිය. සාමාන්‍ය පුරවැසියෙකු මෙන් නොව, මේ රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ ඉහළ අවබෝධයක් ඔහුට ඇත.*
>
> *නීතිය පිළිබඳ පුළුල් දැනුමක් ඇති සහ විශාල වගකීම් සහිත තනතුරක් දරන පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා බරපතල වරදකට සම්බන්ධ වී අත්අඩංගුවට ගැනීමෙන් සක්‍රීයව*

*වැළකී සිටීම ගැඹුරින් කනස්සල්ලට හා කණගාටුවට කරුණකි. අධිකරණ නියෝගයට සහයෝගය දැක්වීමට ඔහු අපොහොසත් වීම සහ සැඟවී සිටීමට ඔහු දරන උත්සාහයන් යුක්තියේ මූලධර්මවලට හානි කරනවා පමණක් නොව, පොලිස් දෙපාර්තමේන්තුවේ කීර්ති නාමයට ද කැළලක් ඇති කරයි. එවැනි ක්‍රියා පිළිගත නොහැකි අතර නීතිය හා සාමය ආරක්ෂා කිරීම භාර දී ඇති ආයතනය කෙරෙහි මහජන විශ්වාසය හීන කරයි., නීතිය ක්‍රියාත්මක කරන සහ සමාජයට ආදර්ශයක් සැපයීමේ කාර්යය පවරා ඇති පෙත්සම්කරුට, නීතියට ඉහළින් සිටින ලෙස ක්‍රියා කිරීමට අවසර දිය නොහැක."*

*පොලිස් දෙපාර්තමේන්තුව සහ අධිකරණය ජාතිය, කුලය, ආගම, භාෂාව, තනතුර, දේශපාලන විශ්වාසයන් හෝ වෙනත් යටි අරමුණක් මත පදනම් වූ කිසිදු බලපෑමකින් තොරව අපක්ෂපාතීව ක්‍රියා කළ යුතු බව සැලකිල්ලට ගැනීම වැදගත්ය. මෙම ආයතන ඔවුන්ගේ ක්‍රියාවන්හි සාධාරණත්වය සහ සමානාත්මතාවය ආරක්ෂා කිරීමට අපොහොසත් වුවහොත්, එය අනිවාර්යයෙන්ම යුක්තිය පසිඳලීමේ පද්ධතිය සහ සමස්තයක් ලෙස යුක්තිය පසිඳලීම කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වනු ඇත. මේ අනුව, සමාජයේ මෙම මූලික කුළුණු කෙරෙහි විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා අඛණ්ඩතාව සහ අපක්ෂපාතීත්වය පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මගේ මතය අනුව, මෙම ආයතන දෙක බියෙන් හෝ අනුග්‍රහය දැක්වීමකින් තොරව ක්‍රියාත්මක වී රටේ නීතියට දැඩි ලෙස අනුගත වුවහොත්, එය අපරාධ 90% කින් සැලකිය යුතු ලෙස අඩු කරන අතර එමඟින් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය ආරක්ෂා කරනු ඇත.*

*මෙම ආයතන දෙක ඵලදායී ලෙස ක්‍රියාත්මක වීමට අපොහොසත් වුවහොත්, සාමාන්‍ය ජනතාවට ඔවුන් කෙරෙහි ඇති විශ්වාසය අනිවාර්යයෙන්ම නැති වී යනු ඇති බව මම තවදුරටත් නිරීක්ෂණය කරමි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජනතාව තනිවම ආරවුල් විසඳීමට යොමු විය හැකි අතර, එය නීතිය ක්‍රියාත්මක නොවීම, මැර ක්‍රියා ඉහළ යාම සහ නීතිය හා සාමය බිඳ වැටීමට හේතු විය හැක. මෙම පිරිහීම හරහා ජනතාව නීතිය අතට ගැනීමට පෙළඹෙන අතර එමඟින් අවසානයේ නීත්‍යානුකූල හා ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අත්තිවාරමට හානි කරයි."*

කලින් සඳහන් කර ඇති පරිදි, වගඋත්තරකාර පොලිස්පතිවරයා මෙම නියෝගයට අභියෝග කර නොමැති බව පිළිගෙන ඇත. එබැවින්, අභියාචනාධිකරණයේ ඉහත නිගමනය ද වලංගුව පවතී.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, චෝදනා පත්‍රයේ චෝදනා අංක 19 සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වැරදිකරු බව විමර්ශන කමිටුව තීරණය කරයි.

## 11. චෝදනා පත්‍රයේ චෝදනා අංක 20,21 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන:

ආරම්භයේදීම, වගඋත්තරකාර පොලිස්පතිවරයා 2025-05-28 දිනැති ඔහුගේ හේතු දැක්වීමේදී, අභියාචනාධිකරණය විසින් CA/Writ/207/2023 හි කරන ලද නියෝගය මෙම විමර්ශන කමිටුවේ අවධානයට යොමු කර ඇත.

2023-06-26 දින ලබා දුන් අභියාචනාධිකරණ තීන්දුවට අනුව, අභියාචනාධිකරණය පහත කරුණුද ඇතුලත්ව වෙනත් කරුණු ඉදිරිපත් කර ඇත:

> *"ඉහත දක්වා ඇති හේතූන් මත, 2022.05.09 සහ/හෝ 2022.07.09 දින මහේස්ත්‍රාත් අධිකරණයේ අදාළ ක්‍රියාදාමයේදී සිදුවීම් සම්බන්ධයෙන් සැකකරුවෙකු වන පෙත්සම්කරු නම් කිරීම වගඋත්තරකරුවන්ට සහ/හෝ ඔවුන්ගෙන් ඕනෑම අයෙකුට සහ/හෝ වැඩි දෙනෙකුට තහනම් කරමින් තහනම් ආඥාවක් නිකුත් කරනු ලැබේ."*

ඉහත නියෝගය සහ අභියාචනාධිකරණය විසින් පෙර සඳහන් කළ තීන්දුවේ කරන ලද ප්‍රකාශයන් සැලකිල්ලට ගනිමින්, එම චෝදනා සම්බන්ධයෙන් ඉදිරියට යාම නුසුදුසු යැයි විමර්ශන කමිටුව තීරණය කළේය . එබැවින්, චෝදනා අංක 20 සහ 21 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව කිසිදු නිගමනයක් නොකරයි.

## 12. චෝදනා පත්‍රයේ චෝදනා අංක 22,23 සම්බන්ධයෙන් විමර්ශන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිගමන:

මෙම චෝදනා දෙක ඉදිරිපත් කර ඇත්තේ, වගඋත්තරකාර පොලිස්පතිවරයා, අනෙක් චෝදනාවල වඩාත් සම්පූර්ණයෙන් දක්වා ඇති විෂමාචාර ක්‍රියා එකක් හෝ කිහිපයක් සිදු කිරීමෙන් සහ/හෝ දැඩි ලෙස බලය අයුතු ලෙස භාවිතා කිරීමේ ක්‍රියාවන් මගින් ශ්‍රී ලංකා පොලිසිය අපකීර්තියට පත් කර ඇති අතර එමගින් රටේ පොලිස්පතිවරයාට නොගැලපෙන ක්‍රියාවක් සිදු කර ඇති බවට පදනම මත ය.

මෙම වාර්තාවේ දක්වා ඇති හේතු නිසා, විමර්ශන කමිටුව විසින් වගඋත්තරකාර පොලිස්පතිවරයා චෝදනා පත්‍රයේ 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 13, 14, 15, 16, 17, 18 සහ 19 යන චෝදනාවලට වරදකරු කර ඇත. මුළු රටේම නීතිය හා සාමය පවත්වාගෙන යාමේ මූලික කාර්යය භාර දී ඇති ශ්‍රී ලංකා පොලිසියේ ඉහළම තනතුර දරන පුද්ගලයා විසින් එම චෝදනාවල දක්වා ඇති ක්‍රියාවන් සිදු කිරීම ශ්‍රී ලංකා පොලිසියට අපකීර්තියක් ගෙන දෙන ආකාරය පෙන්වීමට අමතර හේතු දැක්වීමට අවශ්‍ය නොවන බව කමිටුවේ අදහසයි. කමිටුව මේ කාරණය මීට පෙරත් පැහැදිලි කර ඇත.

මෙම වාර්තාවේ දක්වා ඇති හේතු නිසා කමිටුව නිගමනය කර ඇත්තේ වගඋත්තරකාර පොලිස්පතිගේ ඉල්ලීම පරිදි ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වාගේ කණ්ඩායම W15 හෝටලයට වෙඩි තැබීමට වැලිගමට ගිය බවයි. රටේ පොලිස්පතිවරයා එවැනි භයානක, නීති විරෝධී ක්‍රියාවන්ට පහසුකම් සපයනු ඇතැයි කිසිවෙකුට සිහිනෙන්වත් සිතිය නොහැකි විය: ශ්‍රී ලංකා පොලිසියට අයත් T56 අවියකින් පෞද්ගලික හෝටලයකට වෙඩි තැබීමේ ක්‍රියාව; ඒ සඳහා ශ්‍රී ලංකා පොලිසියට අයත් වෑන් රථයක් භාවිතා කිරීමේ ක්‍රියාව; එම නීති විරෝධී වෙඩි තැබීමේ ක්‍රියාවෙහි යෙදීමට ඔහු අණදෙන බලය ක්‍රියාත්මක කළ ශ්‍රී ලංකා පොලිසියේ නිලධාරීන් යොදවා ගැනීමේ ක්‍රියාව; අනාරක්ෂිත පුරවැසියෙකුගේ එම පෞද්ගලික හෝටල් දේපළට හානි කර ඔහුව බිය ගැන්වීමේ ක්‍රියාව. කිසිම රටක පුරවැසියෙක්ට එවැනි හැසිරීමක් ඇති පොලිස්පතිවරයෙකු තම රටේ පොලිසියේ සිටීම අවශ්‍ය නොවනු ඇත. මෙය මාතර මහේස්ත්‍රාත් අධිකරණය විසින් අත්අඩංගුවට ගැනීම සඳහා නිකුත් කරන ලද නියෝගයක් හමුවේ සැඟවී සිටීමේ පසුකාලීන ක්‍රියාවන්ට අමතරව වේ. කමිටුව දැනටමත් එම අංශ සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

ඒ අනුව, විමර්ශන කමිටුව, මෙම වාර්තාවේ දක්වා ඇති හේතු මත, චෝදනා පත්‍රයේ 22 සහ 23 චෝදනා සම්බන්ධයෙන් වගඋත්තරකාර පොලිස්පතිවරයා වැරදිකරු බව තීරණය කරයි.

**13. සමාප්ති සටහන:**

විමර්ශන කමිටුව දැනටමත් ඉදිරිපත් කර ඇති හේතු මත, නියෝජ්‍ය පොලිස්පති කපුගමරලාලාගේ ජගත් චන්ද්‍ර කුමාර සහ විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරී නෙවිල් ද සිල්වා මෙම කමිටුව ඉදිරියේ අසත්‍ය සාක්ෂි ලබා දී ඇති බව නිගමනය කර ඇත. තවද, ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් ලෙස ඔවුන්ගේ හැසිරීම සැක සහිත බව කමිටුව සොයාගෙන ඇත. එම තත්වයන් යටතේ, ජාතික පොලිස් කොමිසම ඒ සම්බන්ධයෙන් තවදුරටත් ක්‍රියාමාර්ග ගත යුතුද යන්න සලකා බැලීම සඳහා මෙය සැලකිල්ලට ගත යුතු සුදුසු කාරණයක් බව විමර්ශන කමිටුවේ අදහස වේ.

කමිටුවට සහාය වීමට පෙනී සිටි අතිරේක සොලිසිටර් ජනරාල් ජනාධිපති නීතිඥ දිලීප පීරිස්, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් රාජිත පෙරේරා යන මහත්වරුන්ට විමර්ශන කමිටුව ස්තූතිවන්ත වේ. වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටිමින් කමිටුවට සහාය වූ රසික සංජීව වීරවික්‍රම නීතිඥවරයා සහ කිත්මිණි කවීෂා රුවන්පුර මහත්මියට ද කමිටුව ස්තූතිවන්ත වේ.

පාර්ලිමේන්තු මහලේකම් කුෂානි අනුෂා රෝහණධීර මහත්මිය; විමර්ශන කමිටුවට සහාය වීම සඳහා එහි ලේකම් ලෙස සහභාගී වූ පාර්ලිමේන්තු සහකාර මහලේකම් හංස අබේරත්න මහතා; පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරී නිපුණිකා තෙන්නකෝන් මෙනෙවිය; විමර්ශන කමිටුවේ එදිනෙදා කටයුතු සඳහා විශාල වශයෙන් සහාය වූ පාර්ලිමේන්තු නිලධාරී හංසනී මුණසිංහ මෙනෙවිය; කමිටුව සමඟ දීර්ඝ කාලයක් වෙහෙස නොබලා කටයුතු කළ සියලුම හැන්සාඩ්/කමිටු වාර්තාකරුවන්; පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය; මාධ්‍ය නිලධාරීන් සහ පරීක්ෂණයට සහභාගී වූ සියලු දෙනාට විමර්ශන කමිටුව ස්තූතිය පුද කරයි.

…………………………………
විනිසුරු P. පද්මන් සූරසේන
විමර්ශන කමිටුවේ සභාපති

……………………………………..
විනිසුරු ( විශ්‍රාමික) නීල් ඉද්දවෙල

………………………………………
ලලිත් ඒකනායක ( සභාපති) ජාතික පොලිස් කොමිෂන් සභාව

**ඇමුණුම II**

කල් තැබීමෙන් පසුව, පරීක්ෂණ කමිටුව යළි රැස් වී සිය වැඩ කටයුතු පැවැත්වෙන විවෘත කාරක සභා කාමරයේ දී සිය තීරණය ප්‍රකාශ කළේ ය. එම තීරණය පහත පරිදි වේ:—

<u>2025-05-19 වැනි දින වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් මතු කරන ලද මූලික විරෝධතා පිළිබඳව පරීක්ෂණ කමිටුවේ තීරණය</u>

චෝදනා පත්‍රය වගඋත්තරකාර පොලිස්පති (වගඋත්තරකරු) වෙත භාරදීමෙන් පසුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සංජීව වීරවික්‍රම මහතා මූලික විරෝධතා කිහිපයක් මතු කිරීම සඳහා පරීක්ෂණ කමිටුවේ අවසරය පැතී ය. ඉල්ලා සිටි එම අවස්ථාව ලබා දුන් පරීක්ෂණ කමිටුව, වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ සංජීව වීරවික්‍රම මහතා විසින් සහ උගත් අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් කරන ලද කරුණු ඉදිරිපත් කිරීම්වලට සවන් දීමට කටයුතු කරන ලදී. ඉන් අනතුරුව, අතිරේක සොලිසිටර් ජෙනරාල්වරයා විසින් කරන ලද කරුණු ඉදිරිපත් කිරීම්වලට ප්‍රතිචාර දැක්වීමට නීතිඥ සංජීව වීරවික්‍රම මහතාට තවත් අවස්ථාවක් ලබා දෙන ලදී. ඉන්පසුව, ඉහත සඳහන් කරන කරුණු ඉදිරිපත් කිරීම්වලදී මතු කරන ලද කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට හැකි වන පරිදි විමර්ශන කමිටුව විසින් සැසිය කල් තබන ලදී. දෙපාර්ශ්වය වෙනුවෙන්ම උගත් නීතිඥවරුන් විසින් සිය කරුණු ඉදිරිපත් කිරීම්වලදී ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා, ඒකමතිකව මෙම නියෝගය ප්‍රකාශයට පත් කරන ලද්දේ ඉන් අනතුරුව ය.

වගඋත්තරකාර පොලිස්පතිවරයා වෙනුවෙන් පෙනී සිටින උගත් නීතිඥවරයා මූලික විරෝධතා තුනක් සහ අයදුම් දෙකක් ඉදිරිපත් කර ඇත. වගඋත්තරකරු වෙනුවෙන් උගත් නීතිඥවරයා විසින් මතු කරන ලද පළමු මූලික විරෝධය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ (2022 නොවැම්බර් 23 දක්වා සංශෝධිත) ස්ථාවර නියෝග අංක 91 (ඊ) මත පදනම් වේ. එකී ස්ථාවර නියෝගය පහත පරිදි කියැවේ:--

*91.* සෑම මන්ත්‍රීවරයකු ම පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබීමට නියමිත යම් ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් කථා කිරීමේදී, මතු සඳහන් රීති දැඩි ලෙස පිළිපදිනු ලැබිය යුත්තේ ය:—

"(අ) ......

(ආ) ......

(ඇ) ......

(ඈ) ......

(ඉ) ......

(ඊ) කිසිම මන්ත්‍රීවරයෙකු විසින් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුවක් ලබා දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේ ය. විනිශ්චයට භාජනය වී තිබෙන කාරණයට එරෙහි රීතිය කඩ කරමින් කථා කරන කවර හෝ මන්ත්‍රීවරයකුට සිය ආසනයෙහි අසුන් ගන්නා ලෙස නියෝග කරනු ලැබීමට කථානායකවරයාට හෝ මූලාසනාරූඪ මන්ත්‍රීවරයාට හැකි ය.

එසේ වුව ද, එවැනි සඳහන් කිරීමක් නීති කෘත්‍යයක ප්‍රතිඵලය (අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින රීතිය) කෙරෙහි සැබෑ සහ සාරානුකූල හානියක් හෝ අගතියක් නොමැති බව කථානායකවරයාගේ මතය වන්නේ නම්, කථානායකවරයාට එවැනි සඳහන් කිරීමකට ඉඩ දෙනු ලැබීමට හැකි ය.''

1වැන්න සිට 21වැන්න දක්වා ඇති චෝදනාවලට අදාළ විෂය කරුණු මහේස්ත්‍රාත් අධිකරණ දෙකක් ඉදිරියේ විභාග වන නඩු දෙකක්, එනම් මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B R 6314/2023 දරන නඩුව සහ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B 22046/2022 දරන නඩුව යන නඩු කටයුතුවලට අදාළ විෂය කරුණු බව වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයාගේ කරුණු දැක්වීම විය.

උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා පෙන්වා දෙන ලද පරිදි, අංක 91(ඊ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය "පාර්ලිමේන්තුව තුළ කථා කරන මන්ත්‍රීවරුන් සඳහා වන රීති" යන මාතෘකාව යටතේ එන බව පරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කරයි.

එමෙන්ම ස්ථාවර නියෝග අංක 91 ආරම්භ වන්නේ *''සෑම මන්ත්‍රීවරයකු ම පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබීමට නියමිත යම් ප්‍රස්තුතයක් සම්බන්ධයෙන් කථා කිරීමේදී, මතු සඳහන් රීති දැඩි ලෙස පිළිපදිනු ලැබිය යුත්තේ ය''* යනුවෙන් බව ද කමිටුව නිරීක්ෂණය කරයි. එය ස්ථාවර නියෝග 91 දක්වා ඇති උප වගන්ති හයටම [91 (අ) සිට 91 (ඊ)] පොදු ය. 91(ඊ) ස්ථාවර නියෝගය *''කිසිම මන්ත්‍රීවරයකු විසින් යෝජනාවක දී හෝ විවාදයක දී අධිකරණයේ විනිශ්චයට භාජනය වෙමින් පවතින හෝ අධිකරණයේ තීන්දුවක් ලබා දීමට නියමිතව තිබෙන යම් කාරණයක් පිළිබඳව සඳහන් කරනු නොලැබිය යුත්තේ ය …,''* යනුවෙන් සඳහන් කරමින් ඇරඹෙන බව ද පරීක්ෂණ කමිටුව තවදුරටත් නිරීක්ෂණය කරයි.

නීතිඥ සංජීව වීරවික්‍රම මහතා සහ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා යන දෙපළ විසින්ම ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා, එමෙන්ම ඉහත පෙන්වා දෙන ලද පරිදි ස්ථාවර නියෝග 91 හි වචන සහ අන්තර්ගතය ද සැලකිල්ලට ගෙන, ස්ථාවර නියෝග 91 තනිවම සිටීමට තරම් පැහැදිලි බව අපගේ අදහසයි. එම නියෝගය එය වෙනුවෙන් ම කතා කරයි. එබැවින් ස්ථාවර නියෝග 91 අදාළ වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කථිකයන් ලෙස සම්බන්ධ වී සිටින පාර්ලිමේන්තු සභා ගර්භය තුළ සිදුවන කටයුතුවලට පමණක් බව පරීක්ෂණ කමිටුවේ අදහසයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් නොවන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් පරීක්ෂණ කමිටුවක් විසින් පවත්වනු ලබන මෙවැනි ක්‍රියාදාමයන් ආවරණය කිරීමට ස්ථාවර නියෝග 91 මගින් අදහස් නොකරන බව පරීක්ෂණ කමිටුවේ අදහසයි.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අධිකරණයක් විසින් විනිශ්චය කරනු ලබන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් හෝ අධිකරණ තීන්දුවක් ලබා දීමට නියමිත ඕනෑම කරුණක් සම්බන්ධයෙන් පිළිබඳව සඳහන් කිරීමට අවශ්‍ය වූ විට පවා එය අධිකරණ ක්‍රියාදාමයේ ප්‍රතිඵලයට සැබෑ සහ සැලකිය යුතු අනතුරක් හෝ අගතියක්

නොමැති බව කථානායකවරයාගේ අදහස වන්නේ නම්, එවැනි සඳහනකට ඉඩ දීමට ස්ථාවර නියෝග 91 හි ව්‍යතිරේඛය මගින් කථානායකවරයාට බලය ලබා දී තිබේ.

පිළිගත යුතු තත්ත්වය නම් වගඋත්තරකරුට එරෙහිව මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B R 6314/2023 නඩුවේ හෝ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B 22046/2022 නඩුවේ චෝදනා ගොනු කර නැති බවයි. එම අපරාධ නඩු දෙක සම්බන්ධයෙන් චෝදනා ගොනු කරන්නේ නම්, එවැනි චෝදනා සාධාරණ සැකයකින් තොරව ඔප්පු කිරීමට පැමිණිල්ල බැඳී සිටී. අනෙක් අතට, අංක 1 සිට 21 දක්වා වූ චෝදනා දෙස බලන විට, මෙම චෝදනා සකස් කර ඇත්තේ වගඋත්තරකරු විසින් 2022 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තියේ අර්ථය තුළ විෂමාචාර ක්‍රියාවන් සිදු කර ඇති බවටත්, එකී පනතේ 3 (ඉ) වගන්තියේ අර්ථය තුළ 'ඔහුගේ ධුරයේ බලය දැඩි සේ අයුතු ලෙස භාවිත කිරීමේ' ක්‍රියාවන් සිදු කර ඇති බවටත් චෝදනා කරන පදනම මතය. එබැවින්, අපරාධ නඩු දෙකේ (එවැනි චෝදනා වගඋත්තරකරුට එරෙහිව ගොනු කර ඇත්නම්) විභව්‍ය චෝදනාවල ස්වභාවය, එම අපරාධ නඩු දෙක අවසානයේදී ප්‍රතිඵලය, මෙම පරීක්ෂණ කමිටුව හමුවේ වගඋත්තරකරුට එරෙහිව ගොනු කර ඇති චෝදනාවල ස්වභාවයට හා එහි ප්‍රතිඵලයට හාත්පසින්ම වෙනස් ය.

තවද, මෙය 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ විධිවිධාන ප්‍රකාරව වූ කෘත්‍යයක් වන අතර, එකී පනත එහි නම් කර ඇති නිලධරයන් ඉවත් කිරීම සඳහා වූ කාර්ය පටිපාටිය සඳහා විධිවිධාන සලස්වයි. එවැනි එක් නිලධාරියෙක් වන්නේ පොලිස්පතිවරයාය. පරීක්ෂණ කමිටුවේ අදහස වන්නේ මෙම පරීක්ෂණ කමිටුව ඉදිරියේ ඇති කාර්යභාරය සීමාකාරී එකක් වන අතර, එයට වගඋත්තරකරු කිසියම් අපරාධ චෝදනාවකට වරදකරු කිරීම හෝ වගඋත්තරකරු කිසියම් අපරාධ චෝදනාවකින් නිදහස් කිරීම ඇතුළත් නොවන බවයි. එවැනි ක්‍රියාදාමයන් සඳහා පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට චෝදනා ඔප්පු කිරීම අවශ්‍ය වනු ඇත. මෙය එවැනි කටයුත්තක් නොවේ. එබැවින් එම නඩු දෙක 'අධිකරණ තීන්දුවක් ලබා දීමට ඇති කරුණු' ලෙස අපට පිළිගත නොහැක.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතීඥවරයා මතු කළ දෙවැනි මූලික විරෝධතාවය වන්නේ විත්තිකරු සිදු කර ඇතැයි එම චෝදනා තුළ කියා පානු ලබන ක්‍රියා විත්තිකරු සිදු කර ඇත්තේ බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩබලන පොලිස්පති වශයෙන් බැවින් ඔහුට එරෙහිව එල්ල වී ඇති චෝදනා සම්බන්ධයෙන් විනිශ්චය කිරීමට මෙම පරීක්ෂණ කමිටුවට බලපාත්‍රතාවක් නොමැති බවයි.

2002 අංක 05 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතින් පොලිස්පතිවරයා ඉවත් කිරීම සඳහා විනා වැඩබලන පොලිස්පතිවරයා ඉවත් කිරීම සඳහා කිසිදු කාර්ය පටිපාටියක් සපයා නොමැති බවත් වගඋත්තරකාර උගත් නීතීඥවරයා විසින් ඉදිරිපත් කරන ලද අදහස විය.

වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතීඥවරයා වැඩිදුරටත් කරුණු දක්වමින් කියා සිටියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු ලෙස වගඋත්තරකරු විසින් සිදු කර ඇතැයි කියන ඕනෑම විෂමාචාරයක් සම්බන්ධයෙන් විනිශ්චය කිරීමේ බලය ඇත්තේ පොලිස් කොමිසමට බවයි. වගඋත්තරකාර පාර්ශ්වයේ උගත් නීතිඥවරයා මෙම තර්කය ඉදිරිපත් කළේ 2002 අංක 05 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ පොලිස්පතිවරයාට වඩා පහළින් සිටින කවර හෝ නිලධරයකු ඉවත් කිරීම සඳහා පරීක්ෂණ කමිටුවක් පත් කිරීමට පාර්ලිමේන්තුවට ප්‍රතිපාදන නොමැතිය යන පදනම මත ය.

මේවායේ ඇති සිද්ධි වාචක තත්ත්වයන් සහ පසුබිම සැලකිල්ලට ගත් පරීක්ෂණ කමිටුව මෙම චෝදනා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකුට හෝ වැඩ බලන පොලිස්පතිවරයකුට එරෙහිව එල්ල කර නොමැතිය යන අදහස දරයි. ඒවා සකස් කර ඇත්තේ රටේ පොලිස්පතිවරයාට එරෙහිව ය. මෙම චෝදනා රටේ පොලිස්පතිවරයාට එරෙහිව, සාධාරණව සහ ඍජුව ගොනු කර ඇත. 2025-04-08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ ඉතිරි කොටස සමඟ කියවිය යුතු 1 සිට 20 දක්වා වූ චෝදනාවලින් දැනට රටේ පොලිස්පති තනතුර දරන වගඋත්තරකරු බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස් පරීක්ෂකවරයා සහ වැඩබලන පොලිස්පතිවරයා ලෙස ධූරය දැරූ කාලය තුළ එකී චෝදනා තුළ දක්වා ඇති ආකාරයට කටයුතු කර ඇති බව පැහැදිලි වේ. එබැවින් මෙම පරීක්ෂණ කමිටුව විසින් තීරණය කළ යුතු වාදවිෂය වන්නේ වර්තමානයේ පොලිස්පති ධූරය දරන වගඋත්තරකරු චෝදනා තුළ සඳහන් කාල සීමාව තුළ ඔහු විසින් කරන ලදැයි මෙකී චෝදනා විසි තුන තුළ දක්වා ඇති විෂමාචාරය හෝ බලය අයුතු ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් වැරදිකරු බවට තීන්දු කළ යුතුද යන්න බව පැහැදිලි ය.

තුන්වන මූලික විරෝධතාවය මතු කරමින් වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා කියා සිටියේ R-1 ලෙස සලකුණු කොට වගඋත්තරකරුගේ උගත් නීතිඥයා විසින් ඉදිරිපත් කරන ලද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අංක SC FR 67/2024, SC FR 68/2024, SC FR 71/2024, SC FR 72/2024, SC FR 75/2024, SC FR 79/2024, SC FR 80/2024,/ සහ SC FR 82/2024 දරන නඩු සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියෝගය මගින් වගඋත්තරකරු පොලිස්පති ධූරයේ බලතල, කර්තව්‍ය හා වගකීම ක්‍රියාවේ යෙදවීම වාරණය කර ඇති බැවින් මෙම පරීක්ෂණ කමිටුවට ඔහුව පොලිස්පතිවරයා ලෙස කැඳවිය නොහැකි බවයි.

එහිදී වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා වැඩිදුරටත් කියා සිටියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ එකී අතුරු නියෝගය එම නඩුවේ අවසන් තීරණය දක්වා වලංගු වන ලෙස පනවා ඇති බවයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාගේ ධූරයේ බලතල, කර්තව්‍ය සහ වගකීම් ක්‍රියාත්මක කිරීම නතර කර ඇති බවත්, එබැවින් පරීක්ෂණ කමිටුවට වගඋත්තරකාර පොලිස්පතිවරයාට එරෙහිව මෙම පරීක්ෂණය ඉදිරියට ගෙන යා නොහැකි බවත් තර්ක කිරීමට වගඋත්තරකරු වෙනුවෙන් උගත් නීතිඥවරයා තර්ක කිරීමට උත්සුක වූයේ එම පදනම මත ය.

උගත් අතිරේක සොලිසිටර් ජනරාල් විසින් පෙන්වා දෙන ලද පරිදි, වගඋත්තරකරු මේ දක්වා ම පොලිස් පරීක්ෂක ධූරයේ සියලු වරප්‍රසාද සහ ප්‍රතිලාභ පරිහරණය කරමින් සිටියි. ඔහු පොලිස්පතිවරයාගේ වැටුප පවා ලබා ගනී. පොලිස්පතිවරයාගේ උගත් නීතිඥවරයා විසින් උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා විසින් කරන ලද ප්‍රකාශයට පරස්පරව කරුණු දක්වා නැත.

පරීක්ෂණ කමිටුව විසින් වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද **R-1 ලෙස සලකුණු කරන ලද** 2024 ජූලි 24 දිනැති නියෝගය අධ්‍යයනය කර සලකා බලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් වගඋත්තරකරුට එම නඩු අවසන් නිශ්චය කරන තෙක් පොලිස්පතිවරයාගේ කාර්යාලයේ බලතල, කාර්යයන් සහ වගකීම් ක්‍රියාත්මක කිරීමෙන් පමණක් සීමා කර ඇති බව පෙනී යන්නේය යන මතය ප්‍රකාශ කළේය. මේ අනුව, එම නියෝගය පොලිස්පතිවරයාගේ සේවය අවසන් කිරීමේ බලපෑමක් ඇති එකක් ලෙස අර්ථ දැක්විය නොහැකි බව පරීක්ෂණ කමිටුවේ අදහසයි. එපමණක් නොව, වගඋත්තරකරුට එරෙහිව ගොනු කර ඇති චෝදනා සම්බන්ධයෙන් විනිශ්චය කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් මෙම පරීක්ෂණ කමිටුව පත් කර ඇත්තේ ඔහු තවමත් පොලිස්පති තනතුර දරන බැවිනි.

තවද, 2024 ජුලි 24 වැනි දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද නියෝගය මගින් එම අතුරු නියෝගය ක්‍රියාත්මක වන කාලසීමාව සඳහා වැඩබලන පොලිස්පතිවරයා ලෙස සුදුසු පුද්ගලයෙකු පත් කිරීම පිළිබඳව සලකා බලන ලෙස අතිගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලා ඇත. මෙයින් අදහස් වන්නේ ද, ඉන් දැක්වෙන්නේ ද වගඋත්තරකරු තවමත් පොලිස්පති ධූරය දරන බවයි.

ඉහත හේතූන් මත වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද තුන්වන මූලික විරෝධතාවයේ කිසිදු වලංගුතාවක් නොමැති බව පරීක්ෂණ කමිටුවේ අදහසයි. වගඋත්තරකාර පොලිස්පතිවරයාට එරෙහිව මෙම පරීක්ෂණ කමිටුවට මෙම පරීක්ෂණය ඉදිරියට ගෙන යා නොහැකි බවට වගඋත්තරකාර උගත් නීතිඥවරයා ඉදිරිපත් කර ඇති කරුණු අපට පිළිගත නොහැක.

වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයා ඉහත මූලික විරෝධතා තුන මතු කිරීමට අමතරව මෙම පරීක්ෂණ කමිටුවට අයදුම් දෙකක් ද ඉදිරිපත් කර ඇත.

ඉහත කී අයැදුම්වලින් පළමුවැන්න මෙම පරීක්ෂණ කමිටුවට සහය වීම සඳහා උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයාගේ පැමිණීම පිළිබඳ විරෝධතාවක ස්වරූපයෙනි. වගඋත්තරකාර පාර්ශ්වයේ උගත් නීතිඥවරයා තම සේවාදායකයා වෙනුවෙන් මෙම විරෝධතාව ඉදිරිපත් කළේ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා වගඋත්තරකරුට එරෙහිව මාතර මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබීම පදනම් කරගෙනය.

අප හමුවේ කරුණු පැහැදිළි කළ උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා ඉදිරිපත් කළ කරුණු දැක්වීම් සමගින් අපි මෙම කරුණු සලකා බලා ඇත. මෙම පරීක්ෂණ කමිටුවට සහය වීමට තම නිලධාරීන් දෙදෙනෙකු නම් කර ඇත්තේ ගරු නීතිපතිවරයා ය. මේ අනුව, මුළුමනින්ම මෙම නාමයෝජනා සම්බන්ධයෙන් තීරණය කළ යුත්තේ ගරු නීතිපතිවරයාය. උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා වගඋත්තරකරුට එරෙහිව මාතර මහේස්ත්‍රාත් අධිකරණයේ යම් යම් කරුණු ඉදිරිපත් කර ඇතැයි යන හුදු පදනම මත සහය ලබා නොගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පරීක්ෂණ කමිටුවට කිසිදු පදනමක් හෝ හේතුවක් නැත.

කෙසේ වෙතත්, 2025 අප්‍රේල් 08 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ දක්වා ඇති චෝදනා පිළිබඳව අවසන් තීරණය ගැනීමේ බලය සම්පූර්ණයෙන්ම පැවරී ඇත්තේ පරීක්ෂණ කමිටුවට මිස අතිරේක සොලිසිටර් ජනරාල්වරයාට නොවේ. උගත් අතිරේක සොලිසිටර් ජනරාල්වරයා මෙහිදී කරන්නේ පරීක්ෂණ කමිටුවට සහය වීම පමණි. එබැවින් වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයා විසින් කරන ලද ඉහත කී විරෝධතාවයේ/අයදුමේ කිසිදු විශේෂ ගුණයක් නොමැති බව පරීක්ෂණ කමිටුවේ අදහසයි.

වගඋත්තරකරුගේ උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද ඉහත කී අයදුම් අතරින් දෙවැන්න අන්තර් පාර්ලිමේන්තු සංගමයේ සාමාජිකයින්ට සහ ආසියානු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට නිරීක්ෂකයින් ලෙස මෙම පරීක්ෂණ කමිටුව හමුවේ පෙනී සිටීමට අවසර ඉල්ලා සිටීමයි. 2002 අංක 05 දරන නිලධරන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනත තුළ පරීක්ෂණ කමිටුව පිළිපැදිය යුතු එබඳු විධිවිධානයක් නොමැති බව පරීක්ෂණ කමිටුව සඳහන් කරයි. තවද, මෙම පරීක්ෂණ කමිටුව කිසිදු පිටස්තරයෙකු පැමිණ ක්‍රියා පටිපාටීන් නිරීක්ෂණය කිරීම වැළැක්වීමට, සීමා කිරීමට හෝ නැවැත්වීමට කිසිදු තීරණයක් ගෙන නොමැත. ඇත්ත

වශයෙන්ම, සමස්ත මාධ්‍ය පිරිස් ඉදිරියේ අද දින සිදුකෙරෙන පරීක්ෂණය නිරීක්ෂණය කිරීමට සහ සටහන් කිරීමට සහභාගී වූ මාධ්‍යවේදීන් කිසිවකු තෝරා ගන්නේ හෝ ආරාධනා කරන්නේ ද මෙම පරීක්ෂණ කමිටුව නොවේ. එබැවින් මෙහි වගඋත්තරකරු වෙනුවෙන් උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද ඉහත අයදුම සම්බන්ධයෙන් පරීක්ෂණ කමිටුව කටයුතු කිරීමේ අවශ්‍යතාවක් නැත.

තවද, 2002 අංක 05 දරන නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියාපටිපාටිය) පනතේ 9 (ඉ) වගන්තියේ පහත සඳහන් පරිදි දක්වා ඇති නීති විධිවිධාන ද වගඋත්තරකාර පාර්ශ්වයේ උගත් නීතිඥවරයා පරීක්ෂණ කමිටුවේ අවධානයට යොමු කළේය:-

> "එවැනි විභාගයකට හෝ පරීක්ෂණයකට හෝ එහි යම් කොටසකට මහජනයාට ඇතුළුවීමට ඉඩදීමට හෝ එසේ ඉඩ නොදීමට කමිටුවට බලය තිබිය යුතු ය"

පෙර සඳහන් කළ පරිදි, පරීක්ෂණ කමිටුව විසින් මෙතෙක් එම විධිවිධාන යටතේ කිසිවකු සීමා කිරීමට හෝ කිසිදු මහජන නියෝජිතයකු මෙම පරීක්ෂණය නිරීක්ෂණය කිරීමෙන් බැහැර කිරීමට කිසිදු නියෝගයක් කර නොමැති බව ප්‍රකාශ කිරීම ප්‍රමාණවත්ය. කෙසේ වෙතත් එම කටයුතු පාර්ලිමේන්තු පරිශ්‍රය තුළ සිදු වන බැවින් ඒ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව අනුගමනය කරන ආරක්ෂක විධිවිධාන, එහි නීති රීති සහ භාවිතයන්ට ගරු කිරීම සහ ඒවාට අනුකූල වීම අවශ්‍ය වන බව ද මෙහි දී ප්‍රකාශ කළ යුතු ය.

මේ අනුව, ඉහත හේතූන් සඳහා සියලු කරුණු සලකා බැලීමෙන් පසු, වගඋත්තරකරු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද මූලික විරෝධතා තුනම අවලංගු කිරීමට පරීක්ෂණ කමිටුව තීරණය කරයි. එසේම, වගඋත්තරකරු වෙනුවෙන් උගත් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් දෙක සලකා බැලීමට නොහැකි බව ද පරීක්ෂණ කමිටුව තීරණය කරයි.

ඉහත තත්ත්වයන් තුළ, පරීක්ෂණ කමිටුව ඉතිරි පරීක්ෂණ කටයුතු කරගෙන යාමට තීරණය කරයි.

[අත්සන් කළා]
විනිසුරු පී. පද්මන් සූරසේන
පරීක්ෂණ කමිටුවේ සභාපති

[අත්සන් කළා]
විනිසුරු (විශ්‍රාම ලත්) නීල් ඉද්දවෙල
පරීක්ෂණ කමිටුවේ සාමාජික

[අත්සන් කළා]
ලලිත් ඒකනායක (ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති)
පරීක්ෂණ කමිටුවේ නිල බලයෙන්ම සාමාජික

ඇමුණුම I

<u>ලැබිය යුතු:- පොලිස්පති ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා</u>

**<u>චෝදනා</u>**

*2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 5 වගන්තිය සමඟ කියවිය යුතු 3 (ඇ) සහ 3 (ඉ) වගන්ති ප්‍රකාරව විෂමාචාරය සහ ධුරයේ බලතල බරපතල අත්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශ බන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සඳහා එකී පනතෙහි 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට 2025-04-08 දින පාර්ලිමේන්තුව යෝජනාවක් සම්මත කර ඇති හෙයින් ද;*

*2002 අංක 05 දරණ නිලධාරීන් ඉවත් කිරීමේ (ක්‍රියා පටිපාටිය) පනතේ 6 වැනි වගන්තිය අනුව ඔබ පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීමට අදහස් කරමින් ඉදිරිපත් කරන ලද චෝදනා විමර්ශනය කර පරීක්ෂා කිරීමට පරීක්ෂණ කමිටුවක් පත් කර ඇති අතර, ඒ අනුව මෙම පරීක්ෂණ කමිටුව ඔබ ධුරයෙන් ඉවත් කිරීමට අපේක්ෂිත කරුණු සම්බන්ධයෙන් සොයාගැනීම් සිදු කර ගරු පාර්ලිමේන්තුවේ කථානායකතුමාට එවැනි සොයාගැනීම් දැනුම් දීම අවශ්‍ය වන හෙයින් ද;*

*එමෙන්ම එම පරීක්ෂණ කමිටුව 2025 මැයි 07 දිනැති නොතීසිය මඟින් එය පවත්වන පරීක්ෂණය සම්බන්ධයෙන් ඔබ වෙත දැනුම් දී ඇති හෙයින් ද.*

එබැවින්, පහතින් වඩාත් සම්පූර්ණයෙන් සඳහන් කර ඇති චෝදනාවලට අදාළව එම පරීක්ෂණ කමිටුව ඔබට එරෙහිව සොයාගැනීම් නොකළ යුත්තේ මන්දැයි එම කමිටුව හමුවේ හේතු දක්වන ලෙස පොලිස්පති, ටී.එම්.ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා වන ඔබ වෙත මෙයින් නියෝග කරනු ලැබේ:-

1. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත්, නම් වශයෙන් ප්‍රධාන පොලිස් පරීක්ෂක ඇන්ස්ලම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2004 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ගිහාන් පියතිස්ස යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලෑන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් ඔබ 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

2. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත්, නම් වශයෙන්: ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන්

ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලිප් ගිහාන් පියතිස්ස යන එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමත් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් ඔබ 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇත;

3. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස සලස්වා ඇති අතර, එමඟින් ඔබ 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

4. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කිරීමට පහසුකම් සැලැස්වීමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදීමට, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස සලස්වා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔබ ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමන් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇත;

5. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදීමට , එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට, නීති විරෝධී ලෙස සලස්වා ඇති අතර, එමඟින් ඔබ 2007 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇත;

6. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදීමට , එනම් වැලිගම, පැලෑනේ පිහිට W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට, නිති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් ඔබ 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඈ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇත;

7. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමෙහි, යෙදී ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර එමගින් ඔබ 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

8. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායම නිති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කර ඇති බව, ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනිමක් සිදුකර ඇත;

9. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන් කණ්ඩායමේ දෙදෙනෙකු, එනම් පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන අය වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවේ හෝ අපරාධයේ නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

10. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු, එනම් පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවේ හෝ අපරාධයේ නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇත;

11. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් සන්නද්ධ පොලිස් නිලධාරීන් දෙදෙනෙකු, එනම් පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂන රොෂාන් මධුරංග, වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නිති විරෝධී ක්‍රියාවේ හෝ අපරාධයේ නිරත වන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ ළඟම ඇති රෝහලට තුවාලකරුවන් රැගෙන නොගොස්, රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම

සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇත;

12. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු, එනම් පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග වැලිගම, පැලෑනේදී ඉහත සඳහන් නිති විරෝධී ක්‍රියාවේ හෝ අපරාධයේ නිරතවන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැන සිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති වන ඔබ, ළඟම ඇති රෝහලට තුවාල කරුවන් රැගෙන නොගොස්, රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක්සිදු කර ඇත;

13. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට, ඔවුන්ට ආධාර සහ අනුබල දීම මගින් පහසුකම් සලස්වා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

14. බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට, එනම් වැලිගම, පැලෑනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට, ඔවුන්ට ආධාර සහ අනුබල දීම මගින් පහසුකම් සලස්වා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔබගේ ධූරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇත;

15. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායම් අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමක හෝ අපරාධයක යෙදීමට, එනම්, වැලිගම, පැලෑන වෙත යාමට, ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් පහසුකම් සලසා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇත;

16. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස ඔබ කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමක හෝ අපරාධයක යෙදීමට, එනම් වැලිගම, පැලෑන වෙත යාමට, ඔවුන්ට ආධාර සහ

අනුබල දීමෙන් පහසුකම් සලසා ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඉ) වගන්තිය ප්‍රකාරව, ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇත;

17. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ ඔබ පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025.02.27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ නොපිළිපදිමින් සැඟවී සිට ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇත.

18. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ ඔබ පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ නොපිළිපදිමින් සැඟවී සිට ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

19. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාල සීමාව තුළ ඔබ පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී ඔබව අත්අඩංගුවට ගැනීම මගහරිමින් සිටීම, 2025-02-27 දින අංක B R 6314 2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් වරින් වර නිකුත් කරන ලද වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්ට අනුකූලවීමට අපොහොසත් වීම, සිදුවෙමින් පවතින නිසි නෛතික ක්‍රියාවලියට හානි කරමින් සැඟවී සිටීම, නීතියේ ආධිපත්‍යය, යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීමේ හා ආරක්ෂා කිරීමේ කාර්යය පවරා ඇති පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපයට සහ කීර්ති නාමයට කැළලක් සිදු කිරීම, සමස්තයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව සහ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට සලස්වා ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඈ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවන් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවන් සිදු කර ඇත;

20. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ඔබ කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණි, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනිය මාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පිරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දුලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින්

උපතිස්ස ජයසිංහ. ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රීයන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදු කිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

21. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස ඔබ, කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩැන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණි, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනිය මාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පිරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දුලිප් ප්‍රනාන්දු, කහදගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ. ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රීයන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔබගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇත;

22. ඔබ මුළු රටේම නීතිය හා සාමය පවත්වා ගෙන යාමේ රාජකාරිය පැවරී ඇති මෙරට පොලිස්පති ධුරය හොබවන අතරේ, ඉහත කී විෂමාචාර සහ/හෝ බරපතල අන්දමින් බලය අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලින් එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීම මගින් මෙරට පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් කර, පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවන් සිදු කර එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත;

23. ඔබ විවිධාකාර ස්වභාවයේ පුළුල් බලතල පැවරී ඇති මෙරට පොලිස්පති ධුරය හොබවන අතරේ, ඉහත කී විෂමාචාර සහ/හෝ බරපතල අන්දමින් බලය අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවලින් එකක් හෝ වැඩි ගණනක් සිදු කිරීම මගින් මෙරට පොලිස්පති ධුරය දරන තැනැත්තා වෙතින් අපේක්ෂා කෙරෙන ඉහළ ප්‍රමිතියට වඩා පහළ මට්ටමකට වැටී ඇති අතර, එම නිසා මෙරට පොලිස්පති ධුරය

*දැරීමට නුසුදුසු තත්ත්වයට පත්ව ඇති අතර එමගින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත.*

පරීක්ෂණ කමිටුව විසින් නියම කරනු ලබන්නා වූ දිනයට හා වේලාවට පෙර එකී පරීක්ෂණ කමිටුව වෙත දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉහත සඳහන් චෝදනා සම්බන්ධයෙන් නිදහසට කරුණු දක්වන ලෙස ඔබට මෙමගින් නියෝග කරනු ලැබේ. එමෙන්ම මෙම පරීක්ෂණයේ සමාප්තිය වන තෙක් දිනපතා පදනමින් වැඩිදුර පරීක්ෂණය පැවැත්වෙන බව ද ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

[අත්සන් කළා]
විනිසුරු පී. පද්මන් සූරසේන
පරීක්ෂණ කමිටුවේ සභාපති

[අත්සන් කළා]
විනිසුරු (විශ්‍රාම ලත්) නීල් ඉද්දවෙල
පරීක්ෂණ කමිටුවේ සාමාජික

[අත්සන් කළා]
ලලිත් ඒකනායක (ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපති)
පරීක්ෂණ කමිටුවේ නිල බලයෙන්ම සාමාජික